තෝරාගත් කෘති 7 වැනි වෙළුමෙහි ලෙනින්ගේ පහත දැක්වෙන කෘති හා වෙනත් කෘතිද පළ වේ:

රුසියාවේ රටවැසියන් වෙත

ජනතාව වෙත

තරඟ සංවිධානය කරන්නේ කෙසේද?

වැඩකරන සහ සූරාකනු ලබන ජනතාවගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනය

අපූර්ව සහ භයානක දෙයකි

ලෙනින් * තෝරාගත් කෘති 6

ලෙනින්

තෝරාගත් කෘති

වෙළුම් දෙළහ

*

වෙළුම

6

රාජ්‍යය සහ විප්ලවය

බොල්ෂෙවික්වරුන් බලය තමන් අතට ගත යුතුය

මාක්ස්වාදය හා කැරැලි ගැසීම නැගී සිටීම

අර්බුද මෝරාගොස් ඇත

බොල්ෂෙවික්වරුන්ට රාජ්‍ය බලය රැක ගත හැකිද?

ප්‍රගති ප්‍රකාශක මන්දිරය

https://liberationbase.wordpress.com

LIBERATIONBASE
ඩිජිටල් පුස්තකාලය

ඩිජිටල් පුස්තකාලය සහ ලේඛණ සංරක්ෂණ ව්‍යාපෘතිය
ආරම්භය (***NMSG Library*** ලෙස): 2010
LIBERATIONBASE ලෙස නැවත නාමකරණය: 2013

සූචිකරණ දත්ත

කෘතිය: ලෙනින් තෝරාගත් කෘති වෙළුම් දොළහ, වෙළුම 6
කතෘ/පරිවර්තක: වී.අයි. ලෙනින්/උ. මු. අබයරත්න
ප්‍රකාශක: ප්‍රගති ප්‍රකාශක මන්දිරය, මොස්කව්
පළමු ඩිජිටල් පළ කිරීම: 2014-09-22
ඩිජිටල් සංස්කරණයන්: V1:2014-09-22, V2:2019-05-29
පිටු ගණන: 300
භාෂා මාධ්‍ය: සිංහල
ගොනු ආකෘතිය: PDF

Web: https://liberationbase.wordpress.com
Email: slradical@ymail.com

https://liberationbase.wordpress.com

LIBERATIONBASE
ඩිජිටල් පුස්තකාලය

ඩිජිටල් පුස්තකාලය සහ ලේඛණ සංරක්ෂණ ව්‍යාපෘතිය
ආරම්භය (***NMSG Library*** ලෙස): 2010
LIBERATIONBASE ලෙස නැවත නාමකරණය: 2013

සූචිකරණ දත්ත
කෘතිය: ලෙනින් තෝරාගත් කෘති වෙළුම් දොළහ, වෙළුම 6
කතෘ/පරිවර්තක: වී.අයි. ලෙනින්/උ. මු. අබයරත්න
ප්‍රකාශක: ප්‍රගති ප්‍රකාශක මන්දිරය, මොස්කව්
පළමු ඩිජිටල් පළ කිරීම: 2014-09-22
ඩිජිටල් සංස්කරණයන්: V1:2014-09-22, V2:2019-05-29
පිටු ගණන: 300
භාෂා මාධ්‍ය: සිංහල
ගොනු ආකෘතිය: PDF

Web: https://liberationbase.wordpress.com
Email: slradical@ymail.com

ලෙනින්
තෝරාගත් කෘති
වෙළුම් දොළහ

✻

වෙළුම
6

මොස්කව්
ප්‍රගති ප්‍රකාශක මන්දිරය
1980

https://liberationbase.wordpress.com

අනුවාදය — උ. මු. අබයරත්න

В. И. ЛЕНИН
ИЗБРАННЫЕ ПРОИЗВЕДЕНИЯ В 12 ТОМАХ
Том 6
на языке сингала

LIBERATIONBASE

© සිංහල අනුවාදය, ප්‍රගති ප්‍රකාශක මන්දිරය, මොස්කව්

සෝවියට් සංගමයේ මුද්‍රණය කරන ලදී

Л $\frac{10102—196}{016(01)—80}$ 808—80

0101020000

පටුන

රාජ්‍යය සහ විප්ලවය. රාජ්‍යය පිළිබඳ මාක්ස්වාදී න්‍යායය සහ විප්ලවවාදී නිර්ධන පංතියට පැවරෙන කර්තව්‍යයන් . . . 9

ප්‍රථම මුද්‍රණයට පෙරවදන 9

දෙවැනි මුද්‍රණයට පෙරවදන 10

පළමුවැනි පරිච්ඡේදය. පංති සහිත සමාජය සහ රාජ්‍යය 11

1. රාජ්‍යය — පංති සතුරුතාවයන්ගේ නොසමාදාන ස්වභාවය නිසා ඇති වූවකි 11
2. ආයුධ සන්නද්ධ විශේෂ පිරිස්, සිරගෙවල්, ආදිය 14
3. රාජ්‍යය, පීඩිත පංතිය සූරාකෑමේ උපකරණයකි 18
4. රාජ්‍යය "හැකිළියාම" සහ ප්‍රචණ්ඩ විප්ලවය 22

දෙවැනි පරිච්ඡේදය. රාජ්‍යය සහ විප්ලවය. 1848-1851 කාලයේ අත්දැකීම් 29

1. විප්ලවයේ පූර්වාසන්නය 29
2. විප්ලවය ගැන සංක්ෂේපයෙන් 33
3. 1852 දී මාක්ස් ප්‍රශ්නය ඉදිරිපත් කළ හැටි 39

තුන්වැනි පරිච්ඡේදය. රාජ්‍යය සහ විප්ලවය. 1871 පැරිස් කොමියුනයේ අත්දැකීම. මාක්ස්ගේ විග්‍රහය 42

1. කොමියුනාඩ්වරුන්ගේ ප්‍රයත්නය වීරත්වයට පත්වූයේ කුමක් නිසාද? 42
2. සුන් කළ රාජ්‍ය යන්ත්‍රය වෙනුවට ආදේශ කරන්නේ කුමක්ද? 46
3. පාර්ලිමේන්තුවාදය අහෝසි කිරීම 51

https://liberationbase.wordpress.com

4. ජාතික සමගියේ සංවිධානය 57
5. රාජ්‍යය නැමති පිළිලය අහෝසි කිරීම 60

හතරවැනි පරිච්ඡේදය. ඒ ගැනම තවදුරටත්, එංගල්ස්ගේ අතිරේක පැහැදිලි කිරීම 63
1. නිවාස ප්‍රශ්නය 63
2. අරාජිකවාදීන් සමග වාදය 66
3. බේබෙල්ට ලිපියක් 71
4. එර්පුර්ට් වැඩ පිළිවෙළෙහි කෙටුම්පත ගැන විවේචනය . 74
5. මාක්ස්ගේ ''ප්‍රංශයේ සිවිල් යුද්ධය'' නැමති කෘතියට 1891 දී ලියන ලද පෙරවදන 82
6. ප්‍රජාතන්ත්‍රවාදය ජයගැනීම ගැන එංගල්ස්ගේ අදහස් . . 88

පස්වැනි පරිච්ඡේදය. රාජ්‍යය හැකිළී යාමට අදළ වන ආර්ථික පදනම 90
1. මාක්ස් ප්‍රශ්නය ඉදිරිපත් කළ ආකාරය 91
2. ධනපති ක්‍රමයේ සිට කොමියුනිස්ට් ක්‍රමයට පරිවර්තනය වීම 93
3. කොමියුනිස්ට් සමාජයේ පළමු අදියර 99
4. කොමියුනිස්ට් සමාජයේ ඉහළ අදියර 103

හයවැනි පරිච්ඡේදය. අවස්ථාවාදීහු මාක්ස්වාදය කෙළෙසති . . 110
1. ප්ලෙහානව් හා අරාජිකවාදීන් අතර විවාදය 111
2. කෞට්ස්කි හා අවස්ථාවාදීන් අතර විවාදය 112
3. කෞට්ස්කි හා පනෙකුක් අතර විවාදය 119

හත්වැනි පරිච්ඡේදය. 1905 සහ 1917 රුසියානු විප්ලවවල අත්දැකීම් පළමුවැනි සංස්කරණයට පසු සටහන 128

බොල්ෂෙවික්වරුන් බලය තමන් අතට ගත යුතුය 130

රු. ස. ප්‍ර. ක. ප. (බො) මධ්‍යම කාරක සභාවට සහ පෙට්‍රොග්‍රෑඩ් හා මොස්කව් කාරක සභාවලට ලිපිය 130

මාක්ස්වාදය හා කැරැලි ගසා නැගී සිටීම 133
රු. ස. ප්‍ර. ක. ප. (බො) මධ්‍යම කාරක සභාවට ලිපිය . . 133

දේශපාලන විචාරකයෙකුගේ දින පොතෙන් 140

අප පක්ෂයේ වැරැදි 140

අර්බුදය මෝරා ගොස් ඇත 148

බොල්ෂෙවික්වරුන්ට රාජ්‍ය බලය-රැක ගත හැකිද? 158

දෙවැනි මුද්‍රණයට පෙරවදන 158

පසුවදන 205

මධ්‍යම කාරක සභාවට, මොස්කව් සහ පෙට්‍රොග්‍රෑඩ් කාරක සභාවලට සහ පෙට්‍රොග්‍රෑඩ් හා මොස්කව් සෝවියට් සභාවල බොල්ෂෙවික් සාමාජිකයින්ට ලිපිය 212

ප්‍රේක්ෂකයෙකුගේ උපදෙස් 215
උතුරු දිසාවේ සෝවියට් සභා සම්මේලනයට සහභාගි වන බොල්ෂෙවික් සහෝදරවරුන්ට ලිපිය 218

රු. ස. ප්‍ර. ක. ප. (බො) මධ්‍යම කාරක සභා රැස්වීම. 1917 ඔක්තෝබර් 10 (23) 225
1. වාර්තාව 225
2. යෝජනාව 226

රු. ස. ප්‍ර. ක. ප. (බො) මධ්‍යම කාරක සභා රැස්වීම. 1917 ඔක්තෝබර් 16 (29) 228
1. වාර්තාව 228
2. සාකච්ඡාවේදී කළ කථාවලිනි 229
3. යෝජනාව 231

බොල්ෂෙවික් පක්ෂ සාමාජිකයන්ට ලිපිය 232

රු. ස. ප්‍ර. ක. ප. (බො) මධ්‍යම කාරක සභාවට ලිපිය 237

වයි. එම්. ස්වෙර්ද්ලොව්ට ලිපිය 243

මධ්‍යම කාරක සභා සාමාජිකයින්ට ලිපිය 244

සංස්කාරකගේ සටහන් 247

නාමාවලිය 276

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

රාජ්‍යය සහ විප්ලවය[1]

රාජ්‍යය පිළිබඳ මාක්ස්වාදී න්‍යායය සහ විප්ලවවාදී නිර්ධන පංතියට පැවරෙන කර්තව්‍යයන්

ප්‍රථම මුද්‍රණයට පෙරවදන

න්‍යායය සහ ප්‍රායෝගික දේශපාලනය යන දෙවිෂයෙහිම, රාජ්‍යය පිළිබඳ ප්‍රශ්නය දැන් විශේෂයෙන්ම වැදගත් තත්ත්වයක් ගනිමින් පවතී. ඒකාධිකාරී ධනපති ක්‍රමය, රාජ්‍ය ඒකාධිකාරී ධනපති ක්‍රමය බවට පරිවර්තනය වීමේ ක්‍රියාදමය අධිරාජ්‍යවාදී යුද්ධය නිසා අතිශයින් වේගවත් සහ උත්සන්න වී තිබේ. සකල බලධාරී ධනපති සමාගම් සමග වඩ වඩාත් සංයෝජනය වෙමින් පවතින රාජ්‍යය විසින්, වැඩ කරන ජනතාව ඉතා දරුණු ලෙසින් සූරා කනු ලැබීම තව තවත් දරුණු වන්නේය. දියුණු රටවල්, එනම්, ඒවායේ අභ්‍යන්තර ප්‍රදේශ කම්කරුවන් සිර කොට තබන යුද්ධ වරද කරුවන්ට බරපතළ වැඩ සහිත බන්දනාගාර බවට පත් වේ.

දිග්ගැස්සුණු යුද්ධයෙන් ඇති වන අභූත පූර්ව මහා භීතය සහ අන්ත දුක් කම්කටොළු නිසා ජනතාවට දරාගත නොහෙන තත්ත්වයකට ඔවුන් පත්වන අතර, ඔවුන්ගේ කෝපය වැඩි වෙයි. ලෝක නිර්ධන පංති විප්ලවය පැහැදිලි ලෙසම මෝරා එයි. එය හා රාජ්‍යය අතර සම්බන්ධය ගැන වූ ප්‍රශ්නය ප්‍රායෝගික වශයෙන් වැදගත් වෙමින් පවතී.

දශක ගණනාවක් පැවති හා සංසන්දනීය වශයෙන් සාමකාමී වූ සංවර්ධනයක් අතර තුර එකතු වූ අවස්ථාවාදයේ මූලිකාංගයන් හේතුකොට ගෙන, සමාජ-ජාතෝන්මාදවාදය උද්ගත වී තිබේ. එය ලෝකය මුළුල්ලේම ඇති නිල සමාජවාදී පක්ෂ තුළ රජ කරයි. ''සමාජවාදයේ නායකයන්'' ''ඔවුන්ගේ'' ජාතික ධනපති පංතියේ අවශ්‍යතාවය අනුව පහත් ලෙස සහ නිවට ලෙස හැඩ ගැසීමෙන් පමණක් නොව, සහ දුර්වල කුඩා ජාතීන් රාශියක්ම දීර්ඝ කාලයක් තිස්සේ සූරාකෑ සහ වහල් කරගෙන සිටි ඊනියා මහ බලවත් රටවල් බහුතරයෙහි අවශ්‍යතාවයන්ට අනුකූලව ''ඔවුන්ගේ'' රාජ්‍ය වලට ගැලපෙනසේ සකස් වීමෙන්ද, වචනයෙන් සමාජවාදී වන නමුත් ක්‍රියාවෙන් ජාතෝන්මාදවාදී වන (රුසියවේ ප්ලෙහානව්, පොත්‍රෙසව්, බ්‍රෙෂ්කොව්ස්කායා, රුබනොවිච් සහ සුළු වශයෙන් සැහවුණු ආකාරයෙන්, ට්සෙරෙතේලි, චෙර්නොව් සහ සමාගමද,

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ජර්මනියේ ෂෙයිඩමාන්, ලේගින් සහ ඩෙවිඩ් ද, ප්‍රංශයේ සහ බෙල්ජියමේ රෙනොඩෙල්, ගෙද් සහ වැන්ඩර්වෙල්ඩේද එංගලන්තයේ හයින්ඩ්මන් සහ ෆේබියන්වරු[2] ද, යනාදීන් ඇතුළත්) මෙම ප්‍රවණතාවය කැපී පෙනෙන්නේය. ඒ අතර, අධිරාජ්‍යවාදී යුද්ධය, මේ වර්ගයේ වන කොල්ල කා ගත් වස්තුව බෙදා ගැනීමට හා නැවත බෙදා ගැනීමට කරන අධිරාජ්‍යවාදී යුද්ධයක් වේ. ''රාජ්‍යය'' හා සම්බන්ධයෙන් වූ අවස්ථාවාදී දුර්මතවලට විරුද්ධව අරගලයක් නොමැතිව, ජනතාව පොදු වශයෙන් ධනපති පංතියේ බලපෑමෙන්, විශේෂයෙන්ම අධිරාජ්‍යවාදී ධනපති පංතියේ බලපෑමෙන් නිදහස් කර ගැනීම සඳහා අරගලය කිසිසේත් කළ නොහැකිය.

ප්‍රථමයෙන්ම රාජ්‍යය සම්බන්ධයෙන් මාක්ස්ගේ සහ එංගල්ස්ගේ න්‍යායය පරීක්ෂා කරන අපි, අවස්ථාවාදීන් විසින් අමතක කරනු ලබන සහ විකෘති කරනු ලබන එහි අංශ ගැන, විශේෂයෙන් විස්තර සහිතව කරුණු දක්වමු. ඊ ළඟට, මෙම විකෘති කිරීම්වලට ප්‍රධාන වගකිව-යුත්තා වූ කාල් කෞට්ස්කි ගැන කරුණු සඳහන් කරමු. වර්තමාන යුද්ධයේදී, එසේ කාලකණ්ණි ලෙස බංකොලොත් ලැබූ දෙවැනි ජාත්‍යන්තරයේ (1889-1914) වඩාත් ප්‍රකට නායකයා ඔහුය. අවසාන වශයෙන් අපි 1905 සහ විශේෂයෙන්ම 1917 රුසියානු විප්ලවවල අත්දැකීම්වල ප්‍රධාන ප්‍රතිඵල සම්පිණ්ඩනය කරමු. අපට පෙනෙන පරිදි මින් පසු කී විප්ලවයේ ප්‍රථම අවධිය දැන් (1917 අගෝස්තු) සම්පූර්ණ වෙමින් පවතී. නමුත් සමස්තයක් වශයෙන් මෙම විප්ලවය වටහා ගත හැක්කේ, අධිරාජ්‍යවාදී යුද්ධයෙන් හට ගන්නා සමාජවාදී නිර්ධන පංති විප්ලව මාලාවක එක් පුරුකක් ලෙස පමණකි. එනිසා සමාජවාදී නිර්ධන පංති විප්ලවය හා රාජ්‍යය අතර සම්බන්ධය පිළිබඳ ප්‍රශ්නය, ප්‍රායෝගික දේශපාලනය අනුව පමණක් නොව, දවසේ ඉතාමත් හදිසි ප්‍රශ්නයක් වීමේ අර්ථයෙන්ද, පොදු ජනතාව ධනපති දුෂ්ට පාලනයෙන් නිදහස් වීම සඳහා කල් නොයවාම ඔවුන්ට කරන්නට සිදුවන දෙය ඔවුනට විස්තර කර දීමේ අර්ථයෙන්ද, වැදගත් තත්ත්වයක් දරයි.

1917 අගෝස්තු — කර්තෘ

දෙවැනි මුද්‍රණයට පෙරවදන

වෙනසක් නොකරම පාඨයේ මෙම දෙවැනි මුද්‍රණය පළ කෙරේ. දෙවැනි පරිච්ඡේදයට 3 වැනි කොටස පමණක් එකතු කර තිබේ.

මොස්කව්. — කර්තෘ
1918 දෙසැම්බර්, 17

පළමුවැනි පරිච්ඡේදය

පංති සහිත සමාජය සහ රාජ්‍යය

1. රාජ්‍යය — පංති සතුරුතාවයන්ගේ නොසමාදන ස්වභාවය නිසා ඇති වූවකි

මාක්ස්ගේ න්‍යායයට දැන් සිදුවන දෙය, විමුක්තිය සඳහා සටන් කළ පීඩිත පංතිවල විප්ලවවාදී චින්තකයන්ගේ සහ නායකයන්ගේ න්‍යායයන්ට ඉතිහාස කාලය තුළදී නැවත නැවතත් සිදු විය. ශ්‍රේෂ්ඨ විප්ලවවාදීන්ගේ ජීවිත කාලය තුළදී, පීඩක පංති නිරන්තරවම ඔවුන් ලුහුබැඳ ගිය අතර, ඔවුන්ගේ න්‍යායයන් ඉතාමත් රුදුරු ද්වේශයකින්ද, ඉතාමත් දරුණු වෛරයකින්ද,බොරු සහ අපවාද පැතිරවීමේ අති දුර්දාන්ත ව්‍යාපාරවලින්ද පිළිගත්හ. ඔවුන්ගේ අභාවයෙන් පසුව, ඔවුන් අහිංසක ප්‍රතිමා බවට හැරවීමටත්, ඔවුන් මුණිවරයන් බවට පත් කිරීමටත්, එක්තරා ප්‍රමාණයකට පීඩිත පංති ''සැනසීමට'' සහ ඔවුන්ගේ නම් ශුද්ධත්වයට නංවන අතරම, විප්ලවීය න්‍යායයෙහි හරය සොරා ගැනීමටත්, එහි පන්නරය මොට්ට කර එය පිරිහෙළීමටත්, ප්‍රයත්න දරනු ලැබේ. මාක්ස්වාදය මෙසේ සකසා ගැනීම හා සම්බන්ධයෙන්, ධනපතියෝ සහ කම්කරු ව්‍යාපාරය තුළ සිටින අවස්ථාවාදිහු ඒකාකාර අදහස් දරති. ඔවුහු මෙම න්‍යායයෙහි විප්ලවවාදී අංශය, නැතහොත් එහි විප්ලවවාදී ජීවය, ලොප්කර, අඳුරු කර හෝ විකෘති කර දමති. ධනපති පංතියට පිළිගත හැකි හෝ පිළිගත හැකි සේ පෙනෙන දෑ ඉදිරියට තල්ලු කිරීමට හා හුවා දැක්වීමට ඔවුහු කටයුතු කරති. සමාජ-ජාත්‍යොන්මාදවාදීන් සියළු දෙනාම දැන් ''මාක්ස්වාදීන්'' වී ඇත (සිනා නොවන්න!). එපමණක් නොව, ඉතා මෑත කාලයකදී මාක්ස්වාදය සුනු විසුනු කිරීමේ විශේෂඥයන් වූ ජර්මන් ධනපති උගත්තු, ''ජර්මන්-ජාතික'' මාක්ස් ගැන කථා කරමින් කොල්ලකාරී යුද්ධය කිරීම පිණිස එතරම් විශිෂ්ඨ ලෙස සංවිධානය වී සිටින කම්කරු සංගම්වලට ඔහු විසින් අධ්‍යාපනය දෙන ලද බව කියති!

අභූත පූර්ව තරම් ප්‍රචලිත ලෙස මාක්ස්වාදය විකෘති කිරීම ගැන සලකන කල, මෙම තත්ත්වය යටතේ අපගේ මූලික කර්තව්‍යය වන්නේ, රාජ්‍යය

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

පිළිබඳ විෂය ගැන මාක්ස් ඇත්ත වශයෙන් උගැන්වූ දෙය යළිත් තහවුරු කිරීම ය. මේ සඳහා මාක්ස්ගේ හා එංගල්ස්ගේ කෘතිවලින්ම දීර්ඝ කොටස් කීපයක්ම උපුටා දැක්වීම අවශ්‍ය වේ. දීර්ඝ උපුටා දැක්වීම් නිසා පොතෙහි පෙළ නොකිලුටු වන බව සැබෑ නමුත්, එය කියවීමේ පහසුවට කිසිම ආධාරයක් නොවන නමුත්, අපට ඒවා අත්හැර දැමීමට පුළුවන්කමක් නැත. මෙම විෂය ගැන මාක්ස්ගේ හා එංගල්ස්ගේ කෘතිවල එන කොටසේ සියල්ලම, නැතහොත්, යටත්පිරිසෙයින් ඒවායේ ඉතාමත් වැදගත් කොටසේ වත්, හැකි තරම් සම්පූර්ණ ලෙසින් උපුටා දැක්වීම කළ යුතුම වේ. විද්‍යාත්මක සමාජවාදයේ නිර්මාතෘවරයන්ගේ අදහස් සමස්තය හා එම අදහස්වල පරිණාමය ගැන ස්වාධීන අදහසක් ඇති කර ගැනීමට පාඨකයාට හැකි වන්නේ එවිට ය. දැනට බල පවත්වන ''කෞට්ස්කිවාදය'' විසින් එම අදහස් විකෘති කෙරෙන බව ලේඛන අනුව හා පැහැදිලි ලෙස පෙන්නුම් කළ හැකි වන්නේ එවිට ය.

එංගල්ස්ගේ කෘති අතුරෙන් ඉතාමත් ජනප්‍රිය කෘතිය වන, ''පවුල, පෞද්ගලික දේපල සහ රාජ්‍යය ඇතිවූ හැටි'' යන කෘතියෙන් පටන් ගනිමු. එහි හයවැනි සංස්කරණය 1894 තරම් ඈත කාලයක ස්ටුට්ගාර්ට්හිදී පළ කරන ලදී. එයින් උපුටා ගන්නා කොටස් අපට ජර්මන් මුල් පොත්වලින් පරිවර්තනය කර ගැනීමට සිදුවේ. රුසියානු පරිවර්තන රැසක් ඇති නමුත්, ඒවා බොහෝ විට අසම්පූර්ණ ය, නැතහොත්, ඉතාමත් අසතුටුදායක ය.

ඉතිහාසය පිළිබඳ විශ්ලේෂණය සම්පිණ්ඩනය කරමින්, එංගල්ස් මෙසේ කියයි: ''එනිසා, රාජ්‍යය යනු කිසිසේත්ම සමාජය මත පිටතින් පටවන ලද බලයක් නොවේ. එසේම හේගල් කියන ලෙසට, එය 'ආචාර ධර්මානුකූල අදහසේ යථාර්ථය', 'බුද්ධියේ ප්‍රතිමූර්තිය හා යථාර්ථය' නොවන්නේය. එය නම් සංවර්ධනයේ කිසියම් අවධියකදී සමාජය නිපදවන දෙයකි. එය වනාහි, සමාජය තමන්ම සමග නොවිසඳිය හැකි ප්‍රතිවිරෝධයක පැටලී තිබෙන බවත්, එය නොසමහන් කළ හැකි සතුරුතාවයකින් භේද වී තිබෙන හා එම භේදය බැහැර කිරීමට එයට ශක්තිය නොමැති බවත් පිළිගැනීමක් වන්නේය. මෙම සතුරුතාවයන්, නැතහොත්, ඝට්ටනය වන ආර්ථික අවශ්‍යතාවයන් සහිත මෙම පංති විසින්, නිෂ්ඵල අරගලයෙන් තමන් සහ සමාජය ක්ෂය කරනු ලැබීම වළක්වනු පිණිස, සමාජයට ඉහළින් සිටින සේ පෙනෙන හා ඝට්ටනය තුනී කර එය ''සාමයේ'' සීමාවන් තුළ පවත්වාගන්නා බලයක් අවශ්‍ය වීය. ඒ අනුව, සමාජයෙන් උද්ගත වූ එහෙත් සමාජයට ඉහළින් සිටින හා වඩ වඩාත් සමාජයෙන් ඈත් වන එම බලය රාජ්‍යය වේ'' (පිටු 177-178, හයවැනි ජර්මන් මුද්‍රණය).

රාජ්‍යයේ ඓතිහාසික කාර්ය කොටස සහ එහි අර්ථය පිළිබඳව මාක්ස්වාදය දරන අදහස මෙයින් ඉතාමත් පැහැදිලි ලෙස ප්‍රකාශිත වේ. රාජ්‍යය යනු, පංති සතුරුතාවයන්ගේ නොසමාදන ස්වභාවයේ නිමැවුමක් හා සලකුණක් වන්නේ ය. පංති සතුරුතාවයන් වාස්තවික වශයෙන් සාමදන කළ නොහැකි තැන, අවස්ථාවල හා ඒ තාක් දුරට, රාජ්‍යය උද්ගත වන්නේ ය. එසේම, අනිත් අතට පංති සතුරුතාවයන් සමාදන කළ නොහැකි බව රාජ්‍යයේ පැවැත්මෙන් ඔප්පු කෙරේ.

මාක්ස්වාදය විකෘති කිරීම ප්‍රධාන මාර්ග දෙකකින් කෙරෙන අතර, එයට මුල පුරනු ලබන්නේ මෙම ඉතාමත් වැදගත් සහ මූලික කරුණෙනි.

එක් අතකින් අව්වාදී ඓතිහාසික සත්‍යයන්ගේ බලවත්කම හමුවේ, රාජ්‍ය පවත්නේ පංති විරුද්ධතාවයන් හා පංති අරගලයක් පවතින තැනක පමණකැයි යන්න පිළිනොගෙන බැරිව සිටින ධනපති, විශේෂයෙන්ම සුළු ධනපති දෘෂ්ටිවාදීහු, රාජ්‍යය පංති සමගි කිරීම සඳහා පවතින්නක් සේ පෙනෙන ආකාරයෙන් මාක්ස් ''නිදෙස්'' කරති. මාක්ස් කියන ලෙසට පංති අතර සමාදනයක් ඇති කළ හැකිවී නම්, රාජ්‍යය උද්ගත වීමට හෝ එයට පැවතීමට හෝ හැකියාවක් නොතිබිණි. ඉතාමත් නිරන්තර සහ කාරුණික ලෙස මාක්ස් ගැන සඳහන් කරන සුළු ධනපති සහ අශිෂ්ටවාදී මහාචාර්යවරුන් හා ප්‍රකාශකයින් කියන දෙයින් පෙනෙන්නේ, රාජ්‍යය විසින් පංති අතර සමාදනයක් ඇති කෙරෙන බවකි. මාක්ස් කියන ලෙසට රාජ්‍යය පංති පාලනයේ අවයවයකි; එක් පංතියක් විසින් තවත් පංතියක් පීඩනයට පත්කිරීම පිණිස යොදගනු ලබන අවයවයකි; එය පංති අතර ඝට්ටනය තුනී කිරීමෙන්, මෙම පීඩනය නීත්‍යානුකූල කිරීමක් හා නිත්‍යභාවයට පත් කිරීමක් වන්නේ ය. එසේ වී නමුත්, සුළු ධනපති දේශපාලනඥයන්ගේ මතයේ හැටියට, සාමය යනුවෙන් අදහස් කෙරෙන්නේ, එක පංතියක් විසින් තවත් පංතියක් පීඩාවට පත් කිරීම නොව; පංති අතර සමාදනය ය; ඝට්ටනය තුනී කිරීම... පීඩකයන් බලෙන් පහකර දැමීම සඳහා අරගල කිරීමේ නිශ්චිත මාර්ග හා විධික්‍රම පීඩිත පංතිවලට අහිමිකිරීම නොව, පංති අතර සමාදනය ඇති කිරීම ය.

නිදසුනක් වශයෙන්, 1917 විප්ලවයේදී රාජ්‍යයේ කාර්ය කොටස පිළිබඳ ප්‍රශ්නය, එහි සම්පූර්ණ විශාලත්වයෙන්ම, අප්‍රමාද ක්‍රියාකාරිත්වය, හා එසේම, පොදුජන පරිමාණයේ ක්‍රියාකරිත්වය අපේක්ෂා කරන, ප්‍රායෝගික ප්‍රශ්නයක් වශයෙන් උද්ගත වූ විට, සමාජවාදී-විප්ලවවාදීහු[3]

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සහ මෙන්ෂෙවික්වරු[4] සියළු දෙනාම, ''රාජ්‍යය'' පංති අතර ''සමාදනය'' ඇති කරන්නේ ය යන න්‍යායය කරා එක්වරම පහත වැටුණහ. මෙම පක්ෂ දෙකෙහිම දේශපාලනඥයන් ඉමක් කොනක් නැතිව කළ යෝජනා සහ ලියූ ලිපි මෙම සුළු ධනපති සහ අශිෂ්ටවාදී ''සමාදන කිරීමේ'' න්‍යායයෙන් සම්පූර්ණයෙන්ම පිරී ඉතිරී ගොස් ඇත. රාජ්‍යය යනු ස්වකීය ප්‍රතිද්‍රැවය (ඊට ප්‍රතිවිරුද්ධ පංතිය) සමග සමගි විය නොහැකි නිශ්චිත පංතියක අවයවයකැයි යන්න, සුළු ධනපති ප්‍රජාතන්ත්‍රවාදීන්ට කිසි කලෙකත් වටහා ගත නොහැකි දෙයකි, සමාජවාදී-විප්ලවවාදීන් සහ මෙන්ෂෙවික්වරුන් සමාජවාදීන් නොව (එය බොල්ෂෙවික්වරුන් නිතරම කී දෙයකි), සමාජවාදී පෙනුමෙන් යුත් වදන් උපයෝගි කර ගන්නා සුළු ධනපති ප්‍රජාතන්ත්‍රවාදීන් වන බව ඉතාමත් සිත් කාවදින ලෙස පෙන්වන ලකුණුවලින් එකකි, ඔවුන් රාජ්‍යය කෙරෙහි දක්වන ආකල්පය.

අනිත් අතට ''කෞට්ස්කිවාදයෙන්'' කෙරෙන මාක්ස්වාදයේ විකෘතිය, ඊට වඩා බොහෝ සෙයින් සියුම්ය. රාජ්‍යය පංති ආධිපත්‍යයේ අවයවයක් වන බව හෝ, පංති සතුරුතාවයන් සමාදන කළ නොහැකි බව හෝ එයින් ''න්‍යායික වශයෙන්'' ප්‍රතික්ෂේප කරනු නොලැබේ. නමුත්, එයින් අමතක කරනු ලබන දෙය මෙය යි: රාජ්‍යය පංති විරුද්ධතාවයන්ගේ නිමැවුමක් වන්නේ නම්, එය සමාජයට ඉහළින් සිටින සහ එයින් වඩ වඩාත් ඈත්වන බලයක් නම්, පීඩිත පංතියේ විමුක්තිය ලබා ගැනීම, හිංසනය සහිත විප්ලවය නොමැතිව පමණක් නොව, පාලක පංතිය විසින් නිර්මාණය කෙරුණු හා මෙම ''ඈත්වීමේ'' මූර්තිය වන රාජ්‍ය බල යන්ත්‍රය විනාශ කිරීම නොමැතිවද, කිසිසේත්ම කළ හැක්කක් නොවන්නේය. තවත් ඉදිරියේදී අපට පෙනී යනු ඇති පරිදි, විප්ලවයේ කර්තව්‍යයන් ගැන නියත ඓතිහාසික විශ්ලේෂණය පිටිවහල් කොට ගනිමින් මාක්ස්, මෙම න්‍යායික වශයෙන් නිරායාස පැහැදිලිතාවයකින් යුත් නිගමනය වෙත ප්‍රත්‍යක්ෂ ලෙසම එළඹියේය. එහෙත් කෞට්ස්කි අමතක කර සහ විකෘති කර තිබෙන්නේ මෙම නිගමනය බව අපි ඉදිරියේදී සවිස්තරව පෙන්වා දෙන්නෙමු.

2. ආයුධ සන්නද්ධ විශේෂ පිරිස්, සිරගෙවල්, ආදිය

එංගල්ස් තවදුරටත් මෙසේ ලියයි.

> ''පැරණි වංශික (ගෝත්‍ර හෝ ගණ ගෝත්‍ර) ක්‍රමයෙන් රාජ්‍යය වෙනස්වන්නේ, ප්‍රථමයෙන්ම, තම වැසියන් ප්‍රදේශ අනුව බෙදීමෙන් ය.''

මෙය ස්වාභාවික බෙදීමක් ලෙසට අපට පෙනෙන නමුත්, එය ඇතිවීම සඳහා පැරණි පරම්පරා, නැතහොත්, වංශ අනුව පැවත ආ සංවිධානයට විරුද්ධව, දීර්ඝ අරගලයක් අවශ්‍ය විය.

''අමුත්ත දනවන අංග ලක්ෂණය වූයේ, ජනගහනය ආයුධ සන්නද්ධ බලවේගයක් ලෙසට සංවිධානය වීම සමග තවදුරටත් එක එල්ලේම සම්පාත නොවන පොදුබලයක් ස්ථාපිත කිරීම ය. පංති වශයෙන් බෙදී යාමේ හේතුවෙන් ජනගහනයේ ස්වයංක්‍රියාකාරී ආයුධ සන්නද්ධ සංවිධානයක් ඇති කළ නොහැකිව තිබෙන හෙයින් මෙම විශේෂ පොදු බලය අවශ්‍ය වේ... මෙම පොදු බලය සෑම රාජ්‍යයකම ඇත්තේය. එය හුදෙක් ආයුධ සන්නද්ධ පිරිසකින් පමණක් නොව, ද්‍රව්‍යමය උප සංවිධාන, සිර ගෙවල් සහ, ගණ-ගෝත්‍ර (වංශ) සමාජය කිසිසේත් නොදත්, සියළුම වර්ගවල බලහත්කාරී ආයතනවලින්ද සමන්විතය...''

රාජ්‍යය යයි කියනු ලබන ''බලය'' පිළිබඳ සංකල්පය පැහැදිලි කරමින් එය සමාජයෙන් උද්ගත වූ, එහෙත් එයට ඉහළින් සිටින සහ එයින් වඩ වඩාත් ඈත්වන බලයක් ලෙසට එංගල්ස් විස්තර කරයි. මෙම බලය ප්‍රධාන වශයෙන් සංයුක්ත වන්නේ කුමකින් ද? එය සමන්විත වන්නේ, ස්වකීය අණසක යටතේ පවතින සිර ගෙවල් ආදිය ඇති ආයුධ සන්නද්ධ විශේෂ පිරිස්වලිනි.

සෑම රාජ්‍යයකම ගුණාංගයක් වන පොදු බලය, ස්වකීය ''ස්වයංක්‍රියාකාරී ආයුධ සන්නද්ධ සංවිධානය'' සහිත ආයුධ සන්නද්ධ ජනගහනය සමග එක එල්ලේම සම්පාත නොවන'' හෙයින්, අප ආයුධ සන්නද්ධ විශේෂ පිරිස් ගැන කතා කිරීම සාධාරණය.

බලපවත්නා අශිෂ්ටවාදය විසින්, අඩුවෙන්ම අවධානයට ලක් වීමට සුදුසු සේ සලකනු ලබන දෙය, එනම්, ගැඹුරට මුල් ඇද පමණක් නොව පාෂාණීභූතව ද ඇතැයි කෙනෙකුට කිව හැකි දුර්මත මගින් ශුද්ධත්වයට පත් කෙරුණු දෙය, කෙරෙහි පංති විඥානය ඇති කම්කරුවන්ගේ අවධානය යොමු කිරීමට, සියළුම ශ්‍රෙෂ්ඨ විප්ලවවාදී චින්තකයන් සේම එංගල්ස් ද උත්සාහ කළේය. ස්ථිර යුද්ධ හමුදවක් සහ පොලිසිය රාජ්‍ය බලයේ ප්‍රධානම උපකරණ වෙයි. එහෙත්, ඊට වඩා වෙනස් තත්ත්වයක් ඇති විය හැකිද?

ඒ අනුව එංගල්ස් විසින් අමතන ලද හා එකම මහා විප්ලවයක්වත් අත් දැකීමට හෝ සමීප ලෙස නිරීක්ෂණය කිරීමට හෝ අවස්ථාව නොලද, දහනව වැනි ශතවර්ෂයාවසානයේ යුරෝපීයයන් බහුතරයෙහි දෘෂ්ටි කෝණය අනුව, ඊට වඩා වෙනස් තත්ත්වයක් ඇතිවීමට ඉඩ නොතිබිණි.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

''ජනගහනයේ ස්වයං ක්‍රියාකාරී ආයුධ සන්නද්ධ සංවිධානය'' යනු කුමක්දැයි වටහාගැනීමේ හැකියාව ඔවුනට කිසිසේත්ම නොතිබිණි. සමාජයට ඉහළින් සිටින්නාවූ හා එයින් ඈත්වන්නාවූ ආයුධ සන්නද්ධ පිරිස් (පොලිසිය හා ස්ථිර යුද්ධ හමුදව) අවශ්‍ය වූයේ මන්දැයි ඇසූ කල, ස්පෙන්සර්ගෙන් හෝ මිහයිලොව්ස්කිගෙන් හෝ ණයට ගත් වදන් කීපයක් දෙඩවීමට, නැතහොත්, සමාජ ජීවිතයේ වර්ධනය වන සංකීර්ණත්වය, කාර්යයන් වෙන්වීම, යනාදිය ගැන සඳහන් කිරීමට, බටහිර යුරෝපීය සහ රුසියානු අවරසිකයෝ නැඹුරු වෙති.

එවැනි සටහනක් ''විද්‍යාත්මක'' ලෙසට පෙනෙන අතරම, වැදගත් සහ මූලික කරුණ වන සමාජය අසමාදන සතුරු පංතිවලට බෙදී ඇතැයි යන්න ව්‍යාකූල කර, සාමාන්‍ය තැනැත්තා නිද්‍රා ගත කරමින් සාර්ථක ලෙස ඔහු නැලවිල්ලට පත් කරයි.

මෙම භේදය නිසා නොවී නම්,'' ජනතාවගේ ස්වයං-ක්‍රියාකාරී ආයුධ සන්නද්ධ සංවිධානය, එහි සංකීර්ණත්වය, උසස් තාක්ෂණික මට්ටම, යනාදිය හේතුකොට ගෙන පමණක් මුගුරු ලෙළවන වානර රංචුවල, ආදි කල්පික මිනිසුන්ගේ, නැතහොත්; වංශ තුළ එකමුතු වූ මිනිසුන්ගේ ආදි කල්පික සංවිධානයට වඩා වෙනස් වනු ඇත. එසේ වුවද, එවැනි සංවිධානයක් ඇතිකිරීමේ හැකියාව තවමත් ඇත.

ශීලාචාර සමාජය සතුරු පංති වශයෙන් පමණක් නොව, සමාදන නොකළ හැකි සතුරු පංති වශයෙන් බෙදී සිටින නිසා සහ ඒවා ''ස්වයං-ක්‍රියාකාරී'' ලෙස ආයුධ සන්නද්ධ වීමෙන් ඒවා අතර අවිගත් අරගලයකට මග සැලසෙනු හැකි හෙයින්, මෙය කිසිසේත් කළ හැකි නොවේ. රාජ්‍යයක් පැන නගී. විශේෂ බලයක් නිර්මාණය කරනු ලැබේ. ආයුධ සන්නද්ධ පිරිස්වලින් යුත් බලමුළු ඇති කරනු ලැබේ. ඒ අනුව, සෑම විප්ලවයක්ම රාජ්‍ය යන්ත්‍රය විනාශ කරමින්, අපට නිරාවරණ පංති අරගලය ගෙන හැර පාන්නේය. එහිදී පාලක පංති තමන්ට සේවය කරන පිරිස්වලින් යුත් විශේෂ බලමුළු යළිත් ස්ථාපිත කිරීමට ප්‍රයත්න දරන සැටිත්, පීඩිත පංති මෙම වර්ගයේ අළුත් සහ පීඩකයනට නොව පීඩිතයනට සේවය කිරීමෙහි සමත් සංවිධානයක් නිර්මාණය කිරීමට වෙර දරන සැටිත්, එය අපට මැනවින් පෙන්වා දෙයි.

ඉහත සඳහන් තර්කයෙන් එංගල්ස් න්‍යායික ලෙස මතු කරන්නේ, සෑම මහා විප්ලවයක්ම විසින් අප හමුවේ ව්‍යවහාරයේදී, ඉතා විවෘතව හා ඊටත් වඩා පොදුජන පරිමාණයෙන් මතුකෙරෙන එම ප්‍රශ්නයමය; එනම්, ආයුධ සන්නද්ධ පිරිස්වලින් යුත් ''විශේෂ'' බලමුළු සහ ''ජනගහනයේ ස්වයං-ක්‍රියාකාරී ආයුධ සන්නද්ධ සංවිධානය'' අතර සම්බන්ධය පිළිබඳ

ප්‍රශ්නය ය. යුරෝපීය සහ රුසියානු විප්ලවය මෙම අත්දැකීම කෙසේ පිළිබිඹු කරන්නේදැයි යන්න අපට පෙනී යනු ඇත.

එහෙත් එංගල්ස්ගේ විග්‍රහය වෙත ආපසු යමු.

නිදසුනක් ලෙසට උතුරු ඇමෙරිකාවේ සමහර කොටස් ගෙන හැර දක්වමින්, සමහරවිට මෙම පොදු බලය දුර්වල (ඔහු අදහස් කරන්නේ ධනපති සමාජයේ දුර්ලභ විශේෂතාවයක් සහ නිදහස් යටත් විජිතවාදීන් ප්‍රබලව සිටි පූර්ව-අධිරාජ්‍යවාදී උතුරු ඇමෙරිකාවේ එම කොටස් ගැන ය) බවත්, නමුත් සාමාන්‍ය වශයෙන් කියතොත් එය ශක්තියෙන් වර්ධනය වන බවත්, ඔහු පෙන්වා දෙයි.

> ''එය (සමාජමය බලය) ශක්තියෙන් වර්ධනය වෙන්නේ රාජ්‍ය තුළ පංති සතුරුතාවයන් උග්‍රවීමට සහ යාබද රාජ්‍යයන් විශාලවීමට හා ජනගහනයෙන් වැඩිවීමට අනුපාතික වශයෙනි. මෙහිදී අප අද අපගේ යුරෝපය දෙස බැලීම ප්‍රමාණවත් වේ. එහි පංති අරගලය සහ රටවල් අල්ලා ගැනීමේ තරඟය විසින් පොදු බලය කොතරම් තදින් ක්‍රියා කරවනු ලැබේද යත්, මුළු සමාජය සහ රාජ්‍යය පවා ගිලගැනීමේ තර්ජනයක් එයින් ඉදිරිපත් වේ.''

මෙය ලියන ලද්දේ පසුගිය ශතවර්ෂයේ අනූ ගණන්වල මුල් කාලයට වඩා මෑතකදී නොවේ. එංගල්ස්ගේ අවසාන පෙරවදන 1891 ජූනි 16 යනුවෙන් දතම් කර ඇත. ඒ වන විට අධිරාජ්‍යවාදය දෙසට හැරීම, එනම්, සංගත ව්‍යාපාරවල පූර්ණ ආධිපත්‍යය, ලොකු බැංකුවල සර්වබලධාරිත්වය, දැවැන්ත පරිමාණ යටත් විජිත ප්‍රතිපත්තියක් යනාදිය, යම්තමින් ප්‍රංශයේ ආරම්භවෙමින් පැවතුණා පමණකි. ඉන් මෙපිට කාලයේදී ''රටවල් අල්ලාගැනීමේ තරඟය'', යෝධ පියවර ගනිමින් වැඩී ඇත. එසේ වීමට අන් සියල්ලටම වඩා හේතු වූයේ විසිවැනි ශතවර්ෂයේ දෙවන දශකය ආරම්භ වන විට ''රටවල් අල්ලාගැනීමේ තරඟකරුවන් අතර'' ලෝකය මුළුමනින්ම බෙදගෙන තිබීමය. එතැන් පටන් යුද්ධ හා නාවුක අවි ආයුධ විස්මිත ලෙස වර්ධනය වීම සහ බ්‍රිතාන්‍යයට හෝ ජර්මනියට ලෝකාධිපත්‍යය අත්පත් කරගැනීම සඳහාද, කොල්ල කෑ වස්තුව බෙදු ගැනීම සඳහාද, කරන ලද 1914-1917 කොල්ලකාරී යුද්ධය කරණකොටගෙන, සමාජයේ සියලුම බලවේගයන් ප්‍රචණ්ඩ රාජ්‍යය විසින් ''ගිල ගැනීම'' සම්පූර්ණ විනාශයකට ආසන්නවූ තත්ත්වයකට ගෙනවුත් තිබේ.

''රටවල් අල්ලාගැනීමේ තරඟය'' මහ බලවත් රටවල විදේශ ප්‍රතිපත්තියේ ඉතාමත් වැදගත් හා එහි විශේෂතාවය පෙන්වන අංග ලක්ෂණයන් අතුරෙන් එකක් ලෙසට පෙන්වාදීම, 1891 තරම් ඈත කාලයකදී එංගල්-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ස්ට කළ හැකි විය. එහෙත්, මෙම තරහය බොහෝ වරක් උත්සන්න වූ හා අධිරාජ්‍යවාදී යුද්ධයක් උද්ගතවූ 1914-1917 වර්ෂවල පටන් මේ දක්වාම සමාජ-ජාත්‍යාන්මාදවාදී අධමයෝ ''පිතෘ භූමිය ආරක්ෂා කිරීම'', ''සමූහාණ්ඩුව සහ විප්ලවය ආරක්ෂා කිරීම'' ආදිය වැනි වූ වදන් මාලා උපයෝගි කරගනිමින් ''ඔවුන්ගේ ම'' ධනපති පංතියේ කොල්ලකාරී උවමනාවන් ආරක්ෂා කිරීම වසං කිරීමෙහි යෙදී සිටියහ.

3. රාජ්‍යය, පීඩිත පංතිය සූරාකෑමේ උපකරණයකි

සමාජයට ඉහළින් සිටින විශේෂ සමාජමය බලය පවත්වා ගැනීම පිණිස අයබදු ණය සහ රාජ්‍ය ණය මුදල් උවමනා වේ.

> ''සමාජමය බලයත් අයබදු ගැනීමේ අයිතියත් ඇතිව සිටින නිලධාරීහු, දැන් සමාජයේ ඉන්ද්‍රියයන් ලෙසට සමාජයට ඉහළින් සිටිති'' යි එංගල්ස් ලීවේය. ''ගණගෝත්‍ර (වංශ) ව්‍යවස්ථාවේ ඉන්ද්‍රියයන් වෙත පුදන ලද නිදහස් ස්වේච්ඡා ගෞරවය ලබාගැනීමේ හැකියාවක් ඔවුනට තිබුණත්, ඔවුන් ඉන් සතුටට පත් වූයේ නැත...'' නිලධාරීන්ගේ ශුද්ධත්වය හා මුක්තිය ප්‍රකාශයට පත් කරමින් විශේෂ නීති පනවනු ලැබේ: ''ඉතාමත් අවලම් පොලිස් සේවකයා'' පවා වංශ නියෝජිතයන්ට වඩා ''අධිකාරයක්'' ඇතිව සිටින නමුත්, සභ්‍ය රාජ්‍යයක යුද්ධ බලයේ ප්‍රධානියා පවා සමාජයේ ''නිරායාස ගරුත්වය'' ලබන වංශ දෙටුවකු ගැන ඊර්ෂ්‍යාවට පත්වන්නට ඉඩ තිබේ.

රාජ්‍ය බල ඉන්ද්‍රියයන් වශයෙන් නිලධාරීන් දරන වරප්‍රසාද සහිත තත්ත්වයන් පිළිබඳ ප්‍රශ්නය මෙයින් මතු කර තිබේ. එයින් පෙන්නුම් කෙරෙන ප්‍රධාන කරුණ මෙයයි: ඔවුන් සමාජයට වඩා ඉහළින් තැබීමට හේතු වන්නේ කුමක් ද? 1871 පැරිස් කොමියුනය ව්‍යවහාරික වශයෙන් මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයුවේ කෙසේද යනුත්, 1912 දී ප්‍රතිගාමී ප්‍රතිෂ්ඨාවක් ගත් කෞට්ස්කි විසින් එය යටපත් කරන ලද්දේ කෙසේද යනුත්, විමසා බලමු.

> ''රාජ්‍යය උද්ගත වූයේ පංති සතුරුකම් වළක්වා තැබීමේ අවශ්‍යතාවයෙන් වන නිසා ද, ඒ අතරම එය පැන නැංගේ මෙම පංතිවල සට්ටනය මධ්‍යයේම වන නිසා ද, සාමාන්‍ය වශයෙන්ම එය, ඉතාමත් ප්‍රබල හා ආර්ථික වශයෙන් අධිපතිත්වය දරන පංතියේ රාජ්‍යය වන්නේය. එම පංතිය, රාජ්‍යය මාධ්‍යයක් කොට ගනිමින් දේශපාලන වශයෙන් අධිපති පංතිය බවටද පත් වන්නේය. එසේ කිරීමෙන් එය පීඩිත පංතිය යටත් කර තැබීමේ හා සූරා කෑමේ නව මාර්ගයක් අත්පත් කරගන්නේය...'' පෞරාණික සහ වැඩවසම් රාජ්‍යයන් වහලුන් සහ ප්‍රවේණිදාසයන් සූරාකෑමේ බලායතන විය. එමෙන්ම, ''නවීන නියෝජිත රාජ්‍යයද ප්‍රාග්ධනය විසින් වේතන ශ්‍රමය සූරා කෑමේ උපකරණයක් වේ. එසේ වුවද, අසාමාන්‍ය සිදුවීමක් ලෙසට, යුද්ධවදින පංති ඉතාමත් ආසන්න වශයෙන් අන්‍යොන්‍ය තුලනයට පත්වන කාල පරිච්ඡේද ඇතිවන්නේය. එවිට මැදිහත් වන්නාගේ වේශයෙන් පෙනී සිටින රාජ්‍යබලය, මඳ අවස්ථාවකට දෙපාර්ශ්වයෙන්ම කිසියම් ප්‍රමාණයක ස්වාධීනත්වයක් අත්කර ගනියි...'' දහහත්වැනි හා දහඅටවැනි ශතවර්ෂවල ඒකාධිපති රාජාණ්ඩුද, ප්‍රංශයේ පළමුවැනි සහ දෙවැනි සමූහාණ්ඩුවල බොනපාට්වාදයද, ජර්මනියේ බිස්මර්ක් පාලනයද එසේ විය.

සෝවියට් සභා නිකම්ම විසුරුවා හැරීමට ප්‍රමාණවත් තරම් ශක්තියක් ධනපති පංතියට තවමත් නොමැතිව තිබියදී, සුළු ධනපති ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ නායකත්වය නිසා එම සෝවියට් සභා ඒවන විටත් බෙලහීනත්වයට පත්ව තිබුණු අවස්ථාවක, සමූහාණ්ඩුවක් ඇති රුසියාවේ කෙරෙන්ස්කි ආණ්ඩුව විප්ලවවාදී නිර්ධන පංතියට තාඩන පීඩන කිරීමට පටන් ගත් හෙයින් එම ආණ්ඩුවද එම ගණයටම අයත් වන බව අපි එකතු කරමු.

> ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවක, ප්‍රථමයෙන්ම, ''නිලධාරීන්ට (ඇමෙරිකාවේ මෙන්) කෙළින්ම අල්ලස් දීමෙන්ද'', දෙවැනිව (ප්‍රංශයේ සහ ඇමෙරිකාවේ මෙන්) ''ආණ්ඩුව සහ ව්‍යාපාර පොළ අතර සන්ධානයක්'' ඇති කිරීම මගින්ද ''ප්‍රාග්ධනය එහි බලය අනියම් ලෙසින් ක්‍රියාත්මක කරයි'' යනුවෙන් එංගල්ස් තව දුරටත් සඳහන් කරයි.

වර්තමානයේදී අධිරාජ්‍යවාදය සහ බැංකුවල ආධිපත්‍යය සුවිශේෂ කලාවක් සේ ''සංවර්ධනය'' වී තිබේ. සියළුම ආකාරයේ ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩු තුළ ධනයෙහි සර්වබලධාරිත්වය ආරක්ෂා කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ මෙම ක්‍රම දෙකම එසේ සංවර්ධනය වී ඇත. නිදසුනක් ලෙසට, රුසියාවේ ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවේ ප්‍රථම මාස කීපය තුළදී, අයෙකුට කිවහැකි පරිදි, සභාග ආණ්ඩුව තුළ ධනපති පංතිය සමග කරකාරයට

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

බැදුණු ''සමාජවාදී'' සමාජවාදී විප්ලවවාදීන්ගේ සහ මෙන්ෂෙවික්වරුන්ගේ මධු සමය කාලයේ දී, ධනපතියන් හා ඔවුන්ගේ මංකොල්ලකාරී ක්‍රියා මැඩලීමේ අටියෙන් ගන්නා ලද සෑම පියවරකටම පල්චින්ස්කි මහතා බාධාකළ නිසාද, පසුව ඔහු ඇමති මඩුල්ලෙන් ඉල්ලා අස්වීමෙන් (සහ ඒ වෙනුවට, ඔහුට බොහෝ සෙයින්ම සමාන පල්චින්ස්කි කෙනෙකු පත් කිරීමෙන්) අනතුරුව වසරකට රූබල් 1,20,000 ක් සහිත රැකියාවක් දීමෙන් ධනපතියන් ඔහුට ''ත්‍යාග ප්‍රදානය'' කළ නිසාද — ඔබ එය විස්තර කරන්නේ කෙසේද? එය කෙළින්ම හෝ අනියම් ලෙස අල්ලස් දීමක්ද? ආණ්ඩුව හා සම්මේල අතර සන්ධානයක් ද? නැතහොත් ''හුදෙක්'' මිත්‍ර සම්බන්ධකම් පමණක් ද? චෙර්නොව්ලා, ට්සෙරෙතේලිලා, අව්ක්සෙන්තියෙව්ලා සහ ස්කෝබිලෙව්ලා ඉටුකරන්නේ කුමණ කාර්ය කොටසද? ඔවුන් භාණ්ඩාගාර සොරුන්ගේ ''ඍජු'' මිත්‍රයන් නැතහොත්, අනියම් මිත්‍රයන් පමණක් වන්නේද?

ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවකදී ''ධනපති'' සර්වබලධාරිත්වය වඩාත් ඒකාන්ත දෙයක් වීමට තවත් හේතුවකි, එය ධනපති ක්‍රමයේ දේශපාලන යන්ත්‍රයේ දුර්වලකම් කෙරෙන් හෝ එහි දුර්වලකම් සහිත දේශපාලන පිට කවරයෙන් හෝ ආධාරයක් නොපැතීම. ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවක් යනු ධනපති ක්‍රමයට තිබිය හැකි ඉතාමත් හොඳ දේශපාලන පිට කවරය වන්නේය. එනිසා, ධනපති ක්‍රමය, මෙම ඉතාමත් හොඳ දේශපාලන පිට කවරය (පල්චින්ස්කිලා, චෙර්නොව්ලා, ට්සෙරෙතේලිලා සහ සමාගම මගින්) ලබාගත් පසු, ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවේ පුද්ගලයන්, ආයතන හෝ පක්ෂ පිළිබඳ කිසිම වෙනස්වීමකින් තමන් නොසෙල්වෙන පරිදි එය ස්වකීය බලය සුරක්ෂිත ලෙස හා ශක්තිමත් ලෙස ස්ථාපිත කරයි.

සර්වජන ඡන්දය ද, ධනපති පංති පාලනයේ උපකරණයක් වන බව එංගල්ස් ඉතාමත් පැහැදිලි ලෙස ප්‍රකාශ කර තිබෙන බව අප සටහන් කර ගත යුතුය. සර්වජන ඡන්දය යනු

> ''කම්කරු පංතියේ පැසුණු ස්වභාවය දක්වන මිම්ම වන්නේය. වර්තමාන රාජ්‍යය තුළ එයට ඊට වැඩි කිසිවක් ලැබිය නොහැකිය, නොලබනු ඇත.''

මෙසේ කීමේදී එංගල්ස් ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ දීර්ඝ අත් දැකීම සැලකිල්ලට ගත් බව පැහැදිලිය.

සමාජවාදී-විප්ලවවාදීන් සහ මෙන්ෂෙවික්වරුන් වැනි අපගේ සුළු ධනපති ප්‍රජාතන්ත්‍රවාදීන්ද, බටහිර යුරෝපයේ සියළුම සමාජ-ජාත්‍යෝන්මාදවාදීන් සහ අවස්ථාවාදීන් වන ඔවුන්ගේ නිවුන් සහෝදරවරුන්ද

සර්වජන ඡන්දයෙන් අපේක්ෂා කරන්නේ මෙම ''වැඩි'' දෙයම ය. ''වර්තමාන රාජ්‍යයේ'' සර්වජන ඡන්දය, වැඩකරන ජනතාවගේ බහුතරයෙහි කැමැත්ත ප්‍රකාශ කිරීමෙහි හා එය ඉටු කිරීමෙහි ඇත්ත වශයෙන්ම සමත්වෙතිය යන සාවද්‍ය මතය තමන්ම පිළිගන්නා ඔවුහු, එය ජනතාවගේ සිත තුළට ඇතුළු කරති.

මෙහිදී අපට කළ හැක්කේ මෙම වැරදි අදහස ගැන සඳහන් කිරීමත්, ''නිල'' (එනම්, අවස්ථාවාදී) සමාජවාදී පක්ෂවල ප්‍රචාරයේ සහ උද්ඝෝෂණයේ සෑම පියවරකදීම එංගල්ස්ගේ ඉතාමත් පැහැදිලි, නිශ්චිත හා නියත ප්‍රකාශය විකෘති කරනු ලබන බව පෙන්වා දීමත් පමණකි. එංගල්ස් මෙයින් බැහැර කර ලන මෙම මතයේ අන්ත සාවද්‍යතාවය ගැන විස්තර සහිත හෙළිදරව් කිරීමක්, ''වර්තමාන'' රාජ්‍යය ගැන මාක්ස්ගේ හා එංගල්ස්ගේ අදහස් ගැන අපගේ වැඩිදුර විස්තරයෙහි ඇතුළත් කර තිබේ.

එංගල්ස්ගේ අදහස්වල සාමාන්‍ය සම්පිණ්ඩනයක් ඔහුගේ වඩාත්ම ජනප්‍රිය කෘතියෙහි දක්වා ඇත්තේ පහත සඳහන් වචනවලිනි:

> ''එසේ නම්, රාජ්‍යය සදා කල්හිම පැවතියේ නොවේ. එය නොමැතිව කටයුතු කළ සහ රාජ්‍යය හා රාජ්‍ය බලය ගැන හැඟීමක් නොමැතිව පැවති සමාජ තිබී ඇත. සමාජය පංතිවලට බෙදීයාම සමග අවශ්‍යයෙන්ම බැඳුනු ආර්ථික සංවර්ධනයේ එක්තරා අවධියකදී, මෙම භේදවීම නිසා රාජ්‍යය අවශ්‍ය දෙයක් වූයේය. නිෂ්පාදනයේ සංවර්ධනයෙහි දී අප දැන් වේගයෙන් ළඟා වෙමින් සිටින්නේ මෙම පංති අනවශ්‍ය දෙයක් පමණක් නොව, ඒවා නිෂ්පාදනයට ඒකාන්ත බාධකයක්ද වන අවධියකට ය. මුල් අවධියකදී ඒවා පැන නැංග තරම්ම අනිවාරණීය ලෙසට ඒවා ඇද වැටෙනු ඇත. ඒවා සමග රාජ්‍යය අනිවාරණීය ලෙසට ඇද වැටෙනු ඇත. නිෂ්පාදකයන්ගේ නිදහස් සහ සමාන සමාගම් ගත වීමක් පදනම් කරගෙන නිෂ්පාදනය ප්‍රතිසංවිධානය කරන සමාජය, රාජ්‍යයේ මුළු යන්ත්‍රයම එයට සුදුසු තැන, එනම්, කපු කටින චරකය හා ලෝකඩ පොරොව සමග එක පෙළට සිටින සේ පුරාවස්තු තබන කෞතුකාගාරයක ලනු ඇත''.

මෙම ඡේදය, වර්තමාන සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ ප්‍රචාරක හා උද්ඝෝෂණ සාහිත්‍යයෙහි අපට නිතර හමුවන්නක් නොවේ. අපට එය හමු වුවත්, දක්නට ලැබෙන්නේ අයෙක් දේව ප්‍රතිමා ඉදිරියේ වැඳ වැටෙන ආකාරයෙන් එය උපුටා දක්වා තිබෙන බවය; නැතහොත් එංගල්ස්ට නිල වශයෙන් ගෞරව දැක්වීමට එසේ කර තිබෙන බව හා මෙසේ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

''රාජ්‍යයේ මුළු යන්ත්‍රයම පුරාවස්තු තබන කෞතුකාගාරයක'' ලෑමෙන් අදහස් කෙරෙන විප්ලවයේ පුළුල් ස්වභාවය හා ගැඹුර මැන බැලීමට උත්සාහ නොකරනු ලබන බව ය. රාජ්‍ය යන්ත්‍රය යනුවෙන් එංගල්ස් විස්තර කරන දෙය පිළිබඳ වැටහීමක් තිබෙන බවක් පවා බොහෝ අවස්ථාවලදී අපට දක්නට නොලැබේ.

4. රාජ්‍යය ''හැකිළීයාම'' සහ ප්‍රචණ්ඩ විප්ලවය

''රාජ්‍ය හැකිලී යාම'' පිළිබඳ වූ එංගල්ස්ගේ වදන් ඉතා පුළුල් ලෙස ප්‍රචලිතය. බොහෝ විට ඒවා උපුටා දක්වනු ලැබේ. එසේම අවස්ථාවාදයට ගැලපෙන සේ සුපුරුදු ලෙස මාක්ස්වාදය අනුවර්තනය කරගැනීමේ හරයද එයින් පැහැදිලි ලෙස හෙළිදරව් වේ. එනිසා අපි ඒවා ගැන විස්තර සහිතව කරුණු සඳහන් කළ යුත්තෙමු. උපුටාගන්නා ලද වචන අන්තර්ගත මුළු තර්කයම අපි ගෙනහැර දක්වන්නෙමු.

> ''නිර්ධන පංතිය රාජ්‍ය බලය අල්වාගෙන, ප්‍රථමයෙන්ම, නිෂ්පාදන මාර්ග රාජ්‍ය දේපල බවට පත් කරයි. නමුත් එසේ කිරීමේදී එය නිර්ධන පංතිය වශයෙන් තමන්ම අහෝසි කර ගනියි; සියළුම පංති වෙනස්කම් සහ පංති සතුරුතාවයන් අහෝසි කරයි; එසේම රාජ්‍යයක් වශයෙන් රාජ්‍යය ද අහෝසි කරයි. මේ දක්වා පංති සතුරුතාවයන් මධ්‍යයේ කටයුතු කළ සමාජයට රාජ්‍යය, එනම්, එයට විශේෂවූ සූරාකන පංතියේ සංවිධානයක් අවශ්‍ය විය. එයට රාජ්‍යය අවශ්‍ය වූයේ, එහි නිෂ්පාදනයට අදාළ බාහිර කොන්දේසි පවත්වා ගැනීම සහ ඒ සඳහාම, විශේෂයෙන්ම, අදාළ නිෂ්පාදන ක්‍රමයෙන් (වහල් ක්‍රමය, ප්‍රවේණිදාස හෝ වහල්දාස ක්‍රමය, වේතන ශ්‍රමය) නිශ්චය කෙරෙන පීඩනයේ කොන්දේසි තුළ පීඩිත පංතිය බලහත්කාරයෙන් රඳවා ගැනීම පිණිස ය. රාජ්‍යය යනු සමස්තයක් වශයෙන් ගත් සමාජයේ නිල නියෝජිතයා ද, පෙනෙන්නට ඇති සංස්ථාවක් තුළ වූ එහි සංකේන්ද්‍රණයද විය. නමුත්, එය එම තත්ත්වය දැරුවේ, එහි කාලයේදී සමාජය සමස්තයක් වශයෙන් නියෝජනය කළාවූ එම පංතියේ රාජ්‍යය වූ තාක් දුරට, නැතහොත්, පුරාණ කාලයේදී වහල් හිමි පුරවැසියන්ගේ රාජ්‍යයද, මධ්‍ය කාලීන යුගවලදී වැඩවසම් වංශවතුන්ගේ රාජ්‍යයද, අපගේ කාලයේදී ධනපති පංතියේ රාජ්‍යය ද, වූ තාක් දුරට පමණකි. අවසානයේදී, එය මුළු සමාජයේම නියම නියෝජිතයා වූ විට, එය අනවශ්‍ය දෙයක් බවට පත් වන්නේය. යටත් කර තබාගත යුතු වූ සමාජ පංතියක් තවදුරටත් නොමැති තත්ත්වයක් ඇතිවූ වහාම, පංති පාලනයත්, නිෂ්පාදනයේ වර්තමාන අරාජිකත්වය පදනම් කර ගත් පැවැත්ම සඳහා වූ පුද්ගල අරගලයෙන් පැන නගින ඝට්ටන සහ සීමාන්තිකකම් සහිත එම අරගලයත් දුරලූ වහාම, යටත් කර ගැනීමට තවත් කිසිවක්, විශේෂ බලහත්කාරී බලවේගයක්, නැතහොත්, රාජ්‍යය අවශ්‍ය කෙරෙන කිසිවක් ඉතිරි නොවේ. මුළු සමාජයේ නියෝජිතයා ලෙසට සැබවින්ම ඉදිරිපත් වෙමින් රාජ්‍යය ගන්නා ප්‍රථම පියවර, එනම්, සමාජයේ නාමයෙන් නිෂ්පාදන මාර්ගයන් හිමි කර ගැනීම, රාජ්‍යය වශයෙන් එය ගන්නා අවසාන ස්වාධීන පියවර ද වන්නේ ය. සමාජ සම්බන්ධතාවයන්ට රාජ්‍යයේ මැදිහත් වීම ක්ෂේත්‍රයෙන් ක්ෂේත්‍රයට අනවශ්‍යව යන අතර, අනතුරුව එය ඉකුත්වී ස්වයං අභාවයට පත්වන්නේය. පුද්ගලයන් ආණ්ඩු කිරීම වෙනුවට ද්‍රව්‍ය පරිපාලනය කිරීම සහ නිෂ්පාදන ක්‍රියාදාමයන් මෙහෙයවීම ආදේශ කරනු ලැබේ. රාජ්‍ය ''අහෝසි කිරීම'' සිදු නොවේ. එය හැකිළී යන්නේය. ''නිදහස් ජනතා රාජ්‍යයක්'' යන පාඨය උද්ඝෝෂණික ස්ථාවරය අනුව කලක් යන තෙක් යුක්ති යුක්ත ලෙස උපයෝගී කර ගැනීම සහ එම පාඨයෙහි අවසාන විද්‍යාත්මක අසම්පූර්ණතාවය යන දෙකමත්, එසේම, රාජ්‍යය එක රැයකින් අහෝසි කළ යුතුය කියන ඊනියා අරාජිකවාදීන්ගේ ඉල්ලීමත්, අගය කිරීමේ මිම්මක් මෙයින් සැදෙයි.'' (''එව්ගෙනි ඩූරිං මහතාගේ විද්‍යාවේ විප්ලවය.'' ''ඩූරිං විරෝධය'' පිටු 301-303, තුන්වැනි ජර්මන් මුද්‍රණය).

අදහස් අතින් එතරම් උසස් පොහොසත් බවක් දරන එංගල්ස්ගේ මෙම තර්කයෙන් එක කරුණක් පමණක් නවීන සමාජවාදී පක්ෂ අතර පවත්නා සමාජවාදී චින්තනයේ අවශ්‍ය කොටසක් බවට පත්ව ඇතැයි නිර්භයව කිව හැකිය. එය නම්, මාක්ස් කියන ලෙසට රාජ්‍යය ''හැකිළී යන'' බව හා එම හැකිළී යාම රාජ්‍ය ''අහෝසි කිරීම'' පිළිබඳ වූ අරාජිකවාදීන්ගේ ධර්මයට වෙනස් වන බවය. මාක්ස්වාදය එතරම් දුරට කප්පාදු කිරීම යනු එය අවස්ථාවාදය දක්වා පහත දැමීමක් වේ. ඊට හේතුව, මෙම අර්ථ නිරූපනයෙන් ඇති කෙරෙන මතය, හෙමින්, ක්‍රමික ලෙස පවා සිදුවන වෙනසක්ද, පිම් හා කුණාටු රහිත, විප්ලවය රහිත බවක්ද ගැන කියන අපැහැදිලි එකක් වීමය. දැනට පැතිර තිබෙන රාජ්‍යය ''හැකිළී යාම'' පිළිබඳවූ, අයෙකුට ජනප්‍රිය යයි කිව හැකි සංකල්පය, විප්ලවය

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ප්‍රතික්ෂේප කරන්නක් නොවේ නම්, නිසැක වශයෙන්ම එය ව්‍යාකූල කරන්නකි.

කෙසේ හෝ වේවා, එවැනි අර්ථ නිරූපනයක් දීම මාක්ස්වාදය අමු අමුවේ විකෘති කිරීමකි.එයින් වාසි සැලසෙන්නේ ධනපති පංතියට පමණකි. න්‍යාය වශයෙන් සලකන කල, එය පදනම් වී තිබෙන්නේ, අප ඉහත උපුටා දැක්වූ එංගල්ස්ගේ "සම්පිණ්ඩිත" තර්කයෙහි සඳහන් වැනි ඉතාමත් වැදගත් තත්ත්වයන් හා කරුණු නොසලකා හැරීම මත ය.

රාජ්‍ය බලය අල්වා ගන්නා නිර්ධන පංතිය, එසේ කිරීම තුළින් "රාජ්‍යයක් වශයෙන් රාජ්‍ය අහෝසි කරන" බව එංගල්ස් ප්‍රථමයෙන්ම, සිය තර්කය ආරම්භයෙන්ම කියයි. මෙහි අර්ථය ගැන සිතා බැලීම සුදුසු සේ සලකනු නොලැබේ. සාමාන්‍ය වශයෙන් එක්කෝ එය සම්පූර්ණයෙන්ම අමතක කර දමනු ලැබේ. නැතහොත්, එය එංගල්ස් කෙරේ දක්නට ලැබෙන "හේගල්වාදී දුර්වලකමක්" ස්වභාවයේ දෙයක් ලෙස සලකනු ලැබේ. එසේ වුවද, මෙම වචනවලින් සංක්ෂේපයෙන් ප්‍රකාශ කෙරෙන්නේ ඉතාමත් ශ්‍රෙෂ්ඨ නිර්ධන පංති විප්ලව අතුරෙන් එකක, එනම්, 1871 පැරිස් කොමියුනයේ අත්දැකීමය. නිසි තැනදී අපි ඒ ගැන වැඩි විස්තර සහිතව සඳහන් කරන්නෙමු. ඇත්ත වශයෙන්, මෙහිදී එංගල්ස් කියන්නේ නිර්ධන පංති විප්ලවය විසින් ධනපති පංති රාජ්‍යය "අහෝසි" කරනු ලැබීම ගැනය. ඒ අතර රාජ්‍යය හැකිළී යාම ගැනවූ වචන අදාළ වන්නේ සමාජවාදී විප්ලවයෙන් පසුව පවතින නිර්ධන පංති රාජ්‍යයේ නෂ්ටාවශේෂයන්ට ය. එංගල්ස් කියන ලෙසට ධනපති පංති රාජ්‍යය "හැකිළී යන්නේ" නැත; නමුත් විප්ලවය අතරතුරදී එය නිර්ධන පංතිය විසින් "අහෝසි" කර දමනු ලැබේ. මෙම විප්ලවයෙන් පසුව හැකිළී යන්නේ නිර්ධන පංති රාජ්‍යය ය, නැතහොත්, අර්ධ රාජ්‍යය.

දෙවැනිව රාජ්‍යය යනු "විශේෂ බලහත්කාරී බලවේගයකි". මෙහිදී එංගල්ස් මෙම විශිෂ්ඨ හා ඉතාමත් ගැඹුරු අර්ථ නිරූපණය අතිශයින් නිරවුල් ලෙස ඉදිරිපත් කරයි. එසේම ධනපති පංතිය විසින් නිර්ධන පංතිය, නැතහොත්, පොහොසත් සුළු පිරිස් විසින් වැඩ කරන ජනතාව කෝටිගණන් මර්දනය කරනු ලැබීම සඳහා වූ මෙම "විශේෂ බලහත්කාරී බලවේගය" වෙනුවට, නිර්ධන පංතිය විසින් ධනපති පංතිය මර්දනය කරනු ලැබීම සඳහා වූ "විශේෂ බලහත්කාරී බලවේගය" (නිර්ධන පංති ආඥාදායකත්වය) ආදේශ කළ යුතු බව ඒ අනුව අදහස් වන්නේය. "රාජ්‍යයක් වශයෙන් රාජ්‍ය අහෝසි කිරීම" යන්නෙහි නියත අරුත එයයි. මෙය නියත වශයෙන්ම සමාජය නමින් නිෂ්පාදන මාර්ගයන් හිමිකර ගැනීමේ "ක්‍රියාව" වේ. තවද, එක (ධනපති පංති) බලවේගයක් වෙනුවට, එසේ වෙනත්

(නිර්ධන පංති) බලවේගයක් ආදේශ වීම "හැකිළී යාමේ" (ස්වරූපයෙන් සිදුවිය නොහැක්කක් බව නිරායාසයෙන්ම පැහැදිලි වන කරුණකි.

තුන්වැනිව, රාජ්‍යය "හැකිළී යාම" ගැන සහ වඩාත් සිත් කාවදින සහ විචිත්‍ර "ඉකුත් වී ස්වයං අභාවයට පත්වීම" ගැන පවා කථා කිරීමේදී, "රාජ්‍යය මුළු සමාජයම වෙනුවෙන් නිෂ්පාදන මාර්ග හිමිකර ගැනීමෙන්" පසු, එනම්, සමාජවාදී විප්ලවයෙන් පසු කාල පරිච්ඡේදයක් ගැන, එංගල්ස් ඉතා පැහැදිලි ලෙස හා නිශ්චිත ලෙස සඳහන් කරයි. එම අවස්ථාවේදී "රාජ්‍යයේ" දේශපාලන ආකෘතිය ඉතාමත් සම්පූර්ණ ප්‍රජාතන්ත්‍රවාදය බව අපි කවුරුත් දනිමු. නමුත්, එංගල්ස් ඒ අනුව මෙහිදී කියන්නේ "ඉකුත්වී ස්වයං අභාවයට පත්වන," නැතහොත්, "හැකිළී යන" ප්‍රජාතන්ත්‍රවාදය ගැන බව, නිර්ලජ්ජී ලෙස මාක්ස්වාදය විකෘති කිරීමෙහි යෙදී සිටින අවස්ථාවාදීන්ට කිසි කලෙකත් කල්පනා නොවේ. බැලූ බැල්මට මෙය ඉතා පුදුම සහගත ලෙස පෙනෙන නමුත් එය "නොවටහාගත හැකි" දෙයක් වන්නේ, ප්‍රජාතන්ත්‍රවාදය ද රාජ්‍යයක් වීම සහ ඒ අනුව, රාජ්‍යය අන්තර්ධාන වන විට එයත් අන්තර්ධාන වන බව ගැන නොසිතූ කෙනෙකුට පමණකි. ධනපති රාජ්‍යය "අහෝසි" කිරීමෙහි සමත්වන්නේ විප්ලවය පමණකි. සාමාන්‍ය රාජ්‍යයට, එනම්, ඉතාමත් සම්පූර්ණ ප්‍රජාතන්ත්‍රවාදයට විය හැක්කේ "හැකිළීයාම" පමණකි.

හතරවැනිව, "රාජ්‍යය හැකිළී යන්නේය" යන තම සුප්‍රසිද්ධ ප්‍රස්තුතය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එංගල්ස්, එක්වරම විශේෂ පැහැදිලි කිරීමක යෙදෙමින්, මෙම ප්‍රස්තුතය අවස්ථාවාදීන් සහ අරාජිකවාදීන් යන දෙකොටසටම විරුද්ධව එල්ල කරන ලද්දක් බව කියයි. මෙසේ කරන එංගල්ස්, අවස්ථාවාදීන්ට විරුද්ධව එල්ල කරන ලද "රාජ්‍යය හැකිළී යන්නේය" යන ප්‍රස්තුතයෙන් බැසගන්නා එම නිගමනය ඉදිරියෙන් තබයි.

එංගල්ස් මෙම ප්‍රස්තුතයෙන් බැසගන්නා නිගමනයන් එල්ලකරන ලද්දේ ආරාජිකවාදීන්ට පමණක් විරුද්ධව නොවන බව "රාජ්‍යය හැකිළීයාම" ගැන කියවා හෝ අසා ඇති 10,000 කින් 9,990 ක් දෙනාටම එක්කෝ කොහෙත්ම දැනුමක් නැති, නැතහොත්, මතකක් නැති බවට කෙනෙකුට ඔට්ටුවක් අල්ලන්නට පුළුවන. තවද, ඉතිරි දහ දෙනාගෙන්ද නව දෙනෙක්ම, සමහරවිට, "නිදහස් ජනතා රාජ්‍යයක්" යන්නෙහි අරුත හෝ, මෙම උද්යෝග පාඨයට විරුද්ධව ගසන පහර අවස්ථාවාදීන්ට ගසන පහරක් වන්නේ මන්ද යන්න හෝ නොදනිති. ඉතිහාසය ලියනු ලබන්නේ මෙසේය! ශ්‍රෙෂ්ඨ විප්ලවවාදී උගැන්වීමක් නොපෙනෙන සේ වෙනස් කර, දැනට බලපවත්වන අවරසිකවාදයට ගැලපෙන සේ එය අනුවර්තනය කරනු ලබන්නේ මෙසේය. ආරාජිකවාදීන්ට විරුද්ධව

https://liberationbase.wordpress.com

එල්ල කරන ලද නිගමනය වාර දහස් ගණනක් නැවත නැවතත් කියා තිබේ. එය කෙළෙසා දමා ඇත. එය, එහි නොගැඹුරු අර්ථයෙන් ජනතා-වගේ ඔළුගෙඩි තුළට රිංගවා ඇත. එය පූර්ව මතයක් මෙන් බලවත්ව ඇත. ඒ අතර, අවස්ථාවාදීන්ට විරුද්ධව එල්ල කරන ලද නිගමනය අපැහැදිලි කර හා අමතක කර තිබේ!

"නිදහස් ජනතා රාජ්‍යය" යනු හැත්තෑ ගණන්වල ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ වැඩ පිළිවෙළට ඇතුළත් ඉල්ලීමක් හා ඔවුන් අතර පැතිර පැවති උගුල් වදනක් විය. මෙම උගුල් වදනෙහි කිසිම දේශපාලන හරයක් නොමැත. එයින් කෙරෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදය යන සංකල්පය අත්‍යාලංකෘත අවරසික මෝස්තරයකින් ඉදිරිපත් කිරීම පමණකි. නීතියෙන් ඉඩ ඇති ආකාරයට එය ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවක් පිළිබඳ හැඟීමක් ඇති කළතාක් දුරට, උද්ඝෝෂණික දෘෂ්ටි කෝණය අනුව එය "කලකට උපයෝගී කර ගැනීම" "සාධාරණ කර දැක්වීමට" එංගල්ස් සූදානම්ව සිටියේය. එසේ වී නමුදු, එය ධනපති ප්‍රජාතන්ත්‍රවාදයට සුදු හුණු ගෑමට වඩා යමක් සහ රාජ්‍යය පිළිබඳ වූ සමාජවාදී විවේචනය වටහා ගැනීමට පොදු වශයෙන් අසමත් වීමක් හා සමාන වූ හෙයින්, එය අවස්ථාවාදී උගුල් වදනක්ම විය. ධනපති ක්‍රමය යටතේ නිර්ධන පංතියට ලැබිය හැකි හොඳම රාජ්‍ය ආකෘතිය ලෙසට අපි ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවකට පක්ෂ වන්නෙමු. එහෙත් ඉතාමත් ප්‍රජාතන්ත්‍රවාදී ධනපති සමූහාණ්ඩුව යටතේ පවා ජනතාවට අත්වන්නේ, වේතන වහල්භාවය යන්න අමතක කිරීමට අපට අයිතියක් නැත. තවද සෑම රාජ්‍යයක්ම පීඩිත පංතිය මර්දනය කිරීමේ "විශේෂ බලවේගයක්" වන්නේය. ඒ අනුව සෑම රාජ්‍යයක්ම "නිදහස්" නොවන්නේය; එසේම "ජනතා රාජ්‍යයක්" නොවන්නේය. මාක්ස් හා එංගල්ස් හැත්තෑ ගණන් වලදී මෙය නැවත නැවතත් ඔවුන් ගේ සහෝදරවරුන්ට විස්තර කර දුන්හ.[5]

පස්වැනිව, කාටත් මතක තිබෙන රාජ්‍යය හැකිළී යාම ගැන වූ එංගල්ස්ගේ තර්කය අන්තර්ගත ඔහුගේ එම කෘතියෙහිම, බලහත්කාර විප්ලවයේ වැදගත්කම පිළිබඳ තර්කයක්ද ඇතුලත්ව තිබේ. බලහත්කාර විප්ලවයේ කාර්ය කොටස ගැන එංගල්ස් කර ඇති ඓතිහාසික විශ්ලේ-ෂණය, එයට කරන උසස් වර්ණනාවක් බඳු වන්නේය. මෙය "කිසිවෙකුට මතක නැත." මෙම අදහසෙහි වැදගත්කම ගැන කතා කිරීම, නැතහොත් ඒ ගැන සිතීම පවා, නවීන සමාජවාදී පක්ෂ තුළ කිරීමට සුදුසු නොවේ. එම පක්ෂ ජනතාව අතර ගෙනයන ඒවායේ දෛනික ප්‍රචාර සහ උද්ඝෝ-ෂණ සම්බන්ධයෙන් මෙම අදහසෙහි දයකත්වයක් කිසිසේත් නොමැ-ත්තේය. එසේ වුවත්, එය "රාජ්‍යය හැකිළී යාම" සමග ඒකීය සංගත සමස්තයක් වශයෙන් අභේද්‍ය ලෙස බැඳී ඇත්තේය.

එංගල්ස්ගේ තර්කය මෙසේය:

" ... එසේ වුවද, එම බලහත්කාරය ඉතිහාසයේ තවත් (දුෂ්ට බලයක් වීමට අමතරව), විප්ලවවාදී කාර්ය කොටසක් ඉටු කරයි. මාක්ස්ගේ වචනවලින් කියතොත්, එය වනාහි, නව සමාජයකින් ගැබ්බරව සිටින සෑම පැරණි සමාජයකම වින්නඹුවය[6]; එය වනාහි මළගිය, පාෂාණීභූත දේශපාලන ආකෘති පසාරුකරගෙන යමින් ඒවා සුනු විසුනු කිරීමට සමාජ ව්‍යාපාරය විසින් උපකාර කරගනු ලබන උපකරණය ය. මේ ගැන වචනයක්වත් ඩූරිං මහතාගේ කෘතියෙහි නොමැත. සූරාකෑම මත පදනම් වූ ආර්ථිකයක් පෙරළා දැමීම සඳහා සමහර විට බලහත්කාරය අවශ්‍ය වීමට ඉඩ තිබෙන බව ඔහු පිළිගන්නේ සුසුම් ලමින් හා කෙඳිරිගාමින් ය. ඊට හේතුව, ඔහු කියන පරිදි, බලහත්කාරය උපයෝගී කරගැනීමේ සෑම අවස්-ථාවක්ම නිසා, අවාසනාවකට මෙන්, එය උපයෝගී කරගන්නා තැනැත්තා දූර්මුඛ වන හෙයිනි. එපමණක් නොව, මේ සියල්ල එසේ සිදුවන්නේ සෑම ජයග්‍රාහී විප්ලවයක්ම විසින් දෙන ලද අතිමහත් සදාචාරාත්මක සහ අධ්‍යාත්මික දිරිගැන්වීම එසේ තිබියදීය! එසේම, ජර්මනියේදී මෙය ප්‍රචණ්ඩ ඝට්ටනයක් වීමෙන් — සියල්ල සැලකිල්ලට ගත් කළ, එය ජනතාව මත බලෙන් පැටවූවක් විය හැකිය — තිස් අවුරුදු යුද්ධයෙන් සිදුවූ අවමානයේ ප්‍රතිඵලයක් වශයෙන් ජාතියේ මානසිකත්වය විනිවිද ගිය දීනභාවය මකාදැමී-මේ වාසිය හෝ යටත්පිරිසෙයින් සැලසෙනු ඇත.[7] මෙම දෙවගැ-තියාගේ නිසරු, නීරස හා බෙලහීන චින්තන ක්‍රමය, ඉතිහාසය දත් ඉතාමත් විප්ලවවාදී පක්ෂය මත පැටවෙන්නට බලන්නේය!" (පිටු 138, තුන්වැනි ජර්මන් සංස්කරණය, දෙවැනි කොටස, හතරවැනි පරිච්ඡේදයේ අවසානය)[8].

1878 හා 1894 කාලය තුළ, එනම්, ඔහුගේ මරණය දක්වාම, එංගල්ස් නිතොරව ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ අවධානයට ලක් කළ බලහත්කාර විප්ලවය ගැන වූ මෙම වර්ණනය, "රාජ්‍යය හැකිළී යාම" සමග ඒකීය න්‍යායයක් වන සේ ඒකාබද්ධ කරන්නේ කෙසේද?

බොහෝ විට සාර සංග්‍රහවාදී මාර්ගයෙන්, ප්‍රථමයෙන් එක තර්කය-ක්ද, නැවත තවත් තර්කයක්ද හිතුමතය අනුව (නැතහොත් බලවතුන් සතුටු කිරීමට) ප්‍රතිපත්ති විරහිත, නැතහොත්, විතණ්ඩවාදී ලෙස තෝරා ගනිමින් සහ වාර සියයකින් අනූ නවයක්ම හෝ ඊට වැඩි සංඛ්‍යාවක් අවස්-ථාවල, "රාජ්‍යය හැකිළී යාම" පිළිබඳ අදහස පෙරටු කොට තබමින්

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

මේ දෙක එකට සම්බන්ධ කරනු ලැබේ. දයලෙක්තික ක්‍රමය වෙනුවට සාර සංග්‍රහවාදය ආදේශ කරනු ලැබේ. මාක්ස්වාදය හා සම්බන්ධයෙන් වර්තමාන නිල සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී සාහිත්‍යය ඉතාමත් සුපුරුදු හා ඉතාමත් පුළුල් ලෙස අනුගමනය කරන බව දක්නට ලැබෙන පිළිවෙත මෙයයි. මෙබඳු ආදේශ කිරීම් අළුත් දෙයක් නම් නොවේ. මුල් ග්‍රීක දර්ශනය සම්බන්ධයෙන්ද එය අනුගමනය කරන ලදී. මාක්ස්වාදය අවස්ථාවාදී මෝස්තරයෙන් විකෘති කිරීමේදී ජනතාව රැවටීමේ පහසුම විධිය දයලෙක්තික ක්‍රමය වෙනුවට සාරසංග්‍රහවාදය ආදේශ කිරීමය. එයින් මායාවක් වැනි සැනසුමක් ලැබෙන්නේය. එය ක්‍රියාදාමයෙහි සියළුම අංශ, සංවර්ධනයේ සියළුම උපනති, ගැටෙන සියළුම බලපෑම් යනාදිය සැලකිල්ලට ගන්නා සේ පෙනෙන්නේය. එසේ වුවත්, සමාජ සංවර්ධනයේ ක්‍රියාදාමය ගැන කිසිම අනුපූර්ණ හා විප්ලවවාදී සංකල්පයක් ඉන් ඉදිරිපත් කෙරෙන්නේ නැත.

බලහත්කාර විප්ලවයේ අනිවාරණීයත්වය ගැන කියන මාක්ස්ගේ හා එංගල්ස්ගේ න්‍යායය ධනපති රාජ්‍යයට අදාළ වන්නක් බව අපි දැනටමත් ඉහත කියා ඇත්තෙමු. තවද, වඩාත් විස්තර සහිතව ඒ බව ඉදිරියේදී පෙන්වා දෙන්නෙමු. ''හැකිළී යාමේ'' ක්‍රියාවලිය මගින් ධනපති රාජ්‍යය අභිභවා නිර්ධන පංති රාජ්‍යයට (නිර්ධන පංති ආඥාදායකත්වයට) නැගීමට හැකි නොවේ. සාමාන්‍ය නීතියක් වශයෙන්ම එය විය හැක්කේ බලහත්කාර විප්ලවයක් මගින් පමණකි. එයට ගරුත්වය දක්වමින් එංගල්ස් ගායනය කළ සහ මාක්ස් නැවත නැවතත් කළ ප්‍රකාශයන්ට (''දර්ශනයේ දිළිඳුකම'' කෘතියෙහි අවසාන ඡේදයන් සහ කොමියුනිස්ට් ප්‍රකාශනය බලන්න. බලහත්කාර විප්ලවය අනිවාරණීය බව එහි සාඩම්බර ලෙස ප්‍රකාශ කර තිබේ. ඊට තිස්වසරකට පමණ පසුව 1875 දී, ගෝතා වැඩ පිළිවෙළ[9] විවේචනය කරමින් එම වැඩ පිළිවෙළෙහි අවස්ථාවාදී ස්වභාවය නිර්දය පහරට ලක් කරමින් මාක්ස් ලියූ දේ බලන්න.) සම්පූර්ණයෙන්ම අනුකූල වන වර්ණනා ගීය, කිසිසේත් ''හුදු'' ආවේගයක්, හුදු වියත් භාෂිතයක් හෝ විවාදාත්මක ප්‍රහාරයක් නොවේ. මාක්ස්ගේ හා එංගල්ස්ගේ මුළු මහත් න්‍යායයෙහි මුලටම ඇත්තේ බලහත්කාර විප්ලවය පිළිබඳ වූ මෙම සහ නියත වශයෙන්ම මෙම අදහස ජනතාවට ක්‍රමානුකූල ලෙස කාවැද්දීමේ අවශ්‍යතාවය ය. දැනට පැතිර පවතින සමාජජාතෝන්මාදවාදී සහ කෞට්ස්කිවාදී උපනති, මාක්ස්ගේ හා එංගල්ස්ගේ න්‍යායය පවාදී ඇති බව, එම උපනති දෙකම එවැනි ප්‍රචාරය සහ උද්ඝෝෂණය කිරීම ගැන නොතකා හැරීමෙන් සිත කාවදින ලෙස ප්‍රකාශ වේ.

ධනපති පංති රාජ්‍යය අභිභවා නිර්ධන පංති රාජ්‍යය නැගී සිටීම බලහත්කාර විප්ලවයකින් තොරව කිසිසේත් සිදුවිය හැක්කක් නොවේ. නිර්ධන පංති රාජ්‍යය, එනම් සාමාන්‍ය රාජ්‍යය අහෝසි වීම ''හැකිළී යාමේ'' ක්‍රියාමාලාව අනුව මිස වෙනත් ලෙසකින් කිසිසේත් සිදුවිය නොහැකිය.

මාක්ස් සහ එංගල්ස් එක් එක් විශේෂ විප්ලවීය තත්ත්වයක් අධ්‍යයනය කළ විට, ඔවුන් එක් එක් විශේෂ විප්ලවයෙහි අත්දැකීම්වලින් ලැබෙන පාඩම් විශ්ලේෂණය කළ විට, ඔවුහු මෙම අදහස් ගැන දීර්ඝ සහ පැහැදිලි විස්තරයක් කළහ. ඔවුන්ගේ න්‍යායයෙහි මෙම, නිසැක වශයෙන්ම ඉතාමත් වැදගත් කොටස වෙත යමු.

දෙවැනි පරිච්ඡේදය

රාජ්‍යය සහ විප්ලවය. 1848-1851 කාලයේ අත්දැකීම්

1. විප්ලවයේ පූර්වාසන්නය

පැසුණු මාක්ස්වාදයේ ප්‍රථම කෘතීන් වන ''දර්ශනයේ දිළිඳුකම'' සහ ''කොමියුනිස්ට් ප්‍රකාශනය'' පළවූයේ හරියටම 1848 විප්ලවයේ පූර්වාසන්න සමයේය. මෙම හේතුව නිසාම මෙම කෘතිවලින් මාක්ස්වාදයේ පොදු ප්‍රතිපත්ති ඉදිරිපත් වීමට අමතරව, ඒවායින් එකල පැවති විප්ලවීය තත්ත්වයද එක්තරා දුරකට පිළිබිඹු කෙරේ. 1848-1851 වර්ෂවල අත්දැකීම් අනුව මෙම කෘතිවල කතුවරුන් ඔවුන්ගේ නිගමනවලට එළඹීමට පූර්ව ආසන්නතම කාලයේ පැවති තත්ත්වය ගැන කීවේ කුමක්ද යන්න පරීක්ෂා කර බැලීම එනිසා වඩාත් නුවණට හුරු වනු ඇත.

''දර්ශනයේ දිළිඳුකම'' යන පොතෙහි මාක්ස් මෙසේ ලීවේය:

> ''සංවර්ධන පරිපාටිය අතරතුරදී කම්කරු පංතිය ධනපති සමාජය වෙනුවට පංති සහ ඒවායේ සතුරුතාවයන් බැහැර කරන සමාගමයක් ආදේශ කරනු ඇත. එවිට නියම දේශපාලන බලයක් තවදුරටත් නොපවතිනු ඇත. දේශපාලන බලය යනු නියම වශයෙන් ධනපති සමාජයේ පවතින පංති සතුරුතාවයට දෙන නිල හැඳින්වීමය'' (පිටු 182, ජර්මන් සංස්කරණය, 1885).

පංති අහෝසි කිරීමෙන් පසුව රාජ්‍යය අන්තර්ධාන වීම පිළිබඳ අදහස ගැන කෙරුණු මෙම විස්තරය, ඊට මාස කීපයකට, හරියටම 1847 නොවැ-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ම්බර් මාසයේදී, මාක්ස් හා එංගල්ස් ලියූ ''කොමියුනිස්ට් ප්‍රකාශනයෙහි'' අන්තර්ගත විස්තරය සමග සසඳා බැලීම උපදේශාත්මකය.

> '' ... නිර්ධන පංතියේ සංවර්ධනයේ ඉතාමත් සාමාන්‍ය පරිච්ඡේද ගෙන හැර දැක්වීමේදී, පවත්නා සමාජය තුළ ඇවිළෙමින් පවතින තරමක් දුරට සැඟවී තිබෙන සිවිල් යුද්ධය, විවෘත විප්ලවය සේ පුපුරා යන තැන සහ ධනපති පංතිය ප්‍රචණ්ඩ බලයෙන් පහ කිරීමෙන් නිර්ධන පංති ආධිපත්‍යය සඳහා අත්තිවාරම දමන තැන දක්වා එය ගැන විස්තර කෙළෙමු... .
>
> '' ... කම්කරු පංතිය විසින් කරනු ලබන විප්ලවයේ ප්‍රථම පියවර වන්නේ නිර්ධන පංතිය පාළක පංතියේ තත්ත්වයට ඔසවා තැබීම, ප්‍රජාතන්ත්‍රවාදය සඳහා සටන දිනා ගැනීම බව අපි ඉහත දුටුවෙමු.
>
> ''ධනපති පංතියෙන් සියළු ප්‍රාග්ධනය කෙමෙන් කෙමෙන් උදුරාගැනීමත්, රාජ්‍යය, එනම්, පාළක පංතිය ලෙසට සංවිධානය වූ නිර්ධන පංතිය අතෙහි සියළු නිෂ්පාදන උපකරණ සංකේන්ද්‍රණය කිරීමත් සඳහාද, එමෙන්ම හැකි තරම් සීඝ්‍ර ලෙස නිෂ්පාදනීය බලවේගයන්ගේ මුළු ප්‍රමාණය වැඩි කිරීම සඳහාද, නිර්ධන පංතිය එහි දේශපාලන ආධිපත්‍යය උපයෝගි කරගනු ඇත'' (පිටු 31 සහ 37, හත්වැනි ජර්මන් සංස්කරණය, 1906).

රාජ්‍යය ගැන මාක්ස්වාදයේ ඉතාමත් විශිෂ්ට හා ඉතාමත් වැදගත් අදහස් අතුරෙන් එකක් වන ''නිර්ධන පංති ආඥාදායකත්වය'' (මාක්ස් හා එංගල්ස් එය එසේ හැඳින්වූයේ පැරිස් කොමියුනයට පසුව ය) වචනයට නගා තිබීම මෙයින් අපට දක්නට ලැබේ. එමෙන්ම, ''රාජ්‍යය, එනම්, පාලක පංතිය ලෙසට සංවිධානය වූ නිර්ධන පංතිය'' යනුවෙන් රාජ්‍යය පිළිබඳ ඉතාමත් වැදගත් අර්ථ නිරූපනයක්ද මෙහි ඇත. එය මාක්ස් වාදයේ ''අමතක වී ගිය'' වදනකි.

නිල සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂවල දැනට බල පවත්නා ප්‍රචාරක සහ උද්ඝෝෂණ සාහිත්‍යයෙහි රාජ්‍යය ගැන වූ මෙම අර්ථ නිරූපනය කිසි කලෙකත් පැහැදිලි කර නැත. එපමණක් නොවේ. එය උවමනාවෙන්ම අමතක කර තිබේ. එසේ කර තිබෙන්නේ, එය ප්‍රතිසංස්කරණවාදය සමග කිසිසේත් නොගැලපෙන හෙයිනි; එය පොදු අවස්ථාවාදී දුර්මතවලට සහ ''ප්‍රජාතන්ත්‍රයේ සාමකාමී සංවර්ධනය'' පිළිබඳ අවරසික මායාමතවලට කන්සෙට දෙන පහරක් වන හෙයිනි.

නිර්ධන පංතියට රාජ්‍යය අවශ්‍යය — මාක්ස් අදහස් කළේ මෙය යයි

අපට සහතික වන සියළුම අවස්ථාවාදීහු, සමාජ-ජාත්‍යෝන්මාදවාදීහු සහ කෞට්ස්කිවාදීහු නැවත නැවතත් කියති. එහෙත් ප්‍රථමයෙන්ම මාක්ස් කී පරිදි කම්කරු පංතියට අවශ්‍ය වන්නේ හැකිළී යන රාජ්‍යයක්, එනම්, අප්‍රමාදවම හැකිළීයාමට පටන් ගන්නා ලෙසට සංයුක්ත වූ සහ හැකිළී නොයා නොහැකි රාජ්‍ය පමණක් බව එකතු කිරීමට ඔවුන්ට ''අමතක'' විය. දෙවැනිව, වැඩ කරන ජනතාවට රාජ්‍යයක්, එනම්, පාලක පංතිය ලෙසට සංවිධානයවූ නිර්ධන පංතිය, අවශ්‍යය.

රාජ්‍යය යනු බලහත්කාරය පැමේ විශේෂ සංවිධානයකි. එය කිසියම් පංතියක් මර්දනය කිරීම සඳහා ප්‍රචණ්ඩභාවය පැමේ සංවිධානයකි. නිර්ධන පංතිය මර්දනය කළ යුතු පංතිය කුමක්ද? ස්වාභාවික වශයෙන්ම, ඒ සූරාකන පංතිය, එනම්, ධනපති පංතිය පමණකි. වැඩකරන ජනතාවට රාජ්‍යය උවමනා වන්නේ සූරා කන්නන්ගේ ප්‍රතිරෝධය මර්දනය කිරීම සඳහා පමණකි. එසේම, මෙම මර්දනය මෙහෙයවිය හැක්කේ, ක්‍රියාත්මක කළ හැක්කේ නිර්ධන පංතියට පමණකි. ඊට හේතුව, සසංගත ලෙස විප්ලවවාදී විය හැකි එකම පංතිය, ධනපති පංතියට විරුද්ධව අරගල කිරීමේදීත්, එය සම්පූර්ණයෙන්ම ඉවත් කිරීමේදීත්, සියලුම වැඩ කරන සහ පීඩිත ජනතාවන් එක්සත් කළ හැකි එකම පංතිය නිර්ධන පංතිය වීමයි.

සූරාකනු ලබන පංතිවලට සූරාකෑම පවත්වා ගැනීම සඳහා එනම්, අති මහත් ජනතා බහුතරයට විරුද්ධව ඉතා සුළු අල්පතරයකගේ ආත්මාර්ථකාමී උවමනාවන් ඉටුකර ගැනීම සඳහා දේශපාලන අධිපතිත්වය අවශ්‍ය වේ. පීඩිත පංතිවලටද දේශපාලන අධිපතිත්වය අවශ්‍ය වේ. පීඩිත පංතිවලට දේශපාලන අධිපතිත්වය අවශ්‍ය වන්නේ සියළු සූරාකෑම සම්පූර්ණයෙන්ම අහෝසි කිරීම සඳහාය, එනම්, ජනතාවගේ අති බහුතරයෙහි යහපත පිණිස සහ නවීන වහල් හිමියන් නැතහොත් ඉඩම් හිමියන් හා ධනපතියන් වන ඉතා සුළු අල්පතරයකට විරුද්ධව ය.

සුළු ධනපති ප්‍රජාතන්ත්‍රවාදීහු, ඒ බොරුකාර සමාජවදීහු, පංති අරගලය වෙනුවට පංති සංගතියේ සිහින ආදේශ කළහ; සිහින ලෝකයේ මෝස්තර අනුව වන සමාජවාදී පරිවර්තයන් ගැන පවා සිතූහ. ඔවුන් එම පරිවර්තන ගැන සිතුවේ, සූරාකන පංතියේ පාලනය පෙරළා දැමීමක් ලෙසට නොව, ස්වකීය අරමුණු ගැන අවබෝධයක් ලැබූ බහුතරයට අල්පතරය සාමකාමී ලෙස යටත්වීමක් ලෙසට ය. රාජ්‍ය පංතිවලට ඉහළින් සිටින්නේය යන අදහසෙන් වෙන්කළ නොහැකි මෙම සුළු ධනපති මනෝරාජ්‍යය ව්‍යවහාරයේදී කම්කරු පංතිවල අවශ්‍යතාවයන් පාවා දීමට මහ පෙන්වන්නක් විය. නිදසුනක් වශයෙන් 1848 හා 1871 ප්‍රංශ විප්ලවවල ඉතිහාසයෙන්ද, ශතවර්ෂය අවසානයේදී බ්‍රිතාන්‍යයේ, ප්‍රංශයේ, ඉතාලියේ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සහ වෙනත් රටවල ධනපති අමාත්‍ය මණ්ඩලවලට "සමාජවාදී පක්ෂ සහභාගිවීමේ අත්දැකීමෙන්ද, ඒ බව පෙනිණි[10].

මාක්ස් ඔහුගේ මුළු ජීවිත කාලය තුළදීම සුළු ධනපති සමාජවාදයට විරුද්ධව සටන් කළේය. සමාජවාදී-විප්ලවවාදී සහ මෙන්ෂෙවික් පක්ෂ දැන් නැවතත් එම සමාජවාදය රුසියාව තුළ පණ ගන්වා ඇත. මාක්ස් ඔහුගේ පංති අරගලය පිළිබඳ න්‍යායය, සසංගත ලෙස, දේශපාලන බලය නැතහොත් රාජ්‍යය පිළිබඳ න්‍යායය දක්වාම සංවර්ධනය කළේය.

ධනපති පංතිය පෙරළා දැමීමේ කටයුත්ත ඉටු කළ හැක්කේ නිර්ධන පංතියට පමණකි. ස්වකීය ආර්ථික පැවැත්මේ කොන්දේසි විසින් එය මෙම කර්තව්‍යය සඳහා සූදනම් කරනු ලබන සහ එය ඉටු කිරීම සඳහා හැකියාව සහ ශක්තිය ලබන විශේෂ පංතිය එයයි. ධනපති පංතිය විසින් ගොවි ජනතාව සහ සියළුම සුළු ධනපති කණ්ඩායම් කැබලි කර විසුරුවනු ලබන අතර, නිර්ධන පංතිය එකට පාස්සනු, එක්සත් කරනු හා සංවිධානය කරනු ලැබේ. ධනපති පංතියේ සූරා කෑමට, පීඩනයට සහ මිරිකීමට හසුවූ, බොහෝ විට නිර්ධන පංතියට වඩා අඩුවෙන් නොව වැඩියෙන් ඊට බඳුන් වූ, එහෙත් ස්වකීය විමුක්තිය සඳහා ස්වාධීන අරගලයක් කිරීමට හැකියාව නැති, වැඩ කරන සහ සූරාකෑමට ලක්වූ සියළුම ජනතාවන්ගේ නායකයා වීමට හැකියාව ඇත්තේ නිර්ධන පංතියට පමණකි. එයට එම හැකියාව ලැබෙන්නේ මහා පරිමාණ නිෂ්පාදනයෙහි දී එය ඉටු කරන ආර්ථික කාර්ය කොටස නිසාය.

රාජ්‍ය සහ සමාජවාදී විප්ලවය හා සම්බන්ධ ප්‍රශ්නයට මාක්ස් විසින් ගලපාලන ලද පංති අරගල න්‍යායය, නිරායාසයෙන් ම යොමුවන්නේ නිර්ධන පංතියේ දේශපාලන අධිපතිත්වය, එහි ආඥාදායකත්වය, එනම් ජනතාවගේ ආයුධ සන්නද්ධ බලහත්කාරයේ ඍජු ආධාරය ලබන නොබෙදූ බලය පිළිගැනීම වෙතය. නිර්ධන පංතිය, ධනපති පංතියේ අනිවාරණීය සහ මාරාවේශ ප්‍රතිරෝධය පොඩිපට්ටම් කර දැමීමට සහ නව ආර්ථික ක්‍රමය සඳහා සියළුම වැඩ කරන සහ සූරා කනු ලබන ජනතාව සංවිධානය කිරීමට සමත් පාලක පංතිය බවට පත්වීමෙනි, එයට ධනපති පංතිය පෙරළා දැමීම ඉටු කිරීමට හැකි වන්නේ.

සූරාකන්නන්ගේ ප්‍රතිරෝධය සුනුවිසුනු කර දැමීම සහ සමාජවාදී ආර්ථිකයක් සංවිධානය කිරීමේ කටයුත්තෙහිදී, ගොවිජනතාව, සුළු ධනපති පංතිය සහ අර්ධ නිර්ධන පංතිකයන්ද ඇතුළත් දැවැන්ත පොදු ජනකායට නායකත්වය දීම යන දෙකම උදෙසා නිර්ධන පංතියට රාජ්‍ය බලය, එනම්, බලහත්කාරයේ මධ්‍යගත සංවිධානයක් අවශ්‍යය.

කම්කරුවන්ගේ පක්ෂයට උගැන්වීමෙන් මාක්ස්වාදය කරන්නේ, බලය ගැනීමේ සහ මුළු ජනතාවම සමාජවාදයට යොමු කරන නායකත්වය

දීමේද, නව ක්‍රමය මෙහෙය වීමේ සහ සංවිධානය කිරීමේද, ධනපති පංතිය නොමැතිව සහ ධනපති පංතියට විරුද්ධව, වැඩ කරන සහ පීඩිත ජනතාව ඔවුන්ගේ සමාජ ජීවිතය සංවිධානය කර ගැනීමේදී, ඔවුන්ගේ ගුරුවරයා, මාර්ගෝපදේශකයා හා නායකයා වීමේද හැකියාව ඇති නිර්ධන පංති පෙරමුණු බල ඇණියට උගැන්වීම ය. ඊට විසංසන්දනය වන ලෙසට, දැනට බල පවත්වන අවස්ථාවාදය කම්කරුවන්ගේ පක්ෂයේ සාමාජිකයන් පුහුණු කරන්නේ, ජනතාව සමග සම්බන්ධකම් නැති කරගන්නා, ධනපති ක්‍රමය යටතේ තරමක් හොඳින් ජීවත්වන සහ සුළු ලාභයක් සඳහා ස්වකීය ජන්ම අයිතිය විකුණන, නැතහොත්, ධනපති පංතියට විරුද්ධව ජනතාවගේ විප්ලවීය නායකයන් වීමේ කාර්ය කොටස අත්හැර දමන, වඩා හොඳ වැටුප් ලබන, කම්කරුවන්ගේ නියෝජිතයන් වීමට ය.

"රාජ්‍යය, එනම්, පාලක පංතිය ලෙසට සංවිධානයවූ නිර්ධන පංතිය" පිළිබඳ මාක්ස්ගේ න්‍යායය ඉතිහාසයේදී නිර්ධන පංතිය ඉටු කරන කාර්ය කොටස ගැන වූ ඔහුගේ සමස්ත ධර්මය හා සමග වෙන් කළ නො හැකි සේ බැඳී තිබේ. මෙම කාර්ය කොටසෙහි උච්ච අවස්ථාව නිර්ධන පංති ආඥාදායකත්වයයි; නිර්ධන පංතියේ දේශපාලන අධිපතිත්වයයි.

නිර්ධන පංතියට රාජ්‍යය අවශ්‍ය වන්නේ ධනපති පංතියට විරුද්ධ විශේෂ ආකාරයේ ප්‍රචණ්ඩ සංවිධානයක් වශයෙන් වන හෙයින්, පහත සඳහන් නිගමනය නිරායාසයෙන්ම උද්ගත වන්නේය: ධනපති පංතිය ඔවුන් සඳහාම නිර්මාණය කරගත් රාජ්‍ය යන්ත්‍රය අහෝසි නොකර, විනාශ නොකර එවැනි සංවිධානයක් නිර්මාණය කළ හැකි යයි සිතන්නට පුළුවන්ද? කොමියුනිස්ට් ප්‍රකාශනය එක එල්ලේම මෙම නිගමනය වෙතට මග පෙන්වන්නේය. එසේම 1848-1851 විප්ලවයේ අත්දැකීම සම්පිණ්ඩනය කිරීමේදී මාක්ස් කියන්නේ මෙම නිගමනය ගැනය,

2. විප්ලවය ගැන සංක්ෂේපයෙන්

අප විමසා බලන රාජ්‍යය පිළිබඳ වූ විෂයේ ගැන් මාක්ස් 1848-1851 විප්ලවය අනුව බැසගන්නා ඔහුගේ නිගමනයන් "ලුවී බොනපාට්ගේ බෲමේරයේ දහ අට" නැමති කෘතියෙහි, පහත සඳහන් පරිදි සම්පිණ්ඩනය කර තිබේ.

> "නමුත් විප්ලවය සිය කාරිය හරිහැටි කරයි. එය තවමත් ශුද්ධ ගිනිස්ථානය මැදින් ගමන් කරමින් සිටියි. එය එහි කටයුතු ක්‍රමානුකූලව කරයි. 1851 දෙසැම්බර් 2 දින (ලුවී බොනපාට්ගේ කුමන්ත්‍රණයේ දිනය) වන විට, එය, එහි සූදනම් කිරීමේ කටයුතුව-

3—2015

https://liberationbase.wordpress.com

ලින් එක අර්ධයක් සම්පූර්ණ කර තිබුණි. දැන් එය අනිත් අර්ධය සම්පූර්ණ කරමින් සිටියි. ප්‍රථමයෙන් එය සම්පූර්ණ පාර්ලිමේන්තු බලය ඇති කළේය. එසේ කළේ, එම බලය පෙරළා දැමීමට හැකි වනු පිණිස ය. එය දැන් එම කටයුත්ත සාර්ථක කර තිබෙන නිසා, එය සම්පූර්ණ විධායක බලය ඇති කරන්නේය. එයට විරුද්ධව විප්ලවයේ සියලුම බලවේගයන් සංකේන්ද්‍රණය කිරීම සඳහා (අවධාරණය අපගේය), එය එහි පිරිසිදුම සංකේතය බවට පත් කරමින්, තනිකරමින්, තමන්ට එරෙහිව ඇති එකම ඉලක්කය කරගන්නේය. එසේම, එය ස්වකීය කාර්යයෙහි, මෙම දෙවැනි කොටස ඉටු කළ පසු, යුරෝපය එහි අසුනෙන් සැනෙකින් නැගී සිට, උද්දමයෙන් මෙසේ කියනු ඇත: නුඹ හාරනවා හොඳයි, නාකි වැලි මී කඩියා!

''මෙම විධායක බලය, එහි දැවැන්ත නිලධාරිවාදී සහ යුද්ධමය සංවිධානයද, මහා විශාල සහ සූක්ෂම රාජ්‍ය යන්ත්‍රයද, පන්ලක්ෂයක නිලධාරි හමුදාව සහ ඊට අමතරව තවත් පන්ලක්ෂයක යුද්ධ හමුදාව ද සහිත වූ සහ ප්‍රංශ සමාජ ශරීරයේ එතී එහි සියළු සිදුරු හිරකරගෙන සිටින, මෙම පරපුටු දේහය පැන නැංගේ, ඒකාධිපති රාජාණ්ඩු සමයේදී වැඩවසම් ක්‍රමය දිරාපත් වීමත් සමගය. එම ක්‍රමය දිරාපත්වීම ඉක්මන් කිරීමටද එය ආධාරක විය.'' පළමු ප්‍රංශ විප්ලවය මධ්‍යගතකරණය සංවර්ධනය කළේය. ''නමුත් ඒ අතරම'', එය, ''ආණ්ඩු බලයේ ක්ෂේත්‍රය, උපලක්ෂණ සහ නියෝජිතයන් සංඛ්‍යාව වැඩි කළේය. නැපෝලියන් මෙම රාජ්‍ය යන්ත්‍රය සම්පූර්ණ කළේය.'' නීත්‍යානුකූල රාජාණ්ඩුව සහ ජූලි රාජාණ්ඩුව ''වැඩි ශ්‍රම විභජනයක් හැර අන් කිසිවක් ඊට එකතු කළේ නැත...''

'' ... අවසානයේදී, පාර්ලිමේන්තු සමූහාණ්ඩුව විප්ලවයට විරුද්ධව කරන ස්වකීය. අරගලයේදී, මර්දනකාරි පියවරයන් ගන්නා අතරම, ආණ්ඩු බලයද සම්පත් සහ මධ්‍යගතකරණය අතින් ශක්තිමත් නොකර බැරි තත්වයට පත් විය. සියළුම විප්ලව කළේ, මෙම යන්ත්‍රය සුන් කරනවා වෙනුවට එය පරිපූර්ණ කිරීමය. (අවධාරණය අපගේය). වරින් වර ආධිපත්‍යය සඳහා තරඟ වැදුණු පක්ෂ, ජයග්‍රාහකයාගේ ප්‍රධාන වස්තුව කොට සැලකුවේ මෙම දැවැන්ත රාජ්‍ය ප්‍රාසාදය හිමිකර ගැනීමය. (''ලුවී බොනපාට්ගේ 18 වැනි ද බ්‍රැමේරයේ'', පිටු 98-99, හතරවැනි සංස්කරණය, හැම් බර්ග, 1907).

කොමියුනිස්ට් ප්‍රකාශනය සමග සංසන්දනය කරන කල, මෙම විශිෂ්ට තර්කය මගින් මාක්ස්වාදය දැවැන්ත ඉදිරි පියවරක් තබයි. කොමියුනිස්ට් ප්‍රකාශනයෙහි මෙම ප්‍රශ්නය සලකා ඇත්තේ ඉතාමත් වියුක්ත ආකාරයෙනි; ඉතාමත් සාමාන්‍ය ස්වභාවයේ වදන් හා යෙදුම් මගිනි ඉහත උපුටා දක්වා ඇති කොටසෙහි ප්‍රශ්නය ප්‍රත්‍යක්ෂ ආකාරයෙන් සලකා බලා ඇති අතර, එහි නිගමනය ඉතාමත් නියත, නිශ්චිත, ප්‍රායෝගික හා පැහැදිලි වේ. පෙර සියළුම විප්ලව රාජ්‍ය යන්ත්‍රය පරිපූර්ණ කළ නමුත්, එය කඩා බිඳ පොඩිපට්ටම් කර දැමිය යුතු වේ.

රාජ්‍යය පිළිබඳ මාක්ස්වාදී න්‍යායයෙහි ප්‍රධාන සහ මූලික කරුණ මෙම නිගමනය වේ. ප්‍රධාන නිල සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ සම්පූර්ණයෙන්ම නොතකා හැර ඇත්තේ සහ ඇත්ත වශයෙන්ම, (අපට පසුව පෙනෙන ලෙසට) දෙවැනි ජාත්‍යන්තරයේ ප්‍රමුඛතම න්‍යායවාදියා වන කාල් කෞට්ස්කි විකෘති කර තිබෙන්නේද, නියත වශයෙන්ම මෙම කරුණ ය.

''කොමියුනිස්ට් ප්‍රකාශනය'' ඉතිහාසයේ සාමාන්‍ය සම්පිණ්ඩනයක් ඉදිරිපත් කරයි. ඒ අනුව, රාජ්‍යය පංති පාලනයේ අවයවයක් ලෙස සැලකීමට අපට අනිවාර්යයෙන්ම සිදුවන අතර, නිර්ධන පංතිය ප්‍රථමයෙන් දේශපාලන බලය දිනාගන්නේ නැතිව, දේශපාලන අධිපතිත්වය අත්කරගන්නේ නැතිව, රාජ්‍යය ''පාලක පංතිය ලෙස සංවිධානය වූ නිර්ධන පංතිය'' බවට පරිවර්තනය කරන්නේ නැතිව,එයට ධනපති පංතිය පෙරළා දැමිය නොහැකි යයිද, තවද, පංති සතුරුතාවයන් නොමැති සමාජයක රාජ්‍යය අනවශ්‍ය හා නොපැවැත්විය හැකි නිසා, නිර්ධන පංති රාජ්‍යයේ ජයග්‍රහණයෙන් පසු අප්‍රමාදවම එය හැකිළී යාමට පටන් ගන්නේ යයිද යන අනිවාරණීය නිගමනය වෙත අප යොමු වේ. ඓතිහාසිය සංවර්ධනයේ දෘෂ්ටි කෝණය අනුව බලන කල, ධනපති පංති රාජ්‍යය වෙනුවට නිර්ධන පංති රාජ්‍යය ආදේශ කෙරෙන්නේ කෙසේද යන ප්‍රශ්නය මෙහි මතු කර නොමැත.

1852 දී මාක්ස් මෙම ප්‍රශ්නය මතු කර ඊට පිළිතුරු දුන්නේය. මාක්ස් ඔහුගේ දයලෙක්තික ද්‍රව්‍යවාදයේ දර්ශනය අනුවම යමින් 1848 පටන් 1851 දක්වා වූ විප්ලවයේ ශ්‍රෙෂ්ඨ වර්ෂයන්ගේ ඓතිහාසික අත්දැකීම් සිය පදනම වශයෙන් ගනියි. වෙනත් සෑම තැනකදී මෙන්ම, මෙහිදීද, ඔහුගේ න්‍යායය, ලෝකය ගැන වූ ගැඹුරු දර්ශනික සංකල්පයන්ගෙන් සහ ඉතිහාසය ගැන වූ හසළ බුද්ධියෙන් ආලෝකමත් කරන ලද අත්දැකීම් සම්පිණ්ඩනයකි.

රාජ්‍යය පිළිබඳ ප්‍රශ්නය මෙසේ නිශ්චිත ලෙස ඉදිරිපත් කෙරේ: ධනපති රාජ්‍යය, ධනපති පංතියේ පාලනය සඳහා අවශ්‍ය රාජ්‍ය යන්ත්‍රය

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ඓතිහාසික වශයෙන් ජනිත වූයේ කෙසේද? එහි ඇති වූ වෙනස්කම් මොනවාද, ධනපති විප්ලව අතරතුරදී සහ පීඩිත පංතිවල ස්වාධීන ක්‍රියාවන් හමුවේ එහි කුමණ පරිණාමයක් සිදුවීද? මෙම රාජ්‍ය යන්ත්‍රය හා සම්බන්ධයෙන් නිර්ධන පංතියට පැවරෙන කර්තව්‍යයන් මොනවාද?

ධනපති සමාජයට විශේෂ වූ මධ්‍යගත රාජ්‍ය බලය ජනිත වූයේ පරම අධිපතිවාදය බිඳ වැටීමේ කාලයේදීය. මෙම රාජ්‍ය යන්ත්‍රයේ ස්වභාවය වැඩියෙන්ම නිරූපනය කරන ආයතන දෙක නම්, නිලධාරී පෙළැන්තිය සහ ස්ථිර යුද්ධ හමුදව ය. ධනපති පංතිය නූල් දහස් ගණනකින් මෙම ආයතන සමග සම්බන්ධව ඇති බව මාක්ස් හා එංගල්ස් ඔවුන්ගේ කෘතිවලින් නැවත නැවතත් පෙන්වා දී තිබේ. සෑම කම්කරුවකුගේම අත්දැකීම්වලින් මෙම සම්බන්ධය ඉතාමත් ප්‍රත්‍යක්ෂ සහ සිත්කාවදින ලෙස පිළිබිඹු වේ. කම්කරු පංතිය, එහි අමිහිරි අත්දැකීම් අනුව, මෙම සම්බන්ධය හඳුනා ගැනීමට උගෙන ගනියි. එය, මෙම සම්බන්ධයේ අනිවාරණීය භාවය ගැන උගන්වන ධර්මය එතරම් පහසුවෙන් වටහාගන්නේ හා හොඳින් උගෙන ගන්නේ එබැවිනි. සුළු ධනපති ප්‍රජාතන්ත්‍රවාදීහු, නොදැනුවත්කම නිසා හෝ වංචනික ලෙස හෝ එම ධර්මය ප්‍රතික්ෂේප කරති; එසේ නැතහොත් ඊටත් වඩා වංචනික ලෙස එය ''සාමාන්‍යයෙන්'' පිළිගෙන එයින් ප්‍රායෝගික නිගමනවලට බැස ගැනීමට අමතක කරති.

නිලධාරි පෙළැන්තිය සහ ස්ථිර යුද්ධ හමුදව ධනපති සමාජය නැමති ශරීරය වසාගත් ''පිළිලයකි''. එය, එම සමාජය දෙදරුම් කවන අභ්‍යන්තර සතුරුතාවයන් විසින් නිර්මාණය කෙරුණු පිළිලයකි. එහෙත් එය එම සමාජයේ සියලුම අත්‍යවශ්‍ය සිදුරු ''හිර කරන'' පිළිලයකි දැනට නිල සමාජ-ප්‍රජාතන්ත්‍රය තුළ බලපවත්න කෞට්ස්කිවාදී අවස්ථාවාදය සලකන්නේ, රාජ්‍යය පරපුටු සංවිධානයකැයි යන අදහස අරාජිකවාදයට විශේෂවූ හා එයටම සීමාවූ උපාංගයක් ලෙසය. මාක්ස්වාදය මෙසේ විකෘති කිරීම ''පිතෘ භූමිය ආරක්ෂා කිරීම'' යන සංකල්පයට ගලපා ගනිමින් අධිරාජ්‍යවාදී යුද්ධය අලංකාර කර හා සාධාරණ කර දැක්වීමේ නො ඇසූ විරූ නින්දව දක්වා සමාජවාදය පිරිහෙලූ ඒ අමනයන්ට, එයින් මහත් වාසියක් සැලසෙන බව නොකීවත් පැහැදිලිය. නමුත්, කෙසේ වෙතත්, එය නිසැකවම විකෘති කිරීමක් වන්නේය.

වැඩවසම් ක්‍රමය බිඳවැටීමෙන් පසුව යුරෝපය දුටු, ගණනක් නැති ධනපති විප්ලව සියල්ලම අතරතුරදී නිලධාරිවාදී සහ යුද්ධමය යන්ත්‍රය සංවර්ධනය කිරීම, අංග සම්පූර්ණ කිරීම සහ ශක්තිමත් කිරීම දිගටම සිදුවූයේය. ගොවිජනතාවට, සුළු ශිල්පීන්ට, කාර්මිකයන්ට සහ එවැනි වෙනත් කොටස්වලට සංසන්දනීය වශයෙන් සුවදායක, නිසල සහ ගෞරව සහිත රැකියා දෙමින්, ඒවා දරන්නන් ජනතාවගෙන් ඉහළට නංවන

මෙම යන්ත්‍රය මගින්, ලොකු ධනපතියන් පැත්තට ඇදගනු සහ ඔවුන්ට යටත් කරනු ලබන්නේ විශේෂයෙන්ම සුළු ධනපතියන් ය. 1917 පෙබරවාරි 27 දිනෙන් පසු හය මාසය තුළ රුසියාවේ සිදුවූ දෙය ගැන සලකා බලන්න. පූර්වතාවය අනුව, කලින් කළුසියය පිරිස් වලට දෙන ලද නිල තනතුරු, දැන් කැඩෙට්වරුන්[11] මෙන්ෂෙවික්වරුන් සහ සමාජවාදී-විප්ලවවාදීන් අත්කරගත් වාසිය බවට පත්ව තිබේ. බරපතල ප්‍රතිසංස්කරණ ඇති කිරීම ගැන කිසිවෙක් ඇත්ත වශයෙන් කල්පනා කර නැත. ඒවා ''ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය රැස්වන තෙක්'' කල් තැබීමටද, එම මණ්ඩලය කැඳවීම යුද්ධය අවසන් වන තෙක් දිගටම කල්දැමීමටද, සෑම ප්‍රයත්නයක්ම දරා තිබේ! නමුත්, වාසි බෙදා වෙන්කර ගැනීම, ඇමතිවරුන්ට, නියෝජ්‍ය ඇමතිවරුන්ට සහ අග්‍රාණ්ඩුකාරවරුන්ට ආදීන්ට ලොකු ආදයම් සහිත රැකියා ලබා ගැනීම යනාදියෙහිදී ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය බලාපොරොත්තුවෙන් සිටීමක් සිදුවී නැත! ආණ්ඩුව පිහිටුවීමේදී ක්‍රියාත්මක කරන ලද සම්බන්ධිකරණ ක්‍රීඩාව, හරය වශයෙන් ගත්කල, අන් කිසිවක් නොව, ඉහළ, පහළ හා රට සෑම තන්හිමත්, මධ්‍යම හා ප්‍රාදේශීය ආණ්ඩු දෙපාර්තමේන්තු සෑම එකකමත් සිදුවෙමින් පැවති ''වාසි'' බෙදා ගැනීමේ සහ නැවත බෙදා ගැනීමේ සංකේතයක් විය. 1917 පෙබරවාරි 27 සහ අගෝස්තු 27 අතර සය මාසය පහත සඳහන් පරිදි සම්පිණ්ඩනය කළ හැකිය; වාස්තවික ලෙස හා කිසිම විවාදයකට ඉඩ නොතබා මෙසේ සම්පිණ්ඩනය කළ හැකිය: ප්‍රතිසංස්කරණ හමස්පෙට්ටියට දමන ලදී, නිල රැකියා බෙදීම ඉටුකරන ලදී, බෙදීමේදී සිදුවූ ''වැරදීම්'' නැවත බෙදීම් කීපයක් මගින් නිවරද කරන ලදී.

එහෙත් නිලධාරිවාදී යන්ත්‍රය විවිධ ධනපති සහ සුළු ධනපති පක්ෂ අතර (කැඩෙට්වරු, සමාජවාදී-විප්ලවවාදීන් සහ මෙන්ෂෙවික්වරු අතර) වැඩි වැඩියෙන් ''නැවත බෙදූ'' තරමටම, පීඩිත පංති සහ ඒවායේ මුලින් සිටින නිර්ධන පංතිය මුළු මහත් ධනපති සමාජයම කෙරෙහි ඇති තමන්ගේ අසමාදන විරුද්ධත්වය ගැන තව තවත් අවබෝධ කර ගනිති. විප්ලවවාදී නිර්ධන පංතියට විරුද්ධව මර්දනකාරී පියවරයන් උත්සන්න කිරීම, බලහත්කාරයේ යන්ත්‍රය, එනම්, රාජ්‍ය යන්ත්‍රය ශක්තිමත් කිරීම, ඉතාමත් ප්‍රජාතන්ත්‍රවාදී සහ ''විප්ලවවාදී-ප්‍රජාතන්ත්‍රවාදී'' පක්ෂ පවා ඇතුළත් සියළුම ධනපති පක්ෂවලට අවශ්‍යවන්නේ එහෙයිනි. සිදුවීම් මෙම මාවත ඔස්සේ ගමන් කිරීම නිසා ''ස්වකීය විනාශකාරී බලවේගයන් සියල්ලම'' රාජ්‍ය බලයට විරුද්ධව ''සංකේන්ද්‍රණය කිරීමට'' සහ තම ඉලක්කය වශයෙන් රාජ්‍ය යන්ත්‍රය වැඩිදියුණු කිරීම නොව, එය සුන්කර'' විනාශ කිරීම නියම කර ගැනීමට විප්ලවයට අනිවාර්යයෙන්ම සිදුවේ.

මෙහිදී මෙම ප්‍රශ්නය පැන නගින්නේය. මාක්ස්ගේ අත්දැකීම, නිරි-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ක්ෂණ සහ නිගමන සාමාන්‍යකරණය සහ 1848-1851 තුන් වර්ෂයේ ප්‍රංශ ඉතිහාසයට වඩා පුළුල් ක්ෂේත්‍රයකට එය ගලපාලීම නිවැරදිද? මෙම ප්‍රශ්නය ගැන කරුණු සඳහන් කිරීමට පෙර, එංගල්ස් කී දෙයක් මතක් කර, ඊළඟට සත්‍ය කරුණු විමසා බලමු.

"බෲමේරයේ 18 වැනි ද" නැමති කෘතියෙහි තුන්වැනි සංස්කරණයට එංගල්ස් ලියූ සංඥපනයෙහි මෙසේ සඳහන්ව ඇත.

"අන් කුමණ දේශයකටත් වඩා, සෑම අවස්ථාවකදීම ඓතිහාසික පංති අරගල අවසානයක් දක්වා ගෙනගිය සහ එම අරගලවල සංචලනයට ක්ෂේත්‍ර වූ හා එම අරගලවල ප්‍රතිඵල සම්පිණ්ඩනයක් රූගත්, වෙනස්වන දේශපාලන ආකෘති ඉතාමත් පැහැදිලි රේඛාවලින් සලකුණු කළ රට ප්‍රංශය යි. මධ්‍යකාලීන යුගයේදී වැඩවසම් ක්‍රමයේ මධ්‍යස්ථානයද, පුනරුදයේ සමයෙන් පසුව, සමාජ තට්ටු පදනම් කරගත් එක්සත් රාජාණ්ඩුවක් පිළිබඳ ආදර්ශමත් රටද වූ ප්‍රංශය, ඒ ශ්‍රෙෂ්ඨ විප්ලවයේදී වැඩවසම් ක්‍රමය බිඳ හෙළා, වෙනත් කිසිම යුරෝපා දේශයකට සම නොවිය හැකි තරම් සම්භාවනීය සුපිරිසිදුතාවයකින් ධනපති පාලනය ස්ථාපිත කළේය. එමෙන්ම ධනපති පංතියට විරුද්ධව ඉහළට ඒමට වෙර දරන නිර්ධන පංතියේ අරගලය, වෙනත් කිසිම තැනකදී නොවූ තරම් තියුණු ස්වභාවයකින් මෙහිදී මතුවිය." (පිටු 4, 1907 සංස්කරණය).

1871 පටන් මේ දක්වා ප්‍රංශ නිර්ධන පංතියේ විප්ලවවාදී අරගලයේ තුනී වීමක් බලපැවති තාක් දුරට මෙහි අවසාන කියමන කල් ඉක්මවූ ස්වභාවයක් ගනී. අරගලයේ එම තුනී වී යාම දීර්ඝ කාලයක් පැවති නමුත්, අනාගත නිර්ධන පංති අරගලයේදී පංති අරගලය අවසානය දක්වා ගෙනයන සම්භාවනීය රට තමන් වන බව පෙන්වීමට ප්‍රංශයට ඇති ඉඩ කඩ එයින් බැහැර නොවේ.

එසේ වුවද, ශතවර්ෂය අවසානයේ වූ දියුණු රටවල ඉතිහාසය දෙස සාමාන්‍යයෙන් එබී බලමු. එම ක්‍රියාදාමයම, වඩාත් හෙමින්, වඩාත් විවිධාකාර ආකෘති අනුව, ඊට වඩා බොහෝ විශාල ක්ෂේත්‍රයක ක්‍රියාත්මක වූ බව අපට පෙනෙනු ඇත: එක් අතකින් සමූහාණ්ඩු රටවල (ප්‍රංශයේ, ඇමෙරිකාවේ, ස්විට්සර්ලන්තයේ) සහ රාජාණ්ඩුවල (බ්‍රිතාන්‍යයේ, ජර්මනියේ සහ එක්තරා දුරකට ඉතාලියේ, ස්කැන්ඩිනේවියානු රටවල ආදියෙහි) යන දෙකෙහිම "පාර්ලිමේන්තු බලය" සංවර්ධනය විය. අනිත් අතට, ධනපති සමාජයේ පදනම් නොවෙනස්ව පැවති අතර, තනතුරු

"වාසි" බෙදගැනීමෙහි සහ නැවත බෙදගැනීමෙහි යෙදුනු ධනපති සහ සුළු ධනපති පක්ෂ අතර බලය සඳහා අරගලයක් ඇතිවිය. එසේම, අවසාන වශයෙන් නිලධාරිවාදී සහ යුද්ධ යන්ත්‍රයේ "විධායක බලය" අංග සම්පූර්ණ කිරීම සහ තහවුරු වීම් සිදුවිය. සාමාන්‍ය වශයෙන් සියළුම ධනපති රාජ්‍යයන්ගේ මුළු මහත් නවීන පරිනාමයටම මෙම අංග ලක්ෂණ පොදු බවට කිසිදු සැකයක් නැත. 1848-1851 තුන් අවුරුද්ද තුළදී, වේගවත්, තියුණු සහ සංකේන්ද්‍රිත ආකාරයකින් ප්‍රංශය ගෙන හැර දැක්වූයේ, මුළු ධනපති ලෝකයටම විශේෂ වූ එම සංවර්ධන ක්‍රියාදමයන්ම ය.

අධිරාජ්‍යවාදය, එනම්, බැංකු ප්‍රාග්ධනයේ යුගය, යෝධ ධනැති ඒකාධිකාරයන්ගේ සහ ඒකාධිකාරී ධනපති ක්‍රමය රාජ්‍ය ඒකාධිකාරී ධනපති ක්‍රමයට පරිවර්තනය වීමේ යුගය, රාජාණ්ඩුවාදී සහ නිදහස්තම සමූහාණ්ඩු රටවල යන දෙකෙහිම, ඒවායේ නිර්ධන පංතියට විරුද්ධව මර්දනකාරී පියවරයන් උත්සන්න කිරීම හා සම්බන්ධයෙන් අසාමාන්‍ය ලෙසින් "රාජ්‍ය යන්ත්‍රය" ශක්තිමත් කිරීමක් ද, නිලධාරි සහ යුද්ධ යන්ත්‍රයේ අභූත පූර්ව වර්ධනයක්ද, පැහැදිලි ලෙසම පෙන්නුම් කර තිබේ.

රාජ්‍යය යන්ත්‍රය "විනාශ කිරීම" උදෙසා, නිර්ධන පංති විප්ලවයේ සියළු බලවේගයන් සංකේන්ද්‍රණය කිරීමක් වෙතට දැන් ලෝක ඉතිහාසය 1852 ට වඩා අසමසම තරම් විශාල පරිමාණයකින් යොමුවන බවට සැකයක් නොමැත.

රාජ්‍යයන්ත්‍රයේ තැනට නිර්ධන පංතිය ආදේශ කරනු ඇත්තේ කුමක්ද යන්න පැරිස් කොමියුනයේ ඉතාමත් උපදේශාත්මක කරුණුවලින් හඟවනු ලැබේ.

3. 1852 දී මාක්ස් ප්‍රශ්නය ඉදිරිපත් කළ හැටි*

1852 මාර්තු 5 දින මාක්ස් වෙයිදිමෙයර් වෙත යැවූ ලිපියෙන් කොටස් මේරිං 1907 දී "Neue Zeit"[12] හි (වෙළුම **XXV**, 2, පිටු 164) පළ කළේය.

"මා ගැන කියතොත්, නවීන සමාජයේ පංති හෝ ඒවා අතර අරගලය පවතින බව සොයා ගැනීම ගැන මට ලැබිය යුතු ගෞරවයක් නොමැති බව මෙහිලා සඳහන් කරමි. මට බොහෝ කලකට පෙර, ධනපති ඉතිහාසඥයන් මෙම පංති අරගලයේ ඓතිහාසික සංවර්ධනයත්, ධනපති අර්ථ ශාස්ත්‍රඥයන් මෙම පංතිවල ආර්ථික ව්‍යුහයත් විස්තර කර තිබුණි. මා කළ අළුත් දෙය වූයේ මෙම කරුණු

* දෙවැනි සංස්කරණයට එකතු කරන ලදී.

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

> ඔප්පු කිරීමය: 1) පංති පැවැත්ම බැඳී පවතින්නේ නිෂ්පාදනයේ සංවර්ධනයෙහි විශේෂ ඓතිහාසික පරිච්ඡේද historische Entwicklungsphasen der Produktion හා සමග පමණකි. 2) පංති අරගලය අවශ්‍යයෙන්ම නිර්ධන පංති ආඥාදායකත්වය ඇති කිරීමට යොමු වන්නේය. 3) මෙම ආඥාදායකත්වයද, සියළුම පංති අහෝසි කිරීම දක්වා සහ පංති රහිත සමාජයක් දක්වා පරිවර්තනය වීමෙන් පමණක් සංයුක්ත වූවකි.''

මෙම වචනවලින්, ප්‍රථමයෙන්ම තමන්ගේ න්‍යායය සහ ධනපති පංතියේ ඉතාමත් විශාරද චින්තකයන්ගේ න්‍යාය අතර ඇති ප්‍රධාන සහ මූලික වෙනසත්, දෙවැනිව, තමන්ගේ රාජ්‍ය පිළිබඳ න්‍යායයෙහි හරයත් සිත් කාවදින තරම් ඉතාමත් පැහැදිලි ලෙස ගෙනහැර දැක්වීමට මාක්ස් සමත්විය.

මාක්ස්ගේ න්‍යායයෙහි ප්‍රධාන කරුණ පංති අරගලය යයි බොහෝ විට කියනු ලැබේ, ලියනු ලැබේ. නමුත් එය වැරදිය. එම පමණක් නොව, මෙම වැරදි මතයෙහි ප්‍රතිඵලයක් වශයෙන් මාක්ස්වාදය බොහෝ විට අවස්ථාවාදී ලෙස වෙනස් කිරීමට සහ එය ධනපති පංතියට පිළිගත හැකි ආකාරයට විකෘති කිරීමටද හේතු වන්නේය. එසේ වන්නේ පංති අරගලය පිළිබඳ න්‍යායය මාක්ස් විසින් නොව, ඔහුට පෙර නිර්මාණය කරන ලද හා සාමාන්‍යයෙන් කියතොත් එය ධනපති පංතියට පිළිගත හැකි හෙයිනි. පංති අරගලය පමණක් පිළිගන්නා අය එතෙකින් මාක්ස්වාදීහු නොවෙති. ඔවුන් තවමත් ධනපති චින්තනයේ සහ ධනපති දේශපාලනයේ සීමාවන් තුළි සිටිනු දක්නට ලැබේ. මාක්ස්වාදය පංති අරගලයේ න්‍යායයට පමණක් සීමා කිරීම යනු, මාක්ස්වාදය කප්පාදු කිරීමක්, එය විකෘති කිරීමක් සහ එය ධනපති පංතියට පිළිගත හැකිවන යමක් දක්වා බාල කිරීමක් වන්නේය. මාක්ස්වාදියෙක් වන්නේ පංති අරගලය පිළිබඳ පිළිගැනීම, නිර්ධන පංති ආඥාදායකත්වය පිළිගැනීම දක්වා ව්‍යාප්ත කරන තැනැත්තේ පමණකි. මාක්ස්වාදියා සහ සාමාන්‍ය සුළු (එසේම ලොකු) ධනපතියා අතර ඉතාමත් ගැඹුරු වෙනස සංයුක්ත වන්නේ මෙයිනි. මාක්ස්වාදය ගැන නියම අවබෝධය සහ පිළිගැනීම පරීක්ෂාකර බැලීමට උපයෝගි කරගත යුතු උරගල මෙයයි. යුරෝපයේ ඉතිහාසය මෙය ප්‍රායෝගික ප්‍රශ්නයක් ලෙසට කම්කරු පංතිය ඉදිරියට පැමිණවූ අවස්ථාවේදී සියළුම අවස්ථාවාදීන් සහ ප්‍රතිසංස්කරණවාදීන් පමණක් නොව, සියළුම කෞට්ස්කිවාදීන්ද (ප්‍රතිසංස්කරණවාදය හා මාක්ස්වාදය අතර එහා මෙහා වැනෙන අය), නිර්ධන පංති ආඥාදායකත්වය ප්‍රතික්ෂේප කරන කාලකණ්ණි අශිෂ්ටවාදයින් සහ සුළු ධනපති පංතික ප්‍රජාතන්ත්‍රවාදීන් වන බව ඔප්පුවීම පුදුමයට කරුණක්

නොවේ. මෙම පොතෙහි මුල් සංස්කරණය පළවීමෙන් බොහෝ කලකට පසු, 1918 අගෝස්තුවේදී පළ කෙරුණු, කෞට්ස්කිගේ ''නිර්ධන පංති ආඥාදායකත්වය'' යන පොත, වංචනික ලෙස වචනයෙන් පමණක් මාක්ස්වාදය පිළිගනිමින් එය පහත් ලෙස ක්‍රියාවෙන් අත්හැර දමන අතරම, මාක්ස්වාදය සුළුධනපති ස්වරූපයෙන් විකෘති කිරීම පිළිබඳ කදිම නිදර්ශනයක් වේ (''නිර්ධන පංති විප්ලවය සහ කෞට්ස්කි ද්‍රෝහියා'' යන මගේ පොත බලන්න, පෙට්‍රොග්‍රෑඩ් සහ මොස්කව්, 1918).

අද අවස්ථාවාදය, එහි ප්‍රධාන කථිකයා වන කාල් කෞට්ස්කි නැමති හිටපු මාක්ස්වාදියා විසින් නියෝජනය කරනු ලබන ආකාරයට, එය ඉහත උපුටා දැක්වූ ධනපති පංති ප්‍රතිෂ්ඨාව ගැන වූ මාක්ස්ගේ හැඳින්වීම සමග මනා සේ ගැලපෙන්නේය. එසේ කියන්නේ, මෙම අවස්ථාවාදය පංති අරගලය පිළිගැනීම ධනපති සම්බන්ධකම් ක්ෂේත්‍රයට සීමාකරන හෙයිනි. (මෙම ක්ෂේත්‍රය තුළ, මෙම රාමු කට්ටුව තුළ, ''ප්‍රතිපත්තියක් වශයෙන්!'' පංති අරගලය පිළිගැනීම කිසිම උගත් ලිබරල්වාදියෙක් ප්‍රතික්ෂේප නොකරනු ඇත). පංති අරගලය පිළිගැනීම, ප්‍රධාන කරුණ පිළිගැනීම දක්වා, ධනපති ක්‍රමයේ සිට කොමියුනිස්ට් ක්‍රමයට පරිවර්තනය වීමේ, නැතහොත්, ධනපති පංතිය පෙරළා දමා, එය සම්පූර්ණයෙන්ම අහෝසි කිරීමේ කාල පරිච්ඡේදය පිළිගැනීම දක්වා ඉදිරියට ගෙනයාම අවස්ථාවාදය විසින් නොකෙරේ. යථාර්ථය අනුව බලන කළ, මෙම කාල පරිච්ඡේදය අභූත පූර්ව තරම් ප්‍රචණ්ඩ පංති අරගල, අභූත පූර්ව තරම් තියුණු ආකාරයක් ගනිමින් පවතින කාලයක් වීම අනිවාර්‍ය්‍යය. ඒ අනුව, අනිවාර්‍ය්‍ය වශයෙන්ම, මෙම කාලයේ රාජ්‍යය නව ආකාරයෙන් (නිර්ධන පංතියට සහ සාමාන්‍ය වශයෙන් දේපල නැති අයට) ප්‍රජාතන්ත්‍රවාදී වන අතර, නව ආකාරයකින් (ධනපති පංතියට) ආඥාදායක විය යුතුය. මාක්ස්ගේ රාජ්‍යය සම්බන්ධයෙන් වූ න්‍යායයෙහි හරය ගැන මහා දැනුමක් ඇත්තේ, සාමාන්‍ය වශයෙන් සෑම පංති සමාජයකට පමණක් නොව, ධනපති පංතිය පෙරළා දැමූ නිර්ධන පංතියට පමණක් නොව, ධනපති ක්‍රමය පංති රහිත සමාජය වන කොමියුනිස්ට් සමාජයෙන් වෙන් කරන මුළුමහත් ඓතිහාසික කාල පරිච්ඡේදයටම, තනි පංතියක ආඥාදායකත්වය අවශ්‍ය බව වටහා ගත් අයට පමණකි. ධනපති රාජ්‍යයන් ආකෘතියෙන් ඉතාමත් විවිධාකාර වුවත් ඒවායේ හරය එකම ය. ඒවායේ ආකෘතිය කුමක් වුවත්, අවසාන විග්‍රහයේදී මෙම රාජ්‍යයන් සියල්ලම අනිවාර්‍ය්‍ය වශයෙන් ධනපති පංතියේ ආඥාදායකත්වයන් වෙති. ධනපති ක්‍රමයේ සිට කොමියුනිස්ට් ක්‍රමය දක්වා පරිවර්තනය වීමේදී දේශපාලන ආකෘති පිළිබඳ අතිශය බහුලත්වයක් හා විවිධත්වයක් දක්නට ලැබීම ඒකාන්ත වන නමුත්, ඒවායේ හරය අනිවාර්‍ය්‍ය වශයෙන් එකම වනු ඇත. එය නිර්ධන පංති ආඥාදායකත්වය වනු ඇත.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

තුන්වැනි පරිච්ඡේදය

රාජ්‍යය සහ විප්ලවය. 1871 පැරිස් කොමියුනයේ අත්දැකීම්. මාක්ස්ගේ විග්‍රහය

1. කොමියුනාඩ්වරුන්ගේ ප්‍රයත්නය වීරත්වයට පත්වූයේ කුමක් නිසාද?

ආණ්ඩුව පෙරළා දැමීමට දරන කුමණ හෝ ප්‍රයත්නයක් වෙතොත්, එය බලාපොරොත්තු සුන් කර ගැනීමේ අඥාන ක්‍රියාවක් වනු ඇතැයි යනුවෙන් කොමියුනයට මාස කීපයකට පෙර, 1870 සරත් සමයේදී මාක්ස් පැරිස් කම්කරුවන්ට අවවාද කළ බව සුප්‍රකටය[13]. නමුත් 1871 දී තීරණාත්මක සටනක් කම්කරුවන් මත බලෙන් පටවන ලදින් ඔවුන් එය පිළිගත් විට, අවිගත් නැගී සිටීම යථාර්ථයක් බවට පත්වූ විට, අවාසි සහගත පෙර නිමිති දැක දැකම, මාක්ස් නිර්ධන පංති විප්ලවයට මහත් උද්වේගයෙන් යුතුව ශුභ පැතුවේය. මාක්ස්වාදයට පිටුපෑ ඒ රුසියානු පාවා දෙන්නා වන ප්ලෙහානව් මෙන්, ''අකල්'' ව්‍යාපාරයක් හෙළා දැකීමේ පණ්ඩිතමානී ආකල්පයක් රැකීමට මාක්ස් යොමු නොවිය. කම්කරුවන්ගේ හා ගොවි ජනයාගේ අරගලය ගැන උනන්දු කරන ආකාරයෙන් 1905 නොවැම්බරයේදී ලියූ ප්ලෙහානව් 1905 දෙසැම්බරයෙන් පසු මොර දුන්නේ ''ඔවුන් ආයුධ නොගත යුතුව තිබුණි'' යනුවෙනි.

මාක්ස් කී පරිදි ''දෙව් ලොව කැලඹූ[14]'' කොමියුනාඩ්වරුන්ගේ වීරත්වය ගැන, ඔහු දැක්වූයේ උද්වේගය පමණක් නොවේ. පොදුජන විප්ලවය එහි අරමුණ ඉටුකර නොගත් නමුත්, ඔහු එය සැලකුවේ අතිශයින් වැදගත් ඓතිහාසික අත්දැකීමක් ලෙසටය; ලෝක නිර්ධන පංති ව්‍යාපාරයේ ඒකාන්ත ඉදිරි ගමනක් ලෙසටය; වැඩපිළිවෙළවල් සහ තර්ක සිය ගණනකට වඩා වැදගත් ප්‍රායෝගික පියවරක් ලෙසටය. මෙම අත්හදබැලීම විග්‍රහ කිරීමටත්, එයින් ගතහැකි උපක්‍රමීය පාඩම් නිශ්චය කිරීමටත්, එහි ආලෝකය අනුව තම න්‍යාය යළි පරීක්ෂාකර බැලීමටත්, මාක්ස් උත්සාහ කළේය.

''කොමියුනිස්ට් ප්‍රකාශනයට'' ඇතුළත් කළ යුතුයයි ඔහු සැලකූ එකම ''නිවරද කිරීම'' කරන ලද්දේ, පැරිස් කොමියුනාඩ්වරුන්ගේ විප්ලවවාදී අත්දැකීම පදනම් කරගෙන ය.

''කොමියුනිස්ට් ප්‍රකාශනයේ'' අළුත් ජර්මන් සංස්කරණයට, එහි කතුවරුන් දෙදෙනාගේ අත්සන ඇතිව ලියන ලද සංඥපනයට 1872 ජූනි 24 දිනය යොද ඇත. ''කොමියුනිස්ට් ප්‍රකාශනයේ'' වැඩ පිළිවෙළ

සමහර සවිස්තර කරුණු අතින් ''කල් ඉක්මවා'' ඇති බව එම සංඥපනයෙන් කියන කතුවරුන් වන කාල් මාක්ස් සහ ෆ්‍රෙඩ්රික් එංගල්ස්, තවදුරටත් මෙසේ කියති:

> '' ... එක කරුණක් විශේෂයෙන්ම පැරිස් කොමියුනයෙන් ඔප්පු විය. එය නම්, 'සාද නිමකර තිබෙන රාජ්‍ය යන්ත්‍රය එසේම අත්පත්කර ගෙන කම්කරු පංතියට එය තමන්ගේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ නොහැකි බවය' ...''

මෙම කොටසේ තනි උධෘත ලකුණුවලින් දක්වා ඇති කොටස කතුවරුන් ගත්තේ මාක්ස්ගේ ''ප්‍රංශයේ සිවිල් යුද්ධය'' යන පොතෙනි.

ඒ අනුව බලන කල, පැරිස් කොමියුනයේ ප්‍රධාන සහ මූලික පාඩමක් මාක්ස් සහ එංගල්ස් විසින් කොතරම් නම් මහත් සේ වැදගත් කොට සලකන ලද්දේද යත්, ඔවුහු එය වැදගත් නිවැරදි කිරීමක් ලෙස සලකා ''කොමියුනිස්ට් ප්‍රකාශනයට'' ඇතුළත් කළහ.

අවස්ථාවාදීන් විකෘතිය කළේත්, ''කොමියුනිස්ට් ප්‍රකාශනය'' කියවූවන් සියයට අනූ නවයක් නොවේ නම් දහයෙන් නවයක් දෙනා සමහර විට අර්ථය නොදත්තේත්, මෙම ඉතාමත් වැදගත් නිවැරදි කිරීමෙහි වීම වඩාත්ම ස්වභාවානුරූපය. තවත් ඉදිරියෙහිදී, විකෘති කිරීම් සම්බන්ධයෙන් විශේෂයෙන්ම වෙන් කළ පරිච්ඡේදයක මෙම විකෘතිය ගැන වඩාත් විස්තර සහිතව කරුණු සඳහන් කරමු. මාක්ස් අඩුවේගී සංවර්ධනය පිළිබඳ අදහස අවධාරණය කළේ බලය අල්වා ගැනීම ආදියට ප්‍රතිවිරුද්ධ දෙයක් ලෙසට යයි, මෙහි උපුටා දැක්වූ මාක්ස්ගේ සුප්‍රසිද්ධ කියමන සම්බන්ධයෙන් දැනට ප්‍රචලිත පහත් ''අර්ථනිරූපනයෙන්'' කියන බව පමණක් මෙහිලා සටහන් කරගැනීම ප්‍රමාණවත් ය.

ඇත්ත වශයෙන්ම සත්‍යය ඉඳුරාම එයට ප්‍රතිවිරුද්ධ දෙයය. මාක්ස්ගේ අදහස වන්නේ, ''සද නිම කර තිබෙන රාජ්‍ය යන්ත්‍රය'' අත්පත් කර ගැනීමට පමණක් සීමා නොවී කම්කරු පංතිය එය කඩා බිඳ දමා සුන් කළ යුතු බවය.

1871 අප්‍රියෙල් 12 දින, එනම් හරියටම කොමියුනයේ කාලයේදීම, මාක්ස් මෙසේ කුගෙල්මාන් වෙත ලියා යැව්වේය:

> ''ප්‍රංශ විප්ලවයේ මී ළඟ ප්‍රයත්නය වනුයේ කලින් මෙන් තවදුරටත් නිලධාරි යන්ත්‍රය එක අතකින් තවත් අතකට මාරු කිරීමට නොව, එය සුන් කිරීමට (මාක්ස්ගේ අවධාරණය — මුල් වචනය zerbrechen) බවත්, මහා ද්වීපයේ සෑම ජනතා විප්ලවය-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

> කටම පූර්ව කොන්දේසිය මෙය යයි මා ප්‍රකාශ කර තිබෙන බවත්, ඔබ මගේ ''බ්‍රැමේරයේ දහ අට'' පොතෙහි අවසාන පරිච්ඡේදය බලන්නේ නම් ඔබට පෙනෙනු ඇත. පැරිසියේ අපගේ වීර සහෝදරවරුන් උත්සාහ කරන්නේ එය කිරීමට ය.'' ("Neue Zeit", වෙළුම XX, 1, 1901-1902, පිටු 709). (මාක්ස් කුගෙල්මාන්ට යැවූ ලිපි රුසියානු බසින් සංස්කරණ දෙකකින් පළවිය. ඉන් එකක් සංස්කරණය කිරීම සහ ඊට සංඥපනයක් සැපයීම මවිසින් කරන ලදී).

විප්ලවයක් අතරතුරදී රාජ්‍යය හා සම්බන්ධයෙන් නිර්ධන පංතිය ඉටුකළ යුතු කර්තව්‍යය පිළිබඳව මාක්ස්වාදයේ ප්‍රධාන පාඩම ''නිලධාරි-යුද්ධ යන්ත්‍රය සුන් කිරීම'' යන වචනවලින් සංක්ෂිප්ත ලෙස ප්‍රකාශ වේ. මාක්ස්වාදය ගැන දැනට පැතිර පවත්නා කෞට්ස්කිවාදී ''අර්ථ නිරූපනයෙන්'' සම්පූර්ණයෙන්ම නොතකා හැර පමණක් නොව ඒකාන්තවම විකෘති කර තිබෙන්නේද මෙම පාඩම ය!

''බ්‍රැමේරයේ 18 ද'' ගැන කරන සඳහන සම්බන්ධයෙන් කිව යුත්තේ, අප එහි අදාල කොටස සම්පූර්ණයෙන්ම ඉහත උපුටා දක්වා ඇති බවයි.

මාක්ස්ගේ ඉහත උපුටා දක්වන ලද තර්කයෙන් කරුණු දෙකක් සටහන් කර ගැනීම විශේෂයෙන්ම වැදගත්ය. ප්‍රථම කරුණ, ඔහු ඔහුගේ නිගමනය මහා ද්වීපයට සීමා කිරීම යි. බ්‍රිතාන්‍යය එවකටත් ආදර්ශමත් පිරිසිදු ධනපති රටක්වූ, එහෙත්, යුද්ධවාදී කල්ලියක් සහ එක්තරා ප්‍රමාණයකට නිලධාරි පෙළැන්තියක්ද නොමැති රටක්ව පැවති 1871 දී එසේ කිරීම වටහා ගත හැකි විය. ''සද නිමකළ රාජ්‍ය යන්ත්‍රය'' විනාශ කිරීමේ පූර්ව කොන්දේසිය ඉටු නොකර, බ්‍රිතාන්‍යයට විප්ලවයක්, ජනතා විප්ලවයක් පවා, ඉටු කළ හැකි සේ එවකට පෙනී ගිය හා ඇත්තෙන්ම එයට එම අවකාශය තිබුණු නිසා, මාක්ස් එරට මෙම නිගමනයට ඇතුලත් නොකළේය.

අද 1917 දී, ප්‍රථම මහා අධිරාජ්‍යවාදී යුද්ධයේ කාලයේදී, මාක්ස් මේ සම්බන්ධයෙන් යෙදූ සීමා කිරීම තවදුරටත් වලංගු නොවේ. මුළු ලෝකයේම ඇංග්ලො-සැක්සන් ''නිදහසේ'' ලොකුම සහ අවසාන නියෝජිතයා වූ ඇමෙරිකාව, සියල්ල තමන්ට යටත් කරන සහ සියල්ල මර්දනය කරන, සමස්ත යුරෝපීය නිලධාරි-යුද්ධ ආයතන නැමති මඩ ගොහොරුවෙහි සම්පූර්ණයෙන්ම එරී ඇත. මෙහි ඇංග්ලො-සැක්සන් නිදහස ගැන සඳහන් කෙරෙන්නේ ඔවුන් අතර යුද්ධවාදී කල්ලි සහ නිලධාරි පෙළැන්තියක් නොවීමේ අර්ථයෙනි. අද, බ්‍රිතාන්‍යයෙහි සහ ඇමෙරිකාවේද, සෑම සැබෑ ජනතා විප්ලවයකටම පූර්ව කොන්දේසිය වන්නේ (එම රටවල 1914-1917 අවුරුදුවලදී සාද ''යුරෝපීය'' සාමාන්‍ය අධිරාජ්‍යවාදී පරිපූර්ණත්වයට ගෙන එන ලද) ''යාද නිම කළ'' රාජ්‍ය යන්ත්‍රය සුන් කිරීමය, විනාශ කිරීමය.

දෙවැනිව, ''සෑම සැබෑ ජනතා විප්ලවයකටම පූර්ව කොන්දේසිය'' නිලධාරි-යුද්ධ රාජ්‍ය යන්ත්‍රය විනාශ කිරීම වන බවට මාක්ස් කළ අතිශයින්ම ගැඹුරු ප්‍රකාශය කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය. ''ජනතා විප්ලවය'' පිළිබඳ අදහස මාක්ස්ගෙන් ප්‍රකාශවීම අසාමාන්‍ය සේ පෙනෙන හෙයින්, එවැනි ප්‍රකාශයක් මාක්ස් අතින් ''වැරදී ලියවුනු'' බවක් කීමට, මාක්ස්වාදීන් ලෙසට පිළිගනු ලැබීමට කැමති ඒ ස්ත්‍රැවේවාදීන් වන, රුසියානු ප්ලෙහානව්වාදීන් සහ මෙන්ෂෙවික්වරුන් ඉදිරිපත් වීමට ඉඩ තිබේ. ඔවුහු මාක්ස්වාදය කොතරම් නම් කාලකණ්ණි ලිබරල්වාදී විකෘතියක තත්ත්වයකට පත්කළෝද යත්, ධනපති විප්ලවයක්, නිර්ධන පංති විප්ලවයක් අතර වන ප්‍රතිපත්‍යයට වඩා ඇත වෙනත් කිසිම දෙයක් ඔවුනට නොපෙනේ. එම ප්‍රතිපත්‍යය ගැන පවා ඔවුන් අර්ථ නිරූපනය කරන්නේ කිසිම ජීවයක් නැති ආකාරයෙනි.

අපි විසිවැනි ශතවර්ෂයේ විප්ලව නිදසුන් ලෙස ගන්නෙමු නම්, පෘතුගීසි සහ තුර්කි යන විප්ලව දෙකම ධනපති විප්ලව බව පිළිගැනීමට අපට සිදුවනු නිසැකය. එසේ වුවද, ඒ දෙකෙන් එකක් හෝ ජනතා විප්ලවයක් නොවේ. එසේ කියන්නේ, ඉන් එකකදීවත්, පොදු ජනකාය, එහි අතිබහුතරය, කිසියම් සැලකිය යුතු ප්‍රමාණයකට ක්‍රියාශීලී ලෙස, ස්වාධීන ලෙස හා තමන්ගේම ආර්ථික ඉල්ලීම් සහිතව ඉදිරිපත් නොවුන හෙයිනි. ඒ හා සමග විසංසන්දනය කරන කල, 1905-1907 රුසියානු ධනපති විප්ලවය, පෘතුගීසි සහ තුර්කි විප්ලව ලැබූ වැනි ''විශිෂ්ට'' ජයග්‍රහණ ගෙනහැර නොපෑ නමුත්, පීඩනයන් සහ සූරා කෑමෙන් මිරිකී ගිය පොදුජනකාය, ඉන් බහුතරය හා ඉතාමත් පහළ සමාජ කණ්ඩායම්, එහිදී ස්වාධීනව නැගී සිටිමින් තමන්ගේම ඉල්ලීම්වලින්, විනාශකරනු ලබමින් තිබුණු පැරණි සමාජය වෙනුවට තමන්ටම ආවේණික ආකාරයෙන් නව සමාජයක් ගොඩනැගීමට දරනු ලබන තමන්ගේම ප්‍රයත්නවලත් ලාංඡනය විප්ලව මාර්ගය මුළුල්ලේම සටහන් කළ හෙයින්, එය නිසැක වශයෙන්ම ''සැබෑ ජනතා'' විප්ලවයක් විය.

1871 වර්ෂයේදී යුරෝපා මහා දේශයේ කිසිම රටක නිර්ධන පංතිය රටේ ජනගහනයෙන් බහුතරය නොවීය. විප්ලවය ''ජනතා'' විප්ලවයක් වන්නේ, තම ප්‍රවාහයට බහුතරය ඇත්තවශයෙන්ම අද්දන විප්ලවයක් වන්නේ, එය, නිර්ධන පංතිය හා ගොවිජනතාව යන දෙකම වැළඳ ගතහොත් පමණකි. එසේවූ කල''ජනතාව''මෙම පංති දෙකෙන් සංයුක්ත

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

වන්නේය. ''නිලධාරි-යුද්ධ රාජ්‍ය යන්ත්‍රය'' මෙම පංති දෙකම මර්දනය කරන, මිරිකාගෙන සිටින හා සූරාකන නිසා, එම කරුණ විසින් එම පංති එක්සත් කෙරෙයි. මෙම යන්ත්‍රය සුන් කිරීම, එය බිඳ දැමීම සැබවින්ම ජනතාවගේ, ඉන් බහුතරයේ, එනම් කම්කරුවන්ගේත්, ගොවි ජනතාවගෙන් ඉතා වැඩි කොටසකත් යහපතට හේතුවේ; එය දුප්පත් ගොවි ජනයාගේ සහ නිර්ධනයන්ගේ සන්ධානයට අවශ්‍ය ''පූර්ව කොන්දේසිය'' වේ; ඒ අතර, එවැනි සන්ධානයක් නොමැතිව ප්‍රජාතන්ත්‍රවාදය අස්ථාවර වේ, සමාජවාදී පරිවර්තනය සිදුකළ හැකි නොවේ.

පැරිස් කොමියුනය ඇත්ත වශයෙන් එවැනි සන්ධානයක් ඇතිකරගැනීම කරා යොමුව කටයුතු කරමින් සිටි බව සුප්‍රකටය. එහෙත් අභ්‍යන්තර හා බාහිර කරුණු ගණනාවක් නිසා, එයට එහි අරමුණු ඉටුකරගත හැකි නොවීය.

ඒ අනුව ''සැබෑ ජනතා විප්ලවය'' ගැන කතා කිරීමේදී මාක්ස් සුළු ධනපති පංතියේ විශේෂ අංග ලක්ෂණ කිසිසේත්ම අඩුවෙන් නොසලකා (ඔහු ඒ ගැන බොහෝ සෙයින්, බොහෝ විට කතා කළේය), 1871 දී යුරෝපයේ මහා ද්වීපික රටවල් වැඩි ගණනක පැවති පංති බලවේගයන් අතර නියම තුලනය නිවැරදි ලෙස සැලකිල්ලට ගත්තේය. අනිත් අතට, රාජ්‍ය යන්ත්‍රය සුන් කිරීම කම්කරුවන් හා ගොවිජනයා යන දෙකොටසේම යහපත පිණිස අවශ්‍ය බවත්, එසේ කිරීම ඔවුන් එක්සත් කරන්නක් බවත් එය ''පිළිලය'' ඉවත් කිරීමේ හා ඒ වෙනුවට අළුත් යමක් ආදේශ කිරීමේ කර්තව්‍යය ඔවුන් හමුවේ තබන බවත්, ඔහු කීවේය.

ආදේශ කරන්නේ නිශ්චිත වශයෙන් කුමක්ද?

2. සුන් කළ රාජ්‍ය යන්ත්‍රය වෙනුවට ආදේශ කෙරෙන්නේ කුමක්ද?

1847 දී, ''කොමියුනිස්ට් ප්‍රකාශනයෙන්'' මාක්ස් මෙම ප්‍රශ්නයට දුන් පිළිතුර එකළද හුදෙක්ම වියුක්ත එකක් වූයේය. හරියටම කියතොත්, එය නිසි කර්තව්‍යයන් පෙන්නුම් කළ, එහෙත් ඒවා සාර්ථක කරගන්නා ආකාරය පෙන්නුම් නොකළ පිළිතුරක් විය. ''කොමියුනිස්ට් ප්‍රකාශනයෙයෙන්'' දුන් පිළිතුර වූයේ ''ප්‍රජාතන්ත්‍රවාදය සඳහා සටන ජයග්‍රහණය'' කිරීමෙන්, මෙම යන්ත්‍රය වෙනුවට ''පාලක පංතිය ලෙසට සංවිධානය වූ නිර්ධන පංතිය'' ආදේශ කෙරෙන බවය.

මාක්ස් මනෝරාජ්‍යයෙහි නොයෙදුණේය. නිර්ධන පංතිය ලෙසට සංවිධානය වීමේදී එය ගන්නා ආකෘති සහ මෙම සංවිධානය වීම සමග ඉතාමත් පරිපූර්ණ සහ ඉතාමත් සසංගත ලෙස ''ප්‍රජාතන්ත්‍රවාදය සඳහා

සටන ජයග්‍රහණය කිරීම'' එකට සම්බන්ධ කරන නියම ආකාරය ගැන වූ ප්‍රශ්නයට, පොදු ජන ව්‍යාපාරයේ අත්දැකීමෙන් පිළිතුරු සැපයෙනු ඇතැයි මාක්ස් අපේක්ෂා කළේය.

කොමියුනයේ අත්දැකීම් ස්වල්ප වුවත්, මාක්ස් ''ප්‍රංශයේ සිවිල් යුද්ධය'' යන කෘතියෙන් එය ඉතාමත් සුපරීක්ෂාකාර විග්‍රහයට භාජනය කළේය. මෙම කෘතියේ ඉතාමත් වැදගත් ඡේදය උපුටා දක්වමු:

> සෑම තැනම විහිදුනු ස්ථිර යුද්ධ හමුදාවේ, පොලිසියේ, නිලධාරි පෙළැන්තියේ, පැවිදි පක්ෂයේ සහ අධිකරණයේ ආයතන සහිත ''මධ්‍යගත රාජ්‍ය බලය'' මධ්‍යකාලීන සමයේ ආරම්භ වී දහනව වැනි ශත වර්ෂයේදී වර්ධනය විය. ප්‍රාග්ධනය හා ශ්‍රමය අතර පංති සතුරුතාවය වර්ධනය වීමත් සමග ''රාජ්‍ය බලය වඩ වඩාත් කම්කරු පංතිය මර්දනය කිරීමේ මහජන බලවේගයක, පංති පාලනය සඳහා වූ යන්ත්‍රයක, ස්වරූපය ගත්තේය. පංති අරගලයේ ඉදිරි ගමනක් සලකුණු කළ සෑම විප්ලවයකින්ම පසුව, රාජ්‍ය බලයේ පිරිසිදුම බලහත්කාරී ස්වභාවය වඩ වඩාත් හොඳින් කැපී පෙනෙන්නේය.'' 1848-1849 විප්ලවයෙන් පසුව, රාජ්‍ය බලය ''ශ්‍රමයට විරුද්ධ වූ ප්‍රාග්ධනයේ ජාතික යුද්ධ උපකරණය'' බවට පත්වූයේය. දෙවැනි අධිරාජ්‍යය මෙය තහවුරු කළේය.
>
> ''අධිරාජ්‍යයේ සෘජු ප්‍රතිපක්ෂය කොමියුනය විය.'' එය, ''රාජාණ්ඩු ආකෘතිය ගත් පංති පාලනය පමණක් නොව, පංති පාලනය මුළුමනින්ම ඉවත් කිරීම සඳහා වූ සමූහාණ්ඩුවක නිශ්චිත ආකෘතිය'' ද විය.

මෙම නිර්ධන පංති, සමාජවාදී සමූහාණ්ඩුවේ ''නිශ්චිත'' ආකෘතිය කුමක් වීද? එය නිර්මාණය කිරීමට පටන් ගත්තේ කුමණ රාජ්‍යයක්ද?

> ''කොමියුනයේ ප්‍රථම ආඥාව වූයේ... ස්ථිර යුද්ධ හමුදාව අහෝසි කිරීම සහ ඒ වෙනුවට ආයුධ සන්නද්ධ ජනතාව ආදේශ කිරීම ය...''

තමන් සමාජවාදී යයි කියාගන්නා සෑම පක්ෂයේම වැඩ පිළිවෙළෙහි දුන් මෙම ඉල්ලීම දක්නට ලැබේ. එහෙත් ඔවුන්ගේ වැඩ පිළිවෙළවල නියම අගය ඉතාමත් හොඳින් පෙන්නුම් කෙරෙන්නේ අපගේ සමාජවාදී විප්ලවවාදීන්ගේ සහ මෙන්ෂෙවික් වරුන්ගේ හැසිරීමෙනි. පෙබරවාරි විප්ලවය ඇති වීමෙන් පසු මුල් අවස්ථාවේම, ඔවුහු මෙම ඉල්ලීම ක්‍රියාත්මක කිරීම ප්‍රතික්ෂේප කළහ!

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

> ''කොමියුනය සැදුණේ පැරිසියේ විවිධ කොට්ඨාශවලින් සර්වජන ඡන්දයෙන් තෝරාගත්, වගකීමට බැඳුනු සහ ඕනෑම අවස්ථාවක පත්වීම අවලංගු කළ හැකි වූ නාගරික සභිකයන්ගෙනි. ස්වාභාවික වශයෙන්ම මෙම සභිකයන්ගෙන් වැඩි කොටස වැඩ කරන පුද්ගලයන් හෝ කම්කරු පංතියේ පිළිගත් නායකයන් විය... ඒ දක්වාම ආණ්ඩුවේ උපකරණයක්ව පැවති පොලිසියේ දේශපාලන උපලක්ෂණ වහාම එයින් ඉවත් කර, කොමියුනයට වගකියන සහ සැම විටම අවලංගු කළ හැකි උපකරණයක් බවට පත් කරන ලදී. පරිපාලනයේ සියළුම අංශවල නිලධාරීන්ද එම තත්ත්වයට පත් කරන ලදී. කොමියුනයේ සාමාජිකයන්ගේ පටන් පහළට සියළුම මහජන සේවකයන් සඳහා ගෙවීම කම්කරු වේතන අනුව කළ යුතුව තිබුණි. රාජ්‍යයේ උසස් සම්භාවනීය පුද්ගලයන්ගේ වරප්‍රසාද සහ නියෝජන දීමනා, එම සම්භාවනීය පුද්ගලයන්ද සමගම අතුරුදහන් විය... පැරණි ආණ්ඩුවේ කායික බලහත්කාරයේ උපකරණ වූ ස්ථිර හමුදාව සහ පොලිසිය ඉවත් කිරීමෙන් පසුව, කොමියුනය අධ්‍යාත්මික මර්දනය, එනම්, පැවිද්දන්ගේ බලය බිඳ දැමීමට අප්‍රමාදව කටයුතු කළේය... අධිකරණ නිලධාරීන්ට, ඒ බොරු ස්වාධීනත්වය අහිමි විය... එතැන් පටන් ඔවුන් තෝරා පත්කරන, වගකිවයුතු හා ඉවත් කළ හැකි අය බවට පත් වූහ...''15

එනිසා සුන් කරන ලද රාජ්‍ය යන්ත්‍රය වෙනුවට කොමියුනය ආදේශ කළේ, වඩාත් සම්පූර්ණ ප්‍රජාතන්ත්‍රවාදයක් ''පමණක්'' බව මෙයින් පෙනේ: සියළුම නිලධාරීන් තෝරා පත් කිරීමට සහ ඉවත් කිරීමට යටත් විය. නමුත්, මෙම ''පමණක්'' යන්නෙන් සලකුණු වන්නේ, සමහර ආයතන වෙනුවට ඊට වඩා මූලික වශයෙන් වෙනස් වර්ගයක ආයතන දැවැන්ත පරිමාණයෙන් ආදේශ කිරීම ය. මෙය නියත වශයෙන්ම ''සංඛ්‍යාව ගුණය බවට පරිවර්තනය වීමේ'' අවස්ථාවකි. සිතාගත හැකි තරමින් සම්පූර්ණ ලෙස හා සසංගත ලෙස ක්‍රියාත්මක කරන ලද ප්‍රජාතන්ත්‍රය, ධනපති පංති ප්‍රජාතන්ත්‍රයක සිට නිර්ධන පංති ප්‍රජාතන්ත්‍රයකට පරිවර්තනය වේ; එය රාජ්‍යයේ (නිශ්චිත පංතියක් මර්දනය කිරීම සඳහා වූ විශේෂ බලවේගයක) සිට තවදුරටත් නියම රාජ්‍යයක් නොවන දෙයකට පරිවර්තනය වේ.

ධනපති පංතිය මර්දනය කර ඔවුන්ගේ ප්‍රතිරෝධය පොඩිපට්ටම් කර දැමීමේ අවශ්‍යතාවය තවමත් ඇත. විශේෂයෙන්ම, කොමියුනයට මෙය අවශ්‍ය විය. කොමියුනයේ පරාජයට හේතු වූ කරුණු අතුරෙන් එකක් වූයේ මෙය ප්‍රමාණවත් තරම් අධිෂ්ඨානයකින් යුතුව කරනු නොලැබීමය. කෙසේ හෝ වේවා, මෙහිදී මර්දනයේ බලායතනය වන්නේ වහල් ක්‍රමය, වැඩ වසම් ක්‍රමය හා වේතන වහල් ක්‍රමය යටතේ මෙන් ජනගහනයෙන් අල්පතරයක් නොව එහි බහුතරය ය. ජනතාවගේ බහුතරය ම එහි පීඩකයන් මර්දනය කරන හෙයින්, මර්දනය සඳහා ''විශේෂ බලවේගයක්'' තවදුරටත් අවශ්‍ය නොවේ! මේ අර්ථයෙන් රාජ්‍යය හැකිළී යන්නට පටන් ගනී. වරප්‍රසාද ලත් අල්පතරයක (වරප්‍රසාද ලත් නිලධාරීන්, ස්ථිර යුද්ධ හමුදාවේ ප්‍රධානීන්) විශේෂ ආයතන වෙනුවට බහුතරයට එක එල්ලේ තමන්ම විසින් මෙම කාර්යයන් ඉටු කළ හැකි වේ. තවද, ජනතාව සමස්තයක් වශයෙන් රාජ්‍ය බලයට අදාල කාර්යයන් වැඩියෙන් ඉටුකරන තරමට මෙම බලය පැවතීමේ අවශ්‍යතාවය අඩුවේ.

මේ හා සම්බන්ධයෙන්වූ කල, මාක්ස් අවධාරණය කළ, කොමියුනයේ පහත සඳහන් පියවරයන් විශේෂයෙන්ම සටහන් කරගැනීම වටණේය: සියළුම නියෝජන ගාස්තු සහ නිලධාරීන්ගේ සියළුම මුදල්මය වරප්‍රසාද අවලංගු කිරීම, රාජ්‍යයේ සියළුම සේවකයන්ට දෙන පඩිනඩි කම්කරු වේතන මට්ටමට අඩු කිරීම, ධනපති ප්‍රජාතන්ත්‍රවාදයේ සිට නිර්ධන පංති ප්‍රජාතන්ත්‍රවාදයට ද, පීඩකයන්ගේ ප්‍රජාතන්ත්‍රවාදයේ සිට පීඩිත පංතිවල ප්‍රජාතන්ත්‍රවාදයට ද, රාජ්‍යය නිශ්චිත පංතියක් මර්දනය කිරීමේ ''විශේෂ බලවේගයක'' සිට ජනතාව, එනම් කම්කරුවන් සහ ගොවිජනතාවගේ බහුතරය විසින් පීඩකයන් මර්දනය කිරීමේ පොදු බලවේගයක් බවටද හැරීම, අන් කිසිවකටත් වඩා හොඳින් මෙයින් පෙන්නුම් කෙරේ. එසේ වූ කල, රාජ්‍යය පිළිබඳ ප්‍රශ්නයේදී, මාක්ස්ගේ අදහස් සම්පූර්ණයෙන්ම නොතකා හරිනු ලබන්නේ, මෙම, විශේෂයෙන්ම සිත් කාවදින, සමහර විට, වඩාත්ම වැදගත් කරුණ හා සම්බන්ධයෙනි! සාමාන්‍ය විස්තර කථනයන් විශාල සංඛ්‍යාවක් ඉදිරිපත් කර ඇති අතර, එහි මේ ගැන සඳහන් කර නොමැත. කරනු ලබන්නේ එය පැරණි තාලේ බොළඳ කථාවක් වූ කලෙක මෙන් ඒ ගැන කිසිවක් නොකියා සිටීම ය. එසේ කිරීම යනු, ක්‍රිස්තියානිවරුන්ගේ ආගමට රාජ්‍ය ආගමික තත්ත්වය දුන්පසු, ප්‍රජාතන්ත්‍ර-විප්ලව ජීවගුණය ද සහිත ප්‍රාථමික ක්‍රිස්තියානියෙහි ''බොළඳ'' කම ක්‍රිස්තියානිවරුන්ට ''අමතක'' වී ගියාක් මෙනි.

උසස් රාජ්‍ය නිලධාරීන්ගේ පඩිනඩි අඩු කිරීම ''හුදෙක්ම'' බොළඳ ප්‍රාථමික ප්‍රජාතන්ත්‍රවාදයේ ඉල්ලීමක් සේ පෙනේ. නවීන අවස්ථාවාදයේ නිර්මාතෘවරයන්ගෙන් කෙනෙක් වන, හිටපු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී එඩුවාර්ද් බර්න්ෂ්ටයින් ''ප්‍රාථමික'' ප්‍රජාතන්ත්‍රවාදය වෙත යළි යළිත් පහත් ධනපති සමච්චලය එල්ල කළේ එක් වරක් නොවේ. ප්‍රථමයෙන්ම, ''ප්‍රාථමික ප්‍රජාතන්ත්‍රවාදයට'' කිසියම් ''සංශෝධනයක්'' නොකර (එසේ නොමැ-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

තිව, බහුතරය හා ඊළඟට විශේෂයක් නොමැතිව මුළු ජනතාවම, රාජ්‍යයේ කාර්යයන් ඉටු කිරීමට යෙදෙන්නේ කෙසේද?) ධනපති ක්‍රමයේ සිට සමාජවාදයට පරිවර්තනය වීම කිසිසේත් නොහැකි බවද, දෙවැනිව, ධනපති ක්‍රමය සහ ධනපති සංස්කෘතිය පදනම් කරගත් ''ප්‍රාථමික ප්‍රජාතන්ත්‍රවාදය'' ප්‍රාග් ඓතිහාසික හෝ ප්‍රාග් ධනපති කාලයේ ප්‍රාථමික ධනපති ක්‍රමයම නොවන බවද, සියළුම අවස්ථාවාදීන්ට සහ වර්තමාන කෞට්ස්කිවාදීන්ට මෙන්ම ඔහුටද නොවැටහිණි. ධනපති සංස්කෘතිය විසින් මහා පරිමාණ නිෂ්පාදනය, පැක්ටරි, දුම්රිය සේවා, තැපැල් සේවය, විදුලි පණිවුඩ සේවය, ආදිය නිර්මාණය කර තිබේ. එබැවින්, මෙම පදනම මත පැරණි ''රාජ්‍ය බලයේ'' කාර්යයන්ගෙන් අති බහුතරය ඉතාමත් සරල වී ඇති අතර, ඒවා, ලියා පදිංචිය, ගොනු කිරීම සහ හරිවැරදි බැලීම වැනි ඉතාමත් පහසු ක්‍රියා දක්වා සරල කරගත හැකි වී තිබේ. ඒ අනුව අකුරු දත් සැම කෙනෙකුටම ඉතා පහසුවෙන් එම කටයුතු ඉටු කළ හැකිය. එසේම ඒවා සාමාන්‍ය කම්කරු වේතන සඳහා පහසුවෙන්ම කළ හැකි වේ. එනිසා වරප්‍රසාදයේ සැම සේවාවක්ම, ''නිල මහත් තත්ත්වයේ'' සැම ස්වභාවයක්ම එම කාර්යයන් කෙරෙන් ඉවත් කළ හැකිය (ඉවත් කළ යුතුය).

විශේෂයක් නොමැතිව, සියළුම නිලධාරීන් තෝරා පත් කිරීම සහ ඕනෑම අවස්ථාවක ඉවත් කිරීමට යටත් කිරීම, ඔවුන්ගේ වැටුප් සාමාන්‍ය ''කම්කරු වේතන'' මට්ටමට අඩු කිරීම — යන මෙම සරල සහ ''නිරායාසයෙන් පැහැදිලි වන'' ප්‍රජාතන්ත්‍රවාදී පියවරයන් මගින් කම්කරුවන්ගේ සහ ගොවිජනතාවගෙන් බහුතරයෙහි අවශ්‍යතාවයන් සම්පූර්ණයෙන්ම එක්සත් කරන අතර, ඒ සමගම, ඒවා ධනපති ක්‍රමයේ සිට සමාජවාදී ක්‍රමය වෙත යන පාලම ලෙසට ද ප්‍රයෝජනවත් වන්නේය. මෙම පියවරයන් රාජ්‍යය ප්‍රතිසංවිධානය කිරීමත්, සමාජයේ තනිකර දේශපාලනමය ප්‍රතිසංවිධානයත් සමග සම්බන්ධ ය. නමුත් ඒවා සම්පූර්ණ අර්ථවත් බව සහ වැදගත් බව ලබන්නේ ''අසන්තක කරන්නන් අසන්තක කිරීම'' ඉටු කිරීම හෝ ඊට කටයුතු සූදනම් කිරීම, එනම්, නිෂ්පාදන මාර්ගයන් කෙරෙහි ඇති ධනපති පෞද්ගලික අයිතිය සමාජමය අයිතිය බවට පරිවර්තනය කිරීම සමග බව සැබැය.

''ලොකුම වියදම් මාර්ග දෙක වන යුද්ධ හමුදාව සහ නිලධාරි පෙළැන්තිය අහෝසි කිරීමෙන්, කොමියූනය, සියළුම ධනපති විප්ලවවල ඒ උගුල් වදන වූ අඩු වියදමින් ආණ්ඩු කිරීම යථාර්ථයක් බවට පත් කළේය'', යි මාක්ස් ලීවේය.

ධනපති අර්ථයෙන් ''මුදුනට නගින්නේ'', ''ජීවිතය සාර්ථක කරගන්නේ'', නැතහොත්, එක්කෝ පොහොසත් ධනපතියන් හෝ සුරක්ෂිත හා වරප්‍රසාද සහිත තනතුරු දරන නිලධාරීන් බවට පත් වන්නේ ගොවි ජනතාව හා එසේම වෙනත් සුළු ධනපති කොටස්ද අතුරෙන් සැලකිල්ලට නොගත හැකි තරම් ඉතා ස්වල්ප දෙනෙකි. ගොවිජනතාව සිටින සැම ධනපති රටකම (ධනපති රටවල් බොහොමයකම වන පරිදි) ඔවුන්ගෙන් අති බහුතරය ආණ්ඩුව විසින් පීඩනයට පත් කරනු ලැබේ. ඔවුහු එය පෙරළා දැමීමේ හා ''අඩුවියදම්'' ආණ්ඩුවක් ලැබීමේ අභිලාෂයෙන් පසුවෙති. මෙය සාර්ථක කිරීමට හැක්කේ නිර්ධන පංතියට පමණකි. එසේම, එය සාර්ථක කිරීම සමගම, නිර්ධන පංතිය සමාජය සමාජවාදී ක්‍රමයට ප්‍රතිසංවිධානය කිරීම කරා යන පියවරක් ගන්නේය.

3. පාර්ලිමේන්තුවාදය අහෝසි කිරීම

''කොමියූනය පාර්ලිමේන්තු මණ්ඩලයක් නොව, වැඩ කරන, එක්වරම විධායකයක් හා ව්‍යවස්ථාදායකයක් වන, මණ්ඩලයක් කළ යුතු වීය'' යි මාක්ස් ලීවේය.

''පාලක පංතියේ කුමණ සාමාජිකයා පාර්ලිමේන්තුව තුළ සිට ජනතාව නියෝජනය හා මර්දනය (ver- und zertreten) කළ යුතුද යන්න අවුරුදු තුනකට හෝ හයකට වරක් තීරණය කරනවා වෙනුවට, කම්කරුවන්, වැඩමූලිකයන් හා ගිණුම් තබන්නන් සොයා යන බොහෝ සේවා යෝජකයන්ට තනි පුද්ගල ඡන්දය උපකාර වන්නා සේ, කොමියූනවලට සැදුනු ජනතාවට සර්ව ජන ඡන්දයේ සේවය සැලැස්විය යුතුව තිබිණි...''

පාර්ලිමේන්තුවාදය ගැන 1871 දී කරන ලද මෙම ඉතා අගනා විවේචනය මාක්ස්වාදයේ ''අමතක වූ වදන්'' වලට එකතුවී තිබේ. එසේ වූයේ පැතිර පවත්නා සමාජ-ජාත්‍යෝන්මාදවාදය සහ අවස්ථාවාදය හේතුකොට ගෙන ය. කැබිනට් ඇමතිකම් හා පාර්ලිමේන්තු මන්ත්‍රීකම් වෘත්තියක් කොටගත් නිර්ධන පංති ද්‍රෝහීන් සහ අපගේ කාලයේ ''ප්‍රායෝගික'' සමාජවාදීන්ද, පාර්ලිමේන්තුව ගැන විවේචනය කිරීමේ සියළු කටයුතු අරාජිකවාදීන්ට ඉතිරි කර තිබේ. තවද, මෙම පුදුම සහගත සාධාරණ හේතුව පදනමක් කොට ගන්නා ඔවුහු, පාර්ලිමේන්තුවාදය ගැන කරන සියළු විවේචනයන් ''අරාජිකවාදය'' ලෙසට හඳුන්වති!!'' ෂෙයිද්මාන්ලා

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

දව්දව්ලා, ලේගින්ලා, සම්බාලා, රෙනොදෙල්ලා, හෙන්ඩර්සන්ලා, වැන්දෙර්වෙල්ද්ලා, ස්ටෝනිංලා, බ්‍රාන්ටිංලා, බිසොලාටිලා සහ සමාගම වැනි ''සමාජවාදීන්'' ගැන තදබල කලකිරීමට පත් ''දියුණු'' පාර්ලිමේන්තුවාදී රටවල ''නිර්ධන පංතිය'', අරාජික-සම්මේලවාදය අවස්ථාවාදයේ නිවුන් සොහොයුරා බවද නොතකා වඩ වඩාත් නිරන්තර ලෙස එයට සහයෝගය දැක්වීම පුදුමයට කරුණක් නොවේ.

ප්ලෙහානව්, කෞට්ස්කි සහ වෙනත් අය විප්ලවවාදී දයලෙක්තික ක්‍රමය හිස් මොස්තරකාර වදනක්, නැතහොත්, කෙළි බඩු ගැටෙන නාදයක් බවට පත් කළ නමුත්, මාක්ස්ට නම් එය කිසි කලෙකත් එසේ නොවීය. අරාජිකවාදයෙන් නිර්දය ලෙස බිඳී වෙන් වන්නේ කෙසේදැයි මාක්ස් දැන සිටියේය. ඔහු එයින් වෙන් වූයේ, ධනපති පාර්ලිමේන්තුව නැමති ''ඌරුකොටුව'' පවා නොහැර උපයෝගි කර ගැනීමට, විශේෂයෙන්ම, පවතින තත්ත්වය පැහැදිලිවම විප්ලවවාදී නොවන විට එසේ කිරීමට, අරාජිකවාදය අසමත් වන හෙයිනි. නමුත් ඒ අතරම පාර්ලිමේන්තුවාදය නියම විප්ලවවාදී විවේචනයට ලක් කරන හැටිද ඔහු දැන සිටියේය.

පාලක පංතියේ කුමණ සාමාජිකයා පාර්ලිමේන්තුව තුළ සිට ජනතාව නියෝජනය සහ මර්දනය කළ යුතුද යන්න සෑම අවුරුදු කීපයකටම වරක් තීරණය කිරීම ධනපති පාර්ලිමේන්තුවාදයේ නියම හරය වේ. පාර්ලිමේන්තුවාදී ව්‍යවස්ථා සහිත රාජාණ්ඩුවල පමණක් නොව ඉතාමත් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවල ද තත්ත්වය එසේ වේ.

එහෙත්, අපි රාජ්‍යය ගැන වූ ප්‍රශ්නය සලකා බලමු නම්, එසේම, අපි පාර්ලිමේන්තුවාදය රාජ්‍යයේ එක් ආයතනයක් ලෙස සලකමු නම්, මෙම ක්ෂේත්‍රයේදී නිර්ධන පංතියෙන් ඉටුවිය යුතු කර්තව්‍ය පිළිබඳ දෘෂ්ටි කෝණය අනුව බලන කල පාර්ලිමේන්තුවාදයෙන් ගැලවීමේ මාර්ගය වන්නේ කුමක්ද? එය අත්හැර දමන්නේ කෙසේද?

නැවතත් අපි මෙසේ කියමු: කොමියුනය ගැන අධ්‍යයනය කිරීම පදනම් කරගත් මාක්ස්ගේ ඉගැන්වීම් සම්පූර්ණයෙන්ම අමතක කර තිබෙන හෙයින්, අරාජිකවාදී හෝ ප්‍රතිගාමී විවේචනය හැර, පාර්ලිමේන්තුවාදය ගැන කරන වෙනත් කිසිම විවේචනයක් ඇත්ත වශයෙන්ම වටහාගත නොහැකි තත්ත්වයට වර්තමාන ''සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියා (එනම්, සමාජවාදයේ වර්තමාන ද්‍රෝහියා) පත්ව ඇත.

පාර්ලිමේන්තුවාදයෙන් ගැලවීමට කළ යුත්තේ, නියෝජිත ආයතන හා තෝරාපත්කිරීමේ ප්‍රතිපත්තිය අහෝසි කිරීම නම් නොවේ. කළ යුත්තේ නියෝජිත ආයතන කතා සාප්පුවල තත්ත්වයේ සිට ''වැඩ කරන'' මණ්ඩල බවට පත් කිරීමය. ''කොමියුනය පාර්ලිමේන්තු මණ්ඩලයක් නොව, වැඩකරන, එක් වරම විධායකයක් හා ව්‍යවස්ථාදයකයක් වන මණ්ඩලයක් කළ යුතු විය.''

''පාර්ලිමේන්තු මණ්ඩලයක් නොව, වැඩ කරන මණ්ඩලයක්'' — මෙය නම් කෙළින්ම පාර්ලිමේන්තුවාදීන්ට සහ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ පාර්ලිමේන්තුවාදී ''සුරතල් බල්ලන්ට'' දුන් බලවත් පහරකි! ඇමෙරිකාවේ සිට ස්විට්සර්ලන්තය දක්වාද, ප්‍රංශයේ සිට බ්‍රිතාන්‍යය, නෝර්වය සහ වෙනත් රටවල් දක්වාද, ඕනෑම පාර්ලිමේන්තුවාදී රටක් ගෙන බලමු. මෙම රටවල නියම ''රාජ්‍ය'' කටයුතු කෙරෙන්නේ තිරයෙන් පිටුපස ය. එම කටයුතු කරනු ලබන්නේ දෙපාර්තුමේන්තු, නිලධාරී මණ්ඩල සහ හමුදා ප්‍රධාන මණ්ඩල විසිනි. ''පොදු ජනතාව'' රැවටීමේ විශේෂ අරමුණ ඉටු කර ගැනීමේ සඳහා කතා පැවැත්වීමට පාර්ලිමේන්තුව වෙන් කර තිබේ. මෙය කොතරම් සත්‍යයක්ද යත්, ධනපති ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවක් වන රුසියානු සමූහාණ්ඩුවට පාර්ලිමේන්තුවක් පිහිටුවා ගැනීමට හැකි වීමටත් පූර්වයෙන්ම, එය තුළින් පවා පාර්ලිමේන්තුවාදයේ මෙම දෙස් සියල්ලම මතුවිය. ස්කොබිලෙව්ලා සහ ටෙසෙරතේලිලාද, චෙර්නොව්ලා සහ අව්ක්සෙන්තියෙව්ලාද වැනි කුණු අශිෂ්ටවාදයේ වීරයෝ, ඉතාමත් පිළිකුල් සහගත ධනපති පාර්ලිමේන්තුවාදයේ රටාව අනුව යමින් සෝවියට් සභා පවා ගඳ ගැස්වීමට හා ඒවා හුදු කතා සාප්පු බවට හැරවීමට සමත් වූහ. සෝවියට් සභාවල සිටින ''සමාජවාදී'' ඇමති වරු වදන් හරඹය හා යෝජනා උපයෝගි කර ගනිමින් විශ්වාසගත්තා සුළු ගැමියන් රවටති. ආණ්ඩුව තුළ දක්නට ලැබෙන්නේ, එක් අතකින් හැකි තරම් සංඛ්‍යාවක් සමාජවාදී-විප්ලවවාදීන්ට සහ මෙන්ෂෙවික්වරුන්ට වරින් වර ''කේක් ගෙඩියටත්'', වැඩි ආදායම් දෙන සහ ගෞරවනීය තනතුරුවලටත් සමීප වීමට හැකි වනු පිණිසද, අනිත් අතින්,ජනතාවගේ ''අවධානය'' ''යොමුකර තැබීම'' පිණිසද, හැමදම වෙනස් කිරීම් සිදු කෙරෙන බවකි.

''සමාජවාදීන්ගේ'' නායකත්වයෙන් තිබෙන අමාත්‍යාංශවල පවා (මොන බොරුද!) මුළු නිලධාරිවාදී යන්ත්‍රයම ඇත්ත වශයෙන් නොවෙනස්ව පවතින සහ පැරණි තාලයටම වැඩ කරන බවත්, ඉතාමත් ''නිදහස් ලෙස'' විප්ලවවාදී පියවරයන් කඩා කප්පල් කරනු ලබන බවත්, පාලක සමාජවාදී-විප්ලවවාදී පක්ෂයේ නිල පුවත්පත වන ''දියල නරෝද්'' නොබොදු පළ කළ ප්‍රධාන ලිපියකින් පිළිගත්තේ, ''සියළු දෙනාම'' දේශපාලන ගණිකා වෘත්තියෙහි යෙදෙන ''හොඳ සමාජයේ'' අසමසම අකුටිල බව පෙන්වමිනි! මෙම පිළිගැනීම නොතිබුණත්, සමාජවාදී-විප්ලවවාදීන් හා මෙන්ෂෙවික්වරුන් ආණ්ඩුවට සහභාගිවීමේ සැබෑ ඉතිහාසයෙන් මෙය ඔප්පු නොවන්නේද? එසේ වුවද, කැඩෙට්වරුන්ගේ ඇමති සමාගමයෙහි සිටින චෙර්නොව්ලා, රුසානව්ලා, සිනොවියෙව්ලා සහ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

''දියල නරෝද්'' පත්‍රයේ අතිකුත් කතුවරු, කොතරම් ලජ්ජා විරහිත තත්ත්වයකට පත්ව සිටිත්ද යත්, ''ඔවුන්ගේ'' අමාත්‍යාංශවල සියල්ල නොවෙනස්ව පවතින බව ඉතා නොවැදගත් දෙයක නියායෙන් පිළිගැනීමට තරම් ඔවුන් එඩිතර බව සටහන්කර ගැනීම සුදුසුය!! ගමේ සිමයියලා රැවටීම සඳහා විප්ලවවාදී-ප්‍රජාතන්ත්‍රවාදී වදන්ය; ධනපතියන්ගේ ''සිත් පිණවීම'' සඳහා නිලධාරිවාදය හා විරාගත පිළිවෙළය. ''අවංක'' සභාගයේ හරය එයයි.

ධනපති සමාජයේ දූෂිත සහ කුණුවූ පාර්ලිමේන්තුවාදය වෙනුවට කොමියුනය ආදේශ කරන ආයතන, අදහස් දැරීමේ හා සාකච්ඡා කිරීමේ නිදහස රැවටිල්ල දක්වා පහත නොහෙළයි. එය යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට වැඩ කිරීමටද, ඔවුන්ගේම නීති ක්‍රියාත්මක කිරීමටද, යථාර්ථ වශයෙන් ලත් ප්‍රතිඵල තමන්ම පරීක්ෂා කර බැලීමට සහ ස්වකීය ඡන්දදායකයනට කෙළින්ම වගකීමටද සිදුවේ. නියෝජිත ආයතන පවතින නමුත්, ව්‍යවස්ථාදායකය සහ විධායකය අතර ශ්‍රම විභජනයක් සහ මන්ත්‍රීවරුන්ට ලැබෙන වරප්‍රසාද සහිත තත්ත්වයක් වන පාර්ලිමේන්තුවාදයක් මෙහි නැත. නියෝජිත ආයතන නොමැතිව අපට ප්‍රජාතන්ත්‍රවාදය ගැන, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ගැන පවා සිතිය නොහැකිය. නමුත්, පාර්ලිමේන්තුවාදය නොමැතිව ප්‍රජාතන්ත්‍රවාදය ගැන සිතීම අපට කළ හැකි හා අප කළ යුතු දෙයකි. ධනපති සමාජය විවේචනය කිරීම අපට හුදෙක් වචන ගොඩක් පමණක් නොවේ නම්, ධනපති පංති පාලනය පෙරළා දැමීම අපගේ බලවත් හා අවංක ආශාව නම් හා මෙන්ෂෙවික්වරුන්ට හා සමාජවාදී-විප්ලවවාදීන්ටත්, එසේම ෂෙයිදමාන්ලාට සහ ලේගින්ලාටත්, සම්බා ලාට සහ වන්දෙර්වෙල්ද්ලාටත් මෙන්, එය කම්කරු ඡන්ද ගරා ගැනීම සඳහා වූ හුදු ''මැතිවරණ'' සෝෂාවක් පමණක් නොවන්නේ නම්, අපි එසේ සිතිය යුත්තෙමු.

කොමියුනය සහ නිර්ධන පංති ප්‍රජාතන්ත්‍රවාදය සඳහා අවශ්‍ය ඒ නිලධාරීන්ගේ කාර්යයන් ගැන කතා කිරීමේදී, මාක්ස් ඔවුන් ''බොහෝ සේවා යෝජකයන්ගේ'' කම්කරුවන්ට, එනම්, ස්වකීය කම්කරුවන්, වැඩ මූලිකයන් හා ගිණුම් තබන්නන් සහිත සාමාන්‍ය ධනපති ව්‍යවසායයෙහි කම්කරුවන්ට සමාන කරන බව, සටහන් කර ගැනීම ඉතාමත් උපදේශාත්මක ය.

මාක්ස් ''නව'' සමාජයක් සකස් කළේය, නැත-හොත්, නිර්මාණය කළේය යන අර්ථය අනුව කියතොත්, ඔහු තුළ මනෝරාජිකත්වයේ සේයාවක් හෝ නොමැත. නැත. පැරණි සමාජය කෙරෙන් නව සමාජය පතිත වන සැටි සහ ස්වාභාවික ඓතිහාසික ක්‍රියාදමයක් ලෙසට මුලින් කී සමාජයෙන් පසු කී සමාජයට පරිවර්තනය වීමේ ආකාතිද ඔහු විසින් අධ්‍යයනය කරන ලදී. පොදුජන නිර්ධන පංති ව්‍යාපාරයක සැබෑ අත්දැකීම් පරීක්ෂා කළ ඔහු, එයින් ප්‍රායෝගික පාඩම් උකහා ගැනීමට උත්සාහ කළේය. පීඩිත පංතිවල ශ්‍රේෂ්ඨ ව්‍යාපාරවලින් නොපැකිල පාඩම් උගෙන ගත් සහ (''ඔවුන් ආයුධ නොගත යුතුව තිබුණි''යි කී ප්ලෙහානව්ලා හෝ ''පංතියක් තම සීමා පිළිපැදිය යුතුය'' යි කී ටසෙරතේලිලා හෝ මෙන්) කිසි කලෙකත් පණ්ඩිතමානී දේශනා මගින් ඔවුන් නොඇමතූ, සියළුම ශ්‍රේෂ්ඨ විප්ලවවාදී චින්තකයන් මෙන් මාක්ස්ද, කොමියුනයෙන් ඉගෙන ගත්තේය.

නිලධාරි පෙළැන්තිය එක්වරම, සෑම තන්හිම සහ සහමුලින්ම අහෝසි කිරීමට නොපුළුවන. එය මනෝරාජිකය. එහෙත්, පැරණි නිලධාරිවාදී යන්ත්‍රය එක් වරම සුන් කිරීමේ සහ සියළු නිලධාරිවාදයක්ම ක්‍රමික ලෙස අහෝසි කිරීමේ හැකියාව ලබා දෙන නව යන්ත්‍රයක් වහාම ගොඩ නැගීමට පටන් ගැනීම යනු, මනෝරාජික අදහසක් වේ. එය කොමියුනයේ අත් දැකීම් සහ විප්ලවවාදී නිර්ධන පංතියේ හදිසි කර්තව්‍යය වන්නේය.

ධනපති ක්‍රමය ''රාජ්‍ය'' පරිපාලනයේ කර්තව්‍යයන් සරල කරයි. එය ''ලොකුකම'' ඉවත ලීමටත්, සම්පූර්ණ පරිපාලන කටයුත්තම ''කම්කරුවන්, වැඩ මූලිකයන් සහ ගිණුම් තබන්නන්'' මුළු සමාජයම වෙනුවෙන් සේවයට බඳවා ගන්නා නිර්ධන පංතිකයන් (පාලක පංතිය වශයෙන්) සංවිධානය කිරීමක් වන සේ සීමා කිරීමටත්, ඉඩ සලසයි.

අපි මනෝරාජික නොවෙමු. සියළු පරිපාලනයත්, සියළුම යටත් කිරීමත් එක්වරම අත්හැර දැමීම ගැන අපි ''සිහින'' නොදකිමු. නිර්ධන පංතියේ කර්තව්‍යයන් නොවටහා ගැනීම පදනම් කොටගත් මෙම අරාජිකවාදී සිහින මාක්ස්වාදයට සම්පූර්ණයෙන්ම පිටස්තර ය. ඇත්ත වශයෙන් ඒවා ප්‍රයෝජනවත් වන්නේ ජනතාව වෙනස්වන තෙක් සමාජවාදී විප්ලවය කල්දැමීමට පමණකි. නැත. ජනතාව දැනට සිටින සේ සිටියදීම අපට සමාජවාදී විප්ලවය අවශ්‍යය; යටත් කිරීම, පාලනය සහ ''වැඩ මූලිකයන් හා ගිණුම් තබන්නන්'' අත්හැර දැමිය නොහැකි ජනතාව සිටියදීම අපට විප්ලවය අවශ්‍යය.

එසේ වුවද, යටත් කරනු ලැබිය යුත්තේ සූරා කනු ලබන සහ වැඩ කරන සියළු ජනතාවගේ ආයුධ සන්නද්ධ පෙරමුණු බල ඇණියටය, නැතහොත් නිර්ධන පංතියටය. රාජ්‍ය නිලධාරීන්ගේ විශේෂ ''ලොකුකම'' වෙනුවට, ''වැඩමූලිකයන්ගේ සහ ගිණුම් තබන්නන්ගේ'' සරල කාර්යයන්, නැතහොත්, සාමාන්‍ය නගර වැසියාට දැනටමත් සම්පූර්ණයෙන් ඉටු කළ හැකි සහ ''කම්කරු වේතන'' සඳහා ඉටු කිරීමේ අපහසුවක් නැති කාර්යයන් ආදේශ කිරීමේ ආරම්භය වහාම, එක් රැයකින්ම කළ හැකිය කළ යුතුය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ධනපති ක්‍රමය දැනට නිර්මාණය කර තිබෙන දේ පදනම් කොට ගනිමින්ද, කම්කරුවන් වශයෙන් අප ලබා ඇති අත්දැකීම් ගැන විශ්වාසය තබමින්ද, ආයුධ සන්නද්ධ කම්කරුවන්ගේ රාජ්‍ය බලය පිටිවහල් කර ගෙන, දැඩි අයෝමය විනයක් ස්ථාපිත කරමින්ද, කම්කරුවන් වන අපි, මහා පරිමාණ නිෂ්පාදනය සංවිධානය කරන්නෙමු. අපි රාජ්‍ය නිලධාරීන්ගේ කාර්ය කොටස අඩු කොට, එය වගකිව යුතු, ඉවත්කළ හැකි, නොවැඩි ගෙවීමක් ලබන සහ හුදෙක්ම අපගේ නියමයන් (විවිධ ආකාර, විවිධ වර්ගයේ සහ විවිධ තත්ත්වයේ ශිල්පීන්ගේ ආධාරය ඇතිව බව සැබෑය) ක්‍රියාත්මක කරන "වැඩමුලිකයන් ගේ සහ ගිණුම් තබන්නන් ගේ" කාර්යයක් බවට පත් කරන්නෙමු. මෙය අපගේ නිර්ධන පංති කර්තව්‍යය ය. නිර්ධන පංති විප්ලවය සාර්ථක කිරීමේදී අපට ආරම්භ කළ හැකි සහ අප ආරම්භ කළ යුතු දෙය මෙයයි. මහා පරිමාණ නිෂ්පාදනය පදනම් කරගෙන එවැනි ආරම්භයක් කළ පමණින්ම, සියළු ආකාරයේ නිලධාරිවාදය ක්‍රමික ලෙස "හැකිළී යාමට" ද, ක්‍රමික වශයෙන් පිළිවෙළක් ඇතිවීමට, කනපිට පෙරළූ අර්ථයෙන් නොවන හා වේතන වහල් ක්‍රමයට සමානත්වයක් නොදරන පිළිවෙළක් ඇතිකිරීමටද, මග පෑදෙනු ඇත. එවැනි පිළිවෙළක් යටතේ පාලන සහ ගිණුම් තැබීමේ කාර්යයන් වඩ වඩාත් සරල වීමෙන්, ඒවා එක් එක් අය විසින් වරින් වර ඉටු කෙරෙනු ඇත. එවිට එම කාර්යයන් ඉටු කිරීම පුරුද්දක් බවට පත් වී, ඒවා ජනගහනයෙන් විශේෂ කොටසක් විසින් ඉටු කරනු ලබන විශේෂ කාර්යයන් වශයෙන් අභාවයට යනු ඇත.

පසුගිය ශතවර්ෂයේ හැත්තෑ ගණන්වල සිටි තීක්ෂණ ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙක්, තැපැල් සේවය සමාජවාදී ආර්ථික ක්‍රමය පිළිබඳ නිදර්ශනයක් යයි කීවේය. එය ඉතාමත් නිවැරදිය. දැන් තැපැල් සේවය රාජ්‍ය-ධනපති ඒකාධිකාරී ක්‍රමය අනුව සංවිධානය කළ ව්‍යාපාරයකි. අධිරාජ්‍යවාදය ක්‍රමික වශයෙන් සියළුම සංගත ව්‍යාපාර එම වර්ගයේ සංවිධාන බවට පරිවර්තනය කරයි. ඒවා තුළද සිටින්නේ, වැඩ කර වෙහෙසට පත්ව සහ කුසගින්නේ සිටින "පොදු" ජනතාවට ඉහළින් රජයන ඒ ධනපති නිලධාරි පෙළැන්තියම ය. නමුත් සමාජ කළමණාකරණයේ යන්ත්‍රය දැනටම අත ළඟ ය. ධනපතියන් පෙරළා දැමීම, ආයුධ සන්නද්ධ කම්කරුවන්ගේ අයෝමය හස්තයෙන් සූරාකන්නන්ගේ ප්‍රතිරෝධය සුනු විසුනු කිරීම සහ නවීන රාජ්‍යයේ නිලධාරිවාදී යන්ත්‍රය සුන් කිරීම අප විසින් ඉටුකරන ලද පසු, "පිළිලයෙන්" නිදහස් සහ අතිශයින් අංගසම්පූර්ණ යන්ත්‍රයක් අපට හිමි වනු ඇත. එය එක්සත් වූ සහ එසේම ශිල්පීන්, වැඩ මූලිකයන් හා ගිණුම් තබන්නන් කුලී සේවයට බඳවා ගන්නා කම්කරුවන්ටම අපහසුවක් නොමැතිව ක්‍රියාත්මක කළ හැකි, සේවයට බඳවා-

ගත් ඒ සියළු දෙනාටම, ඇත්ත වශයෙන්ම, පොදුවේ සියළුම "රාජ්‍ය" නිලධාරීන්ට කම්කරු වැටුප් ගෙවිය හැකි යන්ත්‍රයක් වනු ඇත. මෙය සියළුම සංගත ව්‍යාපාර සම්බන්ධයෙන් වහාම ඉටු කළ හැකි ප්‍රායෝගික කර්තව්‍යයකි. එම කර්තව්‍යය ඉටු කළ විට වැඩකරන ජනතාව සූරාකෑමෙන් නිදහස් වනු ඇත. එය දැනටමත් කොමියුනය විසින් ව්‍යවහාරයට නැගීමට (විශේෂයෙන්ම රාජ්‍යය ගොඩ නැගීමේහිදී) ආරම්භ කර ඇති දේ ගැන සැලකිල්ලට ගන්නා කර්තව්‍යයකි.

අපගේ හදිසි අරමුණ වන්නේ, ශිල්පීන්, වැඩ මූලිකයන් සහ ගිණුම් තබන්නන්ද, එසේම සියළුම නිලධාරීන්ද, "කම්කරු වේතනයට" වඩා ඉහළ වැටුපක් නොලබන අතර සියළු දෙනාම ආයුධ සන්නද්ධ නිර්ධන පංතියේ පාලනය සහ නායකත්වය යටතේ කටයුතු කරන පරිද්දෙන් තැපැල් සේවාවේ පිළිවෙළට මුළු ආර්ථිකයම සංවිධානය කිරීම ය. අපට අවශ්‍ය රාජ්‍යය මෙයයි; අපට අවශ්‍ය ආර්ථික පදනම මෙයයි. පාර්ලිමේන්තුවාදය අහෝසි කරන අතරම, නියෝජිත ආයතන ආරක්ෂා කර ගැනීම සාර්ථක වනු ඇත්තේ මෙයිනි. ධනපති පංතිය විසින් මෙම ආයතන ගණිකා වෘත්තියෙහි යොදවනු ලැබීමෙන් ශ්‍රමකරු පංති නිදහස් කරනු ඇත්තේ මෙයයි.

4. ජාතික සමගියේ සංවිධානය

"ඉතාමත් කුඩා ගමෙහි වුවද දේශපාලන ආකෘතිය විය යුත්තේ කොමියුනය බව, ජාතික සංවිධානය පිළිබඳව කොමියුනය විසින් සකස් කරන ලද, එහෙත් කාලය මඳවීම නිසා එයට විස්තර සහිතව ඉදිරිපත් කළ නොහැකි වූ කෙටි සටහනකින් එය ඉතා පැහැදිලි ලෙස කියා ඇත". පැරිසියේ "ජාතික නියෝජිත මණ්ඩලය" කොමියුන මගින් පත්කළ යුතුව තිබුණි.

"එවිට, තවමත් මධ්‍යම ආණ්ඩුවට ඉතිරිවන ස්වල්පයක්, එහෙත්, වැදගත් කාර්යයන්, උවමනාවෙන්ම වරදවා කියා ඇති ලෙසට, යටපත් නො කළ යුතු වූ අතර, ඒවා කොමියුනවල, එනම්, ඒකාන්ත ලෙස වගකීමට බැඳුනු, නිලධාරීන්ට පැවරිය යුතුව තිබුණි.

"ජාතික සමගිය නොබිඳිය යුතු විය. අනිත් අතට, කොමියුන ව්‍යවස්ථාව මගින් එය සංවිධානය කළ යුතු විය. එය යථාර්ථයක් බවට පත්විය යුතුව තිබුණේ ජාතියේ සමගියෙහි සංකේතය ලෙසට පෙනී සිටි, එහෙත්, එයින් ස්වාධීනව හා ඊට උච්චව සිටීමට උවමනා කළ හා හුදෙක්ම එහි දේහය මත පිටින් වැඩනු පිළිලයක්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

> වන, රාජ්‍ය බලය විනාශ කිරීමෙනි. පැරණි ආණ්ඩු බලයේ තනිකරම මර්දනකාරී අවයව කපා දැමිය යුතු අතර, සාධාරණ ලෙස එයට භාරවන කාර්යයන්, සමාජයට ඉහළින් සිටීමට හිමිකම් කියන අධිකාරයකින් උදුරාගෙන, ඒවා සමාජයේ වගකිව යුතු සේවකයන්ට යළි පවරා දිය යුතුව තිබුණි.''

මාක්ස්ගේ මෙම කියමන් වටහා ගැනීමට වර්තමාන සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ අවස්ථාවාදීන් කොතරම් දුරට අසමත් වීද — සමහරවිට අකැමති වීද යන්න වඩාත් නිවැරදි වනු ඇත — යනු බර්න්ෂ්ටයින් ද්‍රෝහියාගේ හෙරොස්ට්‍රාට් අර්ථයෙන් ප්‍රසිද්ධ ''සමාජවාදයේ තර්ක මූල සහ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ කර්තව්‍ය'' යන පොතෙන් වඩාත් හොඳින් පෙනී යන්නේය. ''දේශපාලන සන්ධාරය සම්බන්ධයෙන් වූ කල'' මෙම වැඩ පිළිවෙළ, ''එහි වැදගත් අංග ලක්ෂණ සියල්ලෙන්ම ප්‍රැදොන්ගේ පෙඩරල්වාදයට බොහෝ සෙයින්ම සමානකමක් පෙන්වන්නේ'' යයි බර්න්ෂ්ටයින් ලීවේ මාක්ස්ගේ ඉහත සඳහන් ඡේදය හා සම්බන්ධයෙනි... ''මාක්ස් සහ 'සුළු ධනපති' ප්‍රැදොන් අතර වෙනත් කරුණු සම්බන්ධයෙන් කොතරම් වෙනස්කම් තිබුණත්, මෙම කරුණු සම්බන්ධයෙන් ඔවුන් කල්පනා කරන්නේ ඉතාමත්ම සමීප ආකාරයෙනි'' (බර්න්ෂ්ටයින් සුළු ධනපති යන වචනය උපුටා දැක්වීමේ ලකුණු සහිතව ලියන්නේ උපහාසය හැඟවීමටය). බර්න්ෂ්ටයින් තවදුරටත් මෙසේ ලියයි: ''මහ නගර සභාවල වැදගත්කම වැඩි වෙමින් පවතින බව සැබෑය. නමුත් මාක්ස් සහ ප්‍රැදොන් කල්පනා කරන පරිදි ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රථම කටයුත්ත වන්නේ නවීන රාජ්‍යයන් එසේ විසුරුවා හැරීම (Auflösung) සහ කලින් ඒවායේ පැවති ජාතික නියෝජිතත්ව ක්‍රමය අතුරුදහන් වන ලෙසට එසේ එම රාජ්‍යයන්ගේ සංවිධානය (කොමියුන නියෝජිතයන්ගෙන් සමන්විත පළාත් හෝ දිස්ත්‍රික් සභා නියෝජිතයන්ගෙන් යුත් ජාතික සභාවක් පිහිට වීම) සම්පූර්ණයෙන්ම වෙනස්කිරීමද (Umwandlung) පරිවර්තනය කිරීමද) යන්න ගැන මට විශ්වාසයක් නැත'' (බර්න්ෂ්ටයින් ''තර්ක මූල'' ජර්මන් සංස්කරණය. 1899, පිටු 134 හා 136).

''පිටින් වැඩුණු පිළිලයක් වන රාජ්‍ය බලය විනාශ කිරීම'' ගැන වූ මාක්ස්ගෙ අදහස් ප්‍රැදොන්ගේ පෙඩරල් ක්‍රමය සමග පටලවා ගැනීම නිසැක වශයෙන්ම විපරීතයකි! නමුත් එය අහම්බෙන් සිදු වූවක් නොවේ. එසේ කියන්නේ, මාක්ස් මෙහිදී මධ්‍යගතවාදයට පටහැනි ලෙස පෙඩරල්වාදයක් ගැන කොහෙත්ම කථා නොකරන බවත්, ඔහු කථා කරන්නේ සියළුම ධනපති රටවල තිබෙන පැරණි ධනපති රාජ්‍ය යන්ත්‍රය සුන් කිරීම ගැන බවත්, අවස්ථාවාදියාට කිසිවිටෙකත් කල්පනා නොවන හෙයිනි.

අවස්ථාවාදියාට කල්පනා වන්නේ ඔහු අවට ඇති සුළු ධනපති අවරසිකවාදයේ සහ ''ප්‍රතිසංස්කරණවාදී'' නිශ්චලනයේ වටපිටාව තුළ ඔහුට පෙනෙන දෙය ගැන පමණකි, එනම්, ''මහ නගර සභා'' ගැන පමණකි! අවස්ථාවාදියා නිර්ධන පංති විප්ලවය ගැන සිතීමේ පුරුද්ද පවා ඉක්මවා ගොස් සිටී.

මෙය විකාරයකි. එහෙත්, මෙය ගැන කිසිවෙක් හෝ බර්න්ෂ්ටයින් සමග තර්ක නොකිරීම විමතියට කාරණයකි. බොහෝ දෙනෙකු විසින් බර්න්ෂ්ටයින්ගේ මත නිෂ්ප්‍රභා කරන ලදී. විශේෂයෙන්ම ප්ලෙහානව් විසින් රුසියානු සාහිත්‍යයේදී, එසේම කෞට්ස්කි විසින් යුරෝපීය සාහිත්‍යයේදීද ඔහුගේ මත බිඳ හෙළන ලදී. එහෙත් මාක්ස්ගේ කියමන බර්න්ෂ්ටයින් විසින් මෙසේ විකෘති කරනු ලැබීම ගැන මේ දෙදෙනාගෙන් එක් අයෙක්වත් කිසිම දෙයක් කියා නැත.

විප්ලවවාදී ආකාරයකින් සිතන්නේ කෙසේද යන්න හා විප්ලවය ගැන කරුණු සඳහන් කිරීම අවස්ථාවාදියාට කොතරම් අමතක වී තිබේද යත්, ඔහු පෙඩරල්වාදය මාක්ස්ගේ අදහසක් ලෙසට දක්වමින්, මාක්ස් අරාජිකවාදයේ නිර්මාතෘවරයා වන ප්‍රැදොන් සමග එකට පටලවයි. සම්මත මාක්ස්වාදීන් සහ විප්ලවවාදී මාක්ස්වාදයේ න්‍යායයෙහි ආරක්ෂකයන් බවට හිමිකම් කියන කෞට්ස්කි සහ ප්ලෙහානව් මෙම කරුණු ගැන නිහඬය! මාක්ස්වාදය සහ අරාජිකවාදය අතර වෙනස පිළිබඳ අදහස් අන්ත ලෙස පිරිහෙළීම පිළිබඳ මුල් අකුරෙන් එකක් මෙහි දක්නට ලැබේ. කෞට්ස්කිවාදීන්ගේ සහ අවස්ථාවාදීන්ගේ යන දෙකොටසෙහිම ලක්ෂණයක් වන එය ගැන පසුව නැවතත් සාකච්ඡා කරමු.

කොමියුනයේ අත්දැකීම් ගැන මාක්ස් පළ කළ, ඉහත උපුටා දක්වන ලද නිරීක්ෂණයන් තුළ පෙඩරල්වාදයේ සේයාවකුදු නොමැත. අවස්ථාවාදී බර්න්ෂ්ටයින්ට නොපෙනුණ සෑම කරුණක්ම සම්බන්ධයෙන් මාක්ස් ප්‍රැදොන් සමග එකඟ විය. මාක්ස් සහ ප්‍රැදොන් අතර බර්න්ෂ්ටයින්ට සමානත්වයක් පෙනුණු එම කරුණෙහිදීම මාක්ස් ප්‍රැදොන්ට විරුද්ධ විය.

නවීන රාජ්‍ය යන්ත්‍රය ''සුන්'' කිරීම සම්බන්ධයෙන් මාක්ස් ප්‍රැදොන් සමග එකඟ විය. ඒ දෙදෙනාම ඊට පක්ෂ වූහ. මෙම කාරණයෙහිදී මාක්ස්වාදය සහ අරාජිකවාදය (ප්‍රැදොන් සහ බකුනින් යන දෙදෙනාම) අතර අදහස් එකඟත්වය දැකීමට අවස්ථාවාදීහුවත්, එසේ නැතහොත් කෞට්ස්කිවාදීහුවත් කැමති නොවෙති. ඔවුන් මාක්ස්වාදයෙන් බැහැර වන්නේ මෙහිදී වීම එයට හේතුවයි.

නියත වශයෙන්ම පෙඩරල්වාදය පිළිබඳ ප්‍රශ්නයේදී (නිර්ධන පංති අඥාදයකත්වය ගැන නොකියමු) මාක්ස් ප්‍රැදොන් සහ බකුනින් යන දෙදෙනාටම විරුද්ධ විය. පෙඩරල්වාදය ප්‍රතිපත්තියක් ලෙසට අරාජික-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

වාදී සුළු ධනපති පංති අදහස්වලින් තාර්කික වශයෙන් අනුවර්තනය වන්නකි. මාක්ස් මධ්‍යගතවාදියෙක් විය. ඉහත උපුටා දක්වන ලද ඔහුගේ නිරීක්ෂණ තුළ මධ්‍යගතවාදය කෙරෙන් කිසිම පිට පැනීමක් දක්නට නො ලැබේ. ධනපති රාජ්‍ය යන්ත්‍රය විනාශ කිරීම මධ්‍යගතවාදය විනාශ කිරීමක් ලෙසට වරදවා වටහාගත හැක්කේ, රාජ්‍යය ගැන වූ අමන ''අද්භූත විශ්වාසයකින්'' මෝහනය වූවන්ට පමණකි!

නිර්ධන පංතිය සහ දුප්පත් ගොවිජනතාව බලය තමන්ගේම අතට ගෙන, ඉතාමත් නිදහස් ලෙස තමන් කොමියුනවලට සංවිධානය වී, අගනුවරට පහර දීමේදී, ධනපතියන්ගේ ප්‍රතිරෝධය පොඩිපට්ටම්කර දැමීමේදී සහ පෞද්ගලික හිමිකමට යටත්ව තිබෙන දුම්රිය සේවා, පැක්ටරි, ඉඩම් යනාදිය මුළු ජාතියටම පැවරීමේදී, සියලුම කොමියුනවල ක්‍රියාකාරිත්වය එක්සත් කරති නම්, එය මධ්‍යගතවාදය නොවන්නේද? එය ඉතාමත් සසංගත ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගතවාදය, සහ තවදුරටත්, නිර්ධන පංති මධ්‍යගතවාදය නොවන්නේද?

ස්වේච්ඡා මධ්‍යගතභාවයක් ඇතිවීමේ හැකියාව ගැන, ජාතියක් සේ කොමියුන ස්වේච්ඡාවෙන් ඒකාබද්ධ වීම ගැන, ධනපති පාලනය සහ ධනපති රාජ්‍ය යන්ත්‍රය විනාශ කිරීම සඳහා නිර්ධන පංති කොමියුන ස්වේච්ඡාවෙන් එකට බැඳීම ගැන සිතා ගැනීමට බර්න්ෂ්ටයින්ට කොහෙත්ම නුපුළුවන. සියළුම අශිෂ්ටවාදය මෙන් බර්න්ෂ්ටයින්ද මධ්‍යගතවාදය ගැන සිතන්නේ, එය ඉහළින්ම පමණක් සහ නිලධාරි පෙළැන්තිය සහ යුද්ධ හමුද කල්ලිය විසින්ම පමණක් බලෙන් පැනවිය හැකි දෙයක් වශයෙනි.

ජාතික සමගිය විනාශ කිරීමට, මධ්‍යම අධිකාරය අහෝසි කිරීමට කොමියුනයට අවශ්‍ය විය යන චෝදනාව හිතාමතාම කරන වංචාවක් බව මාක්ස් විශේෂයෙන්ම අවධාරණය කළේ, තමන්ගේ අදහස් විකෘති කරනු ලැබෙතැයි යන්න කලින් දුටු කලෙක මෙනි. මාක්ස්, ''ජාතික සමගිය සංවිධානය කළ යුතුව තිබිණි'' යන වචන උවමනාවෙන්ම පාවිච්චි කළේ, විඥූත, නිර්ධන පංති මධ්‍යගතවාදය ධනපති, යුද්ධමය, නිලධාරිවාදී මධ්‍යගතවාදයට විරුද්ධව හරස් කර තැබීමට මෙනි.

එහෙත්, ඇසීමට නොකැමති අය තරම් බිහිරන් තවත් නැත. එමෙන්ම සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ වර්තමාන අවස්ථාවාදීන් ඇසීමට අකැමති දෙය වන්නේද, රාජ්‍ය බලය විනාශ කිරීම ගැනය; පිළිල ස්වභාවයේ පැවැත්ම කපා දැමීම ගැනය.

5. රාජ්‍යය නැමති පිළිලය අහෝසි කිරීම

මෙම කරුණ ගැන මාක්ස් පළ කළ වදන් අපි දැනටමත් උපුටා දක්වා ඇත්තෙමු. දැන් ඊට එකතු කළ යුතු තව යමක් ඇත.

''... සාමාන්‍ය වශයෙන් ඉතිහාසයේ නව නිර්මාණයන්ගේ ඉරණම වන්නේ ඒවා පැරණි සහ අකර්මන්‍යව පවා ගිය සමාජ ආකෘතිවල පැවති, ඊට යම් සමානකමක් දැරූ, ප්‍රතිරූපය ලෙසට වරදවා වටහාගනු ලැබීම'' යයි ඔහු ලීවේය. ''ඒ අනුව නවීන රාජ්‍ය බලය බිඳලන (bricht, සුන් කරයි) මෙම නව කොමියුනය මධ්‍යකාලීන කොමියුනයේ පුනර්ජීවයක් ලෙස (මොන්ටෙස්කියෝ සහ ජිරොන්ඩිස්ට්වරු[16] ඒ ගැන කල්පනා කළ පරිදි), ... අති මධ්‍යගතකරණයට විරුද්ධව පැරණි අරගලයේ අතිශයෝක්ති ආකෘතියක් ලෙස සැලකී ඇත...

''... සමාජයෙන් ජීව ශක්තිය ඇදගන්නා සහ එහි නිදහස් චලනයට බාධක වන, ''රාජ්‍යය'' නැමති ඒ පිටින් වැඩුණු පිළිලය මෙතෙක් උරාගත් බලය, කොමියුන ව්‍යවස්ථාවෙන් නැවතත් සමාජ දේහයට ගෙන දෙන්නේය. මෙම තනි ක්‍රියාවෙන්ම එයට ප්‍රංශයේ පුනර් ජනනය ආරම්භ කළ හැකිව තිබිණි.

''... කොමියුන ව්‍යවස්ථාව අනුව, ගම්බද නිෂ්පාදකයන් ඔවුන්ගේ දිස්ත්‍රික්කවල ඇති මධ්‍යම නගරවල බුද්ධිමය නායකත්වය යටතට ගෙන ඒමට සහ ඔවුන්ගේ අවශ්‍යතාවයන්ගේ ස්වාභාවික භාරකරුවන් වන නාගරික කම්කරුවන් එහිදී ඔවුනට සම්බන්ධ කිරීමටද තිබුණි. කොමියුනයේ පැවපත්මෙන්ම, නිතැතින්ම වන දෙයක් ලෙසට, ප්‍රාදේශීය ස්වයං පාලනයක් තිබීම අදහස් කෙරේ. එහෙත් එය තිබෙන්නේ දැන් අනවශ්‍ය දෙයක් බවට පත්ව ඇති රාජ්‍ය බලයට ප්‍රතිතුලනයක් ලෙස නොවේ.''

''පිටින් වැඩුණු පිළිලයක්'' වූ ''රාජ්‍ය බලය බිඳීම'', එය ''කපා දැමීම'', එය ''සුන් කිරීම''; ''දැන් අනවශ්‍ය දෙයක් බවට පත්ව ඇති රාජ්‍ය බලය'' — කොමියුනයේ අත්දැකීම් අගය කිරීමේදී සහ විග්‍රහ කිරීමේදී රාජ්‍යය සම්බන්ධයෙන් මාක්ස් යොදගත් වදන් එසේය.

අර්ධ ශතවර්ෂයකට මඳක් අඩු කලකට පෙර මේ සියල්ල ලියා ඇත. එහෙත්, දැන්, විකෘති නොකළ මාක්ස්වාදය ජනතාවගේ දැනුම් සඳහා ඉදිරිපත් කිරීම පිණිස, අයෙකුට පුරාවස්තු සෙවීම වැනි ප්‍රයත්නයක යෙදෙන්නට සිදු වේ. පසුගිය මහා විප්ලවය සමයේ ජීවත්ව සිටි මාක්ස්, එම විප්ලවය ගැන නිරීක්ෂණයෙන් බැසගත් නිගමනයන්, හරියටම ඊළඟ මහා නිර්ධන පංති විප්ලවයට කල්යල් පැමිණ තිබූ අවස්ථාවේම අමතක කරන ලදී.

''... කොමියුනය ගැන විවිධාකාර අර්ථ නිරූපනයන් කර තිබීමෙන් සහ එයින් ප්‍රකාශිත වූ අවශ්‍යතාවයන්ගේ විවිධත්වයෙන්

https://liberationbase.wordpress.com

පෙනී යන්නේ, එය ඉතාමත් නම්‍යශීලී දේශපාලන ආකෘතියක් වූ අතර පෙර පැවති සියළු ආණ්ඩු ආකෘති අවශ්‍යයෙන්ම මර්දනකාරී වූ බවය. එහි නියම රහස වූයේ මෙයයි. එය අවශ්‍යයෙන්ම කම්කරු පංති ආණ්ඩුවක් විය; එය, නිෂ්පාදනය කරන පංතිය, අයිති කරගන්නා පංතියට විරුද්ධව කළ අරගලයේ ප්‍රතිඵලයක් විය; එය ශ්‍රමයේ ආර්ථික විමුක්තිය සාර්ථක කිරීමට ඉඩ සැලසීමෙහි සමත්, අවසානයේදී සොයාගන්නා ලද දේශපාලන ආකෘතිය විය...

"මෙහි සඳහන් අවසාන කොන්දේසිය නිසා නොවේ නම්, කොමියුන ව්‍යවස්ථාව නොකෙරෙන දෙයක් හා රැවටිල්ලක් වන්නට තිබිණි..."

සමාජය සමාජවාදී ක්‍රමයට පරිවර්තනය කිරීම පිණිස දේශපාලන ආකෘති "සෙවීමෙහි" මනෝරාජිකවාදීහු නිරත වූහ. අරාජිකවාදීහු දේශපාලන ආකෘති පිළිබඳ ප්‍රශ්නය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කළහ. වර්තමාන සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ අවස්ථාවාදීහු, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයේ ධනපති දේශපාලන ආකෘති, ඉක්මවා නොයායුතු සීමාන්තයන් සේ සලකා ඒවා පිළිගත්හ. මෙම "ආදර්ශය" ඉදිරියේ යාඥකරමින් ඔවුහු ස්වකීය නළල්තලවලට තඩිබා ගත් අතර, මෙම ආකෘති බිඳීමට දැක්වුණු සෑම අභිලාෂයක්ම අරාජිකවාදය ලෙසට හෙළා දුටහ.

සමාජවාදයේ සහ දේශපාලන අරගලයේ මුළු ඉතිහාසයම සැලකිල්ලට ගත් මාක්ස් රාජ්‍යය අතුරුදහන් වීම ස්ථිර වශයෙන්ම ඒකාන්ත බවද, එම අතුරුදහන් වීමේ (රාජ්‍යයේ සිට රාජ්‍යය නොවන තත්වයට පරිවර්තනය වීමේ) පරිවර්තනීය ආකෘතිය "පාලක පංතිය ලෙසට සංවිධානය වූ නිර්ධන පංතිය" බවද නිගමනය කළේය. එහෙත්, මෙම අනාගත අවධියෙහි දේශපාලන ආකෘති සෙවීමට මාක්ස් ව්‍යාවෘත නොවීය. ඔහු සූපරීක්ෂාකාරී ලෙස ප්‍රංශ ඉතිහාසය නිරීක්ෂණය කිරීමටත්, එය විග්‍රහ කිරීමටත් 1851 වර්ෂයේ මග පෙන්වීම අනුව නිගමනයට, එනම්, කරුණු යොමු වෙමින් තිබුණේ ධනපති රාජ්‍ය යන්ත්‍රය විනාශ කිරීම දෙසටය යන නිගමනයට එළඹීමටත්, පමණක් සීමා විය.

එහෙත්, නිර්ධන පංතියේ පොදුජන විප්ලවීය ව්‍යාපාරය ඉදිරියට කඩා වැදුණු විට, එහි අසාර්ථකත්වය නොතකාම, එහි මන්දයුෂ්කභාවය හා දුර්වලකම පෙනෙද්දීම, මාක්ස් එය සොයාගත් ආකෘති අධ්‍යයනය කිරීමට පටන්ගත්තේය.

ශ්‍රමයේ ආර්ථික විමුක්තිය සිදුවීමට ඉඩ සලසන හා "අවසානයේදී" නිර්ධන පංතිය විසින් "සොයා ගන්නා ලද" ආකෘතිය කොමියුනයයි.

නිර්ධන පංති විප්ලවය ධනපති රාජ්‍ය යන්ත්‍රය සුන් කිරීමට දැරූ ප්‍රථම ප්‍රයත්නය කොමියුනයයි. සුන්කරන ලද රාජ්‍ය යන්ත්‍රය වෙනුවට ආදේශ කළ හැකි සහ කළ යුතු, "අවසානයේදී සොයා ගන්නා ලද" දේශපාලන ආකෘතිය එයයි.

1905 සහ 1917 රුසියානු විප්ලව, වෙනත් වාතාවරණයන් සහ වෙනත් කොන්දේසි යටතේ කොමියුනයේ කටයුතු ඉදිරියට ගෙන යන බව හා මාක්ස්ගේ බැබලෙන ඓතිහාසික විග්‍රහයන් සනාථ කරන බව, අපට ඉදිරියේදී දැක්ක හැකිය.

හතරවැනි පරිච්ඡේදය

ඒ ගැනම තවදුරටත්, එංගල්ස්ගේ අතිරේක පැහැදිලි කිරීම

මාක්ස් කොමියුනයේ අත්දැකීම්වල වැදගත්කම ගැන මූලික කරුණු ඉදිරිපත් කළේය. නැවත නැවතත් එම මාතෘකාව වෙත ආපසු පැමිණි එංගල්ස්, මාක්ස්ගේ විග්‍රහය සහ නිගමන පැහැදිලි කළේය. එසේ කිරීමේදී ඔහු සමහර විට ඉතාමත් බලවත් ලෙස සහ සිත්කාවදින ලෙස ප්‍රශ්නයේ වෙනත් පැති ගැන පැහැදිලි කළ හෙයින්, ඔහුගේ පැහැදිලි කිරීම් ගැන වෙනම කරුණු සඳහන් කිරීම අවශ්‍ය වේ.

1. නිවාස ප්‍රශ්නය

එංගල්ස් ඔහුගේ "නිවාස ප්‍රශ්නය" (1872)[17] කෘතියෙන්ම කොමියුනයේ අත්දැකීම් සැලකිල්ලට ගනිමින්, රාජ්‍යය හා සම්බන්ධයෙන් විප්ලවයට පැවරෙන කර්තව්‍යයන් ගැන කීපවරක්ම කරුණු සඳහන් කළේය. මෙම විශේෂිත විෂය ගැන කරුණු දැක්වීමේදී, එක් අතකින්, නිර්ධන පංති රාජ්‍යය සහ වර්තමාන රාජ්‍ය අතර සමානකම් ඇති තැන්, එනම්, එම අවස්ථා දෙකම රාජ්‍යය යනුවෙන් හැඳින්වීමට සුදුසු වන තැන්ද, අනිත් අතට, ඒ දෙක අතර වෙනස්කම් ඇති තැන් නැතහොත් රාජ්‍යයේ විනාශය කරා පරිවර්තනය වීමේ තැන්ද, පැහැදිලිව හෙළිදරව් විය.

"එසේ නම්, නිවාස ප්‍රශ්නය බේරුම් කරන්නේ කෙසේද? වර්තමාන සමාජයේ එය බේරුම් කෙරෙන්නේ වෙනත් ඕනෑම සමාජ ප්‍රශ්නයක් මෙන්මය. එනම්, ඉල්ලුම හා සැපයුම අතර

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ආර්ථික සම මට්ටමක් ක්‍රමික ලෙස ඇති කිරීමෙනි. එය, ප්‍රශ්නය නැවත නැවතත් ප්‍රජනනය කරන බේරුම් කිරීමක් වන හෙයින්, ඇත්ත වශයෙන් බේරුම් කිරීමක් නොවන්නේය. සමාජ විප්ලවයක් මෙම ප්‍රශ්නය බේරුම් කරනු ඇත්තේ කෙසේද යන්න, එක් එක් අවස්ථාවට අදල තත්ත්වයන් මත රඳා පවතින්නක් පමණක් නොව, තවත් බොහෝ දුරගාමී ප්‍රශ්න හා සමග සම්බන්ධ වුවක්දවේ. එවැනි ඉතාමත් මූලික ප්‍රශ්න අතුරෙන් එකකි, නගරය සහ ගම අතර ප්‍රතිප්‍රත්‍යය පිළිබඳ ප්‍රශ්නය. අනාගත සමාජය සංවිධානය කිරීම සඳහා මනෝරාජික ක්‍රම නිර්මාණය කිරීම අපගේ කර්තව්‍යය නොවන හෙයින්, මෙහිදී ඒ ගැන සොයා බැලීම ඉතාමත් නිරර්ථකය. එහෙත් එක්දෙයක් එකාන්තය. ලොකු නගරවල තිබෙන නිවාස ඥනවන්ත ලෙස උපයෝගි කර ගන්නේ නම්, සැබෑ 'ගෙවල් හිඟකම' වහාම විසඳීමට තරම් සෑහෙන නිවාස සංඛ්‍යාවක් එම නගරවල ඇත. ස්වාභාවික වශයෙන් මෙය සිදුවිය හැක්කේ වර්තමාන අයිති කරුවන් අසන්තක කිරීමෙන් සහ දැනට නිවාස නැති කම්කරුවන් හෝ දැනට තද බදය ඇති ගෙවල සිටින කම්කරුවන් එම අයිති කරුවන්ගේ නිවාසවල පදිංචි කරවීමෙනි. නිර්ධන පංතිය දේශපාලන බලය දිනාගත් පසු, පොදු යහපත සඳහා සැලකිල්ල දැක්වීම අනුව ගතයුතු වන එවැනි පියවරක්, වර්තමාන රජයෙන් කෙරෙන වෙනත් අසන්තක කිරීම සහ පදිංචිකරවීම් මෙන්ම පහසුවෙන් ගත හැකි වනු ඇත.'' (ජර්මන්. මුද්‍රණය 1887, පිටු 22).

රාජ්‍ය බලයේ ආකෘතියෙහි වෙනස් වීම ගැන මෙහිදී විමර්ශනය නොකෙරේ. මෙහි විමසනු ලබන්නේ එහි ක්‍රියාකාරිත්වයෙහි හරය ගැන පමණකි. අසන්තක කිරීම් සහ පදිංචි කරවීම් වර්තමාන රාජ්‍යයේ නියමය පරිදි පවා සිදුවන්නේය. විධික්‍රම පිළිබඳ දෘෂ්ටි කෝණය අනුව කියතොත්, නිර්ධන පංති රාජ්‍යය ද, වාසස්ථාන අත්පත් කරගැනීම සහ නිවාස අසන්තක කිරීම ''නියෝග'' කරනු ඇත. එහෙත්, නිර්ධන පංති රාජ්‍යයේ නියෝග ක්‍රියාත්මක කිරීමට කිසිම සුදුසුකමක් ධනපති පංතිය හා සමග සම්බන්ධ පැරණි විධායක යන්ත්‍රයට එනම්, නිලධාරි පෙළැන්තියට නොමැති බව පැහැදිලිය.

> '' ... වැඩ කරන ජනතාව විසින් ශ්‍රම උපකරණ සියල්ල ''නියම වශයෙන්ම අල්ලා ගැනීම'' ත්, කර්මාන්තය සමස්තයක් වශයෙන් හිමිකර ගැනීමත්, ප්‍රැදොන්වාදී ''නිදහස් කර ගැනීමට'' එක එල්ලේම ප්‍රතිවිරුද්ධ දෙයක් බව පෙන්වා දිය යුතුය මෙහි පසුව සඳහන් අවස්ථාව යටතේ තනි පුද්ගල කම්කරුවා වාසස්ථානයේ, ගොවි පලෙහි සහ ශ්‍රම උපකරණවල අයිතිකරු වන්නේය. මුලින් සඳහන් අවස්ථාව අනුව ''වැඩ කරන ජනතාව නිවාසවල, පැක්ටරිවල සහ ශ්‍රම උපකරණවල සාමූහික අයිතිකරුවන් වී සිටිති. එම තත්ත්වය යටතේ, පරිවර්තනීය කාල සීමාවකදී වුව වන්දි හෝ වියදම නොගෙවා ඒවා පාවිච්චි කිරීමට තනි පුද්ගලයන්ට හෝ සමාගම්වලට ඉඩ ලැබෙනු ඇතැයි කිව නොහැක. ඒ ආකාරයෙන්ම ඉඩම් හිමිකම අහෝසි කිරීම බිම් බද්ද අහෝසි කිරීමක් නොවේ. වෙනස් කළ ආකාරයකින් වුවද, එය බිම්බද්ද සමාජයට මාරු කිරීමක් පමණකි. එනිසා, වැඩකරන ජනතාව විසින් ශ්‍රම උපකරණ සියල්ලම නියම වශයෙන්ම අල්ලා ගැනීමෙන්, බදු කුලී සම්බන්ධකම් පවත්වා ගැනීම වැලකෙන බවක් කිසිසේත් අදහස් නොවේ.'' (පිටු 68).

මෙම ඡේදයෙහි සඳහන් ප්‍රශ්නය වන, රාජ්‍යය හැකිලී යාමට අදළ ආර්ථික පදනම ගැන අපි මීළඟ පරිච්ඡේදයන් විමසා බලමු. එංගල්ස් තම අදහස ඉතාමත් ප්‍රවේසම් සහිතව ඉදිරිපත් කරමින්, ''පරිවර්තනීය කාල සීමාවකදී වුව,'' ගෙවීමක් නොකර නිවාස ප්‍රයෝජනයට ගැනීමට නිර්ධන පංති රාජ්‍යය ඉඩ දෙනු ඇතැයි ''කිව නොහැකි'' බව කියයි. මුළු ජනතාවටම හිමි නිවාස පුද්ගලික පවුල්වලට කුලියට දීමේදී, බදු කුලී එකතුකිරීමක්, කිසියම් ප්‍රමාණයක පාලනයක් සහ නිවාස වෙන්කර දීමේ යම් සම්මත පිළිවෙළක් තිබිය යුතුය යන්න නිතැතින්ම අදහස් වේ. මේ සියල්ලම සඳහා කිසියම් රාජ්‍ය ආකෘතියක් අවශ්‍ය වේ. එහෙත්, ඒ සඳහ විශේෂ වරප්‍රසාද සහිත තත්ත්වයන් දරන නිලධාරීන් සහිත, විශේෂ යුද්ධ සහ නිලධාරි යන්ත්‍රයක් කිසිසේත් අවශ්‍ය නොවේ. බදු කුලියෙන් තොරව වාසස්ථාන සැපයීමට හැකි තත්ත්වයකට සංක්‍රමණය වීම, රාජ්‍යය සම්පූර්ණයෙන්ම ''හැකිළී යාම'' මත රඳා පවතී.

කොමියුනයෙන් පසුව සහ එහි අත් දැකීමෙහි බලපෑම යටතේ, බලන්කිවාදීන්[18] විසින් මාක්ස්වාදයේ මූලික ප්‍රතිෂ්ඨාවන් පිළිගනු ලැබීම ගැන කතා කරන එංගල්ස්, එහිලා, මෙම ප්‍රතිෂ්ඨාව මෙසේ ඉදිරිපත් කරයි:

> ''පංති සහ ඒවා සමග රාජ්‍ය අහෝසි කිරීම දක්වා සංක්‍රමණය වීම වශයෙන් නිර්ධන පංතියේ දේශපාලන ක්‍රියාකාරිත්වයේ හා එහි ආඥාදායකත්වයේ අවශ්‍යතාවය...'' (පිටු 55).

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

''රාජ්‍ය අහෝසි කිරීම'' මෙසේ පිළිගැනීමත් මෙම සූත්‍රය අරාජිකවාදී එකක් යයි සලකා, ''ඩූරිං විරෝධයෙන්'' ගත් ඉහත සඳහන් ඡේදයෙන් එය ප්‍රතික්ෂේප කිරීමත් අතර, ප්‍රතිවිරෝධයක් ඇතැයි කෙස් පලන විවේචනයට ඇබ්බැහිවූවන්ට හෝ ධනපති පංතියේ ''මාක්ස්වාදය කපෝති කරන්නන්ට'' හෝ සමහර විට පෙනෙන්නට පිළිවන. සමාජ-ජාත්‍යෝන්මාද වාදීන්ගෙන් ජාත්‍යන්තරවාදීන්ට වැඩි වැඩියෙන් අරාජිකවාදය පිළිබඳ චෝදනා එල්ලවෙමින් පවතින හෙයින්, අවස්ථාවාදීන් එංගල්ස්ද ''අරාජික වාදියෙක්'' ලෙසට වර්ග කරත් නම් එය පුදුමයට කරුණක් නොවනු ඇත.

පංති අහෝසි කිරීම හා සමග රාජ්‍යය ද අහෝසි වනු ඇති බව මාක්ස්වාදය නිතරම උගන්වා තිබේ. ''ඩූරිං විරෝධයේ'' එන ''රාජ්‍ය හැකිළී යාම'' ගැන වූ සුප්‍රසිද්ධ ඡේදයෙන් අරාජිකවාදීන්ට චෝදනා කෙරෙන්නේ, හුදෙක් රාජ්‍යය අහෝසි කිරීමට පක්ෂ වීම ගැන පමණක් නොවේ. රාජ්‍යය ''එක රැයකින්'' අහෝසි කළ හැකි යයි දේශනා කිරීම ගැන ද එයින් ඔවුන්ට චෝදනා කරනු ලැබේ.

රාජ්‍ය අහෝසි කිරීමේ ප්‍රශ්නයේදී අරාජිකවාදයට මාක්ස්වාදයේ ඇති සම්බන්ධය, දැනට පැතිර පවත්නා ''සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී'' ධර්මයෙන් සම්පූර්ණයෙන්ම විකෘති කෙරෙන නිසා, මාක්ස් සහ එංගල්ස් අරාජිකවාදීන්ට විරුද්ධව ඉදිරිපත් වී කළ එක් වාදයක් ගැන මතක් කිරීම විශේෂයෙන් ප්‍රයෝජනවත් වනු ඇත.

2. අරාජිකවාදීන් සමග වාදය

මෙම වාදය ඇති වූයේ 1873 දී ය. මාක්ස් සහ එංගල්ස්, ප්‍රැදොන්වාදීන්ට[19], ''ස්වතන්ත්‍රවාදීන්ට'', නැතහොත්, ''අධිකාරි බල විරෝධීන්ට'' විරුද්ධව ඉතාලි සමාජවාදී වාර්ෂික සංග්‍රහයකට ලිපි සැපයූහ. මෙම ලිපි ජර්මන් "Neue Zeit"[20] හි පළ වූයේ 1913 තරම් පසු කාලයකය.

> ''කම්කරු පංතියේ දේශපාලන අරගලය විප්ලවවාදී ආකාරයන් ආරූඪකර ගතහොත්, එසේම ධනපති පංතියේ ආඥාදායකත්වය වෙනුවට කම්කරුවන් ඔවුන්ගේ විප්ලවවාදී ආඥාදායකත්වයක් පිහිටුවා ගතහොත්, ආයුධ බිම තබා රාජ්‍යය අහෝසි කරනවා වෙනුවට, ඔවුන්ගේ කාලකණ්ණි, පහත් දෛනික අවශ්‍යතාවයන් ඉටු කරගනු සහ ධනපති පංතියේ ප්‍රතිරෝධය පොඩිපට්ටම් කරනු පිණිස, ඔවුන් රාජ්‍යයට තාවකාලික ආකෘතියක් දෙන හෙයින්, ඔවුහු ප්‍රතිපත්ති උල්ලංඝනය කිරීමේ භයානක අපරාධයක් කරන්නෝ වෙති'' යි අරාජිකවාදීන් දේශපාලනය ප්‍රතික්ෂේප කිරීම ගැන ඔවුන්ට සමච්චල් කරමින් මාක්ස් ලිවේය...'' ("Neue Zeit" 1913-1914, වෙළුම 1, පිටු 40)[21].

අරාජිකවාදීන්ගේ මත බිඳහෙළීමේදී මාක්ස් සටන් කළේ මේ ආකාරයේ රාජ්‍යය ''අහෝසි කිරීමට'' විරුද්ධව පමණකි! පංති අතුරුදහන් වන විට රාජ්‍යය අතුරුදහන් වනු ඇති බව හෝ පංති අහෝසි කරන විට රාජ්‍යය අහෝසි වනු ඇති බව හෝ කියන අදහසට ඔහු කිසිසේත් විරුද්ධ නොවීය. ඔහු විරුද්ධ වූයේ, කම්කරුවන් ආයුධ පාවිච්චියත්, සංවිධිත ප්‍රචණ්ඩභාවයත්, එනම්, ''ධනපති පංතියේ ප්‍රතිරෝධය මැඩලීමට'' ප්‍රයෝජන වන රාජ්‍යයත් අත්හළ යුතුය යන ප්‍රස්තුතයට ය.

අරාජිකවාදයට විරුද්ධව තමන් කරන අරගලයේ නියම අරුත විකෘති කිරීම වලක්වනු වස්, මාක්ස්, නිර්ධන පංතියට අවශ්‍ය වන ''විප්ලවවාදී සහ තාවකාලික'' රාජ්‍ය ''ආකෘතිය'' ගැන විශේෂයෙන් අවධාරණය කළේය. නිර්ධන පංතියට රාජ්‍යය අවශ්‍ය වන්නේ තාවකාලික වශයෙන් පමණකි. අරමුණ වශයෙන් රාජ්‍යය අහෝසි කිරීම සම්බන්ධ ප්‍රශ්නයේදී අරාජිකවාදීන් සමග අපගේ කිසිම නොඑකඟතාවයක් නැත්තේය. පංති අහෝසි කිරීම සඳහා පීඩිත පංතිවල තාවකාලික ආඥාදායකත්වයක් අවශ්‍ය වන්නා සේම, මෙම අරමුණ ඉටුකර ගැනීම සඳහා සූරාකන්නන්ට විරුද්ධව රාජ්‍ය බලයේ උපකරණ, සම්පත් සහ ක්‍රම තාවකාලිකව උපයෝගි කර ගත යුතු බව අපි කියන්නෙමු. අරාජිකවාදීන්ට විරුද්ධව මාක්ස් ඉතාමත් තියුණු හා පැහැදිලි ආකාරයෙන් තම අදහස ඉදිරිපත් කරයි: ධනපතියන්ගේ වියගස පෙරළා දැමීමෙන් පසුව කම්කරුවෝ ''ඔවුන්ගේ ආයුධ බිම තැබිය යුතුද'', එසේ නැතහොත් ඒවා ධනපතියන්ට විරුද්ධව, ඔවුන්ගේ ප්‍රතිරෝධය මැඞීම සඳහා උපයෝගි කර ගත යුතුද? තවද, එක පංතියක් විසින් තවත් පංතියකට විරුද්ධව ක්‍රමානුකූල ලෙස ආයුධ පාවිච්චි කිරීම රාජ්‍යයේ ''තාවකාලික ආකෘතියක්'' නොවේ නම් වෙන කුමක්ද?

සෑම සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙක්ම තමන්ගෙන් මෙසේ අසා ගැනීම සුදුසුය: අරාජිකවාදීන් සමග කෙරුණු විවාදයේදී, තමා රාජ්‍යය පිළිබඳ ප්‍රශ්නය ඉදිරිපත් කළේ ඒ ආකාරයෙන්ද? දෙවැනි ජාත්‍යන්තරයේ ඇති විශාල සංඛ්‍යාවක් නිල සමාජවාදී පක්ෂ එය ඉදිරිපත් කර තිබෙන්නේ ඒ ආකාරයෙන්ද?

එංගල්ස් ද, එම අදහස්ම, ඊට වඩා බොහෝ විස්තර සහිතව සහ තවත් ජනකාන්ත ලෙස පැහැදිලි කරයි. ඔහු ප්‍රථමයෙන්ම කරන්නේ, තමන්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

''අධිකාරිබල විරෝධීන්'' යයි කියාගත්, එනම්, සියළු අධිකාරිබල, සියළු යටත් කිරීම්, සියළු බලය, ප්‍රතික්ෂේප කළ, ප්රුදොන්වාදීන්ගේ අවුල් අදහස්වලට සමච්චල් කිරීම ය. පැක්ටරියක්, දුම්රිය සේවයක්, මහ මුහුදේ නැවක් ගෙන බලන්නැයි එංගල්ස් කීවේය: යන්ත්‍ර උපයෝගිතාවය සහ මිනිසුන් බොහෝ දෙනෙකුගේ ක්‍රමානුකූල සහයෝගිතාවය මත පදනම් වූ මෙම සංකීර්ණ තාක්ෂණික ආයතන එකක් හෝ, කිසියම් ප්‍රමාණයක යටත් කිරීම සහ ඒ අනුව යන කිසියම් ප්‍රමාණයක අධිකාරය හෝ බලය නොමැතිව, ක්‍රියාත්මක විය නොහැකි බව නොපැහැදිලිද?

> '' ... ඉතාමත් වියරු අධිකාරිබල විරෝධීන්ට විරුද්ධව මා මෙම තර්ක ඉදිරිපත් කළ විට ඔවුන්ට දියහැකි එකම පිළිතුර මෙයයි: ඔහෝ, ඒක ඇත්තය. එහෙත් මෙය අප අපගේ නියෝජිතයන්ට පවරන අධිකාරි බලය පිළිබඳ ප්‍රශ්නයක් නොව කාර්ය භාරයක් පිළිබඳ ප්‍රශ්නයක් පමණකි! යම් කිසිවක නාම වෙනස් කිරීමෙන්, ඒ දෙය වෙනස් කළ හැකි යයි මේ මිනිස්සු සිතති...''[22]

අධිකාරි බලය සහ ස්වතන්ත්‍රය යනු සාපේක්ෂ අර්ථ දෙන වචන බවත්, විවිධ සමාජ සංවර්ධන කලාප අනුව ඒවා යෙදිය හැකි විෂය ක්ෂේත්‍ර වෙනස් වන බවත්, එසේ පෙන්නුම් කිරීමෙන් සහ යන්ත්‍ර භාවිතයේ හා මහා පරිමාණ නිෂ්පාදනයේ ක්ෂේත්‍රය නොකඩවාම ව්‍යාප්ත වන බවත් එකතු කිරීමෙන්ද අනතුරුව, එංගල්ස් අධිකාරි බලය ගැන සාමාන්‍ය ලෙස සාකච්ඡා කිරීමේ සිට රාජ්‍යය හා සම්බන්ධ ප්‍රශ්නය වෙත යයි.

> ''අනාගතයේ සමාජ සංවිධානය අධිකාරි බලයට ඉඩ දෙන්නේ, නිෂ්පාදන කොන්දේසි අනුව එය අනිවාරණීය වන සීමාවන් තුළ පමණකැයි කීමෙන් ස්වතන්ත්‍රවාදීහු සැනසුණෝ නම්, අපෙකුට ඔවුන් සමග එකඟත්වයක් ඇති කර ගැනීමට ඉඩක් තිබිණි'' යි ඔහු ලිවේය. ''එහෙත් ඔවුහු අධිකාරි බලය අවශ්‍ය කෙරෙනු සියළු කරුණුවලට අන්ධ වන අතර, එම වචනයට විරුද්ධව උද්වේගයෙන් යුතුව සටන් කරති.
>
> ''අධිකාරිබල විරෝධීන් රාජ්‍යයේ දේශපාලන අධිකාරයට විරුද්ධව හඬ නැගීමට පමණක් සීමා නොවන්නේ මන්ද? ඉදිරියේ එන සමාජ විප්ලවයේ ප්‍රතිඵලයක් වශයෙන්, රාජ්‍යය සහ ඒ සමගම දේශපාලන අධිකාරයද අතුරුදහන් වනු ඇති බවට, එනම්, මහජන කටයුතුවල දේශපාලන ස්වභාවය නැතිව ගොස්, ඒවා සමාජ අවශ්‍යතාවයන් ගැන බලාකියා ගැනීමේ හුදු පරිපාලන කාර්යයන් වන බවට, සියළුම සමාජවාදීහු එකඟවෙති. නමුත්, අධිකාරිබල විරෝධීන් ඉල්ලන්නේ, රාජ්‍ය උත්පාද වීමට හේතුවූ සමාජ සම්බන්ධකම් විනාශ කිරීමටත් පෙර, එක පහරින් දේශපාලන රාජ්‍යය අහෝසි කරන ලෙස ය. සමාජ විප්ලවයේ ප්‍රථම කටයුත්ත විය යුත්තේ අධිකාරි බලය අහෝසි කිරීම යයි ඔවුහු ඉල්ලති.
>
> මෙම මහත්වරුන් කිසි කලෙකත් විප්ලවයක් දැක තිබේද? විප්ලවය යනු ඉතාමත් වැඩි අධිකාරි බලයක් සහිත දෙයකි. එය වනාහි, ජනගහනයෙන් එක් කොටසක් රයිපල් තුවක්කු, බයිනෙත්තු සහ කාලතුවක්කු යන, ඉතා උසස් අධිකාරි බලයක් සහිත වන මාධ්‍යයන් උපයෝගි කර ගනිමින් ස්වකීය කැමැත්ත එහි අනිත් කොටසට බලෙන් පිළිගැන්වීමේ ක්‍රියාවකි. එසේම ජයග්‍රාහී පක්ෂය එහි පාලනය පවත්වා ගත යුත්තේ එහි ආයුධ ප්‍රතිගාමීන් තුළ ඇති කරන බිය මාධ්‍යය කොට ගනිමිනි. පැරිස් කොමියුනය ධනපති පංතියට විරුද්ධව ආයුධ සන්නද්ධ ජනතාවගේ අධිකාරි බලය පාවිච්චි නොකළේ නම් එයට එක් දිනකට වඩා කල් පැවතීමේ හැකියාවක් තිබිණිද? ඊට ප්‍රතිකූල වශයෙන්, එය එම අධිකාරි බලයෙන් ප්‍රයෝජන ගත්තේ පමණට වඩා අඩුවෙන් ය යන දෝෂාරෝපනය අපට එය වෙත එල්ල කළ හැකි නොවේද? එනිසා මෙහිදී බැසගත හැක්කේ මෙම නිගමන දෙකෙන් එකකටය. එක්කෝ අධිකාර බල විරෝධීන් කතා කරන්නේ ඔවුන් නොදන්නා දෙයක් ගැනය. එය එසේ නම්, ඔවුන් කරන්නේ අවුල් කිරීමක් මිස අනෙකක් නොවේ. නැතහොත් ඔවුහු ඒ ගැන දනිති. එසේ නම් ඔවුහු විප්ලවයේ සද්ව්‍යාපාරය පාවා දෙති. මේ දෙකෙන් කුමණ එක වුවත්,ඔවුන් සේවය කරන්නේ ප්‍රතිගාමීත්වයට පමණකි'' (පිටු 39)[23].

රාජ්‍ය ය හැකිළී යාමේ කාලය තුළ දේශපාලනය හා ආර්ථිකය අතරවන සම්බන්ධය ගැන විමසිල්ලට භාජනය කළ යුතු ප්‍රශ්න මෙම තර්කයෙහි සඳහන්ව ඇත. (මීළඟ පරිච්ඡේදය මේ සඳහා මිඩංගු වේ). මෙම ප්‍රශ්න නම්, මහජන කාර්යයන්, දේශපාලන කාර්යයන්ගේ තත්ත්වයෙන් සරල පරිපාලන කාර්යයන් බවට පරිවර්තනය කිරීම සහ ''දේශපාලන රාජ්‍යය'' යනුයි. මෙහි සඳහන් ''දේශපාලන රාජ්‍යය'' යන යෙදුම විශේෂයෙන් වැරදි අවබෝධයක් ඇතිවීමට හේතුවිය හැකිය. එයින් හඟවන්නේ රාජ්‍යය හැකිළී යාමේ ක්‍රියාදමයයි. මෙම ක්‍රියාදමයේ එක්තරා අවධි-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

යකදී, හැකිළී යමින් පවතින රාජ්‍යය දේශපාලන නොවන රාජ්‍යය යනුවෙන් හැඳින්විය හැකිය.

එංගල්ස්ගේ මෙම තර්කයෙහි ඉතාමත් අපූර්ව දෙය ඔහු අරාජිකවාදීන්ට විරුද්ධව ඔහුගේ අදහස ඉදිරිපත් කරන ආකාරය බව නැවතත් සඳහන් කළ යුතුය. තමන් එංගල්ස්ගේ ගෝලයන් වන බවට අයිතිවාසිකම් කියන සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්, 1873 න් මෙපිට, අරාජිකවාදීන්ට විරුද්ධව ලක්ෂගණන් වාර තර්ක කර ඇති නමුත්, ඔවුන් මාක්ස්වාදීන්ට කළහැකි ලෙසට හා ඔවුන් කළයුතු ලෙසට තර්ක කර නැත. රාජ්‍යය අහෝසි කිරීම පිළිබඳ අරාජිකවාදී අදහස අවුලකි; එය විප්ලවවාදී නොවේ. එංගල්ස් කීවේ එසේය. අරාජිකවාදීන් දැකීමට අකැමතිව හරියටම ප්‍රතික්ෂේප කරන්නේද, ප්‍රචණ්ඩභාවය, අධිකාරය, බලය, නැතහොත් රාජ්‍යය සහිතව නැගී එන හා සංවර්ධනය වන විප්ලවමය.

වර්තමාන සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයෙන් ආරාජිකවාදයට විරුද්ධව කෙරෙන සාමාන්‍ය විවේචනය, හුදෙක්ම අවරසික ප්‍රලාපයක් බවට පත්ව තිබේ: "අරාජිකවාදීන් රාජ්‍යය නොපිළිගන්නා නමුත්, අපි එය පිළිගනිමු." සිතන්නට හැකි සහ විප්ලවීය සිතුවිලි ඇති කම්කරුවන්, එවැනි ප්‍රලාපවලින් විකර්ෂණය වීම නොවැලැක්විය හැකිය. එංගල්ස් කීවේ වෙනස් දෙයකි. සමාජවාදී විප්ලවයේ ප්‍රතිඵලයක් වශයෙන් රාජ්‍යය අතුරුදහන් වනු ඇතැයි සියළුම සමාජවාදීන් පිළිගන්නා බව ඔහු අවධාරණය කරයි. ඊ ළඟට, ඔහු නිශ්චය වශයෙන්ම විප්ලවය පිළිබඳ ප්‍රශ්නය ගැන කරුණු සඳහන් කරයි. සාමාන්‍යයෙන්, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් අවස්ථාවාදී ලෙස මගහරින්නේ ද මෙම ප්‍රශ්නයමය. ඔවුන් එය "නිරාකරණය කිරීම" තනිකරම අරාජිකවාදීන්ට භාර කළ සේ පෙනේ. මෙම ප්‍රශ්නය ගැන කරුණු දැක්වීමේදී එයට එක එල්ලේ මුහුණ දෙමින්, එංගල්ස් මෙසේ අසයි: කොමියුනය රාජ්‍යයේ, එනම්, පාලක පංතිය ලෙසට ආයුධ සන්නද්ධවූ හා සංවිධානය වූ නිර්ධන පංතියේ විප්ලවවාදී බලයෙන් වඩාත් ප්‍රයෝජන ගත යුතුව නොතිබුණේද?

බලවත්ව පවතින නිල ප්‍රජාතන්ත්‍රවාදය අවරසික ලෙස දත් විලිස්සීමෙන් හෝ විතණ්ඩවාදී ලෙස "අනාගතයේදී පෙනේවි" යි කියා මගහැර යාමෙන් හෝ, විප්ලවයේදී නිර්ධන පංතියට භාරවන කර්තව්‍යයන් පිළිබඳ ප්‍රශ්නය සුපුරුදු ලෙස ඉවත ලූයේය. සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් කම්කරුවන්ට විප්ලවවාදී අධ්‍යාපනයක් දීමේ කර්තව්‍යය ඉටු කිරීමට අසමත් වෙතියි යනුවෙන් වූ, අරාජිකවාදීන්ගේ කියමන මෙවැන්නවුන් සම්බන්ධයෙන් සාධාරණය. එංගල්ස් පසුගිය නිර්ධන පංති විප්ලවයේ අත්දැකීම්වලින් පාඩම් උගෙන ගනියි. ඔහු එසේ කරන්නේ, බැංකු සහ රාජ්‍යය යන දෙකම සම්බන්ධයෙන් නිර්ධන පංතිය කුමක් කළ යුතුද, ඒ කුමණ

ආකාරයෙන්ද, යන්න ගැන ඉතාමත් නිවැරදි අධ්‍යයනයක් කිරීමේ ඒකාන්ත අරමුණ ඇතිවය.

3. බේබෙල්ට ලිපියක්

එංගල්ස් 1875 මාර්තු 18-28 දින ඇතිව බේබෙල්ට යැවූ ලිපියෙහි අන්තර්ගත, රාජ්‍යය ගැන වූ අදහස් පළ කරන පහත දැක්වෙන ඡේදය, මාක්ස් හා එංගල්ස් රාජ්‍යය ගැන කළ ප්‍රකාශයන් අතුරෙන් ඉතාමත් වැදගත් එක නොවේ නම්, ඉන් ඉතාමත් වැදගත් එකක් වන්නේය. අප දන්නා පරිදි, මෙම ලිපිය ප්‍රථමයෙන් පළ කරන ලද්දේ බේබෙල් විසින් ඔහුගේ මතක සටහන් වල ("මගේ ජීවිතයෙන් බිඳක්") දෙවැනි වෙළුමෙහි බවත්, එය ප්‍රකාශයට පත්වූයේ 1911 දී, නැතහොත්, ලිපිය ලියා සහ යවා තිස් අවුරුද්දකට පසුව බවත්, මෙහිලා අමතර වශයෙන් සඳහන් කරමු.

එංගල්ස් එම ලිපිය බේබෙල්ට යැව්වේ ගෝතා වැඩ පිළිවෙළ විවේචනය කරමිනි. මාක්ස් බ්‍රක්කේට[24] යැවූ සුප්‍රසිද්ධ ලිපියෙන්ද විවේචනය කළේ එම වැඩ පිළිවෙළමය.

> "නිදහස් ජනතා රාජ්‍යය නිදහස් රාජ්‍යය බවට පරිවර්තනය කර තිබේ. ව්‍යාකරණ අර්ථයෙන් ගත් කල, නිදහස් රාජ්‍යය යනු, එහි පුරවැසියන්ගෙන් නිදහස් රාජ්‍යයකි. එනිසා එය සර්වාධිකාරී ආණ්ඩුවක් සහිත රාජ්‍යයකි. රාජ්‍යය ගැන කතාව සම්පූර්ණයෙන්ම අත්හළ යුතුය. රාජ්‍යය යන වචනයේ නියම අර්ථයෙන් තව දුරටත් රාජ්‍යයක් නොවූ කොමියුනයෙන් පසු, විශේෂයෙන්ම එසේ කළ යුතුය. සමාජවාදී සමාජ ක්‍රමය ආරම්භ කිරීම සමග රාජ්‍ය දියවී (sich auflöst) ගොස් අතුරුදහන් වන බව දැනටමත් මාක්ස් ප්‍රූදොන්ට විරුද්ධව ලියූ පොතෙන්[25] හා "කොමියුනිස්ට් ප්‍රකාශනයෙන්" පැහැදිලි ලෙස කියා ඇති නමුත්, අරාජිකවාදීහු, අපට එපා වන තෙක් 'ජනතා රාජ්‍යය' අපගේ මුහුණට දමා ගැසූහ. රාජ්‍යය යනු, අයෙකුගේ සතුරන් බලෙන් මැඩලා තැබීම සඳහා, අරගලයේදී, එනම්, විප්ලවයේදී උපයෝගි කර ගනු ලබන පරිවර්තණීය ආයතනයක් පමණක් වන හෙයින් 'නිදහස් ජනතා රාජ්‍යයක්'' ගැන කතා කිරීම සම්පූර්ණයෙන්ම අර්ථ විරහිතය නිර්ධන පංතියට තවදුරටත් රාජ්‍යය අවශ්‍යවන තාක් කල්, ඊට එය අවශ්‍යවන්නේ නිදහස උදෙසා නොව, එහි සතුරන් මර්දනය කර තැබීම පිණිස වන නිසා, නිදහස ගැන කතා කිරීමට

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

හැකි වූ වහාම රාජ්‍යය නියම රාජ්‍යය වශයෙන් පැවතීම නැති වන්නේය. එනිසා සෑම තැනකදීම රාජ්‍යය වෙනුවට, හොඳ පැරණි ජර්මන් වචනයක් වන "ප්‍රජාව" Gemeinwesen යන්න යෙදීමට අපි යෝජනා කරමු. කොමියුනය යන ප්‍රංශ වචනයේ තැන ගැනීමට, එය සම්පූර්ණයෙන්ම සුදුසු වන්නේය. (මුල් ජර්මන් පිටපතෙහි පිටු 321-322).

මෙම ලිපියෙන් සඳහන් කරන්නේ, ඊට දින කීපයකට පමණක් පසුව දතම් කෙරුණු මාක්ස්ගේ ලිපියෙන් (මාක්ස්ගේ ලිපියෙහි දිනය 1875 මැයි 5 විය) විවේචනය කළ පක්ෂ වැඩ පිළිවෙළම ගැන බවත්, එවකට එංගල්ස් මාක්ස් සමග ලන්ඩන්හි පදිංචිව සිටි බවත්, පූර්වාවසාන වාක්‍යයෙහි "අපි යනුවෙන් ලියන විට, එංගල්ස් නියත වශයෙන්ම කියන්නේ. වැඩ පිළිවෙළෙහි එන "රාජ්‍යය" යන වචනය ඉන් කපාහැර ඒ වෙනුවට "ප්‍රජාව" යන වචනය ආදේශ කරන ලෙස තමන්ගේ මෙන්ම මාක්ස්ගේ ද නමින් ජර්මන් කම්කරු පක්ෂයේ නායකයාට යෝජනා කිරීම බවත්, මතක තබාගත යුතු වේ.

අවස්ථාවාදීන්ගේ පහසුව තකා විකෘති කරන ලද වර්තමාන "මාක්ස්වාදයේ" මහා ප්‍රදීපස්තම්භයන් වැනි නායකයින් අමතා, වැඩ පිළිවෙළෙහි එවැනි සංශෝධනයක් කිරීමට යෝජනා කරන ලද්දේ නම්, ඔවුන් "අරාජිකවාදය" ගැන මොන තරම් බෙරිහන් දෙනු ඇද්ද?

ඔවුන් බෙරිහන් දුන්නා වේ. එයින් ඔවුනට ධනපති පංතියේ ප්‍රශංසා ලැබෙනු ඇත.

— එහෙත් අපි අපගේ වැඩ කරගෙන යන්නෙමු. අපගේ පක්ෂයේ වැඩපිළිවෙළ සංශෝධනය කිරීමේදී, සත්‍යයට වඩ වඩාත් සමීප වීමත්, මාක්ස්වාදයේ විකෘති කිරීම් ඉවත් කර එයට නව ජීවනයක් දීමත්, කම්කරු පංතිය එහි විමුක්තිය සඳහා කරන අරගලයට වඩාත් නිවැරදි ලෙස මග පෙන්වීමත් පිණිස, අපි සෑම ආකාරයකින්ම එංගල්ස්ගේ සහ මාක්ස්ගේ උපදෙස් සැලකිල්ලට ගත යුත්තෙමු. එංගල්ස්ගේ සහ මාක්ස්ගේ උපදෙස්වලට විරුද්ධවන කිසිවෙක් ඇත්ත වශයෙන්ම, බොල්ෂෙවික් වරුන් අතර නොවනු ඇත. සමහර විට වචනය සම්බන්ධයෙන් පමණක් එක් දුෂ්කරතාවයක් ඇතිවිය හැක. ජර්මන් භාෂාවේ "ප්‍රජාව" යන අර්ථය දෙන වචන දෙකක් ඇත. එංගල්ස් පාවිච්චි කළේ, එයින් තනි ප්‍රජාවක් නොහඟවන, නමුත්, ප්‍රජා සමස්තය, එනම් ප්‍රජා ක්‍රමයක් හඟවන වචනය ය. රුසියානු භාෂාවෙහි එවැනි වචනයක් නොමැත. එනිසා, "කොමියුනය" යන ප්‍රංශ වචනයෙහි අඩුපාඩුකම් ඇතත්, අපට එම වචනය තෝරා ගැනීමට සිදු විය හැකිය.

"රාජ්‍යය යන වචනයේ නියම අර්ථයෙන් තවදුරටත් රාජ්‍යයක් නොවන කොමියුනය" — න්‍යායික වශයෙන් එංගල්ස්ගේ වැදගත්ම කියමන එයයි. ඉහත කී කරුණුවලින් පසුව මෙම කියමන මනාව පැහැදිලිය. කොමියුනයට මර්දනය කිරීමට තිබුණේ ජනගහනයෙන් බහුතරය නොව ඉන් අල්පතරය (සූරා කන්නන්) වූ නිසා, එය රාජ්‍යයක් වශයෙන් පැවතීම නැති වෙමින් තිබුණේය. එය ධනපති රාජ්‍ය යන්ත්‍රය සුන්කර තිබුණේය. විශේෂ බලහත්කාරී බලවේගය වෙනුවට මුළු ජනගහනයම වේදිකාවට එමින් සිටියේය. මේ සියල්ල රාජ්‍යය යන වචනයේ නියම අර්ථයෙන් ගත් කල,එය රාජ්‍යයෙන් බැහැර යාමක් විය. එසේම කොමියුනය ශක්තිමත් ලෙස තහවුරු වී නම්, එය තුළ වූ රාජ්‍යයේ සියළුම සේයාවන් ස්වයංකෘති ලෙසම "හැකිළී යන්නට" තිබිණි. රාජ්‍යයේ ආයතන "අහෝසි" කිරීමට එයට සිදු නොවන්නටත්, ඒවාට කිරීමට දෙයක් නොමැති හෙයින් ඒවායේ ක්‍රියාකාරිත්වය නවතින්නටත් තිබිණි.

"අරාජිකවාදීහු 'ජනතා රාජ්‍යය' අපගේ මුහුණට දමා ගැසූහ. මෙය කියන විට අන් සියල්ලටම වඩා එංගල්ස් අදහස් කරන්නේ බකුනින් ගැන සහ ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් වෙත එල්ල කළ බකුනින්ගේ ප්‍රහාරයන් ගැන ය. "ජනතා රාජ්‍යයක්" යන්න "නිදහස් ජනතා රාජ්‍යයක්" යන්න මෙන්ම අර්ථ විරහිත හා සමාජවාදයෙන් ඈත් වූ තාක් දුරට, මෙම ප්‍රහාරයන් සාධාරණ වූ බව එංගල්ස් පිළිගත්තේය. ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් ආරාජිකවාදීන්ට විරුද්ධව කළ අරගලය නිවැරදි මගට යොමු කිරීමටත්, එම අරගලය ප්‍රතිපත්තිමය වශයෙන් නිවැරදි එකක් කිරීමටත්, "රාජ්‍යය" ගැන වූ අවස්ථාවාදී දුර්මත එයින් ඉවත් කිරීමටත්, එංගල්ස් උත්සාහ දැරුවේය. අවාසනාවකට මෙන්, එංගල්ස්ගේ ලිපිය තිස් අවුරුද්දක් යනතෙක් හමස් පෙට්ටියේ ලා තිබුණි. මෙම ලිපිය පළ කිරීමෙන් පසුව වුවද, එංගල්ස්ගේ අනතුරු හැඟවීමෙහි සඳහන් එම වැරදිම නැවත නැවතත් කිරීමෙහි කෞට්ස්කි යෙදුණු බව අපට පසුවට දක්නට ලැබෙනු ඇත.

බෙබෙල් 1875 සැප්තැම්බර් 21 දින ඇති ලිපියකින් එංගල්ස්ට පිළිතුරු සැපයුවේය. කෙටුම්පත් වැඩ පිළිවෙළ හා සම්බන්ධයෙන් එංගල්ස් දැක්වූ අදහස්වලට තමා සම්පූර්ණයෙන්ම එකඟ වන බවත්, වැරදි මතවලට ඉඩ දීමට ලිබ්ක්නෙහ්ට් දැක්වූ සූදානම ගැන ඔහුට දෝෂාරෝපනය කළ බවත්, වෙනත් කරුණුත්, බෙබෙල් එහි සඳහන් කළේය. (බෙබෙල්ගේ මතක සටහන්, ජර්මන් සංස්කරණය, දෙවැනි වෙළුම, පිටු 334). එහෙත් අපි බෙබෙල්ගේ "අපේ අරමුණු" යන පොත ගන්නෙමු නම්, රාජ්‍යය ගැන සම්පූර්ණයෙන්ම වැරදි අදහස් එහි තිබෙන බව අපට දක්නට ලැබේ.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

''රාජ්‍යය පංති පාලනය පදනම් කරගත් එකක සිට ජනතා රාජ්‍යයකට පරිවර්තනය කළ යුතුය.'' Unsere Ziele, ජර්මන් මුද්‍රණය, 1866, පිටුව 14)

මෙය බේබෙල්ගේ පොතෙහි නමවැනි (නමවැනි!) සංස්කරණයේ මුද්‍රණය කර ඇත! මෙසේ නිරන්තර ලෙස නැවත නැවතත් හඬවන ලද, රාජ්‍යය ගැන වූ අවස්ථාවාදී අදහස්, ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් විසින් උරා ගනු ලැබීම පුදුමයට කරුණක් නොවේ. විශේෂයෙන්ම, එංගල්ස්ගේ ඒ පිළිබඳ අර්ථ නිරූපනය ප්‍රවේසම් සහිතව හමස් පෙට්ටියේ ලා තිබුණු හෙයින්ද, ජීවන කොන්දේසි සියල්ලම දීර්ඝ කාලයක් යන තෙක් ඔවුන්ට විප්ලවය ''අත්හැරවීමට'' තුඩුදුන් නිසාද එසේ විය.

4. එර්පුර්ට් වැඩ පිළිවෙළෙහි කෙටුම්පත ගැන විවේචනය

රාජ්‍යය ගැන වූ මාක්ස්වාදී උගැන්වීම් විග්‍රහ කර බැලීමේදී, නොසලකා හැරිය නොහැක්කකි, එංගල්ස් 1891 ජූනි 29 දින කොෞට්ස්කි වෙත යැවූ සහ ඊට දස වසරකට පසුව Neue Zeit හි පළ කෙරුණු කෙටුම්පත් එර්පුර්ට් වැඩපිළිවෙළ[26] පිළිබඳ විවේචනය. එසේ කියන්නේ, රාජ්‍ය සංවිධානය හා සම්බන්ධ ප්‍රශ්නවලදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් දැරූ අවස්ථාවාදී අදහස් වෙත එම විවේචනය ප්‍රධාන වශයෙන් එල්ල වූ හෙයිනි.

ආර්ථික ප්‍රශ්න ගැනද එංගල්ස් ඉතාමත් අගනා අදහස් ප්‍රකාශ කර තිබෙන බව මෙහිලා සඳහන් කරමු. එනිසා, නවීන ධනපති ක්‍රමයේ ඇතිවෙමින් පවතින විවිධ වෙනස්කම් ගැන ඔහු කොතරම් අවධානයෙන් යුතුව හා කල්පනාකාරී ලෙස විමසිලිමත් වූයේද යනුත්, එනිසාම, අපගේ වර්තමාන අධිරාජ්‍යවාදී යුගයේ කර්තව්‍යයන් එක්තරා දුරකට කල්තබා දැකීමට ඔහු සමත්වූ බවත් එයින් පෙනේ. ඔහු කියා ඇති දෙය මෙසේය: ධනපති ක්‍රමයේ ස්වභාව ලක්ෂණයක් ලෙසට සඳහන් කර වැඩ පිළිවෙළෙහි යොදා ඇති ''සැලසුම් රහිත බව'' Planlosigkeit යන වදන ගැන එංගල්ස් මෙසේ ලීවේය!

> ''අප බද්ධ ව්‍යාපාර වස්තු සමාගම්වල සිට කර්මාන්ත මුළුමනින්ම ස්වකීය පාලනයට හා ඒකාධිකාරයට යටත් කරන සංගත ව්‍යාපාර වෙතට යන විට, නැතිව යන්නේ පෞද්ගලික නිෂ්පාදනය පමණක් නොවේ. එවිට සැලසුම් රහිත බවද නැතිව යන්නේය.'' "Neue Zeit" වෙළුම 1, 1901-1902, පිටුව 8).

ධනපති ක්‍රමයේ නවතම පරිච්ඡේදය, එනම්, අධිරාජ්‍යය වාදය ගැන න්‍යායික වශයෙන් අගය කිරීමේදී ඉතාමත්ම වැදගත් කරුණ, එනම්, ධනපති ක්‍රමය ඒකාධිකාරී ධනපති ක්‍රමය වන්නේය යන්න මෙයින් කියැවේ. ඒකාධිකාරී ධනපති ක්‍රමය හෝ රාජ්‍ය-ඒකාධිකාරී ධනපති ක්‍රමය දැන් තවදුරටත් ධනපති ක්‍රමය නොවන බවත්, එය ''රාජ්‍ය සමාජවාදය'' යනාදිය ලෙසට හැඳින්විය හැකි බවත් කියන සාවද්‍ය ධනපති ප්‍රතිසංස්කරණවාදී සහතික වීම් ඉතා සුලභ නිසා, ධනපති ක්‍රමය යන්න මෙහිදී අවධාරණය කළ යුතුය. සංගත ව්‍යාපාර කිසි කලෙකත් සැලසුම් සම්පාදනය කළේවත්, දැන් සැලසුම් සම්පාදනය කරන්නේවත්, සම්පූර්ණ සැලසුම් සම්පාදනයක් කිරීමට සමත් වන්නේවත් නැත. ඔවුන් කොතරම් සැලසුම් කළත්, ධනපති හපනුන් ජාතික පමණක් නොව අන්තර්ජාතික පරිමාණයෙන් පවා නිෂ්පාදන පරිමාව කල්තබා ගණන් බැලීම කොතරම් කළත්, එසේම, ඔවුන් කොතරම් දුරට එය හැසිරෙව්වත්, අප තවමත් සිටින්නේ ධනපති ක්‍රමය යටතේමය. එය එහි නව අවධියක් බව ඇත්ත නමුත්, එය නිසැක වශයෙන්ම තවමත් ධනපති ක්‍රමයම වේ. එවන් ධනපති ක්‍රමය සමාජවාදී ක්‍රමයට ''සමීපස්ථ'' වීම, සමාජවාදී විප්ලවය ආසන්න, සුකර, ශක්‍යතා පූර්ණ සහ හදිසි අවශ්‍යතාවයක් බව කීමට තර්කයක් වශයෙන් නිර්ධන පංතියේ නියම නියෝජිතයන්ට ප්‍රයෝජනවත් විය යුතුය. එය කිසිසේත්ම එවැනි විප්ලවයක් අත්හැරීමට සහ සියළුම ප්‍රතිසංස්කරණවාදීන් කරන පරිදි ධනපති ක්‍රමය අලංකාර කිරීමට ප්‍රයත්න දැරීම සඳහා යොදගන්නා තර්කයක් නොවිය යුතුය.

එහෙත්, අපි නැවතත් රාජ්‍යය පිළිබඳ ප්‍රශ්නය වෙතට හැරෙමු. එංගල්ස් ඔහුගේ ලිපියෙන් විශේෂයෙන්ම වැදගත් යෝජනා තුනක් ඉදිරිපත් කරයි: පළමුවැන්න, සමූහාණ්ඩුව ගැනය, දෙවැන්න, ජාතික ප්‍රශ්නය හා රාජ්‍ය සංවිධානය අතර ඇති සම්බන්ධය ගැනය; තුන්වැන්න, ප්‍රාදේශීය ස්වයං පාලනය ගැනය.

සමූහාණ්ඩුව ගැන කිව යුත්තේ, එංගල්ස් කෙටුම්පත් එර්පුර්ට් වැඩ පිළිවෙළ ගැන කළ ඔහුගේ විවේචනයෙහි යොමු ලක්ෂය කොට ගත්තේ එය බවය. එර්පුට් වැඩ පිළිවෙළ මුළු ලෝකයේම සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ට ඉතාමත් වැදගත් වූ ආකාරයත්, එය මුළු දෙවැනි ජත්‍යන්තරයේම ආදර්ශය වූ බවත්, සිහියට ගත් කල, එංගල්ස් එයින් විවේචනය කළේ මුළු දෙවැනි ජාත්‍යන්තරයේම අවස්ථාවාදය බව අතිශයොක්තියෙන් තොරව කිව හැකිය.

> ''කෙටුම්පතෙහි දේශපාලන ඉල්ලීම්වල එක බරපතල වරදක් ඇත. නියත වශයෙන්ම කිව යුතු දෙය එහි නැත'' යි එංගල්ස් ලීවේය. (අවධාරණය එංගල්ස් ගේය).

හරියටම කියතොත්, ජර්මන් ව්‍යවස්ථාව 1850 අන්ත ප්‍රතිගාමී ව්‍යවස්ථාවේ පිටපතක් පමණක් යයි ද, රීයිෂ්ස්ටාග් පාර්ලිමේන්තුව යනු, විල්හෙ-

https://liberationbase.wordpress.com

ල්ම ලීබ්ක්නෙහ්ට කී පරිදි සර්වාධිකාරයේ සෙළුව වසන කොළ අත්ත යයිද, කුඩා රාජ්‍ය සහ කුඩා රාජ්‍යවල පෙඩරල් ඒකාබද්ධ වීමක් පැවතීම නීත්‍යානුකූල කරන ව්‍යවස්ථාවක් පදනම් කරගෙන සියළුම ශ්‍රම උපකරණ පොදු දේපල බවට පරිවර්තනය කිරීමට ප්‍රාර්ථනා කිරීම ''පැහැදිලිවම අර්ථ විරහිත'' යයිද ඔහු අනතුරුව පෙන්වා දෙයි.

''එසේවුවද, එය ගැන සඳහන් කිරීම අන්තරාදයකය'' යනුවෙන් එංගල්ස් එකතු කළේ සමූහාණ්ඩු ජර්මනියක් සඳහා වූ ඉල්ලීම වැඩපිළිවෙළට ඇතුලත් කිරීමට නීතියෙන් කිසිම ඉඩක් නොතිබුණු බව හොඳින් දැන සිටි හෙයිනි. එහෙත් ''කවුරුත්'' සතුටු කළ මෙම කරුණ පිළිගෙන නිකම් සිටීමට එංගල්ස් එකඟ වූයේ නැත. ඔහු තවදුරටත් මෙසේ ලීවේය: ''එසේ වුවද, කුමණ ආකාරයෙන් හෝ එයට පහර දිය යුතුය. මෙය කොතරම් අවශ්‍යද යන්න සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පුවත්පත්වල විශාල කොටසක, හරියටම මෙම වකවානුවේදී පැතිරෙමින් පවතින einreiBende අවස්ථාවාදයෙන් පෙන්නුම් කෙරේ. සමාජවාදයට විරුද්ධ නීතිය යළි පනගැන්වීමක් ගැන ඇති බිය නිසා හෝ, එම නීතිය බලපැවති කාලයේ වැඩි ඉක්මන්කාරී ලෙස කළ නොයෙක් ආකාරයේ ප්‍රකාශයන් මතක්වීම නිසා හෝ, සියළුම පක්ෂ ඉල්ලීම් සාමකාමී ලෙස ඉදිරිපත් කිරීම පිණිස, ජර්මනියේ ඇති වර්තමාන නීත්‍යානුකූල ක්‍රමය ප්‍රමාණවත් යයි පිළිගැනීමට දැන්] ඔවුන්ට උවමනා වී තිබේ...''

LIBERATIONBASE

ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් කටයුතු කළේ සමාජවාදයට විරුද්ධ නීතිය[28] යළි පණගැන්වීම ගැන බියක් ඇතිව යයි කියමින් එංගල්ස් මූලික කාරණය අවධාරණය කළ අතර, එය නිශ්චයවම අවස්ථාවාදය ලෙසට හැඳින්වූයේය. ජර්මනියේ සමූහාණ්වක් නොතිබීමේ සහ නිදහස නොතිබීමේ හේතුව නිසාම ''සාමකාමී'' මාර්ගයක් පිළිබඳව සිහින දැකීම සම්පූර්ණයෙන්ම නිරර්ථක බව ඔහු ප්‍රකාශ කළේය. එංගල්ස් තමාගේ අත් නොබැඳ ගැනීමට තරම් ප්‍රවේසම් සහිත විය. සමූහාණ්ඩුවාදී හෝ ඉතාමත් නිදහස් රටවල, සමාජවාදය කරා යොමු වූ සාමකාමී සංවර්ධනයක් ගැන ''අයෙකුට සිතන්නට (''සිතන්නට'' පමණක්!) හැකි'' බව ඔහු පිළිගත්තේය. එහෙත් ජර්මනිය ගැන ඔහු නැවතත් මෙසේ කීවේය.

''ආණ්ඩුව සර්වබලධාරී ස්වභාවයක් දරන සහ රීයිහ්ස්ටාග් පාර්ලිමේන්තුවට සහ වෙනත් නියෝජිත සභාවලට නියම බලයක්

නොමැතිව තිබෙන ජර්මනියේ, එවැනි දෙයක් දේශනා කිරීම සහ අනවශ්‍ය ලෙස එවැන්නක් ප්‍රකාශ කිරීම යනු, සර්වාධිකාරයේ සෙළුව වසන කොල ඉවත් කර, තමන්ම එම සෙළුවට කඩතුරාව වීමය.

මෙම උපදේශය හමස් පෙට්ටියේ ලූ ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ නිල නායකයන් අතුරෙන් අතිබහුතරය ඇත්ත වශයෙන්ම සර්වාධිකාරයට ''ආවරණයක්'' වූහ.

'' ... එවැනි ප්‍රතිපත්තියකින් කල්යාමේදී සිදුවිය හැක්කේ එය අනුගමනය කරන අයගේ පක්ෂය නොමගට වැටීම පමණකි. ඔවුහු සාමාන්‍ය, වියුක්ත දේශපාලන ප්‍රශ්න ඉදිරියට තල්ලු කරති. එසේ කිරීමෙන්, ප්‍රථමයෙන්ම ඇතිවන මහා සිදුවීම්වලදී, ප්‍රථමයෙන් ඇතිවන දේශපාලන විප්ලවයේදී නිතැතින්ම ඉදිරිපත් වන නියම හදිසි ප්‍රශ්න සඟවා තබනු ලැබේ. තීරණාත්මක අවස්ථාවේදී පක්ෂය හිටි අඩියේම අසරණ තත්ත්වයට පත්වීම සහ ඉතාමත් තීරණාත්මක ප්‍රශ්න කිසි කලෙකත් සාකච්ඡා කර නොමැති නිසා එම ප්‍රශ්න සම්බන්ධයෙන් පක්ෂය තුළ අවිනිශ්චිත භාවය සහ අසමගිය ඇති වීම හැර, මෙයින් ඇති වන ප්‍රතිඵලය කුමක් විය හැකි ද?..

''එදිනෙද ඉතා තාවකාලික අවශ්‍යතාවයන් සලකා මහා, ප්‍රධාන කරුණු මෙසේ අමතක කිරීම, පසුව ඇතිවන ප්‍රතිඵල නොතකා අවස්ථාවට පමණක් දිනුම ලැබීමට මෙසේ අරගල කිරීම, සමහර විට අවංක අදහසින් වුව, ව්‍යාපාරයේ අනාගතය වර්තමානය සඳහා මෙසේ පාවා දීම අවස්ථාවාදයම වන්නේය. එය එසේමය. තවද, සියළු ආකාරයේම අවස්ථාවාදය අතුරෙන් වඩාත් භයානක වන්නේ ''අවංක'' අවස්ථාවාදය විය හැක...

''කිසියම් දෙයක් ස්ථිර නම්, ඒ අපගේ පක්ෂයට හා කම්කරු පංතියට බලයට පත්විය හැක්කේ ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවක් ආකාරයෙන් බවය. මහා ප්‍රංශ විප්ලවයෙන් දැනටමත් පෙන්වා දී ඇති පරිදි නිර්ධන පංති ආඥාදායකත්වයේ විශේෂ ආකෘතියද එයයි...''

මෙහිදී, මතක සිටින ආකාරයෙන්, එංගල්ස් පුනරුච්චාරණය කළේ, මාක්ස්ගේ කෘතීන් සියල්ලම ඔස්සේ ගිය මූලික අදහස වන, නිර්ධන පංති ආඥාදායකත්වයට ඇති කෙටිම ප්‍රවේශමාර්ගය ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්-

https://liberationbase.wordpress.com

ඩුවය යන්නය. ප්‍රාග්ධනයේ පාලනය අඩුතරමින් හෝ අහෝසි නොකරන, එනිසා, පොදු ජනතාවගේ පීඩනය සහ පංති අරගලය අහෝසි නොකරන එවැනි සමූහාණ්ඩුවකින්, අනිවාර්‍යය වශයෙන්ම පංති අරගලය ව්‍යාප්ත වීමට, සංවර්ධනය වීමට, කල එළි වීමට සහ උත්සන්න වීමට කොතරම් දුරට මහ විවෘත වන්නේද යත්, පීඩිත පොදු ජනතාවගේ අවශ්‍යතාවයන් ඉටු කිරීමට හැකිවූ වහාම, එම හැකියාව නොවැලැක්විය හැකි ලෙසටම හා තනිකරම නිර්ධන පංති ආඥාදයකත්වය තුළින්, එම පොදු ජනතාවට නිර්ධන පංතිය දෙන නායකත්වය තුළින්, සාර්ථක කෙරෙන්නේය. මේවා ද, මුළු දෙවැනි ජාත්‍යන්තරයටම, මාක්ස්වාදයේ "අමතක වූ වදන්" වෙති. එසේම, එම වදන් අමතක කරන ලද බව, 1917 රුසියානු විප්ලවයේ පළමු හයමාසයට අදළ මෙන්ෂෙවික් පක්ෂයේ ඉතිහාසයෙන් ඉතා හොඳින් පෙනේ.

ජනගහනයේ ජාතික සංයුතිය හා සම්බන්ධයෙන්, පෙඩරල් සමූහාණ්ඩුවක් පිළිබඳ විෂය ගැන එංගල්ස් මෙසේ ලීවේය.

> "අද ජර්මනියේ සිදුවිය යුත්තේ කුමක් ද (ප්‍රතිගාමී රාජාණ්ඩු ව්‍යවස්ථාවත්, කුඩා රාජ්‍යවලට වෙන් කරන එතරම්ම ප්‍රතිගාමී බෙදීමත්, ඒ සියළුම රාජ්‍යයන් සමස්තයක් වශයෙන් ජර්මනිය තුළ දියකර හරිනු වෙනුවට "ප්රුසියන්වාදයේ" සියළුම විශේෂ අංගලක්ෂණ සදකාලික කරන එම බෙදීමත් සහිත ජර්මනියේ සිදුවිය යුත්තේ කුමක් ද) ? මගේ අදහසේ හැටියට නිර්ධන පංතියට උපයෝගි කර ගත හැක්කේ, ඒකීය සහ නොබෙදිය හැකි සමූහාණ්ඩු ආකෘතිය පමණකි. එක්සත් ජනපදයේ යෝධ භූමි භාගයෙහි, සමස්තයක් වශයෙන් පෙඩරල් සමූහාණ්ඩුවක් තවමත් අවශ්‍ය ය. එහෙත් නැගෙනහිර රාජ්‍යවල එය දැනටමත් බාධකයක් වී තිබේ. බ්‍රිතාන්‍යයේ දී එය ඉදිරි පියවරක් වනු ඇත. එහි දිවයින් දෙකක ජාතීන් හතරක් සිටින අතර, එක පාර්ලිමේන්තුවක් පවතින නමුත් දැනටමත් එකිනෙක සමග උරෙනුර ගැටෙන වෙනස් ව්‍යවස්ථාදයක ක්‍රම ඇත. කුඩා ස්විට්සර්ලන්තයේ එය දීර්ඝ කාලයක සිටම බාධකයකි. එහි එය ඉවත නොදමා තිබෙන්නේ ස්විට්සර්ලන්තය යුරෝපීය රාජ්‍ය ක්‍රමයේ සම්පූර්ණයෙන්ම නිහඬ සාමාජිකයෙක් වී සිටීමෙන් සැනසෙන හෙයින් පමණකි. ජර්මනිය ස්විට්සර්ලන්ත ආකෘතිය අනුව පෙඩරල් ක්‍රමයක් පිළිගැනීම යනු, එරට ආපස්සට තබන දැවැන්ත පියවරක් වනු ඇත. කරුණු දෙකක් අනුව රාජ්‍ය සංගමයක් සම්පූර්ණයෙන්ම ඒකීය වූ රාජ්‍යයකින් වෙනස්වේ. ප්‍රථම කරුණ: සෑම සාමාජික රාජ්‍යයකටම, සෑම කැන්ටන් ප්‍රදේශයකටම, තමන්ගේ සිවිල් සහ අපරාධ නීති සම්පාදන සහ අධිකරණ ක්‍රම ඇත. දෙවැනි කරුණ, මහජන මන්ත්‍රී මණ්ඩලයට අමතරව සෑම ලොකු හෝ කුඩා කැන්ටන් ප්‍රදේශයකම කැමැත්ත ප්‍රකාශ කෙරෙන පෙඩරල් මණ්ඩලයක් ඇත." ජර්මනියේ රාජ්‍ය සංගමය ඒකීය රාජ්‍යයට සංක්‍රමණය වීමේ මාර්ගයකි. තවද, 1866 සහ 1870 වර්ෂවල "ඉහළ සිට විප්ලවය" ආපස්සට නොගත යුතු අතර, "පහළ සිට ව්‍යාපාරය" ඊට එකතු කළ යුතුය.

රාජ්‍ය ආකෘති ගැන එංගල්ස් කිසිසේත් නොසැලකිලිමත් නොවීය. ඊට ප්‍රතිකූල වශයෙන්, එක් එක් විශේෂ අවස්ථාවට බලපාන නියත ඓතිහාසික විශේෂතාවයන් අනුව, කිසියම් නිශ්චිත පරිවර්තනීය ආකෘතියක් කුමක සිට කුමක් දක්වා සංක්‍රමණය වන්නේද යන්න නිගමනය කිරීම සඳහා, ඉතාමත් විස්තරාත්මක ලෙස පරිවර්තනීය ආකෘති විග්‍රහ කිරීමට ඔහු වෙහෙස ගත්තේය.

නිර්ධන පංතියේ සහ නිර්ධන පංති විප්ලවයේ ස්ථාවරයෙන් ප්‍රශ්නය වෙත සමීප වන එංගල්ස්, මාක්ස් සේම ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගතවාදය, සමූහාණ්ඩුව, එනම්, ඒකීය හා නොබෙදිය හැකි සමූහාණ්ඩුව, ආරක්ෂා කළේය. ඔහු පෙඩරල් සමූහාණ්ඩුව ගැන සැලකුවේ, එක්කෝ විශේෂත්වයක් හා සංවර්ධනයට බාධකයක් ලෙසටය, නැතහොත්, රාජාණ්ඩුවක සිට මධ්‍යගත ආණ්ඩුවක් බවට පරිවර්තනය වීමක්, එනම්, සමහර විශේෂ කොන්දේසි යටතේ එන "ඉදිරි පියවරක්" ලෙසට ය. තවද මෙම විශේෂ කොන්දේසි අතුරෙන් ඔහු ඉදිරියෙන්ම තබන්නේ ජාතික ප්‍රශ්නය ය.

කුඩා රාජ්‍යයන්ගේ ප්‍රතිගාමී ස්වභාවය සහ එය වසං කිරීමට ජාතික ප්‍රශ්නය කඩතුරාවක් කර ගැනීම ගැන එංගල්ස් නිර්දය ලෙස විවේචනය කරන නමුත්, මාක්ස් මෙන්ම, ඔහුද, ජාතික ප්‍රශ්නය අයිනකට තල්ලුකර දැමීමේ කිසිම කැමැත්තක් කිසි කලෙකත් නොදැක්වීය. "තමන්ගේ" කුඩා රාජ්‍යයන්ගේ පටු, අමන, ජාතිකවාදයට දක්වන සම්පූර්ණයෙන්ම සාධාරණ විරුද්ධත්වය මුල් කොට ගෙන කටයුතු කරන ලන්දේසි සහ පෝලන්ත මාක්ස්වාදීහු බොහෝ විට එබඳු කැමැත්තක් දැක්වීමේ වරදට වැටෙති.

භූගෝලීය කොන්දේසි, පොදු භාෂාවක් සහ ශතවර්ෂ ගණනාවක ඉතිහාසය විසින් රටේ විවිධ කුඩා බෙදීම් "කෙළවර වී" ඇතැයි පෙනී යා හැකි බ්‍රිතාන්‍යය හා සම්බන්ධයෙන්, එම රට සම්බන්ධයෙන් වුවද, ජාතික ප්‍රශ්නය යටගියාවට අයත් දෙයක් නොවේය යන පැහැදිලි සත්‍යය සැලකිල්ලට ගත් එංගල්ස්, ඒ අනුව, එහි පෙඩරල් සමූහාණ්ඩුවක් පිහිටුවීම ඉදිරි පියවරක් ලෙස පිළිගත්තේය. එහෙත්, එංගල්ස් පෙඩරල් සමූහා-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ණ්ඩුවේ දුර්වලකම් විවේචනය කිරීම හැරදමන බවක් හෝ ඒකීය සහ මධ්‍යගත ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවකට පක්ෂවාදිත්වය දැක්වීම සහ ඒ සඳහා අරගල කිරීම අත් හරින බවක් හෝ ඇඟවීමේ සේයාවකුදු මෙහි නොමැත්තේය.

එහෙත් එංගල්ස් ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගතවාදය යනුවෙන් අදහස් කළේ, ධනපති පංතික හා සුළු ධනපති දෘෂ්ටිවාදීන්ද, ඉන් පසු කී අය අතර තුර අරාජික වාදීන්ද, එම පද යොදු ගත්තේ ධනපති පංතික අර්ථයෙන් නොවේ. රාජ්‍යයේ එක්සත්කම ස්වේච්ඡාවෙන් ආරක්ෂා කිරීම සහ සියළුම නිලධාරිවාදී ව්‍යවහාරයන් හා ඉහළ සිට කරන සියළුම "අණ කිරීම" සම්පූර්ණයෙන්ම කෙළවර කිරීමට, "කොමියුන" සහ දිස්ත්‍රික්ක ඒකාබද්ධ කරන වැනි පුළුල් ප්‍රාදේශීය ස්වයං පාලනය ඔහුගේ මධ්‍යගතවාදය පිළිබඳ අදහස විසින් කිසිසේත් බැහැර නොකෙරේ.

රාජ්‍යය ගැන මාක්ස්වාදී වැඩ පිළිවෙළෙහි අදහස් ඉදිරියට ගෙන යමින් එංගල්ස් මෙසේ ලිවේය:

> "එනිසා, ඒකීය සමූහාණ්ඩුවක් — නමුත්, ඒ වර්තමාන ප්‍රංශ සමූහාණ්ඩුවේ අර්ථයෙන් නොවේ. එය නම් අත් යමක් නොව 1798 දී පිහිටුවන ලද අධිරාජ්‍යයම ය. වෙනසකට ඇත්තේ අධිරාජයා නොමැතිවීම පමණකි. 1792 සිට 1798 දක්වා ප්‍රංශයේ සෑම පාලන ප්‍රදේශයක්ම, සෑම කොමියුනයක්ම (Gemeinde) ඇමෙරිකානු ආදර්ශය අනුකූල සම්පූර්ණ ස්වයං පාලනයක් භුක්ති වින්දේය. අපටද තිබිය යුත්තේ එයයි. ස්වයංපාලනය සංවිධාන කරන්නේ කෙසේද යන්න සහ නිලධාරි පෙළැත්තියක් නොමැතිව අපගේ කටයුතු කරගන්නේ කෙසේද යන්න කියන ආදර්ශයක් අපට ඇමෙරිකාවෙන් සහ ප්‍රථම ප්‍රංශ සමූහාණ්ඩුවෙන් ලැබී තිබේ. ඕස්ට්‍රේලියාව, කැනඩාව සහ වෙනත් ඉංග්‍රිසි යටත් විජිත අද වුවද එය අපට පෙන්වා දෙයි. නිදසුනක් ලෙසට ස්විට්සර්ලන්තයේ බුන්ඩ (සමස්තයක් වශයෙන් ඒකාබද්ධ රාජ්‍යය) සංවිධානයෙන් බොහෝ නිදහස්වන හා අනිත් අතට දිස්ත්‍රික්කයෙන් (Bezirk) සහ කොමියුනයෙන්ද නිදහස්වන කැන්ටන සහිත එරටේ පෙඩරල් ක්‍රමයට වඩා ඉහත සඳහන් වර්ගයේ පළාත්බද (ප්‍රාදේශීය) ස්වයං පාලනය බොහෝ නිදහස්ය. ස්විට්සර්ලන්තයේ කැන්ටන් ආණ්ඩු දිස්ත්‍රික් ආණ්ඩුකාරවරු සහ නායකවරු පත් කරති. ඉංග්‍රිසි කතා කරන රටවල එවැනි පත් කිරීම් නොකෙරෙන අතර, ප්‍රුසියාවේ ලාන්ඩ්රාට සහ රෙගියෙරුංස්රාට" (කොමසාරිස්, දිස්ත්‍රික්ක පොලිස් ප්‍රධානීන්, ආණ්ඩුකාරවරු, සාමාන්‍යයෙන් ඉහළින් පත්කළ සියළු නිලධාරීන්) "තනතුරු මෙන්ම මෙහි එම පත් කිරීම්ද අනාගතයේදී සම්පූර්ණයෙන්ම අහෝසි කිරීමට අපේක්ෂා කරමු."

ඒ අනුව වැඩ පිළිවෙළෙහි අන්තර්ගත ස්වයංපාලන වගන්තිය වෙනුවට, එංගල්ස් පහත සඳහන් වගන්තිය යෝජනා කරයි:

> "සර්වජන ඡන්දයෙන් තෝරා පත් කළ නිලධාරීන් මාර්ගයෙන් පළාත් (ගුබර්නියා හෝ ප්‍රදේශ) වලට, දිස්ත්‍රික්කවලට සහ කොමියුනවලට සම්පූර්ණ ස්වයං-පාලනය රාජ්‍යයේ පත් කෙරෙන ප්‍රාදේශීය සහ පළාත්බද අධිකාරි බලැති තනතුරු සියල්ල අහෝසි කිරීම."

මෙම කරුණෙහිදී (කිසිසේත් මෙම කරුණෙහිදී පමණක් නොවේ) ව්‍යාජ විප්ලවවාදී ව්‍යාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ අපගේ ව්‍යාජ-සමාජවාදී නියෝජිතයින් ඉතාමත් විවෘත ලෙස ප්‍රජාතන්ත්‍රවාදයෙන් බැහැර ගිය ආකාරය මීට පෙර පෙන්වා දීමට මට අවස්ථාව ලැබුණි. කෙරෙන්ස්කිගේ සහ අනෙකුත් "සමාජවාදී" ඇමතිවරුන්ගේ ආණ්ඩු විසින් මර්දනය කරන ලද "ප්‍රාවදා" (1917 මැයි 28 දින අංක 68)[29] පත්‍රයෙන් එය පෙන්වා දුනිමි. "සභාගයක්" මගින් තමන් අධිරාජ්‍යවාදී ධනපති පංතියට බැඳුනු අය ස්වාභාවික වශයෙන්ම මෙම විවේචනයට බිහිරි වූහ.

පෙඩරල් සමූහාණ්ඩුවක් තුළ මධ්‍යගත සමූහාණ්ඩුවකට වඩා නිදහසක් ඇතැයි අවශ්‍යයෙන්ම අදහස්වන්නේය යන දුර්මතය, විශේෂයෙන්ම සුළු ධනපති ප්‍රජාතන්ත්‍රවාදීන් අතර පුළුල් ලෙස පැතිරී ඇත. සත්‍ය කරුණුවලින් සන්නද්ධ වූ එංගල්ස් ඉතාමත් නිවැරදි නිදර්ශන දක්වමින් එම මතය බිඳ හෙළූ බව සටහන් කරගැනීම ඉතා වැදගත් වේ. එය වැරදි මතයකි. 1892-1898 කාලයේ මධ්‍යගත ප්‍රංශ සමූහාණ්ඩුව සහ පෙඩරල් ස්විට්සර්ලන්ත සමූහාණ්ඩුව ගැන එංගල්ස් ගෙනහැර දැක්වූ කරුණුවලින් එය බිඳ වැටෙන්නේය. සැබැවින්ම ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගත සමූහාණ්ඩුව පෙඩරල් සමූහාණ්ඩුවට වඩා වැඩි නිදහසක් දුන්නේය. වෙනත් වචන වලින් කියතොත්, ඉතිහාසය දත් වැඩිම පළාත් පාලන, ප්‍රදේශපාලන සහ වෙනත් නිදහස දුන්නේ පෙඩරල් සමූහාණ්ඩුවක් නොව, මධ්‍යගත සමූහාණ්ඩුවකි.

මෙම කරුණ ගැන අපගේ පක්ෂයේ ප්‍රචාරක සහ උද්ඝෝෂණ කටයුතුවලදී දැක්වූ අවධානය ප්‍රමාණවත් නොවේ. ඇත්තෙන්ම, පෙඩරල් හා මධ්‍යගත සමූහාණ්ඩුවක්, ප්‍රාදේශීය ස්වයං-පාලනයක් පිළිබඳ ප්‍රශ්නය ගැන ද එසේම ය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

5. මාක්ස්ගේ "ප්‍රංශයේ සිවිල් යුද්ධය" නැමති කෘතියට 1891 දී ලියන ලද පෙර වදන

"ප්‍රංශයේ සිවිල් යුද්ධය" නැමති පොතෙහි තුන්වැනි සංස්කරණයට පෙරවදනක් ලියන එංගල්ස් (මෙම පෙර වදනෙහි දිනය 1891 මාර්තු 18 යනුවෙන් යොද ඇති අතර, මුලින්ම, එය "Neue Zeit" හි පළවිය), රාජ්‍යය කෙරෙහි දක්වන ආකල්පය ගැන වූ ප්‍රශ්න සම්බන්ධයෙන් වැදගත් ආනුෂංගික අදහස් කීපයක්ද, ඊට අමතරව කොමියුනයෙන් ලැබෙන පාඩම් ගැන විරල විස්තරයක් දෙන සාරාංශයක්ද ඉදිරිපත් කළේය[30]. කොමියුනයෙන් පසු කතුවරයා ලැබූ විසි අවුරුද්දක අත්දැකීම් හේතුකොට ගෙන වඩාත් අරුත්සරු වූ සහ ජර්මනියේ විශාල ලෙස පැතිරී ගිය "රාජ්‍යය පිළිබඳ මිථ්‍යා විශ්වාසය" ට එරෙහිව ඒකාන්ත වශයෙන් ඉලක්ක කෙරුණු මෙම සාරාංශය, දැනට සැලකිල්ලට බඳුන් වී ඇති ප්‍රශ්නය සම්බන්ධයෙන් මාක්ස්වාදයේ අවසාන කතාව ලෙස යුක්ති යුක්ත ලෙස විස්තර කළ හැකිය.

ප්‍රංශයේ සෑම විප්ලවයකින්ම කම්කරුවන් ඉදිරියට ආවේ ආයුධ දරමිනියි එංගල්ස් කීවේය. "එනිසා රාජ්‍යයේ උච්චස්ථානයෙහි සිටි ධනපති පංතියේ ප්‍රථම ආඥාව වූයේ කම්කරුවන් නිරායුධ කිරීමය. කම්කරුවන් දිනාගත් හැම විප්ලවයකින්ම පසුව, කම්කරුවන්ගේ පරාජයෙන් කෙළවරවන නව අරගලයක් ඇති වූයේ එහෙයිනි."

ධනපති විප්ලවවල අත්දැකීම් කැටිකර දක්වන මෙම සාරාංශය, අර්ථවත් තරමටම සංක්ෂිප්තය. වෙනත් කරුණුද අතර, රාජ්‍යය පිළිබඳ ප්‍රශ්නයේ හරය (පීඩිත පංතියට ආයුධ තිබේද?) මෙහිදී විශිෂ්ට ලෙස ග්‍රහණය කරගෙන තිබේ. ධනපති දෘෂ්ටියේ බල පෑමට හසුවූ මහාචාර්යවරුන් සහ සුළු ධනපති ප්‍රජාතන්ත්‍රවාදීන් යන දෙකොටසම බොහෝ විට මග හැරියේද මෙම සාරවත් කරුණමය. 1917 රුසියානු විප්ලවයේදී, ධනපති විප්ලවවල මෙම රහස දෙඩීමේ ගෞරවය (කවෙනයාක් අර්ථයෙන් ගෞරවය) අත්වූයේ මාක්ස්වාදියෙකු සේ සැරසුනු මෙන්ෂෙවික් වර ට්සෙරතේලිටය. පෙට්‍රොග්‍රෑඩ් කම්කරුවන් නිරායුධ කිරීමට ධනපතියන් අධිෂ්ඨාන කරගෙන සිටින බව ට්සෙරතේලි ඔහුගේ ජූනි 11 දින "ඓතිහාසික" කතාවෙන් කියා පෑවේ, එය තමන්ගේම තීරණයක් හා රාජ්‍යයේ සාමාන්‍ය අවශ්‍යතාවයක් ලෙසට ය![31]

ට්සෙරතේලි ජූනි 11 දින කළ ඓතිහාසික කතාව කෙබඳුද යත්,

ඔහුගේ නායකත්වයෙන් යුක්තවූ සමාජවාදී-විප්ලවවාදී සහ මෙන්ෂෙවික් කණ්ඩායම, නිර්ධන පංතියට විරුද්ධ වෙමින් ධනපති පංතිය පැත්තට පැනගියේ කෙසේද යන්න ඉතා හොඳින් පෙන්වන නිදර්ශනයක් ලෙසට එය 1917 විප්ලවය ගැන විමසන සෑම ඉතිහාසඥයෙකුටම ප්‍රයෝජනවත් වනු ඇත.

එංගල්ස්ගේ තවත් ආනුෂංගික කියමනක්ද රාජ්‍යය පිළිබඳ ප්‍රශ්නය හා සම්බන්ධ වන අතර, එයින් ආගම ගැන සඳහන් වේ. ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් වඩ වඩාත් පිරිහීමට පත් වෙමින්, වඩ වඩාත් අවස්ථාවාදී වීමේ හේතුවෙන් ඔවුන් "ආගම පෞද්ගලික දෙයක් බව ප්‍රකාශයට පත්කළ යුතුය" යන චිර ප්‍රසිද්ධ යෙදුම ගැන වැඩි වැඩියෙන් වැරදි ලෙස අර්ථ නිරූපනය කිරීමට වැටුනු බව කවුරුත් දනිති. විප්ලවවාදී නිර්ධන පංතියේ පක්ෂයට වුවද ආගම පෞද්ගලික දෙයකැයි අදහස් වන සේ ඔවුහු මෙම යෙදුම විකෘති කළහ!!! එංගල්ස් දැඩි ලෙස විරෝධය ප්‍රකාශ කළේ මේ ලෙසට විප්ලවවාදී වැඩ පිළිවෙළ පාවාදීම ගැන ය. 1891 දී ඔහුට පක්ෂය තුළ දකින්නට ලැබුණේ අවස්ථාවාදයේ ඉතා දුර්වල ආරම්භක අවස්ථා පමණකි. එනිසා ඉතාමත් ප්‍රවේසම් සහිත ලෙස ඔහුගේ අදහස් ප්‍රකාශ කළේය:

"කොමියුනයේ සාමාජිකත්වය තනිකරම පාහේ කම්කරුවන්ට හෝ පිළිගත් කම්කරු නියෝජිතයන්ට සීමාවී තිබුණු නිසා, එහි තීරණ නිශ්චය වශයෙන්ම නිර්ධන පංතික ස්වභාවයක් දැරුවේය. ඔවුන් විධාන කළේ, එක්කෝ සමූහාණ්ඩු ධනපතියන් බියසුලුව සම්මත කිරීමෙන් වැලකුණු, එහෙත්, රාජ්‍යය හා සම්බන්ධයෙන් වූ කල ආගම හුදෙක්ම පෞද්ගලික දෙයක්ය යන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම වැනි කම්කරු පංතියේ නිදහස් ක්‍රියාකාරිත්වයට අවශ්‍ය පදනමක් සැපයූ ප්‍රතිසංස්කරණය; නැතහොත් කොමියුනය පැනවූයේ එක එල්ලේම කම්කරු පංතියේ යහපතට හේතුවූ සහ අර්ධ වශයෙන් පැරණි සමාජ ක්‍රමය ගැඹුරට බිඳ දමන ආඥාවන්ය."

එංගල්ස් "රාජ්‍යය හා සම්බන්ධයෙන් වූ කල" යන වචන උච්චමනාවෙන්ම අවධාරණය කළේය. ඔහු එසේ කළේ, පක්ෂය සම්බන්ධයෙන් වූ කල ආගම පෞද්ගලික දෙයක් විය යුතුයයි ප්‍රකාශ කර තිබුණු, එසේම, එනයින් පක්ෂය ඉතාමත් පහත්"නිදහස් චින්තක"අශිෂ්ටවාදයේ තත්ත්වයට, එනම්, ආගමකට අයත් නැති තත්ත්වයට ඉඩ දෙන නමුත්, ජනතාව මොට කරන, ආගම නැමති අබිංවලට විරුද්ධ පක්ෂ අරගලය අත්හැර

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

දමන අශිෂ්ටවාදයේ තත්ත්වයට පිරිහී ගිය ජර්මන් අවස්ථාවාදයට එක එල්ලේ පහරක් ඇනීම වශයෙනි.

ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ට 1914 දී අත්වූ නින්දිත බංකොලොත්භාවය ගැන සුලමුල සොයන ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ අනාගත ඉතිහාසඥයාට, පක්ෂයේ දෘෂ්ටිමය නායකයාගේ ලිපිවල එන ප්‍රශ්නය මග හරින සහ අවස්ථාවාදයට පුළුල් ලෙස දොර විවෘත කර දෙන ප්‍රකාශයන්ගෙන් පටන්ගෙන, 1913 "Los-von-Kirche-Bewegung" (පල්ලිය අත්හැර යාමේ ව්‍යාපාරය)[32] කෙරෙහි පක්ෂය දැක්වූ ආකල්පයෙන් අවසන්වන, මෙම විෂයට අදල වැදගත් කරුණු සෑහෙන ප්‍රමාණයක් සොයා ගත හැකි වනු ඇත.

එහෙත් කොමියුනයෙන් විසි අවුරුද්දකට පසුව, එංගල්ස් සටන්කාමී නිර්ධන පංතිය සඳහා එහි පාඩම් සම්පිණ්ඩණය කළේ කෙසේදැයි බලමු.

එංගල්ස් මූලික වශයෙන් වැදගත් සේ සැලකූ පාඩම් මෙසේය:

> " ... බිඳ වැටෙන්නට තිබුණේ 1798 දී නැපෝලියන් විසින් නිර්මාණය කරන ලද හා එවක් පටන් සෑම අළුත් ආණ්ඩුවක්ම හොඳ ආයුධයක් ලෙසට පිළිගත් හා එහි ප්‍රතිපාක්ෂිකයන්ට විරුද්ධව පාවිච්චි කළ, කලින් පැවති මධ්‍යගත ආණ්ඩුවේ පීඩක බලය වූ යුද්ධ හමුදාව, දේශපාලන පොලීසිය හා නිලධාරි පෙළැන්තියමය. පැරීසියේදී බිඳ වැටුණු මෙන්ම, සෑම තැනෙකම බිඳ වැටෙන්නට ඉඳුරාම තිබුණේද එයමය.
>
> "කම්කරු පංතිය බලයට පත්වූ පසු, එහි වැඩ කටයුතු පැරණි රාජ්‍ය යන්ත්‍රයෙන් කරගෙන යා නො හැකි බව කොමියුනයට එහි ආරම්භයේ පටන්ම පිළිගැනීමට සිදුවිය. එසේම, තමන් දැන් දැන් දිනාගත් ආධිපත්‍යය නැති නොවනු පිණිස කම්කරු පංතිය, එක් අතකින්, කලින් තමන්ට විරුද්ධව යොදන ලද පැරණි පීඩක යන්ත්‍රය විනාශ කළ යුතු බවත්, අනිත් අතින්, තමන්ගේ නියෝජිතවරුන් සහ නිලධාරීන් සියළු දෙනාම, කිසිම විශේෂයක් නොමැතිව, ඕනෑම අවස්ථාවක ඉවත් කළ හැකි බව ප්‍රකාශ කිරීමෙන් තමන් ඔවුන්ගෙන් ආරක්ෂාවීම අවශ්‍ය බවත්,එයට පිළිගැනීමට සිදුවිය..."

රාජාණ්ඩුව යටතේ පමණක් නොව, ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවක් යටතේද රාජ්‍යය රාජ්‍යයක්ම වන බව, එනම්,"සමාජයේ සේවකයන්" හා එහි අවයව වන නිලධාරීන් සමාජයේ ස්වාමිවරුන් බවට පත්වීමේ එහි මූලික හැඳුනුම් ලක්ෂණය රැකෙන බව, එංගල්ස් නැවතත් අවධාරණය කරයි:

> "අතීත රාජ්‍යයන් සියල්ලෙහිම දක්නා ලද පරිවර්තනයක් වූ, රාජ්‍යය සහ රාජ්‍ය අවයව සමාජයේ සේවක තත්ත්වයේ සිට සමාජයේ ස්වාමි තත්ත්වයට මෙසේ පරිවර්තනය වීමට එරෙහිව කොමියුනය නොවරදින මාධ්‍යයන් දෙකක් උපයෝගි කර ගත්තේය. ප්‍රථමයෙන්ම, එය පරිපාලන, අධිකරණ සහ අධ්‍යාපන ආදී, සියළුම තනතුරු, අදළ සියළු දෙනාගේම සර්වජන ඡන්දයෙන් කළ තෝරා පත් කිරීම් මගින් පිරවූ අතර, එම පත් කිරීම් ඡන්දදායකයන් විසින් ඕනෑම අවස්ථාවක අස්කරනු ලැබීමට යටත් කළේය. දෙවැනිව, උසස් හෝ පහත් යන නිලධාරීන් සියළු දෙනාටම එය අනිකුත් කම්කරුවන්ට ලැබෙන වැටුප් ගෙව්වේය. කොමියුනය ඕනෑම කෙනෙකුට ගෙවූ ඉහළම වැටුප ප්‍රෑන්ක් 6000 ක් විය.* ඉහළ තැන් අල්ලා ගැනීම සහ තනතුරු ආත්මාර්ථ සිද්ධිය සඳහා යොදා ගැනීම වැලැක්වීමට මේ ආකාරයෙන් විශ්වාසදායක බාධකයක් ඉදි කරන ලදී. මෙසේ කරන ලද්දේ නියෝජිත මණ්ඩලවලට පත් කෙරෙන නියෝජිතයන්ට අනුගම්‍ය බලය පැවරීමට අමතරවය..."

එංගල්ස් මෙහිදී ළඟාවූයේ සසංගත ප්‍රජාතන්ත්‍රවාදය, එක් අතකින් සමාජවාදයට පරිවර්තනය වන සහ අනිත් අතින්, සමාජවාදය ඉල්ලා බලකරන වැදගත් සීමා රේඛාව වෙතය. එසේ කියන්නේ, රාජ්‍යය අහෝසි කිරීම සඳහා මහජන සේවයේ කාර්යයන් ජනගහනයෙන් අති බහුතරයෙහි සහ අනතුරුව සෑම පුද්ගලයෙකුගේම විෂය ප්‍රමාණයට හා හැකියාවට ගැලපෙන පරිදි, සරල පාලන සහ ගිණුම් තැබීමේ කටයුතු බවට හැරවීම අවශ්‍ය වන හෙයිනි. එසේම තනතුරු ආත්මාර්ථ සිද්ධිය සඳහා යොදා ගැනීම සම්පූර්ණයෙන්ම අහෝසි කිරීමට නම්, නිදහස්තම ධනපති රටවල නිතර සිදුවන පරිද්දෙන් බැංකුවල සහ බද්ධ ව්‍යාපාරවස්තු සමාගම්වල විශාල ආදායම් සහිත තනතුරු ලබාගැනීම පිණිස, ලාභදායක නොවන නමුත්, "ගෞරවනීය" වන තනතුරු උපයෝගි කර ගැනීමට ඉඩ නොදී, එම හැකියාව සම්පූර්ණයෙන්ම නැතිකර දැමිය යුතුය.

එසේ වුවද, ස්වාධිපත්‍යය සඳහා ජාතීන්ගේ අයිතිය වැනි ප්‍රශ්නයක් ගැන කටයුතු කිරීමේදී, ධනපති ක්‍රමය යටතේ එය නොදිය හැකි වන

---

* සාමාන්‍යයෙන් රූබල් 2400 ක් හෝ වර්තමාන විනිමය ප්‍රමාණය අනුව රූබල් 6000 ක් පමණ නිදසුනක් වශයෙන්, ඉතාමත් ප්‍රමාණවත් මුදලක් වන රූබල් 6000 ක් වෙනුවට,රූබල් 9000 ක් රාජ්‍යය මුළුල්ලේම නාගරික සහා සාමාජිකයින්ට ගෙවිය යුතු යයි යෝජනා කරන බොල්ෂෙවික්වරුන්ගේ ක්‍රියාවට සමාව දිය නොහැකිය.[33]

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සහ සමාජවාදී ක්‍රමය යටතේ එය අනවශ්‍ය වන බව කියමින් තර්ක කරන සමහර මාක්ස්වාදීන් කළ වරදට එංගල්ස් නොවැටුණේය. බැලූ බැල්මට විචක්ෂණ සේ පෙනෙන එහෙත් වැරදි සහගත මෙම ප්‍රකාශය ඕනෑම ප්‍රජාතන්ත්‍රවාදී ආයතනයක් සම්බන්ධයෙන් යෙදිය හැකිය. නිලධාරීන්ට ගෙවන නොවැඩි වැටුප් ගැනද එය කිවහැකිය. එසේ කියන්නේ, ධනපති ක්‍රමය යටතේ සම්පූර්ණයෙන් සසංගත ප්‍රජාතන්ත්‍රවාදය තිබිය නොහැකි නිසා සහ සමාජවාදය යටතේ සියළු ප්‍රජාතන්ත්‍රවාදය හැකිළී යනු ඇති නිසා ය.

මෙය නම්, තවත් එක කෙස් ගසක් ගැලවී ගිය විට මිනිහා තට්ටයෙක් වීම ගැන කරන පැරණි විහිළුවට සමාන විතණ්ඩවාදී ප්‍රකාශයකි.

ප්‍රජාතන්ත්‍රවාදය උපරිම ලෙස සංවර්ධනය කිරීම, මෙම සංවර්ධනයේ ආකෘති සොයා ගැනීම, ඒවා ව්‍යවහාරය මගින් පරීක්ෂාවට භාජනය කිරීම, යන මේ සියල්ලම සමාජ විප්ලවය සඳහා අරගලයෙහි අංගෝපාංගයන් වන කර්තව්‍යයන් අතුරෙන් එකකි. වෙනම ගත් කළ, මොනම වර්ගයක වුව ප්‍රජාතන්ත්‍රයකින් සමාජවාදය නොසැලසෙන්නේය. නමුත් යථාර්ථ ජීවිතයේදී ප්‍රජාතන්ත්‍රවාදය කිසිකලෙකත් ''වෙනම ගනු'' නොලැබේ. එය වෙනත් දේවල් සමග එකට ගනු ලැබේ. එයද එහි බලපෑම ආර්ථික ජීවිතය කෙරෙහි විහිදුවනු ඇත; එය එම ජීවිතයේ පරිවර්තනය දිරි ගන්වනු ඇත. අනිත් අතට ප්‍රජාතන්ත්‍රවාදයද ආර්ථික සංවර්ධනයේ බලපෑමට හසුවන්නේය. ඒ ආදී වශයෙනි. ජීවමාන ඉතිහාසයේ දයලෙක්තිකය එයයි.

එංගල්ස් තවදුරටත් මෙසේ ලීවේය:

> '' ... ඉහතින් පැවති රාජ්‍ය බලය මෙසේ සුනු විසුනු වීම (Sprengung) සහ ඒ වෙනුවට නව සහ සැබැවින්ම ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය බලයක් ආදේශ වීම ගැන ''සිවිල් යුද්ධයේ'' තුන්වැනි කොටසෙහි විස්තරාත්මක ලෙස සඳහන් කෙරේ. එහෙත් එහි අංගලක්ෂණ සමහරක් ගැන මෙහිදී නැවත වරක් කෙටියෙන් සඳහන් කිරීම අවශ්‍ය විය. එයට හේතුව, විශේෂයෙන්ම ජර්මනියේ බලපවත්වන රාජ්‍ය කෙරෙහි වූ අද්භූත විශ්වාසය දර්ශනවාදයේ සිට සාමාන්‍යයෙන් ධනපති පංතියේ සහ බොහෝ කම්රුවන්ගේ පවා විඥනයට එකතු වන තත්ත්වයට පත්ව තිබීම ය. එම දර්ශනික සංකල්පය අනුව රාජ්‍යය යනු 'දේව අදහස ක්‍රියාත්මක වීමය', නැතහොත් 'මිහිපිට තිබෙන දෙවියන්ගේ රජදහනය'; දර්ශනවාදී වචනවලින් කියතොත්, සදකාලික සත්‍යය සහ යුක්තිය ලැබෙන්නේ හා ලබාගත යුත්තේ එම ක්ෂේත්‍රය- තුළය. මේ අනුව රාජ්‍යය සහ

> ඊට සම්බන්ධ සියල්ලම කෙරෙන දක්වන මිථ්‍යාමතික පූජනීයත්වයේ ආල්පයක් ඇති වේ. මුළු සමාජයටම පොදු වන කටයුතු රැක බලා ගැනීම අතීතයේ එසේ කළ අයම, නැතහොත්, රාජ්‍යය ම හා ලොකු ආදයම් සහිත තනතුරු දරන නිලධාරීන්ම මිස, වෙනත් කිසිවෙක් විසින් නොවිය යුතු යයි සිතීමට ජනතාව ළමා කාලයේ පටන්ම පුරුදුව සිටින හෙයින්, එම ආකල්පය ඉක්මණින්ම මුල් බැස ගනියි. එනිසා, පරම්පරානුගත රාජාණ්ඩුව ඉවත ලා ජනතාව ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවට පක්ෂව දිවුරුම් දෙනවිට තමන් ගෙන ඇත්තේ ඉතාමත් අසාමාන්‍ය නිර්භීත ඉදිරි පියවරකැයි ඔවුහු සිතති. එසේ වුවද, රාජ්‍යය යනු එක පංතියක් මර්දනය කිරීම සඳහා තවත් පංතියක් උපයෝගි කරගන්නා යන්ත්‍රයක් මිස අන් කිසිවක් නොවේ. ඇත්තෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවෙහිද එම තත්ත්වය රාජාණ්ඩුවට වඩා නොඅඩුව බලපවත්වන්නේ ය. එය හොඳම අර්ථයෙන් ගත්තද, එය පංති ආධිපත්‍යය සඳහා වූ නිර්ධන පංති අරගලයේ ජයග්‍රහණයෙන් පසුව නිර්ධන පංතියට උරුම වන නපුරකි. නව, නිදහස් සමාජ තත්ත්වයන් යටතේ හැදුනු වැඩුනු පරපුරකට, දිරාපත් මුළු රාජ්‍යයම ඉවත ලීමට හැකි වන තෙක්, කොමියුනය කළ ලෙසට, එම යන්ත්‍රයේ නරකම අංග හැකි තරම් ඉක්මණින් කපා දැමීමට ජයග්‍රාහී නිර්ධන පංතියට සිදුවනු ඇත.''

රාජාණ්ඩුව වෙනුවට සමූහාණ්ඩුවක් ආදේශ කිරීමේදී පොදු වශයෙන් රාජ්‍යයට අදළ වූ සමාජවාදයේ ප්‍රතිපත්ති අමතක නොකරන ලෙස එංගල්ස් ජර්මනුන්ට අවවාද කළේය ඔහුගේ එම අවවාදයන් කියවන විට ඒවා ට්සෙරතේලිලාට සහ චෙර්නොව්ලාට දෙන ලද පාඩමක් සේ පෙනේ. ඔවුහු ඔවුන්ගේ ''සභාග'' ව්‍යවහාරයේදී රාජ්‍ය කෙරෙහි අද්භූත විශ්වාසයක් හා එයට අද්භූත පූජනීයත්වයක් ද දැක්වූහ!

තවත් කරුණු දෙකක් කිව යුතුය: 1) ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවක රාජ්‍යය, රාජාණ්ඩුවක රාජ්‍යයට වඩා ''නොඅඩුව'' ''එක පංතියක් මර්දනය කිරීම සඳහා තවත් පංතියක් විසින් උපයෝගී කරගනු ලබන යන්ත්‍රයක්'' වන්නේය යන එංගල්ස්ගේ කියමන, පීඩන ආකෘතිය කුමක් වුවත් නිර්ධන පංතියට වෙනසක් නැතැයි යන අදහස දෙන්නක් යයි සමහර අරාජිකවාදීන් ''උගන්වන නමුත්, එම කියමනෙහි එවැනි අදහසක් ඇත්තේම නැත. පංති අරගලයේ සහ පංති පීඩනයේ වඩාත් පුළුල්, වඩාත් නිදහස් සහ වඩාත් විවෘත ආකෘතියක්, පොදු වශයෙන් පංති අහෝසි කිරීම සඳහා නිර්ධන පංතිය ගෙන යන අරගලයේදී එයට බෙහෙවින් ආධාරකාරී වන්නේය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

2) දිරාපත් රාජ්‍යය ඉවත දැමීම නව පරපුරකට පමණක් කළ හැක්කක් වන්නේ මන්ද? මෙම ප්‍රශ්නය ප්‍රජාතන්ත්‍රවාදය ජය ගැනීම හා සම්බන්ධ එකකි. දැන් ඒ ගැන විමසා බලමු.

6. ප්‍රජාතන්ත්‍රවාදය ජය ගැනීම ගැන එංගල්ස්ගේ අදහස්

එංගල්ස් මෙම විෂය ගැන ඔහුගේ අදහස් ප්‍රකාශ කළේ "සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියා" යන යෙදුම විද්‍යාත්මක වශයෙන් වැරදි බව ඔහු විසින් සනාථ කරන ලද අවස්ථාවේදීය.

එංගල්ස් හැත්තෑ ගණන්වලදී, බොහෝ කොටම, "ජාත්‍යන්තර" ප්‍රශ්න ("Internationales aus dem "Volkstaat" ")* සම්බන්ධයෙන් ලියූ ලිපි සංස්කරණයක් පළ කිරීම සඳහා ඔහු 1894 ජනවාරි 3 දතමින්, එනම්, ඔහුගේ අභාවයට වසර එක හමාරකට පෙර ප්‍රස්ථාවනාවක් ලීවේය. තමාගේ එම ලිපි සියල්ලෙහිම "සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියා" යන වචනය නොයොදා "කොමියුනිස්ට්" යන වචනය යෙදූ බවත්, ඊට හේතු වූයේ එවකට ප්‍රංශයේ ප්‍රැදොන්වාදීන් සහ ජර්මනියේ ලසාල්වාදීන්[34] තමන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් වශයෙන් හඳුන්වා ගැනීම බවත් එංගල්ස් එහි සඳහන් කළේය.

> "එනිසා, මාක්ස්ට සහ මට අපගේ විශේෂ අදහස විස්තර කිරීම සඳහා, එවැනි අනියත වචනයක් යෙදීම කිසිසේත් කළ නොහැකි විය" යි එංගල්ස් තවදුරටත් ලීවේය. අද තත්ත්වය වෙනස්ය. එනිසා, ස්වකීය ආර්ථික වැඩපිළිවෙළ හුදෙක් සාමාන්‍ය සමාජවාදය නොව, ඒකාන්ත කොමියුනිස්ට් ක්‍රමය කොටගත් සහ ස්වකීය අවසාන දේශපාලන අරමුණ මුළු රාජ්‍යයම සහ ඒ අනුව, ප්‍රජාතන්ත්‍රවාදයද ජයගැනීම කොටගත්, පක්ෂයක් හැඳින්වීමට මෙම වචනය ("සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියා") තවමත් හරියටම හරි නොවුවත් (unpassend) අද සමහර විට එය පෙරෙට්ටුවෙන් සමත් වන්නට (mag passieren) ඉඩ තිබේ. කෙසේ වුවද නියම (එංගල්ස්ගේ අවධාරණය) දේශපාලන පක්ෂවල නාමයන් කිසි කලෙකත් හරියටම ගැලපෙන්නේ නොවේ. පක්ෂය සංවර්ධනය වන අතර නම නැවතී සිටින්නේය."[35]

නියම දයලෙක්තිකවාදියෙකු වූ එංගල්ස් ඔහුගේ අවසාන කාලය දක්වාම දයලෙක්තික ක්‍රමය රැක්කේය. "පක්ෂයට සුදුසු අගේ ඇති සහ

* "ජනතා රාජ්‍යයෙන්" ජාත්‍යන්තර මාතෘකා ගැන. — සංස්කාරක

විද්‍යාත්මක නමක් මාක්ස් හා මා දැන සිටි නමුත්, නියම පක්ෂයක්, එනම් නිර්ධන පංති පක්ෂයක් නොවිය" යි ඔහු කීවේය. දැන් (දහනව වැනි ශතවර්ෂය අවසානයේ) නියම පක්ෂයක් තිබෙන නමුත් නම විද්‍යානුකූල ලෙස වැරදිය. නමුත් කම් නැත. පක්ෂය සංවර්ධනය වන තාක් කල්, විද්‍යානුකූල වශයෙන් එහි නමෙහි ඇති වරද එයින් සඟවා නොතබන සහ එය පක්ෂය නිවැරදි මඟ ඔස්සේ සංවර්ධනය වීමට බාධාවක් නොවන තාක් කල්, එය "පෙරෙට්ටුවෙන් සමත් වනු" ඇත.

සමහර විට එංගල්ස් මෙන් ස්ථානෝචිත ප්‍රඥාව මෙහෙයවා ගැනීමෙන් බොල්ෂෙවික්වරුන් වන අපටද සැනසෙන්නට පුළුවන. අපට නියම පක්ෂයක් ඇත. එය විශිෂ්ට ලෙස සංවර්ධනය වෙමින් පවතී. "බොල්ෂෙවික්" යන නමින් ප්‍රකාශ වන්නේ 1903 බ්‍රසල්ස්-ලන්ඩන් සම්මේලනයේදී අප අහඹුවෙන් බහුතරය වී සිටි බව[36] පමණක් මිස අන් කිසිවක් නොවන නමුත්, එවැනි අර්ථයක් නැති නමක් වුවද පෙරෙට්ටුවෙන් සමත් වනු අත. දැන් ජූලි හා අගෝස්තු මාසවලදී සමූහාණ්ඩුවාදීන් සහ "විප්ලවවාදී" සුළු ධනපති පංති ප්‍රජාතන්ත්‍රවාදීන් විසින් අපගේ පක්ෂයට තාඩන පීඩන කරන ලද නිසා, "බොල්ෂෙවික්" යන නාමය සෑම දෙනාගේම ගෞරවයට පාත්‍ර වී තිබෙන හෙයින්ද, ඊට අමතරව, මෙම තාඩන පීඩන වලින් සලකුණු වන්නේ අප පක්ෂය දැවැන්ත ඓතිහාසික ප්‍රගතියක් ලබා ඇති බව වන හෙයින්ද, අප පක්ෂයේ නම වෙනස් කරන ලෙස අප්‍රේල් මාසයේදී මා කළ යෝජනාව ගැන බලකර සිටීමට මා දැන් සමහර විට පැකිලෙන බැවින්, මාගේ සහෝදරවරුන් හමුවේ සම්මුති ස්වභාවයේ යෝජනාවක් තැබීමට, එනම්,අපගේ නම කොමියුනිස්ට් පක්ෂය යනුවෙන් අනුමත කරන අතර බොල්ෂෙවික් යන්න වරහන් තුළ තබා ගන්නා ලෙස යෝජනා කිරීමට කැමැත්තෙමි.

එහෙත්, පක්ෂයේ නම පිළිබඳ ප්‍රශ්නය, විප්ලවවාදී නිර්ධන පංතිය රාජ්‍යය කෙරෙහි දක්වන ආකල්පය පිළිබඳ ප්‍රශ්නයට වඩා අතිශයෙන් අඩු වැදගත්කමක් දරයි.

රාජ්‍යය ගැන සුපුරුදු ලෙස තර්ක කිරීමේදී නිතරම කෙරෙන වරද ගැන එංගල්ස් අනතුරු හැඟවීය. එම වරද ගැන, එනම්, රාජ්‍යය අහෝසි කිරීම යනු ප්‍රජාතන්ත්‍රවාදයත් අහෝසි කිරීමද, රාජ්‍යය හැකිළී යාම යනු ප්‍රජාතන්ත්‍රවාදයත් හැකිළී යාමද වන බව අමතක කිරීම ගැන, අපි ඉහත සාමාන්‍ය වශයෙන් සඳහන් කෙළෙමු.

බැලූ බැල්මට මෙසේ කීම ඉතාමත් මවිත කර සහ නොවටහා ගත හැකි සේ පෙනෙන්නට පිළිවන. ප්‍රජාතන්ත්‍රවාදය යනුවෙන් අදහස් කෙරෙන්නේ අල්පතරය බහුතරයට යටත් කිරීමේ ප්‍රතිපත්තිය පිළිගැනීයම වන හෙයින්, මෙසේ කියන විට අප ඇත්ත වශයෙන් අපේක්ෂා කරන්නේ,

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

එම ප්‍රතිපත්තිය නොරකින සමාජ ක්‍රමයක් උදාවීම යයි සැක කිරීමට පවා අයෙක් පෙළඹෙන්නට පිළිවන.

නැත. ප්‍රජාතන්ත්‍රවාදයත්, අල්පතරය බහුතරයට යටත් කිරීමත් යන දෙක එකම නොවේ. ප්‍රජාතන්ත්‍රවාදය යනු අල්පතරය බහුතරයට යටත් කිරීම පිළිගන්නා රාජ්‍යයකි, නැතහොත්, එක පංතියක් තවත් පංතියකට විරුද්ධව, ජනගහනයෙන් එක් කොටසක් එහි තවත් කොටසකට විරුද්ධව ක්‍රමානුකූල ලෙස බලහත්කාරය යෙදීමේ සංවිධානයකි.

අපි රාජ්‍යය අහෝසි කිරීම, අපගේ අවසාන අරමුණ වශයෙන් නියම කරගන්නෙමු. රාජ්‍යය අහෝසි කිරීම. යන්නෙන් අදහස් කරන්නේ, එක පංතියක් තවත් පංතියකට විරුද්ධව, ජනගහනයේ එක් කොටසක් එහි තවත් කොටසකට විරුද්ධව, සියළු ආකාරයේ සංවිධිත සහ ක්‍රමානුකූල හිංසනය නැතහොත් යෙදීම, කුමණ ආකාරයේ හෝ හිංසනය යෙදීම අහෝසි කිරීමය. අල්පතරය බහුතරයට යටත් කිරීමේ ප්‍රතිපත්තිය නොරකින සමාජ ක්‍රමයක් උදාවීම අපි අපේක්ෂා නොකරමු. එසේ වුවද, සමාජවාදය සඳහා වෙර දැරීමේදී, එය කොමියුනිස්ට් ක්‍රමය දක්වා සංවර්ධනය වන බවත්, ඒ අනුව, ජනතාව හිංසනයෙන් තොරව සහ යටත් කිරීමෙන් තොරව, සමාජ ජීවිතයේ සරල කොන්දේසි පිළිගැනීමට පුරුදු වනු ඇති හෙයින්, එක මිනිසෙක් තවත් මිනිසෙකුට සහ ජනගහනයෙන් එක් කොටසක් එහි තවත් කොටසකට යටත් කිරීම සඳහා, පොදු වශයෙන් ජනතාවට විරුද්ධව හිංසනය යෙදීමේ අවශ්‍යතාවය සම්පූර්ණයෙන්ම අතුරුදහන් වන බවත්, අවබෝධ කරගෙන සිටින්නෙමු.

පුරුද්ද පිළිබඳ මූලිකාංගය ගැන අවධාරණය කිරීම සඳහා, එංගල්ස්, ''දිරාපත් මුළු රාජ්‍යයම'', එනම් ප්‍රජාතන්ත්‍රවාදී-සමූහාණ්ඩු රාජ්‍යය ඇතුලත්ව සෑම රාජ්‍යයක්ම ''ඉවත ලීමට හැකි'' ''නව නිදහස් සමාජ තත්වයන් යටතේ හැදුනු වැඩුනු'' නව පරපුරක් ගැන කතා කරයි.

මෙය පැහැදිලි කිරීම සඳහා රාජ්‍යය හැකිළී යාමට අදළ වන ආර්ථික පදනම විග්‍රහ කිරීම අවශ්‍ය වන්නේය.

පස්වැනි පරිච්ඡේදය

රාජ්‍යය හැකිළී යාමට අදළ වන ආර්ථික පදනම

මාක්ස් ඔහුගේ ''ගෝතා වැඩපිළිවෙළ ගැන විවේචනය'' නැමති කෘතියෙහි මෙම ප්‍රශ්නය ගැන ඉතාමත් විස්තර සහිත ලෙස කරුණු පැහැදිලි කරයි. (1875 මැයි 5 දින බ්‍රැක්කේට යැවූ ලිපිය. 1891 තෙක් කළ නොකෙරුණු මෙය, එම වර්ෂයේදී "Neue Zeit" වෙළුම IX 1 හි පළ

කරන ලදී. එය විශේෂ සංස්කරණයක් ලෙසට රුසියන් බසින් පළ කෙරිණ). ලසාල්වාදයේ විවේචනයක් අන්තර්ගත මෙම අගනා කෘතියේ විවාදත්මක කොටසින්, එහි අනුරෝධී කොටස, එනම්, කොමියුනිස්ට් ක්‍රමය සංවර්ධනය වීම සහ රාජ්‍යය හැකිළී යාම අතර ඇති සම්බන්ධය ගැන විග්‍රහය වැසී ගොස් ඇතැයි කිව හැක.

1. මාක්ස් ප්‍රශ්නය ඉදිරිපත් කළ ආකාරය

මාක්ස් 1875 මැයි 5 දින බ්‍රැක්කේට යැවූ ලිපියත්, එංගල්ස් 1875 මාර්තු 28 දින බෙබෙල්ට යැවූ, අප ඉහත විමසා බැලූ ලිපියත්, මතුපිටින් සංසන්දනය කර බැලුවහොත්, මාක්ස් එංගල්ස්ට වඩා ''රාජ්‍ය පාක්ෂිකයෙක්'' වී යයි ද, රාජ්‍යය ගැන ප්‍රශ්නය හා සම්බන්ධයෙන් ලේඛකයන් දෙදෙනා අතර විශාල මත වෙනස්කම් තිබුණේ යයි ද පෙනී යන්නට ඉඩ තිබේ.

රාජ්‍යය ගැන කතාව සම්පූර්ණයෙන්ම අත්හැර දැමිය යුතු බවත්, ''රාජ්‍යය'' යන වචනය වැඩ පිළිවෙළෙන් සම්පූර්ණයෙන්ම ඉවත් කර ඒ වෙනුවට ''ප්‍රජාව'' යන වචනය ආදේශ කළ යුතු බවත් එංගල්ස් බෙබෙල්ට යෝජනා කළේය. කොමියූනය තවදුරටත් වචනයේ නියම අර්ථය අනුව රාජ්‍යයක් නොවන බව පවා එංගල්ස් ප්‍රකාශ කළේය. එහෙත් මාක්ස් ''කොමියුනිස්ට් සමාජයේ අනාගත රාජ්‍යය'' ගැන පවා කතා කළේය. ඒ අනුව කොමියුනිස්ට් ක්‍රමය යටතේ පවා රාජ්‍යයක අවශ්‍යතාවය ඔහු පිළිගත් සැටියක් පෙනේ.

එහෙත් එවැනි අදහසක් මූලික වශයෙන්ම සාවද්‍ය වනු ඇත. රාජ්‍යය සහ එය හැකිළී යාම ගැන මාක්ස්ගේ හා එංගල්ස්ගේ අදහස් එකක්ම වූ බවත්, ඉහත උපුටා දක්වන ලද මාක්ස්ගේ කියමන අදළ වන්නේ හැකිළී යාමේ ක්‍රියාදමයට පසුව පවතින රාජ්‍යයට බවත්, කරුණු වඩාත් සමීප ලෙස පරීක්ෂා කර බැලූකල පෙනේ.

අනාගත ''හැකිළී යාමේ'' මොහොත නිශ්චය කර දැක්වීමේ ප්‍රශ්නයක් මතුවිය නොහැකි බව පැහැදිලිය. එය දීර්ඝ ක්‍රියාදමයක් වනු ඇති නිසා, විශේෂයෙන්ම එය කිව නොහැකිය. මාක්ස්ගේ සහ එංගල්ස්ගේ මත අතර වෙනසක් තිබෙන සැටියක් පෙනෙන්නේ, ඔවුන් එකිනෙකට වෙනස් මාතෘකා ගැන කියමින් සහ වෙනස් අරමුණු වෙත ළඟා වෙමින් සිටි හෙයිනි. එංගල්ස්ගේ ව්‍යායාමය වූයේ රාජ්‍යය පිළිබඳව පැතිර පවත්නා (ලසාල්ද නො අඩුව පිළිගත්) දුර්මතවල අන්ත අර්ථ විරහිත භාවය සිත් කාවදින ලෙස, තියුණු ලෙස සහ පුළුල් ස්වභාවයෙන්

https://liberationbase.wordpress.com

බේබෙල්ට ගෙන හැර දැක්වීමය. මාක්ස් මෙම ප්‍රශ්නය ගැන සඳහන් කළේ අමතර කරුණක් වශයෙන් පමණකි. ඔහුගේ සැලකිල්ල යොමුවී තිබුණේ වෙනත් විෂයයක් කෙරෙහි ය; එනම්, කොමියුනිස්ට් සමාජය සංවර්ධනය වීම කෙරෙහි ය.

මාක්ස්ගේ මුළු න්‍යායයම සමන්විත වන්නේ සංවර්ධනය පිළිබඳ න්‍යායය, එහි ඉතාමත් සසංගත, සම්පූර්ණ, හරවත් සහ යෝග්‍ය ආකාරයෙන්, නවීන ධනපති ක්‍රමය ගැන පරීක්ෂා කිරීම සඳහා යොදා ගැනීමකිනි. ස්වාභාවික වශයෙන්ම, ඉදිරියේ එන ධනපති ක්‍රමයේ බිඳ වැටීම සහ අනාගත කොමියුනිස්ට් ක්‍රමය අනාගතයේ සංවර්ධනය වීම ගැන විමසීමට, මෙම න්‍යායය ගලපා ගැනීමේ ප්‍රශ්නයට මුහුණ දීමට මාක්ස්ට සිදුවිය.

අනාගතයේ සංවර්ධනය වන අනාගත කොමියුනිස්ට් ක්‍රමය ගැන විස්තර කිරීමට, පදනම වශයෙන් ගත හැකි කරුණු මොනවාද?

එහිදී පදනම වශයෙන් ගත හැකි කරුණ නම්, එහි ප්‍රභවය ධනපති ක්‍රමය තුළ සිදුවන බවය; එය ඓතිහාසික වශයෙන් ධනපති ක්‍රමයෙන් සංවර්ධනය වන බවය; එය ධනපති ක්‍රමය විසින් උත්පාද කරන ලද සමාජ බලවේගයක ක්‍රියාකාරීත්වයේ ප්‍රතිඵලය බව ය. දැනගත නොහැකි දේ ගැන මනෝරාජ්‍යයක් ඉදිකිරීමට, නිශ්ඵල අනුමානකිරීම්වල යෙදීමට, මාක්ස් ප්‍රයත්න දැරූ බවට සේයාවක්ද නැත. මාක්ස් කොමියුනිස්ට් ක්‍රමය පිළිබඳ ප්‍රශ්නය පරීක්ෂා කළේ, නව ප්‍රාණී විශේෂයක් ආරම්භවූ ආකාරය සහ එය වෙනස් වෙමින් පවතින්නේ කුමණ දිසාවට ද යන්න දත් ස්වාභාවික විද්‍යාඥයෙක් එම ප්‍රාණී විශේෂයෙහි වර්ධනය ගැන පරීක්ෂා කරන ආකාරයෙනි.

මාක්ස් ආරම්භයේදී කළේ, රාජ්‍යය සහ සමාජය අතර සම්බන්ධය ගැන ප්‍රශ්නය විෂයෙහි ගෝතා වැඩ පිළිවෙළ ඇති කළ වියවුල් සහිත භාවය නැති කර දැමීම ය. ඔහු මෙසේ ලීවේය:

> ''වර්තමාන සමාජය ධනපති සමාජයයි. සියළුම ශිෂ්ටාචාර රටවල පවතින එය අඩු වැඩි ලෙසින් මධ්‍යකාලීන සම්මිශ්‍රනයෙන් නිදහස් වී, අඩු වැඩි පමණින් එක් එක් රටෙහි විශේෂ ඓතිහාසික සිදුවීම් අනුව සකස්වී, අඩු වැඩි පමණින් සංවර්ධනය වී ඇත. අනිත්, අතට, 'වර්තමාන රාජ්‍යය' රටක දේශසීමා සමග වෙනස් වන්නේය. එය ස්විට්සර්ලන්තයෙහි තිබෙනවාට වඩා ප්රුස්සෝ-ජර්මන් අධිරාජ්‍යයෙහි වෙනස්ය; එක්සත් ජනපදයෙහි තිබෙනවාට වඩා එංගලන්තයෙහි වෙනස් ය. එනිසා 'වර්තමාන රාජ්‍යය' වූ කලී මිථ්‍යා ප්‍රබන්ධයකි.

> ''විවිධ ශිෂ්ටාචාර රටවල තිබෙන විවිධ රාජ්‍යයන්, ඒවායේ ආකෘතියෙන් අනේකාකාර නමුත්, මේ දෙය ඒ සියල්ලටම පොදුය. එනම්, ඒ සියල්ලම, ධනපති ස්වභාවයේ සංවර්ධනයෙන් අඩු හෝ වැඩි නමුත්, එකම සමාජය වන නවීන ධනපති සමාජය මත පදනම්ව ඇත. වර්තමාන මුල වන ධනපති සමාජය මැරී ගිය තත්ත්වයට පත්වනු ඇති අනාගතය සමග විසංසන්දනය කරන කල, මෙම අර්ථයෙන් 'වර්තමාන රාජ්‍යය' ගැන කතා කළ හැකිය. ''එවිට මේ ප්‍රශ්නය පැන නගින්නේය. කොමියුනිස්ට් සමාජයෙහිදී රාජ්‍යයේ කුමණ නම් පරිවර්තනයක් සිදුවනු ඇද්ද? වෙනත් වචනවලින් කියතොත්, වර්තමාන රාජ්‍යයේ කාර්යයන්ට සමාන වන කුමණ සමාජ කාර්යයන් එවිට ඉතිරිව පවතිනු ඇද්ද? මෙම ප්‍රශ්නයට පිළිතුරු දිය හැක්කේ විද්‍යානුකූලව පමණකි. එනිසා ජනතාව යන වචනය රාජ්‍යය යන වචනය සමග දහස් ආකාරයකින් ඒකාබද්ධ කළත්, අයෙක් මැහි පිම්මක් තරමකින්වත් ප්‍රශ්නයට සමීප වන්නේ නැත[37].''

''ජනතා රාජ්‍යයක්'' ගැන කතා එසේ සමච්චලයට ලක් කිරීමෙන් අනතුරුව, ප්‍රශ්නය නියම ලෙස ඉදිරිපත් කළ මාක්ස්, අවවාදයක් දෙන නියායෙන් කීවේ, එයට විද්‍යානුකූල පිළිතුරක් සොයන අප තදින් තහවුරු වූ විද්‍යාත්මක දත්තයන් පමණක් උපයෝගී කරගත යුතු බවය.

සංවර්ධනයේ මුළු මහත් න්‍යායයම විසින්, සමස්ත විද්‍යාවම විසින්, ඉතාමත් නිවැරදි ලෙස තහවුරු කර තිබෙන ප්‍රථම කරුණ නම්, ධනපති ක්‍රමයේ සිට කොමියුනිස්ට් ක්‍රමයට පරිවර්තනය වීමේ ඓතිහාසික අවධියක් හෝ කාල පරිච්ඡේදයක් නිසැකවම තිබිය යුතු බවය. මනෝරාජිකවාදීන් සහ සමාජවාදී විප්ලවයට බිය වන වර්තමාන අවස්ථාවාදීන් එම කරුණ අමතක කර ඇත.

2. ධනපති ක්‍රමයේ සිට කොමියුනිස්ට් ක්‍රමයට පරිවර්තනය වීම

මාක්ස් තව දුරටත් මෙසේ ලීවේය:

> ''ධනපති සහ කොමියුනිස්ට් සමාජ අතර එකක් අනිකට විප්ලවීය ලෙස පරිවර්තනය වීමේ කාල සීමාව ඇත. මීට අනුරූප වන දේශපාලන පරිවර්තනයේ කාල සීමාවක්ද ඇත. එය අන් කිසිවක් නොව නිර්ධන පංතියේ විප්ලවකාරී ආඥාදායකත්වය විය යුතුය.''

https://liberationbase.wordpress.com

නවීන ධනපති සමාජය තුළ නිර්ධන පංතිය ඉටුකරන කාර්ය කොටස ගැන විග්‍රහ කිරීමත්, මෙම සමාජය සංවර්ධනයවීමට අදළ දත්තයනුත්, නිර්ධන පංතියේ සහ ධනපති පංතියේ සතුරු අවශ්‍යතාවයන්ගේ නොසමාදන ස්වභාවයක් පදනම් කරගෙන, මාක්ස් මෙම නිගමනය වෙත එළඹීයේය.

ඉහතදී මෙම ප්‍රශ්නය ඉදිරිපත් කරන ලද්දේ මෙසේය: නිර්ධන පංතිය, එහි විමුක්තිය දිනා ගැනීම සඳහා ධනපති පංතිය බලයෙන් පහකර, දේශපාලන බලය දිනාගෙන එහි විප්ලවකාරී ආඥාදායකත්වය පිහිටුවිය යුතුය.

දැන් එය ඉදිරිපත් කරනු ලබන්නේ වෙනත් ආකාරයකට ය: කොමියුනිස්ට් ක්‍රමය කරා සංවර්ධනය වෙමින් තිබෙන ධනපති සමාජයේ සිට කොමියුනිස්ට් සමාජය දක්වා පරිවර්තනය වීම, ''දේශපාලන පරිවර්තනීය කාල සීමාවකින්'' තොරව කිසිසේත් සිදුවිය නොහැක. තවද, මෙම කාලසීමාවේ රාජ්‍යය විය හැක්කේ නිර්ධන පංති ආඥාදායකත්වය පමණකි.

එසේ නම් ප්‍රජාතන්ත්‍රවාදයට මෙම ආඥාදායකත්වයේ ඇති සම්බන්ධය කුමක් ද?

''නිර්ධන පංතිය පාලක පංතියේ තත්ත්වයට නැංවීමට'' සහ ''ප්‍රජාතන්ත්‍රවාදයේ සටන ජයග්‍රහණය කිරීමට'' යන සංකල්පයන් දෙක, ''කොමියුනිස්ට් ප්‍රකාශනය'' විසින් විශේෂයෙන් තොරව, එක්ලංකොට තබනු ලබන බව අපි දැක්කෙමු. ඉහත දක්වා ඇති සියල්ල පදනම ලෙසට ගත් කල, ධනපති ක්‍රමයේ සිට කොමියුනිස්ට් ක්‍රමය දක්වා පරිවර්තනය වීමේදී ප්‍රජාතන්ත්‍රය වෙනස් වන්නේ කෙසේද යන්න වඩාත් නිවැරදි ලෙස නිර්ණය කිරීමට හැකි වේ.

ධනපති සමාජය තුළ ප්‍රජාතන්ත්‍රවාදය ඉතාමත් වාසිදායක කොන්දේසි යටතේ සංවර්ධනය වන්නේ නම්, ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවක එය (ප්‍රජාතන්ත්‍රවාදය) බොහෝ දුරට සම්පූර්ණව පවතින බව අපට දැක්ක හැකිය. එහෙත් මෙම ප්‍රජාතන්ත්‍රවාදය ධනපති සූරාකෑමෙන් නියම වන පටු සීමාවන් අතර නිතරම හිරවී තිබේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, එය අල්පතරයේ ප්‍රජාතන්ත්‍රවාදයක්, දේපල හිමි පංතිවලට පමණක්, පොහොසතුන්ට පමණක් ප්‍රජාතන්ත්‍රවාදයක් වී ඇත. ධනපති සමාජයේ නිදහස නිතරම පවතින්නේ එය පැරණි ග්‍රීක සමූහාණ්ඩුවල පැවති තත්ත්වයෙනි: ඒ වහල් හිමියන්ගේ නිදහස ය. ධනපති සූරාකෑමේ කොන්දේසි නිසා නවීන වේතන වහළුන් නැති බැරි කම්වලින් සහ දුප්පත් කමින් කොතරම් මිරිකී සිටිත් ද යත්, ''ප්‍රජාතන්ත්‍රවාදය ගැන කරදර වීමට පුළුවන් කමක් ඔවුන්ට නැත''; ''දේශපාලනය ගැන කරදර වීමට පුළුවන් කමක් ඔවුන්ට නැත''. සාමාන්‍ය ලෙස, සාමකාමීව ඇතිවන සිදුවීම්වලදී ජනගහනයෙන් බහුතරයට මහජන සහ දේශපාලන ජීවිතයට සහභාගී වීමට ඉඩදෙනු නොලැබේ.

මෙම ප්‍රකාශයේ නිරවද්‍යාභාවය සමහර විට ජර්මනියේ නිදර්ශනයෙන් ඉතාමත් පැහැදිලි ලෙස සනාථ වේ. එසේ කියන්නේ එහි ව්‍යවස්ථානුකූල නීත්‍යානුකූල භාවය මවිතකර තරම් දීර්ඝ කාලයක්, එනම්, අර්ධ ශතවර්ෂයක පමණ (1871-1914) කාලයක් ආරක්ෂා වූ හෙයිනි; එසේම මෙම කාල සීමාව තුළ, ''නීත්‍යානුකූලභාවය උපයෝගී කර ගැනීමේ'' ආකාරයෙන් අන් රටවලට වඩා ජයග්‍රහණ ලබා ගැනීමට එහි සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ට හැකි වූ හා ලෝකයේ වෙනත් කිසිම තැනක නොසිදු වූ තරමින් කම්කරුවන්ගෙන් විශාල අනුපාතයක් ඔවුන් විසින් දේශපාලන පක්ෂයක් ලෙසට සංවිධානය කරන ලද හෙයිනි.

ධනපති සමාජයේ මෙතෙක් ලියවී ඇති පරිදි, දේශපාලන වශයෙන් විඥානය ඇති සහ ක්‍රියාකාරී වේතන වහළුන් අනුපාතය වැඩිම අවස්ථාව කුමක්ද? ලක්ෂ 150 ක වේතන කම්කරුවන් අතරින් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ සාමාජිකයින් ඇත්තේ 10 ලක්ෂයකි! ලක්ෂ 150 ක් අතරින් වෘත්තීය සමිති තුළ සංවිධානය වී ඇත්තේ ලක්ෂ 30 ක් පමණකි!

ඉතා සුළු අල්පතරයක ප්‍රජාතන්ත්‍රවාදයකි. පොහොසතුන්ගේ ප්‍රජාතන්ත්‍රවාදයකි. ධනපති සමාජයේ ප්‍රජාතන්ත්‍රවාදය එයයි. අපි වඩාත් සුපරීක්ෂාකාරී ලෙස ධනපති යන්ත්‍රය දෙස බලන්නෙමු නම්, අපට සෑම තැනෙකම දකින්නට ලැබෙන්නේ, ඡන්ද බලය ලැබීමට අදළ, ''සුළු'', එනම්, සුළු යයි කියනු ලබන, විස්තර කරුණුද, නියෝජිත ආයතන පටිපාටියද, රැස්වීමේ අයිතියට ඇති සැබෑ බාධක ද (මහජන ගොඩනැගිලි ''හිඟන්නන්'' සඳහා නොවේ!) දිනපතා පුවත්පත් තනිකරම ධනපති ස්වභාවයෙන් සංවිධානය වී තිබීමද, යනාදිය තුළ ප්‍රජාතන්ත්‍රවාදයට එරෙහිව ඇති එක පිට එක පැටවූ සීමාවන් ය. විශේෂයෙන්ම කිසිකලෙකත් අඟහිඟකම් නොදත් සහ පීඩිත පංති ජනතාවගේ පොදුජන ජීවිතයට කිසි කලෙකත් සම්බන්ධ නොවූ අයට (ධනපති දේශපාලනඥයන් සියයට අනූ නවයක් නොවේ නම් දහයෙන් නවයක්ම මෙම ගණයට අයත්ය) පෙනෙන පරිදි, දුප්පතුන්ට බලපාන මෙම සීමාවන්, විශේෂතාවයන්, අවසරනොදීම් සහ බාධාවන් සුළු විය හැකිය. නමුත් මෙම සීමාවන් සමස්තයක් වශයෙන් ගත් කල එය දුප්පතුන්ට දේශපාලනය කිරීමට සහ ක්‍රියාශීලී ලෙස ප්‍රජාතන්ත්‍රවාදයට සහභාගී වීමට ඉඩ නොදී ඔවුන් ඉන් බැහැරට තල්ලුකර දැමීමක් වන්නේය.

පාර්ලිමේන්තුව තුළ සිටිමින් පීඩිතයන් නියෝජනය සහ මර්දනය කළ යුත්තේ විරුද්ධ පංතියේ කුමණ විශේෂ නියෝජිතයන්ද යන්න තීරණය කිරීමට එම පීඩිතයන්ට වසර කීපයකට වරක් ඉඩ දෙනු ලැබේ යයි, කොමියුනයේ අත්දැකීම විග්‍රහ කරමින් මාක්ස් කියන විට, ඔහු ධනපති ප්‍රජාතන්ත්‍රවාදයේ හරය ඉතා හොඳින් ග්‍රහණය කර ගෙන සිටියේය![38]

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ධනපති ප්‍රජාතන්ත්‍රවාදය අනිවාරණීය වශයෙන්ම පටු වූත්, සීරුවෙන් දුප්පතුන් ඉවතට තල්ලුකර දමන්නා වූත්, එනිසාම කොතින් කොනට වංචනික සහ ව්‍යාජ වූත් එකක් වන හෙයින්, ලිබරල් මහාචාර්යවරුන් සහ සුළු ධනපති අවස්ථාවාදීන් අපට කියන ලෙසට එය ''වැඩි වැඩියෙන් ප්‍රජාතන්ත්‍රවාදය'' දෙසට ගෙන යන සංවර්ධනය නිරායාසයෙන්ම, එක එල්ලේම සහ අවුලක් නොමැතිවම සිදුවන්නක් නොවේ. නැත. ඉදිරි සංවර්ධනය, එනම් කොමියුනිස්ට් ක්‍රමය දෙසට යන සංවර්ධනය නිර්ධන පංති ආඥාදායකත්වය ඔස්සේ ගමන් කරන්නකි. එය වෙනත් ලෙසකට සිදුවිය නොහැකිය. ඊට හේතුව, වෙනත් කෙනෙකුට හෝ වෙනත් ආකාරයකින් ධනපති සූරාකන්නන්ගේ ප්‍රතිරෝධය බිඳ හෙළිය නොහැකි වීම ය.

තවද, නිර්ධන පංති ආඥාදායකත්වය, එනම්, පීඩකයන් මර්දනය කරනු සඳහා පීඩිතයන්ගේ පෙරමුණු බලඇණිය පාලක පංතිය ලෙසට සංවිධානය කිරීම, හුදෙක් ප්‍රජාතන්ත්‍රවාදය පුළුල් කිරීමෙන් පමණක් ඉටු විය නොහැක්කකි. ප්‍රජාතන්ත්‍රවාදය, සල්ලි මළකාරයින්ගේ ප්‍රජාතන්ත්‍රවාදයක් නොව, ප්‍රථම වතාවට දුප්පතුන්ට ප්‍රජාතන්ත්‍රවාදය, එනම් ජනතාවට ප්‍රජාතන්ත්‍රවාදය වන ලෙසට, එය විශාල වශයෙන් පුළුල් කරන නිර්ධන පංති ආඥාදායකත්වය, ඒහා සමගම, පීඩකයන්ගේ, සූරාකන්නන්ගේ සහ ධනපතියන්ගේ නිදහස වලක්වමින් සීමාවන් මාලාවක් පනවයි. මිනිස් වර්ගයා වේතන වහල් ක්‍රමයෙන් නිදහස් කරනු පිණිස අපි එම පීඩකයන්, සූරාකන්නන් හා ධනපතියන් මර්දනය කළ යුත්තෙමු; ඔවුන්ගේ ප්‍රතිරෝධය බලහත්කාරයෙන් මැඩලිය යුත්තෙමු. මර්දනය කිරීම සහ හිංසනය ඇති තැන නිදහස සහ ප්‍රජාතන්ත්‍රවාදය නොමැති බව පැහැදිලිය.

පාඨකයාට මතක ඇති ලෙසට එංගල්ස් බෙබෙල්ට යැවූ ලිපියෙහි ''නිර්ධන පංතියට තවදුරටත් රාජ්‍යය අවශ්‍ය වන්නේ නිදහස උදෙසා නොව එහි සතුරන් මර්දනය කර තැබීමට පිණිස වන නිසා, නිදහස ගැන කතා කිරීමට හැකි වූ වහාම රාජ්‍යය නියම රාජ්‍යයක් වශයෙන් පැවතීම නැති වන්නේය''[39] යනුවෙන් සඳහන් කළ විට ඔහු මෙම අදහස අනර්ඝ ලෙස ප්‍රකාශ කළේය.

''රාජ්‍යයේ පැවතීම නැති වන්නේ'' සහ ''නිදහස ගැන කතාකිරීමට හැකි'' වන්නේ කොමියුනිස්ට් සමාජයේදී පමණකි; ධනපතියන්ගේ ප්‍රතිරෝධය සම්පූර්ණයෙන්ම සුනු විසුනු කළ පසු, ධනපතියන් අතුරුදහන්ව ගිය පසු සහ පංති නැතිව ගිය පසු (සමාජමය නිෂ්පාදන මාධ්‍යයන් කෙරෙහි ඇති සම්බන්ධය අතින්, සමාජයේ සාමාජිකයන් අතර වෙනසක් නොමැති වූ පසු) පමණකි. සැබැවින්ම සම්පූර්ණ ප්‍රජාතන්ත්‍රවාදයක්, කිසිම විශේෂත්වයක් නොමැති ප්‍රජාතන්ත්‍රවාදයක් ඇතිවිය හැක්කේ සහ සාර්ථක කරගත හැක්කේ එවිට පමණකි. ප්‍රජාතන්ත්‍රවාදය හැකිළීයාම ආරම්භවනු ඇත්තේ ඉන් පසුව පමණකි. එසේ වන්නේ ධනපති වහල් ක්‍රමයේ, නැතහොත්, ධනපති සූරාකෑමේ නිමක් නැති මහා බියෙන්, ම්ලේච්ඡභාවයෙන්, නිරර්ථකභාවයෙන් සහ නින්ද අපහාසවලින් නිදහස් ජනතාව, ශතවර්ෂ ගණනක් තිස්සේ දැන සිටි, අවුරුදු දහස් ගණන් තිස්සේ යළි යළිත් කියා ඇති සමාජ පැවැත්මේ මූලික නීති පිළිපැදීමට ක්‍රමයෙන් පුරුදු වීමේ සරල කරුණ හේතු කොට ගෙනය. බල කිරීමෙන් තොරව, බලහත්කාරය යෙදීමෙන් තොරව, යටත්කිරීමක් නොමැතිව, රාජ්‍යය නැමති බලහත්කාරය යෙදීමේ විශේෂ යන්ත්‍රය නොමැතිව ඔවුන් එම නීති පිළිපැදීමට පුරුදු වෙනවා ඇත.

''රාජ්‍යය හැකිළී යන්නේය'' යන යෙදුම ඉතාමත් ගැලපෙන ලෙස තෝරාගත් එකකි. අදාළ ක්‍රියාදමයේ ක්‍රමික ස්වභාවයක්, සාංසිද්ධික ස්වභාවයක්, යන දෙකම එයින් හැඟවේ. එවැනි ප්‍රතිඵලයක් ඇති විය හැක්කේ හා නිසැක වශයෙන්ම ඇතිවනු ඇත්තේ පුරුද්ද තුළින් පමණකි. සූරාකෑම නොමැති විටද, බලවත් කෝපය ඇති කරන, විරෝධය පෑමේ සහ කැරලි ගැසීමේ උවමනාව ඇතිවන සහ යටත්කිරීමේ අවශ්‍යතාවය ඇති කරන කිසිවක් නොමැති කලද, ජනයා කැමැත්තෙන්ම සමාජ පැවැත්මේ අවශ්‍ය කොන්දේසි පිළිපැදීමට පුරුදු වන බව අපි වාර ලක්ෂ ගණනක් අප අවට සිදුවීම්වලින් දැක ඇත්තෙමු.

මේ අනුව ධනපති සමාජයේ ඇත්තේ කප්පාදු කළ, කාලකණ්ණි, බොරු ප්‍රජාතන්ත්‍රවාදයකි; පොහොසතුන් සඳහා, අල්පතරය සඳහා පමණක් ප්‍රජාතන්ත්‍රවාදයකි. ප්‍රථම වතාවට ජනතාවට, බහුතරයට ප්‍රජාතන්ත්‍රවාදය සහ ඒ සමගම සූරාකන්නන්, එනම්, අල්පතරය මර්දනය කිරීමද ඇති කෙරෙන්නේ නිර්ධන පංති ආඥාදායකත්වයේ, නැතහොත් කොමියුනිස්ට් ක්‍රමයට පරිවර්තනය වීමේ කාල සීමාව විසිනි. සැබැවින්ම සම්පූර්ණ ප්‍රජාතන්ත්‍රවාදය සැපයීමෙහි සමත් වන්නේ කොමියුනිස්ට් ක්‍රමය පමණකි. තවද, එය වඩාත් පරිපූර්ණ වූ තරමට, එය වඩාත් ඉක්මණින් අනවශ්‍ය දෙයක් බවට පත්වී ස්වයංකාරී ලෙසටම හැකිළී යන්නේය:

වෙනත් වචනවලින් කියතොත් ධනපති ක්‍රමය යටතේ අපට දක්නට ලැබෙන්නේ වචනයේ නියම අර්ථයෙන්ම වූ රාජ්‍යයය. එනම්, එක පංතියක් විසින් තවත් පංතියක්, එපමණක් නොව අල්පතරය විසින් බහුතරය මර්දනය කරනු ලැබීම සඳහා වූ යන්ත්‍රය ය. සූරාකන අල්පතරය විසින් සූරාකනු ලබන බහුතරය ක්‍රමානුකූල ලෙස මර්දනය කිරීම වැනි කටයුත්තක් සාර්ථක කරගනු සඳහා, මර්දනය කිරීමේදී අන්ත රෞද්‍රතාවය සහ ම්ලේච්ඡභාවය ස්වභාවික වශයෙන්ම අවශ්‍ය වේ. ඒ සඳහා ලේ සාගර අවශ්‍ය වේ. වහල් ක්‍රමය, වැඩවසම් ක්‍රමය සහ වේතන ශ්‍රම ක්‍රමය යටතේ මිනිස් වර්ගයා ඇදෙන්නේ එම ලේ සාගරය මැද්දෙනි.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

තවද, ධනපති ක්‍රමයේ සිට කොමියුනිස්ට් ක්‍රමයට පරිවර්තනය වීමේ කාලයේදීද මර්දනය කිරීම තව දුරටත් අවශ්‍ය වේ. එහෙත් එම මර්දනය කිරීම, සූරා කනු ලබන බහුතරය විසින් සූරා කන අල්පතරය කෙරෙහි ක්‍රියාත්මක කරන්නකි. විශේෂ යන්ත්‍රයක්, මර්දනය කිරීම සඳහා විශේෂ යන්ත්‍රයක්, එනම්, "රාජ්‍යය" තවමත් අවශ්‍යය. එහෙත් දැන් එය පරිවර්තනීය රාජ්‍යයකි. දැන් එය වචනයේ නියම අර්ථයෙන් රාජ්‍යයක් නොවේ. මන්දයත්, පෙර දවස වැටුප් වහළුන් වූ බහුතරය විසින් සූරාකන්නන් මර්දනය කරනු ලැබීම සංසන්දනීය වශයෙන් පහසු, සරල හා ස්වාභාවික කර්තව්‍යයක් වන හෙයින්, එයින් වැගිරෙන රුධිරය, වහල්, ප්‍රවේණිදාස හෝ වේතන ශ්‍රමකරු කැරලි මැඩ පැවැත්වීමට වැගිරූ රුධිරයට වඩා අතිශයින්ම අඩු බැවිනි; එයින් මිනිස් වර්ගයාට සිදුවන පාඩුව ඉතාමත් අඩු බැවිනි. පීඩනයේ විශේෂ යන්ත්‍රයක අවශ්‍යතාවය අතුරුදහන්වීමට පටන් ගැනීම, ප්‍රජාතන්ත්‍රවාදය ජනගහනයෙන් එතරම් විශාල බහුතරයකට පුළුල් කිරීම හා සමග ගැලපෙන්නේය. ජනතාව මර්දනය කිරීම සඳහා ඉතාමත් සංකීර්ණ යන්ත්‍රයක් නොමැතිව සූරාකන්නන්ට එම මර්දනය කළ හැකි නොවීම ස්වාභාවිකය. එහෙත් ඉතා සරල "යන්ත්‍රයකින්", "යන්ත්‍රයක්" නොමැතිවම පාහේ, විශේෂ යන්ත්‍රයක් නොමැතිව, ආයුධ සන්නද්ධ ජනතාවගේ සරල සංවිධානය (කලට ඉපෙර ඉදිරියට යමින්, කම්කරු සහ සොල්දාදු නියෝජිත සෝවියට් සභා වැනි සංවිධානය යයි කියන්නෙමු) යොදා ගනිමින් සූරාකන්නන් මර්දනය කිරීම ජනතාවට කළ හැකිය.

අවසාන වශයෙන්, රාජ්‍යය සම්පූර්ණයෙන්ම අනවශ්‍ය කෙරෙන්නේ කොමියුනිස්ට් ක්‍රමය විසින් පමණකි. එය යටතේ මර්දනය කිරීමට කිසිවෙක් නැත. පංතියක අර්ථයෙන්, ජනගහනයේ නිශ්චිත කොටසකට විරුද්ධව ක්‍රමානුකූල ලෙස අරගල කිරීමේ අර්ථයෙන්, මර්දනය කළයුතු කිසිවෙක් නැත. අපි මනෝරාජිකවාදීන් නොවෙමු. එනිසා, තනි පුද්ගලයන් සීමාව ඉක්මවන අවස්ථා සහ එවැනි සීමාව ඉක්මවීම් නැවැත්වීමේ අවශ්‍යතාවය ඇතිවිය හැකි හා අනිවාර්‍යණීය වශයෙන් ඇතිවන බව අපි කිසිසේත් ප්‍රතික්ෂේප නොකරමු. එසේ වුවද, ප්‍රථමයෙන්ම මේ සඳහා විශේෂ මර්දනකාරී යන්ත්‍රයක් අවශ්‍ය නොවේ. මෙය ආයුධ සන්නද්ධ ජනතාව විසින්ම කෙරෙනු ඇත. නවීන සමාජයේ වුවද, රණ්ඩුවක් නතර කිරීමට හෝ ස්ත්‍රියකට පහර දීම වැලැක්වීමට හෝ ඕනෑම පිරිසක් කැමැත්තෙන් ඉදිරිපත් වන සේ නිතැතින්ම මෙය කෙරෙනු ඇත. දෙවැනිව, සමාජ පැවැත්මේ නීති උල්ලංඝනය කිරීම වන සීමාව ඉක්මවා යාම ඇතිකරන මූලික සමාජමය හේතුව ජනතාව සූරාකෑම, ඔවුන්ගේ නැතිබැරිකම සහ දුප්පත්කමය. මෙම ප්‍රධාන හේතුව ඉවත් කිරීම සමග සීමාව ඉක්මවා යාමද අනිවාර්‍යණීය

වශයෙන්ම "හැකිළී යාම" ආරම්භ වන්නේය. එය කොතරම් ඉක්මනින් සිදුවේද, කුමණ අනුපිළිවෙළින් සිදුවේ ද යන්න අපි නොදනිමු. එහෙත් එම සීමා ඉක්මවීම් හැකිළී යනු ඇති බව අපි දන්නේමු. ඒවා හැකිළී යාම හා සමගම රාජ්‍යයද හැකිළී යනු ඇත.

මනෝරාජ්‍යයන් ගොඩනැගීමට යොමු නොවූ මාක්ස්, මෙම අනාගතය ගැන, දැන් විස්තර කළ හැකි දෙය ගැන, එනම්, කොමියුනිස්ට් සමාජයේ පහළ හා ඉහළ අදියර (මට්ටම්, අවධි) අතර වෙනස ගැන වඩාත් සම්පූර්ණ ලෙස විස්තර කළේය.

3. කොමියුනිස්ට් සමාජයේ පළමු අදියර

සමාජවාදය යටතේ කම්කරුවාට "ඔහුගේ ශ්‍රමයේ ඵලය නොඅඩුව" හෝ "සම්පූර්ණයෙන්" හෝ ලැබෙනු ඇතැයි යන ලසාල්ගේ මතය වැරදි බව ඔප්පු කිරීමට මාක්ස් ඔහුගේ "ගෝතා වැඩ පිළිවෙළ ගැන විවේචනය" යන පොතෙහි කරුණු දක්වයි. සංචිත අරමුදලක්, නිෂ්පාදනය විෂ්කීර්ණ කිරීම සඳහා අරමුදලක්, "ගෙවෙන සහ බිඳෙන" යන්ත්‍ර වෙනුවට ආදේශනය සඳහා අරමුදලක් යනාදිය සමාජයේ මුළු සමාජමය ශ්‍රමයෙන් අඩු කරගත යුතු යයි මාක්ස් පෙන්වා දෙයි. ඊළඟට පාරිභෝජන මාධ්‍යයන් කෙරෙන්. පරිපාලන වියදම්, රෝහල්, වැඩි හිටි ජනතා නිවාස යනාදිය සඳහා අරමුදලක් අඩු කරගත යුතු බවද ඔහු කියයි.

ලසාල් ඉදිරිපත් කරන ව්‍යාකූල, නොපැහැදිලි සහ සාමාන්‍ය ප්‍රකාශය ("කම්කරුවාට ඔහුගේ ශ්‍රමයේ සම්පූර්ණ ඵලය") වෙනුවට සමාජවාදී සමාජයට එහි කටයුතු හරියටම කළමනාකරණය කිරීමට සිදුවන්නේ කුමණ ආකාරයෙන්ද යන්න ගැන මාක්ස් ප්‍රඥාගෝචර තක්සේරුවක් කරයි. ධනපති ක්‍රමය නොමැති සමාජයක ජීවන කොන්දේසි ගැන නියත විග්‍රහයක් කිරීමට යොමු වන මාක්ස් මෙසේ කියයි:

> "අප මෙහිදී (කම්කරු පක්ෂයේ වැඩ පිළිවෙළ විග්‍රහ කිරීමේදී) සැලකිල්ලට ගත යුත්තේ, ස්වකීයමය පදනමක් මත සංවර්ධනය වූවක් නොවන, ඊට ප්‍රතිකූල වශයෙන්, ධනපති සමාජයෙන් උද්ගත වන ලෙසටම ගත්, කොමියුනිස්ට් සමාජයක් ගැනය. එනිසා එම සමාජය, ආර්ථිකමය, සදාචාරමය සහ බුද්ධිමය යන සෑම අතින්ම තම මව්කුස වූ පැරණි ධනපති සමාජයෙන් ගෙන ආ උපන් ලපවල මුද්‍රාව තවමත් දරන්නේය."

මාක්ස් කොමියුනිස්ට් සමාජයේ "පළමු" නැතහොත් පහළ අදියර ලෙසට හඳුන්වන්නේ, ධනපති ක්‍රමය නැමති මව් කුසින් මේ දැන් දහවල්

https://liberationbase.wordpress.com

ආලෝකයට බිහිවුණු සහ පැරණි සමාජයෙන් ගෙන ආ උපන් ලපවල මුද්‍රාව සැම අතින්ම දරන, මෙම කොමියුනිස්ට් සමාජය ය.

නිෂ්පාදන මාධ්‍යයන් දැන් පුද්ගලයන් සතු පෞද්ගලික දේපල නොවන්නේය. නිෂ්පාදන මාධ්‍යයන් මුළු සමාජයටම අයත්ය. සමාජමය වශයෙන් අවශ්‍ය වැඩ යම් කොටසක් ඉටු කරන සමාජයේ සැම සමාජිකයෙකුටම, ඔහු කිසියම් වැඩකොටසක් කළ බවට සමාජයෙන් සහතිකයක් ලැබේ. මෙම සහතිකය අනුව මහජන පාරිභෝගික භාණ්ඩ ගබඩාවෙන්, ඊට සරිලන භාණ්ඩ ප්‍රමාණයක් ඔහුට ලැබෙන්නේය. එනිසා මහජන අරමුදලට වැටෙන ශ්‍රම ප්‍රමාණය අඩු කළ පසු සැම කම්කරුවෙක්ම සමාජයට දෙන ශ්‍රම ප්‍රමාණයට සමාන අර්ථලාභයක් ඔහුට සමාජයෙන් ලැබෙන්නේය.

''සමානාත්මතාවය'' රජයන සේ පෙනේ.

එහෙත් (සුපුරුදු ලෙස සමාජවාදය යනුවෙන් හැඳින්වෙන, එහෙත් මාක්ස්, කොමියුනිස්ට් ක්‍රමයේ පළමු අදියර ලෙසට හැඳින්වූ) එවැනි සමාජයක් ගැන සිතමින්, ලසාල්, මෙය ''සමාන ලෙස බෙදා හැරීම'' යයිද, ''ශ්‍රමයේ නිෂ්පාදනයෙන් සමාන කොටසකට සියළු දෙනාගේම අයිතිය'' යයිද කියන විට ඔහු කරන්නේ වරදකි. මාක්ස් එම වරද හෙළිදරව් කරයි.

මෙම අවස්ථාවේ ''සමාන අයිතිය'' තවමත් ඒකාන්තවම ''ධනපති අයිතියට'' අනුකූල යයිද, සියළුම හිමිකම් මෙන් එයද ''අසමානතාවය හඟවන්නක්'' යයිද මාක්ස් කියයි. සැම හිමිකමකින්ම කෙරෙන්නේ, ඇත්ත වශයෙන් එක හා සමාන නොවන හා එකිනෙකාට සමාන නොවන ජනයා කෙරෙහි එක සමාන මිම්මක් ක්‍රියාත්මක කිරීමය. ''සමාන අයිතිය'' යන්න සමානත්වය උල්ලංඝනය කිරීමක් හා අසාධාරණයක් වන්නේ එහෙයිනි. ඇත්ත වශයෙන්ම, සැම කෙනෙක්ම, තවත් කෙනෙකු තරම් සමාජමය ශ්‍රම කටයුතු ඉටු කළ විට (ඉහත සඳහන් අඩු කිරීම්වලින් පසුව) හේ සමාජයේ නිෂ්පාදනයෙන් සමාන කොටසක් ලබා ගනී.

එහෙත් මිනිස්සු එක හා සමාන නොවෙති. එකෙක් ශක්තිමත්ය; අනෙකා දුර්වලය. අයෙක් විවාහකය; තවත් අයෙක් අවිවාහකය. අයෙකුට බොහෝ දරුවන් ඇත; අයෙකුට දරුවන් අඩුය. මේ ආදී වශයෙනි. ඒ අනුව මාක්ස් බැස ගන්නා නිගමනය මෙසේය:

> ''සමානශ්‍රම කාර්ය ඉෂ්ට කරන විට සහ එනිසා සමාජ පරිභෝජන අරමුදලෙන් සමාන කොටසක් ලබන විට, අයෙක් තවත් අයෙකුට වඩා ඇත්ත වශයෙන්ම ලබා ගන්නේය; අයෙක් තවත් අයෙකුට වඩා පොහොසත් වන්නේය. මේ ආදී වශයෙනි. මෙම දුර්වලකම් සියල්ල මඟ හැරීමට අයිතිය සමාන නොව, අසමාන විය යුතුය.''

එනිසා, සාධාරණත්වය හා සමානත්වය දීම කොමියුනිස්ට් ක්‍රමයේ පළමු අදියරට තවමත් කළ නොහැකිය. පොහොසත්කමේ වෙනස්කම් හා අසාධාරණ වෙනස්කම් තව දුරටත් පවතිනු ඇත. එහෙත් එය යටතේ මිනිසා විසින් මිනිසා සූරා කෑම නොකළ හැකි වනු ඇත. ඊට හේතුව, එවිට නිෂ්පාදන මාධ්‍යයන්, එනම් පැක්ටරි, යන්ත්‍ර, ඉඩම් ආදිය අල්ලා ගෙන ඒවා පෞද්ගලික දේපල බවට පත්කරගත නොහැකි වීමය. ''සමානත්වය'' සහ ''සාධාරණත්වය'' ගැන සාමාන්‍ය වශයෙන් කියන ලසාල්ගේ ව්‍යාකූල, සුළු ධනපති, වදන් සිඳ බිඳ දැමීමේ යෙදෙන මාක්ස්, කොමියුනිස්ට් ක්‍රමයේ සංවර්ධන මාර්ගය පෙන්වා දෙන අතර එම කොමියුනිස්ට් ක්‍රමයට ප්‍රථමයෙන් ඉටු කළ හැක්කේ පුද්ගලයන් විසින් නිෂ්පාදන මාධ්‍යයන් අල්ලාගෙන තිබීමේ ''අසාධාරණය'' අනිවාර්යයෙන්ම අහෝසි කිරීම පමණක් බවත්, ''ඉටු කරන ලද ශ්‍රම ප්‍රමාණය අනුව'' (අවශ්‍යතාවය අනුව නොව) පරිභෝගික භාණ්ඩ බෙදහැරීමෙන් සිදුවන අනිත් අසාධාරණය එක්වරම බැහැර කළ නොහැකි වන බවත් කියයි.

ධනපති මහාචාර්යවරුන් සහ ''අපගේ'' තුගාන් ද ඇතුළු පහත් අර්ථශාස්ත්‍රඥයෝ ජනතාවගේ අසමානතාවය අමතක කිරීම සහ එම අසමානතාවය බැහැර කිරීමට ''සිහින මැවීම'' ගැන නිරතුරුවම සමාජවාදීන්ට දෝෂාරෝපනය කරති. අපට පෙනෙන ලෙසට, එවැනි දෝෂාරෝපනයකින් ඔප්පු වන්නේ ධනපති දෘෂ්ටිවාදීන්ගේ අන්ත අඥානකම පමණකි.

මිනිසුන් අතර පවතින අසමානත්වය ගැන මාක්ස් ඉතාමත් අංග සම්පූර්ණ ලෙස සැලකිල්ලට ගනී. එපමණක් නොව, නිෂ්පාදන මාධ්‍යයන් මුළු සමාජයේම (පොදුවේ ''සමාජවාදය'' යනුවෙන් හැඳින්වෙන) පොදු දේපල වලට හැරවීම පමණක්ම නිසා බෙදහැරීමේ සහ ''ධනපති නීතියේ'' දුර්වලකම් ඉවත් නොවන බවද, ''ඉටු කරන ලද ශ්‍රම ප්‍රමාණය අනුව'' නිෂ්පාදිතයන් බෙදා හරින තාක් කල් එම දුර්වලකම් දිගටම පවතින බවද, හේ සැලකිල්ලට ගනී. මාක්ස් තවදුරටත් මෙසේ කියයි:

> ''එහෙත් දීර්ඝ උපත් වේදනා විඳ ධනපති සමාජයෙන් මේ දැන් බිහි වූ වැනි, කොමියුනිස්ට් සමාජයේ පළමු අදියරෙහි මෙම වැරදි තිබීම වැළැක්විය නොහැකිය. නීතිය, සමාජයේ ආර්ථික ව්‍යුහයට හා එමගින් සකස්වුණු ආර්ථික සංවර්ධනයට වඩා කිසි කලෙකත් උසස් විය නොහැකිය.''

මේ අනුව බලන කල, කොමියුනිස්ට් සමාජයේ (සාමාන්‍යයෙන් ''සමාජවාදය'' යනුවෙන් හැඳින්වෙන) පළමු අදියර තුළදී ''ධනපති අයිතිය'' අහෝසි කරනු ලබන්නේ සම්පූර්ණයෙන්ම නොව, අර්ධ වශයෙන්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

පමණකි එතෙක්, ආර්ථික විප්ලවය ඉටුකර තිබෙන තාක් දුරට, එනම්, නිෂ්පාදන මාධ්‍යයන් හා සම්බන්ධයෙන් පමණකි. "ධනපති නීතිය" එම මාධ්‍යයන් පිළිගන්නේ පුද්ගලයන්ගේ පෞද්ගලික දේපල ලෙසටය. සමාජවාදය ඒවා පොදු දේපල බවට හරවයි. ඒ තාක් දුරට, ඒ තාක් දුරට පමණක්, "ධනපති අයිතිය" අතුරුදහන් වේ.

එසේ වුවද අනිත් අංශය සම්බන්ධයෙන් එය දිගටම බලපාන්නේය. සමාජයේ සාමාජිකයන් අතර නිෂ්පාදිත භාණ්ඩ බෙදහැරීම සහ ශ්‍රම කටයුතු වෙන්කර දීම විෂයෙහි ක්‍රියාත්මක වන නියාමකය (තීරක සාධකය) ලෙසට එය දිගටම පවතියි. "යමෙක් වැඩ නොකරයිද, හේ අනුභව නොකළ යුතුය" යන සමාජවාදී ප්‍රතිපත්තිය දැනටමත් සාර්ථක වී ඇත. "සමාන ශ්‍රම ප්‍රමාණයක් සඳහා සමාන නිෂ්පාදිත භාණ්ඩ ප්‍රමාණයක්" යන අනිත් සමාජවාදී ප්‍රතිපත්තියද දැනටමත් සාර්ථක වී ඇත. එහෙත් මෙය තවමත් කොමියුනිස්ට් ක්‍රමය නොවේ. අසමාන (ඇත්ත වශයෙන්ම අසමාන) ශ්‍රම ප්‍රමාණයන් සඳහා අසමාන පුද්ගලයන්ට සමාන නිෂ්පාදිත භාණ්ඩ ප්‍රමානයන් දෙන "ධනපති අයිතිය" මෙයින් තවමත් අහෝසි නොවන්නේය.

මෙය "අඩු පාඩුවකි" යි මාක්ස් කියයි. එහෙත්, කොමියුනිස්ට් ක්‍රමයේ ප්‍රථම අදියරෙහිදී එය වැලැක්විය නොහැකිය. මන්දයත්, අප මනෝරාජිකවාදයට නොවැටීමට නම්, ධනපති ක්‍රමය පෙරළා දැමූ වහාම අයිතියේ මහිමයෙහි කිසිම බලපෑමක් නොමැතිව ජනතාව සමාජය වෙනුවෙන් වැඩ කිරීමට උගෙන ගනිතැයි අප නොසිතිය යුතු හෙයිනි. එපමණක් නොව, ධනපති ක්‍රමය අහෝසි කිරීම නිසා, එවැනි වෙනසක් කිරීම සඳහා පූර්වාවශ්‍යතාවයන් වහාම නිර්මාන වන්නේද නැත.

දැනට, "ධනපති අයිතිය" හැර වෙනත් නීති ඇත්තේද නැත. එනිසා, ඒතාක් දුරට, රාජ්‍යයක් සඳහා අවශතාවය තවමත් පවතී. එය නිෂ්පාදන මාධ්‍යයන්ගේ පොදු අයිතිය ආරක්ෂා කරන අතර ශ්‍රමයේ සහ නිෂ්පාදන භාණ්ඩ බෙද හැරීමේ සමානත්වය ද රකිනු ඇත.

තවදුරටත් ධනපතියන් කිසිවෙක් හා පංති කිසිවක් නොමැති නිසාද, ඒ අනුව පංතියක් මර්දනය කිරීම නොකළ හැකි වන නිසාද, ඒ තාක් දුරට රාජ්‍යය හැකිළී යන්නේය.

එහෙත්, සැබෑ අසමානතාවය ශුද්ධත්වයට නංවන "ධනපති නීතිය" ආරක්ෂා කිරීම තවමත් පවතින නිසා රාජ්‍යය තවමත් සම්පූර්ණයෙන්ම හැකිළී ගොස් නැත. රාජ්‍යය සම්පූර්ණයෙන්ම හැකිළී යාම සඳහා පරිපූර්ණ කොමියුනිස්ට් ක්‍රමය තිබීම අවශ්‍ය ය.

4. කොමියුනිස්ට් සමාජයේ ඉහළ අදියර

මාක්ස් තවදුරටත් මෙසේ ලියයි:

> "කොමියුනිස්ට් සමාජයේ ඉහළ අදියරෙහිදී පමණක්, එනම්, පුද්ගලයා ශ්‍රම විභජනයට වහල් කිරීමත්, ඒ සමගම, මානසික හා කායික ශ්‍රමය අතර ප්‍රතිප්‍රත්‍යයක් අතුරුදහන්වූ පසු, ශ්‍රමය ජීවනෝපායක් පමණක් නොව ජීවනයේ පරම අවශ්‍යතාවයක් වූ පසු, නිෂ්පාදනීය බලවේග විසින් පුද්ගලයාගේ සර්වපාර්ශවීය සංවර්ධනය උසස් කළ පසු හා සමූපකාර පොහොසත් භාවයේ සියළු උල්පත් වඩාත් ආඪ්‍යසම්පන්න ලෙස ගලා යන විට පමණක්, ධනපති නීතියේ පටු ක්ෂිතිජය අතීතයට එකතුකර, සමාජයට තම ධජ මත "හැම එකාගෙන්ම ඔහුගේ හැකියාව අනුව, හැම එකාටම ඔහුගේ අවශ්‍යතාවය අනුව" යන්න ලිවීමට හැකි වේ!"

"නිදහස" සහ "රාජ්‍යය" යන වචන අර්ථ විරහිත ලෙස එකට සම්බන්ධ කිරීම ගැන නිර්දය ලෙස සමච්චල් කරන එංගල්ස්ගේ වදන්වල නිරවද්‍යතාවය ගැන අපට සම්පූර්ණයෙන් අගය කළ හැක්කේ දැන් ය. රාජ්‍යය පවතින තාක් කල් නිදහසක් නොමැත. නිදහස තිබෙන විට රාජ්‍යයක් නොමැති වනු ඇත.

රාජ්‍යය සම්පූර්ණයෙන්ම හැකිළී යාමට අදළ ආර්ථික පදනම කොමියුනිස්ට් ක්‍රමයේ සංවර්ධනයෙහි ඉතා උසස් අවධියකි. එම අවධිය මානසික හා කායික ශ්‍රමය අතර ප්‍රතිප්‍රත්‍යය අතුරුදහන් කරන තරම් උසස් සංවර්ධනයක් සහිතය. ඒ අනුව, වර්තමාන සමාජ අසමානතාවයේ එක් ප්‍රභවයක් අතුරුදහන් වන්නේය. තවද, අසමානතාවයේ එම ප්‍රභව මූලය හුදෙක් නිෂ්පාදන මාධ්‍යයන් මහජන දේපල බවට හැරවූ පමණින්ම, ධනපතියන් අසන්තක කළ පමණින්ම, ඒ වහාම, කිසිසේත් ඉවත්කළ හැක්කක්ද නොවේ.

මෙම අසන්තක කිරීම නිසා නිෂ්පාදනීය බලවේගයන් ඉතාමත් වේගවත් ලෙස සංවර්ධනය වීමට ඉඩ සැලසේ. එසේ හෙයින්, ධනපති ක්‍රමය දැනටමත් කොතරම් විශාල ලෙස මෙම සංවර්ධනය ප්‍රමාද කරන්නේද යන්න අපට පෙනෙන විට, දැනට පැමිණ ඇති ශිල්පක්‍රම මට්ටම අනුව අත්පත් කර ගත හැකි දියුණුව කොතෙක්දැයි අපට පෙනෙන, ධනපතියන් අසන්තක කිරීම නිසා මිනිස් සමාජයේ නිෂ්පාදනීය බලවේගයන්ගේ දැවැන්ත දියුණුවක් අනිවාර්ය වශයෙන්ම ඇති වෙතැයි සම්පූර්ණ විශ්වාසයෙන් යුතුව ප්‍රකාශ කිරීමේ අයිතිය අපට තිබේ. එහෙත්, මෙම සංවර්-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ධනය කොතරම් වේගයෙන් ඉදිරියට යන්නේද, එය ශ්‍රම විභජනයෙන් බැහැර වීමේ, මානසික සහ කායික ශ්‍රමය අතර ප්‍රතිප්‍රත්‍යය ඉවත ලීමේ හා ශ්‍රමය ''ජීවිතයේ පරම අවශ්‍යතාවය'' බවට පෙරළීමේ අවස්ථාවට එළඹෙන්නේ කොතරම් ඉක්මණින්ද යන්න අපි නොදනිමු. අපට එය දැනගත නොහැකිය.

රාජ්‍යය අනිවාරණීය වශයෙන් හැකිළී යාම ගැන අප සඳහන් කරන විට, මෙම ක්‍රියාදාමයේ දිගැස්සුනු ස්වභාවය ගැනත්, එය කොමියුනිස්ට් ක්‍රමයේ ඉහළ අවධියේ සංවර්ධනය මත රැඳී පවතින්නක් වීම ගැනත් අවධාරණය කරමින්ද, හැකිළී යාම සඳහා අවශ්‍ය කාලය හා එහි නියත ආකෘති පිළිබඳ ප්‍රශ්න විවෘත ඒවා ලෙස ඉතිරිකර තබමින්ද පමණක් ඒ ගැන කතා කළ යුත්තේ එහෙයිනි. එයට හේතුව එම ප්‍රශ්නවලට පිළිතුරුදීම සඳහා අවශ්‍ය කරුණු නොතිබීමය.

රාජ්‍යයට සම්පූර්ණයෙන්ම හැකිළී යා හැකිවන්නේ, ''හැම එකාගෙන්ම ඔහුගේ හැකියාව අනුව, හැම එකාටම ඔහුගේ අවශ්‍යතාවය අනුව'' යන නීතිය සමාජයෙහි ක්‍රියාත්මක වූ පසුය. එසේ වන්නේ, ජනතාව ස්වෙච්ඡාවෙන්ම තමන්ගේ හැකියාව අනුව වැඩකරන තරමට ඔවුන් සමාජ පැවැත්මේ මූලික නීති රැකීමට පුරුදු වූ සහ ඔවුන්ගේ ශ්‍රමයෙහි ඵලදායකත්වය වැඩිවූ පසු පමණකි. ''ධනපති නීතියේ පටු ක්ෂිතිජය, නැතහොත්, තමා තවත් කෙනෙකුට වඩා පැය භාගයක් වැඩ කළා නොවේද, තමා අන් කෙනෙකුට වඩා අඩු වැටුපක් ලබනවා නොවේද යන ආකාරයෙන් ෂයිලොක්[40] කෙනෙකුගේ හැඟීමෙන් තොරව ගණන් බැලීමට අයෙකුට බල කරන මෙම පටු ක්ෂිතිජය, එවිට අතීතයට එකතු වනු ඇත. එවිට නිෂ්පාදිත භාණ්ඩ බෙදහැරීමේදී එක් එක් අයට ලැබිය යුතු ප්‍රමාණය ගැන මෙහෙයවීමක් කිරීමේ අවශ්‍යතාවයක් සමාජයට නොමැති වනු ඇත. සැම කෙනෙක්ම ''ඔහුගේ අවශ්‍යතාවය අනුව'' නිදහස් ලෙස ලබා ගන්නවා ඇත.

ධනපති දෘෂ්ටි කෝණයෙන් බලන විට, එවැනි සමාජ ක්‍රමයක් ''හුදෙක්ම මනෝරාජ්‍යයක්'' බව ප්‍රකාශ කිරීමක්, තනි පුද්ගල පුරවැසියාගේ ශ්‍රමය කිසිම පාලනයකට යටත් නොකරම සැම කෙනෙකුටම ඕනෑ තරම් සුවඳ හතු, කාර්, පියානෝ, ආදිය ලබාගැනීමේ අයිතිය දීමට පොරොන්දු වීම ගැන සමාජවාදීන්ට අවඥා කිරීමත්, පහසු දෙයකි. අද දක්වාම වුවද බොහෝ ධනපති ''විද්වතුන්'' මේ ආකාරයෙන් අවඥා කිරීමට සීමා වී සිටිති, ඒ අනුව, ඔවුහු ඔවුන්ගේ අඥානකම හා ධනපති ක්‍රමය ආරක්ෂා කිරීමේ ආත්මාර්ථකාමිත්වය හෙළිදරව් කරති.

අඥාන කමක්මය. කොමියුනිස්ට් ක්‍රමයේ සංවර්ධනයේ ඉහළ අවධිය පැමිණෙන බවට ''පොරොන්දුවක්'' දීම ගැන කිසිම සමාජවාදියෙක්

සිතුවේවත් නැත. එය පැමිණෙනු ඇතැයි කී ශ්‍රේෂ්ඨ සමාජවාදීන්ගේ අනාවැකියෙන් අදහස් කරන ලද්දේ වර්තමාන ශ්‍රම ඵලදායකත්වය නොවන බව, එසේම පම්ලොව්ස්කිගේ කතාවල[41] එන සෙමනේරි ශිෂ්‍යයන් මෙන්, ''හුදු විනෝදය සඳහා'' නොදිය හැකි දෙයක්ම ඉල්ලීමෙහි සමත් වර්තමාන සාමාන්‍ය ජනයා ගැන නොවන බව කිව යුතුය.

කොමියුනිස්ට් ක්‍රමයේ ඉහළ අදියර එන තෙක් ශ්‍රම ප්‍රමාණ සහ පාරිභෝජන ප්‍රමාණ ගැන දැඩිතම පාලනයක් සමාජය සහ රාජ්‍යය විසින් ක්‍රියාත්මක කළ යුතු බව සමාජවාදීහු ඉල්ලති. නමුත් මෙම පාලනය ආරම්භ විය යුත්තේ, ධනපතියන් අසන්තක කිරීමෙන් සහ ධනපතියන් යටත් කොට කම්කරු පාලනය ඇති කිරීමෙනි. තවද එය ක්‍රියාත්මක විය යුත්තේ නිලධාරීන්ගේ රාජ්‍යයෙන් නොව, ආයුධ සන්නද්ධ කම්කරුවන්ගේ රාජ්‍යයෙනි.

ධනපති දෘෂ්ටිවාදීන් (සහ ඔවුන්ගේ අන්තේවාසිකයන් වන ට්සෙරතෙලිලා, චෙර්නොව්ලා සහ සමාගම) ආත්මාර්ථකාමී ලෙස ධනපති ක්‍රමය ආරක්ෂා කරන්නේ, අද දිනට ඉතා වැදගත් සහ දැවෙන දේශපාලන ප්‍රශ්නය වන ධනපතියන් අසන්තක කිරීම, සියළුම පුරවැසියන් එකම මහා සම්මේලයක, එනම්, මුළු රාජ්‍යයේ, කම්කරුවන් සහ වෙනත් සේවකයන් බවට හැරවීම සහ මෙම සම්මේලයේ සියළු කටයුතු සැබැවින්ම ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයකට, කම්කරු සහ සොල්දදු නියෝජිත සෝවියට් සභා රාජ්‍යයට යටත් කිරීම වෙනුවට, දුර අනාගතය ගැන තර්ක සහ කතා ආදේශ කිරීමෙනි.

උගත් මහාචාර්ය වරයා හා ඔහු අනුව අමනයාය, ඊළඟට අමනයා අනුව ට්සෙරතෙලිලා සහ චෙර්නොව්ලා ද, බොල්ෂෙවික්වරුන්ගේ උමතු මනෝරාජ්‍යයත්, කෛරාටික පොරොන්දුත්, සමාජවාදය ''ආරම්භ කිරීමට'' නොහැකියාවත් ගැන කතා කරන විට ඉන් අදහස් කෙරෙන්නේ කොමියුනිස්ට් ක්‍රමයේ ඉහළ අදියර ගැනය. සාමාන්‍යයෙන් කියතොත්, එම අදියර ''ආරම්භ'' කළ හැකි එකක් නොවන හෙයින් එය ආරම්භ කිරීමට කිසිවෙක් පොරොන්දු වී හෝ සිතා හෝ නොමැත.

මෙහිදී අප එළඹෙන්නේ, සමාජවාදය සහ කොමියුනිස්ට් ක්‍රමය විද්‍යාත්මක ලෙස වෙන්කොට ගැනීම පිළිබඳ ප්‍රශ්නයටය. ''සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියා'' යන නාමයෙහි සාවද්‍යතාවය ගැන වූ ඉහත උපුටා දක්වන ලද තර්කයෙහිදී එංගල්ස් මෙම ප්‍රශ්නය ගැන සඳහන් කළේය. දේශපාලන වශයෙන්, කොමියුනිස්ට් ක්‍රමයේ පළමු නොහොත් පහළ අදියරත්, එහි ඉහළ අදියරත් අතර වෙනස කල්යාමේදී සමහර විට ඉතා විශාල වන්නට පිළිවන. එහෙත් මෙම වෙනස දැන්, ධනපති ක්‍රමය අනුව හඳුනා ගන්නට යාම විකාරයක් වනු ඇත. එය තරම් මූලික වශයෙන් වැද-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ගත් දෙයක් සේ සමහර විට සලකනු ඇත්තේ අරාජිකවාදී පුද්ගලයන් පමණකි. (ක්‍රොපොත්කින්ලා, ග්‍රාව්ලා සහ අරාජිකවාදයේ වෙනත් ''තරු'' සමාජ-ජාත්‍යන්මාදවාදීන් නැතහොත්, තවමත් ගෞරවය හා හෘදය සාක්ෂිය පිළිබඳ හැඟීමක් ඇතිව සිටින අරාජිකවාදීන් ස්වල්ප දෙනාගෙන් කෙනෙක් වන, ගේ පැවසූ ලෙස, ''අරාජික-ට්‍රෙන්ච්වාදීන්'' බවට හැරවීමේ ''ප්ලෙහානව්'' ක්‍රමයෙන් කිසිවක් උගෙන නොගත් අය අරාජිකවාදීන් අතර තවමත් සිටිත් නම්, ඔවුන් සමහර විට එම වෙනස ගැන එසේ මූලිකත්වයක් දෙනු ඇත).

එහෙත් සමාජවාදය සහ කොමියුනිස්ට් ක්‍රමය අතර තිබෙන විද්‍යානුකූල වෙනස පැහැදිලිය. සමාජවාදය යනුවෙන් සාමාන්‍ය වශයෙන් හඳුන්වනු ලබන දෙය, කොමියුනිස්ට් ක්‍රමයේ ''පළමු'' නොහොත් පහළ අදියර යනුවෙන් මාක්ස් විසින් නම් කරන ලදී. නිෂ්පාදන මාධ්‍යයන් පොදු දේපල බවට පත්වන හෙයින්, එතෙක් දුරට, මෙහිදී ''කොමියුනිස්ට් ක්‍රමය'' යන වචනයද ගැලපෙන්නේය. එහෙත්, එසේ ගැලපෙන්නේ එය පරිපූර්ණ කොමියුනිස්ට් ක්‍රමය නොවන බව අපට අමතක නොවේ නම් පමණකි. මාක්ස්ගේ පැහැදිලි කිරීම ඉතා වැදගත් වන්නේ, මෙහිදී ද ඔහු දයලෙක්තික ක්‍රමය, එනම්, සංවර්ධනය පිළිබඳ න්‍යායය, සසංගත ලෙස ගලපාගනිමින් කොමියුනිස්ට් ක්‍රමය ධනපති ක්‍රමය කෙරෙන් සංවර්ධනය වන යමක් ලෙසට සලකා ඇති හෙයිනි. පණ්ඩිත ආචාරයෙන් නිමවාගත්, නැතහොත් ''ගොතාගත්'' නිර්වචනයන් සහ වචන ගැන නිරර්ථක තර්ක (සමාජවාදය යනු කුමක්ද? කොමියුනිස්ට් ක්‍රමය යනු කුමක්ද?) කිරීමෙහි නොයෙදෙන මාක්ස්, ඒ වෙනුවට, කොමියුනිස්ට් ක්‍රමය ආර්ථික වශයෙන් මේරීමට පත්වීමේ අවධි දෙක යනුවෙන් විස්තර කළ හැකි අවස්ථා ගැන විග්‍රහයක් ඉදිරිපත්කරයි.

කොමියුනිස්ට් ක්‍රමයට, එහි පළමු අදියර නැතහොත් පළමු අවධිය වන විටම සම්පූර්ණයෙන්ම මේරූ තත්ත්වයකට පත් වීමට සහ ධනපති ක්‍රමයේ සම්ප්‍රදයයන්ගෙන් නැතහොත් සලකුණුවලින් මුළුමනින්ම නිදහස් වීමට නොපුළුවන. එනිසා කොමියුනිස්ට් ක්‍රමය, එහි පළමු අදියරෙහිදී ''ධනපති අයිතියේ පටු ක්ෂිතිජය තිබෙන්නට හැරීමේ'' වැදගත් ප්‍රපංචය දක්නට ලැබේ. නීතියක නියමයන් පිළිපැදීම ක්‍රියාත්මක කරවීමේ හැකියාව ඇති යන්ත්‍රයක් නොමැති නම්, එම නීතියෙහි අගයක් නොමැති හෙයින් පාරිභෝගික භාණ්ඩ බෙදාහැරීමට අදාළ ධනපති අයිතිය පැවතීමෙන් අනිවාර්‍ය ලෙසම අදහස් වන්නේ ධනපති රාජ්‍යය පවතින බවය.

මෙයින් පෙනෙන්නේ කලක් යන තෙක් කොමියුනිස්ට් ක්‍රමය යටතේ ධනපති අයිතිය පමණක් නොව, ධනපති පංතිය නොමැති නමුත්, ධනපති රාජ්‍යය පවා පවතින බවය!

මෙය පරස්පර විරෝධී කතාවක්, නොහොත්, හුදෙක්ම දයලෙක්තික තුන්තේරවිල්ලක් ලෙස ඇසෙන්නට පිළිවන. මාක්ස්වාදයේ අති ගැඹුරු සන්ධාරය අධ්‍යනය කිරීමට අල්ප මාත්‍ර හෝ වෙහෙසක් නොගත් අය බොහෝ විට එය වටහාගත නොහැකි බවට මෙසේ චෝදනා කරති.

එහෙත් ඇත්ත වශයෙන්ම, ස්වභාව ධර්මය සහ සමාජය යන දෙකෙහිදීම පැරැන්නෙහි ශේෂයන් නවකය තුළ රැකී පවතින බව අපට ජීවිතයේ පියවරක් පියවරක් පාසා හමුවන දෙයකි. එනිසා මාක්ස් කළේ ''ධනපති'' අයිතියේ නෂ්ටාවශේෂයන් කොමියුනිස්ට් ක්‍රමයට හිතුවක්කාර ලෙස ඇතුළත් කිරීමක් නොව, ධනපති ක්‍රමය නැමති ගර්භයෙන් මතුවන සමාජයක් තුළ නොවැළැක්විය හැකි සේ පවතින දේ පෙන්නුම් කිරීමය.

කම්කරු පංතිය, එහි විමුක්තිය සඳහා ධනපතියන්ට විරුද්ධව කරන අරගලයේදී එයට ප්‍රජාතන්ත්‍රවාදය බෙහෙවින් වැදගත්වේ. එහෙත් ප්‍රජාතන්ත්‍රවාදය යනු, නොඉක්මවිය යුතු සීමාවක් නොවන්නේය. එය වනාහි, රදළ ක්‍රමයේ පටන් ධනපති ක්‍රමය දක්වාත්, ධනපති ක්‍රමයේ සිට කොමියුනිස්ට් ක්‍රමය දක්වාත් යන මාර්ගයේ එක් අවධියක් පමණකි.

ප්‍රජාතන්ත්‍රවාදයෙන් සමානාත්මතාවය අදහස් වේ. ප්‍රජාතන්ත්‍රවාදය යනුවෙන් අදහස් කරන්නේ පංති අහෝසි කිරීම බව පෙන්වමින්, අපිනිවැරදි ලෙස එහි අර්ථය නිරූපනය කරන්නෙමු නම්, සමානාත්මතාවය සඳහා නිර්ධන පංතිය කරන අරගලයේ සහ සමානාත්මතාවය සඳහා වූ සටන් පාඨයේ මහත් වැදගත්කම පැහැදිලි වනු ඇත. එහෙත් ප්‍රජාතන්ත්‍රවාදයෙන් අදහස්වන්නේ නාමික සමානාත්මතාවය පමණකි. ඒ අනුව නිෂ්පාදන මාධ්‍යයන් හිමිකම හා සම්බන්ධයෙන් සමාජයේ සියළුම සාමාජිකයන්ට සමානාත්මතාවය දිනාගත් පසු, එනම්, ශ්‍රමය සහ වේතන අතින් සමානාත්මතාවය දිනාගත් පසු, තවදුරටත් ඉදිරියට යාම පිළිබඳ ප්‍රශ්නයට මුහුණ දීමට මිනිස් වර්ගයාට අනිවාරණීය වශයෙන්ම සිදුවේ. නාමික සමානාත්මතාවයේ සිට නියම සමානාත්මතාවය දක්වා, නැතහොත්, ''හැම එකාගෙන්ම ඔහුගේ හැකියාව අනුව, හැම එකාටම ඔහුගේ අවශ්‍යතාවය අනුව'' යන නීතිය ක්‍රියාත්මක කිරීම දක්වා ඉදිරියට යාමේ ප්‍රශ්නයට මුහුණ දීමට සිදුවේ. මිනිස් වර්ගයා මෙම ශ්‍රේෂ්ඨ අරමුණ කරා ලඟා වන්නේ කුමණ අවධි මගින්ද, කුමණ ප්‍රායෝගික පියවරයන් මගින්ද යන්න අපි නොදන්නෙමු. එය අපට දැනගත නොහැකිය. එනමුත්, සමාජවාදය ජීවයක් නැති, දරදඬු, කවදත් එකසේම පවතින ලෙසට නියම කර තිබෙන දෙයකැයි යන සාමාන්‍ය ධනපති සංකල්පය මොන තරම් විශාල බොරුවක්ද යන්න වටහා ගැනීම ඉතාමත් වැදගත්ය. ප්‍රථමයෙන් ජනගහනයෙන් බහුතරයක් හා ඊළඟට මුළු ජනගහනයම හසුවන සේ මහජන

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සහ පෞද්ගලික ජීවිතයේ සෑම අංශයකදීම වේගවත්, සැබෑ ඉදිරිගමනක් ආරම්භ කරන්නේ ඇත්ත වශයෙන්ම සමාජවාදය පමණකි.

ප්‍රජාතන්ත්‍රවාදය යනු රාජ්‍ය ආකෘතියකි. විවිධ රාජ්‍ය ආකෘති අතුරෙන් එකකි. ඒ අනුව සෑම රාජ්‍යයක්ම මෙන් එයද, එක් අතකින් පුද්ගලයන්ට විරුද්ධව සංවිධිත ලෙස, ක්‍රමානුකූල ලෙස යොදගන්නා බලහත්කාරය නියෝජනය කරයි. එහෙත් අනිත් අතට, එය පුරවැසියන්ගේ සමානාත්මතාවය, නැතහොත්, රාජ්‍ය ව්‍යුහය ගැන තීරණය කිරීමේ හා එය පරිපාලනය කිරීමේ සමාන අයිතිය පිළිබිඹු කරයි. මෙයින් ඇතිවන ප්‍රතිඵලය නම්, ප්‍රජාතන්ත්‍රවාදය, එහි කිසියම් අවධියක දී, ධනපති ක්‍රමයට විරුද්ධව විප්ලවීය අරගලයක යෙදී සිටින නිර්ධන පංතිය එකට පෑහීම ප්‍රථමයෙන් කර, ඊළඟට, සමූහාණ්ඩු යන්ත්‍රය පවා ඇතුලත් කොටගත් ධනපති රාජ්‍ය යන්ත්‍රය, ස්ථිර යුද්ධ හමුදාව, පොලීසිය සහ නිලධාරි පෙළැන්තිය පොඩි පට්ටම්කර, සුන්කර, පොළෝ තලයෙන් පිස දැමීමට සහ ඒ වෙනුවට මුළු ජනතාවම සම්බන්ධ කරගත් මිලීෂියා හමුදාවක් ඇති කිරීමට කටයුතු කරන කම්කරුවන්ගේ ස්වරූපය ගත්, වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී, එහෙත්, රාජ්‍ය යන්ත්‍රයක්ම ආදේශ කිරීමට එම පංතියට උපකාර වීමය.

මෙහිදී ''ප්‍රමාණය ගුණය බවට හැරෙයි.'' එවන් පරිමාණයක ප්‍රජාතන්ත්‍රවාදයෙන් අදහස් කෙරෙන්නේ ධනපති සමාජයේ සීමාවන් ඉක්මවා යාම සහ එය සමාජවාදී ලෙස සංවිධානය කිරීමේ ආරම්භය වේ. ඇත්ත වශයෙන්ම සියළු දෙනාම රාජ්‍ය පරිපාලනයට සම්බන්ධ වන්නේ නම්, ධනපති ක්‍රමයට එහි ග්‍රහණය පවත්වා ගත නොහැකි වෙනවා ඇත. අනිත් අතට, ධනපති ක්‍රමයේ සංවර්ධනය නිසා, රාජ්‍ය පරිපාලනයට ''සියළු'' දෙනාම සම්බන්ධ වීම සඳහා ඉඩකඩ සලසන පූර්ව කොන්දේසි නිර්මානය වෙයි. එම පූර්ව කොන්දේසි අතුරෙන් සමහරක් මෙසේය: සියළු දෙනාටම අකුරු දැනුම ඉතාමත් දියුණු ධනපති රටවල් ගණනාකම දැනට මෙය ඉටුවී ඇත. ඊළඟට, තැපැල් සේවයේ, දුම්රිය සේවාවල, විශාල පැක්ටරිවල, විශාල පරිමාණ වාණිජයෙහි, බැංකුවල, ආදීවූ අති විශාල, සංකීර්ණ සමාජමය යන්ත්‍රය මගින් කෝටි සංඛ්‍යාත කම්කරුවන් ''පුහුණු කිරීම සහ විනය සම්පන්න කිරීම'' ආදිය ය.

මෙම ආර්ථික පූර්ව කොන්දේසි ඉටුවී ඇතොත්, ධනපතියන් සහ නිලධාරීන් බලෙන් නෙරපා දැමීමෙන් අනතුරුව, නිෂ්පාදනය සහ බෙදාහැරීමත්, ශ්‍රමය සහ නිෂ්පාදන භාණ්ඩ පිළිබඳ ගිණුම් තැබීමත් පාලනය කිරීමේ කටයුතුවලදී ඔවුන් වෙනුවට වහාම, එක් රැයකින් මෙය ආයුධ සන්නද්ධ කම්කරුවන්ද, ආයුධ සන්නද්ධ මුළු ජනගහනයද ආදේශ කිරීමට යොමු වීමත් ඉතා පහසුය. (පාලනය සහ ගිණුම් තැබීම පිළිබඳ ප්‍රශ්නය, විද්‍යාත්මක ලෙස පුහුණුකළ ඉන්ජිනේරුවරුන්, කෘෂි විද්‍යාඥ-

යන් යනාදීන් ගැන වූ ප්‍රශ්නය සමග එකට පටලවා නොගත යුතුය. මෙම මහත්වරු අද ධනපතියන්ගේ කැමැත්තට කීකරුව වැඩ කරති. හෙට ඔවුන් ඊටත් වඩා හොඳින් ආයුධ සන්නද්ධ කම්කරුවන්ගේ කැමැත්තට කීකරුව වැඩ කරනු ඇත).

ගිණුම් තැබීම සහ පාලනය — කොමියුනිස්ට් සමාජයේ පළමු අදියරෙහි කටයුතු ''අවුලක් නොමැතිව'' ඉටුවීම සඳහා ද, නිසි ලෙස ක්‍රියාත්මක වීම සඳහාද, ප්‍රධාන වශයෙන් අවශ්‍ය දෙය එයයි. සියළුම පුරවැසියන්, ආයුධ සන්නද්ධ කම්කරුවන්ගෙන් යක්ත වූ රාජ්‍යයේ කුලී සේවකයන් බවට පත් කරනු ලැබේ. සියළුම පුරවැසියෝ එකම දේශව්‍යාප්ත රාජ්‍යය නැමති ''සම්මේලයේ'' සේවකයන් සහ කම්කරුවන් වෙති. අවශ්‍ය කෙරෙන එකම දෙය වන්නේ ඔවුන් එක හා සමානව වැඩ කර, තමන්ට වැටෙන නියම වැඩ කොටස ඉටුකර, සමාන වැටුප් ලබාගැනීමය. මේ සඳහා අවශ්‍ය ගිණුම් තැබීම සහ පාලනය ධනපති ක්‍රමය විසින් අතිශයින්ම සරල කරනු ලැබ, ඒවා අසාමාන්‍ය තරම් පහසු වූද, අකුරු දත් ඕනෑම කෙනෙකුට ඉටුකළ හැකිවූ ද, පරිපාලන සහ ලේඛන ගත කිරීමේ, අංක ගණිතයේ නීති හතර දැනගැනීමේ සහ නිසි රිසිට් පත් නිකුත් කිරීමේ කටයුතු බවට පත්ව තිබේ*.

එසේ ගිණුම් තැබීමට හා (දැන් සේවකයන් බවට පරිවර්තනය කර ඇති) ධනපතියන් හා තම ධනපති සිරිත් විරිත් අත් හැරිය නොහැකි වූ බුද්ධිමත් මහත්වරුන් කෙරෙහි එවැනි පාලනයක් ක්‍රියාත්මක කිරීමට ජනතාවගෙන් බහුතරය ස්වාධීනව හා සෑම තැනෙකම කටයුතු පටන් ගත් විට, එය විශ්වීය, සාමාන්‍ය සහ පොදුජන පාලනයක් වනු ඇත. එවිට එයින් ගැලවීමට මඟක් නොමැති වනු ඇත. ඉන් ''පැනයාමට තැනක්'' නොමැති වනු ඇත.

මුළු මහත් සමාජයම, ශ්‍රමය හා වැටුප් අතින් සමානාත්මතාවය පවතින එකම කාර්යාලයක හෝ පැක්ටරියක හෝ ස්වභාවය ගනී.

එහෙත්, ධනපතියන් පරාජය කිරීමෙන් පසු, සූරාකන්නන් බලයෙන් නෙරපා දැමීමෙන් පසු, නිර්ධන පංතිය විසින් මුළු සමාජය විෂයෙහිම ක්‍රියාත්මක කෙරෙන මෙම පැක්ටරි විනය කිසිසේත් අපගේ පරමාදර්ශය හෝ අපගේ අවසාන අරමුණ හෝ නොවේ. එය වූ කලී ධනපති සූරාකෑමේ

---

* රාජ්‍යයේ වඩාත් වැදගත් කර්තව්‍යයන් කම්කරුවන්ම ඉටු කරන ගිණුම් තැබීම සහ පාලනය ලෙසට සරල කළ පසු, එය දේශපාලන රාජ්‍යයක් නොවනු ඇත. එසේම එවිට මහජන කාර්යයන්හි දේශපාලන ස්වභාවය නැතිව ගොස් ඒවා හුදු පරිපාලන කර්තව්‍යයන් වනු ඇත. (ඉහත IV වන පරිච්ඡේදය, 26 කාටස, අරාජිකවාදීන් සමග එංගල්ස්ගේ විවාදය බලන්න).

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

නින්ද අපහාස සහ කැතකුණු සියල්ල ඉවත් කර සමාජය සම්පූර්ණයෙන් පිරිසිදු කිරීම සඳහා සහ තවදුර ප්‍රගතිය සඳහා අවශ්‍ය පියවරක් පමණකි.

සමාජයේ සියළුම සාමාජිකයන්, නැතහොත්, ඉන් අති බහුතරය, රාජ්‍යයේ පරිපාලන කටයුතු තමන්ම කිරීමට උගෙන ගෙන එම වැඩ කටයුතු තමන්ගේම අතට ගත් තැන් පටන්, ඉතා සුළු පිරිසක් වන ධනපතියන්ද, ධනපති සිරිත් විරිත් රැකීමට කැමති ප්‍රභූන් ද, ධනපති ක්‍රමය විසින් බරපතල ලෙස දූෂණයට පත් කරනු ලැබූ කම්කරුවන්ද අවනත කරමින් පාලනය සංවිධානය කළ තැන් පටන්, එසේ කෙරුණු තැන් පටන්, මොන වර්ගයක හෝ ආණ්ඩුවක අවශ්‍යතාවය පහව යන්නට පටන් ගනී. ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් පරිපූර්ණ වූ තරමට ආණ්ඩුවක අනවශ්‍යතාවයද වැඩි වන්නේය. ආයුධ සන්නද්ධ කම්කරුවන්ගෙන් සමන්විත හා ''වචනයේ නියම අර්ථයෙන් තවදුරටත් රාජ්‍යයක් නොවන'' රාජ්‍යය වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී වූ තරමට, රාජ්‍යයේ සෑම ආකෘතියක්ම වඩාත් සීඝ්‍ර ලෙස හැකිළී යන්නේය.

මක්නිසාදයත්, සියළු දෙනාම පරිපාලන කටයුතු කිරීමට උගෙන ගත් සහ ඇත්ත වශයෙන් ස්වාධීන ලෙස සමාජමය නිෂ්පාදනය පරිපාලනය කරන විට, ස්වාධීන ලෙස ගිණුම් තබන විට සහ පිළිලයන්, පොහොසතුන්ගේ පුතුන්, වංචාකාරයන් සහ වෙනත් ''ධනපති සම්ප්‍රදාය ආරක්ෂකයන්'' නතුකර පාලනය කරන විට, මෙම පොදු ජන ගිණුම් තැබීමෙන් සහ පාලනයෙන් බේරී යාම නොසිතිය හැකි තරම් දුෂ්කර වන්නේය. එනිසා දුර්ලභ ගණයේ විශේෂ සිදුවීමක් ලෙසට අයෙක් ඉන් බේරී ගියද, සමහර විට ඔහුට ඒ සමගම අප්‍රමාදව හා තදබල ලෙස දඬුවම් ලැබීමට ඇති ඉඩකඩ (ආයුධ සන්නද්ධ කම්කරුවන් ප්‍රායෝගික මිනිසුන් වන හා හැඟීම් බර බුද්ධිමතුන් නොවන හෙයින් තමන් සමග සෙල්ලම් කිරීමට ඔවුන් කිසිවෙකුට ඉඩ නොදෙනු ඇත) බොහෝ බැවින් ප්‍රජාවේ සරල සහ මූලික නීති පිළිපැදීමේ අවශ්‍යතාවය කල් නොයවාම පුරුද්දක් බවට පත් වනු ඇත.

එවිට කොමියුනිස්ට් ක්‍රමයේ පළමු අදියරෙහි සිට එහි ඉහළ අදියරට පරිවර්තනය වීමත්, ඒ සමග රාජ්‍යය මුළුමනින්ම හැකිළී යාමත් සඳහා දොර සම්පූර්ණයෙන්ම විවෘත වනු ඇත.

හයවැනි පරිච්ඡේදය

අවස්ථාවාදීහු මාක්ස්වාදය කෙළෙසති

සාමාන්‍ය වශයෙන් විප්ලවය පිළිබඳ ප්‍රශ්නය ගැන මෙන්ම, රාජ්‍යය සමාජ විප්ලවය කෙරෙහිත්, සමාජ විප්ලවය රාජ්‍යය කෙරෙහිත් ඇති

සම්බන්ධය පිළිබඳ ප්‍රශ්නය ගැනද දෙවැනි ජාත්‍යන්තරයේ (1889-1914) න්‍යායාචාරීන් සහ ප්‍රකාශකයන් දැක්වූයේ ඉතා අල්ප අවධානයකි. එහෙත්, 1914 දී දෙවැනි ජාත්‍යන්තරය බිඳ වැටීමට හේතු සාධක වූ අවස්ථාවාදයේ ක්‍රමික වර්ධන ක්‍රියාදමයෙහි ඉතාමත් ස්වභාව නිරූපී කරුණ වූයේ, මෙම මිනිසුන් එම ප්‍රශ්නයට එක එල්ලේම මුහුණ පා සිටිය දීම වුවද ඔවුන් එය මඟ හැරීමට හෝ එය නොතකා හැරීමට ප්‍රයත්න දැරීමය.

නිර්ධන පංති විප්ලවයත් රාජ්‍යයත් අතර සම්බන්ධය පිළිබඳ ප්‍රශ්නය මග හැරීම අවස්ථාවාදයෙන් ලාභ ප්‍රයෝජන ලැබූ සහ ඉන් මතු කෙරුණු මග හැරීමක් වූ අතර, එහි ප්‍රතිඵලය වූයේ මාක්ස්වාදය විකෘති කිරීම සහ සම්පූර්ණයෙන්ම කෙළෙසීම බව පොදු වශයෙන් කිව හැකිය.

කෙටියෙන් වුවද, මෙම ඛේද ජනක ක්‍රියාදමය ගැන විස්තර කිරීම පිණිස, අපි මාක්ස්වාදයේ ඉතාමත් ප්‍රමුඛ න්‍යායාචාරීන් වන, ප්ලෙහානව් සහ කෞට්ස්කි ගැන විමසා බලමු.

1. ප්ලෙහානව් හා අරාජිකවාදීන් අතර විවාදය

අරාජිකවාදය හා සමාජවාදය අතර සම්බන්ධය ගැන ප්ලෙහානව් විශේෂ පොත් පිංචක් ලිවේය. ''අරාජිකවාදය සහ සමාජවාදය'' යනුවෙන් නම් කරන ලද එය 1894 දී ජර්මන් බසින් පළ කෙරුණි.

මෙම මාතෘකාව ගැන විචාරණයෙහිදී අරාජිකවාදයට විරුද්ධව කරන සටනෙහි ඉතාමත් හදිසි අවශ්‍යතම සහ දේශපාලන වශයෙන් වැදගත් කරුණ වන විප්ලවය හා රාජ්‍යය අතර සම්බන්ධය ගැන ප්‍රශ්නයත්, සාමාන්‍ය වශයෙන්ම රාජ්‍යය පිළිබඳ ප්‍රශ්නයත් සම්පූර්ණයෙන්ම මග හැරීමට ඔහු වග බලා ගත්තේය! ඔහුගේ පොත පැහැදිලි කොටස් දෙකකට බෙදිය හැක: ඉන් එකක් ඓතිහාසික සහ සාහිත්‍යමය කරුණු අඩංගු කොටසය. ෂ්ටිර්නර්, පෘදෝන් සහ අනෙකුත් අයගේ අදහස්වල ඉතිහාසය සම්බන්ධයෙන් වැදගත් කරුණු එහි අන්තර්ගතය. අනිත් කොටස අශිෂ්ටවාදී ස්වභාවයක් දරයි. අරාජිකවාදියෙක් හා පල්හොරෙක් අතර වෙනසක් නැතැයි යන තේමාව අනුව කෙරෙන බහුභූත විවරණයක් එහි අන්තර්ගතය.

එය විනෝදය දනවන ආකාරයෙන් විෂය ඒකාබද්ධ කිරීමක් වන අතර රුසියානු විප්ලවයේ පූර්වාසන්නය සහ විප්ලව කාලය තුළ ප්ලෙහානව් ගෙනගිය සමස්ත ක්‍රියාකාරීත්වයේම ස්වභාවය නිරූපනය කරන්නක්ද වේ. 1905 හා 1917 අතර කාලයේදී ප්ලෙහානව්, තමා දේශපාලනයේදී ධනපති පංතිය පස්සේ ඇදෙන අර්ධ දෘෂ්ටි නිවේශකයෙකු හා අර්ධ අමනයෙකු බව පෙන්නුම් කළේය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

මාක්ස් සහ එංගල්ස් අරාජිකවාදීන් සමග කළ විවාදවලදී රාජ්‍යය කෙරෙහි විප්ලවයේ ඇති සම්බන්ධය පිළිබඳ ස්වකීය අදහස් ඉතාමත් විස්තරාත්මක ලෙස පැහැදිලි කළහ. මාක්ස්ගේ ''ගෝතා වැඩ පිළිවෙළ ගැන විවේචනය'' නැමති කෘතියට 1891 දී ප්‍රස්ථාවනාවක් ලියූ එංගල්ස්, එහි මෙසේ සඳහන් කළේය: ''අපි'' (එනම් මාක්ස් හා එංගල්ස්) ''එවකට (පළමුවන) ජාත්‍යන්තරයේ හාග් සම්මේලනය පසු කොට අවුරුදු දෙකක්වත් ගෙවා නොසිටි අතර බකුනින් සහ ඔහුගේ අරාජිකවාදීන්ට විරුද්ධව ඉතාමත් දරුණු අරගලයක යෙදී සිටියෙමු.''[42]

අරාජිකවාදීහු පැරිස් කොමියුනය ''තමන්ගේම'' වැඩක් ලෙස, තමන්ගේ ධර්මය සනාථ කරන්නක් බවට අයිතිවාසිකම් කීමේ ප්‍රයත්නයක යෙදී සිටියහ. එසේම, ඔවුහු එයින් ගතයුතු පාඩම් සහ එම පාඩම් ගැන මාක්ස් කළ විග්‍රහයන් සම්පූර්ණයෙන්ම වරදවා වටහා ගත්හ. මෙම පැහැදිලි දේශපාලන ප්‍රශ්නවලට දියයුතු නියම පිළිතුරුවලට කිට්ටුවෙන් යන දෙයක්වත් කීමට අරාජිකවාදය සමත් වී නැත: පැරණි රාජ්‍ය යන්ත්‍රය සුන් කළ යුතුද? එසේ නම් ඒ වෙනුවට ආදේශ කළ යුත්තේ කුමක්ද?

එහෙත්, රාජ්‍යය පිළිබඳ ප්‍රශ්නය මගහරිමින් සහ කොමියුනයට පෙර සහ පසු මාක්ස්වාදයේ සංවර්ධනය නොතකා හරිමින් ''අරාජිකවාදය සහ සමාජවාදය'' ගැන කතා කිරීම අනිවාරණීය ලෙසටම අවස්ථාවාදයට වැටීමය. අවස්ථාවාදයට අන් සියල්ලටම වඩා අවශ්‍යවන්නේ ඉහත සඳහන් කරන ලද ප්‍රශ්න දෙක කිසිසේත් මතු නොකර තැබීමය. එය ඉටු වුවහොත්, එයම අවස්ථාවාදයේ ජයග්‍රහණයක් වේ.

2. කෞට්ස්කි හා අවස්ථාවාදීන් අතර විවාදය

කෞට්ස්කිගේ කෘති අතුරෙන් රුසියානු බසට පරිවර්තනය කර ඇති සංඛ්‍යාව, අන් භාෂාවලට පරිවර්තනය කළ කෘති සංඛ්‍යාවට වඩා ඉතා විශාල බව නිසැකය. කෞට්ස්කිගේ කෘති ජර්මනියට වඩා රුසියාවේ කියවනු ලබන බව සමහර ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් විහිළුවට මෙන් කියන්නේ හේතුවක් නොමැතිව නොවේ. (මුලින් මෙම විහිළුව කළ අය සිතුවාට වඩා බොහෝ ගැඹුරු ඓතිහාසික අර්ථයක් මෙහි ඇති බව අමතර වශයෙන් කියමු. 1905 දී ලෝකයේ හොඳම සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී සාහිත්‍යය සඳහා අසාමාන්‍ය තරම් විශාල සහ පෙර නොවූ විරු ඉල්ලුමක් කරමින්ද, වෙනත් රටවල නොදක්නා ලද තරම් මෙම කෘතිවල පරිවර්තන සහ සංස්කරණ ලබා ගනිමින්ද, රුසියානු කම්කරුවෝ

අසල්වැසි සහ වඩාත් දියුණු රටෙහි අත් දැකීම් අපගේ යෞවන නිර්ධන පංති ව්‍යාපාරය තුළ සිටුවන කලෙක මෙන් කටයුතු කළහ).

කෞට්ස්කි මාක්ස්වාදය ජනප්‍රිය කළ නිසා පමණක් නොව, බර්න්ස්ටයින්ගේ නායකත්වයෙන් යුත් අවස්ථාවාදීන් සමග ඔහු කළ විවාදය නිසාද ඔහු අප රටේ විශේෂ ප්‍රසිද්ධියක් උසුලයි. එසේ වුවද එක කරුණක් අප්‍රසිද්ධය. 1914-1915 කාලයේ උග්‍රතම අර්බුදය සමයේදී, කෞට්ස්කි, ඒ විශ්වාස කළ නොහැකි තරම් නින්ද සහගත අවුල සහ සමාජ-ජාත්‍යාන්මාදවාදය ආරක්ෂා කිරීම නැමති මඩ වගුරට ගසා ගෙන ගියේ කෙසේද යන්න සොයා බැලීමට අපි ඉදිරිපත් වෙමු නම්, අපට එම කරුණ අමතක කළ නොහැකිය. එම කරුණ මෙසේය: ප්‍රංශයේ (මිලෙරාන් සහ ජොරේස්) සහ ජර්මනියේ (බර්න්ෂ්ටයින්) ඉතාමත් ප්‍රමුඛ අවස්ථාවාදීන්ට විරුද්ධව ඉදිරිපත් වීමට පෙර කෞට්ස්කි සැලකිය යුතු තරම් වැනෙන සුලු ගතියක් පෑවේය. 1901-1902 කාලයේ ෂ්ටුට්ගාට්හි පළ කෙරුනු සහ විප්ලවවාදී නිර්ධන පංති අදහස් ප්‍රකාශ කළ මාක්ස්වාදී ''සර්යා''[43] සඟරාවට කෞට්ස්කි සමග විවාදයට එළඹීමටත්, 1900 දී පැරිස්හි පැවැත්වුනු ජාත්‍යන්තර සමාජවාදී සම්මේලනයට[44] ඔහු ඉදිරිපත්කළ එක් සිත් නැති, මගහරින සුලු සහ අවස්ථාවාදීන් සැනසීමට යොමුවූ යෝජනාව ''නම්‍යශීලී'' එකක් ලෙස විස්තර කිරීමටත් සිදුවිය. කෞට්ස්කි බර්න්ස්ටයින්ට විරුද්ධව ඉදිරිපත්වීමට පෙර, ඔහු ඊට නො අඩු පැකිලීමක් දැක්වූ බව ජර්මනියේ පළ කරන ලද කෞට්ස්කිගේ ලිපිවලින් පෙනේ.

එසේ වුවද අතිශයින්ම වැදගත් ප්‍රශ්නය අනෙකකි. අවස්ථාවාදීන් සමඟවූ ඔහුගේ මත භේදයේදීම, ඔහු ප්‍රශ්නය වචනයට නැගූ ආකාරයෙන්ම, ඔහු එය සලකා බැලූ ආකාරයෙන්ම කෞට්ස්කි හරියටම රාජ්‍යය පිළිබඳ ප්‍රශ්නයේදී ක්‍රමානුකූල ලෙස මාක්ස්වාදයෙන් ඉවත් වන බව, ඔහු මාක්ස්වාදයට ද්‍රෝහීවීමේ අළුත්ම අවස්ථාවේ ඉතිහාසය ගැන අධ්‍යයනය කරන විට, අපට පෙනේ.

අවස්ථාවාදයට විරුද්ධව කෞට්ස්කි කළ ''බර්න්ෂ්ටයින් සහ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී වැඩපිළිවෙළ'' නැමති ඔහුගේ ප්‍රථම වැදගත් කෘතිය ගෙන බලමු. කෞට්ස්කි විස්තර සහිත ලෙස බර්න්ෂ්ටයින්ගේ මත නිෂ්ප්‍රභා කරයි. එහෙත් මෙහි ස්වභාව නිරූපී කරුණක් ඇත:

හෙරස්ට්‍රාටියන් අර්ථයෙන් සුප්‍රසිද්ධ බර්න්ෂ්ටයින්ගේ ''සමාජවාදයේ තර්කමූල'' නැමති කෘතියෙන් ඔහු මාක්ස්වාදයට ''බ්ලන්කීවාදය'' පිළිබඳ චෝදනාව නගයි. (මෙය ඉන් පසුව රුසියාවේ අවස්ථාවාදීන් සහ ලිබරල් ධනපතියන් වාර දහස් ගණනක් විප්ලවවාදී මාක්ස්වාදීන්ට, බෝල්ෂෙවික් වරුන්ට විරුද්ධව නැගූ චෝදනාවකි). මෙහිදී මාක්ස්ගේ ''ප්‍රංශයේ සිවිල් යුද්ධය'' ගැන විශේෂයෙන් විචාරණය කරන බර්න්ෂ්ට-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

යින්, කොමියුනයෙන් උගත යුතු පාඩම් ගැන මාක්ස් දැරූ අදහස් ප්රූදෝන්ගේ අදහස් සමග එක සමාන බව ඔප්පු කිරීමේ,අප දුටු මෙන් අසාර්ථකවූ, වෑයමක යෙදෙයි. ''කොමියුනිස්ට් ප්‍රකාශනයට'' 1872 දී ලියූ පෙරවදනෙහි මාක්ස් අවධාරණය කළ නිගමනය කෙරෙහි බර්න්ෂ්ටයින් විශේෂ අවධානයක් යොමු කරයි. එම නිගමනයෙහි මෙසේ සඳහන්ය: ''සඳ නිමකර තිබෙන රාජ්‍ය යන්ත්‍රය එසේම අත්පත් කරගෙන කම්කරු පංතියට එය තමන්ගේ අරමුණු ඉටු කර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ නො හැකිය.''

මෙම ප්‍රකාශයෙන් බර්න්ෂ්ටයින් කොතරම් ''සතුටු'' වූයේද යත්, ඔහුගේ පොතෙහි තුන් පලකම එය සඳහන් කරමින් ඔහු එයට ඉතාමත් විකෘති හා අවස්ථාවාදී ආකාරයෙන් අර්ථ දුන්නේය.

අප දැක ඇති ලෙසට, මාක්ස් අදහස් කළේ කම්කරු පංතිය මුළු රාජ්‍ය යන්ත්‍රයම සුනු විසුනු කර, කඩා, පොඩිකර (Sprengung, පිපිරීම — එංගල්ස් යෙදූ වචනය එයයි) දැමිය යුතු බවය. එහෙත් බර්න්ෂ්ටයින් කියන දෙයින් පෙන්නුම් කරන්නේ, මාක්ස්ගේ මෙම වචන, බලය අල්ලා ගැනීමේදී වැඩි විප්ලවවාදී උද්වේගයක් දැක්වීමට විරුද්ධව කම්කරු පංතියට දෙන අවවාදයක් වන බවකි.

මාක්ස්ගේ අදහසට මීට වඩා කොරසැඩි, මීට වඩා විරූපී විකෘතියක් දීම ගැන සිතන්නටවත් නොහැකිය.

එසේ වූ කළ බර්න්ෂ්ටයින් වාදය සවිස්තර ලෙස නිෂ්ප්‍රභා කිරීමට කෞට්ස්කි අනුගමනය කළ මාර්ගය කුමක්ද?

මෙම කරුණෙහිදී අවස්ථාවාදය විසින් මාක්ස්වාදය අන්ත විකෘතියට පත් කරනු ලැබීම ගැන විග්‍රහ කිරීමෙන් ඔහු වැලකුණේය. මාක්ස්ගේ සිවිල් යුද්ධය නැමති කෘතියට එංගල්ස් ලියූ පෙරවදනෙහි එන ඉහත සඳහන් ඡේදය ගෙනහැර දැක්වූ ඔහු කීවේ, මාක්ස්ගේ අදහස අනුව සඳ නිමකළ රාජ්‍ය යන්ත්‍රය එසේම අත්පත් කරගෙන කම්කරු පංතියට එහි උවමනාවන් සඳහා එය යොදා ගත නොහැකි නමුත්, සාමාන්‍ය වශයෙන් කියතොත් ඔවුන්ට එය අත්පත් කර ගත හැකි බවය. ඔහු ඒ ගැන කීවේ එපමණ ය. මාක්ස්ගේ අදහස ලෙසට බර්න්ෂ්ටයින් ඉදිරිපත් කළේ මාක්ස්ගේ අදහසට සම්පූර්ණයෙන්ම ප්‍රතිවිරුද්ධ දෙය බවත්, 1852 පටන්ම මාක්ස් නිර්ධන පංති විප්ලවයේ කර්තව්‍යය ලෙසට ඉදිරිපත් කළේ රාජ්‍ය යන්ත්‍රය ''සුන් කිරීම''[45] බවත් පෙන්වා දීමට කෞට්ස්කි වචනයක්වත් කීවේ නැත.

මෙහි ප්‍රතිඵලය වූයේ, නිර්ධන පංති විප්ලවයේ කර්තව්‍යයන් පිළිබඳ විෂය ගැන මාක්ස්වාදය සහ අවස්ථාවාදය අතර ඇති ඉතා වැදගත් වෙනස කෞට්ස්කි විසින් නොසලකා හරිනු ලැබීමය!

බර්න්ෂ්ටයින්ට ''විරුද්ධව'' ලියමින් කෞට්ස්කි කීවේ ''නිර්ධන පංති ආඥාදායකත්වය හා සම්බන්ධ ප්‍රශ්නය විසඳීම අපට බියක් නැතිව අනාගතයට තැබිය හැකිය'' යනුයි. (පිටු 172, ජර්මන් සංස්කරණය).

මෙය බර්න්ෂ්ටයින්ට විරුද්ධ විවාද කිරීමක් නොව ඔහුගේ අදහසට ඉඩ දීමකි, අවස්ථාවාදයට යටත් වීමකි. එසේ කියන්නේ, නිර්ධන පංති විප්ලවයේ කර්තව්‍යයන් පිළිබඳ මූලික ප්‍රශ්න සියල්ලම ''බියක් නැතිව අනාගතයට තැබීමට'' වැඩි කිසිවක් දැනට අවස්ථාවාදය විසින් ඉල්ලනු නොලබන හෙයිනි.

1852 පටන් 1891 දක්වාම, නැතහොත්, අවුරුදු හතළිහක් තිස්සේම මාක්ස් හා එංගල්ස් නිර්ධන පංතියට උගැන්වූයේ, එය රාජ්‍ය යන්ත්‍රය සුන් කර දැමිය යුතු බවය. නමුත් 1899 දී, අවස්ථාවාදීන් මෙම කරුණෙහි දී මාක්ස්වාදයට ද්‍රෝහී වනු දුටු කෞට්ස්කි, රාජ්‍ය යන්ත්‍රය සුන් කිරීම අවශ්‍යද යන ප්‍රශ්නය වෙනුවට, එය විනාශ කිරීමේ නියත ආකෘති පිළිබඳ ප්‍රශ්නය වංචනික ලෙස ආදේශ කර ඊ ළඟට නියත ආකෘති කල් තබා දැනගත නොහැකිය යන ''විතර්කයට ඉඩ නොදෙන'' (සහ පුහු) අමන සත්‍යය පිටුපස සැඟවුණේය!!

විප්ලවයට කම්කරු පංතිය පුහුණු කිරීමේ නිර්ධන පංති පක්ෂයේ කර්තව්‍යය කෙරෙහි දක්වන ආකල්පය අතින්, මාක්ස් හා කෞට්ස්කි අතර විශාල පරතරයක් ඇත.

ඊළඟට කෞට්ස්කිගේ වඩාත් පැසුණු කෘතියක් ගෙන බලමු. එයද බොහෝ දුරට අවස්ථාවාදී වැරදි මත බිඳ හෙළීමට මිඩංගු කර ඇත. එම පොත් පිංචෙහි නම ''සමාජ විප්ලවය'' යනුයි. මෙම පොත් පිංචෙහි තම විශේෂ තේමාව වශයෙන් කතුවරයා තෝරා ගත්තේ ''නිර්ධන පංති විප්ලවය'' සහ''නිර්ධන පංති පාලනය'' ය. ඔහු එයින් ඉතා වැදගත් කරුණු රැසක් ඉදිරිපත් කළ නමුත්, රාජ්‍යය පිළිබඳ ප්‍රශ්නය මගහැරියේය. පොත මුළුල්ලේම කතුවරයා රාජ්‍ය බලය දිනා ගැනීම ගැන කියන නමුත්, ඊට වඩා යමක් නොකියයි. එයින් පෙනෙන්නේ අවස්ථාවාදීන්ට සහනයක් සලසන, එනම්, රාජ්‍ය යන්ත්‍රය විනාශ නොකර බලය අල්ලා ගත හැකි බව පිළිගන්නා සූත්‍රයක් ඔහු තෝරාගත් බවයි. ''කොමියුනිස්ට් ප්‍රකාශනයේ[46] වැඩ පිළිවෙළෙහි ''කල් ඉක්මවූ'' කරුණක් ලෙසට මාක්ස් 1872 දී සඳහන් කළ දෙයටම කෞට්ස්කි 1902 දී නැවත පණදෙයි.

''සමාජ විප්ලවයේ ආකෘති සහ ආයුධ'' වෙනුවෙන් පොතෙහි විශේෂ කොටසක් මිඩංගු කර තිබේ. පොදුජන දේශපාලන වැඩ වර්ජන ගැන, සිවිල් යුද්ධය ගැන සහ වර්තමානයේ විශාල රාජ්‍යයෙහි බල මහිමයේ උපකරණ වන නිලධාරි පෙළැන්තිය හා යුද්ධ හමුදාව ගැන, කෞට්ස්කි

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

මෙහි සඳහන් කරයි. එහෙත් දැනටමත් කොමියුනය කම්කරුවන්ට උගන්වා ඇති දේ ගැන ඔහු වචනයක් හෝ නොකියයි. රාජ්‍යය කෙරෙහි ''මිථ්‍යා මතික පූජනීයත්වයක්'' දැක්වීම ගැන එංගල්ස් විශේෂයෙන්ම ජර්මන් සමාජවාදීන්ට අවවාද කළේ හේතු විරහිතව නොවන බව මෙයින් පෙනේ.

කෞට්ස්කි විෂය කරුණ ගැන මෙසේ කියයි: ''ජයග්‍රාහී නිර්ධන පංතිය ප්‍රජාතන්ත්‍රවාදී වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනු ඇත.'' ඊළඟට ඔහු එම වැඩ පිළිවෙළෙහි වගන්ති ඉදිරිපත් කරයි. එහෙත් ධනපති ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවට නිර්ධන පංති ප්‍රජාතන්ත්‍රවාදය ආදේශ කිරීම සම්බන්ධයෙන් 1871 වර්ෂයෙන් සැපයුනු නව කරුණු ගැන ඔහු වචනයකුදු නොකියයි. කෞට්ස්කි, පහත දැක්වෙන වැනි ''සිත් කාවදින සේ ඇසෙන'' වැදගැම්මකට නැති කියමන් යොදා ගනිමින් මෙම ප්‍රශ්නය ගැන විමසීම කෙළවර කරයි:

''වර්තමාන තත්වයන් යටතේ අප තවමත් ආධිපත්‍යත්වයට පත් නොවනු ඇති බව නොකීවත් පැහැදිලි කරුණකි. දීර්ඝ සහ ගැඹුරට දිවෙන අරගල අවශ්‍ය වන බව විප්ලවයෙන්ම ඇති කෙරෙන පූර්ව කල්පනයකි. එම අරගල නිසාම අපගේ වර්තමාන දේශපාලන සහ සමාජ ව්‍යුහය වෙනස් වනු ඇත.

මෙය නම් නොකීවත් පැහැදිලි බවට සැකයක් නොමැත. එය අශ්වයෝ ඕට්ස් කති, නැතහොත් වොල්ගා ගඟ කැස්පියන් මුහුදට ගලයි, යන්න වැනි කියමනකි. එහෙත් මෙහිදී, විප්ලවවාදී නිර්ධන පංතියට ඉතාමත් වැදගත්වන ප්‍රශ්නයක් මග හැරීමට, එනම්, ඉහත සිදු වූ නිර්ධන පංති නොවන විප්ලවවලින් වෙනස් වන ආකාරයට, නිර්ධන පංතියේ විප්ලවය රාජ්‍යය සම්බන්ධයෙන් හා ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන් වූ කළ ගැඹුරට දිවෙන එකක් වන්නේ කෙසේද යන ප්‍රශ්නය මගහැරීමට, ''ගැඹුරට දිවෙන'' අරගල පිළිබඳ පුහු සහ ගර්වාන්විත කියමන යොදා ගෙන තිබේ. එය කණගාටුවට හේතුවකි.

කෞට්ස්කි අවස්ථාවාදයට විරුද්ධව බලවත් ලෙස යුද්ධ ප්‍රකාශ කරන බව වචනයෙන් කියමින්, ''විප්ලවය පිළිබඳ අදහසෙහි'' වැදගත්කම අවධාරණය කරතත්, (විප්ලවයේ නියත පාඩම් කම්කරුවන්ට උගැන්වීමට අයෙක් බියවන කල මෙම ''අදහස'' කොතරම් වටනේද?) නැතහොත්, ''අන්සියල්ලටම පෙර විප්ලවවාදී විඥානවාදය'' යනුවෙන් කියතත්, එසේත් නැතහොත්, ඉංග්‍රීසි කම්කරුවන් දැන් ''සුළු ධනපතියන්ට වඩා හොඳ නොවේ'' යයි ප්‍රකාශ කරතත්, ඔහු මෙම ඉතා වැදගත් කාරණයෙහිදී අවස්ථාවාදයට ඉඩ දෙයි.

කෞට්ස්කි මෙසේ ලියයි: ''සමාජවාදී සමාජය තුළ එකට නිලධාරිවාදී (??), වෘත්තීය සමිතිවාදී, සමුපකාර සහ පුද්ගලික යන විවිධාකාර ව්‍යවසායයන් පැවතිය හැකිය. ... නිදසුනක් ලෙසට නිලධාරිවාදී (??) සංවිධානය නොමැතිව පැවතිය නොහැකි දුම්රිය සේවය වැනි ව්‍යවසායයන් ඇත. මෙහිදී ප්‍රජාතන්ත්‍රවාදී සංවිධානය පහත සඳහන් හැඩය ගැනීමට ඉඩ තිබේ: කම්කරුවන් තෝරා පත් කරන නියෝජිතයන් යම්කිසි පාර්ලිමේන්තුවක් මෙන් සැදෙන අතර එම සංවිධානය වැඩ රෙගුලාසි ස්ථාපිත කරමින් නිලධාරිවාදී යන්ත්‍රයේ කළමනාකරණ කටයුතු අධීක්ෂණය කරයි. අන් ව්‍යවසායයන්ගේ කළමනාකරණ කටයුතු වෘත්තීය සමිතිවලට පැවරීමද, තවත් ඒවා සමුපකාර ව්‍යවසායයන් බවට පත් කිරීමද සුදුසුය.''

මෙම තර්කය සාවද්‍යය. කොමියුනයෙන් ලද පාඩම් නිදර්ශන කොට ගනිමින් මාක්ස් සහ ඒංගල්ස් හැත්තෑ ගණන්වලදී කළ පැහැදිලි කිරීම සමග සසඳා බලන කළ, මෙය පියවරක් පස්සට තැබීමකි.

අවශ්‍ය යයි කියන ''නිලධාරිවාදී'' සංවිධානය සම්බන්ධයෙන් වූ කළ දුම්රිය සේවයත්, වෙනත් ඕනෑම මහා පරිමාණ යන්ත්‍ර කර්මාන්තයකුත්, ඕනෑම පැක්ටරියකුත්, විශාල වෙළෙඳ සැලකුත්, නැතහොත්, මහා පරිමාණ ධනපති කෘෂිකාර්මික ව්‍යවසායකුත් අතර කිසිම වෙනසක් නැත. මෙම ව්‍යවසායයන් සියල්ලෙහිම කාර්මික ශිල්පය අනුව ඉතාමත් දැඩි විනයක්ද, තමන්ට පැවරුණු කාර්යය සෑම අයෙක් විසින්ම ඉතාමත් නිවැරදි ලෙස ඉටු කරනු ලැබීමද අවශ්‍ය වේ. එසේ නොවුවහොත්, මුළු ව්‍යවසායයම නවතිනු ඇත. නැතහොත් යන්ත්‍රවලට හෝ නිමි භාණ්ඩවලට අලාභ හානි සිදුවනු ඇත. මේ සියළු ව්‍යවසායවලම කම්කරුවන් ''තෝරා පත්කරන නියෝජිතයන් කිසියම් පාර්ලිමේන්තුවක් මෙන් සැදෙනු'' ඇති බව සැබවි.

එහෙත් මෙහි වැදගත් කාරණය නම්, මෙම ''කිසියම් පාර්ලිමේන්තුව'' ධනපති පාර්ලිමේන්තු ආයතනයේ අර්ථයන් පාර්ලිමේන්තුවක් නොවන බවය. වැදගත් කරුණ නම්, ධනපති පාර්ලිමේන්තුවාදයේ සීමා ඉක්මවා නොයන චින්තනයක් ඇති කෞට්ස්කි සිතන ලෙසට, මෙම ''කිසියම් පාර්ලිමේන්තුව'' හුදෙක් ''වැඩ රෙගුලාසි ස්ථාපිත කරමින් නිලධාරි යන්ත්‍රයේ කළමණාකාර කටයුතු අධීක්ෂණය'' පමණක් නොකරන බවය. සමාජවාදී සමාජයේදී, කම්කරු නියෝජිතයන්ගෙන් සමන්විත ''කිසියම් පාර්ලිමේන්තුව'' වැඩ රෙගුලාසි ස්ථාපිත කරමින් ''යන්ත්‍රයේ'' කළමනාකරණය අධීක්ෂණය'' කරන බව සැබෑ නමුත්, මෙම යන්ත්‍රය ''නිලධාරිවාදී'' නොවනු ඇත. දේශපාලන බලය දිනා ගැනීමෙන් පසු කම්කරුවෝ පැරණි නිලධාරිවාදී යන්ත්‍රය සුන් කරති; එය අත්තිවාරම දක්වාම බිඳ දමති; එය පොළොවට සමතලා කරති. ඔවුන් ඒ වෙනුවට එම කම්කරුවන් සහ වෙනත් සේවකයන්ගෙන් සමන්විත වෙනත් යන්ත්‍රයක් ආදේශ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කරන අතර, එම කම්කරුවන් හා සේවකයන් නිලධාරිවාදීන් බවට පරිවර්තනය වීමට විරුද්ධව එක් වරම පියවර ගනු ඇත. මාක්ස් සහ එංගල්ස් විස්තර සහිත ලෙස දක්වා ඇති එම පියවරයන් මෙසේය: 1) තෝරාපත් කිරීම පමණක් නොව, ඕනෑම අවස්ථාවක ඉවත්කිරීම; 2) වැටුප කම්කරු වැටුපට වැඩි නොවීම; 3) සියළු දෙනාම කාලයකට ''නිලධාරිවාදීන්'' වන සේ සහ එනිසා කිසිවෙකුට නිලධාරියෙක් වීමට නොහැකි වන සේ, සියළු දෙනා විසින්ම කෙරෙන පාලනය හා අධීක්ෂණය ක්‍රියාත්මක කිරීම.

''කොමියුනය පාර්ලිමේන්තු මණ්ඩලයක් නොව වැඩ කරන, එක්වරම විධායකයක් සහ ව්‍යවස්ථාදායකයක් වන මණ්ඩලයක්''[47] වී යයි කී මාක්ස්ගේ වචන ගැන කෞට්ස්කි කිසි කලෙකත් සිතාබලා නැත.

ප්‍රජාතන්ත්‍රවාදය (ජනතාව සඳහා නොවේ) නිලධාරි පෙළැන්තිය සමග (ජනතාවට විරුද්ධව) සම්බන්ධ කරන ධනපති පාර්ලිමේන්තුවාදයද, නිලධාරිවාදය මුලින් කපා හෙළීමට වහාම පියවර ගන්නා සහ මෙම පියවරයන් අවසානය දක්වා කරගෙන යාමෙහි, නිලධාරි පෙළැන්තිය අහෝසි කිරීමෙහි සහ ජනතාව සඳහා සම්පූර්ණ ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කිරීමෙහි සමත් නිර්ධන පංති ප්‍රජාතන්ත්‍රවාදයද අතර වෙනස කෞට්ස්කිට කිසිසේත් වැටහී නැත.

කෞට්ස්කි රාජ්‍යය කෙරෙහි ඒ පැරණි ''මිථ්‍යා මතික පූජනීයත්වයම'' දක්වන අතර නිලධාරි පෙළැන්තිය කෙරෙහි ''මිථ්‍යාමතික විශ්වාසක්'' තබයි.

අවසාන වශයෙන්, කෞට්ස්කි අවස්ථාවාදීන්ට විරුද්ධව ලියූ හොඳම පොත වන ''බලයට මාවත'' ගෙන බලමු. (එය රුසියානු බසින් පළ නොවිනැය සිතමි. එයට හේතුව එය පළ කෙරුණේ අප රටේ ප්‍රතිගාමීත්වය ඉහළම අවස්ථාවට නැග තිබුණු 1909[48] වර්ෂයේ බැවිනි). මෙම පොත, 1899 දී බර්න්ෂ්ටයින්ට විරුද්ධව ලියන ලද පොත මෙන් පොදු වශයෙන් විප්ලවවාදී වැඩ පිළිවෙළ ගැන ලියවුනක් නොවන නිසාද, විප්ලවය සිදුවන කාලය ගැන නොතකා සමාජ විප්ලවය ගැන ලියවුන 1902 වර්ෂයේ ''සමාජ විප්ලවය'' මෙන් නොවන නිසාද, එය ඉදිරියට තැබූ විශාල පියවරක් වේ. එය ලියා ඇත්තේ ''විප්ලවයේ යුගය'' ආරම්භ වෙමින් පවතින බව පිළිගැනීමට අපට බල කරන තත්ත්වයන් ගැනය.

මේ හා සම්බන්ධයෙන් විශේෂයෙන් වැදගත්කාර්ය කොටසක් ඉටු කරන පංති සතුරුතාවයන් උග්‍රවීමු වෙත සහ අධිරාජ්‍යවාදය වෙත කතුවරයා ඒකාන්ත ලෙස පෙන්නුම් කරයි. බටහිර යුරෝපයේ ''1789-1871 විප්ලවීය කාල පරිච්ඡේදයන්'' පසුව, 1905 දී නැගෙනහිර එවැනි කාල පරිච්ඡේදයක් ආරම්භ වී යයි ඔහු කියයි. භයංකර වේගයකින් ලෝක යුද්ධයක් ලඟාවෙයි. ''එයට (නිර්ධන පංතියට) දැන් අකල් විප්ලවය ගැන කතා කළ නොහැකිය.'' ''අප විප්ලවීය කාල පරිච්ඡේදයකට පා තබා ඇත්තේමු.'' විප්ලවීය යුගය ආරම්භ වෙමින් පවතී.''

මෙම ප්‍රකාශයන් ඉතාමත් පැහැදිලිය. අධිරාජ්‍යවාදී යුද්ධයට පෙර ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් පොරොන්දු වූයේ කුමණ ආකාරයකින් කටයුතු කිරීමටද යනුත්, යුද්ධය ආරම්භවූ පසු, කෞට්ස්කිද ඇතුළුව ඔවුන් කිඳා බැස්සේ පිරිහීමේ කුමණ පාතාලයකටද යනුත්, සසඳා බැලීම සඳහා මිම්මක් ලෙසට කෞට්ස්කිගේ මෙම පොත ප්‍රයෝජනවත් විය යුතුය. ''අප (එනම් ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්) ඇත්ත වශයෙන් දරන තත්ත්වයට වඩා මැදහත් ස්වභාවයක් ගන්නා බවක් පහසුවෙන් පෙනී යාමේ අන්තරාය වර්තමාන තත්ත්වය තුළ ගැබ්ව ඇතැ'' යි සමාලෝචනයට භාජන වී ඇති පොතෙහි කෞට්ස්කි ලීවේය. ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය පෙනෙන්නට තිබුණාට වඩා බෙහෙවින් මැදහත් හා අවස්ථාවාදී වූ බව යථාර්ථයෙන් ඔප්පු විය!

කෞට්ස්කි කී පරිදි ''දේශපාලන විප්ලවය'' ගැන විශ්ලේෂණයක් කිරීමට කැප කරන ලද මෙම පොතෙහි, විප්ලවයේ යුගය දැනටමත් ආරම්භ වී ඇතැයි යනුවෙන් ඔහු ඒකාන්ත ලෙස ප්‍රකාශ කර ඇතත්, ඔහු නැවතත් රාජ්‍යය පිළිබඳ ප්‍රශ්නය සම්පූර්ණයෙන්ම මඟ හැරියේ තම ස්වභාවය වඩාත් හොඳින් පෙන්වමිනි.

මෙසේ ප්‍රශ්නයෙන් පැන යාම, ප්‍රශ්නය අත්හැර දැමීම සහ දෙපැත්තට ඇදීම එකට එකතු වූ කල, එය සම්පූර්ණයෙන්ම අවස්ථාවාදයට හැරීමක් විය. අපි ඒ ගැන දැන් විමසා බැලිය යුත්තෙමු.

සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ නියෝජිත කෞට්ස්කි මෙසේ කී සැටියක් පෙනේ: මම විප්ලවවාදී අදහස් පිළිගන්නෙමි (1899); අන් සියල්ලටම වඩා මම නිර්ධන පංතියේ සමාජ විප්ලවයේ අනිවාරණීය භාවය පිළිගන්නෙමි (1902) විප්ලව පිළිබඳ නව යුගයක් උදාවී ඇති බව මම පිළිගනිමි (1909); එහෙත්, රාජ්‍යය හා සම්බන්ධයෙන් නිර්ධන පංති විප්ලවයට පැවරෙන කර්තව්‍යයන් පිළිබඳ ප්‍රශ්නය මතු කරනු ලබන නිසා, මම, 1852 තරම් ඈත කාලයක මාක්ස් කී දෙය නොපිළිගන්නා බව කියන්නෙමි (1912).

කෞට්ස්කි පනෙකුක් සමග කළ විවාදයේදී ප්‍රශ්නය ඉදිරිපත් කරන ලද්දේ මෙම නිරනුමාන ආකාරයෙනි.

3. කෞට්ස්කි හා පනෙකුක් අතර විවාදය

කෞට්ස්කිට විරුද්ධ වීමේදී පනෙකුක් ඉදිරිපත් වූයේ රෝසා ලුක්සෙම්බුර්ග්, කාල් රාදෙක් සහ වෙනත් අය ඇතුලත් ''වාම රැඩිකල්''

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

උපනතියේ නියෝජිතයෙකු ලෙසට ය. විප්ලවවාදී උපක්‍රම වෙනුවෙන් සටන් කළ ඔවුහු සියළු දෙනාම කෞට්ස්කි ගැන එකම අදහසක් දැරූහ. කෞට්ස්කි මාක්ස්වාදය සහ අවස්ථාවාදය අතර ප්‍රතිපත්ති විරහිතව එහා මෙහා වැනෙමින් සිටි ''මධ්‍යස්ථ පිරිස'' පැත්තට යමින් සිටි බව ඔවුහු විශ්වාස කළහ. මෙම අදහස සම්පූර්ණයෙන්ම නිවැරදි බව යුද්ධයෙන් ඔප්පුවිය. යුද්ධයේදී මෙම ''මධ්‍යස්ථ'' (සාවද්‍ය ලෙස මාක්ස්වාදී යයි කියන ලද) උපනතියේ, නැතහොත්, කෞට්ස්කිවාදයේ පිළිකුල් සහගත කාලකණ්ණි ස්වභාවය සම්පූර්ණයෙන්ම හෙළිදරව් විය.

රාජ්‍යය හා සම්බන්ධ ප්‍රශ්නය ගැන සඳහන් කරමින් ''පොදුජන සටන සහ විප්ලවය'' යන සිරස්තලය යටතේ ලිපියක් ("Neue Zeit" 1912 වෙළුම XXX, 2) ලියූ පනෙකුක් කෞට්ස්කිගේ ආකල්පය ගැන එහි විස්තර කළේ ''අකර්මණ්‍ය රැඩිකල්වාදයක'' හා ''අක්‍රියාශීලී අපේක්ෂකත්වයේ න්‍යායික'' ආකල්පයක් ලෙසටය. ''කෞට්ස්කි විප්ලවයේ ක්‍රියාදමය දැකීම ප්‍රතික්ෂේප කරන්නේය'' යි පනෙකුක් ලීවේය (පිටු 616). ප්‍රශ්නය මේ ආකාරයෙන් ඉදිරිපත් කිරීමෙන්, පනෙකුක් අප උනන්දුවන කරුණ වෙත ළඟාවූයේය. එය නම් රාජ්‍යය හා සම්බන්ධයෙන් නිර්ධන පංති විප්ලවයට පැවරෙන කර්තව්‍ය පිළිබඳ ප්‍රශ්නයයි.

ඔහු මෙසේ ලීවේය: ''නිර්ධන පංතියේ අරගලය, හුදෙක් රාජ්‍ය බලය සඳහා ධනපති පංතියට විරුද්ධව කරන අරගලයක් නොවේ. එය රාජ්‍ය බලයට විරුද්ධව කරන අරගලයකි... මෙම නිර්ධන පංති විප්ලවයේ සන්ධාරය යනු, නිර්ධන පංති බලයේ ආම්පන්න ආධාර කොට ගනිමින් රාජ්‍ය බලයේ ආම්පන්න විනාශකර විසුරුවා හැරීම (Auflösung) වන්නේය (පිටු 544). මෙම අරගලය නතර වන්නේ, එහි ප්‍රතිඵලයක් ලෙසට රාජ්‍ය සංවිධානය සම්පූර්ණයෙන්ම විනාශ වූ පසු පමණකි. එවිට බහුතරයේ සංවිධානය, පාළක අල්පතරයේ සංවිධානය විනාශ කිරීයෙන්, ස්වකීය උසස් බව පෙන්නුම් කළ තත්වයෙහි සිටිනු ඇත.'' (පිටු 548).

පනෙකුක් ඔහුගේ අදහස ඉදිරිපත් කිරීමට උපයෝගි කරගත් යෙදුම් කෙරෙහි බරපතළ දුර්වලකම් ඇත. එනමුත් එහි අර්ථය පැහැදිලිය. එසේම කෞට්ස්කි ඊට විරුද්ධව කරුණු ඉදිරිපත් කළ ආකාරය කුතුහලය අවුස්සන සුලුය.

කෞට්ස්කි මෙසේ ලීවේය: ''සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් සහ අරාජිකවාදීන් අතර මෙතෙක් පැවති ප්‍රතිප්‍රත්‍යය නම්, මුලින් කී අය රාජ්‍ය බලය දිනාගැනීමටත් පසු කී අය එය විනාශකිරීමටත් අපේක්ෂා කිරීමය. මේ දෙකම කිරීමට උවමනා වී තිබේ'' (පිටු 724).

පනෙකුක්ගේ විස්තර විභාගය, නියත ස්වභාවය හා නිවැරදිභාවය අතින් අඩු නමුත්, එමෙන්ම, ඔහුගේ ලිපියෙහි, වෙනත්, වර්තමාන විෂයට

අදාළ නැති, දුර්වලකම් ඇති නමුත්, කෞට්ස්කි හරියටම අල්ලා ගත්තේ මතු කළ ප්‍රතිපත්තිමය කාරණය ය. තවද, මෙම මූලික ප්‍රතිපත්තිමය කරුණෙහිදී කෞට්ස්කි මාක්ස්වාදී ස්ථාවරය සම්පූර්ණයෙන්ම අත්හැර දමා, සම්පූර්ණයෙන්ම අවස්ථාවාදය පැත්තට ගියේය. ඔහු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් සහ අරාජිකවාදීන් අතර වෙනස පෙන්වා ඇති ආකාරය සම්පූර්ණයෙන්ම වැරදිය. ඔහු කරන්නේ මාක්ස්වාදය සම්පූර්ණයෙන්ම පිරිහෙළීමක් හා විකෘති කිරීමකි.

මාක්ස්වාදීන් හා අරාජිකවාදීන් අතර ඇති වෙනස මෙයයි: 1) මාක්ස්වාදීහු රාජ්‍යය සම්පූර්ණයෙන්ම අහෝසි කිරීමට අරමුණු කරන අතරම, මෙය සාර්ථක කරගත හැක්කේ සමාජවාදී විප්ලවය විසින් පංති අහෝසි කිරීමෙන් පසුව, රාජ්‍යය හැකිළී යාමට මග සලසමින් සමාජවාදය පිහිටුවීමේ ප්‍රතිඵලයක් වශයෙනැයි යන්න පිළිගනිති. රාජ්‍යය අහෝසි කළ හැක්කේ කුමණ කොන්දේසි යටතේද යන්න නොවටහාගත් අරාජිකවාදීහු එක රැයකින් රාජ්‍යය අහෝසි කිරීමට අපේක්ෂා කරති. 2) නිර්ධන පංතිය දේශපාලන බලය දිනාගත් පසු පැරණි රාජ්‍යය සම්පූර්ණයෙන්ම විනාශ කළ යුතු බවත්, ඒ වෙනුවට කොමියුනයේ ආදර්ශය අනුව යන ආයුධ සන්නද්ධ කම්කරුවන්ගේ සංවිධානයකින් සමන්විත රාජ්‍යයක් ආදේශ කළ යුතු බවත්, මාක්ස්වාදීහු පිළිගනිති. අරාජිකවාදීහු රාජ්‍යය විනාශ කළ යුතු බව තරයේ කියන නමුත්, නිර්ධන පංතිය ඒ වෙනුවට ආදේශ කළ යුත්තේ කුමක්ද යන්න හා එය එහි විප්ලවවාදී බලය කෙසේ පාවිච්චි කළ යුතුද යන්න ගැන ඉතාමත් ව්‍යාකුල අදහසක් ඇතිව සිටිති. විප්ලවවාදී නිර්ධන පංතිය රාජ්‍ය බලය පාවිච්චි කළ යුතුය යන අදහස පවා අරාජිකවාදීන් විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඔවුහු විප්ලවවාදී අඥදයකත්වය ප්‍රතික්ෂේප කරති. 3) වර්තමාන රාජ්‍යය උපයෝගි කර ගනිමින්, නිර්ධන පංතිය විප්ලවය සඳහා පුහුණු කළ යුතුයයි මාක්ස්වාදීහු තරයේ කියති. අරාජිකවාදීහු මෙය ප්‍රතික්ෂේප කරති. හුදෙක්ම පරණ රාජ්‍ය යන්ත්‍රය අළුත් අය අතට පත්වීමේ අර්ථයෙන් නිර්ධන පංතියට රාජ්‍ය බලය දිනාගත නොහැකි බව සහ එම යන්ත්‍රය සුන් කර දමා ඒ වෙනුවට අළුත් එකක් ආදේශ කළ යුතු බව උගන්වා ඇත්තේ මාක්ස් වන නිසා, මෙම විවාදයේදී මාක්ස්වාදය නියෝජනය කරන්නේ කෞට්ස්කි නොව පනෙකුක්ය.

අවස්ථාවාදීන් කිසිසේත් නොපිළිගන්නා මෙම රාජ්‍ය යන්ත්‍රය විනාශ කිරීම, කෞට්ස්කිගේ තර්කයෙන් සම්පූර්ණයෙන්ම අතුරුදහන් වන හෙයින් සහ බහුතරයක් ලබා ගැනීමේ සරල කටයුත්ත ලෙසට අර්ථ නිරූපනය කළ හැකි සේ ''අල්ලා ගැනීම'' යන වචනය යෙදීමෙන්, ඔහු අවස්ථාවාදීන්ට රිංගා යාමට ඉඩක් සලසන හෙයින්, ඔහු මාක්ස්වාදය අතහැර අවස්ථාවාදී කඳවුරට ඇතුලත් වෙයි.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

තමා මාක්ස්වාදය විකෘති කරන බව වසං කිරීමට කෞට්ස්කි දෘෂ්ටි නිවේශකයෙකු ලෙසට හැසිරෙයි: ඔහු මාක්ස්ගේම කිමනක් උපුටා දක්වයි. ''රාජ්‍ය අධිකාරය තුළ බලය තීරණාත්මක ලෙස මධ්‍යගත කිරීමක් අවශ්‍ය''[49] යයි මාක්ස් 1850 දී ලිවේය. ඒ අනුව කෞට්ස්කි ජයග්‍රාහක ස්වරයකින් මෙසේ අසයි: පනෙකුක්ට උවමනාවී තිබෙන්නේ ''මධ්‍යගතවාදය'' විනාශ කිරීමටද?

මධ්‍යගතවාදයට විරුද්ධ අර්ථයෙන් ගත් පෙඩරල්වාදය ගැන කියමින් බර්න්ෂ්ටයින් මාක්ස්වාදය ප්රුදෝන්වාදයට සමාන කළ සේම, මෙයද හුදෙක්ම රැවටිල්ලක් පමණකි.

කෞට්ස්කිගේ ''උධෘත පාඨය'' මෙහිදී පක්ෂව හෝ විපක්ෂව හෝ ගත හැක්කක් නොවේ. මධ්‍යගතවාදය පැරණි රාජ්‍යය සහ අළුත් රාජ්‍යය යන දෙකෙහිම ක්‍රියාත්මක කළ හැකි වේ. කම්කරුවන් ඔවුන්ගේ සන්නද්ධ හමුද ස්වේච්ඡාවෙන් එක්සත් කරති නම්, එය මධ්‍යගතවාදය වනු ඇත. එහෙත් එය මධ්‍යගත රාජ්‍ය යන්ත්‍රය වන ස්ථිර යුද්ධ හමුදාව, පොලීසිය සහ නිලධාරි පෙළැන්තිය ''සම්පූර්ණයෙන්ම විනාශ කිරීම'' මත පදනම් වූවක් වනු ඇත. කොමියුනය ගැන මාක්ස් සහ එංගල්ස් ඉදිරිපත් කළ චිරප්‍රසිද්ධ තර්ක මගහැර යමින්, ප්‍රස්තුත කාරණයට කිසිසේත් අදාළ නොවන කියමන් උපුටා දක්වමින්, කෞට්ස්කි කටයුතු කරන්නේ නියම වංචාකාරයෙකු ලෙසටය.

කෞට්ස්කි තවදුරටත් මෙසේ ලියයි. ''සමහරවිට රාජ්‍ය නිලධාරීන්ගේ කාර්යයන් අහෝසි කිරීමට ඔහුට (පනෙකුක්ට) උවමනා වී තිබෙනවා විය හැක? එහෙත් රාජ්‍ය පරිපාලනයෙහිදී තබා, පක්ෂයේ සහ වෘත්තීය සමිතිවල පවා අපට නිලධාරීන් නැතිව බැරිය. තවද රාජ්‍ය නිලධාරීන් අහෝසි කළ යුතුබවක් අපගේ වැඩපිළිවෙළෙන් ඉල්ලන්නේද නැත. එහි කියා ඇත්තේ ඔවුන් ජනතාව විසින් තෝරා පත් කරනු ලැබිය යුතු බවය. ... අප මෙහිදී සාකච්ඡා කරන්නේ ''අනාගත රාජ්‍යයේ පරිපාලන යන්ත්‍රයේ ආකෘතිය ගැන නොව, අප රාජ්‍ය බලය අල්ලා ගන්නටත් පෙර අපගේ අරගලය විසින් රාජ්‍ය බලය දියකර හරින කලෙක මෙන් අහෝසි කෙරෙනු ඇද්ද (Auflöst) යන්න ගැනය. (අවධාරණය කෞට්ස්කිගේය). කුමණ නම් අමාත්‍යාංශයක් එහි නිලධාරීන්ද සමග අහෝසි කළ හැකිද?'' ඊළඟට අධ්‍යාපන, අධිකරණ, මුදල් හා යුද්ධ කටයුතු යන අමාත්‍යාංශ ලැයිස්තුවක් සඳහන්ය. ''නැත. ආණ්ඩුවට විරුද්ධව අප කරන දේශපාලන අරගලය මගින් වර්තමාන අමාත්‍යාංශ අතුරෙන් එකක්වත් ඉවත් නොකෙරෙනු ඇත... වැරදි වැටහීමක් ඇතිවීම වැළැක්වීම සඳහා මම නැවතත් මෙසේ කියමි: අප මෙහිදී සාකච්ඡා කරන්නේ ජයග්‍රාගී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් විසින් ''අනාගත රාජ්‍යයට'' දෙනු ලබන ආකෘතිය ගැන නොව, අපගේ ප්‍රතිපාක්ෂිකතාවය නිසා වර්තමාන රාජ්‍යය වෙනස් වන්නේ කෙසේද යන්න ගැනය'' (පිටු 725).

මෙය උපාමාරුවක් බව පැහැදිලිය. පනෙකුක් මතු කළේ විප්ලවය පිළිබඳ ප්‍රශ්නය යි. ඔහුගේ ලිපියේ සිරස්තලය මෙන්ම උපුටා දැක්වූ කොටස්ද ඒ බව හඟවයි. කෞට්ස්කි ''ප්‍රතිපාක්ෂිකතාවය'' පිළිබඳ ප්‍රශ්නයට පැනීමෙන්, විප්ලවවාදී දෘෂ්ටි කෝණය වෙනුවට අවස්ථාවාදී දෘෂ්ටි කෝණය ආදේශ කරයි. ඔහු කියන දෙයෙහි අර්ථය මෙසේය: දැනට අපි විරුද්ධ පක්ෂයක් වෙමු. අපි බලය අල්ලාගත් පසු කවුරුන් වෙමුද යන්න එවිට බලමු. විප්ලවය අතුරුදහන් වී ඇත! අවස්ථාවාදීන්ට අවශ්‍ය වූයේද එයමය.

ප්‍රස්තුත ප්‍රශ්නය ප්‍රතිපාක්ෂිකතාවයවත්, සාමාන්‍ය දේශපාලන අරගලයවත් නොව විප්ලවය ය. විප්ලවය සංයුක්ත වන්නේ, නිර්ධන පංතිය විසින් ''පරිපාලන යන්ත්‍රය'' සහ මුළු රාජ්‍ය යන්ත්‍රය විනාශ කරනු ලැබීමෙන් සහ ආයුධ සන්නද්ධ කම්කරුවන්ගෙන් යුත් අළුත් එකක් ඒ වෙනුවට ආදේශ කිරීමෙනි. කෞට්ස්කි ''අමාත්‍යාංශ'' කෙරෙහි ''මිථ්‍යාමතික පූජනීයත්වයක්'' දක්වයි. එහෙත් ඒවා ඉවත් කර, ඒ වෙනුවට, නිදසුනක් වශයෙන්, ස්වෛරී සහ සකල බලධාරී කම්කරු සහ සොල්දදු නියෝජිත සෝවියට් සභා යටතේ වැඩ කරන විශේෂඥයන්ගේ කාරක සභා ඇති කළ නොහැක්කේ මන්ද?

වැදගත් කාරණය වන්නේ, ''අමාත්‍යාංශ'' පවතිනු ඇද්ද, නැතහොත් විශේෂඥයන්ගේ කාරක සභා හෝ වෙනත් මණ්ඩල පිහිටුවනු ලැබේද යන්න නොවේ. වැදගත් කාරණය වන්නේ (දහස් ගණන් රැහැන්වලින් ධනපති පංතියට බැඳුණු සහ අස්සක් මුල්ලක් නැර අනුබැඳියාවෙන් සහ උදසීනත්වයෙන් විනිවිද ගිය) පැරණි රාජ්‍ය යන්ත්‍රය තබාගන්නවාද නැතහොත්, එය විනාශ කර ඒ වෙනුවට අළුත් එකක් ඇති කරනවාද යන්නය. විප්ලවය සංයුක්ත වන්නේ පැරණි රාජ්‍ය යන්ත්‍රයේ ආධාරයෙන් නවපංතිය විසින් කෙරෙන අණ දීමෙන් හෝ ආණ්ඩු කිරීමෙන් නොවේ. විප්ලවය සංයුක්ත වන්නේ එම පංතිය එම යන්ත්‍රය සුන්කර, නව යන්ත්‍රයේ ආධාරයෙන් අණ දීමෙන් හා ආණ්ඩු කිරීමෙනි. කෞට්ස්කි මාක්ස්වාදයේ මෙම මූලික අදහසෙන් ඉවතට ලිස්සා යයි. නොඑසේනම්, ඔහුට එය කොහෙත්ම වැටහෙන්නේ නැත.

කොමියුනයේ පාඩම් හෝ මාක්ස්ගේ උගැන්වීම් හෝ ඔහුට නොවැටහෙන බව නිලධාරීන් ගැන ඔහු නගන ප්‍රශ්නයෙන් පැහැදිලිව පෙනේ. ''පක්ෂයේ සහ වෘත්තීය සමිතිවල පවා අපට නිලධාරීන් නැතිව බැරිය.''

ධනපති ක්‍රමය යටතේ, ධනපති පංතියේ පාලනය යටතේ, අපට නිලධාරීන් නැතිව බැරිය. ධනපති ක්‍රමය විසින් නිර්ධන පංතිය පීඩාවට පත් කරනු ලැබේ, වැඩ කරන ජනතාව වහල් කරනු ලැබේ. ධනපති ක්‍රමය යටතේ බලපවත්වන වේතන වහල් ක්‍රමයේ කොන්දේසි සියල්ලෙන්ම

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සහ ජනතාවගේ දුප්පත්කම හා දුක්ඛිත තත්වය නිසා, ප්‍රජාතන්ත්‍රවාදය සීමා වී, හිර වී, කප්පාදු වී හා විරූප වී ඇත. අපගේ දේශපාලන සංවිධානවල සහ වෘත්තීය සමිතිවල කාරකවරුන් ධනපති ක්‍රමයේ කොන්දේසිවලින් දූෂණයට පවත්වන්නේ, නැතහොත්, දූෂණයට පත්වීමට නැඹුරුවන්නේත්, නිලධාරිවාදීන් වීමේ, එනම්, ජනතාවගෙන් ඈත්වුණු හා ජනතාවට ඉහළින් සිටින වරප්‍රසාද ලත් පුද්ගලයන් වීමේ නැඹුරුවක් දක්වන්නේත්, මේ හේතුව නිසාය; හුදෙක් මේ හේතුව පමණක්ම නිසාය.

නිලධාරිවාදයේ සාරාර්ථය එයයි. එනිසා, ධනපතියන් අසන්තක කරන තෙක් සහ ධනපති පංතිය බලෙන් නෙරපා දමන තෙක්, නිර්ධන පංති කාරකවරුන් පවා එක්තරා දුරකට ''නිලධාරිවාදීවීම'' නොවැලැක්විය හැකිය.

කෞට්ස්කි කියන ලෙසට සමාජවාදය යටතේ තෝරා පත් කෙරුණු කාරකවරුන් සිටින නිසා, නිලධාරීන්ද, නිලධාරිවාදයද එසේම පවතිනු ඇත! ඔහුට වැරදුණේ හරියටම මෙතැනදීය. කොමියුනයේ නිදර්ශනය ගැන සඳහන් කළ මාක්ස් පෙන්වාදුන්නේ, නිලධාරීන් තෝරා ගැනීමේ ප්‍රතිපත්තියට අමතරව, ඕනෑම අවස්ථාවක ඉවත් කිරීමේ ප්‍රතිපත්තියද ආරම්භ කිරීමත්, එසේම, වේතන සාමාන්‍ය කම්කරුවන්ගේ තත්ත්වයට පහත දැමීමත්, ඒසමගම පාර්ලිමේන්තු ආයතන වෙනුවට ''එකවරම විධායකයක් හා ව්‍යවස්ථාදායකයක් වන වැඩ කරන මණ්ඩල''[50] ආදේශ කිරීමත් සිදු කෙරෙන අනුපාතය අනුව, සමාජවාදය යටතේ කාරක වරුන් ''නිලධාරිවාදීන්'' හෝ ''නිලධාරීන්'' වීම කෙළවර වනු ඇති බවය.

සත්‍ය කරුණු අනුව බලන කල, කෞට්ස්කි පනෙකුක්ට විරුද්ධව ඉදිරිපත් කරන මුළු තර්කයම, විශේෂයෙන්ම, අපගේ පක්ෂ සහ වෘත්තීය සමිති සංවිධානවල පවා නිලධාරීන් නැතිව බැරිය යන ඔහුගේ චමත්කාර ජනක මතය වනාහි, හුදෙක්ම බර්න්ෂ්ටයින් පොදුවේ මාක්ස්වාදයට විරුද්ධව ඉදිරිපත් කළ පැරණි ''තර්ක'' නැවත ඉදිරිපත් කිරීමක් පමණක් වේ. බර්න්ෂ්ටයින් ඔහුගේ ''සමාජවාදයේ තර්ක මූල'' නැමති ද්‍රෝහී පොතෙන් ''ආදිකල්පික'' ප්‍රජාතන්ත්‍රවාදයේ අදහස්වලට පහර දෙයි; එයින් ඔහු ''දෘෂ්ටි නිවේශක ප්‍රජාතන්ත්‍රවාදය'' යනුවෙන් හඳුන්වන දෙයට, එනම්, අනුගම්‍ය බලය පැවරීම්, ගරු නිලධාරීන්, බෙලහීන මධ්‍යම නියෝජිත සභා යනාදියට පහර දෙයි. මෙම ''ආදිකල්පික'' ප්‍රජාතන්ත්‍රවාදය දුර්වල එකකැයි පෙන්වීමට, බර්න්ෂ්ටයින්, වෙබ්ස්[51] ගේ අර්ථ නිරූපනය කිරීම අනුව ගත් බ්‍රිතාන්‍ය වෘත්තීය සමිතිවල අත් දැකීම් ගැන සඳහන් කරයි. ''සම්පූර්ණ නිදහස'' යටතේ සිදුවූ හැත්තෑ අවුරුද්දක සංවර්ධනය අනුව ''ආදිකල්පික'' ප්‍රජාතන්ත්‍රවාදය වැඩකට නැති බව වෘත්තීය සමිතිවලට ඒත්තු ගිය හෙයින්, ඔවුන් ඒ වෙනුවට සාමාන්‍ය ප්‍රජාතන්ත්‍රවාදය,

එනම්, නිලධාරිවාදය සමග ඒකාබද්ධ වූ පාර්ලිමේන්තුවාදය ආදේශ කළ බව (ජර්මන් සංස්කරණයේ පිටු 137 හි) ඔහු කියයි.

ඇත්ත වශයෙන්ම වෘත්තීය සමිති සම්පූර්ණ නිදහස ඇතිව සංවර්ධනය වූයේ නැත. ඒවා සංවර්ධනය වූයේ සම්පූර්ණ ධනපති වහල් ක්‍රමය යටතේය. එම ක්‍රමය යටතේ බල පවත්නා නපුර, හිංසනය, බොරුව සහ ''ඉහළ'' පරිපාලන කටයුතුවලින් දුප්පතුන් පිටමං කර තැබීම හමුවේ සහනයන් කීපයක් දීම ''නොකර බැරි දෙයක්'' බව ඉතා පැහැදිලිය. ශිෂ්ටාචාර ඉතිහාසයේ ප්‍රථම වතාවට සමාජවාදී සමාජය යටතේ ජනගහනයේ පොදු ජනකාය මැතිවරණවලදී ඡන්දය දීමට පමණක් නොව, රාජ්‍යයේ දෛනික පරිපාලන කටයුතුවලටද ස්වාධීන ලෙස සහභාගිවීමට නැගී සිටින හෙයින්, එහිදී අනිවාරණීය වශයෙන්ම ''ආදිකල්පික'' ප්‍රජාතන්ත්‍රවාදය බොහෝ දුරට යළි පණ ගැන්වෙනු ඇත. සමාජවාදය යටතේ වාරයෙන් වාරය සියළු දෙනාම ආණ්ඩු කරනු ඇති හෙයින්, කිසි කෙනෙක් ආණ්ඩු නොකරන තත්ත්වයට හැම දෙනාම කල් නොයවාම පුරුදු වනු ඇත.

අවස්ථාවාදීන් අවසාන වශයෙන් ධනපති පංතියෙන් බිඳීයාමට අකැමති නිසා ඔවුන්ට බිය ගෙන දෙන සහ එම බිය නිසා දැකීමටද ඔවුන් අසතුටු වන, එසේම අරාජිකවාදීන්ගේ ඉක්මන්කාරී ගතිය නිසා හෝ ඔවුන්ට මෙම සමාජ විපර්යාසයන්ට අදාළ කොන්දේසි සියල්ලම නොවැටහෙන නිසා හෝ ඔවුන්ද නොදකින සන්ධිස්ථානයක්, කොමියුනයේ ප්‍රායෝගික කටයුතු කෙරෙන් මාක්ස් ඔහුගේ විවේචක විශ්ලේෂක මහා ප්‍රාඥත්වයෙන් දුටුවේය. ''පැරණි රාජ්‍ය යන්ත්‍රය විනාශ කිරීම ගැන අප සිතීම වුවද නොමනාය. අමාත්‍යාංශ සහ නිලධාරීන් නැතිව අපි කෙසේ නම් කටයුතු කරමුද? ''අශිෂ්ටවාදයෙන් සම්පූර්ණයෙන්ම සන්තෘප්තියට පත්ව, විප්ලව ගැනත් විප්ලවයේ නිර්මාණශීලී භාවය ගැනත් සැකයක් හද පත්ලෙහි ඇතිව පමණක් නොව, එය ගැන මාරක බියක්ද ඇතිව වෙසෙන (අපගේ මෙන්ෂෙවික්වරු සහ සමාජවාදී-විප්ලවවාදීන් මෙන් වන) අවස්ථාවාදියා එසේ තර්ක කරයි.

''අප කල්පනා කළ යුත්තේ පැරණි රාජ්‍ය යන්ත්‍රය විනාශ කිරීම ගැන පමණකි: අතීත නිර්ධන පංති විප්ලවවලින් ගත හැකි නියත පාඩම් ගැන පරීක්ෂා කිරීමෙන් සහ විනාශ කළ රාජ්‍ය යන්ත්‍රය වෙනුවට ආදේශ කළ යුත්තේ කුමක්ද, එය කරන්නේ කෙසේද යන්න ගැන විග්‍රහ කිරීමෙන් ඇති වැඩක් නැත.'' අරාජිකවාදියා එසේ තර්ක කරයි. (එසේ තර්ක කරන්නේ හොඳම අරාජිකවාදීන්ය. ධනපති පංතිය පසුපස ඇදෙන ක්‍රපොත්කින් සහ සමාගමේ අනුගාමිකයින් නොවේ). මේ අනුව, අරාජිකවාදියාගේ උපක්‍රම, අපේක්ෂා භංගත්වයේ උපක්‍රම වන්නේය; පොදු ජනතා ව්‍යාපාරයේ ප්‍රායෝගික කොන්දේසි සැලකිල්ලට ගනිමින් නිශ්චිත ප්‍රශ්න

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

විසඳීමට දරන වික්‍රමවත් ලෙස එඩිතර වූ විප්ලවවාදී ප්‍රයත්න නොවන්නේය.

මෙම වැරදි දෙකෙන්ම වලකින ලෙස මාක්ස් අපට උගන්වයි. පැරණි රාජ්‍ය යන්ත්‍රය විනාශ කිරීමේදී ඉතාමත් එඩිතර ලෙස කටයුතු කිරීමට මාක්ස් අපට උගන්වයි. එසේම, ප්‍රශ්නය නිශ්චිත ලෙස ඉදිරිපත් කිරීමට ද ඔහු අපට උගන්වයි. වඩාත් පුළුල් ප්‍රජාතන්ත්‍රවාදයක් ඇති කිරීමට සහ නිලධාරි පෙළැන්තිය උදුරා දැමීමට ද අසූවල් නම් පියවරයන් ගනිමින්, සති කීපයක කාලය තුළදී නව නිර්ධන පංති යන්ත්‍රයක් ගොඩනැගීම ආරම්භ කිරීමටද කොමියූනය සමත් විය. අපි කොමියූනාර්වරුන්ගෙන් විප්ලවවාදී එඩිතරභාවය උගෙන ගනිමු: ඉතාමත් හදිසි සහ වහාම ඉටු කළ හැකි පියවරයන් පිළිබඳ කටු සටහන් ඔවුන්ගේ ප්‍රායෝගික පියවරයන් තුළින් අපි දකින්නෙමු. ඊ ළඟට මෙම මාර්ගය අනුගමනය කරමින් නිලධාරි පෙළැන්තිය සම්පූර්ණයෙන්ම විනාශ කිරීම අපි සාර්ථක කරන්නෙමු.

වැඩ දිනය කෙටි කිරීමත්, ජනතාව නව ජීවනයකට ඔසවා තැබීමත්, කිසිම විශේෂයක් නොමැතිව සියළු දෙනාටම "රාජ්‍ය කාර්යයන්" ඉටු කළ හැකි වන සේ ජනගහනයෙන් බහුතරය සඳහා කොන්දේසි ඇති කිරීමත්, සමාජවාදයෙන් කෙරෙනු ඇති හෙයින් මෙසේ නිලධාරි පෙළැන්තිය විනාශ කිරීමේ හැකියාව සහතික වී තිබෙන අතර, සාමාන්‍ය වශයෙන් සෑම ආකාරයේම රාජ්‍යයක් සම්පූර්ණයෙන්ම හැකිළී යාමට එයින් මහ සැලසෙනු ඇත.

කෞට්ස්කි තවදුරටත් මෙසේ ලියයි: "එහි (පොදු ජන වැඩ වර්ජනයේ) අරමුණ රාජ්‍ය බලය විනාශ කිරීම විය නොහැකිය: එහි එකම අරමුණ විය හැක්කේ, කිසියම් විශේෂ ප්‍රශ්නයකදී ආණ්ඩුව අනුකූල කර ගැනීම හෝ නිර්ධන පංතියට විරුද්ධ ආණ්ඩුවක් වෙනුවට එයට ඇහුම්කන්දීමට අඩ දුරක් ඒමට කැමති (entgegenkommende) ආණ්ඩුවක් ආදේශ කිරීම හෝ පමණකි... කිසිම කලෙක, මොනම තත්ත්වයක් හෝ යටතේ එය (නිර්ධන පංතිය එයට විරුද්ධ ආණ්ඩුවක් පරාජය කරන ලබන ජයග්‍රහණය) රාජ්‍ය බලය විනාශ කිරීමට මහ සලසන්නක් විය නොහැකිය. එයින් සිදු විය හැක්කේ රාජ්‍ය බලය තුළ බල තුලනයේ කිසියම් වෙනසක් (Verschiebung) ඇතිවීම පමණකි.... කලින් මෙන්ම තව දුරටත් දේශපාලන අරගලයේ අරමුණ, පාර්ලිමේන්තුව තුළ බහුතරයක් දිනා ගැනීමෙන් සහ පාර්ලිමේන්තුව ආණ්ඩුවේ ස්වාමි පදවියට උසස් කිරීමෙන් රාජ්‍ය බලය අල්ලා ගැනීම වන්නේය" (පිටු 726, 727 හා 732).

මෙය නම් ඉතාමත් පිරිසිදු සහ ඉතාමත් පහත් අවස්ථාවාදය මිස, අන් කිසිවක් නොවේ. මෙයනම් විප්ලවය වචනයෙන් පිළිගනිමින් එය

ක්‍රියාවෙන් ප්‍රතික්ෂේප කිරීමකි. කෞට්ස්කිගේ සිතුවිලි "නිර්ධන පංතියට ඇහුම්කන්දීමට අඩ දුරක් ඒමට කැමති ආණ්ඩුවක්" ඉක්මවා ඉන් ඔබ්බට යන්නේ නැත. 1847 හා සමග සසඳා බලන කල මෙය අමනවාදය වෙතට පියවරක් පස්සට තැබීමකි. එය වර්ෂයේදී "කොමියුනිස්ට් ප්‍රකාශනය" කීවේ "නිර්ධන පංතිය පාලක පංතිය ලෙසට සංවිධාන" කළ යුතු බවය.

කෞට්ස්කිට සිදුවනු ඇත්තේ ෂයිඩමාන්ලා, ප්ලෙහානව්ලා සහ වැන්ඩර්වෙල්ඩේලා සමග ඔහුගේ සිත්ගත් "සමගිය" ඇති කර ගැනීමටය. "නිර්ධන පංතියට ඇහුම්කන් දීමට අඩ දුරක් ඒමට කැමති" ආණ්ඩුවක් සඳහා සටන් කිරීමට ඒ සියළු දෙනාම එකඟ ය.

කෙසේ හෝ වේවා, සමාජවාදයට ද්‍රෝහි වූ මොවුන්ගෙන් අපි වෙන් වෙමු. එසේම, ආයුධ සන්නද්ධ නිර්ධන පංතියම ආණ්ඩුව බවට පත්විය හැකි වනු පිණිස, පැරණි රාජ්‍ය යන්ත්‍රය සම්පූර්ණයෙන්ම විනාශ කිරීම සඳහා අපි සටන් කරමු. මේ දෙක එකිනෙකට බෙහෙවින්ම වෙනස් ය.

"රාජ්‍ය බලය තුළ බලතුලනයේ වෙනසක් ඇතිකිරීමට" ද, "පාර්ලිමේන්තුව තුළ බහුතරයක් දිනාගැනීමට" ද, "පාර්ලිමේන්තුව ආණ්ඩුවේ ස්වාමි පදවියට පත් කිරීමට" ද කටයුතු කිරීමට එක හෙළා කැමති ලේගින්ලාගේ ට්සෙරතේලිලාගේ සහ චෙර්නොව්ලාගේත් ප්‍රිය මනාප සමාගමය භුක්ති විඳීමට කෞට්ස්කිට සිදු වනු ඇත. මෙය ඉතාමත් අගනා අරමුණකි. එය අවස්ථාවාදීන්ට සම්පූර්ණයෙන්ම පිළිගත හැකි සහ සියළු දේම ධනපති පාර්ලිමේන්තු සමූහාණ්ඩුවේ සීමාව තුළ රඳවන අරමුණකි.

එහෙත් අපි නම් අවස්ථාවාදීන් කෙරෙන් වෙන් වෙමු. එවිට, "බලතුලනයේ වෙනසක් ඇති කිරීමට" නොව, ධනපති පංතිය බලයෙන් නෙරපීමට, ධනපති පාර්ලිමේන්තුවාදය විනාශ කිරීමට සහ කොමියූනයේ ආදර්ශය අනුව යන ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවක් හෝ කම්කරු හා සොල්දාදු නියෝජිත සෝවියට් සභා සමූහාණ්ඩුවක් හෝ පිහිටුවීමට, නිර්ධන පංතියේ විප්ලවවාදී ආඥාදායකත්වය පිහිටුවීමට, කරන සටනේදී පංති විඥානය ඇති මුළු මහත් නිර්ධන පංතියම අප සමග සිටිනු ඇත.

* * *

ජාත්‍යන්තර සමාජවාදයට අයත්, ජර්මනියේ "සමාජවාදී මාසිකය"[52] (ලේගින්, ඩේවිඩ්, කෝල්බ් සහ ස්කැන්ඩිනේවියානු ස්ටෞනිං සහ බ්‍රාන්ටිං ඇතුළු තවත් බොහෝ දෙනෙක්) ද, ප්‍රංශයේ සහ බෙල්ජියමෙහි ජොරේස් අනුගාමිකයින්[53] සහ වැන්ඩර්වෙල්ඩෙ ද, බ්‍රිතාන්‍යයේ "ස්වාධීන" පිරිස (ඇත්ත වශයෙන්ම නිතරම ලිබරල් පක්ෂයට යටත් වූ "ස්වාධීන කම්කරු පක්ෂය"[54]) ද, එවැනි වෙනත් කොටස්ද, කෞට්ස්කිගේ දකුණෙන් සිටිති.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ස්වකීය පක්ෂවල පාර්ලිමේන්තු කටයුතු හා පුවත්පත් සම්බන්ධයෙන් බොහෝ විට විශාල කාර්ය කොටසක් ඉටු කරන මෙම මහත්වරු සියළු දෙනාම නිර්ධන පංති ආඥාදායකත්වය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරති; විවෘත අවස්ථාවාදී ප්‍රතිපත්තියක් අනුගමනය කරති. මෙම මහත්වරුන්ට පෙනෙන ලෙසට නිර්ධන පංති ආඥාදායකත්වය ප්‍රජාතන්ත්‍රවාදයට "ප්‍රති-විරෝධී" ය!! මොවුන් හා සුළු ධනපති ප්‍රජාතන්ත්‍රවාදීන් අතර සාරානු-කූල වශයෙන් ඇති වෙනසක් නැත.

මෙම කරුණු සැලකිල්ලට ගත් කල, දෙවැනි ජාත්‍යන්තරය, එනම්, එහි නිල නියෝජිතයන්ගෙන් අති බහුතරය සම්පූර්ණයෙන්ම අවස්ථාවාද-යෙහි ගිලී ඇතැයි යන නිගමනයට අප එළඹීම සාධාරණය. කොමියුනයේ අත් දැකීම් නොසලකා හැර තිබේ. එපමණක් නොව, ඒවා විකෘති කර තිබේ. පැරණි රාජ්‍ය යන්ත්‍රය සුන් කළ යුතු බවත්, ඒ වෙනුවට අළුත් එකක් ආදේශ කළ යුතු බවත්, එසේ කිරීමෙන්, කම්කරුවන්ගේ දේශපාලන ආණ්ඩුව සමාජය සමාජවාදී ක්‍රමයට ප්‍රතිසංවිධානය කිරීම සඳහා පදනම කර ගත යුතු බවත්, කම්කරුවන්ට අවබෝධ කර දෙනු වෙනුවට, කර තිබෙන්නේ ඊට හාත්පසින්ම විරුද්ධ දෙය කම්කරුවන්ට දේශනා කරමින්, අවස්ථාවා-දයට ඇතුළු වීම සඳහා සිදුරු දහස් ගණනක් තබමින්, "බලය අල්ලා ගැනීම" හුවා දැක්වීමය.

අධිරාජ්‍යවාදී තරඟයේ ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රසාරණය වී ගිය යුද්ධ යන්ත්‍ර හිමි රාජ්‍යයන්, ලෝකය පාලනය කළ යුත්තේ බ්‍රිතාන්‍යයද, නැතිනම් ජර්මනිය ද, මෙම මූල්‍ය ප්‍රාග්ධනාධිකාරියද, නැත්නම් අනික ද, යන්න තීරණය කිරීම සඳහා දශ ලක්ෂ සංඛ්‍යාත ජනතාව මරු මුවට යවන මහා රාක්ෂයන් බවට පත්ව ඇති කාලයක, නිර්ධන පංති විප්ලවය හා රාජ්‍ය අතර ඇති සම්බන්ධය විරූප කර දැක්වීම සහ එය වසං කිරීම මගින් ඉටු කෙරෙන්නේ සුළු පටු කාර්ය කොටසක් නොවන බව පැහැදිලිය.*

* අත් පිටපතෙහි තවදුරටත් මෙසේ සඳහන් වේ:

හත් වන පරිච්ඡේදය

1905 සහ 1917 රුසියානු විප්ලවවල අත් දැකීම්

මෙම සිරස්තලයෙහි දක්වා ඇති මාතෘකාව ඉතා විශාල එකකි. ඒ ගැන වෙළුම් ගණන් ලිය හැකිය, එසේම, ලිය යුතුය. වර්තමාන පොත ලිවීමේදී, ව්‍යවහාරය විසින් සපයන ලද ඉතාමත් වැදගත්, එමෙන්ම, රාජ්‍ය බලය හා සම්බන්ධයෙන් විප්ලවයේදී නිර්ධන පංතියට පැවරෙන කර්තව්‍ය යන්ට එක එල්ලේම අදාළ වන පාඩම්වලට පමණක් සීමාවීමට අපට සිදුවීම ස්වාභාවික ය." (මෙතැනින් අත් පිටපත කෙළවර වේ. — සංස්කාරක)

පළමුවැනි සංස්කරණයට පසු සටහන

මෙම පොත ලියන ලද්දේ 1917 අගෝස්තු සහ සැප්තැම්බර් මාසවලදී ය. ඒ වන විට මා "1905 සහ 1917 රුසියානු විප්ලවවල අත්දැකීම්" යන ඊළඟ හත්වැනි පරිච්ඡේදයට සැලැස්ම සකස් කර තිබුණි. එහෙත් එහි සිරස්තලය හැරුණු විට, එම පරිච්ඡේදයෙන් එක පේළියක්වත් ලිවීමට මට කාලය නොලැබුණි. 1917 ඔක්තෝබර් විප්ලවයට පූර්වාසන්නයේ ඇති වූ දේශපාලන අර්බුදය මෙයට "බාධාවක්" විය. එහෙත් එවැනි "බාධාවක්" නිසා ඇතිවන්නේ සතුටක්මය. එසේ වුවද, පොතෙහි දෙවැනි කොටස ("1905 සහ 1917 රුසියානු විප්ලවවල අත් දැකීම්) ලිවීම දීර්ඝ වශයෙන් කල් තැබීමට සිදු වීමට ඉඩ තිබේ. "විප්ලවයේ අත්දැකීම්" ගැන ලියනවාට වඩා එම අත්දැකීම් ඔස්සේ ඉදිරියට යාම වඩාත් ප්‍රිය මනාපය, ප්‍රයෝජනවත් ය.

පෙට්‍රොග්‍රෑඩ්, 1917 නොවැම්බර් 30

කර්තෘ

1917 අගෝස්තු-සැප්තැම්බර් මාසවලදී, පළමුවැනි සංස්කරණයට පසු සටහන 1917 නොවැම්බර් 30 දිනද, දෙවන පරිච්ඡේදයේ 3 වන කොටස 1918 දෙසැම්බර් 17 දිනට පෙරද ලියන ලදී

පොතක් ලෙසට ප්‍රථමයෙන්ම 1918 දී පෙට්‍රොග්‍රෑඩ්හි "ෂිස්න් ඊ ස්නානි" ප්‍රකාශකයන් විසින් පළ කරන ලදී

සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 25, පිටු 1—120

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

බොල්ෂෙවික්වරුන් බලය තමන් අතට ගත යුතුය

රු. ස. ප්‍ර. ක. ප. (බො) මධ්‍යම කාරක සභාවට සහ පෙට්‍රොග්‍රෑඩ් හා මොස්කව් කාරක සභාවලට ලිපිය

බොල්ෂෙවික්වරුන් ප්‍රධාන නගර දෙකෙහිම කම්කරු සහ සොල්දාදු සෝවියට සභා[55] වල බහුතරයක් දිනා ගෙන ඇත. ඔවුන්ට රාජ්‍ය බලය තමන් අතට ගත හැකිව තිබේ. ඔවුන් එසේ කළ යුතුය.

ජනතාව මෙහෙයවා ගැනීමට, ප්‍රතිපාක්ෂිකයාගේ ප්‍රතිරෝධය පරාජය කිරීමට, ඔහු සුන් කර දැමීමට හා බලය රැගෙන එය පවත්වා ගැනීමට ප්‍රධාන නගර දෙකෙහි විප්ලවකාරී කොටස්වල ක්‍රියාශීලී බහුතරය ප්‍රමාණවත් වන හෙයින් ඔවුන්ට එම හැකියාව තිබේ. එසේ වන්නේ බොල්ෂෙවික්වරු අප්‍රමාදවම ප්‍රජාතන්ත්‍රවාදී සාමයක් යෝජනා කිරීමෙන්ද, වහාම ගොවි ජනතාවට ඉඩම් දීමෙන්ද, කෙරෙන්ස්කි විසින් අඹරා දමන ලද සහ පොඩිපට්ටම් කර දමන ලද ප්‍රජාතන්ත්‍රවාදී ආයතන සහ වරම් නැවත නගා සිටුවීමෙන්ද, කිසිවෙකුට පෙරළා දැමිය නොහැකි වන ආණ්ඩුවක් පිහිටුවනු ඇති හෙයිනි.

ජනතාවගෙන් බහුතරය අප පැත්තේ සිටිති. මැයි මස 6 වැනි දින පටන් අගෝස්තු 31 දක්වාද නැවත සැප්තැම්බර් 12 දක්වාද ඇති වූ දීර්ඝ සහ වේදනාකාරී සිදුවීම් මාලාවෙන්[56] මේ බව ඔප්පුවිය. ප්‍රධාන නගරවල සෝවියට් සභාවල බහුතරය සැදුනේ ජනයා අපගේ පැත්තට එකතු වීමේ ප්‍රතිඵලයක් වශයෙනි. සමාජවාදී-විප්ලවවාදීන්ගේ සහ මෙන්ෂෙවික් වරුන්ගේ වැනෙන සුලු භාවයෙන් සහ ඔවුන්ගේ පිරිස් අතර ජාත්‍යන්තරවාදීන් සංඛ්‍යාව වැඩි වීමෙන්ද, ඔප්පු වන්නේ එයමය.

ප්‍රජාතන්ත්‍රවාදී සාකච්ඡා සභාවකින් නියෝජනය කෙරෙන්නේ විප්ලවවාදී ජනතාවගෙන් බහුතරයක් නොව, සුළු ධනපති පංතියේ පාවාදෙන සුලු ඉහළ ස්ථරය පමණකි. මැතිවරණ සංඛ්‍යා ලේඛන වලින් අපි රැවටිල්ලට පත් නොවිය යුත්තෙමු. මැතිවරණවලින් කිසි දෙයක් ඔප්පු නොවේ. පෙට්‍රොග්‍රෑඩ් සහ මොස්කව් නගර සභා තෝරා පත් කිරීමේ මැතිවරණ සමග සෝවියට් සභා තෝරා පත් කිරීම සංසන්දනය කර බලන්න. මොස්කව් මැතිවරණ හා අගෝස්තු 12 මොස්කව් වැඩ වර්ජනය සංසන්දනය කරන්න.[57] ඒවා ජනතාවට නායකත්වය දෙන විප්ලවකාරී කොටස්වල බහුතරය හා සම්බන්ධ වාස්තවික කරුණුය.

ප්‍රජාතන්ත්‍රවාදී සාකච්ඡා සභාව ගොවි ජනතාව රවටයි. එය ඔවුනට සාමයවත්, ඉඩම්වත් නොදෙයි.

ගොවි ජනතාවගේ ඉල්ලීම් ඉටු කරනු ඇත්තේ බොල්ෂෙවික් ආණ්ඩුවක් පමණකි

* * *

හරියටම මෙම මොහොතේදීම බොල්ෂෙවික්වරුන් බලය ගත යුත්තේ මන්ද?

එසේ කළ යුත්තේ සිදුවෙන්නට යන පරිදි පෙට්‍රොග්‍රෑඩය පාවා දීම නිසා අපට ඇති තත්වය සිය ගුණයකින් වඩාත් අවාසි සහගත කෙරෙන හෙයිනි,

තවද, යුද්ධ හමුදාව කෙරෙන්ස්කි සහ සමාගමේ නායකත්වය යටතේ පවතින තාක් කල් පෙට්‍රොග්‍රෑඩය පාවා දීම වැලැක්වීමේ ශක්තියක්ද අපට නැත.

එහෙත් ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය එන තෙක් "බලා සිටීම" ද අපට නොකළ හැකිය. පෙට්‍රොග්‍රෑඩය පවාදීමෙන් පසුව, කෙරෙන්ස්කි සහ සමාගමට එය කඩා කප්පල් කර දැමීම සැම විටම කළ හැකි වනු ඇත. ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය කැඳවීම සාර්ථක කළ හැක්කේ, බලය ලබාගත් අප පක්ෂයට පමණකි. එවිට අනිකුත් පක්ෂ ප්‍රමාද වීම ගැන ඒවාට චෝදනා කිරීමටත්, එම චෝදනා සාධාරණ බව පෙන්වීමටත් අප පක්ෂයට හැකිවේ[58]

බ්‍රිතාන්‍යයන් හා ජර්මානුන් අතර වෙනම සාමයක් ඇති කර ගැනීම වැලැක්විය හැක්කේ සහ වැලැක්විය යුත්තේ ප්‍රමාදව ක්‍රියා කිරීමෙන් පමණකි.

මෙන්ෂෙවික්වරුන්ගේ සහ සමාජවාදී-විප්ලවවාදීන්ගේ අස්ථිර ගති ජනතාවට එපා වී තිබේ. ගොවි ජනතාව අප සමග ඉදිරියට යනු ඇත්තේ අප ප්‍රධාන නගරවල ජයග්‍රහණය කළහොත් පමණකි.

* * *

කැරලි ගසමින් නැගී සිටීමේ "දිනය" හෝ "මොහොත" ගැන අප සැලකිලිමත් වන්නේ එහි පටු අර්ථයෙන් නොවේ, එය තීරණය කරනු ලබන්නේ කම්කරුවන් සහ සොල්දාදුවන් සමග, එනම්, පොදු ජනතාව සමග සම්බන්ධකම් ඇතිව සිටින අයගේ පොදු කැමැත්ත අනුවය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

දැන් ප්‍රජාතන්ත්‍රවාදී සාකච්ඡා සභාවේදී, අප පක්ෂය තමන්ගේම සම්මේලනය පවත්වන බඳු තත්වයක් ඇතිවන බවත්, එම සම්මේලනය (එය කැමති වුනත් නැතත්) විප්ලවයේ ඉරණම ගැන තීරණය කළ යුතු බවත් සැලකිල්ලට ගතමනාය.

කළ යුතුව තිබෙන්නේ අප පක්ෂයේ කර්තව්‍යය පැහැදිලි කිරීමය. වර්තමාන කර්තව්‍යය විය යුත්තේ පෙට්‍රොග්‍රෑඩයේ සහ මොස්කව්හි (එහි අවට ප්‍රදේශයද ඇතුලත්ව) ආයුධ සන්නද්ධව නැගී සිටීම, බලය අල්ලා ගැනීම සහ ආණ්ඩුව පෙරළා දැමීමය. එය ඒ ආකාරයෙන්ම පුවත්පත්වලින් නොකියා, මේ සඳහා උද්ඝෝෂණය කරන්නේ කෙසේද යන්න අපි සලකා බැලිය යුත්තෙමු.

කැරලි ගැසීම ගැන, "කැරලි ගැසීම කලාවකි"[59] යනාදී වශයෙන් කී මාක්ස්ගේ වචන අපි මතක තබා ගත යුත්තෙමු, අගය කළ යුත්තෙමු.

* * *

බොල්ෂෙවික්වරු "විධිමත්" බහුතරය බවට පත්වන තෙක් බලා සිටීම බොළඳ කමක් වේ. කිසිම විප්ලවයක් එතෙක් බලාසිටින්නේ නැත. කෙරෙන්ස්කි සහ සමාගමද බලා සිටින්නේ නැතිව, පෙට්‍රොග්‍රෑඩය පාවා-දීමට සූදනම් වෙති. ප්‍රජාතන්ත්‍රවාදී සාකච්ඡා සභාවේ වැනෙන සුලු භාවය නිසා පෙට්‍රොග්‍රෑඩ් සහ මොස්කව් කම්කරුවන්ගේ ඉවසීම කෙළවර වනු නියතය! අපි දැන් බලය නොගන්නෙමු නම් ඉතිහාසය අපට සමාව නොදෙනු ඇත.

පාලන යන්ත්‍රයක් නොමැතිද? පාලන යන්ත්‍රයක් ඇත. සෝවියට් සභා සහ ප්‍රජාතන්ත්‍රවාදී සංවිධානවලින් එය සැදී තිබේ.

හරියටම දැන්, බ්‍රිතානීන් හා ජර්මානුන් අතර වෙනම සාමයක් ඇති කර ගැනීමේ පූර්වාසන්න මොහොතේ, ජාත්‍යන්තර තත්වය අපට වාසිදායකය. මේ දැන් ජාතීන්ට සාමය යෝජනා කිරීම යනු, ජයග්‍රහණය අත් කර ගැනීම වන්නේය.

මොස්කව් සහ පෙට්‍රොග්‍රෑඩ් යන නගර දෙකෙහිම එකවර (මේ දෙකෙන් කුමක් ඉස්සර වුවත් වරදක් නැත. සමහර විට මොස්කව් නගරය මුල් පියවර ගනු ඇත.) බලය ගැනීමෙන් අපි සම්පූර්ණයෙන්ම හා නිශ්චිත ලෙසම ජයග්‍රහණය කරන්නේමු.

1917 සැප්තැම්බර් 12—14 (25—27) ලියන ලදී

එන්. ලෙනින්

"ප්‍රොලිතාර්ස්කයා රෙවලූට්සියා" අංක 2 සහරාවෙහි 1921 දී ප්‍රථමයෙන් පළ කරන ලදී.

සම්පූර්ණ කෘති 5 වැනි මුද්‍රණය, වෙළුම 34, පිටු 239-241

මාක්ස්වාදය හා කැරලි ගසා නැගී සිටීම

රු. ස. ප්‍ර. ක. ප. (බො) මධ්‍යම කාරක සභාවට ලිපිය

කැරලි ගැසීමට සූදනම් වීමේ කටයුතු කිරීම සහ සාමාන්‍ය වශයෙන් කැරලි ගසා නැගී සිටීම කලාවක් ලෙසට සැලකීම "බ්ලාන්කීවාදය" යයි කියන අවස්ථාවාදී බොරුව ප්‍රබල "සමාජවාදී පක්ෂ විසින් මාක්ස්වාදය සම්බන්ධයෙන් කරනු ලබන ඉතාමත් දරුණු සහ සමහර විට ඉතාමත් පැතිරී ගිය විකෘති කිරීම් අතුරෙන් එකකි.

අවස්ථාවාදයේ නායකයා වූ බර්න්ෂ්ටයින් මාක්ස්වාදයට බ්ලාන්කිවාදය පිළිබඳ චෝදනා නැගීමේ අවාසනාවන්ත ප්‍රසිද්ධිය දැනටමත් ලබා ගෙන තිබෙන හෙයින්, අපගේ වර්තමාන අවස්ථාවාදීන් බ්ලාන්කීවාදය ගැන කරන ඝෝෂණයෙන් බර්න්ෂ්ටයින්ගේ එම සුළු පටු "අදහස්" අල්ප මාත්‍ර වශයෙන් හෝ "පොහොසත්" නොකෙරේ.

මාක්ස්වාදීන් කැරලි ගසා නැගී සිටීම කලාවක් ලෙස සලකන නිසා ඔවුන්ට බ්ලාන්කීවාදීන් යයි කියා චෝදනා කරනු ලැබේ. මීට වඩා නින්දිත ලෙසට සත්‍ය කණ පිට පෙරළීමක් සිදුවිය හැකිද? මේ ගැන මාක්ස්ම ඔහුගේ අදහස ඉතාමත් නිශ්චිත ලෙස, කියන ලෙස සහ ඒකාන්ත ලෙස ප්‍රකාශ කරමින්, කැරලි ගසා නැගී සිටීම කලාවක් ලෙස විශේෂයෙන්ම විස්තර කොට, එය එසේ සැලකිය යුතු බවත්, ප්‍රථම ජයග්‍රහණය ලබාගෙන ඊළඟට සතුරාට විරුද්ධව ප්‍රහාරය නොනවත්වාම ගෙනයමින්, ඔහු අවුලට පත්ව සිටීම ආදිය වාසියට හරවා ගනිමින් ජයග්‍රහණයෙන් ජයග්‍රහණයට යා යුතු බවත්, ප්‍රකාශ කළේය. මාක්ස් එසේ කී බව, එකද මාක්ස්වාදියෙක් හෝ ප්‍රතික්ෂේප නොකරනු ඇත.

කැරැල්ලක් සාර්ථක වීම සඳහා එය කුමන්ත්‍රණය මත නොව, පක්ෂය මත නොව, වඩාත් දියුණු පංතිය මත පදනම් විය යුතුය. ප්‍රථම කරුණ මෙයයි. කැරැල්ල ජනතාවගේ විප්ලවවාදී උත්සන්නියක් මත විශ්වාසය තැබිය යුතුය. දෙවැනි කාරණය එයයි. කැරැල්ල, ජනතාවගේ දියුණුතම පිරිස්වල ක්‍රියාකාරිත්වය උපරිම මට්ටමෙහි පවතින, සතුරු පිරිස් සහ

https://liberationbase.wordpress.com

විප්ලවයේ දුර්වල, එක්සිත් නැති හා අධිෂ්ඨාන විරහිත මිතුරු පිරිස් අතර වැනෙන සුලු භාවය ඉතාමත් බලවත් අවස්ථාව වන, වර්ධනය. වන විප්ලවයේ ඉතිහාසයේ සන්ධිස්ථානය කෙරෙහි විශ්වාසය තැබිය යුතුය. තුන්වැනි කරුණ එයයි. කැරලි ගැසීම පිළිබඳ ප්‍රශ්නය මතු කිරීමට අදාළව මෙම කොන්දේසි තුන සැලකිල්ලට ගැනීමෙන් මාක්ස්වාදය හා බ්ලැන්කීවාදය අතර වෙනස පෙනී යන්නේය.

එසේ වුවද, මෙම කොන්දේසි ඉටුවී පවතින කල කැරලි ගසා නැගී සිටීම කලාවක් සේ නොසැලකීම මාක්ස්වාදය පාවා දීමක්, විප්ලවය පාවා දීමක් වන්නේය.

මුළු මහත් සිදුවීම් මාලාවම විසින් කැරලි ගැසීම දවසේ කාර්යය ලෙසට වාස්තවික ලෙස නියම කරන ලද මොහොත, හරියටම මෙම අවස්ථාව බව පක්ෂය පිළිගත යුතුය යනුත්, කැරලි ගසා නැගී සිටීම කලාවක් සේ පිළිගත යුතුය යනුත් පෙන්වාදීමට, සංසන්දනය කිරීමේ ක්‍රමය උපයෝගි කර ගැනීම සහ ජූලි 3—4 දින සහ සැප්තැම්බර් දින සමාන්තර කර බැලීම, සමහර විට වඩාත් සුදුසු විය හැකිය.

කොහොම වුණත්, කැරලි ගැසීම පිළිබඳ චෝදනාව අප වෙත එල්ල කොට, නිර්දය ලෙස අපට කැරලි කරුවන් සේ සැලකීමට අපගේ සතුරන් ක්‍රියා කරන බව අපේක්ෂා කළ හැකිව තිබුණු හෙයින්, කළ යුතුව තිබුණේ බලය ගැනීම යයි සත්‍යයට පිටු නොපා ජූලි 3—4 දිනවල තර්ක කළ හැකිව තිබුණි. එහෙත් කැරැල්ල ජයග්‍රහණය කිරීමට අවශ්‍ය වාස්තවික කොන්දේසි ඉටු වී නොතිබුණ හෙයින්, එම අවස්ථාවේ ඉහත කරුණු සලකා බලය ගැනීමට තීරණය කළේ නම්, එය වරදක් වන්නට තිබුණි.

1. විප්ලවයේ පෙරමුණු බල ඇණිය වන පංතියේ සහයෝගය ඒ වන විටත් අපට නොතිබුණි.

පෙට්‍රොග්‍රෑඩ් සහ මොස්කව් කම්කරුවන්ගෙන් සහ සොල්දදුවන්ගෙන් බහුතරයක් අපට ඒවන විටත් නොතිබිණි. දැන් එම සෝවියට් සභා දෙකෙහිම අපට බහුතරයක් ඇත. එය ඇති වූයේ තනිකරම ජූලි සහ අගෝස්තු ඉතිහාසය නිසාය; බොල්ෂෙවික්වරුන්ට දක්වන ලද "නිර්දය සැලකිල්ල" කෙරෙන් ලත් අත් දැකීම නිසාය; කර්නිලව් කැරැල්ලේ[60] අත්දැකීම් නිසාය.

2. එම අවස්ථාවේදී දේශ ව්‍යාප්ත උත්සන්නියක් නොවීය. දැන්, කර්නිලව් කැරැල්ලට පසුව, එවැනි උත්සන්නියක් ඇත. පළාත්වල පවතින තත්වයෙන් සහ ප්‍රදේශ බොහොමයක සෝවියට් සභා බලය ගැනීමෙන් මෙය ඔප්පු වේ.

3. එම වකවානුවේදී, බරපතල ලෙස ගත හැකි දේශපාලන පරිමාණයකින් සතුරන් සහ අධිෂ්ඨාන විරහිත සුළු ධනපතියන් අතර වැනෙන සුලු භාවය නොදක්නා ලදී. දැන් ඔවුනතර වැනෙන සුලු භාවය විශාල ලෙස පැතිරී ඇත. අපගේ සතුරා වන මිත්‍ර සහ ලෝක අධිරාජ්‍යවාදය (ලෝක අධිරාජ්‍යවාදයට නායකත්වය දෙන්නේ "මිත්‍ර" බලවතුන්ය) ජයග්‍රාහී අවසානයක් දක්වා යුද්ධය කිරීමත්, රුසියාවට විරුද්ධව එල්ල කළ වෙනම සාමයක් ඇති කර ගැනීමත් අතර, එහා මෙහා වැනෙන්නට පටන් ගෙන සිටියි. අපගේ සුළු ධනපති ප්‍රජාතන්ත්‍රවාදීන්ට[61] ජනතාව අතර වූ බහුතරය පැහැදිලිවම නැතිව යාම නිසා, බලවත් වැනෙන සුලු භාවයක් පෑමට පටන් ගෙන තිබෙන ඔවුහු, කැඩේට්වරු සමග පෙරමුණක්, එනම්, සභාගයක්, ඇති කරගැනීම ප්‍රතික්ෂේප කර ඇත්තාහ.

4. එනිසා ජූලි 3—4 දිනවල කැරලි ගසා නැගී සිටින ලද නම් එය වරදක් වන්නට තිබුණි. එසේ වී නම් අපට භෞමික වශයෙන් හෝ දේශපාලන වශයෙන් හෝ බලය රැක ගැනීමට හැකියාවක් නොතිබුණි. ඒ අවස්ථාවේදී පෙට්‍රොග්‍රෑඩය අපගේ අතෙහි තිබුණ නමුත්, පෙට්‍රොග්‍රෑඩය සඳහා සටන් කර මිය යාමට අපගේ කම්කරුවන් සහ සොල්දදුවන් එවිට සූදානම්ව නොසිටි නිසා අපට භෞමික වශයෙන් එය ආරක්ෂා කර ගැනීමට හැකියාවක් නොවීය. එම වකවානුවේදී කෙරෙන්ස්කිලාගේත්, ට්සෙරතේලිලාගේ සහ චෙර්නොව්ලාගේත් යන දෙකොටසෙහිම, ඒ "මිලේච්ඡා භාවය" හෝ රෞද්‍ර ක්‍රොධය දක්නට නොතිබුණි. සමාජවාදී-විප්ලවවාදීන්ගේ සහ මෙන්ෂෙවික්වරුන්ගේද සහභාගිත්වය ඇතිව, බොල්ෂෙවික්වරු තලා පෙළා දැමීම පිළිබඳ අත් දැකීමෙන්, අපගේ ජනතාව එවකට තවමත් පන්නරය ලබා නොසියහ.

ජූලි 3—4 දිනවල, එනම්, කර්නිලව් කැරැල්ලට පෙර, යුද්ධ හමුදව සහ පළාත් පෙට්‍රොග්‍රෑඩයට විරුද්ධව එන්නට ඉඩ තිබුණු නිසා සහ එනු ඇතැයි අපේක්ෂා කළ හැකි වූ නිසා එකල දේශපාලන වශයෙන් අපට බලය රැක ගැනීමේ හැකියාවක් නොවීය.

දැන් පින්තූරය ඊට හාත්පසින්ම වෙනස්ය.

විප්ලවයේ පෙරමුණු බල ඇණිය වන, ජනතාවගේ පෙරමුණු බල ඇණිය වන හා ජනතාව තමන් සමග පෙරට ගෙනයාමට සමත් වන පංතියේ බහුතරයෙහි අනුගාමිකත්වය අපට ඇත. චෙර්නොව්ගේ ඉල්ලා අස්වීම, සමාජවාදී-විප්ලවවාදීන්ගේ පෙරමුණෙන් (නැතහොත්, සමාජවාදී-විප්ලවවාදීන්ගෙන්ම) ගොවි ජනතාවට ඉඩම් නොලැබෙන බව කියන ඉතාමත් සිත් කාවදින සහ පැහැදිලි, එහෙත් හුදකලා, නොවන, සලකුණ වන බැවින්, අපට ජනතාවගේ බහුතරයෙහි පක්ෂපාතිත්වය ඇත. ඒ අනුව, අපගේ විප්ලවය පොදුජන ස්වභාවයක් ගැනීමට එය ප්‍රධාන වශයෙන් හේතු වන්නේය.

සමස්තයක් වශයෙන් මුළු අධිරාජ්‍යවාදයත්, සමස්තයක් වශයෙන් මුළු මෙන්ෂෙවික් සහ සමාජවාදී-විප්ලවවාදී පෙරමුණත් විශ්වාස කළ

https://liberationbase.wordpress.com

නොහැකි ආකාරයෙන් වැනෙන සුලු ගතියකින් පෙළෙන විට, යායුත්තේ කුමණ අතටද යන්න ඒකාන්ත ලෙස දන්නා පක්ෂයක් ලෙසට අපි වාසිදයක තත්වයක සිටිමු.

ජනතාව දිවි නොතකන තත්ත්වයට ආසන්නව සිටින හෙයින්ද, අප මුළු ජනතාවටම නොවරදින ගැලවීමේ මාර්ගයක් පෙන්වන හෙයින්ද, අපගේ ජයග්‍රහණය සහතිකය. අපගේ නායකත්වය කොතරම් අගනේද යන්න අපි ''කර්නිලව් දිනවලදී'' මුළු ජනතාවටම පෙන්නුම් කෙළෙමු. පෙරමුණේ දේශපාලනඥයන්ගේ වැනෙන සුලු භාවයෙහි අඩුවක් නැතත් අප එම වකවානුවේදී ඔවුන් සමග සම්මුතියක් යෝජනා කෙළෙමු. ඔවුහු එය ප්‍රතික්ෂේප කළහ.

සම්මුතියක් සඳහා වූ යෝජනාව තවමත් ප්‍රතික්ෂේප කර නැතැයිද, ප්‍රජාතන්ත්‍රවාදී සාකච්ඡා සභාව එය පිළිගනු ඇතැයිද, කල්පනා කිරීම බරපතල වරදක් විය හැකිය. සම්මුතිය පක්ෂයක් විසින් පක්ෂවලට යෝජනා කරන ලද්දක් විය. එය වෙනත් ආකාරයකින් යෝජනා කිරීමේ හැකියාවක් නොවීය. පක්ෂ විසින් එය ප්‍රතික්ෂේප කරන ලදී. ප්‍රජාතන්ත්‍රවාදී සාකච්ඡා සභාව, සාකච්ඡා සභාවක්ම මිස, ඊට වඩා යමක් නොවේ. එක කරුණක් අමතක නොකළ යුතුය. එනම්, විප්ලවවාදී ජනතාවගෙන්, දුප්පතුන්ගෙන් සහ අප්‍රසාදයට පත් ගොවි ජනතාවගෙන් බහුතරය එහි නියෝජනය නොවන බවය, එය ජනතාවගෙන් අල්ප තරයක සාකච්ඡා සභාවකි. මෙම පැහැදිලි සත්‍යය අමතක නොකළ යුතුය. අපි ප්‍රජාතන්ත්‍රවාදී සාකච්ඡා සභාව පාර්ලිමේන්තුවක් යයි සලකමු නම්, එය හුදෙක්ම අපගේ පාර්ලිමේන්තු විකලාංගවාදයක් වනු ඇත. මක් නිසාද යත්, එය තමන් ස්ථිර සහ ස්වෛරී පාර්ලිමේන්තුවක් ලෙසට ප්‍රකාශයට පත් කළත්, එයට කිසි දෙයක් තීරණය කළ නොහැකි වනු ඇති බැවිනි. තීරණය කිරීමේ බලය ඇත්තේ ඉන් බාහිරව, පෙට්‍රොග්‍රෑඩ් හා මොස්කව් කම්කරු කොටස් අතරය.

සාර්ථක ලෙස කැරලි ගසා නැගී සිටීම සඳහා අවශ්‍ය සියළු වාස්තවික කොන්දේසි ඉටුවී ඇත. මිහි පිට ඉතාමත් වේදනා සහගත දෙය වන හා ජනතාව විඩාවට පත්කර තිබෙන අවිනිශ්චිතතාවය, කැරලි ගසා අප ලබන ජයග්‍රහණයකින් පමණක් කෙළවර කළ හැකි වන තත්ත්වයක් පැවතීමේ වාසිය අපට ඇත. එම තත්ත්වය යටතේ ගොවිජනතාවට වහාම ඉඩම් ලැබෙන්නේ කැරැල්ලෙන් අප ජයග්‍රහණය කළොත් පමණකි. එම තත්ත්වය යටතේ, විප්ලවයට විරුද්ධව එල්ල කළ වෙනම සාමයක් ඇති කිරීමේ ක්‍රීඩාව නතර කළ හැක්කේ, නැතහොත්, වඩාත් සම්පූර්ණ, වඩාත් සාධාරණ සහ වඩාත් කඩිනම් සාමයක්, එනම්, විප්ලවයට සෙතක් සලසන සාමයක්, යෝජනා කිරීමෙන් එම ක්‍රීඩාව නතර කළ හැක්කේ, කැරැල්ලෙන් අප ජයග්‍රහණය කළහොත් පමණකි.

අවසාන වශයනේ පෙට්‍රොග්‍රෑඩය බේරා ගත හැක්කේ අපගේ පක්ෂයට පමණකි; අපගේ පක්ෂය කැරලි ගසා ඉන් ජය ලැබීමෙන් පමණකි. එසේ කියන්නේ, අපගේ සාම යෝජනාව ප්‍රතික්ෂේප කරන ලදහොත්, අපට යටත් පිරිසෙයින් යුද විරාමයක්වත් නොලැබේ නම්, එවිට අප ''ආරක්ෂාවාදීන්'' වන හෙයිනි. එවිට අපි යුද්ධ පක්ෂවල මුල් තැන ගන්නෙමු.අපි ඉතාමත් විශිෂ්ඨ යුද්ධමය පක්ෂයක් වන්නෙමු.එසේම අපි නියම විප්ලවවාදී ආකාරයෙන් යුද්ධය කරගෙන යන්නෙමු. අපි පාන් සහ සපත්තු සියල්ලම ධනපතියන්ගෙන් රැගන්නෙමු. අපි ඔවුනට පාන් පොතු සහ රළු සපත්තු පමණක් ඉතිරි කරන්නෙමු. අපි පාන් සපත්තු සියල්ලම යුද පෙරමුණට යවන්නෙමු.

ඒ ආකාරයෙන් අපි පෙට්‍රොග්‍රෑඩය බේරා ගන්නෙමු.

සැබැවින්ම විප්ලවවාදී යුද්ධයක් කිරීම සඳහා තවමත් රුසියාවේ තිබෙන දේශපාලන සහ ජීවගුණික යන දෙආකාරයේම සම්පත් බොහෝය. ජර්මානුන් අපට තාවකාලික සාමයක් හෝ දෙතැයි යන්න විශ්වාස කිරීමට ඇත්තේ සියයට එකක ඉඩක් පමණකි. තවද දැන් යුද විරාමයක් දිනා ගැනීම යනු මුළු ලෝකයම දිනා ගැනීමක්වේ.

* * *

විප්ලවය ආරක්ෂා කිරීම පිණිස සහ කණ්ඩායම් දෙකෙහිම අධිරාජ්‍යවාදීන් විසින් රුසියාව කොටස්වලට ''වෙනම'' වෙන් කර ගැනීම වලක්වනු පිණිස පෙට්‍රොග්‍රෑඩ් සහ මොස්කව් කම්කරුවන් කැරලි ගැසීමේ පරම අවශ්‍යතාවය පිළිගත් පසු, අප ප්‍රථමයෙන්ම කළ යුත්තේ වර්ධනය වෙමින් පවතින කැරැල්ලෙහි කොන්දේසිවලට ගැලපෙන සේ සාකච්ඡා සභාවේදී අප අනුගමනය කරන දේශපාලන උපක්‍රම හැඩ ගැස්වීමය. දෙවැනිව, කැරැලි ගසා නැගී සිටීම කලාවක් සේ සැලකිය යුතුය යන මාක්ස්ගේ අදහස අප පිළිගන්නේ වචනයෙන් පමණක් නොවන බව පෙන්විය යුතුය.

සාකච්ඡා සභාවේදී සංඛ්‍යාව වැඩි කර ගැනීමට ව්‍යාවෘත නොවී, එහි බොල්ෂෙවික් කණ්ඩායම තරයේ ඒකාබද්ධ කර ගැනීමට අපි වහාම කටයුතු කළ යුත්තෙමු. එසේ කිරීමේදී අස්ථිර ගති පාන අය වැනෙන සුලු අයගේ කඳවුරෙහි සිටින්නට හැරීමට අප බිය නොවිය යුතුය. ඔවුන් අධිෂ්ඨාන සහගත සහ කැප වූ සටන්කරුවන්ගේ කඳවුරෙහි සිටිනවාට වඩා එහි සිටීම විප්ලවයට ප්‍රයෝජනවත්ය.

දීර්ඝ කථාවලින් සහ පොදුවේ කරන ''කථා'' වලින් වැඩක් නැති බවද, විප්ලවය ආරක්ෂා කර ගැනීමට වහාම කටයුතු කිරීමේ අවශ්‍යතාවයද, ධනපති පංතියෙන් සම්පූර්ණයෙන්ම බිඳී වෙන්වීමේ වර්තමාන ආණ්ඩුව එහැම පිටින්ම ඉවත්කර දැමීමේ, රුසියාව කොටස්වලට

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

“වෙනම” වෙන් කර ගැනීමට කටයුතු සූදනම් කරමින් සිටින ඉංග්‍රීසි-ප්‍රංශ අධිරාජ්‍යවාදීන් කෙරෙන් සම්පූර්ණයෙන්ම වෙන්වීමේ සහ සියළු බලය විප්ලවවාදී නිර්ධන පංතියේ නායකත්වයෙන් යුත් විප්ලවවාදී ප්‍රජාතන්ත්‍රවාදීන්ට වහාම පැවරීමේ පරම අවශ්‍යතාවයද, ඒකාන්ත ලෙස අවධාරණය කරමින් බොල්ෂෙවික්වරුන් නමින් නිකුත් කිරීම සඳහා අපි කෙටි ප්‍රකාශයක් සකස් කළ යුත්තෙමු.

ජනතාවට සාමයද, ගොවිජනතාවට ඉඩම්ද, අපචාරවත් ලාභ රාජසන්තක කිරීමද, ධනපතියන් විසින් අපචාරවත් ලෙස නිෂ්පාදය කඩා කප්පල් කරනු ලැබීම වැලැක්වීම ද පිළිබඳ වූ වැඩ පිළිවෙළෙහි එන යෝජනා සමග සම්බන්ධ කර මෙම නිගමනය ඉතාමත් සංක්ෂිප්ත ලෙස සහ තියුණු ලෙස අපගේ ප්‍රකාශයෙහි යෙදුම් ගත කළ යුතු වේ.

ප්‍රකාශය කෙටි වූ තරමට, එය තියුණු වූ තරමට හොඳය. තවත් අතිශයින්ම වැදගත් කරුණු දෙකක් පමණක් එහි පැහැදිලි ලෙස ඇතුලත් කළ යුතුය. ඒවා නම්, අවිනිශ්චිතතාවය නිසා ජනතාව විඩාවට පත්ව ඇති බව හා සමාජවාදී-විප්ලවවාදීන්ගේ සහ මෙන්ෂෙවික්වරුන්ගේ අධිෂ්ඨාන විරහිත භාවය ජනතාවට තිත්ත වී ඇති බවද, මෙම පක්ෂ විප්ලවයට ද්‍රෝහී වී තිබෙන නිසා අප නිශ්චිත වශයෙන්ම ඒවායෙන් බිඳී වෙන්වන බවද වේ.

LIBERATIONBASE

තවත් කරුණකි. රටවල් අල්ලා ගැනීමෙන් තොර සාමයක් වහාම යෝජනා කිරීමෙන් හා මිත්‍ර අධිරාජ්‍යවාදීන් සහ සියළුම අධිරාජ්‍යවාදීන් කෙරෙන් වහාම බිඳී වෙන්වීමෙන්, එක්කෝ එක් වරම අපට යුද විරාමයක් ලබා ගත හැකි වන්නේය. නැතහොත් මුළු මහත් විප්ලවවාදී නිර්ධන පංතියම රට ආරක්ෂා කිරීමට එක්රොක් වනු ඇත. එවිට විප්ලවවාදී ප්‍රජාතන්ත්‍රවාදීන් නිර්ධන පංතියේ නායකත්වය යටතේ සැබැවින්ම සාධාරණ, සැබැවින්ම විප්ලවවාදී යුද්ධයක් කරනු ඇත.

මෙම ප්‍රකාශය කියවීමෙන් පසුව, යෝජනා ලිවීමට නොව ක්‍රියා කිරීමට, කථා කිරීම නොව තීරණ ගැනීම කරන ලෙසට ආයාචනා කිරීමෙන් පසුව, අපි අපගේ මුළු කණ්ඩායමම පැක්ටරිවලට සහ බැරැක්කවලට පිටත් කළ යුත්තෙමු. ඔවුන්ට අයත් තැන එතැනය. ජීවිතයේ හදවත ගැහෙන තැන එතැනය. අපගේ විප්ලවයේ ආරක්ෂාවට ප්‍රභව මූලය එතැනය. එසේම ප්‍රජාතන්ත්‍රවාදී සාකච්ඡා සභාවේ ගාමක බලවේගය එතැනය.

එහිදී උත්සුක්ත ලෙස හා අනුවේදනීය ලෙස කථා කරමින් අපි අපගේ වැඩ පිළිවෙළ පැහැදිලි කර විකල්පය ඉදිරිපත් කළ යුත්තෙමු. එක්කෝ සාකච්ඡා සභාව එම වැඩ පිළිවෙළ මුළුමනින්ම පිළිගත යුතුය. නැතහොත්, කැරලි ගසා නැගී සිටිය යුතුය. මැද මාවතක් නොමැත. ප්‍රමාදයට කිසිම ඉඩක් නැත. විප්ලවය මිය යමින් පවතී.

ප්‍රශ්නය මේ ආකාරයෙන් ඉදිරිපත් කිරීමෙන්, අපගේ මුළු කණ්ඩායම

ම පැක්ටරි හා බැරැක්ක වෙත සංකේන්ද්‍රණය කිරීමෙන්, කැරැල්ල ආරම්භ කිරීමට නිසි මොහොත තීරණය කිරීමට අපට හැකි වෙනවා ඇත.

කැරලි ගසා නැගී සිටීම මාක්ස්වාදී ආකාරයෙන්, එනම්, කලාවක් ලෙස සැලකීම පිණිස, අපි ඒ හා සමගම, මොහොතක් හෝ අපතේ නොහැර කැරලිකාර කණ්ඩායම්වල මූලස්ථානය සංවිධානය කළ යුත්තෙමු. අපගේ බලකායයන් බෙදා හරිමින්, විශ්වාසවත් රෙජිමේන්තු ඉතාමත් වැදගත් ස්ථානවලට ගෙන යා යුත්තෙමු. අලෙක්සන්ද්‍රින්ස්කි නෘත්‍ය ශාලාව වටලා, පෙත්‍රපාව්ලව්ස්කය බලකොටුව[62] අතපත් කරගෙන, හමුදා ප්‍රධාන මණ්ඩලය සහ ආණ්ඩුව අත් අඩංගුවට ගත යුත්තෙමු. එසේම, නගරයේ මර්මස්ථානවලට ලං වීමට සතුරාට ඉඩ දෙනවාට වඩා මිය යාමට සූදනම් ඒ බලකායයන් යුංකර්[63] වරුන්ට සහ මිලේච්ඡ හමුදවට[64] විරුද්ධව සටනට යැවිය යුත්තෙමු. ආයුධ සන්නද්ධ කම්කරුවන් සටනට මෙහෙයවා, අන්තිම අවදනම් සටන කරන ලෙස ඔවුන්ට ආයාචනා කර වහාම දුරකථන සහ විදුලි පණිවුඩ හුවමාරු ස්ථානය අල්ලා ගෙන, මධ්‍යම දුරකථන හුවමාරු මධ්‍යස්ථානයට අපගේ කැරල්ලේ මූලස්ථානය ගෙන ගොස්, එය සියළුම පැක්ටරි, ආයුධ සන්නද්ධ සටන් කෙරෙන සියළුම ස්ථාන ආදිය සමග දුරකථන මාර්ගයෙන් සම්බන්ධ කළ යුත්තෙමු.

එහෙත්, මේ සියල්ලම සඳහන් කරන්නේ නිදසුන් වශයෙනි — මෙම අවස්ථාවෙහි කැරලි ගසා නැගී සිටීම කලාවක් ලෙස සලකතොත් මිස, මාක්ස්වාදයට පක්ෂපාත වීමක්, විප්ලවයට පක්ෂපාත වීමක් නොවිය හැකි බව පෙන්වා දීමට නිදසුන් වශයෙන් පමණකි.

එන්. ලෙනින්

1917 සැප්තැම්බර් 13-14 (26-27) ලියන ලදී

1921 වර්ෂයේදී “ප්‍රොලිතාර්ස්කයා රෙවලුට්සියා” සඟරාවේ අංක 2 කලාපයෙහි ප්‍රථමයෙන් පළකරන ලදී

සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 34,

පිටු 242-247

https://liberationbase.wordpress.com

දේශපාලන විචාරකයෙකුගේ දිනපොතෙන්

අප පක්ෂයේ වැරදි

1917 සැප්තැම්බර් 22, සිකුරාදා

ප්‍රජාතන්ත්‍රවාදී සාකච්ඡා සභාව යන්නෙහි අර්ථය ගැන අයෙකු වඩාත් මෙනෙහි කළ තරමට, අයෙකු පිටතින් සිට එය ගැන වඩාත් සුපරීක්ෂාකාරී ලෙස නිරීක්ෂණය කළ තරමට — පසෙක සිටින්නාට වඩාත් හොඳින් පෙනෙන බව කියනු ලැබේ — අප පක්ෂය එයට සහභාගී වීමෙන් කළේ වරදකැයි යන්න ඔහුට වඩාත් බලවත් ලෙස අවබෝධ වන්නේය. අපි එය වර්ජනය කළ යුතු වූයෙමු. අතීතය නිවරද කළ නොහැකි නිසා, එවැනි කරුණක් විග්‍රහ කර බැලීමේ ප්‍රයෝජනයක් තිබේ දැයි කෙනෙකුට ඇසිය හැකිය. එසේ වුවද, පසුගිය ද අනුගමනය කළ උපක්‍රම විවේචනය කිරීම ගැන දක්වන එවැනි විරෝධතාවයක් පදනම් විරහිත බව පැහැදිලිය. ''අතින් කටට'' ජීවිතයක් ගෙවනවුන්ගේ උපක්‍රම අපි කවදත් හෙළා දැක ඇත්තෙමු. මාක්ස්වාදීන් ලෙසට අපි ඒවා හෙළා දැකිය යුත්තෙමු. මෙහොතකට පමණක් ලබන ජයග්‍රහණය අපට ප්‍රමාණවත් නොවේ. සාමාන්‍ය වශයෙන්ම එක මිනිත්තුවක් හෝ දිනක් සඳහා ගණන් බලා සකස් කළ සැලසුම් අපට ප්‍රමාණවත් නොවේ. දේශපාලන සිදුවීම්වල කාරණරූප සම්බන්ධයත්, ඒවායේ ප්‍රතිඵලත් ඇතුලත්ව, එම සිදුවීම් දමය මුළුමනින්ම අධ්‍යයනය කිරීමෙන් අපි අපගේ නිරවද්‍යතාවය නිරතුරුවම පරීක්ෂණයට භාජනය කළ යුත්තෙමු. ඊයේ කළ වැරදි විග්‍රහ කර බැලීමෙන් අපි අද හා හෙට වැරදි මගහැරීමට උගෙන ගන්නෙමු.

රට තුළ අළුත් විප්ලවයක් මෝරාගෙන එන්නේය. එය වෙනත් (සාර්වාදයට විරුද්ධව විප්ලවය කළ පංතිවලට අමුතු) පංතිවල විප්ලවයකි. එම අවස්ථාවේදී එය සාර්වාදයට විරුද්ධ වූ නිර්ධන පංතියේ, ගොවිජනතාවගේ සහ ඉංග්‍රීසි-ප්‍රංශ මූල්‍ය ප්‍රාග්ධනය සමග සන්ධානගත වූ ධනපති පංතියේ විප්ලවයක් විය.

දැනට මෝරා එන විප්ලවය ධනපති පංතියට විරුද්ධ, එහි මිත්‍ර ඉංග්‍රිසි-ප්‍රංශ මූල්‍ය ප්‍රාග්ධනයට විරුද්ධ සහ බොනපාට්වාදී කෙරෙන්ස්කිගේ නායකත්වයෙන් යුත් එහි ආණ්ඩු යන්ත්‍රයට විරුද්ධ, නිර්ධන පංතියේත්, ගොවිජනතාවගෙන් බහුතරයෙහි, වඩාත් නිශ්චිතව කියතොත්, දුප්පත් ගොවියන්ගෙත් විප්ලවයකි.

අපගේ ප්‍රධාන නිල ප්‍රකාශනය වන ''රබෝචි පුත්''[65] හි පළ වී තිබෙන ලිපි අනුව බලන කල, පක්ෂය මෙම කරුණ ගැන එහි අදහස් පැහැදිලි කර තිබෙන නිසා නව විප්ලවයක් නැගී එන බව ඔප්පුකරන කරුණු සම්බන්ධයෙන් මෙම අවස්ථාවේදී විස්තර කිරීමට අපි අදහස් නො කරමු. නව විප්ලවවාදී උත්සන්නිය පක්ෂය විසින් පොදුවේ පිළිගන්නා ලද ප්‍රපංචයක් බවට පත්වී තිබේ. මෙම මෝරායාම පිළිබඳ දත්තයන් තවමත් සම්පිණ්ඩනය කර නොමැති නමුත්, ඒවා වෙනත් ලිපිවලට විෂය මාතෘකා කරගත යුතුය.

වර්තමාන අවස්ථාවෙහිදී වඩාත් වැදගත් වන්නේ පැරණි විප්ලවය සහ අළුත් විප්ලවය අතර පංති වෙනස්කම් කෙරෙහි ඉතාමත් කිට්ටු අවධානය යොමු කරවීමය; මෙම මූලික කාරණය වන, පංති සම්බන්ධකම් පිළිබඳ දෘෂ්ටි කෝණයෙන් දේශපාලන තත්ත්වය සහ අපගේ කර්තව්‍යයන් මැන බැලීමය. ප්‍රථම විප්ලවය අවස්ථාවේදී පෙරමුණු බල ඇණිය සැදුනේ කම්කරුවන් සහ සොල්දාදුවන්ගෙන්, එනම්, නිර්ධන පංතියෙන් සහ ගොවි ජනතාවගේ දියුණු කොටස්වලිනි.

මෙම පෙරමුණු බල ඇණිය විසින් ඉදිරියට ගෙනයනු ලැබූ පිරිස් අතර සුළු ධනපති පංතියේ ඉතාමත්ම වැනෙන සුලු කොටස් බොහෝ ගණනක් (සමූහාණ්ඩුව පිළිබඳ ප්‍රශ්නයේදී මෙන්ෂෙවික්වරුන් සහ තෘදවික්වරුන්[66] දැක්වූ අවිනිශ්චිතතාවය සිහියට නගන්න) පමණක් නොව කැඩෙට්වරුන්ගේ රාජාණ්ඩුවාදී පක්ෂයද, එම ඉදිරි ගමන නිසා සමූහාණ්ඩු පක්ෂයක් බවට පත් වූ ලිබරල් ධනපතියන් ද විය. එවැනි වෙනසක් සිදුවිය හැකි වූයේ කෙසේ ද?

එසේ වූයේ ධනපති පංතියට ආර්ථික ආධිපත්‍යය අන්සියල්ලටම වඩා වැදගත් වන අතර, දේශපාලන ආධිපත්‍යයේ ආකෘතිය ගැන ඔවුන් දක්වන්නේ ඉතා සුළු වැදගත් කමක් වන හෙයිනි. සමූහාණ්ඩුවක් යටතේද ධනපති පංතියේ පාලනය එසේම ශක්තිමත් ලෙස ගෙන යා හැක. සමූහාණ්ඩු දේශපාලන ක්‍රමයක් යටතේ ආණ්ඩුවේ සංයුතියෙහි හෝ දේශපාලන පක්ෂවල සංයුතියෙහි සහ කණ්ඩායම් ස්වභාවයෙහි වෙනස්වීම් කිසිවක් නිසා ධනපති පංතියට හානියක් නොවන හෙයින්, සමූහාණ්ඩුවක් යටතේ එහි ආධිපත්‍යය වඩාත් ස්ථිර ය.

එහෙත් රාජාණ්ඩු ආයතනවලින් ප්‍රාග්ධනයට සැපයෙන වඩාත් කාර්යක්ෂ ස්වභාවයේ ආරක්ෂාව වඩාත් පැහැදිලි සහ ''හිත කාමී'' නිසා ධනපති පංතිය රාජාණ්ඩුවට පක්ෂ විය; මතුවට ද පක්ෂ වනු ඇත. එසේ වුවද,

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

''පහළින්'' එන බලවත් බලපෑම යටතේ, ධනපති පංතිය නිතරම සහ සෑම තත්හිම, තමන්ගේ ආර්ථික ආධිපත්‍යය ආරක්ෂා කර ගත හැකි තාක් දුරට සමුහාණ්ඩුවකට ''ගැලපෙන සේ'' හැඩ ගැසී ඇත.

නිර්ධන පංතිය සහ දුප්පත් ගොවි ජනතාව, එනම්, ජනතාවගෙන් බහුතරය ධනපති පංතිය සහ මිත්‍ර (සහ ලෝක) අධිරාජ්‍යවාදය කෙරෙහි පවත්වන සම්බන්ධය අනුව, එම ජනතාවට තමන් සමග ධනපති පංතිය ඉදිරියට ''ගෙනයාම'' කිසිසේත් කළ නොහැකිය. එපමණක් නොවේ. සුළු ධනපති පංතියේ ඉහළ ස්ථරය සහ ප්‍රජාතන්ත්‍රවාදී සුළු ධනපති පංතියේ වඩාත් පොහොසත් ස්ථරය ප්‍රකට ලෙසම නව විප්ලවයකට විරුද්ධ වෙති. මෙම කරුණ ඉතා පැහැදිලි නිසා ඒ ගැන මෙහි විස්තර කිරීමේ අවශ්‍යතාවයක් නැත. ලිබර්දන්ලාගෙන්, ට්සෙරෙතේලිලාගෙන් සහ චෙර්නොව්ලාගෙන් මෙය ඉතාමත් පැහැදිලි ලෙස පෙනී යන්නේය.

පංති සම්බන්ධතාවයන් වෙනස් වී තිබේ. කාරණයේ අරටු කොටස එයයි.

දැන් විවිධ පංති ''වීදි බාධකයෙහි එක පැත්ත සහ අනිත් පැත්ත'' ගෙන සිටිති.

ප්‍රධාන කාරණය එයයි.

නව විප්ලවයක් ගැන කථා කිරීමට ඇති විද්‍යාත්මක හේතුව එය පමණකි. හුදෙක්ම න්‍යායික ලෙසත්, ප්‍රශ්නය වියුක්ත ලෙසත් ගනිමින් තර්ක කරතොත් එම විප්ලවය නීත්‍යානුකූල ලෙස සාර්ථක කළ හැක්කේ, නිදසුනක් ලෙසට, ධනපති පංතිය විසින් රැස් කෙරෙන ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය ධනපති පංතියට විරුද්ධ බහුතරයක්, එනම්, කම්කරුවන්ගේ හා ගොවි ජනතාවගේ පක්ෂවලට අයත් බහුතරයක් ඉදිරිපත් කළහොත් පමණකි.

වර්ජනය කිරීම හෝ සහභාගි වීම හෝ පිළිබඳ උපක්‍රම හිතුවක්කාර ලෙස හා අපගේ ''හිතවත්කම්'' අනුව නොව, මාක්ස්වාදී ආකාරයෙන් නිගමනය කිරීමට නම්, සැලකිල්ලට ගත යුතු වන්නේ, පංති අතර පවතින වාස්තවික සම්බන්ධ කම්ද, නිශ්චිත නියෝජිත ආයතන ඇතුළත හා ඉන් පිටත එම සම්බන්ධකම්වලින් ඉටු කෙරෙන (ආර්ථික හා දේශපාලන) කාර්ය කොටසද, විප්ලවයේ නැගීම හෝ බැසීමද, පාර්ලිමේන්තුවෙන් බාහිර අරගලය හා පාර්ලිමේන්තු මාධ්‍යය තුළින් කරන අරගලය අතර සම්බන්ධයද යන ප්‍රධාන, මූලික වශයෙන් වාස්තවික කරුණුය.

වර්ජනය කිරීමේ ප්‍රශ්නයට මාක්ස්වාදී ආකාරයෙන් සමීප විය යුත්තේ කෙසේද යන්න අපගේ විප්ලවයේ අත් දැකීම්වලින් පැහැදිලි ලෙස පෙන්නුම් කෙරේ.

බුලීගින් දූමා සභාව[67] වර්ජනය කිරීම නිවැරදි උපක්‍රමයක් බව ඔප්පු වූයේ මන්ද?

එසේ වූයේ එම උපක්‍රම, සංවර්ධනය වෙමින් පවතින සමාජ බලවේගයන්ගේ වාස්තවික පෙළ ගැස්මට අනුකූල වූ හෙයිනි. පාර්ලිමෙන්තුවාදයේ ''නැංගුරම් ලා ගැනීම'' පිළිබඳ බලාපොරොත්තුවක් ඇති නොකරන හා ජනතාව විප්ලවයෙන් වෙනතකට යොමු කරනු උදෙසා පිළිකුල් සහගත ලෙස එකට ගැට ගසන ලද, සම්මුති ස්වභාවයේ ආයතනයක් (බුලීගින් දූමා සභාව) රැස් කිරීමට කටයුතු කරමින් සිටි පැරණි පාලනය පෙරළා දැමීම සඳහා වූ සටන් පාඨය, මෝරා එන විප්ලවයට ලැබුණේ ඒ අනුව ය. නිර්ධන පංතියේ සහ ගොවි ජනතාවගේ පාර්ලිමේන්තුවෙන් බාහිර අරගල මාධ්‍යය වඩාත් ශක්තිමත් විය. බුලීගින් දූමා සභාව වර්ජනය කිරීමේ නිවැරදි උපක්‍රම, එනම්, වාස්තවික තත්ත්වය සැලකිල්ලට ගත් උපක්‍රම සකස්වූයේ මෙම මූලිකාංගයන්ගෙනි.

තුන්වැනි දූමා සභාව[68] වර්ජනය කිරීමේ උපක්‍රම වැරදි බව ඔප්පු වූයේ මන්ද?

එසේ වූයේ, එම උපක්‍රම, වර්ජන සටන් පාඨයේ ''සිත් ගන්නා ස්වභාවය'' මත හා ජූනි තුන්වැනි දින ''ඌරු කොටුව'' කෙරෙහි ඇති වූ පිළිකුල මත පමණක් පදනම් කරන ලද හෙයිනි. එහෙත් වාස්තවික තත්ත්වය වූයේ එක් අතකින් විප්ලවය බිඳ වැටෙන තත්ත්වයක හා වේගයෙන් අඩුවේගන යන තත්ත්වයක පැවතීමය. පාර්ලිමේන්තුවෙන් බාහිර ප්‍රචාරක, උද්ඝෝෂණ සහ සංවිධාන මාධ්‍යයන් නො පැවති තරම් හෝ ඉතාමත් දුර්වල හෝ වූ නිසා, විප්ලවයේ උත්සන්නිය සඳහා පාර්ලිමේන්තු පදනමක් (''ඌරු කොටුවක්'' තුළ වුවත්) දේශපාලන වශයෙන් අතිශයින් වැදගත් විය. අනිත් අතට, තුන්වැනි දූමා සභාවේ ඉතාමත් විවෘත ප්‍රතිගාමී ස්වභාවය නිසා, එය නියම පංති සම්බන්ධතාවය පිළිබිඹු කරන, එනම්, රාජාණ්ඩුවේ සහ ධනපති පංතියේ ස්තලිපින් සම්බන්ධය පිළිබිඹු කරන ආයතනයක් වීමෙන් වැලකුනේ නැත. නව පංති සම්බන්ධතාවය රට විසින් බැහැර කළ යුතු වූ දෙයක් විය.

තුන්වැනි දූමා සභාවට සහභාගිවීමේ උපක්‍රම සකස් වූයේ ද වාස්තවික තත්ත්වය නිසි ලෙස සැලකිල්ලට ගත් මෙම මූලිකාංගයන්ම විසිනි.

ප්‍රජාතන්ත්‍රවාදී සාකච්ඡා සභාවට, ප්‍රජාතන්ත්‍රවාදී සභාවට හෝ පාර්ලිමේන්තුවට සහභාගි වීම වැරදි උපක්‍රමයක් වනු ඇතැයි වටහා ගැනීමට, අත්දැකීමෙන් ලබා ගත් මෙම පාඩම්ද, වර්ජනය කිරීම හෝ සහභාගිවීම පිළිබඳ ප්‍රශ්නය වෙත මාක්ස්වාදී ආකාරයෙන් ළඟාවීමට අදාළ කොන්දේසිද ගැන කල්පනා කර බැලීම ප්‍රමාණවත්ය.

එක් අතකින් අළුත් විප්ලවයක් මෝරා එමින් පවතී. යුද්ධයද තදබල වෙයි. පාර්ලිමේන්තුවෙන් බාහිර ප්‍රචාරක, උද්ඝෝෂණ සහ සංවිධාන

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

මාධ්‍යයන් දුවැන්තය. මෙහි දී අදාළ පූර්ව-පාර්ලිමේන්තුවේ ''පාර්ලිමේන්තු'' චේදිකාවද ඉතාමත් කුඩාය. අනිත් අතට මෙම පූර්ව-පාර්ලිමේන්තුව නව පංති සම්බන්ධතාවයක් පිළිබිඹු කරන්නේ හෝ ඒ සඳහා උපයෝගීවන්නේ හෝ නැත. නිදසුනක් වශයෙන්, දැනටමත් පවතින ආයතනවලට (ගොවිජන නියෝජිත සෝවියට් සභාවලට) වඩා අල්ප වශයෙන් මෙහි ගොවිජනතාව නියෝජනය වේ. කිලුටු පෙරාගත් ලිබර්දන්ලා[69], ට්සෙරෙතේලිලා සහ චෙර්නොව්ලාත්, ඒ හා සමග කෙරෙන්ස්කි සහ සමාගමත්, ට්සෙරෙතේලි-බුලිගින් දූමා සභාවට තමන් කැමති අය පත් කිරීමෙන් පූර්ව-පාර්ලිමේන්තුවේ සංයුතිය ව්‍යාජයක් වී තිබෙන නිසා පමණක් නොව, ඊටත් වඩා බරපතල ලෙසට එම පූර්ව-පාර්ලිමේන්තුවේ එකම අරමුණ ජනතාවට උගුලක් ඇදීම, කම්කරුවන් හා ගොවි ජනතාව රැවටීම, ඔවුන් විප්ලවයේ නව උත්සන්නියෙන් ඉවතට යොමු කිරීම හා ධනපති පංතිය සමග වූ පැරණි, දීර්ඝ කාලයක් අත් හදා බලන ලද, වැරහැලි වුනු, පතුල ගෙවී ගිය ''සභාගයට'' (එනම්, ට්සෙරෙතේලි සහ සමාගම අධිරාජ්‍යවාදයට හා අධිරාජ්‍යවාදී යුද්ධයට ජනතාව යටත් කිරීමට උපකාරීවන කවටයන් බවට ධනපති පංතිය විසින් පත් කරනු ලැබීමට) පළන්දන නව ඇඳුමක දිස්නයෙන් පීඩිත පංතිවල ඇස් නිලංකාර කිරීම වන නිසාද, එහි හරය බොනපාට්වාදී රැවටිල්ලක්ම වන්නේය.

''අපි දැන් දුර්වල වෙමු'' යි සාර් 1905 දී ඔහුගේ රදළ ඉඩම් හිමියන්ට කීවේය. ''අපගේ බලය සැලෙමින් පවතී. කම්කරුවන්ගේ සහ ගොවි ජනයාගේ විප්ලවයේ වඩදිය නැගී එන්නේය. අපි 'සාමාන්‍ය මිනිසාට' උගුලක් ඇද්ද යුත්තෙමු. අපි ඔහුගේ ඇස් ඉදිරියේ යමක් නැටවිය යුත්තෙමු...''

''අපි දැන් දුර්වල වෙමු'' යයි වර්තමාන ''සාර්'' වන බොනපාට්වාදී කෙරෙන්ස්කි, කැඩෙට් වරුන්ටත් පක්ෂයක් නැති ටිට් ටිට්ච්[70] ලාටත්, ප්ලෙහානව්ලාටත්, බ්‍රෙෂ්කොව්ස්කයලා සහ සමාගමටත් කියයි — ''අපගේ බලය හෙල්ලුම් කමින් පවතී. ධනපති පංතියට විරුද්ධව කම්කරුවන්ගේ සහ ගොවිජනතාවගේ විප්ලවයේ රැල්ලක් නැගී එන්නේය. විප්ලවවාදී ප්‍රජාතන්ත්‍රවාදයේ සමාජවාදී-විප්ලවවාදී සහ මෙන්ෂෙවික් නායකයන් වන, අපගේ හිත මිතුරු ට්සෙරෙතේලිලා සහ චෙර්නොව්ලා, ජනතාව රැවටීමට 1917 මැයි මස 6 වැනි දින පටන් මේ දක්වා පැළඳගෙන සිටින ඒ කවටයාගේ ඇඳුම අළුත් පාටකින් සායම් කිරීමෙන් අපි ප්‍රජාතන්ත්‍රවාදීන් රැවටිය යුත්තෙමු. ''අපට පහසුවෙන්ම 'පූර්ව-පාර්ලිමේන්තුවක්' ඔවුන්ගේ ඇස් ඉදිරිපිට නැටවිය හැක.''

''අපි දැන් ශක්තිමත් වෙමු'' යයි සාර් 1907 ජූනි මාසයේදී ඔහුගේ රදළ ඉඩම් හිමියන්ට කීවේය. ''කම්කරුවන්ගේ සහ ගොවි ජනතාවගේ

විප්ලව රැල්ල බැසගෙන යන්නේය. එහෙත් අපට කලින් මෙන්ම අපගේ පැවැත්ම ගෙනයා නොහැකිය. රැවටිල්ල පමණක්ම ප්‍රමාණවත් නොවේ. අපි ගමෙහි දී අළුත් ප්‍රතිපත්තියක් අනුගමනය කළ යුත්තෙමු. අපි ගුච්කොව්ලා සහ මිල්යුකොව්ලා සමග, ධනපති පංතිය සමග නව ආර්ථික සහ දේශපාලන පෙරමුණක් ඇති කර ගත යුත්තෙමු.''

වර්ජනය කිරීමේ උපක්‍රමවලට අදාළවන වාස්තවික පදනම සහ පංති සම්බන්ධකම් සමග එහි ඇති ගැලපීම ඉතාමත් විචිත්‍ර ආකාරයෙන් ගෙන හැර දැක්වීම පිණිස 1905 අගෝස්තු, 1917 සැප්තැම්බර් සහ 1907 ජූනි කාලවල පැවති තත්ත්වයන් තුන මේ ආකාරයෙන් ඉදිරිපත් කිරීම සුදුසුය. පීඩකයන් විසින් පීඩිත පංති සැම කල්හිම රවටනු ලැබේ. එහෙත් මෙම රැවටීමේ අර්ථය ඉතිහාසයේ විවිධ අවස්ථාවලදී විවිධාකාර වන්නේය. පීඩකයෝ ජනතාව රවටතියි යන තනි කරුණ පදනම් කරගෙන උපක්‍රම සකස් කළ නොහැකිය. උපක්‍රම සකස් කළ යුත්තේ පංති සම්බන්ධකම්වල මුළු සමස්තයත්, පාර්ලිමේන්තුවෙන් බාහිර අරගලය හා පාර්ලිමේන්තු ස්වභාවයේ අරගලත් විග්‍රහ කිරීමෙන් පසුවය.

පූර්ව-පාර්ලිමේන්තුවට සහභාගී වීම, වාස්තවික පංති සම්බන්ධකම්වලට නොගැලපෙන, අවස්ථාවේ වාස්තවික තත්ත්වයන්ට නොගැලපෙන වැරදි උපක්‍රමය කි.

අප කළ යුතුව තිබුණේ ප්‍රජාතන්ත්‍රවාදී සාකච්ඡා සභාව වර්ජනය කිරීමය. එසේ නොකිරීමෙන් අප සියළු දෙනාටම වූයේ වැරදීමකි. එහෙත් වැරදීම් සිදුවීම අපරාධයක් නොවේ. අපට වැරදි නිවරද කර ගත හැකිවන්නේ පොදු ජනතාවගේ විප්ලවවාදී අරගලයට ආධාර කිරීමේ අවංක අභිලාෂයක් අපට ඇතොත් පමණකි; අප අපගේ උපක්‍රම ගැන මහත් සැලකිල්ලෙන් යුතුව සිතා බැලුව හොත් පමණකි.

අපි පූර්ව-පාර්ලිමේන්තුව වර්ජනය කළ යුත්තෙමු. අපි එය අත් හැර, කම්කරු, සොල්දදු සහ ගොවි නියෝජිත සෝවියට් සභා වෙත, වෘත්තීය සමිති වෙත, පොදු වශයෙන් ජනතාව වෙත යා යුත්තෙමු. අරගල කරන ලෙස අපි ඔවුන් අමතා හඬ නැගිය යුත්තෙමු. අපි ඔවුනට නිවැරදි සහ පැහැදිලි සටන් පාඨයක් දිය යුත්තෙමු: කෙරෙන්ස්කිගේ බොනපාට්වාදී කල්ලිය සහ මෙම ට්සෙරතේලි-බුලිගින් දූමා සභාව සහිත ඔහුගේ ව්‍යාජ පූර්ව-පාර්ලිමේන්තුව විසුරුවා හරිනු. කර්නිලොව් කැරැල්ලෙන් පසුව වුවද මෙන්ෂෙවික්වරු සහ සමාජවාදී-විප්ලවවාදීහු සෝවියට් සභාවලට (ඒ වන විට අපට ඒවායේ බහුතරයක් නොවීය) සාමකාමී ලෙස බලය පැවරීම පිළිබඳ අපගේ සම්මුති යෝජනාව පිළිගැනීම ප්‍රතික්ෂේප කළහ. ඔවුහු නැවතත් කැඩෙට්වරුන් සමග කැත සහ නින්දිත ආකාරයෙන් කේවෙල් කිරීම නැමති මඩ වගුරෙහි ගිලුනහ. මෙන්ෂෙවික්වරුන් සහ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සමාජවාදී-විප්ලවවාදීන් හංගවේවා! ඔවුනට විරුද්ධව නිර්දය ලෙස අරගල කරනු. සියළුම විප්ලවවාදී සංවිධානවලින් ඔවුන් නිර්දය ලෙස පලවා හරිනු. කිෂ්කින්ලාගේ ඒ මිත්‍රයන් සමග, කර්නිලව් වාදී ඉඩම්හිමියන්ගේ සහ ධනපතියන් ගේ මිත්‍රයන් සමග කිසිම සාකච්ඡාවක් නැත, කිසිම ගනු දෙනුවක් නැත.

සැප්තැම්බර් 23, සෙනසුරාද

ට්‍රොට්ස්කි වර්ජනය කිරීමට පක්ෂවිය. කදිමයි ට්‍රොට්ස්කි සහෝදරය!

ප්‍රජාතන්ත්‍රවාදී සාකච්ඡා සභාවේ බොල්ෂෙවික් කණ්ඩායම තුළ වර්ජනය කිරීම්වාදය පරාජය විය.

වර්ජනය දිනේවා!

තත්ත්වය කුමක් වුවත්, අපට සහභාගිවීමට අනුකූල වන සේ හැඩ ගැසෙන්නට නුපුළුවන. සාකච්ඡා සභා අතුරෙන් එකක කණ්ඩායම පක්ෂයේ උසස්ම බල මණ්ඩලය නොවේ. තවද පක්ෂයේ උසස්තම බල මණ්ඩලවල තීරණ පවා, අත්දැකීම පදනම් කරගෙන සංශෝධනය කිරීමට යටත් වන්නේය.

විධායක කාරක සභාවේ පූර්ව රැස්වීමකදී සහ පක්ෂයේ ඇති විශේෂ සම්මේලනයකදී වර්ජනය කිරීම පිළිබඳ ප්‍රශ්නය කුමණ අපහසුවක් හෝ විඳ නිරාකරණය කර ගැනීමට සියළු උත්සාහයන් දැරිය යුත්තෙමු. වර්ජනය කිරීමේ ප්‍රශ්නය සම්මේලනයට තෝරාපත් කිරීම සඳහා ද, පක්ෂය අභ්‍යන්තරයේ සියළුම තෝරා පත් කිරීම් සඳහා ද වේදිකාව කරගත යුත්තෙමු. අපි මෙම ප්‍රශ්නය සාකච්ඡා කිරීමේදී පොදු ජනතාව එයට සම්බන්ධ කර ගත යුත්තෙමු. පංති විඥානයෙන් යුත් කම්කරුවන් මෙම ප්‍රශ්නය විසඳීම තමන් අතට ගෙන, සාකච්ඡාව සංවිධාන කර, එමගින් "ඉහළ සිටින අය" කෙරෙහි බල පෑ යුතු වේ.

අපගේ පක්ෂයේ "ඉහළ" තැන්වල දක්නට ලැබෙන වැනෙන සුලු ගති ඇති බවට කිසිම සැකයක් නැත. අරගලය සංවර්ධනය වෙමින් පවතින නිසා මෙම වැනෙන සුලු ගති විනාශකාරී වන්නට ඉඩ තිබේ. යම් යම් තත්ත්වයන් යටතේ, කිසියම් අවස්ථාවක වැනෙන සුලු ගති නිසා ව්‍යාපාරය විනාශ වී යා හැක. අපි අපගේ බලවේගයන් සියල්ලම අරගලයට යෙදිය යුත්තෙමු. පක්ෂයේත්, විප්ලවවාදී නිර්ධන පංතියේත් නිවැරදි ක්‍රියාමාර්ගය ආරක්ෂා කළ යුත්තෙමු. කල් ඉක්ම යාමට පෙර අපි එසේ කළ යුත්තෙමු.

අප පක්ෂයේ "පාර්ලිමේන්තු" නායකයන්ගේ කටයුතු ද සියල්ලම නිවැරදියයි කිව නොහැක. ඔවුන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුය. ඔවුන් කෙරෙහි වැඩි කම්කරු අධීක්ෂණයක් ක්‍රියාත්මක කළ යුතුය. පාර්ලිමේන්තු කණ්ඩායම්වල බලතල වඩාත් පැහැදිලි ලෙස විස්තර කර දැක්විය යුතුය.

අප පක්ෂයේ වරද පැහැදිලිව පෙනේ. දියුණු පංතියේ සටන්කාරී පක්ෂය වැරදීම් නිසා බියට පත්විය යුතු නොවේ. බිය විය යුත්තේ වරද නැවත නැවතත් කිරීමට ඉදිරිපත් වීම ගැනය; ලජ්ජාව පිළිබඳ බොරු හැඟීමකට යටවී, වරද පිළිගැනීමටත්, එය නිවරද කිරීමටත් ප්‍රතික්ෂේප කිරීම ගැනය.

සැප්තැම්බර 24, ඉරිද,

සෝවියට් සභා සම්මේලනය ඔක්තෝබර් 20 දක්වා කල් දමා තිබේ. රුසියානු ජීවිතයේ වේගය කොතරම්ද යත්, මෙය හරියටම ග්‍රීක කලෙන්ඩස් දිනය[71] දක්වා කල් තැබීමක් වැනිය. සමාජවාදී-විප්ලවවාදීන් සහ මෙන්ෂෙවික්වරුන් අප්‍රෙල් 20—21 දිනවල වේදිකා ගත කළ රඟවිල්ල, දැන් දෙවැනි වරටත් රඟ දක්වනු ලැබේ.

ප්‍රථමයෙන් පළ කරන ලද්දේ 1924 දී "ප්‍රොලිතාරස්කය රෙවලූට්සියා" සඟරාවේ අංක 3 කලාපයෙහිය.

සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 34, පිටු 257-263

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

අර්බුදය මෝරා ගොස් ඇත

I

සැප්තැම්බරයේ අවසානයෙන් රුසියානු විප්ලව ඉතිහාසයේ මහා සන්ධිස්ථානයක් සලකුණු වූ බව නිසැකය. සියළුම කරුණු අනුව පෙනෙන්නේ එය ලෝක විප්ලව ඉතිහාසයේ ද සන්ධිස්ථානයක් බවය.

යථාර්ථ වශයෙන් සමාජ-ජාතෝන්මාදවාදය වන, දිරාගිය ඒ නිල "සමාජවාදයෙන්" ශේෂවූ අවංක සැම ගුණයක්ම ස්වකීය අසීමිත ධෛර්යයෙන් නියෝජනය කළ පුද්ගලයන්ගේ සටන්වලින් ලෝක කම්කරු පංති විප්ලවය ආරම්භ විය. ලෝක විප්ලවයේ පුරෝගාමීන් ලෙස කටයුතු කිරීමේ කාර්ය ය තමන් පිට පවරාගත් ඒ හුදකලා වීරයන් අතුරෙන් වඩාත්ම ප්‍රසිද්ධ වූයේ ජර්මනියේ ලීබ්ක්නෙහ්ත්, ඕස්ත්‍රියාවේ අද්ලර් සහ බ්‍රිතාන්‍යයේ මැක්ලීන් ය.

මෙම විප්ලවය සඳහා සූදනම් වීමේ දෙවැනි අවධිය පුළුල් ලෙස පැතිරී ගිය පොදුජන අප්‍රසාදයක් වූයේය. නිල පක්ෂ භේදවීමෙන්ද, නීති විරෝධී ප්‍රකාශනවලින්ද, වීදි පෙළපාළිවලින්ද එය ප්‍රකට විය. යුද්ධයට එරෙහිව පාන විරෝධය වඩාත් බලවත් විය. ඒ අනුව ආණ්ඩුවේ තාඩන පීඩන වලට ගොදුරු වන්නන්ගේ සංඛ්‍යාව වැඩි විය. නීතිය රැකීම සහ නිදහස ගැන පවා කීර්තියක් ලද, ජර්මනිය, ප්‍රංශය, ඉතාලිය හා බ්‍රිතාන්‍යය වැනි රටවල බන්ධනාගාර, යුද්ධ විරෝධීන් හා කම්කරු පංති විප්ලවයක පක්ෂවාදීන් වන ජාත්‍යන්තරවාදීන් දහ දහස් ගණනින් පිරී ගියේය.

තුන්වැනි අවධිය දැන් ආරම්භ වී තිබේ. මෙම අවධිය විප්ලවයේ පූර්වාසන්නය යනුවෙන් හැඳින්විය හැකිය. නිදහස් ඉතාලියේ තොග පිටින් පක්ෂ නායකයන් අත් අඩංගුවට ගැනීම සහ ජර්මනියේ හමුදාවල කැරලිගැසීම් ආරම්භ වීම[72] මහා සන්ධිස්ථානයක් ළඟ ඇති බවත්, අප ලෝක ව්‍යාප්ත විප්ලවයක පූර්වාසන්න කාලයට පැමිණ ඇති බවත්, අවිවාදී ලෙසින් කියන ලක්ෂණ වන්නේය.

මීට පෙරද ජර්මන් හමුදාවල කැරලි ගැසීමේ එක් එක් අවස්ථා තිබුණු බව සැබෑ නමුත්, ඒවා ඉතා සුළු, දුර්වල හා හුදකලා සටන් වූ හෙයින්, ඒවා

නිහැඬියාවෙන් යටකිරීමට හැකි විය. රාජද්‍රෝහී ක්‍රියාවන් පොදු ජනයා අතර පැතිර යාම වැලැක්වීමේ ප්‍රධාන ක්‍රමය එය විය. අවසානයේදී, ජර්මනියේ යුද්ධවහල් පාලනයේ දරුණුකම නොතකාම, මවිතකර තරම් සවිස්තර ලෙස පනවා ඇති සහ නොඇදහිය හැකි තරම් පණ්ඩිතමානයකින් ක්‍රියාත්මක කරනු ලබන, එම දරුණුකම නොතකාම, නාවුක හමුදාවේ විශාල ව්‍යාපාරයක් ඇති විය. එය නිහැඬියාවෙන් කිසි සේත් යට කළ නො හැකි විය.

මේ ගැන කිසිම සැකයක් තිබිය නොහැක. අපි ලෝක නිර්ධන පංති විප්ලවයක එළිපත්ත මත සිටින්නෙමු. එනිසා, සියළුම රටවල සිටින ජාත්‍යන්තරවාදීන් අතරෙන් යම් ප්‍රමාණයක් නිදහසක් භුක්ති විඳින්නේ රුසියානු බොල්ෂෙවික්වරු වන අප පමණක් නිසා, අපට නීත්‍යානුකූල පක්ෂයක් හා දූසිම් දෙකක් පමණ ප්‍රවෘත්ති පත්‍රද, ප්‍රධාන නගර දෙකෙහිම කම්කරු සහ සොල්දාදු නියෝජිත සෝවියට් සභාවල පක්ෂපාතිත්වයද විප්ලව අවස්ථාවක ජනතාවගෙන් බහුතරයක සහයෝගය ද තිබෙන නිසා, "බොහෝ දේ ලබා සිටින අයගෙන් බොහෝ දේ අපේක්ෂා කරනු ලැබේ" යන්න අප හා සම්බන්ධයෙන් යෙදීම සාධාරණය, යුතුය.

II

රුසියාවේ විප්ලවයෙහි තීරණාත්මක අවස්ථාව පැමිණ තිබෙන බව නිසැකය.

ගොවිජන රටක, ඊයේ වනතෙක්ම සුළු ධනපති ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රමුඛත්වය දරා සිටි සමාජවාදී-විප්ලවවාදීන්ගේ සහ මෙන්ෂෙවික් වරුන්ගේ ආධාරය ලබන විප්ලවවාදී සමූහාණ්ඩුවාදී ආණ්ඩුවක් යටතේ ගොවිජන විප්ලවයක් විකාශ වෙමින් පවතී.

විශ්වාස කළ නොහැකි සේ පෙනුනත් මෙය ඇත්තකි.

බොල්ෂෙවික්වරු වන අපි මෙම කරුණෙන් පුදුම නොවෙමු. ධනපති පංතිය සමග ඇති කරගත් "අපකීර්තිමත්" සභාගයේ ආණ්ඩුව, ප්‍රජාතන්ත්‍රවාදය සහ විප්ලවය පාවා දෙන ආණ්ඩුවක් ද, අධිරාජ්‍යවාදී ඝාතනයේ ආණ්ඩුවක්ද, ධනපතියන් සහ ඉඩම් හිමියන් ජනතාවගෙන් ආරක්ෂා කරන ආණ්ඩුවක් ද වන බව අපි නිතරම කීවෙමු.

සමාජවාදී-විප්ලවවාදීන් සහ මෙන්ෂෙවික්වරුන් ගෙනයන බොරුව නිසා, සමූහාණ්ඩුවක් යටතේ සහ විප්ලවයේ අවස්ථාවක, සෝවියට් සභා සමග එක පෙළට පවතින ධනපතියන්ගේ සහ ඉඩම් හිමියන්ගේ ආණ්ඩුවක් තවමත් රුසියාවේ පවතී. මෙය අමිහිරි හා අශෝභන වුවත්, යථාර්ථයකි. අධිරාජ්‍යවාදී යුද්ධය දිග්ගැසීම නිසා සහ එහි ප්‍රතිඵල නිසා

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ජනතාව මත පැටවී ඇති ඇදහිය නොහැකි තරම් වන දුෂ්කරතාවයන් ගැන සලකා බලන කල, රුසියාවේ ගොවි කැරැල්ලක් ආරම්භ වී පැතිර යාම පුදුමයට කරුණක් ද?

දිගටම ''සභාගයට'' ආධාර කළේත්, අන්තිම දින හෝ සති කීපය තෙක්ම ජනතාවගෙන් බහුතරයක පක්ෂපාතීත්වය දිනා ගෙන සිටියේත්, සභාග ප්‍රතිපත්තිය ජනතාවගේ අවශ්‍යතාවයන් පාවාදීමක් බව වටහා ගත් ''නව'' සමාජවාදී-විප්ලවවාදීන්ට[73] හරස් කැපීම හා අවමාන කරන්නේත් නිල සමාජවාදී-විප්ලවවාදී පක්ෂයමය. බොල්ෂෙවික්වරුන්ගේ සතුරන් වන, එම නිල සමාජවාදී-විප්ලවවාදී පක්ෂයේ නායකයන්, ඉහත තත්ත්වයන් යටතේ ඔවුන්ගේ නිල ප්‍රකාශනය වන ''දියල නරෝද''[74] හි සැප්තැම්බර් 29 දින කතුවැකිය පහත සඳහන් පරිදි ලියා තිබීම පුදුමයක්ද?

''මධ්‍යම රුසියාවේ ගම්වල තවමත් බලපවත්වන බන්ධන සම්බන්ධතාවයන් කෙළවරක් කිරීමට මෙතෙක් කිසිම දෙයක් කර නොමැති තරම්ය. දීර්ඝ කලකට පෙර තාවකාලික ආණ්ඩුව තුළ ඉදිරිපත් කරන ලද හා අධිකරණ සාකච්ඡා සභාව වැනි නරකාදියක් පවා පසු කර ගිය, ගම්බද පෙදෙස්වල ඉඩම් සම්බන්ධකම් විධිමත් කිරීමේ පනත කිසියම් කාර්යාලයක ගැලවී ගත නොහැකි සේ ඇමිණී තිබේ... අපගේ සමූහාණ්ඩුවාදී ආණ්ඩුව පැරණි සාර්වාදී පරිපාලන පුරුදු කම්වලින් නිදහස් වීමට තව බොහෝ දුර යායුතු බවත්, විප්ලවවාදී ඇමතිවරුන් අනුගමනය කරන ක්‍රම තුළ ස්තලිපින්ගේ මළ හස්තයේ ග්‍රහණය තවමත් බලවත් ලෙස දැනෙන බවත් අප කියන විට අප නිවැරදි නොවන්නේද?

නිල සමාජවාදී-විප්ලවවාදීන් විසින් මෙසේ ලියනු ලැබේ! මදක් සිතා බලන්න: ගොවිජන රටක විප්ලවයෙන් පසු හත්මසක් ගිය තැන, ගොවි ජනතාවගේ ''බන්ධනයන්'', ඉඩම් හිමියන් විසින් ඔවුන් වහල් කර ගනු ලැබීම, ''කෙළවරක් කිරීමට කිසිම දෙයක් කර නොමැති තරම්'' වන බව පිළිගැනීමට සිදුවන තැනට සභාගයේ ආධාර කරුවන් වැටී ඇත! තමන්ගේ සගයා වන කෙරෙන්ස්කි සහ ඔහුගේ ඇමති කල්ලියට ස්තලිපින්ලා යන නාමය නොදී බැරි තත්ත්වයට මෙම සමාජවාදී-විප්ලවවාදීන් පත්ව ඇත.

සභාගය බිඳවැටී ඇති බව සහ කෙරෙන්ස්කි පාලනය ඉවසන නිල සමාජවාදී-විප්ලවවාදී පක්ෂය ජනතා-විරෝධී, ගොවිජන විරෝධී සහ ප්‍රතිවිප්ලවවාදී පක්ෂයක් වී තිබෙන බව පමණක් නොව, මුළු රුසියානු විප්ලවයම සන්ධිස්ථානයකට පැමිණ ඇති බවද කියන විට වඩා බලවත් සාක්ෂියක් අපගේ සතුරු කඳවුරෙන් අපට ලබා ගත හැකි ද?

සමාජවාදී-විප්ලවවාදී කෙරෙන්ස්කිගේත්, මෙන්ෂෙවික් නිකීතින්ගේ සහ ග්වොස්දියොව්ගේත්, ප්‍රාග්ධනයේ සහ ඉඩම්හිමියන්ගේ උවමනාවන් පිළිබිඹු කරන අනික් ඇමතිවරුන්ගේත් ආණ්ඩුවට විරුද්ධව, ගොවිජන රටක ගොවිජන කැරැල්ලකි! මෙම කැරැල්ල සමූහාණ්ඩුවාදී ආණ්ඩුවක යුද්ධමය පියවරයන් මගින් මිරිකා දැමීමකි!

මෙම කරුණු දක දකම, අර්බුදය මෝරා ඇති බව ප්‍රතික්ෂේප කරන, විප්ලවය ඉතාමත් තීරණාත්මක අවස්ථාවක් පසුකරමින් තිබෙන බව හා ගොවිජන කැරැල්ල පරදවා ආණ්ඩුව ලබන ජයග්‍රහණය විප්ලවයේ මළ බෙරය වන බවත්, එය කර්නිලව් කැරැල්ලේ අවසාන ජයග්‍රහණය වන බවත් ප්‍රතික්ෂේප කරන අයෙකුට, නිර්ධන පංතියේ විඥත සටන් කරුවෙක් විය හැකිද?

III

ගොවි ජන රටක සත් මසක් තිස්සේ ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවක් පැවති පසු, ගොවිජන කැරැල්ලක් ඇතිවන තැනට කරුණු යෙදේ නම්, විප්ලවය ජාති ව්‍යාප්ත බිඳවැටීමකින් රෝගී වී ඇති බවත්, එය අභූත පූර්ව තරම් දරුණු අර්බුදයකට මුහුණ පා තිබෙන බවත්, ප්‍රතිවිප්ලවයේ බලවේගයන් අන්තිම සීමාව දක්වා ගොස් තිබෙන බවත් එයින් පැහැදිලිව අදහස් වේ.

එය ඉතා පැහැදිලිය. ගොවිජන කැරැල්ල වැනි යථාර්ථයක් හමුවේ අනිකුත් දේශපාලන ලක්ෂණ සියල්ලම සම්පූර්ණයෙන්ම නොවැදගත් වනු ඇත. එම ලක්ෂණ ජාතිව්‍යාප්ත අර්බුදයක් මෝරා ඒමට ප්‍රතිවිරෝධී තත්ත්වයක් දැරුවත් ගොවිජන කැරැල්ල හමුවේ ඒවා නො වැදගත්ය.

එහෙත් ඊට ප්‍රතිකූල වශයෙන් සියළුම ලක්ෂණයන් ගෙන් පෙන්නුම් කෙරෙන්නේ ජාතිව්‍යප්ත අර්බුදය මෝරා තිබෙන බවය.

කෘෂිකාර්මික ප්‍රශ්නය ළඟට, රුසියාවේ පවතින තත්ත්වය අනුව වඩාත්ම වැදගත් වන්නේ ජාතික ප්‍රශ්නයයි. ජනගහනයේ සුළුධනපති පිරිස්වලට එය වැදගත් වේ. එසේම, ට්සෙරෙතේලි මහතා සහ සමාගම විසින් පිළියෙළ කරන ලද ප්‍රජාතන්ත්‍රවාදී සාකච්ඡා සභාවේදී ''ජාතික'' කියූරියා මණ්ඩලය රැඩිකල්වාදී ස්වභාවය අතින් වෘත්තීය සමිතිවලට පමණක් දෙවැනි වන බැව්ද, සභාගයට විරුද්ධව දෙන ලද ඡන්ද ප්‍රතිශතය අතින් (55 කින් 40 ක්) එය කම්කරු සහ සොල්දාදු නියෝජිත කියූරියා මණ්ඩලය ඉක්මවා සිටි බවද, අපට පෙනේ. ගොවිජන කැරැල්ල මර්දනය කරන ආණ්ඩුවක් වන කෙරෙන්ස්කි ආණ්ඩුව, ප්‍රතිගාමී පින්ලන්ත ධනපති පංතිය ශක්තිමත් කරනු පිණිස පින්ලන්තයෙන් විප්ලවවාදී හමුද ඉවත් කර ගනිමින් සිටී. ආණ්ඩුවට විරුද්ධව උක්‍රේනියාවේ ඇති වූ උක්‍රේනියානුවන්ගේ ගැටුම් පොදු වශයෙන් ද, හමුදවල ගැටුම් විශේෂයෙන් ද, වඩ වඩාත් නිරන්තරව සිදුවන්නේය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ඊට අමතරව අපි යුද්ධ හමුදාව ගෙන බලමු. යුද්ධ කාලවලදී එය රාජ්‍ය කටයුතු හා සම්බන්ධයෙන් අතිශයින් විශාල කාරිය කොටසක් ඉටු කරන්නේය. පින්ලන්තයේ හමුදාව සහ බෝල්ටික් මුහුදේ නාවුක හමුදාව ආණ්ඩුවට නො එකඟ වී සිටින බව අපට පෙනේ. සුළු යුද්ධ පෙරමුණම වෙනුවෙන් කථා කරමින්, සොල්දාදුවන් තවදුරටත් යුද්ධ නොකරනු ඇතැයි සෑම බොල්ෂෙවික්වරයෙකුටම වඩා විප්ලවවාදී ආකාරයකින් කී, බොල්ෂෙවික්වරයෙකු නොවන නිලධාරි දුබාසව්ගේ සහතිකය අප හමුවේ ඇත[75]. සොල්දාදුවන් ''කැලඹුනු'' තත්ත්වයක සිටින හෙයින් ''සාමය'' පවත්වාගැනීම ගැන (එනම්, ගොවිජන කැරැල්ල මර්දනය කිරීමට මෙම සොල්දාදුවන් සහභාගි වීම ගැන) කිසිසේත් සහතික කළ නොහැකි යයි කියන ආණ්ඩුවේ වාර්තා ගැන අප අසා ඇත. අවසාන වශයෙන් මොස්කව් නගරයේ ඡන්දය දුන් ආකාරය, එහිදී දහ හත් දහසකින් දහහතර දහසක් බොල්ෂෙවික්වරුන්ට ඡන්දය දුන් ආකාරය අපි දුටුවෙමු.

මොස්කව් දිස්ත්‍රික් සභා තෝරා පත් කිරීමට දෙන ලද මෙම ඡන්දය මුළු ජාතියේම ඉරියව්ව විෂයෙහි සිදුවී තිබෙන බරපතල වෙනස ගැන ඉතාමත් සිත් කාවදින ලෙස කියා පාන ලක්ෂණයකි. සාමාන්‍ය වශයෙන් මොස්කව් නගරය පෙට්‍රොග්‍රෑඩයට වඩා සුළු ධනපති පංති ස්වභාවයක් දරන බව සුප්‍රකටය. මොස්කව් නිර්ධන පංතිය ගම්බද පෙදෙස් සමග අපරිමිත තරම් සම්බන්ධකම් රැසක් ඇතිව සිටී. එය ගොවියාට වැඩි හිතවත් කමක් දක්වන අතර, ගොවියාගේ හැඟීම්වලට වඩාත් සමීපය. මෙම කරුණු නිරන්තරව ඔප්පු කර ඇති බැවින් ඒ ගැන විවාද කිරීමට ඉඩක් නැත.

එසේ වුවද, සමාජවාදී-විප්ලවවාදීන්ට මොස්කව් නගරයෙන් ලැබුණු ඡන්දය ජූනි මාසයේදී සියයට 70 ක් වූ අතර, දැන් එය සියයට 18 දක්වා අඩු වී තිබේ. සුළු ධනපති පංතිය හා ජනතාව සභාගයෙන් ඉවතට හැරී ඇති බවට කිසිම සැකයක් නැත. කැඩෙට්වරු ඔවුන්ගේ ඡන්දය සියයට 17 සිට සියයට 30 දක්වා වැඩි කර ගෙන සිටිති. එහෙත් ඔවුහු අල්පතරයක් වෙති. ''දක්ෂිණාංශික'' සමාජවාදී-විප්ලවවාදීන් සහ ''දක්ෂිණාංශික'' මෙන්ෂෙවික්වරුන් ද ඔවුන් සමග එකතු වී සිටින බව පෙනෙන නමුත්, ඔවුහු පලක් නැති අල්පතරයක්ම වෙති. කැඩෙට්වරුන්ට ලැබුණු මුළු ඡන්ද සංඛ්‍යාව 67,000 පටන් 62,000 දක්වා පහත වැටුනු බව ''රුස්කිය වියදමස්ති''[76] ප්‍රකාශ කරයි. වැඩි වූයේ බොල් ෂෙවික්වරුන්ට දෙන ලද ඡන්දය පමණකි. එය 34,000 සිට 82,000 දක්වා වැඩි විය. ඔවුනට මුළු ඡන්ද ප්‍රමාණයෙන් සියයට 47 ක් ලැබිණි. වාම සමාජවාදී-විප්ලවවාදීන් හා සමග එක්වූ අපට දැන් සෝවියට් සභාවලත්, යුද්ධ හමුදාවෙහිත්, රටෙහිත් බහුතරයක් සිටින බවට කිසිම සැකයක් නැත.

සාමාන්‍ය ආර්ථික, දේශපාලන හා යුද්ධමය දෘෂ්ටි කෝණය අනුව බලන කල අතිශයින්ම වැදගත් පිරිසක් වන දුම්රිය හා තැපැල් සේවක හමුදා දිගටම ආණ්ඩුව සමග තියුණු ලෙස ගැටෙමින් සිටීම ද[77], ආරක්ෂාවාදී මෙන්ෂෙවික්වරුන් පවා ''ඔවුන්ගේ'' ඇමති තැන්පත් නිකිතින් ගැන අප්‍රසාද වී සිටීමද, නිල සමාජවාදී-විප්ලවවාදීන් කෙරෙන්ස්කි සහ සමාගමට ''ස්තලිපින්ලා'' යන නම දීමද, කරුණු සටහන් කරන නිමිති වශයෙන් පමණක් නොව, යථාර්ථ වශයෙන්ද මහත් වැදගත් කමක් ඇති ලක්ෂණ සමහරක් වේ.

IV

. . . .

V

එසේය. මධ්‍යම විධායක කාරක සභාවේ නායකයෝ ධනපතියන් සහ ඉඩම් හිමියන් ආරක්ෂා කිරීමේ නිවැරදි උපක්‍රම අනුගමනය කරති. සෝවියට් සභා සම්මේලනය සහ ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය කැඳවීම, සෝවියට් සභා සම්මේලනය පැවැත්වෙනතෙක් ''සිටීම'', යනාදීය කෙරෙහි විශ්වාසය රැඳවීමේ ව්‍යවස්ථානුකූල උගුලට තමන් අසුවීමට බොල්ෂෙවික්වරු ඉඩ දෙත්නම්, මෙම බොල්ෂෙවික්වරුන් නිර්ධන පංති ව්‍යාපාරයට ද්‍රෝහී කාලකණ්ණියන් වන බවට ස්වල්ප හෝ සැකයක් නොමැත.

ඔවුන් හැසිරෙන්නේ ජර්මනියේ නාවුක හමුදාවේ කැරැල්ලක් ආරම්භ කර සිටින කම්කරුවන් පාවා දෙන ආකාරයට හෙයින් ඔවුන් ව්‍යාපාරයට ද්‍රෝහීන් වනු ඇත. එවැනි තත්ත්වයන් යටතේ සෝවියට් සභා සම්මේලනය පැවැත්වෙන තෙක් ''සිටීම'' ජාත්‍යන්තරවාදය පාවාදීමක් වන්නේය, ලෝක සමාජවාදී විප්ලවය පාවා දීමක් වන්නේය.

ජාත්‍යන්තරවාදය යනු සහයෝගය දැක්වීමේ ප්‍රකාශයන්ගෙන් හා යෝජනාවලින් නොව ක්‍රියාවන්ගෙන් සංයුක්ත වූවකි.

''දියල නරෝද්'' පවා ස්තලිපින් ආණ්ඩුවට සමාන කරන ආණ්ඩුවක් විසින් ගොවිජනතා කැරැල්ල මර්දනය කරනු ලැබීම ඉවසා සිටීම මුළු විප්ලවයම විනාශ කිරීමක් වන හෙයින්, එය සඳහටම විනාශ කිරීමක් වන හෙයින්, බොල්ෂෙවික්වරුන් ගොවිජනතාවට ද්‍රෝහීන් වනු ඇත. අරාජිකත්වය සහ උදාසීනත්වය වැඩිවීම ගැන කලබැගැනියක් කරනු ලැබේ. එහෙත් ගොවිජනතාවට කැරලි ගැසීමට සිදුවන තැනට ඔවුන් පත් කර, එම කැරැල්ල යුද්ධ බලයෙන් මර්දනය කරන තෙක් ඊනියා ''විප්ලවවාදී

https://liberationbase.wordpress.com

ප්‍රජාතන්ත්‍රවාදීන්'' ඉවසිලිමත්ව බලා සිටින විට, උදාසීන වීම හැර ජනතාවට වෙන කළහැකි කුමක්ද?

එවැනි අවස්ථාවක ගොවිජන කැරැල්ල මර්දනය කිරීම ඉවසා සිටීමෙන් අදහස් වන්නේ, ප්‍රජාතන්ත්‍රවාදී සාකච්ඡා සභාව සහ ''පූර්ව-පාර්ලිමේන්තුවට'' තෝරා පත්කිරීම් සාදගත් පිළිවෙළටම, ඊටත් වඩා නරක සහ ගොරහැඩි ලෙසට ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලයටද තෝරා පත්කිරීම් සාදගැනීමට ඉඩදීමක් වන හෙයින් බොල්ෂෙවික්වරුන් ප්‍රජාතන්ත්‍රවාදයට ද්‍රෝහී වනු ඇත.

අර්බුදය මෝරා ගොස් තිබේ. රුසියානු විප්ලවයේ මුළු අනාගතයම පරදුවට ලක්ව තිබේ. බොල්ෂෙවික් පක්ෂයේ ගෞරවය ප්‍රශ්නයට ලක්වී ඇත. සමාජවාදය සඳහා වූ ජාත්‍යන්තර කම්කරු විප්ලවයේ මුළු අනාගතයම පරදුවට ලක්ව ඇත.

අර්බුදය මෝරා ගොස් ඇත...

1917 සැප්තැම්බර් 29.

මේ දක්වා සියල්ල පළ කිරීම සුදු සුය. එහෙත් මෙහි පහත දැක්වෙන කොටස මධ්‍යම කාරක සභාවේත්, පෙට්‍රොග්‍රෑඩ් කාරක සභාවේත්, මොස්කව් කාරක සභාවේත්, සෝවියට් සභාවලත් සාමාජිකයන් අතර බෙදා දීම පිණිසය.

VI

එසේ නම් කළ යුත්තේ කුමක්ද? අපි aussprechen was ist ''යථාතතු ප්‍රකාශ කළ'' යුත්තෙමු.'' අපගේ මධ්‍යම කාරක සභාව තුළ සහ අපගේ පක්ෂ නායකයන් අතර සෝවියට් සභා සම්මේලනය පැවැත්වෙන තෙක් සිටීමට පක්ෂ, වහාම බලය ගැනීමට විරුද්ධ, වහාම කැරලි ගසා නැගී සිටීමකට විරුද්ධ ප්‍රවණතාවයක්, නැතහොත් මතයක් ඇතැයි යන සත්‍ය කරුණ පිළිගත යුත්තෙමු. එම ප්‍රවණතාවය, නැතහොත් මතය, පරාජය කළ යුතුය.[78]

එසේ නොකළහොත් බොල්ෂෙවික්වරු තමන් වැසී යන සදාකාලික නින්දාවක් ඇහලා ගනු ඇත්තාහ. එසේම පක්ෂයක් වශයෙන් තමන් විනාශ කරගනු ඇත.

එවැනි අවස්ථාවක් පැහැර හැර, සෝවියට් සභා සම්මේලනය පැවැත්වෙන තෙක් බලා සිටීම යනු අන්ත මෝඩ කමක් නැතහොත් හුදෙක්ම ද්‍රෝහී කමක් වන්නේය.

එය ඉදුරාම ජර්මන් කම්කරුවන්ට කරන ද්‍රෝහී කමක් වනු ඇත. ඇත්තෙන් අපි ඔවුන්ගේ විප්ලවය ආරම්භ වන තෙක් බලා නො සිටිය යුත්තෙමු. එම බලා සිටීමේ තත්ත්වය යටතේ නම් එයට ''ආධාර කිරීමට'' ලිබර්දන්ලාත් පක්ෂ වනු ඇත. ඒ අතර කෙරෙන්ස්කි, කිෂ්කින් සහ සමාගම බලයේ සිටින තාක් කල් එය ආරම්භ විය නොහැකිය.

එය ඉදුරාම ගොවීන්ට කරන ද්‍රෝහිකමක් වනු ඇත. ප්‍රධාන නගර දෙකෙහිම සෝවියට් සභා අපගේ පාලනය යටතේ තිබිය දී ගොවිජන කැරැල්ල මර්දනය කිරීමට ඉඩදීම, ගොවි ජනතාව අප කෙරෙහි තැබූ විශ්වාසය අන්තිම අංශුව දක්වාම අහිමිකර ගැනීමකි. ඔවුන් එසේ අප කෙරේ විශ්වාසය අත්හැරීම සාධාරණය. ගොවිජනයාගේ ඇසින් බලන කල අප ලිබර්දන්ලා සහ වෙනත් අධමයන්ගේ තත්ත්වයට පත්වූ බව පෙනෙනු ඇත.

සෝවියට් සභා සම්මේලනය පැවැත්වෙන තෙක් ''සිටීම'' යනු සති හා දින පවා හේතුකොටගෙන සියල්ල තීරණය වන කාලයක, සති ගණන් කාලය අපතේ හැරීමක් වනු ඇත. නොවැම්බර් 1—2 දින (කැරලි ගසා නැගී සිටීම සඳහා එතරම් අඥනවත් ලෙස ''නියම කරන ලද''* දිනයේදී කොසාක්වරුන් සටනට යොදනු ඇති හෙයින් දේශපාලන වශයෙන් හා සටන් ශිල්පමය වශයෙන්ද යන දෙය ආකාරයෙන්ම බලය ගැනීම කෙහෙත්ම නොකළ හැකි වනු ඇති නිසා, එය බියගුළු ලෙස බලය අත්හැර දැමීමක් වන්නේය.

සෝවියට් සභා සම්මේලනයෙන් කිසිවක් නොලැබෙනු ඇති නිසා සහ කිසිවක් දීමෙහි එය සමත් නොවන නිසා, එම සම්මේලන පැවැත්වෙන තෙක් බලා සිටීම මුග්ධකමකි!

''සදචාර'' වැදගත්කම? සෝවියට් සභා ගොවි ජනතාවට ආධාර කරන බවත්, ගොවි ජන විප්ලවය මර්දනය කරනු ලබන බවත් අප දන්නා කල, යෝජනාවල සහ ලිබර්දන්ලා සමග කරන සාකච්ඡාවල ''වැදගත්කම'' ගැන කථා කිරීම ඇත්තෙන්ම පුදුම සහගතය! එසේ කිරීම යනු සෝවියට් සභා කාලකණ්ණි වාද මඩුවල තත්ත්වයට පහත දැමීමක් වන්නේය. ප්‍රථමයෙන් කෙරෙන්ස්කි පරාජය කරනු. ඊළඟට සම්මේලනය කැඳවනු.

බොල්ෂෙවික්වරුන්ට දැන් කැරලි ගසා නැගී සිටීමකින් ජයග්‍රහණය

---

* ''බලය ගැනීමට'' තීරණය කිරීම සඳහා සෝවියට් සභා හම්මේලනය ඔක්තෝබර් 20 දින ''කැඳවීම'' — කැරලි ගසා නැගී සිටීමට අඥනවත් ලෙස ''දින නියම කිරීමක්'' හැර එය වෙන කුමක් ද? දැන් බලය ලබා ගත හැකි වන අතර ඔක්තෝබර් 20—29 බලය ගැනීමට ඔබට අවස්ථාවක් නො ලැබෙනු ඇත.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ලැබිය හැකි බව සහතික ය. 1) අපට (අපි සෝවියට් සභා සම්මේලනය තෙක් නො "සිටිමු" නම්) ස්ථාන තුනකින් පෙට්‍රොග්‍රෑඩයෙන්, මොස්කව් නගරයෙන් සහ බෝල්ටික් නාවුක හමුදාවෙන් හදිසි ප්‍රහාරයක් දිය හැකිය.* 2) අපට නිසැක ලෙස සහයෝගය ලබා දෙන සටන් පාඨ ඇත්තේය — ඉඩම් හිමියන්ට විරුද්ධව ගොවිජනතාව ගසන කැරැල්ල මර්දනය කරන ආණ්ඩුව හංග වේවා! 3) අපට රටේ බහුතරයක් ඇත. 4) මෙන්ෂෙවික්වරු සහ සමාජවාදී-විප්ලවවාදීන් අතර අසංවිධානාත්මක භාවය අංග සම්පූර්ණය. 5) අප මොස්කව් නගරයේ බලය ගැනීමට හැකි තත්ත්වයක සිටින බව කිව හැකිය. (සතුරා අනපේක්ෂිත තත්ත්වයෙන් ගැනීම සඳහා ආරම්භය පවා එතැනින් වීමට ඉඩ තිබේ). 6) හිම මාළිගයත්, යුද්ධ හමුද ප්‍රධාන මණ්ඩල ගොඩනැගිල්ලක්, දුර කථන හුවමාරු මධ්‍යස්ථානයත්, විශාල මුද්‍රණාලයනුත් එක්වරම අල්ලා ගැනීමේ හැකියාව ඇති දහස්ගණන් ආයුධ සන්නද්ධ කම්කරුවන් සහ සොල්දාදුවන් අපට පෙට්‍රොග්‍රෑඩයේ ඇත, සාමයද, ගොවීන්ට ඉඩම්ද යනාදිය ගෙන දෙන මෙම ආණ්ඩුවට විරුද්ධ සටන් කිරීමට කිසිසේත් ඉඩ නොලැබෙන සේ යුද්ධ හමුදාව තුළ උද්ඝෝෂණික වැඩ කෙරෙන අතර, අප පලවාහැරීමට සමත් කිසිවක් නොවනු ඇත.

අපි තුන් පලකින්, පෙට්‍රොග්‍රෑඩයෙන්, මොස්කව් නගරයෙන් හා බෝල්ටික් නාවුක හමුදාවෙන් හදිසියේම පහර දෙමු නම්, සාමයේ ආණ්ඩුවට විරුද්ධව යුද්ධ හමුද ඉදිරියට නොඑනු ඇති නිසා, ජූලි 3—5 දින වල කළ කැපකිරීම්වලට අඩු කැප කිරීම් සහිතව අපට ජයලැබීම සඳහා සියයට අනූනමයක ඉඩක් ඇත. කෙරෙන්ස්කිගේ "පක්ෂපාත" අශ්වාරෝහක හමුද ආදිය දැනටමත් පෙට්‍රොග්‍රෑඩයේ ඇතත්, අපි දෙපැත්තකින් පහර දෙමු නම්, යුද්ධ සමුදාවේ හිතවත්කම අපට තිබෙන නිසා, ඔහුට යටත් වීමට සිදුවනු ඇත. අපට දැනට තිබෙන වැනි අවස්ථා තිබියදී, අපි බලය නොගන්නෙමු නම්, සෝවියට් සභාවලට බලය පැවරීම පිළිබඳ සියළු කථා බොරුවක්ම වන්නේය.

දැන් බලය ගැනීමෙන් වැලකී සිටීම, බලා "සිටීම", මධ්‍යම විධායක කාරක සභාවේ කථා රස විඳීමෙහි යෙදී සිටීම සහ (සෝවියට් සභාවේ) "බලායතනය සඳහා සටන් කිරීමට", "සම්මේලනය සඳහා සටන් කිරීමට" සීමාවී සිටීම යනු විප්ලවය පරාජයට බිලි දීමක් වන්නේය.

---

* හමුදාවන් සිටුවා ඇති ආකාරය ආදිය අධ්‍යයනය කිරීමට පක්ෂය කර තිබෙන්නේ කුමක්ද? කැරලි ගසා නැගී සිටීම කලාවක් සේ කරගෙන යාමට එය කර තිබෙන්නේ කුමක්ද? හුදෙක්ම මධ්‍යම කාරක සභාවේ කථා කිරීම ආදිය පමණකි!

ප්‍රජාතන්ත්‍රවාදී සාකච්ඡා සභාව ආරම්භ වූ තැන් පටන්ම එවැනි ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම සඳහා මා නිතර කළ ඉල්ලීම්වලට පිළිතුරක් පවා නොදී සිටීමට මධ්‍යම කාරක සභාව යොමු වී තිබෙන නිසාද, පූර්ව-පාර්ලිමේන්තුවට සහභාගිවීමට ගත් නින්ද සහගත තීරණයත්, සෝවියට් සභාවේ සභාපති මණ්ඩලයට මෙන්ෂෙවික්වරුන් පත් කර ගැනීමත්, ආදී වූ බොල්ෂෙවික්වරුන් අතින් සිදු වූ ඇස්පනා පිට පෙනෙන වැරදි ගැන සඳහන් කෙරෙන කොටස් මගේ ලිපිවලින් කපා හැරීමට ප්‍රධාන නිල ප්‍රකාශනය යොමු වී තිබීමත් නිසාද, මධ්‍යම කාරක සභාව මෙම ප්‍රශ්නය ගැන සලකා බැලීමට පවා අකැමති බවත්, එය මා මගේ කට වසා ගෙන සිටිය යුතු යයි කියන "සූක්ෂම" ඇඟවීමක් කරන බවත් හා මා විශ්‍රාම ගත යුතුයයි කියන යෝජනාවක් කරන බවත් වටහා ගත යුතු යයි මට නොසලකා බැරිය.

මධ්‍යම කාරක සභාවෙන් ඉල්ලා අස්වීමට මට සිදු වී තිබේ. පක්ෂයේ සාමාජිකත්වය අතර සහ පක්ෂ සම්මේලනය තුළ මගේ අදහස් සඳහා සටන් කිරීමේ අයිතිය තබා ගෙන මම මෙයින් ඉල්ලා අස්වෙමි.

මා එසේ කරන්නේ, අප සෝවියට් සභා සම්මේලනය පැවැත්වෙන තෙක් "සිටිය" හොත්, එය විප්ලවය විනාශ කිරීමක්ය යන අදහස මා දැඩිව දරන හෙයිනි.

සැප්තැම්බර් 29.

එන්. ලෙනින්.

ප. ලි. කොසාක් හමුද පවා සාමයේ ආණ්ඩුවකට විරුද්ධව නොයනු ඇතැයි යන්න ඔප්පු කිරීමට කරුණු ගණනාවක් ඇත! තවද, ඔවුහු සංඛ්‍යාවෙන් කීදෙනෙක් වෙත්ද? ඔවුන් සිටින්නේ කොහේද? මුළු යුද්ධ හමුදාවම අපට ආධාර කිරීමට සේනාංක නොඑවනු ඇද්ද?

I—III සහ V කොටස් 1917 ඔක්තෝබර් 20(7) දින "රබෝචි පුත්" පත්‍රයේ අංක 30 කලාපයේ ද, VI කොටස 1924 දී ද පළ කරන ලදී.

සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 34, පිටු 272—283

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

බොල්ෂෙවික්වරුන්ට රාජ්‍ය බලය රැක ගත හැකිද?

දෙවැනි සංස්කරණයට පෙරවදන

මෙම පොතෙහි සඳහන් කරුණුවලින් පෙනෙන ලෙසට, එය සැප්තැම්බර් මස අගදී ලියා 1917 ඔක්තෝබර් 1 දින අවසන් කරන ලදී.

මෙම පොතෙහි මතුකර තිබෙන ප්‍රශ්නය ඔක්තෝබර් 25 දින විප්ලවය විසින් න්‍යායයෙහි ක්ෂේත්‍රයේ සිට ව්‍යවහාරයේ ක්ෂේත්‍රයට මාරු කරන ලදී.

දැන් මෙම ප්‍රශ්නයට පිළිතුරු දිය යුත්තේ වචනවලින් නොව ක්‍රියාවලිනි. බොල්ෂෙවික්වරුන් බලය ගැනීමට විරුද්ධව ඉදිරිපත් කරන ලද න්‍යායික තර්ක අත්‍යන්තයෙන්ම දුර්වල ඒවා විය. මෙම තර්ක තූ තූ කොට දමා ඇත.

දැන් තිබෙන කර්තව්‍යය නම් කම්කරුවන්ගේ සහ ගොවිජනතාවගේ ආණ්ඩුව ප්‍රරෝහණ ශක්තියෙන් යුක්ත බව දියුණු පංතිය වන නිර්ධන පංතිය විසින් ව්‍යවහාරයෙන් ඔප්පු කිරීමය. මෙම දැවැන්ත ඓතිහාසික ප්‍රශ්නය විසඳීම සඳහා පංති විඥනය ඇති සියළුම කම්කරුවන්ද, ක්‍රියාශීලී සහ අවංක ගොවියන් සියළු දෙනාමද, වැඩ කරන සහ සූරා කනු ලබන සියළු ජනයාද හැකි සියල්ලක්ම කරනු ඇත.

වැඩ කරමු. සියළු දෙනාම වැඩ කරමු. ලෝක සමාජවාදී විප්ලවයේ සත්ව්‍යාපාරය විජයග්‍රහණය කළ යුතුය. එය විජයග්‍රහණය කරනු ඇත.

සාන්ත පීටර්ස්බර්ග්
1917 නොවැම්බර් 9

එන් ලෙනින්

1918 දී
එන්. ලෙනින්, ''බොල්ෂෙවික්වරුන්ට රාජ්‍ය බලය රැක ගත හැකිද?''
යන පොතෙහි පළ කරන ලදී.
''සොල්දදු සහ ගොවිජන පුස්තකාල'' පොත්මාලාව සාන්ත,
පීටර්ස්බර්ග්.

''රෙච්'' සිට ''නෝවය ෂිස්න්'' දක්වා වන හා එම ප්‍රකාශනද ඇතුළත්වූත්, කර්නීලව්වාදී කැඩෙට්වරුන්ගේ පටන් අර්ධ-බොල්ෂෙවික්වරුන් දක්වා වූත්, බොල්ෂෙවික්වරුන් හැර අන් සියළුම උපනති එකඟවී සිටින්නේ කුමක් ගැන ද?

බොල්ෂෙවික්වරුන් තනිවම බලය ගැනීමට තරම් කිසිකලෙකත් එඩිතර නොවනු ඇතැයිද, ඔවුන් එවැනි නිර්භීත කමක් පාමින් බලය ගත්තත් එය සුළු මොහොතකට හෝ රැක ගැනීමට ඔවුන්ට නොහැකි වනු ඇතැයිද යන මතයට ඔවුහු සියළු දෙනාම එකඟ වෙති.

බොල්ෂෙවික්වරුන් තනිවම සම්පූර්ණ රාජ්‍ය බලය ගැනීම සම්පූර්ණයෙන්ම ශක්‍යතා රහිත දේශපාලන ප්‍රශ්නයක් යයි ද, එය ශක්‍යතා පූර්ණ සේ සැලකිය හැක්කේ හිස උදුම්මාගත් ඉතාම දැඩි ''අන්ත ගාමියෙකුට'' පමණකැයිද සහතික කර කියන කිසියම් අයෙක් වෙනම් විවිධ දේශපාලන ''වර්ණ'' ගත් ඉතා බලවත් දේශපාලන පක්ෂ හා උපනතිවල ප්‍රකාශ ඇති සැටියෙන්ම උපුටා දක්වමින් අපි එම කියමන නිෂ්ප්‍රභා කරන්නෙමු.

එහෙත්, ඉහත සඳහන් කරන ලද ප්‍රශ්න අතුරෙන් එකක් ගැන වචනයක් හෝ දෙකක් ප්‍රථමයෙන් සඳහන් කළ යුතුය. බොල්ෂෙවික්වරු තනිවම මුළු රාජ්‍ය බලය ගනිතිද? මෙම ප්‍රශ්නයට ඔව් යන අර්ථයෙන් පිළිතුරක් දීමට අවස්ථාවක් මීට පෙර ද සමස්ත රුසියා සෝවියට් සභා සම්මේලනයේදී මට ලැබිණ. එහි දී ට්සෙරෙතේලි ඔහුගේ ඇමති කථාවක් කරමින් සිටියදී මා මගේ අසුනේ සිට හඬ නගා ප්‍රකාශ කළ ඉතාමත් පැහැදිලි වදනකින් එසේ පිළිතුරු දුන්නෙමි.[79] තවද, අපි තනිව බලය නොගන්නෙමුයි යන ප්‍රකාශයක් බොල්ෂෙවික්වරුන් කර තිබෙන බවක් පුවත් පත් මගින් නොදුටුවෙමි. එවැනි ප්‍රකාශයක් අසන්නට ද ලැබී නැත.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

අවස්ථාව ලද විට බලය ගැනීම ප්‍රතික්ෂේප කරන දේශපාලන පක්ෂයක් වේනම්, විශේෂයෙන්ම දියුණුම පංතියේ පක්ෂය එසේ කරන්නේ නම්, එයට පැවතීමට අයිතියක් නැති බවත්, එයට පක්ෂය යන හැඳින්වීම නොසුදුසුවන බවත්, කුමණ අර්ථයෙන් ගත්තත් එය කිසිම වැදගැම්මකට නැති එකක් බවත්, මම දනුදු කියමි.

අපගේ උනන්දුව යොමුවූ ප්‍රශ්නය සම්බන්ධයෙන් කැඩෙට්වරුන්, සමාජවාදී-විප්ලවවාදීන් සහ අර්ධ-බොල්ෂෙවික් වරුන් (කාලේ බොල්ෂෙවික්වරුන් යයි කීමට මම කැමැත්තෙමි) විසින් කරන ලද ප්‍රකාශයන් දැන් උපුටා දක්වමු.

සැප්තැම්බර් මස 16 දින ''රෙච්''[80] පත්‍රයේ ප්‍රධාන ලිපියෙහි මෙසේ සඳහන් විය .

''අලෙක්සන්ද්‍රින්ස්කි නෘත්‍ය ශාලාවේ දූස්සංගමය සහ ව්‍යාකූලත්වය රජවිය. සමාජවාදී පත්‍රවලද එයම චිත්‍රගත වේ. නිශ්චිත සහ ඍජු අදහස් ඇත්තේ බොල්ෂෙවික්වරුන් වෙත පමණකි. සාකච්ඡා සභාව තුළ ඒවා අල්පතරයේ අදහස් වන්නේය. එහෙත් ඔවුනට වාචක සටන්කාමිත්වය, වගාඩම්බර වදන් හා ආත්ම විශ්වාසය ඇතත්, කීප දෙනෙක් හැරුණු විට බොල්ෂෙවික්වරු නිර්භීත වන්නේ වචනයෙන් පමණකි. ඔවුන් ස්වකැමැත්තෙන් 'සම්පූර්ණ බලය' ගැනීමට උත්සාහ නොකරනු ඇත. අසංවිධාන කිරීමෙහි හා කඩාකප්පල් කිරීමෙහි අසමසම දක්ෂයන් වන ඔවුහු, තමන්ගේ නෛසර්ගික අඥනකම හා තම වර්තමාන ජයග්‍රහණවල තාවකාලික ස්වභාවය හද පත්ලෙන් වටහාගත් බියගුල්ලන් වෙති. ඔවුන්ගේ අවසාන ජයග්‍රහණයේ ප්‍රථම දිනය, ඔවුන් ප්‍රපාතයට ඇදවැටීමේ ප්‍රථම දිනයද වන බව අප සියළු දෙනාම මෙන්ම ඔවුහුද හොඳින් දනිති. ස්වභාවයෙන්ම වගකීමෙන් තොර, ක්‍රමයෙන් සහ ව්‍යවහාරයෙන් අරාජිකවාදී වන ඔවුන් සැලකිය යුත්තේ දේශපාලන චින්තන උපනතියක් ලෙසට, නැතහොත්, වඩාත් නිවැරදි ලෙස කියතොත්, එම උපනතියක පළුදුවලින් එකක් ලෙසට පමණකි. වර්ෂ ගණනාවකින් ඔබ්බට බොල්ෂෙවික්වාදය දුරලීමට, එය පලවා හැරීමට හොඳම ක්‍රමය නම් රටේ ඉරණම එහි නායකයන් අතෙහි තැබීමය. මෙම වර්ගයේ අත්හද බැලීම් නොකළයුතු බවත්, ඒවා මරණීය අන්තරාය සහිත බවත් හඟවන අවබෝධය නිසා මිස, කර කියාගත හැකි දෙයක් නොමැති කල අයෙකුට මෙම වීර ක්‍රියාව පවා කිරීමට අදහස් වේ. වාසනාවකට මෙන්, මෙම අප්‍රසන්න වර්තමාන වීරයන් කිසිලෙසකින්වත් ඇත්ත වශයෙන් බලය අල්ලා ගැනීමේ අභිලාෂයකින් කටයුතු නොකරන බව නැවතත් කියමු. කුමණ තත්වයක් යටතේවත් නිර්මාණශීලී ලෙස වැඩ කිරීමට නම් ඔවුනට බැරිය. එනිසා ඔවුන්ගේ නිශ්චිත සහ ඍජු අදහස් සියල්ලම දේශපාලන වේදිකාවටත්, වැඩක් නැති චතුර කථාවලටත් පමණක් සීමා වේ. කිසිම ප්‍රායෝගික කටයුත්තක් සඳහා, මොන දෘෂ්ටි කෝණයෙන් හෝ වුවත්, ඔවුන්ගේ ප්‍රතිෂ්ඨාව ගැන සැලකිල්ලක් දක්විය නොහැක. එහෙත් එක අතකින් පමණක් එහි ප්‍රායෝගික අර්ථයක් ඇත: එය, එයට විරුද්ධ 'සමාජවාදී චින්තනයේ' සියළුම මතිමාත්‍ර එක්සත් කරයි...''

කැඩෙට්වරුන් තර්ක කරන්නේ ඒ ආකාරයට ය. එහෙත්, රුසියාවේ ලොකුම ''පාලනය කරන හා ආණ්ඩු කරන'' පක්ෂය වන සමාජවාදී-විප්ලවවාදීන්ගේ අදහස මෙසේය. එයද අත්සන තොරව, එනම් ප්‍රධාන නිල ප්‍රකාශනය වන ''දියල නරෝද'' හි සැප්තැම්බර් 21 දින ප්‍රධාන කර්තෘ වාක්‍ය ලිපිය මගින් ප්‍රකාශ කරන ලද්දකි:

'' ... ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය රැස් කරන තෙක්, සාකච්ඡා සම්මේලනය අනුමත කළ ක්‍රියාමාර්ගය පදනම් කරගෙන ප්‍රජාතන්ත්‍රවාදය සමග වැඩ කිරීමට ධනපති පංතිය ප්‍රතික්ෂේප කරන්නේ නම්, එවිට සාකච්ඡා සභාව තුළින්ම සභාගය මතුවිය යුතුය. මෙය සභාගයට පක්ෂ අය කරන බරපතල කැප කිරීමක් වනු ඇත. නමුත් දේශපාලන බලය පිළිබඳ ''පිරිසිදු ප්‍රතිපත්තියක්'' සඳහා සටන් කරන අයට වුවද මෙයට එකඟවීමට සිදුවනු ඇත. එහෙත් මෙහිදී එකඟත්වයක් ඇති නොවෙතැයි යන බිය අපට ඇත. එවැනි තත්ත්වයක් ඇති වුවහොත් තුන්වැනි හා අවසාන සංයෝජනය ඉතිරිවන්නේය.එය අනුව, සමජාතීය ආණ්ඩුවක් පිළිබඳ අදහසට ප්‍රතිපත්තියක් වශයෙන් එකඟ වූ සාකච්ඡා සභාවේ අර්ධය ආණ්ඩුවක් සංවිධානය කළ යුතුය.

''අපි පැහැදිලි ලෙස මෙසේ කියමු: බොල්ෂෙවික්වරුන්ට ඇමති මණ්ඩලයක් පිහිටුවීමට සිදුවනු ඇත. ඔවුහු ඉතාමත් ශක්තිමත් ආකාරයෙන් විප්ලවවාදී ප්‍රජාතන්ත්‍රවාදීන් තුළ සභාගය කෙරෙහි වෛරයක් ඇති කළහ. 'සම්මුතිය' අත්හළ වහාම එම ප්‍රජාතන්ත්‍රවාදීන්ට නොයෙක් දේ ලබා දෙන බවට ඔවුහු පොරොන්දු වූහ — රටේ සියළුම අභාග්‍යයට හේතුව සභාගය බව කීහ.

''ඔවුන් තමන්ගේ උද්ඝෝෂණය මගින් කරමින් සිටියේ කුමක්දැයි දනිත් නම්, ඔවුන් ජනතාව රවටමින් සිටියෝ නොවෙත් නම්, ඔවුන් හැම පැත්තටම බෙදු හළ පොරොන්දු පත්‍ර අනුව කටයුතු කිරීම ඔවුන්ගේ යුතුකම වන්නේය.

''ප්‍රශ්නය පැහැදිලිය.

''තමන්ට කිසිසේත් බලය ගත නොහැකිය යනුවෙන් සදගත් න්‍යායයක් පිටුපස හදිසියේම සැඟ වෙනු පිණිස ඔවුන් උත්සාහ නොදැරිය යුතුය.

''ප්‍රජාතන්ත්‍රවාදය මෙම න්‍යායාන් භාර නො ගනී.

''ඒ අතරම සභාගයේ ආධාරකරුවන් ඔවුන්ට පූර්ණ සහයෝගය දෙන බව සහතික කළ යුතුය.

''අප හමුවේ, අපට විවෘතව තිබෙන සංයෝජන තුන, මාර්ග තුන මෙය. වෙනත් මාර්ග නැත!'' (අවධාරණය ''දියල නරෝද'' ප්‍රකාශනයේ මෙනි).

සමාජවාදී-විප්ලවවාදීන් තර්ක කරන ආකාරය මෙයයි. අවසාන වශයෙන් සැප්තැම්බර් 23 ''නෝවය ෂිස්න්'' කතුවැකියෙහි සඳහන්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

පරිදි ''නෝවය ෂිස්න්''[81] ''කාලේ-බොල්ෂෙවික්වරුන්ගේ'' ප්‍රතිෂ්ඨාව (බංකු දෙකක් අතර වාඩි වීමට තැත් කිරීම ප්‍රතිෂ්ඨාවක් ලෙසට ගත හැකි නම්, එය) මෙසේය.

''නැවතත් කනවාලව් සහ කිෂ්කින් සමග සභාගයක් පිහිටවුව හොත්, එය අන් කිසිවක් නොව, නැවත වරක් ප්‍රජාතන්ත්‍රවාදය යටත් වීමක් වන්නේය. එය, අගෝස්තු 14 දින ක්‍රියාමාර්ගය අනුව වගකිවයුතු ආණ්ඩුවක් ඇති කිරීම ගැන වූ සාකච්ඡා සහා යෝජනාව අවලංගු කිරීමක් වන්නේය.

''මෙන්ෂෙවික්වරුන්ගේ සහ සමාජවාදී-විප්ලවවාදීන්ගේ සමජාතීය ආණ්ඩුවකට වගකීම දැරීමට හැකි වනු ඇත්තේ සභාග අමාත්‍යමණ්ඩලයේ වගකිව යුතු සමාජවාදී ඇමතිවරුන් තරමටම ස්වල්ප වශයෙනි. මෙම ආණ්ඩුව විප්ලවයේ 'ජීවමාන බලවේගයන්' තමන් වටා ඒකරාශී කරගැනීමට පමණක් නොව, තම පෙරමුණු බල ඇණියෙන්, එනම්, නිර්ධන පංතියෙන් පවා කිසිම ක්‍රියාශීලී සහයෝගයක් ලබා ගැනීමටද අසමත් වන්නේය.

''එහෙත්, වෙනත් වර්ගයක සමාජීය ඇමති මණ්ඩලයක් පිහිටුවීම, ''නිර්ධන පංතියේ සහ ගොවි ජනතාවගේ'' ආණ්ඩුවක් පිහිටුවීම, ඊට වඩා හොඳ විසඳීමක් නොවනු ඇත. එය වඩාත් නරක විසඳුමක් වනු ඇත. ඇත්ත වශයෙන්ම එය කිසිසේත්ම විසඳුමක් නොවන අතර, බංකොලොත් ලැබීමක් පමණක් වනු ඇත. ''රබෝචි පුත්'' හි එන අනියම්, බියගුළු සහ පසුව ක්‍රමාණුකූල ලෙස ''විස්තර කෙරෙන'' අදහස් දැක්වීම මගින් හැර, වෙනත් කිසිවෙක් එවැනි සටන් පාඨයක් ඉදිරිපත් නොකරන බව සැබෑය.'' (සැප්තැම්බර් 21 දින ''දියල නරෝද'' කතු වැකිය පවා අමතක කළ, වගකිවයුතු පුවත්පත් කලාවේදීහු ඇස් පනා පිට පෙනෙනෙ මෙම අසත්‍යය ''නිර්භීත ලෙස'' ලියති.)

''බොල්ෂෙවික්වරු දැන් නැවතත් ''විධිමත් ලෙස'' ''සෝවියට් සභාවලට මුළු බලය පවරනු'' යන සටන් පාඨය ඉදිරිපත් කර ඇත. එය ජූලි දිනවලින් පසුව ඉවත් කරගෙන තිබුණි. එම වකවානුවේදී මධ්‍යම විධායක කාරක සභාව මගින් නියෝජනය වුනු සෝවියට් සභා ක්‍රියාශීලී බොල්ෂෙවික් විරෝධී ප්‍රතිපත්තියක් අනුගමනය කළේය. දැන් ''සෝවියට් සභාවල ප්‍රතිපත්තිය'' ඇදහැර සකස් කර තිබෙන සේ සැලකිය හැකිය. එපමණක් නොව, යෝජිත සෝවියට් සභා සම්මේලනයේ බහුතරයක් බොල්ෂෙවික්වරුන්ට පක්ෂපාත වනු ඇතැයි උපකල්පනය කිරීමටද හේතු තිබේ. එවැනි තත්ත්වයන් යටතේ, බොල්ෂෙවික්වරු යළි පණගන්වා ඉදිරිපත් කර තිබෙන ''සෝවියට් සභාවලට මුළු බලය පවරනු'' යන සටන් පාඨය, නිශ්චය වශයෙන්ම නිර්ධන පංතියේ සහ ''දුප්පත් ගොවි ජනතාවගේ'' ආඥාදායකත්වය ඇති කර ගැනීම සඳහා ඉදිරිපත් කළ ''උපක්‍රමීය ක්‍රියාමාර්ගයකි.'' සෝවියට් සභා යනුවෙන් ගොවිජන

නියෝජිත සෝවියට් සභා ද අදහස් වන බව සැබෑය. එනිසා බොල්ෂෙවික් සටන් පාඨයෙන් අදහස් වන්නේ රුසියාවේ මුළු ප්‍රජාතන්ත්‍රවාදයේත් අතිවිශාල වැඩි කොටස මත රැඳුනු බලයකි. එනමුත්, එම තත්ත්වය යටතේ ''සෝවියට් සභාවලට මුළු බලය පවරනු'' යන සටන් පාඨයේ ස්වාධීන වැදගත්කම සම්පූර්ණයෙන් නැතිව යන්නේය. එයට හේතුව, එම තත්ත්වය යටතේ පවතින සෝවියට් සභා, සාකච්ඡා සභාව විසින් පිහිටුවන ලද පූර්ව-පාර්ලිමේන්තුව සමග බොහෝ දුරට එක හා සමාන වීමය''. (''නෝවය ෂිස්න්'' සහතික කර කියන්නේ අමූලික බොරුවකි. එය, ව්‍යාජ සහ වංචනික ප්‍රජාතන්ත්‍රවාදය, ''බොහෝදුරට'' ප්‍රජාතන්ත්‍රවාදය හා සමග ''එක සමාන'' යයි කීම වැනිය. පූර්ව-පාර්ලිමේන්තුව ප්‍රෝඩාවකි. එය ජනතාවගෙන් අල්පතරයේ කැමැත්ත, විශේෂයෙන්ම, කුස්කෝවා, බෙර්කන්හෙයිම්, වයිකොව්ස්කි සහ සමාගමේ කැමැත්ත, බහුතරයේ කැමැත්ත ලෙසට පිළිගනියි. ප්‍රථම කාරණය එයයි. දෙවැනි කාරණය නම්, අවුක්සන්තියෙව්ලා සහ වයිකොව්ස්කිලා තමන්ට උවමනා අය පත් කර ගැනීමෙන් පුරවන ලද ගොවිජන සෝවියට් සභා පවා සභාගයට විරුද්ධව ඉතා ඉහළ ප්‍රතිශතයක් පෑ හෙයින්, එය කම්කරු හා සොල්දාදු සෝවියට් සභා සමග එකට ගත් කල සභාගය සම්පූර්ණයෙන්ම ඇදවැටෙන්නට සැලැස්විය හැකිව තිබුණු බවය. තුන්වැනි කරුණ නම්, ''සෝවියට් සභාවලට බලය පැවරීම'' යන්නෙන් අදහස් වන්නේ ගොවිජන සෝවියට් සභාවල බලය ප්‍රධාන වශයෙන් ගම්බද දිස්ත්‍රික්කවල පැතිරෙන බව සහ ගම්බද දිස්ත්‍රික්ක තුළ දුප්පත් ගොවිජනතාවගේ අධිපතිත්වය සහතික වන බවය). ''ඒ දෙක එකම නම්, එවිට බොල්ෂෙවික් සටන් පාඨය වහාම ඉවත් කර ගත යුතුය. එහෙත් ''සෝවියට් සභා වලට බලය පැවරීම'' යනු නිර්ධන පංතියේ ආඥාදායකත්වයට දුන් වෙස් මාරුවක් පමණක් නම්, එවිට එවැනි බලයකින් අදහස් වන්නේ නිශ්චය වශයෙන්ම විප්ලවය අසාර්ථක වන හා බිඳවැටෙන බවය.

''රටේ අනෙකුත් පංතිවලින් පමණක් නොව, ප්‍රජාතන්ත්‍රවාදයේ නියම ජීවමාන බලවේගයන්ගෙන් ද කොන් වූ නිර්ධන පංතියට, රාජ්‍ය යන්ත්‍රය තාක්ෂණ වශයෙන් අත්පත් කර ගෙන අතිශයින්ම සංකීර්ණ තත්ත්වය යටතේ එය ක්‍රියාත්මක කිරීමට හෝ එසේ නැතහොත්, නිර්ධන පංති ආඥාදායකත්වය පමණක් නොව, ඒ මදිවාට මුළු මහත් විප්ලවයම අතුගා දමනු ඇති සතුරු බලවේගයන්ගේ සියළුම බලපෑම්වලට ප්‍රතිරෝධය දැක්වීමට හෝ නොපුළුන් වන බව ඔප්පු කිරීමට සාක්ෂිත් අවශ්‍ය ද?

''වර්තමාන තත්ත්වයේ අවශ්‍යතාවයන්ට පිළිතුරු සපයන එකම බලය වන්නේ ප්‍රජාතන්ත්‍රවාදය සමග ඇති කරගන්නා නියම වශයෙන් අවංක සභාගයකි.''

https://liberationbase.wordpress.com

* * *

මෙම දීර්ඝ කොටස් උපුටා දැක්වීම ගැන අපි පාඨකයාගෙන් සමාව ඉල්ලමු. එහෙත් එසේ නොකර බැරිය. බොල්ෂෙවික්වරුන්ට විරුද්ධ විවිධ පක්ෂ දරූ ප්‍රතිෂ්ඨාවන් නිශ්චිත ලෙස ගෙන හැර දැක්වීම අවශ්‍යය. බොල්ෂෙවික්වරුන් තනිවම සම්පූර්ණ රාජ්‍ය බලය ගැනීම ශක්‍යතා පූර්ණ ප්‍රශ්නයක් පමණක් නොව, ඉතා හදිසි අවශ්‍යතාවයක්ද වන බව මෙම පක්ෂ සියල්ලම පිළිගෙන ඇතැයි යන ඉතාමත් වැදගත් කාරණය ඒකාන්ත ලෙස ඔප්පු කිරීම අවශ්‍යය.

කැඩෙට්වරුන්ගේ පටන් ''නෝවය ෂිස්න්'' ජනයා දක්වා වූ ''සියළු දෙනාම'' පිළිගත් කාරණය වන බොල්ෂෙවික් වරුන්ට බලය රැකගත නොහැකිය යන්න අපි දැන් පරීක්ෂා කර බලමු.

ගරු කටයුතු ''රෙච්'' පත්‍රය කිසිම තර්කයක් ඉදිරිපත් නො කරයි. එය කරන්නේ ඉතාමත් කර්කෂ හා උමතු බිණුම් බොල්ෂෙවික්වරුන් මත ඇද හැලීම පමණකි. ''රෙච්'' පත්‍රය බොල්ෂෙවික්වරුන් ''ප්‍රකෝප කරවා'' බලය ගන්නා ලෙස ඔවුන් පෙළඹවීමට උත්සාහ කරන්නේය යන අදහසින් ''සහෝදරවරුනි බලාගෙනයි, සතුරා දෙන්නේ නරක උපදේශයක්ම විය යුතුය'' කීම කොතරම් බරපතල වරදක් වනු ඇද්ද යන්නත්, වෙනත් කරුණුත්, අප උපුටා දැක්වූ කොටසින් පෙනේ. සාමාන්‍ය හා නියත වශයෙන් සැලකිල්ලට ගතයුතු කරුණු ප්‍රායෝගික ආකාරයෙන් නොසලකා හරින අතර බලය ගන්නා ලෙසට ධනපති පංතිය අප ප්‍රකෝප කරතැයි යන හේතුව සලකා අප ''අවනතවීමට'' ඉඩ තැබුවහොත් අප ධනපති පංතියට රැවටෙනු ඇත. ඒ මක්නිසාද යත්, බොල්ෂෙවික්වරුන් බලය ගැනීමෙන් ඇති වෙතැයි කියන, දශ ලක්ෂ සංඛ්‍යාත ව්‍යසනයන් ගැන අනාවැකි ද්වේෂ සහගත ලෙස පළකිරීමට හා ''බොල්ෂෙවික්වරුන්ට බලය ගැනීමට ඉඩ දී, ඊළඟට එක පහරින් ඔවුන් අඹරවා දැමීමෙන් ඔවුන් 'අවුරුදු ගණනාවකින් ඔබ්බට දුරලීම' '' වඩා හොඳයයි ද්වේෂ සහගත ලෙස නිතරම මොර දීමටද ධනපතියන් අමතක නොකරනු ඇති හෙයිනි. මෙම මොරදීම ද ඔබ කැමති නම් ''ප්‍රකෝප කිරීමක්'' ලෙසට ගත හැකිය. එහෙත් ඒ වෙනත් පැත්තකින් එල්ල කෙරෙන ප්‍රකෝප කිරීමකි. කැඩෙට්වරු හා ධනපති පංතිය අපට බලය ගන්නැයි කියා කිසි ලෙසකින්වත් ''උපදෙස්'' නොදෙති. එසේම බලය ගන්නා ලෙස ඔවුහු අපට කිසි කලෙකත් උපදෙස් නොදුන්හ. ඔවුන් උත්සාහ කරන්නේ විසඳිය නොහැකි යයි කියනු ලබන ආණ්ඩුවේ ගැටළු පෙන්වා අප බිය ගැන්වීමට පමණකි.

නැත. බියට පත් ධනපති පංතියේ හඬ තැලීම් අසා අපට

LIBERATIONBASE

අපි ඉඩ නොතැබිය යුත්තෙමු. අපි ''විසඳිය නොහැකි'' සමාජ ප්‍රශ්න අප පිට පටවා ගෙන නොමැති බව තරයේ සිතට ගත යුත්තෙමු. පවත්නා අතිශය දුෂ්කර තත්ත්වයෙන් ගැලවීමේ එකම මාර්ගය වන සමාජවාදය දෙසට එල්ල වූ පියවර ගැනීමට වහාම යොමු වීම පිළිබඳ ඒකාන්ත ලෙසම විසඳිය හැකි ප්‍රශ්නය හා සම්බන්ධයෙන් වූ කල, එය විසඳෙනු ඇත්තේ නිර්ධන පංතියේ සහ දුප්පත් ගොවි ජනතාවගේ ආඥාදායකත්වය විසින් පමණක් බව කියනු කැමැත්තෙමු. රුසියාවේ නිර්ධන පංතිය බලය ගත්තේ නම්, වෙන කවරදකටත් වඩා දැන්, වෙන කොතැනකට වත් වඩා එයට, ජයග්‍රහණය සහතිකය.

කිසියම් අවස්ථාවක් අවාසිදායක වීමට හේතුවන නියත කරුණු ගැන අපි හුදෙක්ම ප්‍රායෝගික වශයෙන් සාකච්ඡා කරමු. එහෙත් ධනපති පංතියේ වියරු උඩුබිරුලෑම් වලින් අප බියපත් වීමට මොහොතකට හෝ ඉඩ නොතබන්නෙමු. එසේම, බොල්ෂෙවික්වරුන් සම්පූර්ණ බලය ගැනීමේ ප්‍රශ්නය ඇත්ත වශයෙන්ම හදිසි අවශ්‍යතාවයක් වන බවද අමතක නොකරමු. අප මෙය අමතක කළහොත්, බලය ගැනීමට තවම ''කල් වැඩි'' යයි පිළිගන්නවාට වඩා අපරිමිත තරම් මහා අන්තරායක තර්ජනයට අප පක්ෂය දැන් හසු වන්නේය. මේ හා සම්බන්ධයෙන් දැන් මොන දෙයට වුවත් ''කල්වැඩි'' නැත. දශලක්ෂයකින් එකක් හෝ දෙකක් හැරුණු විට අන් සියළුම අවස්ථා මෙයට වාසිදායකය.

''රෙච්'' පත්‍රය ඇදබාන උමතු බිණුම් ගැන අපට මෙසේ කිවහැකිය, අපි මෙසේ කියන්නෙමු:

මදුර වැනුම් නාදෙන් නොව,
උත්කෝපිත වියරු හඬින්
ප්‍රසාදයේ හඬ අපට ඇසේ![82]

ධනපති පංති පාලනය පෙරළා දැමීමේ නිවැරදි මාර්ග හා ක්‍රම අප ජනතාවට පෙන්වා දෙන බව ඔප්පු කරන සාක්ෂියකි, ධනපති පංතිය එතරම් ආවේගී ලෙස අපට වෛර කිරීම.

* * *

''දියල නරෝද'' මෙම අවස්ථාවේ එහි බැනවැදීම්වලින් අපට ගරු කිරීමට තරම් පහත නොවැටීම අසාමාන්‍ය දෙයකි. එපමණක් නොව, එය තර්කයක සේයාවක්වත් ඉදිරිපත් කළේද නැත. එය උත්සාහ කළේ ''බොල්ෂෙවික්වරුන්ට ඇමති මණ්ඩලයක් පිහිටුවීමට සිදුවනු ඇත'' යනුවෙන් සිදුවිය හැකි දේ පෙන්වමින් වක්‍ර ඉඟි කිරීම් මගින් අප බියවැද්දීමට උත්සාහ කිරීම පමණකි. සමාජවාදී-විප්ලවවාදීන් අප බිය ගැන්-

https://liberationbase.wordpress.com

වීමට උත්සාහ දරන අතර, බියෙනැලලී ගිය ලිබරල්වාදියාගේ අවතාරය දැක ඔවුන්ම අවංකවම මාරක බියට පත්ව සිටින බව මම හොඳින්ම විශ්වාස කරමි. මධ්‍යම විධායක කාරක සභාව සහ ඒ සමාන "සම්බන්ධතා" (කැඩෙට්වරුන් සමග සම්බන්ධතා පවත්වන, පැහැදිලි බසින් කියතොත් කැඩෙට්වරුන් සමග කුළුපග වීමේ) කොමිසම් වැනි ඉතාමත් උසස් සහ ඉතාමත්ම කෙලෙසුනු ආයතනවලදී බොල්ෂෙවික්වරුන් සමහර දෙනෙක් බියවැද්දීමට සමාජවාදී-විප්ලවවාදීන් සමත්වන බව එසේම මට විශ්වාසය. එයට හේතුව, පළමුව, ඒ සියළුම මධ්‍යම විධායක සභා, පූර්ව-පාර්ලිමේන්තු ආදියෙහි වාතාවරණය පිළිකුල් සහගත හා ඔක්කාරය නංවන තරමට දුගඳ හමන හෙයින්, ඕනෑම මිනිසෙකුට කිසියම් දීර්ඝ කාලයක් තිස්සේ එම වාතාශ්‍රය ලැබීම හානිදයක වන නිසාද, දෙවැනිව අවංක භාවය බෝවන හෙයින් තනිපුද්ගල විප්ලවවාදීන් යම් කාලයක් යන තෙක් අමනයන් බවට හැරවීමේ හැකියාව අවංකවම බියට පත් කෙනෙකුට ඇති හෙයින්ද වේ.

"මිනිසත්" කම අනුව කථා කරතොත්, කැඩෙට්වරුන්ගේ සමාගමයෙහි ඇමතිවරයෙකු වීමේ හෝ කැඩෙට්වරුන්ට පෙනෙන ලෙසට ඇමතිවරයෙකු වීමට සුදුසුකම් ඇති අයෙකු වීමේ හෝ අභාග්‍යයට හිමිවූ, සමාජ-විප්ලවවාදියෙකුගේ අවංක බිය ගැන අප කොතරම් තේරුම් ගත්තත්, අපි අපට බියපත් වීමට ඉඩ තබන්නෙමු නම්, අප කරන්නේ නිර්ධන පංතියට ද්‍රෝහී වීමට ඉතාමත් සමීප වන දේශපාලන වරදකි. මහත්වරුනි, අපි ඔබගේ ප්‍රායෝගික තර්ක ගෙන බලමු! ඔබගේ භීතියෙන් අප බියපත් වීමට අප ඉඩ තබනු ඇතැයි යන බලාපොරොත්තුවක් ඇති කර නොගන්න!

* * *

මෙවර ප්‍රායෝගික තර්ක දක්නට ලැබෙන්නේ "නෝවය ෂිස්න්" පත්‍රයේ පමණකි. මෙම අවස්ථාවේදී එම පත්‍රය ධනපති පංතියේ උපදේශක කාර්ය කොටස ඉටු කිරීමට ඉදිරිපත් වෙයි. එය, හොඳ ගුණ රසක් ඇති මෙම මහත්මාව[83] "කම්පනයට පත් කරන" බොල්ෂෙවික් වරුන් ගේ නිදහසට කරුණු කියන උපදේශක කාර්ය කොටසට වඩා, එම පත්‍රයට වඩාත් හොඳින් ගැලපෙන්නේය.

උපදේශකයා කරුණු හයක් ඉදිරිපත් කර තිබේ;

1) නිර්ධන පංතිය "රටේ අනිකුත් පංතිවලින් කොන් වී තිබේ."

2) එය "ප්‍රජාතන්ත්‍රවාදයේ නියම ජීවමාන බලවේගයන්ගෙන් කොන් වී තිබේ."

3) එයට "රාජ්‍ය යන්ත්‍රය තාක්ෂණ වශයෙන් අත්පත් කර ගැනීමට නොපුළුවන් වනු" ඇත.

4) එයට මෙම "යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට නොපුළුවන් වනු" ඇත.

5) "තත්ත්වය අතිශයින්ම සංකීර්ණය."

6) "නිර්ධන පංති ආඥාදායකත්වය පමණක් නොව, ඒ සමගම මුළුමහත් විප්ලවයම අතුගා දමනු ඇති සතුරු බලවේගයන්ගේ සියළුම බලපෑම්වලට ප්‍රතිරෝධය දක්වීමට එයට නුපුළුවන් වනු" ඇත.

"නෝවය ෂිස්න්" පළමු කරුණ යෙදුම් ගත කර ඇත්තේ අඥාන හා අපැහැදිලි ආකාරයෙනි. එසේ කියන්නේ ධනපති සමාජයේ සහ අර්ධ ධනපති සමාජයේ ඇත්තේ පංති තුනක්, එනම්, ධනපති පංතිය සුළු ධනපති පංතිය (එය ප්‍රධාන වශයෙන් ගොවි ජනතාවගෙන් සංයුක්තය) සහ නිර්ධන පංතිය පමණක් බව අප දන්නා හෙයිනි. විෂය කාරණය ධනපති පංතියට විරුද්ධව නිර්ධන පංතිය ගෙනයන අරගලය, නැතහොත් ධනපති පංතියට විරුද්ධ විප්ලවය වන කල, නිර්ධන පංතිය අනිත් පංතිවලින් කොන්වීම ගැන කථා කිරීමේ අර්ථය කුමක් ද?

"නෝවය ෂිස්න්" සඳහන් කළේ ඉඩම් හිමියන් ගැන නොවේයයි සිතාගත හැකි නිසා, එයට කියන්නට උවමනාවූයේ නිර්ධන පංතිය ගොවි ජනතාවගෙන් කොන් වී ඇතැයි යන්න බව පෙනේ. එහෙත්, නිර්ධන පංතිය දුන් ගොවිජනතාවගෙන් කොන් වී ඇතැයි යන්න පැහැදිලිව හා නිශ්චිතව කීමේ හැකියාවක් එයට නොවීය. එයට හේතුව එවැනි කියමනක අන්ත අසත්‍යතාවය ඉතාමත් හොඳින් පෙනී යන හෙයිනි.

රුසියාවේ නිර්ධන පංතිය තරම් අඩුවෙන්ම සුළු-ධනපති පංතියෙන් කොන්වී ඇතැයි කිව හැකි, වෙනත් ධනපති රටක වන හා එසේම ධනපති පංතියට විරුද්ධව විප්ලවයක යෙදී සිටින නිර්ධන පංතියක් ගැන සිතීම පවා අපහසුය. ට්සෙරෙතේලිගේ "බුලීගින් දූමා සභාව", එනම්, ඒ අපකීර්තිමත් "ප්‍රජාතන්ත්‍රවාදී" සාකච්ඡා සභාව තුළ "කියුරියා" මණ්ඩල ධනපති පංතිය සමග සභාගයට පක්ෂව හා විපක්ෂව දුන් ඡන්ද පිළිබඳ අළුත්ම ප්‍රතිඵල, මේ බව ඔප්පු කරන නොබිඳිය හැකි සාක්ෂියකි. සෝවියට් සභාවල කියුරියා මණ්ඩල ගත්විට අපට මෙම ප්‍රතිඵලය ලැබේ:

	සභාගයට පක්ෂව	විරුද්ධව
කම්කරු සහ සොල්දදු නියෝජිත සෝවියට් සභා	83	192
ගොවි නියෝජිත සෝවියට් සභා	102	70
සියළු සෝවියට් සභා	185	262

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

මේ අනුව බලන කල, බහුතරය සමස්තයක් වශයෙන්, 'ධනපති පංතිය සමග සභාගයට විරුඩව' යන නිර්ධන පංති සටන් පාඨයට පක්ෂ වේ. සෝවියට් සභා තුළ බොල්ෂෙවික්වරුන්ගේ බලපෑම වර්ධනය වීම කැඩෙට්වරුන්ට පවා පිළිගැනීමට සිදුවී තිබෙන බව අපි ඉහත දුටුවෙමු. තවද පසුද සෝවියට් සභා වල නායකයින් වූ සහ මධ්‍යම ආයතනවල ස්ථිර බහුතරයක් ඇති සමාජවාදී-විප්ලවවාදීන් සහ මෙන්ෂෙවික්වරුන් කැඳවූ සාකච්ඡා සභාවද මෙසේය! මෙයින් පෙනෙන්නේ සෝවියට් සභාවල බොල්ෂෙවික්වරුන් දරන ප්‍රබලත්වයේ සැබෑ තත්ත්වය අඩුවෙන් ප්‍රකාශිත වී තිබෙන බවය.

ධනපති පංතිය සමග සභාගය පිළිබඳ ප්‍රශ්නයත්, වතුකාර ඉඩම් වහාම ගොවි කාරක සභා වලට පවරා දීම පිළිබඳ ප්‍රශ්නයත්, යන දෙකෙහිදීම, කම්කරු, සොල්දදු සහ ගොවිජන සභාවල බහුතරයක්, ජනතාවගෙන් බහුතරයක්, සුළු ධනපති පංතියෙන් බහුතරයක් දැනටමත් බොල්ෂෙවික්වරුනට පක්ෂව සිටිති. සැප්තැම්බර් 18 දින පෙට්‍රොග්‍රෑඩයේ පැවැත්වුනු ගොවි නියෝජිත ප්‍රාදේශීය සෝවියට් සභාවල සාකච්ඡා සභාවක් ගැන සමාජවාදී-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ නිල ප්‍රකාශනය වන ''ස්නාමිය තෘද''[84] පත්‍රයේ අංක 25 කලාපයෙහි පළ වූ වාර්තාවකින් කරුණු උපුටා ගෙන, සැප්තැම්බර් 24 දින ''රබෝචි පුත්'' අංක 24 කලාපයෙහි පළ කර තිබේ. මෙම සාකච්ඡා සභාවේදී ගොවි සෝවියට් සභා හතරක විධායක කාරක සභා (කස්ත්‍රමා, මොස්කව්, සමාරා සහ තවුරිද) සීමාවකට යටත් නැති සභාගයකට පක්ෂව ඡන්දය දුන්හ. ගුබේර්නියා පළාත් තුනක සහ හමුද දෙකක විධායක කාරක සභා (ව්ලදීමිර්, රියාන් සහ කළුමුහුද ගුබේර්නියා) කැඩෙට්වරුන් නොමැතිව සභාගයකට පක්ෂව ඡන්දය දුන්හ. ගුබේර්නියා පළාත් විසිතුනක හා හමුද හතරක විධායක කාරක සභා සභාගයකට විරුද්ධව ඡන්දය දුන්හ.

එනිසා, ගොවිජනතාවගෙන් බහුතරය සභාගයකට විරුද්ධ ය.

''නිර්ධන පංතිය කොන්වී'' සිටීම ගැන මේ ප්‍රමාණවත් ය.

සභාගයේ ආධාර කරුවන් වූයේ, පොහොසත් ගොවීන් සහ ඉඩම් හිමියන් සාපේක්ෂ වශයෙන් ඉතා විශාල සංඛ්‍යාවක් සිටින සමාරා, තවුරිද සහ කළු මුහුද යන ප්‍රත්‍යන්ත ගුබේර්නියා පළාත් තුන සහ රුසියාවේ ගුබේර්නියා පළාත් බහුතරයට වඩා බලයක් සහිත ගොවි ධනපති පංතියක් සිටින කාර්මික ගුබේර්නියා පළාත් (ව්ලදීමිර්, රියාන්, කස්ත්‍රමා සහ මොස්කව්) හතරද විය. මෙම ප්‍රශ්නය ගැන විස්තරාත්මක සංඛ්‍යා ලබා ගැනීමත්, ''පොහොසත්'' ගොවීන් වැඩි සංඛ්‍යාවක් සිටින ගුබේර්නියා පළාත්වල දුප්පත් ගොවීන් පිළිබඳව තොරතුරු ලබා ගත හැකි දැයි සොයා බැලීමත් වැදගත් වනු ඇත.

තවද, ''රුසියානු නොවන කණ්ඩායම්'' අතර සභාගයට විරුද්ධ අය ඉතා ප්‍රබල බව, එනම් ඡන්ද 40 ක් සභාගයට විරුද්ධ අතර පක්ෂ වූයේ 15 ක් පමණක් බව ද වැදගත් කරුණකි. බොනපාට්වාදී කෙරෙන්ස්කි සහ සමාගම විසින් රුසියාවේ ස්වෛරී භාවය නැති ජාතීන් කෙරෙහි ගෙන ගිය රටවල් අල්ලා ගැනීමේ සහ විවෘත හිංසනයේ ප්‍රතිපත්තිය ඵල දරා තිබේ. පීඩා කරන ජාතීන්ට විරුද්ධ වූ පීඩිත ජාතීන්ගේ විමුක්තිය සඳහා කරන අරගලය ඉතිහාසය විසින් පෙරමුණට ගෙනවුත් තිබෙන නිසා පීඩිත ජාතීන්ගේ පුළුල් ජනතා කොටස් (සුළු ධනපති පංතික බහුජනයා ද ඇතුළුව) රුසියාවේ ධනපති පංතියට වඩා නිර්ධන පංතිය කෙරෙහි විශ්වාසය තබති. ධනපති පංතිය පීඩිත ජාතීන්ගේ නිදහසේ සද්ව්‍යාපාරයට නින්දිත ලෙස ද්‍රෝහී වී ඇත; නිර්ධන පංතිය නිදහසේ සද්ව්‍යාපාරයට පක්ෂපාතය.

වර්තමාන කාලයේදී රුසියාවේ ජනගහනයේ සුළු ධනපති කොටස්වලට මූලික ප්‍රශ්න වන්නේ ජාතික සහ ගොවිජන ප්‍රශ්නයය. මේ ගැන විවාදයක් තිබිය නොහැකිය. එසේම මෙම ප්‍රශ්න දෙකෙහිදීම නිර්ධන පංතිය ''කොන්වී නැත'' — අන් කවරදකටත් වඩා කොන්වීමට ඈතින් සිටී. ජනතාවගෙන් බහුතරය එහි නායකත්වය පිළිගන්නේය. නිර්ධන පංති රාජ්‍යයට ජනගහනයෙන් බහුතරයක සහයෝගය ගෙන දීම පමණක් නොව, ජනතාව අතර විප්ලවවාදී උද්වේගයේ නියම උද්ගමනයක් ඇති වීමද එක්වරම සහතික කළ හැකි වන පරිදි මෙම ප්‍රශ්න දෙකෙහිදීම අධිෂ්ඨාන සහගත සහ සැබැවින්ම ''විප්ලවවාදී-ප්‍රජාතන්ත්‍රවාදී'' ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට හැකි වන්නේ එයට පමණකි. එසේ වන්නේ, සාර්වාදය යටතේවූ පරිදි ගොවිජනතාව ඉඩම් හිමියන් විසින්ද, උක්‍රයිනියානුවන් මහරුසියානුවන් විසින්ද, නිර්දය ලෙස පීඩාවට පත් කරනු ලැබීම, නැතහොත්, සමූහාණ්ඩුව යටතේ වූ පරිදි පම්පෝරි වදන්වලින් සරසා එම ප්‍රතිපත්තියම ගෙනයාමට ප්‍රයත්න දැරීමවත්, එසේත් නැතහොත් බැණීම්, අපවාදකිරීම්, කපටිකම්, ප්‍රමාද කිරීම්, හොර ගනුදෙනු සහ මග හැරීමවත් (මේ සියල්ල ගොවි ජනතාවට සහ පීඩිත ජනතාවට කෙරෙන්ස්කි දුන් තෑගිය) නැති තත්ත්වයක් ප්‍රථම වතාවට ජනතාවට පෙනෙනු ඇති හෙයින් මෙන්ම අනිත් අතට ඉඩම් හිමියන්ට විරුද්ධව ගන්නා අප්‍රමාද සහ විප්ලවවාදී පියවරයනුත්, පින්ලන්තය, උක්‍රේනියාව, බෙලරුසියාව හා මුස්ලිම් ජාතීන් යනාදීන්ට නැවතත් සම්පූර්ණ නිදහස වහාම ලබා දීමෙනුත් ක්‍රියාවෙන් ඔප්පු කෙරෙන උනුසුම් හිතවත්කම ප්‍රකාශවන හෙයින්ද වේ.

සමාජවාදී-විප්ලවවාදී සහ මෙන්ෂෙවික් මහත්වරු මෙය හොඳින්ම දනිති. එනිසා, ඔවුහු ජනතාවට විරුද්ධව ඔවුන්ගේ විප්ලවවාදී-ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිපත්තිය අනුගමනය කිරීමට ආධාරකර ගැනීම පිණිස සමූපකාර

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සමිතිවල අර්ධ-කැඩෙට් ලොක්කන් ඔවුන් වෙත ඇද ගනිති. ප්‍රායෝගික ප්‍රතිපත්තියේ නිශ්චිත කරුණු සම්බන්ධයෙන්, නිදසුනක් වශයෙන්,චතුකාර ඉඩම් සියල්ලම වහාම ගොවි කාරක සභාවලට පවරා දිය යුතුද, පින්ලන්ත හෝ උක්‍රේනියානු ජාතිකයන්ගේ ඉල්ලීම් දිය යුතුද යන්න සම්බන්ධයෙන්, පොදු ජන මතය දිනා ගැනීමට ජනමත විමසීමකට හෝ යටත් පිරිසෙයින්, සියළුම ප්‍රාදේශීය සෝවියට් සභාවල, සියළුම ප්‍රාදේශීය සංවිධානවල වුව ඡන්දයක් විමසීමට හෝ තරම්, ඔවුන් එඩිතර නොවන්නේ එබැවිනි.

අද ඉතාමත් වැදගත් ප්‍රශ්නය වන සාමය ගැන කල්පනා කර බලන්න. නිර්ධන පංතිය ''අනිකුත් පංතිවලින් කොන් වී ඇත''... මෙම ප්‍රශ්නයේදී නිර්ධන පංතිය මුළු ජාතියම, එනම් සියළුම පංතිවලට අයත් සියළුම ජීවමාන සහ අවංක ජනයා සහ සුළු ධනපති පංතියේ අති බහුතරය සැබැවින්ම නියෝජනය කරන්නේය. එසේ කියන්නේ, බලය ලබාගත් වහාම සියළුම සටන්කාරී ජාතීන්ට සාධාරණ සාමයක් යෝජනා කරනු ඇත්තේ නිර්ධන පංතිය පමණක් වනු ඇති හෙයිනි; ඉතාමත් කඩිනම් සහ හැකි ඉතාමත් සාධාරණ සාමය අත්පත් කර ගැනීම සඳහා සැබැවින්ම විප්ලවවාදී පියවරයන් (රහස් ගිවිසුම්, ප්‍රසිද්ධ කිරීම ආදිය) ගනු ඇත්තේ නිර්ධන පංතිය පමණක් වනු ඇති හෙයිනි.

නිර්ධන පංතිය කොන්වී නොමැත. නිර්ධන පංතිය කොන්වී සිටීමක් ගැන හඬ දෙන ''නෝවය ෂිස්න්'' මහත්වරුන් කරන්නේ, ඔවුන් ධනපති පංතියට ඇති මනෝමූල බිය හෙළිදරව් කිරීම පමණකි. රුසියාවේ පවතින වාස්තවික තත්ත්වය නම්, හරියටම වර්තමාන අවස්ථාවේදී නිර්ධන පංතිය සුළු ධනපති පංතියේ බහුතරයෙන් ''කොන් වී'' නොසිටීමය. හරියටම දැන්, ''සභාගය'' සම්බන්ධයෙන් ලැබූ කණගාටු දයක අත්දැකීමෙන් පසුව, නිර්ධන පංතිය ජනතාවගෙන් බහුතරයෙහි සහයෝගය ඇතිව සිටින්නේය. බොල්ෂෙවික්වරුන් විසින් බලය රැක ගැනීම සඳහා අවශ්‍ය මෙම කොන්දේසිය ඉටුවී පවතින්නේය.

* * *

දෙවැනිව ඉදිරිපත් කර තිබෙන කාරණය නිර්ධන පංතිය ''ප්‍රජාතන්ත්‍රවාදයේ නියම ජීවමාන බලවේගයන්ගෙන් කොන් වී'' ඇතැයි යන්නය. මෙයින් අදහස් කෙරෙන්නේ කුමක්ද යන්න නො පැහැදිලිය. මෙවැනි අවස්ථාවලදී ප්‍රංශවන් කියන ලෙසට, එය සමහර විට ''ග්‍රීක්'' කියමනක් විය හැක.

''නෝවය ෂිස්න්'' ලේඛකයන් හොඳ ඇමති වරුන් වීමට ඉඩ තිබේ. කැඩෙට් ඇමති මණ්ඩලයක ඇමති වරුන් වීමට ඔවුහු ඉතාමත් සුදුස්සන් වෙති. එහි ඇමතිවරුන්ට තිබිය යුතු එකම සුදුසු කම වන, ඉතාමත් කැත වැඩ වසං කිරීමට පිළිගත හැකි සේ පෙනෙන, කාන්තිමත් එහෙත් කිසිම අර්ථයක් නැති සහ එනිසාම අධිරාජ්‍යවාදීන් ගේ සහ සමාජ-ජාත්‍යාන්මාද වාදීන්ගේ අත් පොලසන් ලබා ගත හැකි වදන් බිණීමෙහි සමත්කම ඔවුනට තිබේ. ප්‍රජාතන්ත්‍රවාදයේ නියම ජීවමාන බලවේගයන් ගෙන් නිර්ධන පංතිය කොන්වී ඇතැයි සහතික කර කියන විට, එයින් වක්‍රොක්තියෙන් අදහස් කෙරෙන්නේ, නැතහොත් අදහස් කෙරෙන බව වටහා ගනු ලබන්නේ, කැඩෙට්වරු, බ්‍රේෂ්කොව්ස්කය, ප්ලෙහානව්, කෙරෙන්ස්කි සහ සමාගම ''ප්‍රජාතන්ත්‍රවාදයේ ජීවමාන බලවේගයන්'' බව වන හෙයින් ''නෝවය ෂිස්න්'' ලේඛකයන්ට ඔවුන්ගේ අත්පොලසන් ලැබෙනු නො අනුමානය.

එය ඇත්තක් නොවේ. ඔවුහු මළගිය බලවේග වෙති. සභාගයේ ඉතිහාසයෙන් මෙය ඔප්පු වී තිබේ.

ධනපති පංතියෙන් හා එහි ධනපති-බුද්ධිමත් වාතාවරණයෙන් දූපනය වැටුනු ''නෝවය ෂිස්න්'' ජනයා ''වෝලිය නරෝද''[85], ''යෙදින්ස්ත්ව''[86] සහ වෙනත් ප්‍රකාශන වැනි, ප්‍රධාන කරුණු අතින් කැඩෙට්වරුන්ට වඩා වෙනසක් නොමැති සමාජවාදී-විප්ලවවාදීන්ගේ සහ මෙන්ෂෙවික්වරුන්ගේ දක්ෂිණාංශය ''ජීවමාන'' ලෙසට ගනිති. එහෙත් අප ජීවමාන ලෙස සලකන්නේ, කුලාක්වරුන් සමග නොව ජනතාව සමග සම්බන්ධ වූ අය පමණකි. සභාගයේ පාඩම් නිසා විකර්ෂණය වුනු අය පමණකි, සුළු ධනපති ප්‍රජාතන්ත්‍රවාදයේ ''ක්‍රියාශීලී ජීවමාන බලවේගයන්'' නියෝජනය කරනු ලබන්නේ සමාජවාදී-විප්ලවවාදීන්ගේ සහ මෙන්ෂෙවික්වරුන්ගේ වාමාංශය විසිනි. මෙම අංශය, විශේෂයෙන්ම ජූලි ප්‍රතිවිප්ලවයෙන් පසුව ශක්තියෙන් වැඩි වීම, නිර්ධන පංතිය කොන්වී නැති බව පෙන්වන ඒකාන්ත ලක්ෂණයකි.

චෙර්නොව්ගේ කණ්ඩායම කිෂ්කින් සමග නව සභාගයකට සහයෝගය නොදෙන බව සැප්තැම්බර් 24 දින චෙර්නොව් කළ ප්‍රකාශයෙන් ඔප්පුවන ලෙසට, සමාජවාදී-විප්ලවවාදී මැද පිරිස ඉතා මෑත දී වමට නැඹුරු වීමෙන් මෙය වඩාත් සිත් කාවදින ලෙස පෙනීයන්නේය. නාගරික සහ විශේෂයෙන්ම ගම්බද දිස්ත්‍රික්කවලින් ලත් ඡන්ද සංඛ්‍යාව අනුව බලන කල, ප්‍රමුඛ ප්‍රබල පක්ෂය වන සමාජවාදී-විප්ලවවාදී පක්ෂයේ සාමාජිකත්වයෙන්, මේ මෑතක් වන තෙක්ම අති බහුතරය වූ එහි මැද පිරිස මෙසේ වමට නැඹුරු වීමෙන් ඔප්පු වන්නේ, ''දියල නරෝද'' පත්‍රයෙන් අප උපුටා දැක්වූ පරිදි, යම් යම් තත්ත්වයන් යටතේ ප්‍රජාතන්ත්‍රවාදය තනිකර බොල්ෂෙවික් ආණ්ඩුවකට ''සම්පූර්ණ සහයෝගය දීම සහතික'' කළ යුතුය යන්න කුමණ ලෙසකින් හෝ හිස් වදනක් නොවන බවය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සමාජවාදී-විප්ලවවාදී පක්ෂයේ මැද පිරිස කිෂ්කින් සමග නව සභාගයක් ඇති කර ගැනීමට විරුද්ධ වීම හෝ පළාත්වල (කොකේසියාවේ ජෝර්දනිය ආදීය) මෙන්ෂෙවික්-ආරක්ෂාවාදීන් අතර සභාගයේ ප්‍රතිපාක්ෂිකයන් ප්‍රබලවීම හෝ වැනි කරුණු වලින් වාස්තවික ලෙස ඔප්පු වන්නකි, මේ දක්වා මෙන්ෂෙවික්වරුන් සහ සමාජවාදී-විප්ලවවාදීන් අනුගමනය කළ ජනතාවගෙන් යම් කොටසක්, තනිකර බොල්ෂෙවික් ආණ්ඩුවකට ආධාර කරනු ඇතැයි යන්න.

රුසියාවේ නිර්ධන පංතිය දූන් කොන්වී නැත්තේ නියත වශයෙන්ම ප්‍රජාතන්ත්‍රවාදයේ ජීවමාන බලවේගයන්ගෙනි.

* * *

තුන්වැනිව ඉදිරිපත් කෙරුණු, ''රාජ්‍ය යන්ත්‍රය තාක්ෂණ වශයෙන් අත්පත් කර ගැනීම නිර්ධන පංතියට නොපුළුවන් වනු'' ඇතැයි යන්න සමහර විට ඉතාමත් පොදු හා නිරන්තර වශයෙන් කියන කරුණය. මේ හේතුව නිසා එය ගැන වැඩියෙන්ම අවධානය යොමු කළ යුතු වේ. තවද එය ජයග්‍රාහී නිර්ධන පංතියට මුහුණ පාන්නට වන කර්තව්‍යයන් අතුරෙන් ඉතාමත් බරපතල හා දුෂ්කර එකක් වන නිසාද, ඒ ගැන වැඩි සැලකිල්ලක් දැක්විය යුතුය. මෙම කර්තව්‍යයන් දුෂ්කර වන බවට සැකයක් නොමැත. එහෙත්, සමාජවාදීන් යයි කියාගන්නා අප, මෙම දුෂ්කරතාවය පෙන්නුම් කරන්නේ මෙම කර්තව්‍යයන් ගෙන් කර ඇරීමට නම්, එවිට අපත් ධනපති පංතියේ අන්තේවාසිකයනුත් අතර ව්‍යවහාරයේ දී ඇත්තෙන්ම වෙනසක් නැතිව යන්නේය. නිර්ධන පංති විප්ලවයේ කර්තව්‍යයන්ගේ දුෂ්කරතාවය, එම කර්තව්‍යයන් ඉටුකිරීම සඳහා වඩාත් සමීප හා වඩාත් ස්ඵීරසාර අධ්‍යයනයක් කිරීමට, නිර්ධන පංතියේ ආධාරකරුවන් පොළඹවන්නක් විය යුතුය.

රාජ්‍ය යන්ත්‍රය යනු මූලික වශයෙන් ස්ථිර යුද්ධ හමුදව, පොලීසිය සහ නිලධාරි පෙළැන්තිය ය. නිර්ධන පංතියට මෙම යන්ත්‍රය තාක්ෂණ වශයෙන් අත්පත් කර ගැනීමට නොපුළුවන් බව කීමෙන් ''නෝවය ෂිස්න්'' ලේඛකයන් පෙන්වන්නේ මීට බොහෝ ඉහත දී බොල්ෂෙවික් සාහිත්‍යයේ සඳහන් වූ කරුණු ගැන ඔවුන්ගේ අන්ත නො දැනුවත්කම හා ඒවා ගැන සැලකිල්ලට ගැනීමට ඔවුන්ගේ ඇති අකැමැත්තය.

''නෝවය ෂිස්න්'' ලේඛකයන් සියළු දෙනාම තමන් ගැන සලකාගන්නේ එක්කෝ මාක්ස්වාදීන් ලෙසටය. නැතහොත් යටත්පිරිසෙයින් මාක්ස්වාදය දන්නා අය, උගත් සමාජවාදීන් හෝ ලෙසට ය. එහෙත් පැරිස් කොමියුනයේ අත් දැකීම් පදනම කොටගත් මාක්ස්, සද නිම කළ රාජ්‍ය යන්ත්‍රය එලෙසින්ම අත්පත් කොටගෙන එය තමන්ගේ අවශ්‍යතාවයන්

සඳහා යොද ගැනීම නිර්ධන පංතියට නො කළ හැකි බවත්, නිර්ධන පංතිය මෙම යන්ත්‍රය සුන් කර, ඒ වෙනුවට අළුත් එකක් ආදේශ කළයුතු බවත් උගැන්වීය (මම මේ ගැන වඩාත් විස්තර සහිතව කරුණු දක්වමින් පොතක් ලියන අතර, එහි මුල් කොටස අවසන් කොට ඇත්තෙමි. ''රාජ්‍යය සහ විප්ලවය. රාජ්‍යයත් විප්ලවයේදී නිර්ධන පංතියට පැවරෙන කාර්යයනුත් පිළිබඳ මාක්ස්වාදී න්‍යායය'' යන නමින් එය නුදුරේදී පළ කෙරෙනු ඇත*). මෙම නව වර්ගයේ රාජ්‍ය යන්ත්‍රය පැරිස් කොමියුනය විසින් නිර්මාණය කරන ලදී. එමෙන්ම, කම්කරු, සොල්දදු සහ ගොවිජන නියෝජිතයන්ගේ රුසියානු සෝවියට් සභා එම වර්ගයේම ''රාජ්‍ය යන්ත්‍රයක්'' වන්නේය. 1917 අප්‍රේල් 4 වන දිනෙන් පසුව, මා කීප වරක්ම මෙය පෙන්වා දී ඇත. බොල්ෂෙවික් සාකච්ඡා සභාවල සහ බොල්ෂවික් සාහිත්‍යයේ ද, ඒ ගැන විස්තර කර තිබේ. තමන් මාක්ස් සහ බොල්ෂෙවික්වරුන් සමග කොහෙත්ම එකඟ නොවන බවක් පැවසීමේ අයිතිය ''නෝවය ෂිස්න්'' පත්‍රයට ඇත. එහෙත් බොල්ෂෙවික්වරු දුෂ්කර ප්‍රශ්න කෙරෙහි නිරර්ථක ආකල්පයක් දක්වතියි කියමින් ඔවුන්ට උද්ධච්ච ලෙස බැන වැදුනු එම පත්‍රය, මෙම ප්‍රශ්නය සම්පූර්ණයෙන්ම මගහැර යාම නම්, එය තමන්ටම නිකුත්කර ගන්නා මානසික දුගීභාවය පිළිබඳ සහතිකයක් වන්නේය.

නිර්ධන පංතියට ''රාජ්‍ය යන්ත්‍රය අත්පත් කර ගෙන'' එය ''ක්‍රියාත්මක කිරීමට'' පුළුවන් කමක් නැත. එහෙත් පරණ රාජ්‍ය යන්ත්‍රයෙහි තිබෙන පීඩාකාරී, අනුබැඳුණු සහ නොහික්මවිය හැකි ලෙසට ධනපති වන සියල්ල සුන් කර දැමීම හා ඒ වෙනුවට තමන්ගේම නව යන්ත්‍රයක් ආදේශ කිරීම එයට කළ හැකිය. කම්කරු, සොල්දදු සහ ගොවිජන සෝවියට් සභා යනු ඒකාන්ත වශයෙන්ම මෙම යන්ත්‍රය වන්නේය.

මෙම ''රාජ්‍ය යන්ත්‍රය'' ගැන ''නෝවය ෂිස්න්'' පත්‍රයට අමතක වී යාම විස්තර කළ හැක්කේ මහත් පුදුමයක් ලෙසට පමණකි. ''නෝවය ෂිස්න්'' ජනයා ඔවුන්ගේ දේශපාලන තර්කණයෙහි දී මෙසේ හැසිරීමෙන් දේශපාලන න්‍යායය පිළිබඳ ක්ෂේත්‍රයෙහි දී කරන දෙය හරය වශයෙන් ගත් කල, එය කැඩෙට් වරුන් දේශපාලන ව්‍යවහාරයෙහිදී කරන දෙයට සමාන වන්නේය. නිර්ධන පංතියට සහ විප්ලවවාදී ප්‍රජාතන්ත්‍රවාදීන්ට ඇත්ත වශයෙන්ම නව රාජ්‍ය යන්ත්‍රයක් අවශ්‍ය නැත්නම් එවිට බොල්ෂෙවික්වරුන් ඔවුන්ගේ raison d'être, එනම් ඔවුන්ගේ පැවැත්මේ අයිතිය නැතිව යන හෙයින්ද, සෝවියට් සභා බින්දුවට බැස්ස වීමට කර්නිලව් වාදී කැඩෙට් වරුන් ප්‍රයත්න දැරීම නිවැරදි වන හෙයින්ද, එම නිගමනයට බැස ගැනීමට සිදුවේ!

* මෙම වෙළුමේ මුල් කොටස බලන්න — සංස්කාරක

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

මෙම ප්‍රශ්නයේදී ජාත්‍යන්තරවාදී මෙන්ෂෙවික්වරුන්[87] (පෙත්‍රොග්‍රෑඩයේ පසුගිය නගර සභා මැතිවරණයේදී "නෝවය ෂිස්න්" පෙරමුණක් ඇති කර ගත්තේ ඔවුන් සමගය) පවා මෙම ප්‍රශ්නයේදී බොල්ෂෙවික්වරුන්ට සමීපතාවයක් පෙන්නුම් කර තිබෙන හෙයින්, "නෝවය ෂිස්න්" පත්‍රයේ මෙම පුදුම සහගත න්‍යායික වරද හා දේශපාලන අන්ධකම වඩාත්ම පුදුම එලවන සුලුය. ප්‍රජාතන්ත්‍රවාදී සාකච්ඡා සභාවේදී මාර්තව් සහෝදරයා ඉදිරිපත් කළ සෝවියට් සභා බහුතරයේ ප්‍රකාශයෙහි මෙසේ සඳහන් කර තිබේ:

"ජනතාව කෙරෙන්ම පැන නැගුනු නිර්මාණශීලී උද්වේගයේ දැවැන්ත උද්ගමනයක් තුළින් විප්ලවයේ මුල් දිනවලදී පිහිටුවන ලද කම්කරු සොල්දාදු සහ ගොවිජන නියෝජිත සෝවියට් සභා, පැරණි පාලනයේ යල්පැන ගිය රාජ්‍ය ව්‍යුහය වෙනුවට ආදේශ වූනු නව ව්‍යුහයක් ව..

එය මඳක් අලංකාරයෙන් වැඩිය. මෙහි භාෂා අලංකාරයෙන් දේශපාලන චින්තනයේ අඩුපාඩුව වසං කෙරෙන්නේය. සෝවියට් සභා තවමත් පැරණි "ව්‍යුහය" වෙනුවට ආදේශ වී නැත. එසේම මෙම පැරණි "ව්‍යුහය" පැරණි පාලනයේ රාජ්‍ය ව්‍යුහය නොවේ. එය සාර්වාදය සහ ධනපති සමූහාණ්ඩුව යන දෙකෙහිම රාජ්‍ය ව්‍යුහය වන්නේය. එහෙත්, ඒ එසේවුවත්, මාර්තව් "නෝවය ෂිස්න්" පත්‍රයට වඩා ඉතාමත් උසස් අවබෝධයක් පෙන්වයි.

සෝවියට් සභා යනු නව රාජ්‍ය යන්ත්‍රයකි. එය ප්‍රථමයෙන්ම කම්කරුවන්ගේ සහ ගොවීන්ගේ ආයුධ සන්නද්ධ හමුදවක් ඇති කර තිබේ. මෙම හමුදව පැරණි ස්ථිර යුද්ධ හමුදව ලෙසට ජනතාවගෙන් වෙන්වී නොමැත. එය ජනතාව සමග සමීප ලෙස සම්බන්ධ වී තිබේ. යුද්ධමය දෘෂ්ටි කෝණය අනුව කල්පනා කර බලන කල මෙය ඉහත පැවති හමුදවලට වඩා අසම සම තරම් බලවත්ය. විප්ලවවාදී දෘෂ්ටි කෝණය අනුව බලන කල, එය වෙනුවට වෙනත් කිසිවක් ආදේශ කළ නොහැකිය. දෙවැනිව, මෙම යන්ත්‍රය ජනතාව සමග, ජනතාවගේ බහුතරය සමග, ඉතාමත් කිට්ටු, ඉතාමත් ශක්තිමත්, ඉතාමත් පහසුවෙන් පිරික්සිය හැකි හා අළුත් කළ හැකි සම්බන්ධයක් ඇති කරන්නේය. ඒ අනුව බලන කල, ඊට යම්තමින් හෝ සමකළ හැකි කිසිම යමක් කලින් පැවත් රාජ්‍ය යන්ත්‍රයෙහි නොවීය. තුන්වැනිව, එහි සේවක පිරිස් නිලධාරිවාදී චාරිත්‍රානුගත භාවයෙන් සම්පූර්ණයෙන්ම තොරව ජනතා කැමැත්ත අනුව තෝරා පත් කරන ලද නිසා හා ඉවත් කිරීමට යටත් නිසා, ඉහත පැවති ඕනෑම යන්ත්‍රයකට වඩා එය ප්‍රජාතන්ත්‍රවාදීය. හතරවැනිව, එය විවිධාකාර වෘත්තීන් සමග ඉතාමත් කිට්ටු සම්බන්ධයක් ඇතිකරන හෙයින්, අනුබැඳියාවෙන් තොරව ඉතාමත්

සහ මූලික වෙනස් කම් ඇති කිරීම පහසු කෙරේ. පස්වැනිව, පීඩිත පංතිවල, කම්කරුවන් ගේ සහ ගොවීන්ගේ වැඩිම පංති විඥනයක් ඇති, ඉතාමත් ධෛර්ය සම්පන්න සහ ඉතාමත් ප්‍රගතිශීලී කොටස වන පෙරමුණු බල ඇණියට සංවිධාන ආකෘතියක් එයින් සැපයෙන අතර, එම සෝවියට් යන්ත්‍රය, මේ දක්වා දේශපාලන ජීවයෙන් හා ඉතිහාසයෙන් සම්පූර්ණයෙන්ම පිටමං වී සිටි මෙම පංතිවල අතිවිශාල පොදු ජනකාය මුළුමනින්ම උසස් කර, පුහුණු කර, ඔවුනට අධ්‍යාපනය දී නායකත්වය දීම පිණිස එම පංතිවල පෙරමුණු බල ඇණියට ප්‍රයෝජනවත් වන මාධ්‍යයක්ද වන්නේය. හය වැනිව, පාර්ලිමේන්තු ක්‍රමයේ යහපත් අංශ සමීප සහ ඍජු ප්‍රජාතන්ත්‍රවාදයේ යහපත් අංශ සමග සම්බන්ධ කර ගැනීමට, එනම්, ව්‍යවස්ථාදායක සහ විධායක යන කාර්යයන් දෙකම ජනතාව විසින් තෝරා පත්කරන ලද නියෝජිතයන්ට පැවරීමට හැකියාව එයින් ඇති කෙරේ. ධනපති පාර්ලිමේන්තු ක්‍රමය හා සමග සසඳන කල, මෙය ප්‍රජාතන්ත්‍රවාදයේ ලෝකව්‍යාප්ත ඓතිහාසික වැදගත් කමක් ඇති දියුණුවකි.

1905 දී සෝවියට් සභා ජීවමානව පැවත්යේ සති කීපයක් පමණක් නිසා එය කලල ස්වභාවයෙන් පැවති බවක් කිව හැකිය. එවකට පැවති තත්ත්වයන් යටතේ ඒවා අංග සම්පූර්ණ ලෙස සංවර්ධනය වීම, කිසිසේත් සිදුවිය හැකි දෙයක් නොවීය. 1917 විප්ලවයේදී ද, තවමත් එය සිදුවීමට ඉඩක් නැත. එයට හේතුව මාස කීපයක් යනු ඉතා කෙටි කාලයක් වීමය. මෙය ඉතා වැදගත් කරුණකි. සමාජවාදී-විප්ලවාදීහු සෝවියට් සභා වෛශ්‍යා වෘත්තියෙහි යෙදවූහ. ඔවුහු ඒවායේ කාර්යයන් කථා මඩු කාර්යයන් වන සේ කප්පාදු කළහ; ඒවා නායකයන් ගේ පාවාදීම් කටයුතුවල හවුල්කාරයන් බවට පත්කර ගත්හ. ලීබර්ලාගේ, දන්ලාගේ, චෙරෙතේලිලාගේ සහ චෙර්නොව්ලාගේ නායකත්වය යටතේ සෝවියට් සභා පණ පිටින්ම කුණු වෙමින් හා දිරාපත් වෙමින් පැවතුනි. සෝවියට් සභාවලට නිසි ලෙස සංවර්ධනය වීමටත්, ඒවායේ ශක්‍යතාවයන් සහ හැකියාවන් සියල්ල ගෙන හැර පෑමටත් හැකිවන්නේ, පූර්ණ රාජ්‍ය බලය ගැනීමෙන් පමණකි. නො එසේ නම්, ඒවාට කිරීමට දෙයක් නොමැති වන්නේය. එවිට ඒවා හුදෙක් කලල ස්වභාවයෙන්ම (දීර්ඝ කාලයක් කලල ස්වභායෙන් පැවතීම මාරක අන්තරායකි) හෝ කෙළි බඩු ලෙසට හෝ පවතිනු ඇත. "ද්විත්ව බලය" යනු සෝවියට් සභාවලට අංශභාග රෝගය වැළඳීම හා සමානය.

විප්ලවවාදී පංතිවල නිර්මාණශීලී උද්වේගය විසින් සෝවියට් සභා ජනිත නොකරන ලද නම්, රුසියාවේ නිර්ධන පංති විප්ලවය නිශ්ඵල කටයුත්තක් වන්නට තිබුණි. පැරණි රාජ්‍ය යන්ත්‍රය තිබියදී නිර්ධන පංතියට බලය රැක ගැනීම නිසැක වශයෙන්ම නොකළහැකි වන අතර නව යන්ත්‍ර-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

යක් එක සැනින් නිමවා ගැනීමට ද නුපුළුවන් හෙයින් එම විප්ලවය නිශ්ඵල වන්නට තිබුණි. ට්සෙරෙතේලිලා සහ චේර්නොව්ලා විසින් සෝවියට් සභා වෛශ්‍යා වෘත්තියෙහි යෙදවීමේ ශෝක ජනක ඉතිහාසයත්, ''සභාගයේ'' ඉතිහාසයත් යනු, සෝවියට් සභා සුළු ධනපති මායා මතවලින් නිදහස් වීමේ සහ නොයෙක් මාදිලියේ ධනපති සභාගවල අන්ත පිළිකුළ සහ කැත කුණු පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම නැමති ''නරකාදිය'' මැද්දෙන් ඒවා ගිය ගමනෙහි ඉතිහාසයද වන්නේ ය. මෙම ''නරකාදිය'' නිසා සෝවියට් සභා දුර්වල නොවී ශක්තිමත් වී ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

* * *

නිර්ධන පංති විප්ලවයට මුහුණ පාන්නට වන ප්‍රධාන දුෂ්කරතාවය නම්, ඉතාමත් නිවැරදි සහ ඉතාමත් අවංක ලෙස ගිණුම් තැබීමේ සහ පාලනය කිරීමේ ක්‍රමයක්, එනම්, භාණ්ඩ නිෂ්පාදනය කිරීම හා බෙදහැරීම පිළිබඳ කම්කරු පාලන ක්‍රමයක් දේශව්‍යාප්ත වශයෙන් ස්ථාපිත කිරීමය.

කම්කරු පාලනය පිළිබඳ සටන් පාඨය ඉදිරිපත් කිරීමෙන් අප සම්මේලවාදයට වැටෙතැයි ''නෝවය ෂිස්න්'' ලේඛකයන් තර්ක කරන කල, ඔවුන්ගේ එම තර්කය, මාක්ස්වාදය අධ්‍යයනය නොකර මෝඩ පාසල් ළමා ක්‍රමයට එය ක්‍රියාත්මක කිරීමේ, නැතහොත් ස්ත්‍රැවේ ආකාරයෙන් එය කටපාඩමෙන් කීමට උගෙන ගැනීමේ නිදසුනක් විය. සම්මේලවාදය එක්කෝ නිර්ධන පංතියේ විප්ලවාදී ආඥාදයකත්වය ප්‍රතික්ෂේප කරයි, නැතහොත්, සාමාන්‍ය වශයෙන් දේශපාලනය මෙන්ම එය ද පසු අසුනකට තල්ලු කර දමයි. එහෙත් අපි එය පෙරමුණෙහි තබන්නෙමු. ''නෝවය ෂිස්න්'' ලේඛකයන් සමග එක්ව, අපි ද 'කම්කරු පාලනය නොව, එහෙත් රජයේ පාලනය' යයි පමණක් කියන්නෙමු නම්, එය හුදෙක්ම ධනපති ප්‍රතිසංස්කරණවාදී වදනක් වේ. කම්කරුවන් ''රජයේ'' පාලන කටයුතුවලට සහභාගි වීම ගැන කැඩෙට්වරුන් විරුද්ධ නොවන හෙයින් එය ඉඳුරාම පිරිසිදු කැඩෙට් සූත්‍රයක් වනු ඇත. එවැනි සහභාගීත්වය නිසා ධනපති පංතියට කම්කරුවන් රැවටීමේ හොඳම මාර්ගයත්, ග්වොස්දියෙව්ලා, නිකිටින්ලා, ප්‍රකපෝවිච්ලා, ට්සෙරතේලිලා සහ එම කල්ලියේ වෙනත් අයට දේශපාලන වශයෙන් අල්ලස් දීමේ ඉතාමත් සූක්ෂම මාර්ගයක් විවෘත වන වග, කර්නිලව් වාදී කැඩෙට්වරු හොඳින් ම දනිති.

අපි ''කම්කරු පාලනය'' ගැන කියන විට, මෙම සටන් පාඨය නිතරම නිර්ධන පංති ආඥාදයකත්වය සමග එකට සඳහන් කරන්නෙමු. එය නිතරම නිර්ධන පංති ආඥාදයකත්වයට පසුව එසේ සඳහන් කරන්නෙමු. එසේ

කිරීමෙන්, අප අදහස් කරන්නේ කුමණ වර්ගයේ රාජ්‍යයක්ද යන්න පැහැදිලි කරන්නෙමු. රාජ්‍යය යනු පංති ආධිපත්‍යයේ අවයවය වේ. ඒ කුමණ පංතියේද යන ප්‍රශ්නය පැන නගී. එය ධනපති පංතියේ ආධිපත්‍යය නම්, එවිට එය අන්කිසිවක් නොව, හයමසක් තිස්සේ රුසියාවේ වැඩ කරන ජනතාව ''කර්නිලව්වාදී'' සහ ''කෙරෙන්ස්කිවාදී'' පාලනයට නතු කළ කැඩෙට්-කර්නිලව්-කෙරෙන්ස්කි රාජ්‍යමය ය. එය නිර්ධන පංතියේ ආධිපත්‍යය නම්, අප කථාකරන්නේ නිර්ධන පංති රාජ්‍යය ගැන, එනම්, නිර්ධන පංති ආඥාදයකත්වය ගැන නම්, එවිට කම්කරු පාලනය භාණ්ඩ නිෂ්පාදනය සහ බෙදහැරීම පිළිබඳ දේශ ව්‍යාප්ත, සර්වග්‍රාහී, සර්ව ව්‍යාපී, ඉතාමත් නිවැරදි හා ඉතාමත්ම විඥත ගිණුම් තැබීම බවට පත් විය හැකිය.

සමාජවාදී විප්ලවයට මුහුණ පාන්නට සිදුවන ප්‍රධාන දුෂ්කරතාවය, ප්‍රධාන කර්තව්‍යය මෙය ය. සෝවියට් සභා නොමැතිව, යටත් පිරිසෙයින් රුසියාවේවත් මෙම කර්තව්‍යය ඉටුකළ නොහැකි වනු ඇත.

මේ අනුව අපි ප්‍රශ්නයේ වෙනත් පැත්තකට, එනම් රාජ්‍ය යන්ත්‍රය වෙතට යොමු වෙමු. ප්‍රධාන වශයෙන්ම ''මර්දනකාරී'' යන්ත්‍රය වන ස්ථිර යුද්ධ හමුදාව, පොලිසිය හා නිලධාරි පෙළැන්තියට අමතරව, බැංකු හා සම්මේල සමග ඉතාමත් සමීප සම්බන්ධකම් ඇති, එනම්, දැවැන්ත ප්‍රමාණයක් ගිණුම් තැබීමේ සහ ලියාපදිංචි කිරීමේ කටයුතු කරන යන්ත්‍රයක් යයි කිවහැකි අංශයක්, නවීන රාජ්‍යයට හිමිය. මෙම යන්ත්‍රය සුන් නො කළ යුතුය. එය ධනපතියන්ගේ පාලනයෙන් උදුරාගත යුතුය. ධනපතියන්ද, ඔවුන් අදින ලනු ද මෙම යන්ත්‍රයෙන් කපා හළ යුතුය, සිඳ දැමිය යුතුය, කපා වෙන්කර දැමිය යුතුය. එය නිර්ධන පංති සෝවියට් සභා වලට යටත් කළ යුතුය. එය පුළුල් කර, වඩාත් අංග සම්පූර්ණ කර, දේශව්‍යාප්ත බවට පත් කළ යුතුය. තවද, මහා පරිමාණ ධනපති ක්‍රමය දැනටමත් බලාගෙන ඇති ජයග්‍රහණ උපයෝගි කරගනිමින් මෙය කළ හැකිවේ. (මෙම ජයග්‍රහණ උපයෝගි කර ගනිමින් නිර්ධන පංති විප්ලවයට පොදු වශයෙන් එහි අරමුණ ඉටු කරගත හැකි සේම ය).

බැංකු, සම්මේල, තැපැල් සේවය, පාරිභෝගිකයන්ගේ සමිති සහ කාර්යාල සේවක සංගම් ස්වභාවය ගත් ගිණුම් තැබීමේ යන්ත්‍රයක් ධනපති ක්‍රමය විසින් නිර්මාණය කරනු ලැබ තිබේ. විශාල බැංකු නොමැතිව සමාජවාදය සාර්ථක කළ නොහැකි වනු ඇත.

සමාජවාදය ස්ථාපිත කිරීම සඳහා අපට අවශ්‍ය වන හා අප ධනපති ක්‍රමයෙන් සදු නිමකළ ආකාරයෙන් ගන්නා ''රාජ්‍ය යන්ත්‍රය'' විශාල බැංකුය. මෙහි දී අපගේ කර්තව්‍යය වන්නේ, මෙම අනර්ඝ යන්ත්‍රය ධනපති ආකාරයෙන් විරූප කරන දේ ඉන් සිඳ දැමීම පමණකි, එම යන්ත්‍රය තවත් විශාල කර, තවදුරටත් ප්‍රජාතන්ත්‍රවාදී කර, තව තවත් අංග සම්පූර්ණ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කිරීම පමණකි. සංඛ්‍යාව ගුණයට පරිවර්තනය වනු ඇත. සෑම ග්‍රාමීය දිස්ත්‍රික්කයකම, සෑම පැක්ටරියකම ශාඛා සහිත වන සහ ලොකු බැංකු අතරින් ලොකුම එක වන තනි රාජ්‍ය බැංකුවකින්, සමාජවාදී යන්ත්‍රයේ දහයෙන් නව පංගුවක්ම සංයුක්ත වනු ඇත. මෙය භාණ්ඩ නිෂ්පාදනය සහ බෙදහැරීම පිළිබඳ දේශව්‍යාප්ත පොත් තැබීමක්, දේශව්‍යාප්ත ගිණුම් තැබීමක් වනු ඇත. මෙය සමාජයේ සැකිල්ල වශයෙන් විස්තර කළ හැකි ස්වභාවයේ දෙයක් වනු ඇත.

පොත් තැබීමේ, පාලනය කිරීමේ, ලියා පදිංචි කිරීමේ, ගිණුම් තැබීමේ සහ ගණන් ගැනීමේ කාර්යයන් ඇත්ත වශයෙන් ඉටු කරනු ලබන්නේ, තමන්ම නිර්ධන පංති හෝ අර්ධ නිර්ධන පංති දිවියක් ගෙවන බහුතරයකින් යුත් සේවකයන් විසින් වන නිසා අපට මෙම ''රාජ්‍ය යන්ත්‍රය'' (එය ධනපති ක්‍රමය යටතේ සම්පූර්ණයෙන්ම රාජ්‍ය යන්ත්‍රයක් නොවන නමුත්, අප යටතේ, සමාජවාදය යටතේ එය පූර්ණ රාජ්‍ය යන්ත්‍රයක් වනු ඇත) එක හෙළාම, එකම ආඥාවකින්ම ''අත්පත් කරගෙන'' එය ''ක්‍රියාත්මක කළ හැකි'' වේ.

නිර්ධන පංතියේ එක ආඥාවකින්ම මෙම සේවකයන් රාජ්‍ය සේවකයන්ගේ තත්ත්වයට පත් කළ හැකිය, පත්කළ යුතුය. බ්‍රියාන් සහ අනිකුත් ධනපති ඇමතියන් වැනි ධනපති ක්‍රමයේ මුර බල්ලන්, එක ආඥාවක් නිකුත්කර වැඩ වර්ජිත දුම්රිය කම්කරුවන් රාජ්‍ය සේවකයන් බවට පත්කරන මෙන්ම, එයද කළ හැක. අපට මෙම වර්ගයේ රාජ්‍ය සේවකයන් බොහෝ දෙනෙක් තවත් අවශ්‍ය වන්නේය. එසේම ධනපති ක්‍රමය ගිණුම් තැබීමේ සහ පාලනයේ කර්තව්‍යයන් සරල කර තිබෙන හෙයින්, අකුරු දත් ඕනෑම කෙනෙකුට ඉටු කළ හැකි පොත් තැබීමේ සාපේක්ෂ වශයෙන් සරල වූ ක්‍රමයක් වන සේ එය ලිහිල් කර තිබෙන හෙයින්, එම සේවකයන් බොහෝ දෙනෙක් සොයා ගත හැකි වේ.

සෝවියට් සභා පාලනය හා අධීක්ෂණය ක්‍රියාත්මක කරන්නේ නම්, (මුල්‍ය ධනපති ක්‍රමය ඇතුළුව ධනපති ක්‍රමය විසින් අප වෙනුවෙන් ඉටු කර තිබෙන ප්‍රාථමික වැඩ කොටසට ස්තුති වන්නට) බැංකු, සම්මේල, වාණිජ ආදී වූ සාමාන්‍ය සේවකයන් රාජ්‍ය සේවකයන් බවට හරවා ගැනීම තාක්ෂණික වශයෙන් හා දේශපාලන වශයෙන් යන දෙආකාරයෙන්ම සම්පූර්ණයෙන් කළ හැකි දෙයක් වන්නේය.

ඉතා සුළු පිරිසක් වන, එහෙත් ධනපති පංතිය දෙසට ඇදී යන උසස් නිලධාරීන් සම්බන්ධයෙන් කළ යුත්තේ, ඔවුන්ට ද ධනපතියන්ට මෙන්ම ''තදින්'' සැලකීමය. ධනපතියන් මෙන්ම ඔවුන්ද ප්‍රතිරෝධය පානු ඇත. මෙම ප්‍රතිරෝධය බිඳලිය යුතුය. රාජ්‍ය කටයුතු ගැන කිසිවක් නොදත් පෙෂෙහෝනව්, කිසිකලෙකත් අමතක නොවන තරම් ළාමක ගතියක්

පාමින් 1917 ජූනි මාසයේදී තරම් කල් තබාම ''ධනපතියන්ගේ ප්‍රතිරෝධය බිඳලා ඇතැ'' යි යන වදන ළදරුවෙකු මෙන් ප්‍රකාශ කළේ නම්, මෙම ළදරු පුරසාරම, මෙම බොළඳ ආඩම්බරය, නිර්ධන පංතිය විසින් යථාර්ථයක් බවට පත් කරනු ලැබේ.

අපට මෙය කළ හැකිය. එය ජනගහනයේ ඉතා සුළු අල්පතරයක, සාමාන්‍යයෙන් කියතොත් අතලොස්සක ප්‍රතිරෝධය බිඳලීමේ ප්‍රශ්නයක් පමණක් වන හෙයින්ද, සෙඩන්හිදී ප්‍රංශුවන් වටලන ලද පරිද්දෙන්[88] සෑම ටීට ටීටිච් කෙනෙක්ම වටකර ඔවුන් අධීක්ෂණයට යටත් කිරීමට සේවක සමිති, වෘත්තීය සංගම්, පාරිභෝගිකයන්ගේ සමිති සහ සෝවියට් සභා සමත්වනු ඇති හෙයින් ද, එය කළ හැකිය. අපි මෙම ටීට ටීටිච්ලා නමින් දන්නෙමු. අප කළ යුතුව ඇත්තේ අධ්‍යක්ෂවරුන්ගේ, පාලක මණ්ඩල සාමාජිකයින්ගේ, විශාල කොටස් හිමියන්ගේ ආදීන්ගේ ලැයිස්තු පරීක්ෂා කිරීම පමණකි. මුළු රුසියාවේම ඔවුන් සිය ගණනක් ඇත, වැඩිම වුවහොත්, දෙතුන් දහසක් ඇත. ඔවුන් එක් එක් අය ගැන අධීක්ෂණය සඳහා අධීක්ෂකයන් දස දෙනා බැගින් නැතහොත් සියදෙනා බැගින් පවා පත් කිරීමට සෝවියට් සභා යන්ත්‍රය සහිත නිර්ධන පංති රාජ්‍යයට පුළුවන් වන්නේය. එවිට ''ප්‍රතිරෝධය බිඳලනවා'' වෙනුවට (ධනපතියන් යටත් කර ක්‍රියාත්මක කරන) කම්කරු පාලනය උපයෝගී කර ගනිමින් කිසිම ප්‍රතිරෝධයකට ඉඩ නොතබන තත්ත්වයක් ඇති කළ හැකිය.

වැදගත් කටයුත්ත වන්නේ ධනපතියන්ගේ දේපල රාජසන්තක කිරීමද නොවේ. එය නම්, ධනපතියන් සහ ඔවුන්ට ආධාර දෙනු ඇති අය යටත් කර දේශව්‍යාප්ත, සර්වග්‍රාහී කම්කරු පාලනය ඇති කිරීමය. නිසි ලෙස බෙදා හැරීම සඳහා අවශ්‍යවන සංවිධානයේ සහ ගිණුම් තැබීමේ මූලිකාංගයන් රාජ්‍ය සන්තක කිරීමට අන්තර්ගත නොවන හෙයින්, හුදෙක් එය පමණක් කිරීමෙන් ඉටුවන කාර්යක් නැත.රාජ්‍ය සන්තක කිරීම වෙනුවට අපට පහසුවෙන්ම සාධාරණ බද්දක් පැනවිය හැකිය. එහෙත් එසේ කිරීමේදී තක්සේරුවෙන් මඟ හැරීමට, සත්‍ය වසංකිරීමට, නීතිය මඟ හැරීමට (නිදසුනක් වශයෙන් ෂිංගරියොව් පරිමාණයෙන් හෝ එසේ කිරීමට) කිසිවෙකුට ඉඩ නොතැබීමට වග බලාගත යුතුය. මෙම ඉඩ කඩ අහුරාලිය හැක්කේ කම්කරු රාජ්‍යය තුළ කම්කරු පාලනය ක්‍රියාත්මක කිරීමෙන් පමණකි.

අනිවාර්ය සම්මේලගතකරණය, එනම්, රාජ්‍ය පාලනය යටතේ අනිවාර්ය ලෙස සමාගම් තුළ ඒකාබද්ධ කිරීම — ධනපති ක්‍රමය මාර්ගය සකස් කර ඇත්තේ මෙය සඳහාය. ජර්මනියේ ජුන්කර් රාජ්‍යයේ ක්‍රියාත්මක කර තිබෙන්නේ මෙයය. රුසියාවේ සෝවියට් සභා විසින්, නිර්ධන පංති ආඥාදායකත්වය විසින් ක්‍රියාත්මක කරනු ලැබුවේ මෙයය. එසේම,

https://liberationbase.wordpress.com

විශ්වීය, කලට සරිලන හා නිලධාරිවාදී නොවන රාජ්‍ය යන්ත්‍රය අපට සපයනු ඇත්තේද මෙයය*.

* * *

ධනපති පංතියේ උපදේශකයන් ඉදිරිපත් කරන හතරවැනි කරුණ, නිර්ධන පංතියට ''රාජ්‍ය යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට නොපුළුවන් වනු'' ඇතැයි යන්නය. ඉහත සඳහන් කරුණ සමඟ සංසන්දනය කර බලන කල මෙහි අළුත් කිසිවක් නොමැත. අපට යන්ත්‍රය අත්පත් කර ගැනීම හෝ එය ක්‍රියාත්මක කිරීම හෝ කළ නොහැකි බව ඇත්තකි. නව යන්ත්‍රය වන සෝවියට් සහා ''ජනතාව කෙරෙන්ම පැන නැගුනු නිර්මාණශීලී උද්වේගයේ දැවැන්ත උද්ගමනයක් තුළින්'' දැනටමත් ක්‍රියාත්මක කර තිබේ. අප කළ යුතුව තිබෙන්නේ සමාජවාදී-විප්ලවවාදී සහ මෙන්ෂෙවික් නායකයන්ගේ ආධිපත්‍යයෙන් එයට වැටී ඇති විලංගුවලින් එය නිදහස් කිරීම පමණකි. මෙම යන්ත්‍රය දැනටමත් ක්‍රියාත්මක වෙමින් පවතී. අප කළ යුත්තේ, එය මුළු වේගයෙන් ක්‍රියාත්මක වී ඉරිදියට යාම වලක්වන දැවැන්ත සුළු ධනපති බාධකවලින් එය මුදගැනීම පමණකි.

ඉහත කී කරුණුවලට ඌනපූරක වශයෙන් මෙහිදී තත්ත්වයන් දෙකක් ගැන සලකා බැලිය යුතුය. ප්‍රථමයෙන් කිව යුත්තේ, නව පාලන මාධ්‍යයන් අප විසින් නොව, ධනපති ක්‍රමය විසින්, එහි අධිරාජ්‍යවාදී අවධියේදී නිර්මාණය කරන ලද බවය. දෙවැනිව කිව යුත්තේ, නිර්ධන පංති රාජ්‍යයක පරිපාලනයට වැඩි ප්‍රජාතන්ත්‍රවාදයක් ගෙන දිය යුතු බවය.

ධාන්‍ය ඒකාධිකාරය සහ පාන් සලාක ක්‍රමය අප විසින් නොව යුද්ධ කාලයේ ධනපති රාජ්‍යය විසින් ආරම්භ කරන ලද්දකි. කම්කරුවන්ට බරපතල වැඩ සහිත යුද්ධ කාලීන සිර දඬුවමක් වන අනිවාර්ය විශ්වීය ශ්‍රම සේවය ධනපති ක්‍රමයේ රාමු කට්ටුව තුළ කල් තබාම ක්‍රියාත්මක කර තිබුණි. නිර්ධන පංතියේ සියළුම ඉතිහාස නිර්මාණක කටයුතු වලදී මෙන්ම මෙහිදී ද, නිර්ධන පංතිය එහි ආයුධ ලබා ගන්නේ ධනපති ක්‍රමයෙනි; එය ඒවා හුදු හිස් බව කෙරෙන් ''සොයා ගන්නවා'' හෝ ''නිමවා ගන්නවා'' හෝ නොවේ.

නිර්ධන පංති රාජ්‍යය අතට පත්, ස්වෛරී සෝවියට් සභා අතට පත් ධාන්‍ය ඒකාධිකාරය, පාන් සලාක ක්‍රමය හා අනිවාර්ය ශ්‍රම සේවය ඉතාමත් බලවත් ගිණුම් තැබීමේ හා පාලනය කිරීමේ මාධ්‍යය වනු ඇත. මෙම

* අනිවාර්ය සම්මේලගතකරණය යන්න ගැන වැඩි විස්තර සඳහා ''ළඟ එන විනාශය හා එයට විරුද්ධව සටන් කරන්නේ කෙසේද?'' යනුවෙන් මා ලියූ පොත බලන්න.

මාධ්‍යය ධනපතියන් විෂයෙහි ක්‍රියාත්මක කෙරෙන විට, පොදුවේ පොහොසතුන් කෙරෙහි ක්‍රියාත්මක කෙරෙන විට, එය ''රාජ්‍ය යන්ත්‍රය ක්‍රියාත්මක කිරීම'' සඳහා ද, ධනපතියන්ගේ ප්‍රතිරෝධය පරාජය කිරීම සඳහා ද, ඔවුන් නිර්ධන පංති රජයට යටත් කිරීම සඳහා ද උපකාරීවන, මෙතෙක් ඉතිහාසයේ නොදක්නා ලද විරු බලවේගයක් ඇති කරන්නේය. පාලනය කිරීමේ සහ වැඩකරන ලෙස ජනයට බලකිරීමේ මාධ්‍යය පොදුජන සම්මුතියේ නීතිවලට සහ එහි ගිලටිනයට වඩා බලවත් ය. ගිලටිනයෙන් කෙරුනේ බිය වැද්දීම පමණකි. ක්‍රියාශීලී ප්‍රතිරෝධය බිඳලීම පමණකි. අපට මෙය ප්‍රමාණවත් නොවේ.

අපට මෙය ප්‍රමාණවත් නොවේ. අප කළ යුත්තේ ධනපතියන් ''බියවැද්දීම'', එනම්, නිර්ධන පංති රාජ්‍යයේ සර්වව්‍යාපී බලය දැනෙන්නට සලස්වා, ඊට ක්‍රියාශීලී ප්‍රතිරෝධය දැක්වීම පිළිබඳ සෑම අදහසක්ම අත්හැර දමන සේ ඔවුන් පෙළඹවීම පමණක් නොවේ. අපි අකර්මන්‍ය ප්‍රතිරෝධයද බිඳලිය යුත්තෙමු. නිසැක වශයෙන්ම වඩාත් භයානක හා අන්තරාදයක ප්‍රතිරෝධය එය ය. අප කළ යුත්තේ සෑම වර්ගයකම ප්‍රතිරෝධය බිඳ හෙළීම පමණක් නොවේ. නව රාජ්‍ය සංවිධානයේ රාමු කට්ටුව තුළ වැඩ කරන සේ ධනපතියන්ට බල කිරීම ද කළ යුතු වේ. ධනපතියන් ''ඉවත් කිරීම'' ප්‍රමාණවත් නොවේ. අපි ඔවුන් (නුසුදුස්සන් හා නොහික්මවියහැකි ''ප්‍රතිරෝධකයින්'' ඉවත් කිරීමෙන් පසු) නව රාජ්‍යයේ සේවය සඳහා යෙදිය යුත්තෙමු. ධනපතියන්ටත්, ධනපති බුද්ධිමතුන්ගේ ඉහළ කොටස්, කාර්යාල සේවකයන් යනාදීන්ටත්, යන දෙකොටසටම මෙය අදළ වේ.

මෙය කිරීමේ මාධ්‍යයන් අපට තිබේ. මේ සඳහා අවශ්‍ය මාධ්‍යයන් හා උපකරණ යුද්ධයෙහි යෙදුනු ධනපති රාජ්‍යය විසින් අප අතට පත්කර තිබේ. මෙම මාධ්‍යයන් නම්, ධාන්‍ය ඒකාධිකාරයත්, පාන් සලාක ක්‍රමයත්, අනිවාර්ය ශ්‍රම සේවයත් වේ. ''යමෙක් වැඩ නොකරයි ද, හේ අනුභව නොකළ යුතුය.'' කම්කරු නියෝජිත සෝවියට් සභා පාලක බලය බවට පත් වූ පසු, ඒවාට ක්‍රියාත්මක කළ හැකි හා ඒවා ක්‍රියාත්මක කළ යුතු මූලික ප්‍රථම සහ ඉතාමත් වැදගත් රෙගුලාසිය එයය.

හැම කම්කරුවෙකුටම වැඩ පොතක් තිබේ. දැනට මෙම පොත, කම්කරුවා කිසියම් පරපෝෂිතයෙකුට අයත් බව සහතික කරන, ධනපති වේතන වහල් ක්‍රමයේ ලියවිල්ලක් වන බව නිසැක නමුත්, එයින් කම්කරුවාට නින්දවක් සිදු නොවේ.

සෝවියට් සභා පොහොසතුන් සඳහා වැඩ පොත් ක්‍රියාත්මක කරනු ඇත. ඊළඟට ක්‍රමික වශයෙන් මුළු ජනගහනයම සම්බන්ධයෙන් එය ක්‍රියාත්මක කරනු ලැබේ (සමහර විට ගොවිජන රටක, ගොවිජනතා

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

අති බහුතරය සඳහා දීර්ඝ කාලයක් ගතවනතෙක් වැඩ පොත් අවශ්‍ය නොවනු ඇත). වැඩ පොත "සාමාන්‍ය රංචුවේ" අඩයාලමක්, "පහළ" සමාජයේ ලේඛණයක්, වේතන වහල් ක්‍රමයේ සහතිකයක් වන තත්ත්වය කෙළවර වනු ඇත. එය, නව සමාජයේ තවදුරටත් "වැඩ කරුවන්" කිසිවෙක් නොමැති බවද, අනිත් අතට, තවදුරටත් වැඩ නො කරන මිනිසුන් නොමැති බවද, සහතික කරන ලියවිල්ලක් වනු ඇත. පොහොසතුන්ට, ඔවුන්ගේ වැඩ කටයුතුවලට වඩාත් සමීප ලෙස සම්බන්ධ වූ කම්කරු හෝ කාර්යාල සේවක සංගමයෙන් වැඩ පොතක් ලබා ගැනීමටත්, ඔවුන් අවංක ලෙස ඔවුන්ගේ වැඩ කරන බවට එම සංගමයෙන් සහතිකයක් සතියකට හෝ වෙනත් නියමිත කාලයකට හෝ වරක් ලබා ගැනීමටත් සිදුවනු ඇත. මෙය නොමැතිව සාමාන්‍ය වශයෙන් පාන් සලාක පත් හෝ ආහාර ද්‍රව්‍ය ලබා ගැනීමට ඔවුන්ට නො පුළුවන් වනු ඇත. නිර්ධන පංති රාජ්‍යය මෙසේ කියනු ඇත: අපට බැංකු කටයුතු සහ ව්‍යවසාය ඒකාබද්ධ කිරීමේ කටයුතු සඳහා හොඳ සංවිධායකයින් අවශ්‍යය. (මෙම කටයුත්තෙහිදී ධනපතියන්ට වැඩි පළ පුරුද්දක් ඇත. එසේම පළපුරුදුකම් ඇති අය සමග වැඩ කිරීම පහසුය). එසේම, පෙරට වඩා බොහෝ ගණනක් ඉන්ජිනේරුවරුන්, කෘෂිවිද්‍යාඥයන්, කාර්මික ශිල්පීන් සහ සෑම වර්ගයකම විද්‍යානුකූල පුහුණුව ලත් විශේෂඥයන් අපට අවශ්‍යය. අපි මේ විශේෂඥයන් සියළු දෙනාටම, ඔවුන්ට හුරු පුරුදු හා කළ හැකි වැඩ දෙන්නෙමු. අප සම්පූර්ණ වේතන සමානත්වය ක්‍රියාත්මක කරන්නේ ක්‍රමික වශයෙන් පමණක් වීමට බොහෝ දුරට ඉඩ තිබේ. එනිසා පරිවර්තනීය කාලසීමාව තුළදී අපි මෙම විශේෂඥයින්ට වැඩි වැටුපක් ගෙවන්නෙමු. එසේ වුවද, අපි ඔවුන් අංග සම්පූර්ණ කම්කරු පාලනයට යටත් කරන්නෙමු. එසේම "යමෙක් වැඩ නොකරයිද, හේ අනුභව නොකළ යුතුය" යන රෙගුලාසිය සම්පූර්ණ සහ නිරපේක්ෂ ලෙස ක්‍රියාවට නංවන්නෙමු. අපි වැඩ පිළිබඳ සංවිධාන ආකෘතිය නිර්මාණය නොකරන්නෙමු. අපි එය නිම කළ ආකාරයෙන් ධනපති ක්‍රමයෙන් ගන්නෙමු. අපි බැංකු, සම්මේල, හොඳම පැක්ටරි, පර්යේෂණ මධ්‍යස්ථාන, විද්‍යායතන යනාදිය ගන්නෙමු. අප කළ යුතුව ඇත්තේ දියුණු රටවල් සම්පාදනය කර තිබෙන හොඳම ආදර්ශ උපුටා ගැනීම පමණකි.

එහෙත් මොහොතකට හෝ අපි මනෝරාජ්‍යයට නො පිවිසෙන්නෙමු. ඉතාමත් ඥනාන්විත හා ප්‍රායෝගික තර්කානුකූල භාවයේ භූමිය අත්හැර නොයන අපි, මුළු ධනපති පංතිය ඉතාමත් මුරණ්ඩු සහගත ප්‍රතිරෝධයක් දක්වනු ඇති බව කියන්නෙමු. එහෙත්, මුළු ජනතාවම සෝවියට් සභා තුළ සංවිධානය කිරීමෙන් මෙම ප්‍රතිරෝධය බිඳ හෙළනු ලැබේ. ඉතාමත් මුරණ්ඩු හා දුර්දාන්ත ධනපතියන්ට නම් ඔවුන්ගේ සියළුම දේපල රාජසන්තක කිරීමෙන් සහ බන්ධනාගාරගත කිරීමෙන් දඩුවම් කිරීමට සිදුවේ. අනිත් අතට, නිර්ධන පංතියේ ජයග්‍රහණය නිසා, මට අද "ඉස්වෙස්තිය" පත්‍රයෙන්[89] කියවන්න ලැබුණු පහත දක්වෙන නිදර්ශයෙහි සඳහන් වැනි අවස්ථා වැඩි වීමට ඉඩ තිබේ:

ඉන්ජිනේරුවන් කණ්ඩායමක් සමාජවාදී ඉන්ජිනේරුවන්ගේ සංගමයක් පිහිටුවීමට තීරණය කළ බව දන්වීමට ඉන්ජිනේරුවරු දෙදෙනෙක් සැප්තැම්බර් මස 26 දින පැක්ටරි කාරක සභා මධ්‍යම මණ්ඩලයට පැමිණියහ. වර්තමාන අවස්ථාව සමාජ විප්ලවයේ ආරම්භය යයි විශ්වාස කරන සංගමය, කම්කරුවන්ගේ අවශ්‍යතාවයන් ආරක්ෂා කිරීමට කම්කරු සංවිධාන සමග සම්පූර්ණ සමගියෙන් වැඩ කිරීමේ අභිලාෂයෙන් කම්කරු ජනතාවට සේවය කිරීමට ඉදිරිපත් වෙයි. පැක්ටරි කාරක සභා මධ්‍යම මණ්ඩලයේ නියෝජිතවරු ඊට පිළිතුරු දෙමින් මණ්ඩලයේ ඉන්ජිනේරු අංශයක් පිහිටුවා, එහි වැඩපිළිවෙළට ප්‍රථම පැක්ටරි කාරක සභා සාකච්ඡා සභාවේ ප්‍රවාද ඇතුලත් කිරීමට කැමති බව කීහ. මීළඟ දින කීපය තුළ, පැක්ටරි කාරක සභා මධ්‍යම මණ්ඩලයේ සහ සමාජවාදී ඉන්ජිනේරුවන්ගේ ක්‍රියාරම්භක කණ්ඩායමේ නියෝජිතයන්ගේ රැස්වීමක් පවත්වනු ලැබේ". ("ඉස්වෙස්තිය" 1917 සැප්තැම්බර් 27)

* * *

නිර්ධන පංතියට රාජ්‍ය යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට නොහැකි වනු ඇතැයි අපට කියනු ලැබේ.

1905 විප්ලවයෙන් පසුව රුසියාව ආණ්ඩු කරන ලද්දේ ඉඩම් හිමියන් 1,30,000 ක් විසිනි. ඔවුහු 1,50,00,000 ක් ජනතාවට කෙළවරක් නැති හිංසා කළහ; ඔවුන්ට සීමාවක් නැති නින්ද කළහ; ඉන් අති බහුතරය බලවත් වෙහෙසට හා අර්ධ සාගතයට පත් කළහ.

එසේවුවත්, බොල්ෂෙවික් පක්ෂයේ සාමාජිකයින් 2,40,000 ට රුසියාව ආණ්ඩු කිරීමට, පොහොසතුන්ට විරුද්ධව දුප්පතුන්ගේ යහපත පිණිස ආණ්ඩු කිරීමට නොහැකි වේයයි අපට කියනු ලැබේ. මෙම 2,40,000 ට දැනටමත් වැඩිහිටි ජනගහනයෙන් දශලක්ෂණයකට නො අඩු සංඛ්‍යාවක ආධාරය ලැබී තිබේ. යුරෝපයේ අත් දැකීම් සහ රුසියාවේ අත් දැකීම් පදනම් කරගෙන පිහිටුවන ලද පක්ෂයට, නිදසුනක් ලෙසට පසුගිය අගෝස්තු මස පැවැත්වුනු පෙට්‍රොග්‍රෑඩ් නගර සභා මැතිවරණයේදී ලැබුණු ඡන්ද සංඛ්‍යාව හා පක්ෂ සාමාජික සංඛ්‍යාව අතර වෙනස එය බව පෙනී ගොස් ඇත. ඒ අනුව බලන කල සෑම මාසයකම 20 වැනි දිනට ලැබෙන ලොකු මුදල නිසා නොව, උසස් පරමාර්ථයන් නිසා සමාජවාදී රාජ්‍යයට කැප වුනු දශ ලක්ෂයක් ජනතාවගේ "රාජ්‍ය යන්ත්‍රයක්" දැනටමත් අපට ඇත.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ඊට අමතරව අපගේ රාජ්‍ය යන්ත්‍රය එක පැහැරම දස ගුණයකින් විශාල කිරීමේ ''මැජික් ක්‍රමයක්'' ද අපට ඇත. කිසිම ධනපති රාජ්‍යයකට එම ක්‍රමය තිබුණේ හෝ තිබිය හැකි වූයේ නැත. මෙම මැජික් ක්‍රමය නම්, වැඩ කරන ජනතාව, දුප්පත් ජනයා දෛනික රාජ්‍ය පරිපාලන කටයුතුවලට සම්බන්ධ කර ගැනීමය.

මෙම මැජික් ක්‍රමය උපයෝගි කර ගැනීම කොතරම් පහසුද, එය කොතරම් නිරවද්‍ය ලෙස ක්‍රියාත්මක වන්නේද යන්න පැහැදිලි කිරීමට හැකි තරම් සරල හැකි තරම් සිත් ඇදගන්නා නිදර්ශනය ගනිමු.

තට්ටු නිවාසයකින් කිසියම් පවුලක් බලෙන් ඉවත් කර එහි වෙනත් පවුලක් පදිංචි කරවීමට රජයට උවමනා වී තිබේ. මෙය, බොහෝ විට ධනපති රාජ්‍යයේ සිදුවන දෙයක් වන අතර, නිර්ධන පංති රාජ්‍යය යටතේද සිදුවන්නේය.

කම්කරු පවුලක ඉපයීම් කරන තැනැත්තා නැතිව ගිය හෙයින්, කුලිය ගෙවා ගත නොහැකිව සිටින පවුලක් ධනපති රාජ්‍යය විසින් ඉවත් කරනු ලැබේ. බේලිප් විදනෝ තැන පොලිසියේ හෝ මිලිෂියා හමුදාවේ මුළු කණ්ඩායමක්ම කැටුව එහි එන්නේය. කම්කරු දිස්ත්‍රික්කයක පවුලක් ඉවත් කිරීමට කොසාක් හමුදාවේ මුළු සේනාංකයක්ම අවශ්‍ය වන්නේය. ඒ මන්ද? එසේ වන්නේ ඉතා ශක්තිමත් යුද්ධභට කණ්ඩායමක ආරක්ෂාව නොමැතිව, බේලිප් විදනෝ සහ මිලිෂියා භටයෝ එහි යාමට ප්‍රතික්ෂේප කරන හෙයිනි. ගෙයකින් පදිංචි කරුවන් ඉවත් කිරීමේ අවස්ථාවක, අසල්වැසියන් අතර, එනම්,මාරාන්තිකභාවයේ සමීපයට දක්කනු ලැබූ දහස් සංඛ්‍යාත මිනිසුන් අතර, ඉතාමත් බලවත් කෝපාග්නියක් ඇවිළී යන බැවින්, එහි දී කොයියම් මොහොතක හෝ බේලිප් විදනෝ සහ මිලිෂි යා භටයන් කැබලිවලට ඉරා දමනු ලැබීමේ අවදනමට ලක්වන බව ඔවුහු දනිති. විශාල හමුදා අවශ්‍ය වන්නේය. ලොකු නගරයකට රෙජිමේන්තු කීපයක් ගෙන ආයුතු වන්නේය. සොල්දාදුවන්ට නාගරික දුප්පතුන්ගේ ජීවිතය ගැන හොඳ අවබෝධයක් නොලැබෙනු පිණිස, සොල්දාදුවන්ට සමාජවාදය ''බෝවීම'' නොවනු පිණිස හමුදාව ගෙන ආයුත්තේ දුර බැහැර ප්‍රත්‍යන්ත ප්‍රදේශයකිනි.

ඉතා දුප්පත් පවුලක් පොහොසතාගේ තට්ටුනිවාසයෙහි බලෙන් පදිංචි කරවීමට නිර්ධන පංති රාජ්‍යයට සිදුවේ. අපගේ මිලිෂියා හමුදාවේ ශක්තිය පසළොස් දෙනෙක් යයි සිතමු. ඔවුන් සේලරුවන් දෙදෙනක්ද, සොල්දාදුවන් දෙදෙනෙක්ද, පංති විඥානය ඇති කම්කරුවන් දෙදෙනෙක් ද (ඉන් එක් අයෙක් පමණක් පක්ෂ සාමාජිකයෙක් හෝ එසේ නැතහොත් පක්ෂ හිතවතෙක් යයි සිතමු), එක් බුද්ධිමතෙක්ද, දුප්පත් වැඩ කරන ජනතාවගෙන් අටදෙනෙක්ද වන අතර, ඉන් පසුකී අට දෙනාගෙන් පස්

දෙනෙක්වත් ස්ත්‍රීන්, ගෘහසේවකයන්, නුපුහුණු කම්කරුවන් යනාදීන් විය යුතුය. කණ්ඩායම පොහොසත් මිනිසාගේ තට්ටු නිවාසයට පැමිණ එය පරීක්ෂා කර බැලූ කල, එය මිනිසුන් දෙ දෙනෙක් සහ ස්ත්‍රීන් දෙදෙනෙක් පදිංචි කාමර පහක නිවාසයක් බව පෙනී යයි. පුරවැසියනි, මෙම ශීත ඍතුවේදී නුඹලා කාමර දෙකක මදක් තදබද වී සිටපල්ලා. කාමර දෙකක් දැනට බිම්ගෙවල සිටින පවුල් දෙකක් සඳහා සූදනම් කරපල්ලා. ඉන්ජිනේරුවන්ගේ ආධාර ඇතිව (ඔබ ඉන්ජිනේරුවෙක් නොවේද?) සියළු දෙනාටම හොඳ ගෙවල් තනන තෙක් නුඹලාට මදක් කුඩු ගැසී සිටින්නට සිදු වේවි. නුඹලාගේ දුර කථනය පවුල් දහයක ප්‍රයෝජනය සඳහා තැබිය යුතුය. මේ නිසා සාප්පු යාමට ගත කරන කාලයෙන් පැය සියයක් අඩුවීම ආදී යහසාධනයන් සිදුවන්නේය. දැන් සැහැල්ලු වැඩ කළ හැකි, රැකියා විරහිත අය දෙදෙනෙක් නුඹලාගේ පවුලේ ඉන්නවා. අවුරුදු පණස් පහක පුරවැසි ස්ත්‍රියක් සහ අවුරුදු දහහතරක පුරවැසියෙක් සිටිනවා. ඔවුන් දිනකට පැය තුන බැගින් රාජකාරි කරමින් පවුල් දහයකට හරි ආකාර ආහාර බෙදා දීම ගැන අධීක්ෂණය කිරීමත් ඒ සඳහා අවශ්‍ය ගිණුම් තැබීමත් කළ යුතුය. අපගේ කණ්ඩායමේ සිටින ශිෂ්‍ය පුරවැසියා මෙම රාජ්‍ය නියෝගය පිටපත් දෙකකින් යුතුව දැන් ලියනු ඇත. නුඹලා එය නොපිරිහෙළා ඉටුකරන බවට අත්සන් කළ ප්‍රකාශයක්, නුඹලා අපට කරුණාකර දිය යුතුය.''

පැරණි ධනපති සහ නව සමාජවාදී රාජ්‍ය යන්ත්‍රයත්, රාජ්‍ය පාලනයත් අතර වෙනස පැහැදිලි කළ යුතු ආකාරය පිළිබඳව, මෙය හොඳ නිදසුනක් වන්නේ යයි මම අදහස් කරමි.

අපි මනෝරාජිකවාදීන් නොවෙමු. නොපුහුණු කම්කරුවා හෝ අරක්කැමියා එක්වරම රාජ්‍ය පරිපාලන කටයුත්තෙහි යෙදීමට සමත් නොවන බව අපි දන්නෙමු. මෙහිදී අපි කැඩෙට්වරුන්, බ්‍රෙෂ්කොව්ස්කය සහ ට්සෙරෙතේලි සමග එකඟ වන්නෙමු. නමුත් රාජ්‍ය පරිපාලනය කිරීමට, පරිපාලනයේ සාමාන්‍ය දෛනික වැඩ කටයුතු කිරීමට සමත්වන්නේ පොහොසතුන් පමණකැයිද, නැතහොත්, පොහොසත් පවුල්වලින් තෝරාගත් නිලධාරීන් පමණකැයිද යන පූර්ව මතික අදහස වහාම අත්හැරිය යුතුයයි බලකර සිටීමෙන්, අපි මෙම පුරවැසියන්ගෙන් වෙනස් වන්නෙමු. පංති විඥානය ඇති කම්කරුවන් හා සොල්දාදුවන් මගින් රාජ්‍ය පරිපාලන කටයුතු ගැන පුහුණුවක් දීම කරන ලෙසත්, එම පුහුණුව වහාම අරඹන ලෙස එනම්, මෙම කටයුතු සඳහා සියළුම වැඩ කරන ජනයා, සියළුම දුප්පතුන් පුහුණු කිරීමට වහාම ආරම්භයක් කරන ලෙසත්, අපි ඉල්ලමු.

කැඩෙට්වරුන්ද ජනතාවට ප්‍රජාතන්ත්‍රවාදය උගැන්වීමට කැමැත්-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

තෙන් සිටින බව අපි දනිමු. ඉංග්‍රීසි සහ ප්‍රංශ ගුරුකුලයන් අනුගමනය කරමින්, සමාන කාන්තා අයිතිවාසිකම් ගැන ගෘහ සේවිකාවන්ට දේශනා පැවැත්වීමට කැඩෙට් ආර්යාවන් කැමති වනු ඇත. එසේම, ඊළඟ විවිධ ප්‍රසංග රැස්වීමේදීම, දහස් ගණන් ප්‍රේක්ෂකයන් ඉදිරිපිට දී, වේදිකාවේ හාදු දීමක් පිළියෙළ කරනු ඇත. දේශක කැඩෙට් ආර්යාව බ්‍රෙෂ්කොව්ස්කය සිපගනු ඇත. බ්‍රෙෂ්කොව්ස්කය හිටපු ඇමති ට්සෙරතේලි සිපගනු ඇත. එනිසා කෘතඥතා පූර්වක ජනතාවට සමූහාණ්ඩුවාදී සමානාත්මතාවය, නිදහස සහ සහෝදරත්වය පිළිබඳ ආදර්ශ පාඩමක් ලැබෙනු ඇත.

එසේය. කැඩෙට්වරුන්, බ්‍රෙෂ්කොව්ස්කය සහ ට්සෙරෙතේලි ඔවුන්ගේම ශෛලියෙන් ප්‍රජාතන්ත්‍රවාදයට කැපවී සිටින බවත්, ඔවුන් එය ජනතාව අතර පතුරුවමින් සිටින බවත් අපි පිළිගනිමු. එසේ වුවත් ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ අපගේ සංකල්පය ඔවුන්ගේ සංකල්පයට වඩා තරමක් වෙනස් නම් කුමක් කළ හැකිද?

අපගේ අදහසේ හැටියට යුද්ධය ඇතිකරන නො ඇදහියහැකි තරම්වන දුෂ්කරතා සහ කරදර කම්කටොළු අඩු කිරීමටද, යුද්ධයෙන් ජනතාවට සිදුවී ඇති භයානක තුවාල සුව කිරීමට ද, අවශ්‍ය වන විප්ලවවාදී ප්‍රජාතන්ත්‍රවාදය යනු, දුප්පතුන්ගේ යහපත පිණිස නිවාස ඉඩ කඩ බෙදා දීම පිළිබඳ වූ ඉහත සඳහන් නිදර්ශනයේ විස්තර කෙරෙන වැනි වර්ගයේ විප්ලවවාදී පියවරයන්ය. නාගරික සහ ගම්බද යන ප්‍රදේශ දෙකෙහිදීම ආහාර, වස්ත්‍ර, පාවහන් ආදිය බෙදා දීමෙහි දී ද, ගම්බද දිස්ත්‍රික්කවල ඉඩම් සම්බන්ධයෙන්ද යනාදී කටයුතුවලදී අනුගමනය කළ යුත්තේ හරියටම එම ක්‍රියා පිළිවෙළමය. මෙම ජීවගුණයෙන් යුතුව රාජ්‍යයේ පරිපාලන කටයුතු කරගෙන යාම සඳහා, ධනපති රාජ්‍යයක් කිසි කලෙකත් නොදත් විරූ, දෙකෝටියක නොවේනම්, කෝටියක පිරිසකින් යුත් රාජ්‍ය යන්ත්‍රයක් එක් වරම ක්‍රියාත්මක කිරීමට අපට පුළුවන. එවැනි යන්ත්‍රයක් නිර්මාණය කිරීමෙහි සමත් වන්නේ අප පමණකි. අපට එය කළහැක්කේ ජනතාවගේ අති බහුතරයෙහි පූර්ණ සහ කැපවූ හිතවත්කම ගැන අපට විශ්වාස හෙයිනි. දීර්ඝ කාලයක් තිස්සේ ධනපති ක්‍රමයෙන් ''අධ්‍යාපනය'' ලබා, විනය සම්පන්න වූ (අප ධනපති ක්‍රමයේ පාසැලෙහි උගෙන ගැනීමට ගියේ නිකම්ම නොවේ), පංති විඥානයෙන් හෙබි කම්කරුවන්, කම්කර මිලීෂියා හමුදවක් ඇති කර (එය අප්‍රමාදවම විශාල කිරීමට ආරම්භ කිරීමෙහි) එය මුළු මහත් ජනතාවමඅ ාලිංගනය කරගත් මිලීෂියා හමුදවක් වන සේ ක්‍රමික ලෙස විශාල කිරීමෙහි සමත් කම්කරුවන් අපට ඇති නිසා, එවැනි යනත්‍රයක් නිර්මාණය කිරීමෙ හැකියාව ඇත්තේ අපට පමණකි. පංති විඥනය ඇති කම්කරුවන් නායකත්වය දිය යුතු අතර, පරිපාලනයේ

කටයුතු සඳහා වැඩ කරන හා පීඩිත මහා ජනකාය යොදවා ගැනීමට ඔවුන්ට හැකිවේ.

නව යන්ත්‍රය එහි ප්‍රථම පියවරයන් ගැනීමේදී, එයට වැරදීම් සිදුවීම නොවැලැක්විය හැකි බව කීම අවශ්‍ය නොවේ. එහෙත් ගොවි ජනයා ප්‍රවේණිදාස ක්‍රමයේ සිට නැගී විත් තමන්ගේ කටයුතු පාලනය කිරීමට පටන් ගත් විට ඔවුන්ට වැරදීම් නොසිදුවී ද? ජනතාවට තමන්ගේ කටයුතු පාලනය කර ගැනීමට සහ වැරදි සිදු වීම වැලැක්වීමට උගෙන ගැනීම සඳහා ව්‍යවහාරය හැර වෙනත් මාර්ගයක් තිබේ ද? ජනතාව විසින් කෙරෙන නියම ස්වයං-පාලනය වෙතට වහාම යාම හැර ඒ සඳහා වෙනත් මාර්ගයක් තිබේ ද? දැන් කළ යුතු ප්‍රධාන දෙය නම්, ස්වකීය සමාජ-තත්ත්වයම නිසා ප්‍රාග්ධනයෙන් සම්පූර්ණයෙන්ම යැපෙන තත්ත්වයේ සිටින විශේෂ නිලධාරීන් පමණක් රාජ්‍ය පාලනයෙහි සමත් වන්නේය යන පූර්වමතික ධනපති බුද්ධිවාදී මතය අත් හැර දැමීමය. කළයුතු ප්‍රධාන දෙය නම්, ධනපති නිලධාරීන් සහ ''සමාජවාදී'' ඇමැතිවරුන් පැරණි තාලයට ආණ්ඩු කිරීමට උත්සාහ කරන නමුත්, එය කරගත නොහැකිව, ගොවිජන රටක ගොවිජන විප්ලවයකට මුහුණ පා සිටින තත්ත්වය කෙළවරක් කර දැමීමය! කළ යුතු ප්‍රධාන දෙය නම්, පීඩිත හා වැඩ කරන ජනතාවට ඔවුන්ගේම ශක්තිය ගැන විශ්වාස ඇති කරන හැඟීමක් ඔවුන් තුළ ඇති කිරීමය. දුප්පතුන්ගේ යහපත පිණිස පාන්, සියළු ආහාර වර්ග, කිරි, වස්ත්‍ර, ආදිය නිසිලෙස හා ඉතාමත් තදබල පාලනයක් හා සංවිධානයක් අනුව බෙදහැරීම සහතික කිරීම ඔවුන්ටම කළ හැකි බවත්, ඔවුන්ම එය කළ යුතු බවත්, ව්‍යවහාරයෙන් ඔවුන්ට ඔප්පු කිරීමය. මෙය කරතොත් මිස රුසියාව බිඳ වැටීමෙන් හා විනාශයෙන් මුදගත නොහැකිය. එසේ වුවද, පරිපාලන කටයුතු නිර්ධන පංතිකයන්ට සහ අර්ධ-නිර්ධන පංතිකයන්ට භාර දීමට ගන්නාවූ, අවංක, එඩිතර, විශ්වීය පියවර නිසා ජනතාව අතර කොතරම් නම් අභූත පූර්ව, විප්ලවවාදී උද්වේගයක් දැල්වී යන්නේද යත්, ආපදා තත්ත්වයට විරුද්ධව සටන් කරන ජනතා බලවේගයන් වැඩි වී ගොස්, අපගේ පටු, පැරණි නිලධාරිවාදී බලවේගයන්ට නොකළහැකි සේ පෙනුනු බොහෝ දේ කිරීමට, ධනපතියන්, ප්‍රභූන්, නිලධාරීවාදීන් සඳහා නොව, දඬුවම් ලැබීමේ බිය නිසා නොව, තමන්ම සඳහා වැඩ කිරීමට පටන් ගන්නා, දශලක්ෂ සංඛ්‍යාත ජනතාවන්ට හැකි වන්නේය.

* * *

''බොල්ෂෙවික්වරුන් සහ බලය පිළිබඳ ප්‍රශ්නය'' යන සිරස්තලය යටතේ, සැප්තැම්බර් 27 දින ''නෝවයා ෂිස්න්'' අංක 138 කලාපයෙහි බසාරොව් සහෝදරයා විසින් ලියන ලද ලිපියෙන් අසාමාන්‍ය තරම් බලවත්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ලෙස හා අදක්ෂ ලෙස මතු කර තිබෙන මධ්‍යගතවාදය පිළිබඳ ප්‍රශ්නයද, රාජ්‍ය යන්ත්‍රය හා සම්බන්ධ ප්‍රශ්නයට අදාළ වන්නේය.

බසාරොව් සහෝදරයා පහත සඳහන් පරිදි තර්ක කරයි: සෝවියට් සභා බොහෝ තැන්වල "පූර්ණ බලය" භුක්ති විඳින නමුත්, "ආර්ථික විනාශයට විරුද්ධව සටන් කිරීමේදී සතුටු දයක ප්‍රතිඵල ලෙසට හැඳින්විය හැකි ආකාරයේ කිසිවක් කිරීමට ඒවාට නොහැකි වී තිබෙන" බව සත් මාසයක අත් දැකීමෙන් පෙනී ගොස් ඇති නිසා සහ "සාන්ත පීටර්ස්බර්ග් විධායක කාරක සභාවේ ආර්ථික දෙපාර්තුමේන්තුවට අයත් දුසිම් ගණන් සහ සිය ගණන් ලේඛණවලින් සනාථ වී ඇති නිසා, "සෝවියට් සභා රාජ්‍ය ජීවිතයේ සියළු ක්ෂේත්‍රයන්ටම සුදුසු යන්ත්‍රයක් නොවේ." අවශ්‍යව තිබෙන්නේ, "නිෂ්පාදන අංශ අනුව බෙදන ලද, එක් එක් අංශයෙහි දැඩි මධ්‍යගත භාවයක් ඇති සහ තනි දේශ ව්‍යාප්ත මධ්‍යස්ථානයකට යටත් කළ" යන්ත්‍රයකි. එනිසා, "සැලැස්මක් ඇති අයට බොල්ෂෙවික්වරු කොතරම් සමච්චල් කරතත්..." එය "පැරණි යන්ත්‍රය වෙනුවට අළුත් එකක් ආදේශ කිරීම නොව, හුදෙක්ම එය ප්‍රතිසංස්කරණය කිරීම පිළිබඳ ප්‍රශ්නයක් බව" පිළිගැනීමට තරම් ඔබ කාරුණික වනු ඇත.

බසාරොව් සහෝදරයාගේ මෙම තර්ක සියල්ලම පුදුම එළවන තරම් අර්ථ විරහිතය. ධනපති පංතියේ තර්ක දෝංකාර දෙවන එයින් පිළිබිඹු වන්නේ ඔවුන්ගේ පංති අදහස්ය.

ඇත්ත වශයෙන්ම රුසියාවේ කුමණ තැනක හෝ කිසිම කලෙක හෝ සෝවියට් සභා "පූර්ණ බලය" භුක්ති වින්දේයයි කීම (ධනපතියන්ගේ ආත්මාර්ථකාමී පංති බොරුවක් අනුප්‍රාසය කිරීමක් නොවේ නම්) ඉඳුරාම විකාරයක් වේ. පූර්ණ බලය යනුවෙන් අදහස් වන්නේ ඉඩම් සියල්ලම, බැංකු සියල්ලම සහ පැක්ටරි සියල්ලම පාලනය කිරීමට ඇති අයිතියය. දේශපාලනය හා ආර්ථිකය අතර සම්බන්ධය ගැන වූ ඉතිහාසමය හා විද්‍යාත්මක කරුණු ගැන යම්තමින් හෝ දන්නා පුද්ගලයෙකුට මෙම "සුළු" කාරණය "අමතක විය" නොහැකිය.

සෝවියට් සභාවලට බලය නොදෙන ලෙසත්, ඒවා ගන්නා සෑම වැදගත් පියවරක්ම කඩා කප්පල් කරන ලෙසත්, ඒ අතර, ආණ්ඩුව තමන්ගේම අතෙහි තබා ගන්නා ලෙසත්, ඉඩම්, බැංකු ආදිය පාලනය කිරීමේ බලය තබාගන්නා, ලෙසත්, ඊළඟට විනාශය සම්බන්ධයෙන් දෝෂාරෝපනය සෝවියට් සභා මත දමන ලෙසත් ධනපති පංතිය උපදෙස් දෙයි! සභාගයේ ඛේද ජනක අත්දැකීමෙහිම සම්පූර්ණ අර්ථය මෙය ය.

සෝවියට් සභාවලට කිසිම කලෙක පූර්ණ බලය තිබුණේ නැත. එනිසා, ඒවා ගන්නා පියවරයන් නිසා තාවකාලික සහනයක් ඇති වීමට හා වියවුල වැඩි වීමට වඩා ප්‍රතිඵලයක් ඇති විය නොහැකි විය.

අවබෝධයෙන්ම මධ්‍යගතවාදීන් වන බොල්ෂෙවික්වරුන්ට, ඔවුන්ගේ පක්ෂයේ වැඩ පිළිවෙළ හා සියළු උපක්‍රම අනුව මධ්‍යගතවාදීන් වන බොල්ෂෙවික්වරුන්ට, මධ්‍යගතභාවයේ අවශ්‍යකම ඔප්පු කිරීමට දරන ප්‍රයත්නය විවෘත දොරක් බලෙන් ඇරීම වැනි දෙයකි. "නෝවයා ෂිස්න්" ලේඛකයන්ගේ "දේශ ව්‍යාප්ත" අදහස ගැන ඇගේ සමච්චලය තේරුම් ගැනීමට නොහැකි වීම නිසාම, ඔවුහු ඔවුන්ගේ කාලය නාස්ති කර ගනිති. තවද "නෝවයා ෂිස්න්" ජනයාට මෙය වටහා ගත නොහැකිවී තිබෙන්නේ ඔවුන් පංති අරගලයේ දහම බරපතල ලෙස පිළි නොගෙන එය ගැන කථා කිරීමෙහි පමණක් යෙදී සිටින හෙයිනි. පංති අරගලය ගැන තමන් කට පාඩම් කරගත් වචන පුනරුච්චාරණය කරමින් ඔවුහු "පංතිවලට ඉහළින් සිටින දෘෂ්ටි කෝණය" වෙතම නිතරම ලිස්සා යති. එය න්‍යායික වශයෙන් හාස්‍ය ජනකය. ව්‍යවහාරයෙන් ප්‍රතිගාමීය. තවද, ඔවුන් මෙසේ ධනපති පංතියට වලිගය වැනීම, "දේශ ව්‍යාප්ත" සැලැස්මක් ලෙසට ඔවුන් හඳුන්වනු ලැබේ.

ප්‍රිය මිනිසුනි, රාජ්‍යය යනු පංති සංකල්පයකි. රාජ්‍යය යනු එක පංතියක් තවත් පංතියකට විරුද්ධව ක්‍රියාත්මක කරන ප්‍රචන්ඩභාවයේ අවියකි. එය ධනපති පංතිය විසින් නිර්ධන පංතියට විරුද්ධව ක්‍රියාත්මක කරන ප්‍රචණ්ඩභාවයේ අවියක්ව පවතින තාක් කල්, නිර්ධන පංතියට තිබිය හැක්කේ එක සටන් පාඨයක් පමණකි: රාජ්‍යය විනාශ කරනු, එහෙත් රාජ්‍යය නිර්ධන පංති රාජ්‍යයක් වන විට, එය නිර්ධන පංතිය විසින් ධනපති පංතියට විරුද්ධව ක්‍රියාත්මක කරන ප්‍රචණ්ඩ භාවයේ අවියක් වන විට, අපි ශක්තිමත් රාජ්‍ය බලයකටත් මධ්‍යගතභාවයටත් කොන්දේසි විරහිතව පක්ෂ වන්නෙමු.

වඩාත් පොදුජන භාෂාවෙන් කියතොත්, අපි "සැලසුම්වලට" සමච්චල් නොකරන්නෙමු. අප සමච්චල් කරන්නේ, "කම්කරු පාලනය" බැහැර කිරීමෙන්, නිර්ධන පංතියේ ආඥාදායකත්වය බැහැර කිරීමෙන්, බසාරොව් සහ සමාගම ධනපති පංති ආඥාදායකත්වයට පක්ෂ වන බව වටහා ගැනීමට ඇති ඔවුන්ගේ අසමර්ථකම ගැනය. මැද මාවතක් නොමැත. මැද මාවතක් යනු සුළු ධනපති ප්‍රජාතන්ත්‍රවාදියාගේ නිෂ්ඵල සිහිනයකි.

සෝවියට් සභා මධ්‍යගත කිරීමට විරුද්ධව, ඒවා ඒකාබද්ධ කිරීමට විරුද්ධව එකම මධ්‍යම මණ්ඩලයක්වත්, එකම බොල්ෂෙවික්වරයෙක්වත් කිසි කලෙකත් තර්ක කර නොමැත. නිෂ්පාදනයේ සෑම අංශයකම පැක්ටරි කාරක සභා ඇති කිරීමට හෝ ඒවා මධ්‍යගත කිරීමට හෝ අපි කිසි කෙනෙක් විරුද්ධ නොවන්නෙමු. බසාරොව්ට ඉලක්කය අසලකින්වත් යා නොහැකි වී තිබේ.

අප සිනා වන්නේ, සිනා වූයේ හා ඉදිරියේ දීත් සිනාසෙන්නේ "මධ්‍ය-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ගතවාදයට'' හා ''සැලසුම්වලට'' නොව ප්‍රතිසංස්කරණවාදයට ය. මක්නිසාදයත්, සභාගයේ අත්දැකීමෙන් පසුව ඉදිරිපත් කරන ඔබගේ ප්‍රතිසංස්කරණවාදය අන්ත මෝඩකමක් වන හෙයිනි. තවද, ''යන්ත්‍රය වෙනුවට අළුත් එකක් ආදේශ කිරීම නොව, එය ප්‍රතිසංස්කරණය කිරීම'' යයි කීමෙහි අර්ථය ප්‍රතිසංස්කරණවාදියෙකු වීමය, විප්ලවවාදියෙක් නොව ප්‍රතිසංස්කරණවාදී ප්‍රජාතන්ත්‍රවාදියෙකු වීමය. ප්‍රතිසංස්කරණවාදය යන්නෙන් අදහස් වන්නේ පාලක පංතියෙන් ලැබෙන සහනයන්ට වඩා දෙයක් නොවේ. ඉන් අදහස් වන්නේ එය පෙරලා දැමීම නොවේ. එය සහනයන් දෙන නමුත් බලය එය අතෙහිම රැඳී පවතින්නේය.

සභාගයේ හය මාසය තුළ අත්හද බලන ලද්දේද හරියටම මෙයය.

අප සිනාසෙන්නේ මෙයටය. පංති අරගලයේ දහම තරයේ වටහා ගැනීමට අසමත් වූ බසාරොව්, ''අන්න හරි, අන්න හරි, අපි කිසිසේත් ප්‍රතිසංස්කරණයට විරුද්ධ නොවෙමු, දේශ ව්‍යාප්ත පාලනයට කම්කරුවන් සහභාගි වීම ගැන අපි පක්ෂ වෙමු, අපි සම්පූර්ණයෙන්ම එයට එකඟ වෙමු,'' යනුවෙන් කණ්ඩායමක් ලෙසට ගායනා කරන ධනපතියන්ට තමන් හසුවීමට ඉඩ තබයි. එසේම, ඒ හොඳ බසාරොව් වාස්තවික වශයෙන් ධනපතියන්ගේ ගීයට තාලය අල්ලයි.

පංති සටන ගහනව පවතිද්දී ''මැද'' ප්‍රතිෂ්ඨාවක් ගැනීමට උවමනා කරන පුද්ගලයන් නිතරම කටයුතු කළේත්, කටයුතු කරන්නේත් මේ ආකාරයටය. ''නෝවයා ෂිස්න්'' ලේඛකයන්ගේ ප්‍රතිපත්තිය එසේ විකට ස්වභාවයෙන් ධනපති පංතිය සහ නිර්ධන පංතිය අතර සදකාලික ලෙස එහා මෙහා වැනීමක් බවට පත්ව තිබෙන්නේ ඔවුන් පංති අරගලය ගැන වටහා ගැනීමට අසමත් හෙයිනි.

ප්‍රිය පුරවැසියනි, ''සැලසුම්'' සම්බන්ධයෙන් උනන්දුව කටයුතු කරන්න. එය දේශපාලනය නොවේ. එය පංති අරගලය නොවේ. මෙහිදී ඔබ කරන දෙය ජනතාවට ප්‍රයෝජනවත් විය හැකිය. ඔබගේ පත්‍රයෙහි වැඩ කරන ආර්ථික විද්‍යාඥයින් බොහෝ දෙනෙක් ඔබට ඇත. නිෂ්පාදනය සහ බෙදා හැරීම මෙහෙයවීම හා සම්බන්ධ ප්‍රශ්න ගැන කටයුතු කිරීමට කැමති ඒ ඉන්ජිනේරුවරු හා වෙනත් අය සමග එක්සත් වන්න. ඔබගේ මහා ''යන්ත්‍රයෙහි'' (ඔබගේ පත්‍රයෙහි) මැද පිටුව රුසියාවේ භාණ්ඩ නිෂ්පාදනය සහ බෙදා හැරීම ගැන, බැංකු, සම්මේල යනාදිය ගැන නියත කරුණු පිළිබඳ ප්‍රායෝගික අධ්‍යයනයක් කිරීම ආදිය සඳහා යොදන්න. ඔබගේ කටයුතු ජනතාවට ප්‍රයෝජනවත් විය හැක්කේ ඒ ආකාරයෙනි. බැංකු දෙකක් අතර වාඩි වීමේ පිළිවෙත ජනතාවට විශේෂයෙන් හානිදයක නොවනු ඇත්තේ එසේ කළ විටය. ''සැලසුම්'' සම්බන්ධව

එසේ වැඩ කළ විට කම්කරුවන්ගෙන් සමච්චලය නොව ප්‍රශංස ලැබෙනු ඇත.

නිර්ධන පංතිය ජයග්‍රහණය කළ පසු එය පහත සඳහන් පරිදි කටයුතු කරනු ඇත. සැලැස්මක් සකස් කිරීම, එය හරි වැරදි බැලීම, ශ්‍රම පිරිමැස්මේ මධ්‍යගත ක්‍රම සකසා ගැනීම, පාලනය සඳහා සරලතම, වියදම් අඩුම, පහසුතම සහ විශ්වීය පියවරයන් හා ක්‍රම සැකසීම ආදිය සඳහා කම්කරු සංවිධානවල පාලනය යටතේ වැඩ කිරීමට ආර්ථික විද්‍යාඥයින්, ඉන්ජිනේරුවරුන්, කෘෂි විද්‍යාඥයින් යොදනු ලැබේ. මෙම වැඩ කිරීම සඳහා ආර්ථික විද්‍යාඥයින්ට, සංඛ්‍යා විද්‍යාඥයින්ට සහ කාර්මික ශිල්පීන්ට අපි හොඳ වැටුප් ගෙවන්නෙමු... එහෙත් ඔවුන් මෙම කාර්යයන් අවංක ලෙස සහ මුළුමනින්ම වැඩ කරන ජනතාවගේ යහපතට හේතුවන ලෙස නොකළහොත් අපි ඔවුනට අනුභව කිරීමට කිසිවක් නොදෙන්නෙමු.

අපි මධ්‍යගතභාවයට සහ ''සැලැස්මට'' පක්ෂ වන්නෙමු. එහෙත් අප පක්ෂ වන්නේ නිර්ධන පංති රාජ්‍යයේ වූත්, දුප්පත් ජනතාවගේ, වැඩ කරන ජනතාවගේ, සූරාකනු ලබන්නන්ගේ යහපත පිණිස සහ සූරාකන්නන්ට විරුද්ධව නිෂ්පාදනය කිරීමේ කටයුතු මෙහෙයවීම සඳහා වූත්, මධ්‍යගතභාවයට හා සැලැස්මටය. අපට එකඟ විය හැක්කේ ''දේශ ව්‍යාප්ත'' යන වචනයේ එක තේරුමකට පමණකි. එනම්, ධනපතියන්ගේ ප්‍රතිරෝධය බිඳ දැමීමේද, ජනතාවගෙන් බහුතරයට, එනම්, නිර්ධන පංතිකයන්ට සහ අර්ධ නිර්ධන පංතිකයන්ටත්, කම්කරුවන්ට සහ දුප්පත් ගොවිජනතාවටත් මුළු බලය පැවරීමේද අර්ථයෙනි.

* * *

පස්වැනිව ඉදිරිපත් කර ඇති කරුණ නම්, ''තත්වය අතිශයින්ම සංකීර්ණ'' නිසා බොල්ෂෙවික්වරුන්ට බලය රැකගත හැකි නොවන බවය.

ඔහෝ ප්‍රඥවන්ත මිනිස්සු! සමහර විට ඔවුන් විප්ලවයට එකඟව හිත හදගනු ඇත්තේ ''තත්වය අතිශයින්ම සංකීර්ණ'' නොවෙතොත් පමණකි.

එවැනි විප්ලව කවදාවත් සිදු නොවේ. එවැනි, විප්ලවයක් සඳහා කරන සුසුම් ලෑම් ධනපති බුද්ධිමතාගේ අඥෝනාවන්ට වඩා කිසිම අර්ථයක් දෙන්නක් නොවේ. බෙහෙවින් සංකීර්ණ නොවන සේ පෙනෙන තත්වයන් යටතේ විප්ලවයක් ආරම්භ වී ඇතත්, විප්ලවයේ සංවර්ධනය නිසාම නිතරම අතිශයින් සංකීර්ණ තත්වයක් නිර්මාණය වන්නේය. විප්ලවයක්, නියම, ගැඹුරු විප්ලවයක්, මාක්ස්ගේ වචනය යොදතොත් ''ජනතා'' විප්ලවයක්[90] යනු, පැරණි සමාජ ක්‍රමය අභාවයට යාම සහ නව

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සමාජ ක්‍රමයක් ජනිත වීම පිළිබඳ, එනම්, කෝටි සංඛ්‍යාත ජනතාවන්ගේ ජීවන ක්‍රමය පිළිබඳ වූ ඇදහිය නොහැකි තරම් සංකීර්ණ සහ වේදනා සහගත ක්‍රියාදමයකි. සිවිල් යුද්ධයකින් තොරව ඉතිහාසයේ ශ්‍රේෂ්ට විප්ලවවලින් එකක්වත් සිදුවී නැත. ''අතිශයින්ම සංකීර්ණ තත්ත්වයක්'' නොමැති සිවිල් යුද්ධයක් ගැන සිතන්නට හැක්කේ ''මජ්ලර්කාරයාට[91] පමණකි.

තත්ත්වය අතිශයින්ම සංකීර්ණ නොවී නම්, එහි විප්ලවයක් විය නොහැකිය. ඔබ වෘකයනට බිය නම් වනාන්තරයට නොයන්න.

පස්වැනි කරුණෙහි සාකච්ඡා කිරීමට දෙයක් නොමැත. එහි ආර්ථික, දේශපාලන හෝ වෙනත් අර්ථයක් නැත්තේය. එහි අන්තර්ගතව ඇත්තේ විප්ලවයෙන් වික්ෂෝපයට සහ බියට පත් මිනිසුන්ගේ බලවත් ආශාව පමණකි. මෙම ආශාව කෙබඳුද යනු දක්වීම පිණිස මා පෞද්ගලිකව අත් දුටු සිදුවීම් දෙකක් ගැන සඳහන් කිරීමට මෙම අවසරය ගන්නෙමි.

ජූලි දිනවලට මඳ කලකට පෙර ධනවත් ඉන්ජිනේරුවෙකු සමග කථා කිරීමේ අවස්ථාවක් මට ලැබුණි. මෙම ඉන්ජිනේරුවා වරක් විප්ලවවාදියෙක් වූ අතර, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරය තුළ සිටියේය. එ කාලයේදී ඔහු බොල්ෂෙවික් පක්ෂයේ සාමාජිකත්වය පවා දැරුවේය. දැන් ඔහු කලබලකාරී සහ නොහික්මවිය හැකි කම්කරුවන් ගැන බියෙන් හා කෝපයෙන් ඇලලී සිටියි. ''මොවුන් යටත් පිරිසෙයින් ජර්මන් කම්කරුවන් වගේවත් නම් (ඔහු උගත් මිනිසෙකි. එසේම විදේශයට ගොස් ඇත); සාමාන්‍ය වශයෙන් සමාජ විප්ලවය වැලැක්විය නොහැකි බව මම දනිමි. නමුත්, යුද්ධය නිසා මෙහි කම්කරුවන්ගේ තත්ත්වය පිරිහී ගොස් තිබෙන විට... එය විප්ලවයක් නොව පාතාලයකි'' යි ඔහු කීවේය.

දුම්රිය ස්ථානයට පිවිසෙන ජර්මන් සීඝ්‍රගාමී දුම්රියක් ලෙසට සාමකාමී, කලබල රහිත, මෘදු සහ නියත ආකාරයෙන් ඉතිහාසය විසින් සමාජ විප්ලවය ඇති කරනු ලැබේ නම්, ඔහු එය භාර ගැනීමට සතුටුය. තැන්පත් කොන්දොස්තරයෙක් දුම්රිය මැදිරියේ දොර හැර ''සමාජ විප්ලව දුම්රියපල! Alle Aussteigen (සියළු දෙනාම මාරුවන්න!)'' යනුවෙන් කියනු ඇත. එසේ වන්නේ නම්, ටිට ටිට්විලා යටතේ ඉන්ජිනේරුවකු වශයෙන් ඔහු දරන තත්ත්වය කම්කරු සංවිධාන යටතේ එම තත්ත්වයට මාරු කිරීමට ඔහු කැමති වනු ඇත.

ඒ පුද්ගලයා වැඩ වර්ජන දැක ඇත්තේය. ඉතාමත් සාමකාමී කාලවල පවා වුව, ඉතාමත් සාමාන්‍ය වැඩ වර්ජනවලදී පවා මොන තරම් නම් ආවේගයේ කුණාටුවක් ඇති වන්නේද යනු ඔහු දන්නේය. එපමණක් නොව, අති විශාල රටක වැඩ කරන ජනයා සියළු දෙනාම පංති සටනෙන් නැගී සිටින විට, ශත වර්ෂ ගණන් තිස්සේ ඉඩම් හිමියන්ගෙන් වධ වේදනා වින්ද සහ දශක ගණන් තිස්සේ ධනපතියන්ගේත්, සාර්ගේ නිලධාරීන්ගේත් කොල්ලයට හා පීඩනයට බඳුන් වූ ලක්ෂ සංඛ්‍යාත ජනතාව, යුද්ධය හා සූරාකෑම නිසා මරු නොතකන තත්ත්වයට පත්වූ විට මෙම කුණාටුව ඊට වඩා කෝටි වාරයක් රෞද්‍රවන බවද ඔහු දන්නේය. ඔහුට මේ සියල්ලම ''න්‍යායික වශයෙන්'' වැටහෙන්නේය. ඔහු මෙයට පක්ෂ වන්නේ වචනයෙන් පමණකි. ''අතිශයින්ම සංකීර්ණ තත්ත්වය'' නිසා ඔහු ඉඳුරාම සංත්‍රාසයට පත්වී සිටියි.

ජූලි දිනවලට පසුව කෙරෙන්ස්කි ආණ්ඩුව ඉතාමත් සැලකිලිමත් ලෙස මා කෙරෙහි අවධානය දක්වීමෙන් මට කරන ලද ගෞරවය නිසා මට රහසිගතව කටයුතු කරන්නට සිදුවිය. අප වැනි අයට රැකවරණය දුන්නේ කම්කරුවන්ය. පෙට්‍රොග්‍රෑඩයේ ප්‍රත්‍යන්ත කම්කරු පංති පෙදෙසක කුඩා කම්කරු පංති නිවසක සවස ආහාරය මෙහෙය වනු ලැබේ. ගෘහිණිය පාන් මේසය මත ගෙනවුත් තබන්නීය. එවිට ගෙහිමියා මෙසේ කියන්නේය: ''බලන්න, මොන තරම් හොඳ පාන් ද? දැන් අපට නරක පාන් දීමට තරම් 'ඔවුහු' එඩිතර නොවෙති. නමුත්, අප සිටියේ පෙට්‍රොග්‍රෑඩයේදී අපට නැවතත් කිසි කලෙකත් හොඳ පාන් ලැබේ දැයි යන්න ගැන සිතීම පවා අත්හරින තත්ත්වයකය.''

ජූලි දින සම්බන්ධයෙන් වූ මෙම පංතිමය ඇගැයීමෙන් මම පුදුමයට පත්වීමි. මගේ සිත ගැටෙමින් තිබුණේ එම සිදුවීම්වල දේශපාලන වැදගත්කමත්, සාමාන්‍ය සිදුවීම් මාලාව සම්බන්ධයෙන් එමගින් ඉටු වූ කාර්ය කොටස තක්සේරු කිරීමත්, ඉතිහාසයේ මෙම වංගුව ඇති වීමට හේතු වූ තත්ත්වය විග්‍රහ කිරීමත්, වෙනස් වූ තත්ත්වයට ගැලපෙන සේ අපගේ සටන්පාඨ සකස් කළ යුතු සහ අප පක්ෂ යන්ත්‍රය හැඩ ගසා ගත යුතු ආකාරයත් වටා ගෙතුනු කරුණු ගැනය. අගහිඟ කම නුපුරුදුව සිටි මා, පාන් ගැන කල්පනා කළේ නැත. පාන් නිතරම ලැබෙන දෙයක් ලෙසට, එය ලේඛකයා කරන වැඩවලින් ලැබෙන අතුරු නිෂ්පාදනයක් හා සමාන ලෙසට සැලකීමට පුරුදුව සිටියෙමි. සිත සියල්ලෙහිම පදනම වෙත, පාන් සඳහා පංති අරගලය වෙත ළඟාවන්නේ, ඉතාමත් සංකීර්ණ සහ ඇද කුද සහිත මාර්ගයක් ගන්නා දේශපාලන විග්‍රහය මගිනි.

එහෙත් පීඩිත පංතියේ මෙම සාමාජිකයා, හොඳ වැටුපක් ලබන බුද්ධිමත් කම්කරුවෙක් වුවත්, චමත්කාර ජනක තරම් සරල හා ඍජු ශෛලියකින්ද, බුද්ධිමතුන්වන අපට අහසේ තරු සේ දුරස්තර වන හා මවිත කර තරම් පැහැදිලි අවබෝධයකින් හා දැඩි අධිෂ්ඨානයකින්ද, ගොනා අඟින් ගන්නා කලෙක මෙන් ප්‍රශ්නය වෙත ළඟා වන්නේය. මුළු ලෝකයම කඳවුරු දෙකකට බෙදී තිබේ: ''අප,'' එනම්, වැඩ කරන ජනයා සහ ''ඔවුන්'', එනම් සූරා කන්නන්ය. සිදු වී තිබුණු දෙය ගැන

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කිසිම ඇකිළීමක් පැකිළීමක් ඇත්තේම නැත. එය හුදෙක්ම ශ්‍රමය සහ ප්‍රාග්ධනය අතරේ කෙරෙන දීර්ඝ අරගලයේ එක සටනක් පමණකි. ගස් කපා හෙළන විට අතු කැබලි විසි වේ.

"විප්ලවයෙන් ඇති වන මෙම අතිශයින් සංකීර්ණ තත්ත්වය මොනතරම් වේදනා සහගත දෙයක්ද." ධනපති බුද්ධිමතා සිතන්නේ හා හඟින්නේ ඒ ලෙසටය.

"අපි 'ඔවුන්' අල්ලා පොඩියක් මිරිකුවෙමු. ඉස්සර මෙන් අපට ලොකුකම් පෙන්වීමට තරම් ඔවුන් නැවතත් ආවොත් මිරිකා දමන්නෙමු. එසේම, සම්පූර්ණයෙන්ම එළියටම තල්ලු කර දමන්නෙමු" කම්කරුවා සිතන්නේ හා හඟින්නේ එලෙසටය.

* * *

හවැනි සහ අවසාන කරුණ මෙසේය: "නිර්ධන පංති ආඥාදායකත්වය පමණක් නොව, ඒ සමගම මුළු මහත් විප්ලවයම අතුගා දමනු ඇති සතුර බලවේගයන්ගේ සියළුම බලපෑම්වලට ප්‍රතිරෝධය දැක්වීමට නුපුළුවන් වනු ඇත."

මහත්වරුනි අප බියගැන්වීමට උත්සාහ නොගන්න. ඔබට එය කළ නොහැකි වනු ඇත. අපි මෙම සතුරු බලවේගයන් සහ ඒවායේ කර්නිලව්වාදී බලපෑම දුටුවෙමු (කෙරෙන්ස්කි ආණ්ඩුව එයින් කිසිසේත් වෙනස් නොවේ). නිර්ධන පංතිය සහ දුප්පත් ගොවිජනතාව විසින් කර්නිලව් කල්ලිය අතුගා දමන ලද්දේ කෙසේද යනුත්, ධනපතියන්ගේ ආධාරකරුවන්ගේ සහ විප්ලවයට බලවත් "විරුද්ධත්වයක්" දැක්වූ, බොහෝ පොහොසත් කුඩා ඉඩම් හිමියන් ස්වල්ප දෙනාගේ තත්ත්වය කොතරම් කණගාටුදායක සහ අසරණ වීද යනුත් කවුරුත් දුටු අතර, ජනතාවට මතකය. ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය (කැරළිකාර ගොවීන්ට විරුද්ධව ගන්නා ලද "යුද්ධමය පියවරවල" ආරක්ෂාව යටතේ කැඳවන ලදුව) රැස්වන තෙක් "ඉවසන ලෙසත්", එතෙක් කෙරෙන්ස්කි (එනම්, කර්නිලව්) සහ ව්‍යාජ ට්සෙරතේලි -බුලීගින් දූමා සභාව "පිළිගන්නා" ලෙසත් සැප්තැම්බර් 30 දින "දියල නරෝද" කම්කරුවන් උනන්දු කරවීය. ඒ අතරම, එය උගුර කැඩෙන තෙක්ම "නෝවයා ෂීස්න්" පත්‍රයේ හයවැනි කරුණ නද දෙවන්නේය: කෙරෙන්ස්කි ආණ්ඩුව කුමණ තත්ත්වය හමුවේ වුවද (සෝවියට් සභාවල පාලනයට, කම්කරුවන්ගේ සහ ගොවිජනයාගේ පාලනයට) යටත් නොවනු ඇත. (යුදෙව් සංහාරකයින්ට සහ යුදෙව් විරෝධීන්ටත්, රාජාණ්ඩුවාදීන්ට හා කැඩෙට් වරුන්ටත් දෙවැනි වීමට අකැමති "දියල නරෝද" සෝවියට් සභාවල, කම්කරුවන්ගේ හා ගොවිජනයාගේ පාලනය "ට්‍රොට්ස්කිගේ සහ ලෙනින්ගේ" පාලනය ලෙසට හඳුන්වයි. සමාජවාදී -විප්ලවවාදීන් කොතරම් දුර යත්දැයි එයින් පෙනේ!)

එහෙත් "නෝවයා ෂීස්න්" පත්‍රයටවත්, "දියල නරෝද" පත්‍රයටවත්, පංති විඥානය ඇති කම්කරුවන් බිය ගැන්විය හැකි නොවේ. "කෙරෙන්ස්කි ආණ්ඩුව කුමණ තත්ත්වය හමුවේ වුවද යටත් නොවනු ඇත" යයි ඔබ කියන්නෙහිය. වඩාත් සරල ලෙස, නොවලහා සහ පැහැදිලි ලෙස කියතොත්, ඔබ කියන්නේ එය නැවතත් කර්නිලව් කැරැල්ල ඇති කරන බවය. එසේම "දියල නරෝද" පත්‍රයේ මහත්වරු එය "සිවිල් යුද්ධයක්" වනු ඇතැයිද "අනාගතයේ විය හැකි භයානක දෙයක්" යයිද කීමට තරම් එඩිතර වෙති!

නැත මහත්වරුනි, කම්කරුවන් ඔබට නොරැවටෙනු ඇත. එය සිවිල් යුද්ධයක් නොවනු ඇත. එය අතලොස්සක් කර්නිලව්වාදීන්ගේ සම්පූර්ණයෙන්ම අසාර්ථක කැරැල්ලක් වනු ඇත. ජනතාවට "යටත් වීම ප්‍රතික්ෂේප කිරීමට" සහ කර්නිලව් මිනිසුන්ට විබෝර්ග්හිදී සිදු වූ දෙය වඩාත් පුළුල් ලෙස සිදුවන තත්ත්වයක් ඇති කිරීමට ඔවුනට උවමනා නම්, සමාජවාදී-විප්ලවවාදීන්ට අවශ්‍ය එය නම්, සමාජවාදී-විප්ලවවාදී පක්ෂයේ සාමාජික කෙරෙන්ස්කිට අවශ්‍ය එය නම්, ඔහු ජනතාවට නොඉවසිය හැකි තත්ත්වයන් ඇති කළා වේ. එහෙත් මහත්වරුනි, මෙයින් කම්කරුවන් සහ සොල්දාදුවන් බිය ගැන්වීමට ඔබට නොහැකි වන්නේය.

මොන තරම් විශාල නිග්‍රහයක්ද? ඔවුහු අළුත් බුලීගින් දූමා සභාවක් අටවා ගත්හ. මෙම ප්‍රෝඩාව මගින්, ඔවුහු ඔවුන්ගේ ආධාරයට ප්‍රතිගාමී සමූපකාරකයන් පිරිසක් සහ ගම්වල කුලාකයන් බඳවා ගත්හ. ඊට අමතරව ධනපතියන් සහ ඉඩම්හිමියන්ද (ඊනියා දේපල හිමි පංති) එකතු කර ගත්හ. ඉන් පසු මෙම කර්නිලව්වාදී කල්ලියේ ආධාරය ඇතිව ජනතාවගේ කැමැත්ත කම්කරුවන්ගේ සහ ගොවි ජනතාවගේ කැමැත්ත ක්‍රියාත්මක වීම වැලැක්වීමට ඔවුහු අදහස් කරති.

ඔවුන් ගොවිජන රටක ඇති කර තිබෙන තත්ත්වය කෙබඳුද යත්, ගහක් පිටාර ගලන කලෙක මෙන් ගොවිජන කැරැල්ල සෑම තැනම පැතිර යන්නේය! ඒ ගැන සිතා බලන්න. ජනගහනයෙන් සියයට 80 ක් ගොවි ජනතාව වන ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවක, ගොවි ජනතාව කැරලි ගසන තත්ත්වයට පත් කර සිටිති... "ඉවසා සිටින" මෙන් සැප්තැම්බර් 30 දින කම්කරුවන්ට අවවාද දීමට තරම් බිය සැක නොමැති වූ මෙම "දියල නරෝද" පත්‍රයටම, චෙර්නොව්ගේ පත්‍රය හා "සමාජවාදී-විප්ලවවාදී" පක්ෂයේ නිල පත්‍රයද වන එයටම, එහි සැප්තැම්බර් 29 දින ප්‍රධාන ලිපියෙන් මෙසේ පිළිගැනීමට සිදුවිය:

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

''මධ්‍යම රුසියාවේ ගම්වල තවමත් බලපවත්වන බන්ධන සම්බන්ධතාවයන් කෙළවරක් කිරීමට මෙතෙක් කිසිම දෙයක් කිරීමට කිසිම දෙයක් කර නොමැති තරම්ය.''

මෙම ''දියල නරෝද'' පත්‍රයම එහි සැප්තැම්බර් 29 දින ප්‍රධාන ලිපියෙහි මෙසේ කියයි: ''විප්ලවවාදී ඇමතිවරු'' අනුගමනය කරන ක්‍රම තුළ ''ස්තලීපින්ගේ මළ හස්තයේ ග්‍රහණය තවමත් බලවත් ලෙස දැනේ.'' වෙනත් වචනවලින් වඩාත් සරල සහ පැහැදිලි ලෙස කියතොත්, කෙරෙන්ස්කි, නිකීතින්, කිෂ්කින් සහ සමාගම එය විසින් ''ස්තලීපින්ලා'' යන නමින් හංවඩු තබනු ලැබේ.

''ස්තාලීපින්ලා'' කෙරෙන්ස්කි සහ සමාගම ගොවිජනතාව කැරලි ගසන තත්ත්වයට පත් කළහ. දැන් ඔවුහු ගොවිජනතාවට විරුද්ධව යුද්ධමය පියවර ගනිමින් සිටිති. දැන් ඔවුහු ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය කැඳවීමෙන් ජනතාව සැනසීමට උත්සාහ කරති. එහෙත් නියමිත සැප්තැම්බර් 17 දිනට ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය රැස්කරන බවට ගරු ගාම්භීර ලෙසට ජූලි මස 8 වැනි දින කළ ප්‍රකාශයෙන් කෙරෙන්ස්කි සහ ටෙසෙරතේලි දැනටමත් වරක් ජනතාව රවටා ඇත. ඊට පසු ඔවුහු තමන් දුන් පොරොන්දු කඩ කර මෙන්ෂෙවික්වර දන්ගේ උපදේස් පවා නොතකා, ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය ඔක්තෝබර් මස අග දක්වා නොව, නොවැම්බර් මස අග දක්වා කල් තැබූහ). දැන් දැන්ම ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය කැඳවීමෙන් ජනතාව සැනසීමට ''ස්තලීපින්ලා'' කෙරෙන්ස්කි සහ සමාගම උත්සාහ ගනිති. ඔවුන් කටයුතු කරන්නේ මෙම කාරණය සම්බන්ධයෙන් දැනටමත් බොරුකියා ඇති අය කෙරෙහි ජනතාවට විශ්වාසය තැබිය හැකි කලෙක මෙනි; දුර බැහැර ගම්වල යුද්ධමය පියවරයන් ගත්, නැතහොත්, එයින් අදහස් වන පරිදි, පංති විඥනය ඇති ගොවීන් හිතුවක්කාරී ලෙස අත් අඩංගුවට ගැනීමට සහ මැතිවරණ වංචා කිරීමට විවෘතවම අනුබල දෙනු ඇති ආණ්ඩුවක් නිසි ලෙස ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලයක් රැස්කරනු ඇතැයි ජනතාවට විශ්වාස කළ හැකි කලෙක මෙනි.

ගොවිජනයා කැරලි ගසන තත්ත්වයට පත් කළ ආණ්ඩුව, දැන් ඔවුනට මෙසේ කීමට තරම් බිය සැක නොමැති ගතියක් පාන්නේය: ''ඔබ 'ඉවසා සිටිය' යුතුය. ඔබ ප්‍රමාදව සිටිය යුතුය. 'යුද්ධමය පියවර' මගින් කැරලිකාර ගොවිජනයා මර්දනය කරන ආණ්ඩුව කෙරෙහි ඔබගේ විශ්වාසය තැබිය යුතුය!''

ජූනි 19 දින ප්‍රහාරයෙන් පසු ලක්ෂ ගණන් රුසියානු සොල්දාදුවන් මරුමුවට පත් කරන දරුණු තත්ත්වයක් ඇති කර තිබේ. යුද්ධය දිග්ගස්සනු ලැබේ. ජර්මන් සේලරුවෝ කැරලි ගසා ඔවුන්ගේ නිලධාරීන් මුහුදට වීසි කර දමති. මෙවැනි තත්ත්වයක් ඇති කර තිබෙන්නේ නොනවත්වාම සාමය ගැන වදන් දෙසාබාන, එහෙත් යුද්ධකාරීන් සියළු දෙනාටම සාධාරණ සාමයක් යෝජනා කිරීමෙන් වලකින අතරය. එසේ වුවත්, කම්කරුවන්ට හා ගොවි ජනතාවටත්, මිය යමින් සිටින සොල්දාදුවන්ටත්, මෙසේ කීමට තරම් බිය සැක නොමැති කමක් පානු ලැබේ. ''ඔබ ඉවසා සිටිය යුතුය.'' ''ස්තලීපින් මිනිසාගේ'', එනම්, කෙරෙන්ස්කිගේ ආණ්ඩුව කෙරෙහි විශ්වාසය තබන්න. තවත් මාසයකට කර්නිලව් සේනා පතියන් කෙරෙහි විශ්වාසය තබන්න. සමහර විට ඒ මාසය තුළ ඔවුන් තවත් සොල්දාදුවන් විසිතිස් දහස් ගණනින් මරුමුවට යවනු ඇත... ''ඔබ ඉවසා සිටිය යුතුය.''

එය ලජ්ජා නැති කමක් නොවේද?

එහෙත්, සමාජවාදී -විප්ලවවාදී මහත්වරුනි, එම පක්ෂයේ සාමාජික කෙරෙන්ස්කි සගයෙනි, සොල්දාදුවන් ඔබට රැවටෙන්නේ නැත.

සෝවියට් ආණ්ඩුව අප්‍රමාදවම සියළු යුද්ධ කාරීන්ට සාධාරණ සාමයක් යෝජනා කරනු ඇති බව සහ එනිසා වහාම යුද්ධ විරාමයක් සහ සීඝ්‍ර සාමයක් ඇති කර ගැනීමට එය සමත් වීමට සියළු ඉඩ කඩ තිබෙන බව දන්නා කම්කරුවන් සහ ගොවීන්, එක දිනක් හෝ, අතිරේකව එක පැයක් හෝ, කෙරෙන්ස්කි ආණ්ඩුව තබා නොගනු ඇත.

සෝවියට් සභාවල කැමැත්තට විරුද්ධව එක දිනක් හෝ, අතිරේක එක පැයක් හෝ බලයේ රැඳී සිටීමට කෙරෙන්ස්කි ආණ්ඩුවට, එනම්, ගොවිජන කැරැල්ල මර්දනය කිරීමට යුද්ධමය පියවර යොදා ගන්නා ඒ ආණ්ඩුවට ඉඩ නොදීමට අපගේ ගොවිජන හමුදාවේ සොල්දාදුවන් වග බලා ගන්නවා ඇත.

නැත, සමාජවාදී-විප්ලවවාදී මහත්වරුනි, එම පක්ෂයේ සාමාජික කෙරෙන්ස්කි සගයෙනි, කම්කරුවන් සහ ගොවි ජනයා තවදුරටත් ඔබට රැවටෙන්නේ නැත.

* * *

''නෝවයා ෂීස්න්'' මරණීය බියට පත් කළ සහ නිර්ධන පංති ආඥාදයකත්වය අතුගා දැමීමේ සමත් වනු ඇතැයි එය අපට සහතික කර කියන, සතුරු බලවේගයන්ගේ බලපෑම පිළිබඳ ප්‍රශ්නය ගැන කිව යුත්තේ, එහිදී තවත් විශාල තර්කණ සහ දේශපාලන වරදක් කෙරෙන බවත්, එය නොපෙනෙන්නේ ස්වකීය සිහි බුද්ධිය විකල් වන තරමට තමන් බියපත් වීමට ඉඩ තැබූ අයට පමණක් බවත්ය.

''සතුරු බලවේගයන්ගේ බලපෑම් නිර්ධන පංති ආඥාදයකත්වය අතුගා දමනු ඇතැ'' යි ඔබ කියන්නේහිය. හොඳයි. එහෙත් ප්‍රිය පුරවැසි

https://liberationbase.wordpress.com

සගයෙනි, ඔබ සියළු දෙනාම ආර්ථික විද්‍යාඥයන් සහ උගත් මිනිසුන් වෙති. ප්‍රජාතන්ත්‍රවාදය හා ධනපති පංතිය විසංසන්දනය කිරීම අර්ථ විරහිත සහ අඥනකමේ සලකුණක් බව ඔබ සියළු දෙනාම දන්නෙහිය. එය රාත්-තල් හා යාර විසංසන්දනය කිරීමට සමානය. ප්‍රජාතන්ත්‍රවාදී ධනපති පංතියක්ද, සුළු ධනපති පංතියේ ප්‍රජාතන්ත්‍රවාදී නොවන (ගැනුම් කරුවෙකු ඔසවා තැබිමෙහි[92] සමත්) කණ්ඩායමක්ද ඇත.

"සතුරු බලවේගයන්" යනු හුදෙක්ම හිස් වදනකි. එහි යෙදෙන පංති වචනය (ඉඩම් හිමියන්ගේ ආධාරය ලබන) ධනපති පංතිය ය.

සෑම ධනපති රටක්ම මෙන්ම රුසියාවත් බෙදෙන්නේ ධනපති පංතිය සහ ඉඩම් හිමියන්ද, නිර්ධන පංතියද, සුළු ධනපති පංතිය, කුඩා දේපල හිමියන්, මූලික වශයෙන්ම ගොවි ජනයාද, යන ප්‍රධාන බලවේගයන් තුනටය. සෑම ධනපති රටකම (රුසියාව ඇතුලුව) ඇති ප්‍රධාන බලවේග තුන ඒවා බව හෙළිදරව් වී දැන් බොහෝ කල්ය. විද්‍යාත්මක ආර්ථික විග්‍රහයෙන් පමණක් නොව, සියළුම රටවල නවීන ඉතිහාසයේ දේශපාලන අත්දැකීම් අනුව, දහඅටවැනි ශත වර්ෂයේ සියළුම යුරෝපීය විප්ලව අනුව, 1905 හා 1917 රුසියානු විප්ලව දෙකම අනුව, ඒ බව පෙනී ගියේය.

අනාගතයේදී නිර්ධන පංතියේ ආඥාදායකත්වය ධනපති පංතියේ බලපෑමෙන් අතුගෑවී යන්නේය, යන තර්ජනය පෙන්වා නිර්ධන පංතිය බිය ගැන්වීමට ඔබ උත්සාහ කරන්නෙහිද? ඔබගේ තර්ජනයෙහි අර්ථය එයයි. එයම පමණකි. එහි වෙනත් අර්ථයක් නැත.

හොඳයි. නිදසුනක් ලෙසට, කම්කරුවන්ගේ සහ දුප්පත් ගොවිජනයාගේ පාලනය අතුගා දැමීමට ධනපති පංතිය සමත් වේ නම්, ඉතිරි වන එකම විකල්පය "සභාගය", එනම් සුළු ධනපති පංතිය සහ ධනපති පංතිය අතර සන්ධානයක්, නැතහොත් එකඟත්වයක් පමණකි. වෙනත් කිසිවක් ගැන කල්පනා කළ නොහැකිය!

එහෙත් හය මාසයක් තිස්සේ සභාගය අත්හදා බලා තිබේ. එයින් බංකොලොත් භාවයට මග පෑදිනි. "නෝවයා ෂීස්න්" හි ප්‍රිය, එහෙත් කල්පනා කිරීමට තරම් අපොහොසත් මහත්වරුනි, ඔබමත් සභාගය අත් හැර දමා ඇත!

එනිසා අපට ඉතිරිව ඇතිතේ කුමක්ද?

"නෝවයා ෂීස්න්" පත්‍රයේ මහත්වරුනි, ඔබ කොතරම් අවුලට පත්ව සිටිත්දයත්, පහ දක්වා තබා තුන දක්වා වුවද ගණන් කිරීමේ ඉතාමත් සරල කටයුත්තෙහිදී වුවද, ඔබට එක එල්ලේ කල්පනා කරන්නට නොහැකි වී තිබේ.

එක්කෝ ධනපති පංතිය සියළු බලය ගත යුතුය. දැන් බොහෝ කලෙක සිට ඔබ ඒ සටන් පාඨය අත්හැර දමා තිබේ. අප්‍රියෙල් 20-21 සිදුවීම්වලදී ජනතාව එක්වරම උරයෙන් පැහැර එම බලය පෙරළා දැමූ බවත්, එමෙන් තුන් ගුණයක් අධිෂ්ඨාන සහගත සහ නිර්දය ලෙස ඔවුන් දැන් එය පෙරළා දමනු ඇති බවත් ධනපතියන් දන්නා හෙයින්, ඔවුහු පවා මෙම සටන් පාඨය ගැන ඉඟියක් හෝ නොකරති. එසේ නැත්නම් සුළු ධනපති පංතිය බලය ගත යුතුය. සියළුම විප්ලවවල අත්දැකීම්වලින් ඔප්පු වී ඇති පරිදි සහ ධනපති රටක ප්‍රාග්ධනයේ පැත්ත ගැනීමට හා ශ්‍රමයේ පැත්ත ගැනීමට හැකි නමුත් ඒ දෙක අතර දීර්ඝ කාලයක් සිටිය නොහැකි බව ආර්ථික විද්‍යාවෙන් ඔප්පු කර තිබෙන පරිදි, තනිව හා ස්වාධීනව බලය ගැනීමට සුළු ධනපති පංතිය නොකැමති හා අසමත් වන හෙයින්, එයින් අදහස් වන්නේ, ඔවුන් හා ධනපති පංතිය අතර (සන්ධානයක්, එකඟත්වයක් වන) සභාගයකි. රුසියාවේ මෙම සභාගය, සය මාසයක් තිස්සේ, දූසිම් ගණන් මාර්ග අත්හදා බැලූ නමුත් ඒ සියල්ල අසාර්ථක විය.

එසේත් නැතහොත්, අවසාන වශයෙන්, ධනපති පංතියට විරුද්ධව, එහි ප්‍රතිරෝධය බිඳ දැමීම සඳහා නිර්ධන පංතිය සහ දුප්පත් ගොවි ජනතාව මුළු බලය ගත යුතුය. මෙය තවමත් අත්හදා බලා නැත. "නෝවයා ෂීස්න්" මහත්වරුන් වන ඔබ කරන්නේ, මෙය නොකරන ලෙසට ජනතාව පෙළඹවීමය. ඔබ උත්සාහ දරන්නේ ධනපති පංතිය කෙරෙහි ඇති ඔබේ බිය පෙන්වා ජනතාව බිය ගැන්වීමටය.

හතරවැනි මාර්ගයක් සොයාගත නොහැකිය.

ඒ අනුව ඔවුන් කියන නිර්ධන පංති ආඥාදායකත්වය ධනපති පංතිය විසින් පරාජය කරනු ලැබීමට ඉඩ තිබෙන හෙයින්, "නෝවයා ෂීස්න්" නිර්ධන පංති ආඥාදායකත්වයට බිය වෙයිනම්, එය ප්‍රතික්ෂේප කරයි නම්, එය ධනපතියන් සමග සම්මුතිය දක්වා නැවත හොර රහසේ ආපසු යාමට සමානය! ප්‍රතිරෝධයට බිය වන තැනැත්තේ, ප්‍රතිරෝධය බිඳ ලිය හැකියයි විශ්වාස නොකරන තැනැත්තේ "ධනපතියන්ගේ ප්‍රතිරෝධයෙන් ප්‍රවේසම් වන්න, ඔබට එය මැඩ ලිය නොහැකි වනු ඇත" යනුවෙන් ජනතාවට අනතුරු හඟවන තැනැත්තේ කවුරුන් හෝ වුව, ඔහු එමගින් නැවතත් ධනපතියන් සමග සම්මුතියට පක්ෂව හඬ නගන බව, දහවල් එළිය මෙන් පැහැදිලිය.

සභාගය බංකොලොත් වූ බව දැන් වටහා ගෙන සිටින, එය විවෘත ලෙස ආරක්ෂා කිරීමට තරම් එඩිතර නොවන, එසේම, ඒ අතරම, ධනපති පංතියේ ආරක්ෂාව ලබන හා නිර්ධන පංතියට සහ දුප්පත් ගොවි ජනතාවට මුළු බලය පැවරීමට බිය වන සියළුම සුළු ධනපති ප්‍රජාතන්ත්‍රවාදීන් මෙන්ම "නෝවයා ෂීස්න්" ද සම්පූර්ණයෙන්ම හා ඛේද ජනක ලෙස අවුලට පත්ව තිබේ.

* * *

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ධනපතියන්ගේ ප්‍රතිරෝධයට බිය වන අතරම විප්ලවවාදියෙක් ලෙස හඳුන්වා ගැනීම, සමාජවාදියෙකු ලෙසට සලකනු ලැබීම අපේක්ෂා කිරීම ලජ්ජාවට කරුණක් නොවේද? එවැනි කථා කියනු ලැබිය හැකි වනු පිණිස, අවස්ථාවාදයෙන් දූෂිත ජාත්‍යන්තර සමාජවාදය කොතරම් පහතට වැටී තිබිය යුතුද?

ධනපති පංතියේ ප්‍රතිරෝධයේ ශක්තිය අපි දැනටමත් දැක ඇත්තෙමු. මුළු ජනතාවම එය දැක ඇත. ධනපතියෝ අනිත් පංතිවලට වඩා පංති විඥනයක් ඇතිව සිටින අතර, එක් වරම සෝවියට් සභාවල වැදගත්කම දුටහ. එනිසා ඔවුහු සෝවියට් සභා කටයුතු කඩා කප්පල් කිරීම පිණිස, ඒවා බිංදුවට බැස්ස වීමට, (මෙන්ෂෙවික්වරුන්ගේ සහ සමාජවාදී-විප්ලව-වාදීන්ගේ ආධාර ඇතිව) ඒවා වෛශ්‍යා වෘත්තියෙහි යෙදවීමට, ඒවා කථා සාප්පු බවට පරිවර්තනය කිරීමට, මාස ගණන් තිස්සේ පුහු කථා කීමෙහි සහ විප්ලව ක්‍රීඩාවෙහි යෙදීම මගින් ගොවි ජනතාව සහ කම්කරුවන් විඩාපත් කිරීමට, ඔවුන්ගේ සියළු ප්‍රයත්නයන්ම එක්වර අන්තය දක්වා විහිදුවමින්, ඔවුන්ට හැකි සියල්ල කළහ; කිසිවක් නොකර ඉතිරි නොකළහ; නොසිතිය හැකි තරම් බොරු හා අපවාද පැතිර වූහ; යුද්ධ කුමන්ත්‍රණ කළහ.

එසේ නමුත්, නිර්ධන පංතියේ සහ දුප්පත් ගොවිජනයාගේ ප්‍රතිරෝධයේ ශක්තිය අපි තවමත් දැක නැත්තෙමු. මෙම ශක්තිය සම්පූර්ණයෙන්ම පෙනී යනු ඇත්තේ බලය නිර්ධන පංතිය අතේ තිබෙන විට පමණකි; එය පෙනෙනු ඇත්තේ, රාජ්‍යබලය පීඩිත පංති අතට පත්වී තිබෙන බවත්, ඉඩම් හිමියන්ට හා ධනපතියන්ට විරුද්ධව සටන් කිරීමට රාජ්‍යය දුප්පතුන්ට උදව් දෙන බවත්, එය ධනපතියන්ගේ ප්‍රතිරෝධය බිඳ දමන බවත්, අග හිග කමින් සහ ධනපති වහල්භාවයෙන් පිරි පීඩිත කෝටි සංඛ්‍යාත ජනතාවන්ට අත්දැකීමෙන් පෙනෙන හා හැඟෙන විට පමණකි. ධනපතියන්ට ප්‍රතිරෝධය පෑමේ නොවැදගත් බලවේගයන් කොතෙක් ජනතාව අතර සැඟ වී තිබේද යන්න අපට දැක ගත හැකි වන්නේ එවිට පමණකි. එංගල්ස් ''සැඟවුණු සමාජවාදය''[93] යනුවෙන් හැඳින්වූ දෙය ප්‍රකට වන්නේ එවිට පමණකි. ක්‍රියාශීලී ලෙස හෝ අකර්මන්‍ය ප්‍රතිරෝධයෙන් හෝ කම්කරු පංති පාලනයට විරෝධය පෙන්නුම් කරන විවෘත හා සංවෘත එහි සතුරන් සෑම දස දහසකටම විරුද්ධව, දේශපාලන වශයෙන් නිහඬව, දුප්පත් කමේ සහ අපේක්ෂා භංගත්වයේ වේදනාවෙන් මිරිකෙමින් සිටි, තමන්ගේ මිනිස් බව ගැන, තමන්ට ජීවත්වීමට අයිතියක් තිබෙන බව ගැන, තමන්ටද නවීන මධ්‍යගත රාජ්‍යයෙන් සේවයක් විය හැකි බව ගැන හා රාජ්‍ය පාලනයේ ඒකාන්ත, හදිසි සහ දෛනික කටයුතුවලට සහභාගි වන ලෙස සම්පූර්ණ විශ්වාසයෙන් යුතුව නිර්ධන

පංති මිලීසියා හමුදව විසින් තමන් කැඳවනු ලැබිය හැකි බව ගැන අදහා නොගෙන සිටි අළුත් සටන් කරුවන් දශ ලක්ෂය බැගින් මතු වනු ඇත.

ප්ලෙහානව්, බ්‍රෙෂ්කොව්ස්කයා, ට්සෙරතේලි, චෙර්නොව් සහ සමාගමේ කාරුණික ආධාරය ඇතිව ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුව කැත කිරීම සඳහා ධනපතියෝ හා ඉඩම් හිමියෝ ඔවුන් හැකි හැම දෙයක්ම කළහ. ඔවුන් වස්තුවට දසවීමෙන් එය කොතරම් දුරට කැත කළේද යත්, ජනතාව මන්දෝත්සාහයට හා උදසීනත්වයට පත්වෙමින් සිටිති. ජනතාවට එහි වෙනසක් නොපෙනේ. එසේ වන්නේ කුසගින්නේ පෙළෙන මිනිසාට සමූහාණ්ඩුවේ සහ රාජාණ්ඩුවේ වෙනස නොපෙනෙන හෙයිනි. සීතලේ මිදෙන, පාවහන් නොමැති, විඩාපත් සහ තම ජීවිතය පිටස්තරයන්ගේ උවමනාව සඳහා කැප කරන සොල්දදුවා සමූහාණ්ඩුව කෙරෙහි ආදරයක් ඇති කර ගැනීමට යොමු නොවෙයි.

එහෙත් නිර්ධන පංතිරාජ්‍යය වස්තුව හමුවේ දන නොගසන බවත්, මෙම රාජ්‍යය විප්ලවවාදී පියවර ගැනීමට නොපැකිලෙන බවත්, එය පර පුටුවන්ගෙන් අතිරික්ත ආහාර තොග අත්පත් කරගෙන ඒවා කුස ගින්නේ සිටිනවුන් අතර බෙදා දෙනබවත්, ගෙවල් නැතියවුන් පොහොසතුන්ගේ ගෙවල බලෙන් පදිංචි කරවන බවත්, එය කිරි සඳහා මුදල් ගෙවන ලෙස පොහොසතුන්ට බල කරන නමුත් දුප්පත් පවුල් සියල්ලෙහිම ළමුන්ට ප්‍රමාණවත් තරම් කිරි සපයන තෙක් පොහොසතුන්ට කිරි බින්දුවක්වත් නොදෙන බවත්, ඉඩම් වැඩ කරන ජනතාවට පවරා දෙන අතර පැක්ටරි සහ බැංකු කම්කරුවන්ගේ පාලනය යටතට පත් කරනු ලබන බවත්, ස්වකීය වස්තුව සඟවන කෝටි පතියන්ට අප්‍රමාද හා තදබල දඬුවම් පමුණුවන බවත්, සෑම ශ්‍රම කරුවෙකුටම, සෑම විරැකියා ගත කම්කරුවෙකුටම, සෑම අරක්කැමියෙකුටම, වැනසුනු සෑම ගොවියෙකුටම, පුවත්පත්වලින් නොව තමන්ගේම ඇස්වලට පෙනෙන විට, ධනපති හෝ කුලාක බලවේග කිසිවකට, කෝටි සිය ගණන් මුදල් කපටි ලෙස මෙහෙයවන ලෝක මූල්‍ය ප්‍රාග්ධනයේ බලවේගයන් කිසිවකට, ජනතා විප්ලවය පරාජය කළ නොහැකි වනු ඇත. ඊට ප්‍රතිකූල වශයෙන් සමාජවාදී විප්ලවය සියළුම රටවල මෝරා එමින් තිබෙන හෙයින්, එම විප්ලවය ලෝකය මුලුල්ලේම විජයග්‍රහණය කරනු ඇත.

අප පිටු පස අපරිමිත තරම් විශාල, වඩාත් සංවර්ධිත, වඩාත් සංවිධිත ලෝක නිර්ධන පංති බලවේගයන් ඇත. ඒවා යුද්ධයෙන් තාවකාලිකව මර්දනය වී ඇතත්, විනාශ වී නැත. ඊට ප්‍රතිකූල ලෙසට යුද්ධය නිසා ඒවා වැඩී වී තිබේ. එනිසා අපගේ විප්ලවය තමාටම බිය නොවන්නේ නම්, එය අපරාජිත වනු ඇත.

* * *

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

බොල්ෂෙවික් ආණ්ඩුව, එනම්, දුප්පත් ගොවි ජනතාවගේ කැප වූ සහයෝගය ඒකාන්ත වශයෙන්ම ලබන නිර්ධන පංතික ආණ්ඩුව, ධනපති මහත්වරුන් විසින් ''අතුගා දමනු'' ලැබෙතැයි යන බිය කෙනෙක් ඇති කරගන්නේ කෙසේද! එය මොනතරම් අදූර දර්ශී කමක්ද! මොන තරම් නින්ද සහගත ලෙස ජනතාවට බිය වීමක්ද! මොන තරම් වංචාවක්ද! මෙම බිය පෙන්වන අය, ''සාධාරණය'' යන වචනය පුරුද්දට, කටට ආ පළියට කියන, ඒ ගැන විශ්වාස නොකරන හා එහි අර්ථයක් ඇති සේ නොසලකන ඒ ''උසස්'' (ධනපති සම්මතයෙන් උසස් වූවත්, ඇත්ත වශයෙන් කුණු වී ගිය) සමාජයට අයත් අය වෙති.

නිදර්ශනයක් මෙන්න.

පෙෂෙහෝනව් මහතා සුප්‍රසිද්ධ අර්ධ-කැඩෙට් වරයෙකි. බ්‍රෙෂ්කොව්ස්කයලාගේම සහ ප්ලෙහානව්ලාගේම සංකල්පනා ඇති ඊට වඩා මැදහත් තෲදොවික්වරයෙක් සොයා ගත නොහැකිය. ඊට වඩා ධනපති පංතියට දස වූ ඇමතිවරයෙක් නොවීය. ''සභාගයේ'' සහ ධනපතියන් සමග සම්මුතියේ මීට වඩා උත්සුක්ත පක්ෂවාදියෙක් ලෝකයා කිසි කලෙකත් දැක නැත.

ආරක්ෂාවාදී ''ඉස්වෙස්තියා'' පත්‍රයෙහි වාර්තා වී ඇති පරිදි ''ප්‍රජාතන්ත්‍රවාදී'' (බුලීගින්, යනුවෙන් කියවන්න) සාකච්ඡා සභාවේ ඔහු කළ කථාවෙන් ඔහුට පිළිගැනීමට සිදු වූ කරුණු මෙසේය.

වැඩ පිළිවෙළවල් දෙකක් ඇත. එකක් කණ්ඩායම් අයිතිවාසිකම්, එනම් පංති සහ ජාතික අයිතිවාසිකම් ඉදිරිපත් කරන වැඩ පිළිවෙළකි. මෙය බොල්ෂෙවික්වරුන් විසින් නොසහවාම ඉදිරිපත් කරනු ලබන වැඩ පිළිවෙළය. එසේ වුවද, මෙම වැඩ පිළිවෙළ ප්‍රතික්ෂේප කිරීම ප්‍රජාතන්ත්‍රවාදයේ අනික් කොටසට පහසු නොවේ. එම අයිතිවාසිකම්, වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකම්ය, රවටන ලද, පීඩනයට පත් කරන ලද ජාතීන්ගේ අයිතිවාසිකම්ය.එනිසා,ප්‍රධාන වශයෙන්,මෙම අයිතිවාසිකම් හරය වශයෙන් සාධාරණ වන නිසාම, බොල්ෂෙවික්වරුන් කෙරෙන් බිඳී වෙන්වීම, මෙම පංති අයිතිවාසිකම් ප්‍රතික්ෂේප කිරීම, ප්‍රජාතන්ත්‍රයට පහසු නොවේ. එහෙත්, විප්ලවයට පෙර අප මෙම වැඩ පිළිවෙළ සඳහා සටන් කළ නමුත්, ඒ සඳහා අපි විප්ලවය කළ නමුත්, වෙනත් තත්ත්වයන් යටතේ අප සියළු දෙනාටම ඒකමතිකව එයට සහයෝගය දැක්විය හැකි නමුත් වර්තමාන තත්ත්වය යටතේ එය භයානක අන්තරායක් වන්නේය. මෙම ඉල්ලීම් ඉදිරිපත් කිරීමට සිදු වී තිබෙන්නේ ආණ්ඩුවට ඒ ඉටු කිරීමට නොහැකි අවස්ථාවක හෙයින් දැන් එම අන්තරාය වඩාත් දරුණුය. අපි ප්‍රථම කොට සමස්තය, එනම් රාජ්‍යය විනාශයෙන් මුදා ගත යුත්තෙමු. එය කිරීමට ඇත්තේ එකම මඟක් පමණකි. ඉල්ලීම් කොතරම් සාධාරණ සහ තර්කානුකූල වුවත්, එම මාර්ගය ඉල්ලීම් ඉටු කිරීම නොවේ. ඊට ප්‍රතිකූල වශයෙන් එම මාර්ගය වන්නේ සෑම අංශයකින්ම දයක වෙමින් සීමා කිරීම හා පරිත්‍යාගයයි.'' (''ඉස්වෙස්තිය'', සැප්තැම්බර් 17),

ධනපතියන් බලයෙහි සිටිනතාක් කල් තමන් ආරක්ෂා කරන්නේ සමස්තය නොව, රුසියානු සහ ''මිත්‍ර'' අධිරාජ්‍යවාදී ප්‍රාග්ධනයේ ආත්මාර්ථකාමී උවමනාවන් බව වටහා ගැනීමට පෙෂෙහෝනව් මහතා අසමත් වෙයි. යුද්ධය අධිරාජ්‍යවාදී රටවල් අල්ලා ගැනීමේ කොල්ලකාරී යුද්ධයක් නොවන තත්ත්වයට පත්වන්නේ, ධනපතියන් සහ ඔවුන්ගේ රහස් ගිවිසුම්, ඔවුන්ගේ රටවල් අල්ලා ගැනීම් (අන්‍යයන්ගේ දේශ භූමි අල්ලා ගැනීම) සහ බැංකු හා මූල්‍ය වංචාවන් කෙරෙන් බිඳී වෙන් වූ පසු පමණ කැයි යන්න වටහා ගැනීමට පෙෂෙහෝනව් මහතාටබැරිය. යුද්ධය ආරක්ෂාවාදී යුද්ධයක්, සාධාරණ යුද්ධයක් වන්නේ මෙයට පසුව පමණක් බව, සාධාරණ සාමයක් සඳහා කෙරෙන විධිමත් යෝජනාව සතුරා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් බව වටහා ගැනීම පෙෂෙහෝනව් මහතාට නුපුළුවන. ප්‍රාග්ධනයේ වියගස ඉවත දමූ, ගොවි ජනතාවට ඉඩම් පවරා දුන් සහ බැංකු සහ පැක්ටරි කම්කරු පාලනය යටතට පත්කළ රටක ආරක්ෂක හැකියාවන්, ධනපති රටක ආරක්ෂක ශක්තිය මෙන් බොහෝ වාරයක් විශාල බව පෙෂෙහෝනව් මහතාට අවබෝධ වන්නේ නැත.

පෙෂෙහෝනව් මහතාට වටහා ගත නොහැකි වන ප්‍රධාන දෙය නම්, බොල්ෂෙවික්වාදයේ සාධාරණකම පිළිගැනීම, එහි ඉල්ලීම් ''වැඩ කරන ජනතාවගේ'', එනම් ජනතාවගෙන් බහුතරයෙහි ඉල්ලීම් බව පිළිගැනීම මගින් ඔහු කළේ ඔහුගේ මුළු ප්‍රතිෂ්ඨාවම, මුළු මහත් සුළු ධනපති පංතියේ ප්‍රතිෂ්ඨාවට යටවීමට අත්හැර දැමීම බවය.

අපගේ ශක්තිය ඇත්තේ මෙතැනය. අපගේ ආණ්ඩුව අනභිභවනීය වනු ඇත්තේ ඒ නිසාය — බොල්ෂෙවික් වැඩපිළිවෙළ ''වැඩ කරන ජනතාවගේ'' සහ ''පීඩිත ජාතීන්ගේ'' වැඩපිළිවෙළ බව අපගේ ප්‍රතිපාක්ෂිකයන්ට පවා පිළිගැනීමට සිදුවන බැවිනි.

කොහොම වුවත්, පෙෂෙහෝනව් නම් කැඩෙට්වරුන්ගේ, ''යෙදින්ස්ත්ව'' සහ ''දියල නරෝද'' ජනයාගේ, බ්‍රෙෂ්කොව්ස්කයලාගේ සහ ප්ලෙහානව්ලාගේ දේශපාලන මිතුරෙකි. ඔහු කුලාකයන්ගේ නියෝජිතයෙකි. බොල්ෂෙවික්වරුන් හෙට කර්නිලව්ගේ හෝ (ඒ සමානම වන) කෙරෙන්ස්කිගේ හමුදාවලට පරාජය වුවහොත් තුවාල ලත් බොල්ෂෙවික්වරුන්ගේ ඇස් තම කුඩවලින් උගුල්ලා දැමීමට ඉදිරියට එන භාර්යාවන් සහ සහෝදරියන් ඇති මහත්වරුන්ගේ නියෝජිතයෙකි.

බොල්ෂෙවික්වරුන්ගේ ඉල්ලීම්වල සාධාරණත්වය පිළිගැනීමට මෙවැනි මහත්මයෙකුට සිදුවී තිබේ.

ඔහුට ''සාධාරණය'' යනු හුදෙක්ම හිස් වදනක් පමණකි. එහෙත්, අර්ධ නිර්ධන පංති මහා ජනකායයට සහ යුද්ධයෙන් විනාශයට පත්, වද වින්ද සහ විඩාවට පත් නාගරික සහ ගම්බද සුළු ධනපති පංතියේ බහුත-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

රයට, එය නිරාහාරව මිය යාම පිළිබඳ, පාන් පොත්තක් පිළිබඳ ඉතාමත් තියුණු, දැවෙන සහ ඉතාමත් බරපතල ප්‍රශ්නයකි. නිරාහාරව සිටින හා විනාශයට පත් ජනයාගේ උවමනාවන් සහ සූරාකන්නන්ගේ උවමනාවන් අතර ''සභාගයක්,'' ''සම්මුතියක්'' පදනම් කරගෙන, කිසිම ප්‍රතිපත්තියක් සකස් කළ නොහැකි වන්නේ එහෙයිනි. බොල්ෂෙවික් ආණ්ඩුවට මෙම ජනතාවගෙන් අති බහුතරයෙහි සහයෝගය ලැබීම නිසැක වන්නේ එහෙයිනි.

සාධාරණය යනු හිස් වදනකැයි, බුද්ධිමත්හු සහ තමන් ආර්ථික ද්‍රව්‍යවාදයේ ''පශ්චිම කොටස් ගැන කල්පනාකර බලා'' ඇතැයි යන උත්තම හේතුව ඉදිරිපත් කරමින්, තමන් මාක්ස්වාදීන් බව කියා ගැනීමට නැඹුරු වන ඒ අධමයෝ කියති.

ජනතාව තුළට තරයේ කා වැදුනු අදහස්, බලයක් සහිත බවට පත් වන්නෝය. ඒ අනුව, විප්ලවවාදී නිර්ධන පංති ජාත්‍යන්තරවාදයේ නියෝජිතයින් වන බොල්ෂෙවික්වරුන්, ලෝකය මුළුල්ලේම සිටින, ගණනක් මිම්මක් නැති, වැඩ කරන ජනතාවන් ක්‍රියාවට පොළඹවන අදහස, හරියටම මෙම අවස්ථාවේ ඔවුන්ගේ වැඩ පිළිවෙළට ඇතුලත්කර තිබේ.

තනිකරම සාධාරණත්වය නිසාම, හුදෙක්ම, සූරාකෑමට විරුද්ධව ජනතාව තුළ ඇති වන කෝපය නිසාම, ජනතාව සමාජවාදයේ මාර්ගයට පිවිසීම සිදු නොවන්නට තිබිණි. එහෙත් ධනපති ක්‍රමයට ස්තුති වන්නට, ලොකු බැංකුවල, සම්මේලවල, දුම්රිය සේවාවල, ආදියෙහි ද්‍රව්‍යමය යන්ත්‍රය වර්ධනය වී ඇති නිසා, දියුණු රටවල යෝධ අත්දැකීමෙන් ඉන්ජිනේරු විද්‍යාත්මක පුදුමයන් සම්භාරයක් එක්රැස් වී ඇති අතර, ඒවායේ උපයෝගිතාවයට ධනපති ක්‍රමය හරස් වන නිසා, වැඩකරන හා සූරා කනු ලබන ජනතාවගේ ආධාරය ඇතිව එම යන්ත්‍රය ක්‍රමානුකූල ලෙස අත්පත් කරගෙන එය ක්‍රියාත්මක කිරීම සඳහා ලක්ෂ දෙක හමාරක සාමාජිකත්වයක් ඇති පක්ෂයක් පංති විඥනය ඇති කම්කරුවන් විසින් ගොඩනගා ගනු ලැබ තිබෙන නිසා, දැන් මෙම කොන්දේසි ඉටුවී පවතින නිසා, බොල්ෂෙවික්වරු තමන් බියපත් වීමට ඉඩ නොතබත් නම්, ඔවුහු බලය ගැනීමට සමත් වෙති නම්, එම බලය ලෝක සමාජවාදී විප්ලවය තෙක් රැක ගැනීමෙන් ඔවුන් වලකාලිය හැකි කිසිම බලවේගයක් මිහි පිට නැත.

පසු වදන්

ඔක්තෝබර් 1 දින ''නෝවයා ෂිස්න්'' පත්‍රයේ ප්‍රධාන ලිපිය මගින්, එහි මොට්ට ස්වභාවයේ තවත් අනර්ඝ නිදර්ශනයක් ඉදිරිපත් කරන විට, ඉහත සඳහන් කෘතිය ලියා නිම කර තිබුණි. බොල්ෂෙවික්වරුන්ට හිතවත්කමක් පාමින් ''ඔබ ප්‍රකෝප වීමට ඉඩ නොදෙන්න'' යනුවෙන් එයින් ඔවුන්ට ඉතාමත් ඥනාන්විත අමන අවවාදයක් දෙනු ලබන නිසා එය වඩාත් අන්තරාදයකය. (බොල්ෂෙවික්වරුන් බියපත් කර බලය ගැනීමෙන් වැලකී සිටීමට ඔවුන් පෙළඹවීම අරමුණු කොටගත් ප්‍රකෝපකිරීම ගැන වූ මෙම හඬ තැළීමේ උගුලට හසු නොවන ලෙසට කෙරෙන අවවාදයක් සේ එය ගත යුතුය).

ඒ අනගි නිදර්ශනය මෙන්න:

''ප්‍රජාතන්ත්‍රවාදයේ නියමයන් ඉටු කරන හා ජනගහනය අතර ඉමහත් බලපෑමක් කිරීමෙහි සමත් අවයව ප්‍රජාතන්ත්‍රවාදය සතු බවත්, සිවිල් යුද්ධයේදී එය ආරක්ෂාවාදී තත්ත්වයක් ගත් කල එය අනභිභවනීය වන බවත්, නමුත්, එය ක්‍රියාරම්භකත්වයක් ගනිමින් ප්‍රහාරයෙහි යෙදෙන විට එය පරාජයට පත්වන හා එයට වැනෙන සුලු මැද කණ්ඩායම් නැතිව යන, බවත්, එක් අතකින්, ජූලි 3—5 දිනවල සහ අනිත් අතින් කර්නිලව් දිනවල ඇතිවූ ව්‍යාපාරවලින්, ඉතා පැහැදිලි ලෙස පෙනී ගියේය.''

කුමණ ආකාරයකින් හෝ අල්පමාත්‍ර වශයෙන් හෝ බොල්ෂෙවික්වරුන් මෙම තර්කයේ අමන මොට්ටකමට ඉඩ දුනහොත්, ඔවුන් කරන්නේ ඔවුන්ගේ පක්ෂය හා විප්ලවය විනාශ කිරීමකි.

සිවිල් යුද්ධය (බොහෝ හොඳ ලකුණු ඇති නෝනා කෙනෙකුට හරියටම ගැලපෙන විෂය) ගැන කථා කිරීමේ කර්තව්‍යය තමන් පිට පවරා ගන්නා මෙම තර්කයේ කතුවරයා, මෙම ප්‍රශ්නය හා සම්බන්ධ ඉතිහාසයේ පාඩම් නොඇසිය හැකි ලෙසින් විකෘති කරයි.

https://liberationbase.wordpress.com

මෙම පාඩම් ගැන, මෙම ප්‍රශ්නය හා සම්බන්ධ ඉතිහාසයේ පාඩම් ගැන, නිර්ධන පංති විප්ලවවාදී උපක්‍රමවල නියෝජිතයා හා නිර්මාණකයා වූ මාක්ස් කීවේ මෙසේය:

''කැරලි ගසා නැගී සිටීම යුද්ධයට නැතහොත් වෙනත් ඕනෑම කලාවකට සමාන වන බරපතල කලාවකි. එනිසා, එය කිසියම් කාර්ය පරිපාටික නීතිවලට යටත් වන්නේය. එම නීති ගැන නොතකා හැරිය හොත්, එසේ නොතකන පාර්ශ්වයෙහි විනාශයට එය හේතු වන්නේය. ඔබට මුහුණ පාන්නට සිදුවන පක්ෂවල හා තත්වයන්ගේ ස්වභාවය අනුව බැස ගන්නා තර්කානුකූල නිගමනයන් වන මෙම නීති ඉතා පැහැදිලිය, ඉතා සරලය. එනිසා, ජර්මන්වරුන් 1848 දී ඒ පිළිබඳව ලැබූ කෙටි අත්දැකීමෙන්, ඔවුන්ට ඒ ගැන තරමක් හොඳ දැනුමක් ලබාගත හැකි විය. ප්‍රථමයෙන්ම ඔබ මුළු දුරම යාමට සම්පූර්ණයෙන්ම සූදානම් නම් මිස, කිසි කලෙකත් කැරලි ගසා නැගී සිටීම ක්‍රීඩාවක් කොට නොගන්න. (වචනාර්ථයෙන් කියතොත්: ඔබගේ ක්‍රීඩාවෙහි ප්‍රතිඵලයට මුහුණ දෙන්න). කැරලි ගසා නැගී සිටීම යනු, සෑම දිනක්ම පාසා වෙනස්වන අගය සහිත, ඉතාමත් අවිනිශ්චිත විශාලත්වයෙන් යුක්ත සමීකරණයකි. ඔබට විරුද්ධ බලවේගයන්ට සංවිධානයේ, විනය සම්පන්න භාවයේ සහ චිරාගත අධිකාරයේ සියළුම වාසිදායක තත්ත්වයන් ඇත. (මාක්ස් අදහස් කරන්නේ ''බලවත් ලෙස ස්ථාපිත වූ'' පැරණි අධිකාරයට විරුද්ධ වන විප්ලවයේ බලපෑම සහ ආණ්ඩුවේ වැනෙන සුලු භාවය නිසා බිඳී යාමට තවමත් පාත්‍ර නොවුනු යුද්ධ හමුදුවට විරුද්ධව කරන ඉතාමත් ''දුෂ්කර'' කැරලි ගසා නැගී සිටීමේ අවස්ථාව ගැනය). ඔවුන්ට විරුද්ධව බලවත් අවාසි සහිත තත්ත්වයන් ඇති නොකරන්නේ නම්, ඔබ පරාජයට හා විනාශයට පත් වේ. දෙවැනිව, ඔබ කැරලි ගසා නැගී සිටීමේ ව්‍යාපාරයකට පිවිසි පසු, ඉතාමත් බලවත් අධිෂ්ඨානයෙන් යුතුව සහ ප්‍රහාරත්මකව කටයුතු කරන්න. ආරක්ෂක තත්ත්වයට වැටීම සෑම ආයුධ සන්නද්ධ නැගී සිටීමකම මරණය වන්නේය. එය සතුරා සමග සටන් වැදීමටත් පෙර පරාජය වීමකි. ඔබගේ සතුරන්ගේ බලවේග විසිරි තිබෙන විට, ඔවුන්ට හදිසියේ පහර දෙන්න. ඉතා කුඩා වූ නමුත්, නව ජයග්‍රහණයන් ලබා ගැනීමට කටයුතු සූදනම් කරන්න. සෑම දිනම සූදනම් වීමෙහි යෙදෙන්න. ප්‍රථම සාර්ථක නැගී සිටීමෙන් ඔබට ලැබුණු සාදචාරමය වැඩි ශක්තිය රැකගන්න. නිතරම ප්‍රථම ශක්තිමත් ආවේගය අනුව යන සහ නිතරම ආරක්ෂා සහිත පැත්ත සොයන වැනෙන සුලු කොටස් මේ ආකාරයෙන් ඒකරාශී කරගන්න. ඔබේ සතුරන් ඔබට විරුද්ධව ඔවුන්ගේ ශක්තිය එක්තැන් කර ගැනීමට පෙර ඔවුන් පසු බස්වන්න. විප්ලවවාදී උපක්‍රම පිළිබඳව මෙතෙක් දක්නා ලද ශ්‍රේෂ්ඨතම විශාරදයා වූ දන්තොන් කියන ලෙසට: ''ධෛර්‍යය, ධෛර්‍ය, නැවතත් ධෛර්‍යය'' (''ජර්මනියේ විප්ලවය'' සහ ප්‍රතිවිප්ලවය, ජර්මන් සංස්කරණය, 1907, පිටු 118).

අපි ඒ සියල්ලම වෙනස් කර ඇත්තෙමුයි, ''මාක්ස්වාදීන් වෙන්නට සිටින'' ''නෝවය ෂිස්න්'' පත්‍රයේ අය තමන් ගැනම කියනු ඇත. ධෛර්‍යමත් කම් තුන වෙනුවට ඔවුන් වෙත යහගුණ දෙකක් තිබේ: ''මහත්මයාණනි, අපට දෙකක් ඇත: මැදහත් සහ නිවැරදිකම.''[94] ''අපට'' ලෝක ඉතිහාසයේ අත්දැකීමෙහි, ශ්‍රේෂ්ඨ ප්‍රංශ විප්ලවයේ ඉතිහාසයෙහි අර්ථයක් නැත. අපට වැදගත් දෙය වන්නේ උදසීනත්වයේ කණ්ණාඩිවලින් විකෘති කරන ලද 1917 ව්‍යාපාර දෙකෙහි අත්දැකීමය.

මෙම සිත් ගන්නා කණ්ණාඩි නොමැතිව, මෙම අත්දැකීම ගැන විමසා බලමු.

ඔබ ජූලි 3—5 සිදුවීම් ''සිවිල් යුද්ධයට'' සම කරන්නේ ඔබ අලෙක්සින්ස්කි, පිරිවෙර්සෙව් සහ සමාගම කෙරෙහි විශ්වාසය තැබූ හෙයිනි. එවැනි අය කෙරෙහි විශ්වාසය තැබීම (හා ලොකු දිනපතා පුවත්පතක විශාල යන්ත්‍රයක් තමන්ට ඇතත්, ජූලි 3—5 දිනවල සිදුවීම් ගැන තොරතුරු එකතු කිරීමට තමන්ම කිසිවක් නොකිරීම) ''නෝවය ෂිස්න්'' මහත්වරුන්ගේ ප්‍රතිරූපකාර ගුණයකි.

එහෙත්, ජූලි 3—5 සිදුවීම් බොල්ෂෙවික්වරුන් විසින් මූලාකෘති තත්ත්වයේ තබා ගන්නා ලද සිවිල් යුද්ධයේ මූලා කෘතියක් නොව, නියම සිවිල් යුද්ධයක් යයි මොහොතකට සිතමු. එය උපකල්පනයක් වශයෙන් පිළිගනිමු.

තත්ත්වය එසේ වී නම්, මෙම පාඩමෙන් ඔප්පු වන්නේ කුමක්ද?

ප්‍රථමයෙන්ම, බොල්ෂෙවික්වරු ප්‍රහාරය දීමට යොමු නොවූහ. ඔවුන් ප්‍රහාරය දීමට යොමු වී නම්, ජූලි 3—4 රාත්‍රියෙහි හා ජූලි 4 දින පවා, ඔවුනට බොහෝ දුර ඉදිරියට යාමට ඉඩ තිබුණු බව විවාදයෙන් තොරව පිළිගැනීමට සිදුවේ. අපි (''නෝවය ෂිස්න්'' මෙන්) සිවිල් යුද්ධය ගැන කථා කරන්නෙමු නම්, (සත්‍ය කරුණුවලින් පෙනෙන ලෙසට, සාංසිද්ධික කඩා පැනීමක් අප්‍රියෙල් 20—21 වර්ගයේ පෙළපාළියක් බවට හැරවීම ගැන කථා නොකරමු නම්) ඔවුන්ගේ මෙම ආරක්ෂක තත්ත්වය ඔවුන්ගේ දුර්වල කමක් විය.

එනිසා ''පාඩමෙන්'' ඔප්පු වන්නේ ''නෝවය ෂිස්න්'' පත්‍රයේ ඥානවන්තයන්ට වැරදී තිබෙන බවය.

දෙවැනිව, ජූලි 3 හා 4 දිනවල කැරලි ගසා නැගී සිටීමක් ආරම්භ කිරීමට පවා බොල්ෂෙවික්වරු එයට හේතු වූයේ ''නෝවය ෂිස්න්'' හා අප අතර ගැටුමට පිටස්තර කරුණකි. එසේ කියන්නේ, කැරලි ගසා නැගී සිටීමකට ආධාර දීමට බහුතරයක් නොමැති බව පැහැදිලිව පෙනෙන කල,

https://liberationbase.wordpress.com

කැරලි ගසා නැගී සිටීම ගැන කල්පනා කිරීමට විප්ලවවාදී පක්ෂය පසුබට වන්නේය යන කරුණ ගැන නොව, ''සිවිල් යුද්ධයේ'' පාඩම් ගැන අප තර්ක කරන හෙයිනි.

1917 ජූලි මාසයට බොහෝ පසුව නාගරික සෝවියට් සභාවල සහ රටේ ඡන්ද බහුතරයක් (මොස්කව් ඡන්දවලින් සියයට 49 ක්) බොල්ෂෙවික්වරුන්ට ලැබුණු බව කවුරුත් දන්නා හෙයින්, නැවතත් ලැබෙන්නේ, ඒ බොහෝ හොඳ ලක්ෂණ ඇති නෝනා වන ''නෝවය ෂිස්න්'' කැමති වන ඒවාට වඩා වෙනස් ''පාඩම්'' මය.

එසේ නොවෙයි, ''නෝවය ෂිස්න්'' පුරවැසියනි, ඔබ දේශපාලනයට අත නොදමා සිටීම වඩා හොඳය!

රටේ විප්ලවවාදී පංතිවල, පෙරමුණු බල ඇණිවල බහුතරයක් විප්ලවවාදී පක්ෂයට නොමැති නම්, කැරලි ගසා නැගී සිටීමක ප්‍රශ්නයක් පැන නැගිය නොහැකිය. එපමණක් නොව කැරලි ගසා නැගී සිටීම සඳහා මෙම කොන්දේසිද ඉටු විය යුතු වේ: 1) දේශව්‍යාප්ත පරිමාණයෙන් විප්ලවය වර්ධනය වීම; 2) පැරණි ආණ්ඩුවේ, නිදසුනක් ලෙසට ''සභාග ආණ්ඩුවේ'' සම්පූර්ණ සදචාරමය සහ දේශපාලන බංකොලොත් භාවය; 3) සියළුම මැද කණ්ඩායම්වල, එනම්, ඊයේ ආණ්ඩුවට සම්පූර්ණයෙන් ආධාර කළ නමුත් දැන් එයට සම්පූර්ණයෙන් ආධාර නොකරන කණ්ඩායම්වල අන්ත වැනෙන සුලු භාවය.

ජූලි 3—5 දිනවල පාඩම් ගැන කථා කිරීමේදී ''නෝවය ෂිස්න්'' පත්‍රය මෙම ඉතා වැදගත් පාඩම ගැන සඳහන් නොකළේ මන්ද? එසේ වූයේ දේශපාලන ප්‍රශ්නයක් විමර්ශනයට භාජනය කරන ලද්දේ දේශපාලනඥයන් විසින් නොව, ධනපති පංතියට බියෙන් ඇලලී ගිය බුද්ධිමතුන් පිරිසක් විසින් බැවිනි.

තවදුරටත් විමසන විට, තුන්වැනිව කරුණු අනුව පෙනෙන්නේ, සමාජවාදී-විප්ලවවාදීන් සහ මෙන්ෂෙවික්වරුන් අතර පිරිහීම ඇරඹුනේ ජූලි 3—4 සිදුවීම්වලින් පසුව බවද, එසේ වූයේ නියත වශයෙන්ම ටසෙරතේලිලා අනුගමනය කළ ජූලි ප්‍රතිපත්තියෙන් ඔවුන්ගේ ස්වභාවය හෙළිදරව් වීමත්, බොල්ෂෙවික්වරුන් තමන්ගේම පෙරමුණු බල ඇණියේ සටන් කරුවන් වන අතර ''සමාජ-පෙරමුණේ'' පක්ෂවාදීන් ද්‍රෝහීන් බව පොදු ජනතා සමූහයාට නියත වශයෙන්ම අවබෝධ වීමත්, නිසා බවද යන්නය. කර්නිලව් කැරැල්ලට කලින්ම පවා අගෝස්තු 20 පෙට්‍රොග්‍රෑඩ් මැතිවරණයෙන් මෙම පිරිහීම සම්පූර්ණයෙන්ම හෙළිදරව් විය. එම මැතිවරණයේ ප්‍රතිඵලය වූයේ බොල්ෂෙවික්වරුන්ට ජයග්‍රහණය ලැබීම සහ ''සමාජ-පෙරමුණේ'' පක්ෂවාදීන් අන්ත පරාජයට පත්වීමය. (පක්ෂ සියල්ලෙහිම ඡන්ද ගණන් වසං කරමින් මෙය නිෂ්ප්‍රභා කිරීමට ''දියල නරෝද'' මෑතදී ප්‍රයත්නයක් දැරූ නමුත්, එය ආත්මවංචනයක් ස්වකීය පාඨකයන් රැවටීමක් යන දෙකම විය. අගෝස්තු 24 ''දියෙන්'' හි පළ කරන ලද සංඛ්‍යාවන් අනුව, සම්පූර්ණ ඡන්ද සංඛ්‍යාවෙන් කැඩෙට්වරුන්ට ලැබුණු ප්‍රතිශතය 22 සිට 23 දක්වා ඉහළ ගිය නමුත් ඔවුන්ට ලැබුණු මුළු ඡන්ද සංඛ්‍යාව සියයට 40 කින් පහත වැටුනේය. සම්පූර්ණ ඡන්ද සංඛ්‍යාවෙන් බොල්ෂෙවික්වරුන්ට ලැබුණු ප්‍රතිශතය 20 සිට 33 දක්වා ඉහළ ගිය අතර, ඔවුන්ට ලැබුණු මුළු ඡන්ද සංඛ්‍යාව පහත වැටුනේ සියයට 10 කින් පමණකි. ''මැද කණ්ඩායම්වල'' ප්‍රතිශතය 58 සිට 44 දක්වා පහත වැටුනු අතර ඔවුන්ගේ මුළු ඡන්ද සංඛ්‍යාව සියයට 60 ක් පහත වැටුනි!)

ජූලි දිනවලින් පසුව හා කර්නිලව් දිනවලට පෙර සමාජවාදී -විප්ලවවාදීන් සහ මෙන්ෂෙවික්වරුන් අතර පිරිහීමක් ඇති වී තිබුණු බව, එම පක්ෂ දෙකම තුළ සියයට 40 ක් පමණ වන තරමට ඒවායේ වාමාංශය වර්ධනය වීමෙන්ද ඔප්පු වේ. මෙය කෙරෙන්ස්කි විසින් බොල්ෂෙවික්වරුන්ට කරන ලද වද හිංසා ''පලදීමකි''.

ජූලි 3—4 සිදුවීම්වලින් නිර්ධන පංති පක්ෂයට සාමාජිකයන් දෙතුන් සියයක් නැතිව ගිය නමුත්, එය එයින් විශාල ප්‍රගතියක් ලැබුවේය. එහි කැප වූ ස්වභාවයත්, සමාජවාදී -විප්ලවවාදීන්ගේ සහ මෙන්ෂෙවික්වරුන්ගේ ද්‍රෝහි කමත් ජනතාවට අවබෝධ වූයේ සහ දකින්නට ලැබුණේ, නියත වශයෙන්ම එම තද පරුෂ දවස්වලය. එනිසා ''පාඩම'' කිසිසේත්ම ''නෝවය ෂිස්න්'' කියන ආකාරයේ නොව, ඊට හාත් පසින්ම වෙනස් එකක් විය. එය මෙසේය: කුල්මත් වී සිටින ජනතාව අත් හැර ''මොල්චාලින් ප්‍රජාතන්ත්‍රවාදය'' වැළඳ නොගන්න. එසේම ඔබ කැරලි ගසා නැගී සිටීම ආරම්භ කරන්නේ නම්, සතුරාගේ බලවේග විසිරී තිබියදී පහර දෙන්න, සතුරා බලාපොරොත්තු නොවන ආකාරයෙන් පහර දෙන්න.

එය එසේ නොවේද? ''මාක්ස්වාදීන් වෙන්නට සිටින'' ''නෝවය ෂිස්න්'' මහත්වරුනි.

එසේ නැතහොත්, මාක්ස්වාදය යන්නෙන් අදහස් කරන්නේ, වාස්තවික තත්ත්වය හරි ආකාර ලෙස අගය කිරීමක් මත උපක්‍රම පදනම් නොකර, ''සිවිල් යුද්ධයක්'', ''සෝවියට් සභා සම්මේලනයක් සහ ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය කැඳවීමක් අර්ථ විරහිත ලෙස හා විචාරයෙන් තොරව එකට පොදි බැඳීමද?

මෙය ඉඳුරාම විකාරයකි මහත්වරුනි. මෙය නම් මාක්ස්වාදය හා පොදු වශයෙන් තර්ක විද්‍යාව විහිළුවට ලක් කිරීමකි!

පංති අරගලය සිවිල් යුද්ධයේ තත්ත්වයට උත්සන්න කිරීම සාධාරණ බව කියන කිසිවක් වාස්තවික තත්ත්වයෙහි නොමැතිනම්, සෝවියට් සභා සම්මේලනය හා ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය සම්බන්ධයෙන්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ඔබ ''සිවිල් යුද්ධය'' ගැන කථා කළේ මන්ද? (මෙහි සාකච්ඡාවට භාජනය වන ''නෝවය ෂිස්න්'' ප්‍රධාන ලිපියේ සිරස්තලයෙහි සඳහන් කර තිබෙන්නේ එසේය). තත්ත්වය එසේ වීනම්, වාස්තවික තත්ත්වය අනුව සිවිල් යුද්ධයට ඉඩක් නොමැති බවත්, එනිසා, සෝවියට් සහා සම්මේලනයක් සහ ආණ්ඩුක්‍රම සම්පාදක මණ්ඩලයක් වැනි සාමකාමී, ව්‍යවස්ථානුකූල-නීත්‍යානුකූල, නීතිවේදක සහ පාර්ලිමේන්තුවාදී වශයෙන් ''සරල'' කාරණා උපක්‍රමවල මුල්ගල විය හැකි හා විය යුතු බව පැහැදිලි ලෙස පාඨකයාට කියා එය ඔහුට ඔප්පු කිරීම ඔබේ යුතුකම විය. එය එසේ නම්, එවැනි සම්මේලනයක් සහ එවැනි මණ්ඩලයක් ඇත්ත වශයෙන්ම තීරණ ගැනීමෙහි සමත් වන්නේය යන මතය දැරීමට ඉඩ තිබේ.

එහෙත් අනික් අතට, වර්තමාන වාස්තවික තත්ත්වයන් තුළ සිවිල් යුද්ධයක අනිවාර්‍යණීයත්වයක් ගැබ්ව තිබේනම්, සිවිල් යුද්ධයක් ඇති වීමේ ඉඩ කඩක් පමණක් වුව ගැබ්ව තිබේනම්, ඔබ ඒ ගැන කථා කළේ ''නිකම් බොරුවට'' නොවේ නම්, ඔබ ඒ ගැන කථා කළේ සිවිල් යුද්ධ තත්ත්වයක් පවතින බව ඔබට පෙනුණ හැඟුණ හා දැනුණ නිසා නම්, සෝවියට් සහා සම්මේලනයක් හෝ ආණ්ඩුක්‍රම සම්පාදක මණ්ඩලයක් හෝ මුල්ගල වශයෙන් ගැනීම ඔබට කළ හැකි වන්නේ කෙසේද?

මෙය නම් සාගින්නේ පෙළෙන, දුක්කරදර විඳින ජනතාව විහිළුවට ලක් කිරීමක්ම වන්නේය! සාගින්නේ තැවෙනවුන් මාස දෙකක් ''බලා සිටීමට'' කැමති වනු ඇතැයි ඔබ සිතන්නෙහිද? එසේ නැතහොත්, ඔබ දිනපතාම ලියන පරිදි දිනපතාම වැඩි වෙමින් පවතින විනාශය සෝවියට් සහා සම්මේලනය හෝ ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය හෝ එන තෙක් ''බලා සිටිතැයි'' ඔබ සිතන්නෙහිද? එසේත් නැතහොත්, පෙබරවාරි 28 පටන් සැප්තැම්බර් 30 දක්වා මහත් කලබලකාරී ලෙස සහ අභූත පූර්ව සීඝ්‍රතාවයකින් ගමන් ගත් රුසියානු විප්ලවයේ ඉතිහාසය, ඔක්තෝබර් 1 දින සිට නොවැම්බර් 29 දක්වා[95], උත්ක්ෂේපණය, වේග දිවුම්, යුද්ධ පරාජයන් හා ආර්ථික අර්බුද ඇති නොවන සේ උත්තර නිසලතාවයක්, සාමකාමී භාවයක් හා නීතිමය තුලනයක් සහිත සාමයක් ඇතිව ගමන් ගනිතැයි නිගමනය කිරීමට ඔබට අවසර දෙන කරුණු ඔබ වෙත තිබේද? නො එසේ නම්, බොල්ෂෙවික් නොවන නිලධාරියෙකු වන දුබාසව්, මුළු යුද පෙරමුණම වෙනුවෙන් කථා කරමින් ''එය සටන් නොකරනු ඇතැ'' යි කී පෙරමුණෙහි යුද හමුදාව ''නියම කළ'' දිනය එන තෙක් නිරාහාරව හා සීතලේ මිදී සිටිනු ඇද්ද? එසේත් නොවේ නම්, ගොවි ජනතා කැරැල්ල ''ආරාජිකත්වය'' හා ''යුදෙව් සංහරය'' යනුවෙන් ඔබ විසින් විස්තර කරනු ලබන නිසා, හෝ කෙරෙන්ස්කි ගොවිජනතාවට විරුද්ධව ''යුද්ධ'' හමුදා යවනු ඇති නිසා හෝ, එම කැරැල්ල සිවිල් යුද්ධයේ සාධකයක් නොවී

තිබෙනු ඇද්ද? එසේ නැතහොත්, ගොවිජන රටක ගොවිජනතා කැරැල්ල මර්දනය කරමින් සිටින ඒ ආණ්ඩුවටම, සන්සුන් ලෙස, අවංකව සහ රැවටිල්ලෙන් තොරව, ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය කැඳවීමට කටයුතු කළ හැකි යයි සිතන්නට පුළුවන්ද?

''ස්මොල්නි ආයතනයේ පවතින වියවුල''[96] ගැන සිනා නොවන්න, මහත්වරුනි! ඔබේ පිරිස් අතර පවතින වියවුල ඊට දෙවැනි නොවේ. සිවිල් යුද්ධයේ බරපතල ප්‍රශ්නවලට ඔබ පිළිතුරු දෙන්නේ අවුල් වදන් සහ ව්‍යවස්ථානුකූල මායාවන් ඉදිරිපත් කිරීමෙනි. මෙම අන්දම්වලට බොල්ෂෙවික්වරු ඉඩ දුනහොත් ඔවුන්ගේ පක්ෂය හා විප්ලවය විනාශ කිරීමක් වන බව මා කියන්නේ එනිසාය.

1917 ඔක්තෝබර් 1

එන්. ලෙනින්

1917 සැප්තැම්බර් අග දී හා ඔක්තෝබර් 1 දිනවල ලියන ලදී

1917 ඔක්තෝබර් මස ''ප්‍රස්වෙශේනිය'' සඟරාවේ කලාප අංක 1—2 හි පළ කරන ලදී

සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 34, පිටු 287—339

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

මධ්‍යම කාරක සභාවට, මොස්කව් සහ පෙට්‍රොග්‍රෑඩ් කාරක සභාවලට සහ පෙට්‍රොග්‍රෑඩ් හා මොස්කව් සෝවියට් සභාවල බොල්ෂෙවික් සාමාජිකයින්ට ලිපිය

ප්‍රිය සහෝදරවරුනි, ඇති වන සිදුවීම් විසින් අපට භාර කර්තව්‍යය ඉතා පැහැදිලි ලෙස නියම කරනු ලැබේ. එනිසා ප්‍රමාද වීම ඒකාන්ත වශයෙන්ම සාපරාධීය.

ගොවිජන ව්‍යාපාරය වර්ධනය වෙයි. ආණ්ඩුව එහි තදබල මර්දනකාරී පියවරයන් උත්සන්න කරයි. යුද්ධ හමුදව තුළ අප කෙරෙහි හිතවත් කම වර්ධනය වෙයි. (මොස්කව් සොල්දාදුවන් සියයට 99 ක් අපට ඡන්දය දුන්හ. පින්ලන්තයේ යුද්ධ හමුදව සහ නාවුක හමුදව ආණ්ඩුවට විරුද්ධය. එසේම පොදු වශයෙන් පෙරමුණ ගැන දූබාසව් දුන් සාක්ෂිය ඇත).

ජර්මනියේ විප්ලවයක ආරම්භය පැහැදිලිව පෙනේ. විශේෂයෙන්ම සේලරුවන් වෙඩි තබා මැරීමෙන් පසු එය පැහැදිලිය. මොස්කව් මැතිවරණයෙන් බොල්ෂෙවික්වරුන්ට සියයට 47 ක් — මෙය මහා විශාල ජයග්‍රහණයකි. අප වාම සමාජවාදී විප්ලවවාදීන් සමග එක් වූ විට රටේ පැහැදිලි බහුතරයක් අපට ඇත.

දුම්රිය සහ තැපැල් සේවකයෝ ආණ්ඩුව සමග සට්ටනය වෙති. ඔක්තෝබර් 20 දිනට සම්මේලනය කැඳවනවා වෙනුවට ඔක්තෝබරය අගදී ආදී වශයෙන් එය කැඳවීම ගැන ලිබර්දන්ලා දූනටමත් කථා කරමින් සිටිති.

එවැනි තත්ත්වයන් යටතේ බලා ''සිටීම'' යනු අපරාධයක් වනු ඇත.

සෝවියට් සභා සම්මේලනය එන තෙක් සිටීමට බොල්ෂෙවික්වරුන්ට අයිතියක් නැත. ඔවුහු අප්‍රමාදවම බලය අත්පත් කර ගත යුත්තාහ. එසේ කිරීමෙන් (එසේ නොකළහොත් සියළුම රටවල අධිරාජ්‍යවාදීන් අතර ජාවාරමකට ඉඩ තිබේ. ජර්මනියේ වෙඩි තැබීම්වලින් පසුව ඔවුන් එකිනෙකාට සහන දෙමින් අපට විරුද්ධව එක්සත් වනු ඇත.) ඔවුන් ලෝක විප්ලවයත්, (එසේ නොකළහොත් අරාජිකත්වයේ රැල්ල අපට වඩා ශක්තිමත් විය හැකිය.) රුසියානු විප්ලවයත්, යුද්ධ පෙරමුණේ ලක්ෂ ගණන් ජනයාගේ ජීවිතත් මුදා ගනු ඇත.

ප්‍රමාදය සාපරාධීය. සෝවියට් සභා සම්මේලනය එන තෙක් බලා සිටීම විධි ක්‍රම පිළිබඳ ළදරු ක්‍රීඩාවක්, විධික්‍රම පිළිබඳ අශෝභන ක්‍රීඩාවක් සහ විප්ලවය පාවාදීමක් වනු ඇත.

කැරලි ගසා සිටීමකින් තොරව බලය දිනා ගත නොහැකි නම්, අපි වහාම කැරලි ගසා නැගී සිටීම කළ යුත්තෙමු. නිදසුනක් ලෙසට මොස්කව් සෝවියට් සභාව වහාම බලය ගන්නේ නම් සහ (පෙට්‍රොග්‍රෑඩ් සෝවියට් සභාවද සමග) තමන් ආණ්ඩුව වන බව ප්‍රකාශයට පත් කරන්නේ නම්, කැරලි ගසා නැගී සිටීමකින් තොරව, මෙම මොහොතේ බලය දිනා ගැනීමට පුළුවන් විය හැක. මොස්කව්හි ජයග්‍රහණය සහතික වී තිබේ. එනිසා එහි සටන් කිරීමේ අවශ්‍යතාවයක් නොමැත. පෙට්‍රොග්‍රෑඩයට තව ප්‍රමාද විය හැකිය. තමන්ගේ ගැලවිල්ල සඳහා ආණ්ඩුවට කළ හැකි කිසිවක් නැත. එනිසා එය යටත් වනු ඇත.

බලය අල්ලා ගැනීමෙන් සහ බැංකු, පැක්ටරි හා ''රුස්කය ස්ලෝව'' අත්පත් කර ගැනීමෙන්, මොස්කව් සෝවියට් සභාවට දැවැන්ත පදනමක් හා දැවැන්ත ශක්තියක් ලැබෙන නිසා, රුසියාව මුළුල්ලේම ව්‍යාපාරයක් ගෙන යමින්, එයට තර්කය මෙසේ ඉදිරිපත් කිරීමට හැකි වනු ඇත: බොනපාට්වාදී කෙරෙන්ස්කි යටත් වන්නේ නම් (ඔහු යටත් නොවේ නම් අපි ඔහු නොරපා දමමු) අපි හෙටම සාමය යෝජනා කරමු. අපි වහාම ගොවීනට ඉඩම් භාර දෙන්නෙමු. අපි දුම්රිය සහ තැපැල් සේවකයන්ට වහාම සහනයන් දෙන්නෙමු. ඒ ආදී වශයෙනි.

''ආරම්භය'' පෙට්‍රොග්‍රෑඩයෙන් වීම අවශ්‍ය නැත. ලේ වැගිරීමක් නොමැතිව ''ආරම්භය'' මොස්කව් නගරයෙන් කෙරෙන්නේ නම්, 1) යුද්ධ පෙරමුණේ හමුදව එහි හිතවත් කම දැක්වීමෙන්ද, 2) සෑම තැනෙකම ගොවි ජනයාද, 3) නාවුක හමුදව සහ පෙට්‍රොග්‍රෑඩය බලා එනු ඇති පින්ලන්තයේ සිටින හමුදද, ඒකාන්ත වශයෙන් එහි ආධාරයට එනු ඇත.

කෙරෙන්ස්කිට පෙට්‍රොග්‍රෑඩය අසල අශ්වාරෝහක හමුදවක් දෙකක් ඇතත්, ඔහුට යටත් වීමට සිදු වනු ඇත. පෙට්‍රොග්‍රෑඩ් සෝවියට් සභාවට ප්‍රමාද වෙමින් මොස්කව් සෝවියට් ආණ්ඩුවට පක්ෂව ව්‍යාපාරයක් ගෙන යා හැක. සටන් පාඨය මෙයයි: සෝවියට් සභාවලට බලය; ගොවීන්ට ඉඩම්, ජාතීන්ට සාමය; සාගින්නේ සිටින්නවුනට පාන්!

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ජයග්‍රහණය සහතිකය. එය ලේ වැගිරීමෙන් තොර ජයග්‍රහණයක් වීමට දහයෙන් නමයක්ම ඉඩ ඇත.

බලා සිටීම විප්ලවයට කරන අපරාධයක් වන්නේය.

ශුභ පැතුම්

එන්. ලෙනින්

1917 ඔක්තෝබර් 1(14) දින ලියන ලදී.

සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 34, පිටු 340—341

ප්‍රථමයෙන් 1921 දී එන්. ලෙනින් (වී උල්යානොව්) කෘති, වෙළුම 14, 2 වැනි කොටසෙහි පළ කරන ලදී

ප්‍රේක්ෂකයෙකුගේ උපදෙස්

මා මෙය ලියන්නේ ඔක්තෝබර් 8 වැනි දිනය. මෙය පෙට්‍රොග්‍රෑඩ් සහෝදරවරුනට 9 වැනි දින ලැබේය යන්න ගැන තැබිය හැක්කේ මද විශ්වාසයකි. උතුරු දිසාවේ සෝවියට් සභා සම්මේලනය ඔක්තෝබර් 10 දිනට නියම කර තිබෙන නිසා[98] මෙය පමණට වඩා ප්‍රමාදවී ලැබෙන්නට පිළිවන. එසේ වුවත්, මගේ "ප්‍රේක්ෂකයෙකුගේ උපදෙස්" එවන්නෙමි. පෙට්‍රොග්‍රෑඩයේ සහ මුළු දිසාවේම කම්කරුවන් සහ සොල්දදුවන් ආරම්භ කරනු ඇති සටන ඉක්මණින්ම සිදු වුවත්, එය තවමත් ක්‍රියාත්මක වී නැත්නම්, මෙම උපදෙස් ප්‍රයෝජනවත් විය හැක.

සෝවියට් සභාවලට මුළු බලය අත් විය යුතු බව නිසැකය. නිර්ධන පංති විප්ලවවාදී බලයට (නැතහොත්, බොල්ෂෙවික් බලයට — දැන් ඒ දෙකම එකය) පොදු වශයෙන් සමස්ත ලෝකයේම, විශේෂයෙන්ම, යුද්ධකාරී රටවල වැඩ කරන සහ සූරා කනු ලබන ජනතාවගේ සහ විශේෂයෙන්ම, රුසියානු ගොවි ජනතාවගේ, ඉහළම හිතවත්කම හා කොන්දේසි විරහිත සහයෝගය ලැබෙන බවද, සෑම බොල්ෂෙවික්වරයෙක්ම එසේම අවිවාදයෙන් පිළිගත යුතුය. මෙම ඉතාමත් සුප්‍රසිද්ධ සහ බොහෝ කලක සිට තහවුරු වී තිබෙන සත්‍යයන් ගැන නැවත කරුණු විස්තර කිරීම අවශ්‍ය නැත.

විස්තර කළ යුතු කරුණ, සමහර විට සියළුම සහෝදරවරුන්ට මනාව පැහැදිලි නොවූ දෙයක් වන්නට පිළිවන. එනම්, දැන් සෝවියට් සභාවලට බලය පැවරීම යනු ආයුධ සන්නද්ධ නැගී සිටීමක් වන බවය. මෙය පැහැදිලිව පෙනෙන දෙයක් නමුත්, මෙම කරුණ ගැන කල්පනා කළේ හෝ කල්පනා කරන්නේ හෝ හැම දෙනෙක්ම නොවේ. දැන් ආයුධ සන්නද්ධ නැගී සිටීම ප්‍රතික්ෂේප කිරීම යනු බොල්ෂෙවික්වාදයේ මූලික සටන් පාඨය (සෝවියට් සභාවලට මුළු බලය පවරනු) සහ සාමාන්‍ය වශයෙන් නිර්ධන පංති විප්ලවවාදී ජාත්‍යන්තරවාදය ප්‍රතික්ෂේප කිරීමකි.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

එහෙත් ආයුධ සන්නද්ධ නැගිටීම විශේෂ දේශපාලන අරගල ක්‍රමයකි. එය විශේෂ නීතිවලට යටත්ය. එම නීති ගැන අවධානයෙන් යුතුව සිතා බැලිය යුතුය. කාල් මාක්ස්, ''කැරලි ගසා නැගී සිටීම යුද්ධයට සමාන කලාවකි'' යනුවෙන් ලියන විට ඔහු මෙම සත්‍යය විශිෂ්ට පැහැදිලි තාවයකින් යුතුව ප්‍රකාශ කළේය.

මෙම කලාවේ ප්‍රධාන නීති අතුරෙන් මාක්ස් විසින් සටහන් කරන ලද ඒවා මෙසේය:

1) කැරලි ගසා නැගී සිටීම කිසි කලෙකත් ක්‍රීඩාවක් කොට නොගන්න, එහෙත් එය ආරම්භ කරන විට ඔබ මුළු දුරම යායුතු බව තරයේ අවබෝධ කර ගන්න.

2) තීරණාත්මක තැනදී හා තීරණාත්මක මොහොතේ දී අතිමහත් වැඩි බලයක් සංකේන්ද්‍රණය කරන්න. එසේ නොකළහොත් වඩාත් සූදනම් සහිතව සහ සංවිධානව සිටීමේ වාසිය ඇතිව සිටින සතුරා කැරලි කරුවන් විනාශ කරනු ඇත.

3) කැරලි ගසා නැගී සිටීම ආරම්භ වූ පසු, උසස්තම අධිෂ්ඨාන ශක්තියෙන් කටයුතු කරන්න. එසේම සැම ආකාරයෙන්ම හා නොවරදවාම ප්‍රහාරයෙහි යෙදෙන්න. ''ආරක්ෂක තත්ත්වයට වැටීම සෑම ආයුධ සන්නද්ධ නැගී සිටීමකම මරණය වන්නේය.''

4) සතුරා බලාපොරොත්තු විරහිත තත්ත්වයෙන් ගෙන ඔහුට පහර දිය යුතුය. එසේ පහර දීම සඳහා ඔහුගේ බලවේගයන් විසිරී තිබෙන මොහොත තෝරා ගත යුතුය.

5) ඔබ දින පතාම (නගරයක නම්, පැයක්, පැයක් පාසා යයි, කෙනෙකුට කිව හැකිය) කොතරම් කුඩා වූ හෝ ජයග්‍රහණ ලැබීමට ප්‍රයත්න දැරිය යුතුය. එසේම කුමණ ආකාරයෙන් හෝ ''සදචාරමය වැඩි ශක්තිය'' රැක ගත යුතුය.

විප්ලවවාදී උපක්‍රම පිළිබඳව මෙතෙක් දක්නා ලද ශ්‍රෙෂ්ඨතම විශාරදයා වූ දන්තොන්ගේ මෙම වචනවලින් මාක්ස් සියළු විප්ලවවලින් ලැබෙන, ආයුධ සන්නද්ධ නැගී සිටීම් හා සම්බන්ධ පාඩම් සම්පිණ්ඩනය කර දක්විය: ධෛර්යය, ධෛර්යය, නැවතත් ධෛර්යය.[99]

රුසියාවට සහ 1917 ඔක්තෝබරයට ගලපන ලද කල, එහි අර්ථය මෙයයි: පෙට්‍රොග්‍රෑඩයට එක්වරම, හැකි තරම් ක්ෂණික ලෙස හා වේගවත් ලෙස පහරදීමකි. එය නොවරදවාම, ඇතුලතින් හා පිටතින්ද, කම්කරු පංති වාසස්ථානවලින් හා පින්ලන්තයෙන්ද, රෙවල් සිට හා ක්‍රොන්ෂ්ටාට් සිටද, දෙන පහරක් හා මුළු මහත් නාවුක හමුදාවේම ප්‍රහාරයක්ද විය යුතුය. එය 15.000 ක් හෝ 20.000 ක් (සමහර විට ඊට වැඩි) ''ධනපති ආරක්ෂක බලකායට'' (යුංකර්වරුන්), අපගේ ''ප්‍රතිවිප්ලව හමුදාවලට'' (කොසාක්-වරුන්ගෙන් කොටසකි), ආදීන්ට විරුද්ධව යෝධ වැඩි බලයක් සහිත බල හමුද සංකේන්ද්‍රණයක් විය යුතුය.

නොවරදවාම (අ) දුරකථන හුවමාරු මධ්‍යස්ථානය, (ආ) විදුලි පණිවුඩ කාර්යාලය, (ඇ) දුම්රිය ස්ථාන සහ (ඈ) ප්‍රධාන වශයෙන්ම පාළම් නොවරදවාම අත්පත් කර ගැනීමට සහ අල්ලා ගෙන සිටීමට හැකි වන ආකාරයට අපගේ ප්‍රධාන බල හමුද තුන වන නාවුක හමුදාව, කම්කරුවන් සහ යුද්ධ හමුද කණ්ඩායම් ඒකාබද්ධ කළ යුතුය.

වඩාත්ම බලවත් අධිෂ්ඨාන ශක්තියක් ඇති කොටස් (අපගේ ''වේග ප්‍රහාරක හමුද'' සහ තරුණ කම්කරුවන්ද, එමෙන්ම හොඳම සේලරුවන්ද), වඩාත් වැදගත් ස්ථාන සියල්ලම අල්ලා ගැනීම සහ පහත සඳහන් වැනි වැදගත් කටයුතුවලට සහභාගි වීම පිණිස, කුඩා බල පිරිස් ලෙසට සංවිධානය කළ යුතුය: එම කටයුතු නම්:

පෙට්‍රොග්‍රෑඩය වට කර, අන් ප්‍රදේශවලින් එය වෙන් කිරීම; සේලරුවන්ගේ, කම්කරුවන්ගේ සහ යුද්ධ හමුදවල ඒකාබද්ධ ප්‍රහාරයකින් එය අල්ලා ගැනීම. මෙම කර්තව්‍යය ඉටු කිරීමට කලාව සහ තුන්ගුණයක් එඩිතරභාවයද අවශ්‍යය.

සතුරාගේ ''මධ්‍යස්ථාන'' වලට (නිලධාරී අභ්‍යාස පාසල්, විදුලි පණිවුඩ කාර්යාලය, දුරකථන හුවමාරු මධ්‍යස්ථානය, ආදියට) පහර දීමට හා ඒවා වට කිරීමට රයිපල් සහ බෝම්බවලින් සන්නද්ධ හොඳම කම්කරුවන්ගෙන් සමන්විත බල පිරිස් පිහිටුවීම. ඔවුන්ගේ සංඥා වදන විය යුත්තේ, ''සතුරාට මෙතැනින් යන්නට දෙනවාට වඩා මරණය යහපති'' යන්න!

සටන කිරීමට තීරණය කරන්නේ නම්, නායකයන් දන්තොන්ගේ සහ මාක්ස්ගේ ශ්‍රෙෂ්ට ශික්ෂා පද ක්‍රියාත්මක කරනු ඇතැයි අපි විශ්වාස කරමු.

රුසියානු විප්ලවය සහ ලෝක විප්ලවය යන දෙකෙහිම ජයග්‍රහණය දින දෙකක් තුනක් සටන් කිරීම මත රඳා පවතින්නේය.

1917 ඔක්තෝබර් 8(21) දින
ලියන ලදී

සම්පූර්ණ කෘති, 5 වැනි
මුද්‍රණය, වෙළුම 34
පිටු 382—384

ප්‍රථමයෙන්, 1920 නොවැම්බර්
7 දින ''ප්‍රාව්ද'' අංක 250 පත්‍රයේ
පළ කරන ලදී

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

උතුරු දිසාවේ සෝවියට් සභා සම්මේලනයට සහභාගී වන බොල්ෂෙවික් සහෝදරවරුන්ට ලිපිය

සහෝදරවරුනි! අපගේ විප්ලවය ඉතාමත් අර්බුද සහිත කාලයක් පසු කරමින් සිටී. මෙම අර්බුදය, ලෝක සමාජවාදී විප්ලවයේ වර්ධනය සහ එයට විරුද්ධව අධිරාජ්‍යවාදය කරන අරගලය පිළිබඳ වූ මහා අර්බුදය සමග සම්පාත වන්නේය. ඒ අනුව අපගේ පක්ෂයේ නායකයින්ට යෝධ කර්තව්‍යයක් පැවරෙන්නේය. එය ඉටු කිරීමට අසමත් වුවහොත්, ජාත්‍යන්තර නිර්ධන පංති ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම බිඳ වැටීමේ අන්තරාය එයින් පැන නගින්නේය. තත්ත්වය කෙබඳුද යත්, ප්‍රමාදය ඇත්ත වශයෙන්ම මාරක වනු ඇත.

ජාත්‍යන්තර තත්ත්වය දෙස හැරී බලන්න. ලෝක විප්ලවයක් වර්ධනය වන බව අවිවාදයෙන් පිළිගැනීමට සිදුවේ. චෙක් කම්කරුවන්ගේ උතුරා හැළුණු කෝපය මර්දනය කර තිබෙන්නේ, විශ්වාස කළ නොහැකි තරම් දරුණු කෲරත්වයකිනි. එයින් ඔප්පු වන්නේ ආණ්ඩුව අන්තයටම බියපත් වූ බවය. ඉතාලියේද, ටියුරින්හි පොදු ජන අභිනිර්ගමනයක් දක්නට ලැබිණ.[100] එහෙත් ඒ සියල්ලටම වඩා වැදගත් වන්නේ ජර්මන් නාවුක හමුදාවේ කැරැල්ලය. විශේෂයෙන්ම වර්තමාන තත්ත්වයන් යටතේ, ජර්මනිය වැනි රටක විප්ලවයක් කිරීමට ඇති දැවැන්ත දුෂ්කරතාවයන් කෙනෙකුට සිතා ගත හැකිය. ජර්මන් නාවුක හමුදාවේ කැරැල්ල මහා අර්බුදයක් ඇති බව, එනම්, ලෝක විප්ලවයේ වර්ධනය, පෙන්නුම් කරන්නකි. ජර්මනිය පරාජය කිරීමට කථා කරන අපගේ ජාතොයෝන්මාදවාදීහු, ජර්මන් කම්කරුවන් වහාම වැඩ වර්ජනය කළ යුතු යයි බලකර කියති. එහෙත්, යුද්ධ හමුද අතර කැරැල්ලක් ඇති වීමට වඩා හොඳින් විප්ලවයේ වර්ධනය පෙන්නුම් කරන සලකුණක් ගැන සිතන්නට නොහැකි බව, 1905 — 1917 අත්දැකීම අනුව රුසියානු විප්ලවවාදී ජාත්‍යන්තරවාදීන් වන අපි දන්නෙමු.

ජර්මන් විප්ලවවාදීන්ගේ ඇසින් බලන කල දැන් අපගේ තත්ත්වය කුමක්දැයි මදක් සිතා බලන්න. අප අමතා මෙසේ කීමට ඔවුන්ට පුළුවන: විප්ලවය සඳහා විවෘත ලෙස හඬ නැගූ කෙනෙක් ලෙසට අපට සිටින්නේ ලිබ්ක්නෙහ්ත් පමණය. ඔහුගේ හඬ අපරාධ කරුවන්ගේ සිරගෙයක් තුළ අවහිර කොට තිබේ. විප්ලවයක අවශ්‍යතාවය විවෘත ලෙස පැහැදිලි කර දෙන එකද ප්‍රවෘත්ති පත්‍රයක්වත් අපට නැත. අපට රැස්වීමේ නිදහස නැත. අපට කම්කරු සහ සෙබළ සෝවියට් සභා එකක්වත් නොමැත. අපගේ හඬ පුළුල් පොදුජන කොටස් අතරට නොයන තරම්ය. එසේ වුවත්, ජයග්‍රහණය ලැබීමට ඇති අවස්ථාව සියයට එකක් වුවත්, අපි කැරැල්ලක් ගැසීමට ප්‍රයත්නයක් දරුවෙමු. ඒ අතර, රුසියානු විප්ලවවාදී ජාත්‍යන්තරවාදීන් වන ඔබ දැන් අවුරුදු භාගයක් තිස්සේ නිදහස් ලෙස උද්ඝෝෂණය කර ඇත. ඔබට පුවත්පත් දුසිම් දෙකක් පමණ තිබේ. ඔබට කම්කරු සහ සොල්දාදු සෝවියට් සභා ගණනාවක් ඇත. පෙට්‍රොග්‍රෑඩ් සහ මොස්කව් සෝවියට් සභාවල ඔබ බලවත් තත්ත්වයට පත්ව ඇත. මුළුමහත් බෝල්ටික් නාවුක හමුදාව සහ පින්ලන්තයේ රුසියානු හමුද ඔබට පක්ෂව සිටිති. එසේ තිබියදීද, නැගී සිටින සේ අප ඔබ අමතා කරන හඬ නැගීමට ඔබ ප්‍රතිචාරයක් නොදක්වන්නෙහිය. ඔබගේ නැගී සිටීම සාර්ථක වීමට සියයකින් අනූනමයකම අවස්ථාව ඇතත්, ඔබ ඔබගේ කෙරෙන්ස්කි අධිරාජ්‍යවාදියා නෙරපා නොදමන්නෙහිය.

ඔව්. මෙවැනි අවස්ථාවක, මෙවැනි වාසි දායක තත්ත්වයන් යටතේ, ජර්මන් විප්ලවවාදීන් කරන මෙම හඬ නැගීමට අප ප්‍රතිචාරය දක්වන්නේ... හුදෙක්ම යෝජනාවලින් නම්, අපි ජාත්‍යන්තරයට ද්‍රෝහීන් වන්නෙමු.

තවත් සැලකිල්ලට ගත යුතු කරුණකි. අප ඉතා හොඳින් දන්නා පරිදි, රුසියානු විප්ලවයට විරුද්ධ ජාත්‍යන්තර අධිරාජ්‍යවාදීන් යොදන උපක්‍රම සහ කරන කුමන්ත්‍රණ සීඝ්‍රයෙන් වැඩී වෙමින් පවතී. ජාත්‍යන්තර අධිරාජ්‍යවාදය මොනයම් ආකාරයකින් හෝ විප්ලවය මර්දනය කිරීමේ යුද්ධමය පියවරයන් සහ රුසියාවේ අවාසියට හේතුවන පරිදි ඇති කර ගන්නා සාමයක්, යන මාර්ග දෙකෙන්ම එය මර්දනය කිරීමේ අදහසට සමීප වෙමින් සිටින්නේය. ලෝක සමාජවාදී විප්ලවයේ අර්බුදය උග්‍ර වන්නේත්, නැගී සිටීම අප විසින් ප්‍රමාද කරනු ලැබීම වඩාත් අන්තරාදයක වන්නේත්, එය අපරාධයක් ලෙසට හැඳින්වීමට මට සිතෙන්නේත්, මේ නිසාය.

තවදුරටත්, රුසියාවේ අභ්‍යන්තර තත්ත්වය ගන්න. කෙරෙන්ස්කි සහ සාමාන්‍යයෙන් අධිරාජ්‍යවාදීන් කෙරෙහි ජනතාව තැබූ බොළඳ විශ්වාසය පළ කළ, සම්මුති ගත වන, සුළු ධනපති පක්ෂ අන්ත බංකොලොත් භාවයට පත්ව තිබේ. ඒවායේ බිඳ වැටීම සම්පූර්ණය.

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

ප්‍රජාතන්ත්‍රවාදී සාකච්ඡා සභාවේදී සෝවියට් කියුරියා සභාව සභාගයට විරුද්ධව දුන් ඡන්දයද, ගොවිජන නියෝජිත සෝවියට් සභාවලින් බහුතරය (අවුක්සෙන්තියෙව් සහ කෙරෙන්ස්කිගේ වෙනත් මිත්‍රයන් රඳවා සිටින ඔවුන්ගේ මධ්‍යම සෝවියට් සභාවද නොතකා) සභාගයට විරුද්ධව දුන් ඡන්දයද, වැඩ කරන පංති ජනගහනය ගොවීන් සමග ඉතා කිට්ටු සම්බන්ධකම් ඇතිව සිටින මොස්කව් නගරයේ සියයට 49 ට වැඩි (සහ සොල්දාදුවන් අතරින් දහහත් දහසකින් දහහතර දහසක) ඡන්දයක් බොල්ෂෙවික්වරුන්ට ලැබුණු මැතිවරණයද, යන මේවායින් පෙන්නුම් කෙරෙන්නේ, කෙරෙන්ස්කි කෙරෙහිත්, කෙරෙන්ස්කි සහ සමාගම සමග සම්මුතියට එළඹෙන්නන් කෙරෙහිත්, ජනතාව තැබූ විශ්වාසය සම්පූර්ණයෙන්ම බිඳ වැටී තිබෙන බව නොවේද? ජනතාව මෙම ඡන්දය දීමෙන් කළ ප්‍රකාශයට වඩා පැහැදිලි ලෙස, ''අපට නායකත්වය දෙන්න. අප ඔබ අනුගමනය කරන්නෙමු'' යයි බොල්ෂෙවික්වරුන් අමතා කීමට, ඔවුන්ට තිබෙන කුමණ හෝ මාර්ගයක් ගැන කෙනෙකුට පුළුවන්ද?

එසේ වූ විට, ජනතාවගෙන් බහුතරයක් අප පැත්තට දිනා ගෙන සිටින, එසේම, ප්‍රධාන නගර දෙකෙහිම සෝවියට් සභා දිනාගෙන සිටින අප, බලා සිටිය යුතුද? ඒ කුමක් සඳහාද? ඒ කෙරෙන්ස්කි සහ ඔහුගේ කර්නිලව්වාදී සේනාපතියන් පෙට්‍රොග්‍රෑඩය ජර්මානුන්ට පාවා දෙන තෙක් සහ ඒ අනුව රුසියානු විප්ලවය සම්පූර්ණයෙන් මැඩ දැමීමට කෙළින්ම හෝ වක්‍ර ලෙස, විවෘත ලෙස හෝ රහසින්, බ්‍යුකනන් හා විල්හෙල්ම් යන දෙදෙනාම සමග කුමන්ත්‍රණයට එළඹෙන තෙක්ද?

මොස්කව් ඡන්දය මගින් සහ සෝවියට් සභාවලට තෝරාපත් කිරීම් මගින් ජනතාව බොල්ෂෙවික්වරුන් කෙරෙහි ඔවුන්ගේ විශ්වාසය පළ කර තිබේ. එහෙත්, එපමණක්ද නොවේ. මන්දෝත්සාහය සහ උදාසීනත්වය වර්ධනය වන ලකුණු දකින්නට තිබේ. එය වටහා ගත හැකි කරුණකි. එයින් අදහස් වන්නේ, කැඩෙට්වරුන් සහ ඔවුන්ගේ අන්තේවාසිකයන් බෙරිහන් දෙන ලෙසට, විප්ලවයේ බැස යාමක් නොව, යෝජනා සහ මැතිවරණ කෙරෙහි තැබූ විශ්වාසය අඩු වී යන බවය. විප්ලවයකදී නායක පක්ෂවලින් පොදු ජනතාව ඉල්ලන්නේ වචන නොව ක්‍රියාවන්ය, කථාව නොව අරගලයේදී ලබන ජයග්‍රහණයන්ය. ජනතාව බොල්ෂෙවික්වරුන් කෙරෙහි විශ්වාසය තබා තිබියදී ඔවුන් ක්‍රියාත්මක වීමට අසමත් නිසා බොල්ෂෙවික්වරුන්ද අන් අයට වඩා හොඳ පිරිසක් නොවේය යන අදහස ජනතාව තුළ පිළිසිඳ ගන්නා මොහොත ළං වෙමින් පවතී...

ගොවිජන කැරැල්ල මුළු රට පුරාම පැතිරෙමින් පවතින්නේය. කැඩෙට්වරු සහ ඔවුන්ගේ හෙංචයියලා, ඔවුන්ට හැකි සෑම ආකාරයකින්ම එය සුළු කොට දක්වන බවත්, ඒ අන් කිසිවක් නොව ''කෝලාහල'' සහ

''අරාජිකත්වය'' යයි කියන බවත් ඉතා පැහැදිලිය. ඒ බොරුව නිෂ්ප්‍රභා වන්නේය. විප්ලව මධ්‍යස්ථානවල ඉඩම් ගොවීන්ට භාර දෙනු ලබන නිසා එසේ වන්නේය. ''කෝලාහල'' සහ ''ආරාජිකවාදය'' නිසා කිසිකලෙකත් එවැනි අගනා දේශපාලන ප්‍රතිඵල ලැබී නැත! ගොවි ජන කැරැල්ලේ ව්‍යාපාරයෙන් තමන් අවසාන වශයෙන් ගිලී යාම වැලැක්වීමේ අවියෙන් ''දියල නරෝද්'' සම්මුති කාරයින් හා සමාජවාදී-විප්ලවවාදීන් පමණක් නොව, බ්‍රෙෂ්කෝ-බ්‍රෙෂ්කොව්ස්කය පවා ගොවි ජනතාවට ඉඩම් පවරා දීම ගැන කථා කිරීමට පටන් ගෙන තිබීමෙන්, එම කැරැල්ලේ යෝධ ශක්තිය පෙන්නුම් කෙරේ.

කර්නිලව්වාදි කෙරෙන්ස්කිගේ කොසාක් සේනාංකවලට, ගොවිජන කැරැල්ල කොටස් වශයෙන් මර්දනය කිරීම සාර්ථක කරගත හැකි වන තෙක් අප බලා ගෙන සිටිය යුතුද? (කෙරෙන්ස්කි කර්නිලව්වාදියෙක් ලෙසට සමාජවාදී-විප්ලවවාදීන් විසින්ම මෑතදී හෙළිදරව් කරන ලදී).

අප සියළු දෙනාම අනුමත කළ හා අප කෙළවරක් නැතිව ප්‍රතිරාවය කළ සටන් පාඨයේ නියම අර්ථය සටහන් කර ගැනීමට අප පක්ෂයේ සමහර නායකයන් අසමත්ව සිටිනු පෙනේ. එම සටන් පාඨය, ''සෝවියට් සභාවලට මුළු බලය පවරනු'' යන්නය. මෙම සටන් පාඨයෙන් කැරලි ගසා නැගී සිටීම අදහස් නොකෙරුණු කාල සීමා හා අවස්ථා විප්ලවයේ සය මාසය තුළ තිබුණි. සමහර විට එම කාල සීමාවලින් හා අවස්ථාවලින් අපගේ සහෝදරවරුන් සමහර දෙනෙකුගේ ඇස් නිලංකාර වී ඇති අතර, දැන්, යටත් පිරිසෙයින් මෙම මැද සැප්තැම්බරයේ වත්, මෙම සටන් අපටත් කැරලි ගසා නැගී සිටීම සඳහා කරන ආයාචනයක් හා සමාන වී තිබෙන බව අමතක කිරීමට ඔවුන් යොමු වී සිටිනවා විය හැක.

මේ ගැන කිසිම සැකයක් තිබිය නොහැක. ''දියල නරෝද්'' මෑතදී ''මොනම තත්ත්වයන් යටතේ වුව, කෙරෙන්ස්කි යටත් නොවනු ඇත!'' යි ඔහුට එසේ කළ හැකි කලෙක මෙන්! කීමෙන් මෙම කරුණ ''පොදු ජන'' ආකාරයෙන් පැහැදිලි කළේය.

''සෝවියට් සභාවලට මුළු බලය පවරනු'' යන සටන් පාඨය කැරලි ගසා නැගී සිටීමට කරන හඬ නැගීමක් මිස අන් කිසිවක් නොවේ. කැරලි ගසන ලෙස හා සම්මුතිය ඉවත ලන ලෙස මාස ගණන් තිස්සේ ජනතාවට හඬ නගමින් සිටි අපි, විප්ලවය බිඳ වැටීමේ පූර්වාසන්න අවස්ථාවේ, ජනතාව අප කෙරෙහි විශ්වාසය පළ කර තිබියදීම, ජනතාව කැරලි ගැසීමට මෙහෙය වීමෙහි අපි අසමත් වන්නෙමු නම්, වරද සම්පූර්ණයෙන්ම හා නිසැක වශයෙන්ම අප අතේය.

ජූලි 3—5 දිනවල නිදර්ශනය ගෙන හැර පාමින්, කළු සියය පිරිස්වල උත්සන්න උද්ඝෝෂණය වෙත පෙන්නුම් කරමින්, යනාදී වශයෙන්, අප

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

බිය ගැන්වීමට කැඩෙට්වරු සහ සම්මුති කාරයෝ උත්සාහ කරති. එකල අප තවමත් බහුතරයක් නොවූ නිසා අප අතින් වරදක් සිදුවී යයි මම නොසිතමි. එහෙත් දැන් එය මරණීය වරදක් වනු ඇත. වරදකටත් වඩා නරක දෙයක් වනු ඇත. කළු-සියය පිරිස්වල උද්ඝෝෂණය පැතිරී යාම වටහා ගත හැකි දෙයකි. එය නිර්ධන පංති සහ ගොවි ජනතා විප්ලවයේ වාතාවරණය යටතේ ආන්තික කොටස් උග්‍ර වීමක් වන්නේය. එහෙත් එය නැගී සිටීමට විරුද්ධව තර්කයක් වශයෙන් ඉදිරිපත් කිරීම විකාරයකි. මන්දයත්, ධනපතියන්ට කුලියට සේවය කරන කළු සියය පිරිස්වල බෙලහීනත්වය, එනම් අරගලයේදී කළු සියය[101] පිරිස්වල බෙලහීනත්වය ඔප්පු කිරීම පවා අනවශ්‍ය වන තරමට පැහැදිලි හෙයිනි. අරගලයේදී ඔවුන් ගැන සැලකිල්ලට ගැනීම පවා නොතරම් ය. අරගලයේදී කර්නී-ලව්ට සහ කෙරෙන්ස්කිට විශ්වාසය තැබිය හැක්කේ ම්ලේච්ඡ හමුදාව සහ කොසාක්වරුන් කෙරෙහි පමණකි. තවද, දැන් කොසාක්වරුන් අතර පවා අධෛර්යය පැතිරීමට පටන් ගෙන තිබේ. එපමණක් නොව, ඔවුන්ගේ කොසාක් ප්‍රදේශ තුළම ගොවි ජනතාව ඔවුන් කෙරෙහි සිවිල් යුද්ධයේ තර්ජනය එල්ල කරති.

මා මෙය ලියන්නේ ඔක්තෝබර් 8 වැනි ඉරිදය. ඔක්තෝබර් 10 දිනට පෙර ඔබට මෙය කියවන්නට නොලැබෙනු ඇත. "කෙරෙන්ස්කි පෙට්‍රොග්‍රෑඩයට කොසාක්වරු ගෙනෙන්නේය!" යි වෝර්සෝ යන දුම්රියේ ගමන් කරන ජනයා කියන බව මේ ප්‍රදේශය පසුකර ගිය සහෝදර-යෙකුගෙන් ඇසීමි. මෙය නිසැකවම සිදුවිය හැකි දෙයකි. එය නිවැරදිද යන්න ඉතාමත් සුපරීක්ෂාකාරී ලෙස සොයා නොබලන්නෙමු නම්, එසේම, දෙවැනි වාරයේ බඳවා ගත් කර්නීලව්වාදී හමුදාවල ශක්තිය හා ඒවා බෙදා හැර තිබෙන ආකාරය ගැන අධ්‍යයනයක් නොකරන්නෙමු නම්, එය සම්පූර්ණයෙන්ම අපගේ වරද වනු ඇත.

රාජ්‍ය බලය සෝවියට් සභා අතට පත් වීම වැළැක්වීම පිණිස, එම බලය විසින් වහාම සාමයක් යෝජනා කරනු ලැබීම වැළැක්වීම පිණිස, සියළුම ඉඩම් ගොවි ජනතාවට පවරා දෙනු ලැබීම වළක්වනු පිණිස පෙට්‍රොග්‍රෑඩය ජර්මන්වරුන්ට පාවා දෙනු පිණිස හා තමා ගැලවී ගෙන මොස්කව් නගරයට පැනයාම පිණිස, කෙරෙන්ස්කි නැවතත් පෙට්‍රොග්‍රෑඩය අසලට කර්නීලව් හමුදා ගෙනවුත් ඇත! අපට හැකි තරම් පුළුල් ලෙස පතුරුවා හැරිය යුතු කැරලි ගසා නැගී සිටීමේ සටන් පාඨය එයයි. එය අතිශයින් සාර්ථක සටන් පාඨයක් වනු ඇත.

අපි සමස්ත රුසියා සෝවියට් සභා සම්මේලනය එන තෙක් බලා නොසිටිය යුත්තෙමු. මධ්‍යම විධායක කාරක සභාව එය නොවැම්බරය දක්වා වුව ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. අපි ප්‍රමාද වීමෙන් තවත් කර්නීලව්වාදී

හමුදා ගෙන ඒමට කෙරෙන්ස්කිට ඉඩ නොදිය යුත්තෙමු. පින්ලන්තය, නාවුක හමුදාව හා රේවල් ප්‍රදේශයද, සෝවියට් සභා තුළ නියෝජනය වේ. මේ සියළු කොටස්වලටම වහාම පෙට්‍රොග්‍රෑඩය වෙත, කර්නීලව්වාදී රෙජිමේන්තුවලට විරුද්ධව එක්වර ගමනාරම්භ කිරීමට පුළුවන. එය නාවුක හමුදාවත්, තුවක්කු හමුදාවත්, මැෂින්තුවක්කුත්, එසේම, වීබොර්-ග්හිදී කර්නීලව් සේනාපතියන්ට — කෙරෙන්ස්කි නැවතත් ඔවුන් සමග කුමන්ත්‍රණ කරමින් සිටී — ස්වකීය වෛරයේ උත්සන්නතාවය පෑ හමුදා වැනි යුද්ධ හමුදා දෙකක් හෝ තුනකුත් ඉදිරියට ගමන් කිරීමක් වනු ඇත.

බෝල්ටික් නාවුක හමුදාව පෙට්‍රොග්‍රෑඩයට පැමිණීමෙන් පෙරමුණ ජර්මන්වරුන්ට විවෘත වනු ඇතැයි යන්න හේතුවක් ලෙසට සලකා, දෙවැනි වර බඳවාගත් කර්නීලව් හමුදා විනාශ කිරීමට ඇති අවස්ථාවෙන් ප්‍රයෝජන ගැනීමට ප්‍රතික්ෂේප කිරීම ඉතා බරපතල වරදක් වන්නේය. එයින් පෙරමුණ විවෘත වනු ඇතැයි කර්නීලව්වාදී අපවාද කාරයෙන් කියනු ඇත. ඔවුන්ට ඕනෑම බොරුවක් කිව හැකිය. එහෙත් බොරුවලින් සහ අපවාදවලින් තමන් බියවීමට ඉඩ තැබීම විප්ලවවාදීන්ට තරම් නොවන්-නකි. කෙරෙන්ස්කි පෙට්‍රොග්‍රෑඩය ජර්මානුන්ට පාවා දෙනු ඇත. එය දැන් දහවල් එළිය මෙන් පැහැදිලි කරුණකි. එය එසේ නොවේ යයි කොතරම් සහතික කර කීවත්, එය එසේම වන බවට අපගේ ඇති පූර්ණ අවබෝධය නැති නොවේ. එයට හේතුව කෙරෙන්ස්කිගේ මුළු මහත් ප්‍රතිපත්තියම අනුව බැස ගත යුතු නිගමනය එය වීමය.

කෙරෙන්ස්කි සහ කර්නීලව්වාදීහු පෙට්‍රොගෑඩය ජර්මානුන්ට පාවා දෙනු ඇත්තාහ. එබැවින් කෙරෙන්ස්කි බලයෙන් පහ කොට ප්‍රධාන නගර දෙකෙහිම සෝවියට් සභා බලය අත්පත් කර ගත යුත්තේ, පෙට්‍රොග්‍රෑඩය මුදා ගැනීම පිණිස ය. මෙම සෝවියට් සභා, සියළුම ජාතීන් වෙත වහාම සාමයක් යෝජනා කිරීමෙන්, ඔවුන්ගෙන් ජර්මන් විප්ලවවාදීන්ට ඉටු විය යුතු යුතුකම සපුරාලනු ඇත. ඔවුන් එසේ කිරීම, රුසියානු විප්ලවයට විරුද්ධව කරගෙන යනු ලබන සාපරාධී කුමන්ත්‍රණ, එනම්, ජාත්‍යන්තර අධිරාජ්‍යවාදයේ කුමන්ත්‍රණ, අසාර්ථක කිරීමට ගන්නා තීරණාත්මක පියවරක්ද වන්නේය.

රුසියානු සහ ලෝක විප්ලවය මුදා ගත හැක්කේ, පෙට්‍රොග්‍රෑඩය අසල නවත්වා සිටින කර්නීලව්වාදී බල මූළුවලට විරුද්ධව, පින්ලන්ත-යෙන් හා බෝල්ටික් නාවුක හමුදාවෙන්ද, රේවල් හා ක්‍රොන්ෂ්ටාට්වලින්ද වහාම හමුදා එවීමෙන් පමණකි. එවැනි ඉදිරි ගමනකට ප්‍රධාන නගර දෙකෙහිම කම්කරුවන්ගේ සහ සොල්දාදුවන්ගේ ආධාරය ලැබෙනු ඇති හෙයින්, එසේ ගමන් ගැනීමෙන් දින කීපයක් ඇතුලත කොසාක්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

හමුදවෙන් කොටසක් යටත් වීමත්, ඉන් ඉතිරි කොටස අන්ත පරාජයට පත් වීමත්, කෙරෙන්ස්කි බලයෙන් නෙරපීමත් සිදුවීමට සියයකින් අනූනමයක් ඉඩකඩ තිබේ.

ඇත්ත වශයෙන්ම ප්‍රමාදය මරණීය වනු ඇත.

"සෝවියට් සභාවලට මුළු බලය පවරනු" යන සටන් පාඨය, කැරලි ගසා නැගී සිටීම සඳහා සටන් පාඨයකි. මෙය වටහා ගන්නේ නැතිව හා මෙය ගැන සිතන්නේ නැතිව, මෙම සටන් පාඨය උපයෝගි කරගත් කිසියම් අයෙක් වෙතොත්, ඔහු ඒ ගැන දෙස් තැබිය යුත්තේ තමන්ටමය. තවද, කැරලි ගසා නැගී සිටීම කලාවක් ලෙස සැලකිය යුතුය. ප්‍රජාතන්ත්‍රවාදී සාකච්ඡා සභාවේදී මම එය ගැන බලකර කීවෙමි. දැනුදු ඒ ගැන බලකර කියන්නෙමි. මාක්ස්වාදය අපට උගන්වන දෙය එයයි. රුසියාවේ සහ සාමාන්‍ය වශයෙන් ලෝකයේ දැනට පවතින තත්ත්වයෙන් අපට උගන්වනු ලබන්නේ එයයි.

එය ඡන්දය දීම පිළිබඳ ප්‍රශ්නයක් නොවේ; වාම සමාජවාදී විප්ලව-වාදීන්, නැතහොත්, තවත් ප්‍රාදේශීය සෝවියට් සභා ආකර්ෂණය කර ගැනීමේ හෝ සෝවියට් සභා සම්මේලනයක් හෝ පිළිබඳ ප්‍රශ්නයක් නොවේ. එය පෙට්‍රොග්‍රෑඩ්, මොස්කව්, හෙල්සිංෆෝර්ස්, ක්‍රොන්ෂ්ටාට්, වීබෝර්ග් සහ රේවල් විසින් තීරණය කරනු ලැබිය හැකි හා තීරණය කරනු ලැබිය යුතු කැරලි ගසා සිටීම පිළිබඳ ප්‍රශ්නයකි. කැරලි ගසා නැගී සිටීම ගැන තීරණය කිරීම සහ එය හැකි තරම් මහත් උනන්දුවෙන්, හැකි තරම් හොඳින් සූදනම් කර, හැකි තරම් ඉක්මණින් හා හැකි තරම් ශක්තිමත් ලෙස ක්‍රියාත්මක කිරීම කළ හැක්කේ සහ කළ යුත්තේ පෙට්‍රොග්‍රෑඩය ආසන්නයේම හා පෙට්‍රොග්‍රෑඩය තුළමය.

නාවුක හමුදව, ක්‍රොන්ෂ්ටාට්, වීබොර්ග් සහ රේවල්, පෙට්‍රොග්‍රෑඩය වෙත ඉදිරියට යාමෙහි සමත්ය; ඒවා එසේ ඉදිරියට යා යුතුය. ඔවුන් කර්නීලව්වාදී රෙජිමේන්තු විනාශ කළ යුතුය. ප්‍රධාන නගර දෙකම පුබුදුවා ලිය යුතුය, ගොවි ජනතාවට අප්‍රමාදව ඉඩම් දෙන, සාමය සඳහා වහාම යෝජනා ඉදිරිපත් කරන ආණ්ඩුවක් සඳහා පොදු ජන උද්ඝෝෂණයක් පටන්ගත යුතුය.කෙරෙන්ස්කි ආණ්ඩුව පෙරළා දමා මෙම කරුණු ඉටු කරන ආණ්ඩුවක් පිහිටුවිය යුතුය. ඔවුන්ට එය කළ හැකිය. ඔවුන් එය කළ යුතුය.

ප්‍රමාදය මරණීය වනු ඇත.

1917 ඔක්තෝබර් 8 — එන්. ලෙනින්

ප්‍රථමයෙන්, 1925 නොවැම්බර් 7 දින "ප්‍රාව්දා" අංක 255 කලාපයේ පළ කරන ලදී

සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 34, පිටු 385—390

රු.ස.ප්‍ර.ක.ප. (බො.) මධ්‍යම කාරක සභා රැස්වීම 1917 ඔක්තෝබර් 10 (23)[102]

1

වාර්තාව

රැස්වීමේ වාර්තාවෙන්

සැප්තැම්බරයේ ආරම්භයේ පටන් කැරලි ගසා නැගී සිටීම පිළිබඳ ප්‍රශ්නය ගැන නොසැලකිල්ලක් පානු දක්නට ලැබේ යයි ලෙනින් සහෝදරයා කියයි. සෝවියට් සභා විසින් බලය අල්ලා ගැනීම සඳහා වූ සටන් පාඨය අපි ඉතාමත් බරපතල ස්වභාවයකින් ඉදිරිපත් කරන්නෙමු නම්, එම නොසැලකිල්ලට ඉඩ තැබිය නොහැකිය. එනිසා මෙම ප්‍රශ්නයේ විධි ක්‍රම හා සම්බන්ධ පැත්ත ගැන අවධානය යොමු කිරීමට කාලය එළඹ තිබේ.

එසේ වුවත් ප්‍රශ්නය ඉතා තියුණුය. තීරණාත්මක අවස්ථාව අත ළඟටම පැමිණ ඇත.

ජාත්‍යන්තර තත්ත්වය සලකා බලන කල, අපි ක්‍රියාරම්භකත්වය දැක්විය යුත්තෙමු.

නාර්වා දක්වා දේශ භූමිය පාවා දීමටත්, පෙට්‍රොග්‍රෑඩය පාවා දීමටත් කරන ලබන දේ නිසා අප තීරණාත්මක ලෙස කටයුතු කිරීම අනිවාර්ය වන්නේය.

දේශපාලන තත්ත්වයද සිත් කාවදින ලෙස මෙම දිසාවට යොමු වෙමින් පවතී. ජූලි 3, 4 හා 5 දිනවල අපි තීරණාත්මක ක්‍රියාවන්හි යෙදුනෙමු නම්, එවකට අපට බහුතරයක් නොසිටි නිසා එය අසාර්ථක වන්නට තිබුණි. එයින් පසුව අපි දැවැන්ත ප්‍රගතියක් ලබා ඇත්තෙමු.

ජනතාව නොපැමිණෙන්නේ සහ නොසැලකිල්ලක් දක්වන්නේ, ඔවුන්ට වචන හා යෝජනා අසා ඇති වී තිබෙන නිසාය.

බහුතරයේ අනුගාමිකත්වය අපට ඇත. බලය අල්ලා ගැනීම සඳහා තත්ත්වය දේශපාලන වශයෙන් සම්පූර්ණයෙන්ම මෝරා තිබේ.

ගොවිජන ව්‍යාපාරයද එම දිසාවටම සංවර්ධනය වෙමින් පවතී. එම ව්‍යාපාරයට අවහිර කිරීමට නම් සීමාන්තික ප්‍රයත්නයක් අවශ්‍ය වන බව

https://liberationbase.wordpress.com

පැහැදිලිය. සියළු ඉඩම් පවරා දීම සඳහා වූ සටන් පාඨය ගොවි ජනතාවගේ පොදු සටන් පාඨය වී තිබේ. එනිසා දේශපාලන තත්ත්වය මෝරා තිබේ. අපි විධි ක්‍රම පැත්ත ගැන කථා කළ යුත්තෙමු. ප්‍රශ්නයේ හරවත් කොටස එයයි. එසේ වුවද, ආරක්ෂාවාදීන් මෙන් අපද, නැගී සිටීමක් සඳහා ක්‍රමානුකූල ලෙස සූදනම් වීම දේශපාලන වරදක් මෙන් සැලකීමට නැඹුරු වන තත්ත්වයක් ඇත.

අපගේ පැත්ත නොගනු ඇති ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලයෙන් සිදු විය හැක්කේ අපගේ කර්තව්‍යය තවත් සංකීර්ණ වීම පමණක් හෙයින්, එය එන තෙක් බලා සිටීම අර්ථ විරහිතය.

තීරණාත්මක ලෙස ක්‍රියා කිරීම ඇරඹීම සඳහා ප්‍රාදේශීය සම්මේලනය සහ මින්ස්ක් යෝජනාව[103] උපයෝගි කරගත යුතුය.

ප්‍රථමයෙන් 1922, ''ප්‍රොලිතාර්ස්-කය රෙවලූට්සිය'' සඟරාවේ අංක 10 කලාපයෙහි පළ කරන ලදී	සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 34, පිටු 391-392

2

යෝජනාව

රුසියානු විප්ලවයේ ජාත්‍යන්තර තත්ත්වයද (ලෝක සමාජවාදී විප්ලවය යුරෝපය මුළුල්ලේම වැඩී ගොස් ඇති බව ඉතාමත් විශිෂ්ට ලෙස පෙන්නුම් කරන ජර්මන් නාවුක හමුද කැරැල්ල, රුසියාවේ විප්ලවයේ ගෙල මිරිකා දැමීම අරමුණු කොටගත් සාමයක් ඇති කර ගැනීමේ අධිරාජ්‍යවාදී තර්ජනය), එමෙන්ම, යුද්ධ තත්ත්වයද (පෙට්‍රොග්‍රැඩය ජර්මානුන්ට පාවා දීමට නිසැක ලෙසම රුසියානු ධනපති පංතිය සහ කෙරෙන්ස්කි සහ සමාගම ගත් තීරණය), නිර්ධන පංති පක්ෂය සෝවියට් සභා තුළ බහුතරයක් දිනා ගෙන සිටීමද, මේ සියල්ල සමග ඒකාබද්ධ ලෙස ගොවිජන විප්ලවය සහ අප පක්ෂය කෙරෙහි පොදු ජන විශ්වාසය යොමු වීමද (මොස්කව් මැතිවරණය), අවසාන වශයෙන්, දෙවැනි කර්නිලව් කැරැල්ලක් සඳහා පැහැදිලිවම කරනු ලබන සූදනමද (පෙට්‍රොග්‍රැඩයෙන් හමුද ඉවත් කිරීම සහ පෙට්‍රොග්‍රැඩයට කොසාක්වරුන් යැවීම, කොසාක්වරුන් යොදවා මින්ස්ක් වැටලීම, ආදිය), යන මේ කරුණු සියල්ල සැලකිල්ලට ගත් කල, කැරලි ගසා නැගී සිටීම දවසේ කාර්යය බවට පත්ව ඇතැයි මධ්‍යම කාරක සභාව පිළිගනියි.

එනිසා ආයුධ සන්නද්ධ නැගී සිටීමක් අනිවාරණීය බවත්, ඒ සඳහා කල් යල් පැමිණ ඇති බවත්, සැලකිල්ලට ගන්නා මධ්‍යම කාරක සභාව, ඒ අනුව කටයුතු මෙහෙයවන ලෙසත්, සියළුම ප්‍රායෝගික ප්‍රශ්න මෙම දෘෂ්ටි කෝණය අනුව බලා සාකච්ඡා කර තීරණ ගන්නා ලෙසත් (උතුරු දිසාවේ සෝවියට් සභා සම්මේලනය, පෙට්‍රොග්‍රැඩයෙන් යුද්ධ හමුද ඉවත් කිරීම, මොස්කව්හි හා මින්ස්ක්හි අප ජනයා ගන්නා පියවරයන් ආදිය), සියළුම පක්ෂ සංවිධානවලට උපදෙස් දෙයි.

ප්‍රථමයෙන් 1922 ''ප්‍රොලිතාර්-ස්කය රෙවලූට්සිය'' සඟරාවෙ අංක 10 කලාපයෙහි පළ කරන ලදී	සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 34, පිටු 393

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

රු.ස.ප්‍ර.ක.ප.(බො.) මධ්‍යම කාරක සභා රැස්වීම 1917 ඔක්තෝබර් 16 (29) [104]

1

වාර්තාව

රැස්වීමේ වාර්තාවෙන්

මධ්‍යම කාරක සභාවේ පසුගිය රැස්වීම අනුමත කළ යෝජනාව ලෙනින් සහෝදරයා විසින් කියවන ලදී. යෝජනාව අනුමත කිරීමේදී දෙදෙනෙක් විරුද්ධව ඡන්දය දුන් බව ඔහු සඳහන් කළේය. විරුද්ධ සහෝදරවරුන් ප්‍රකාශයක් කිරීමට කැමති නම්, ඒ ගැන සාකච්ඡාවක් කළ හැක. ඒ අතර ඔහු යෝජනාවේ අරමුණ විස්තර කළේය.

මෙන්ෂෙවික් සහ සමාජවාදි-විප්ලවවාදී පක්ෂ ධනපතියන් සතුටු කරන ඔවුන්ගේ ප්‍රතිපත්තිය අත්හරින්නේ නම්, ඒවා සමග සම්මුතියක් ඇති කර ගැනීමේ යෝජනාවක් ඉදිරිපත් කළ හැකිය. කලින් මෙම යෝජනාව කර ඇති නමුත්, එය ප්‍රතික්ෂේප කරන ලද බව පැහැදිලිය. අනිත් අතට, ඒ වන විට පොදු ජනතාව බොල්ෂෙවික්වරුන්ගේ නායකත්වය පිළිගෙන සිටි බව නිශ්චිතවම පැහැදිලි වී තිබුණේය. ඒ කර්නිලව් කැරැල්ලට ඉහතදී විය. ලෙනින්, ඊට සාක්ෂි වශයෙන් පෙට්‍රොග්‍රෑඩයේ සහ මොස්කව්හි මැතිවරණ ප්‍රතිඵල ගැන සඳහන් කළේය. කර්නිලව් කැරැල්ල නිසා ජනතාව තව තවත් තීරණාත්මක ලෙස බොල්ෂෙවික්වරුන්ගේ පැත්ත ගත්හ. ප්‍රජාතන්ත්‍රවාදී සාකච්ඡා සභාව තුළ බලවේග පෙළගැසී තිබුණේ මෙසේය: එහි තත්ත්වය පැහැදිලි විය. එක්කෝ කර්නිලව් ආඥාදායකත්වය, නැතහොත්, නිර්ධන පංතියේ සහ දුප්පත් ගොවිජන ස්ථරයන්ගේ ආඥාදායකත්වය. ජනතාවගේ ඉරියව්ව වෙනස් විය හැකි නිසා සහ නොමිනිය හැකි නිසා, පක්ෂයට එයින් මග පෙන්වීමක් ගත නොහැකිය. පක්ෂය මග පෙන්වීම ලබා ගත යුත්තේ වාස්තවික ලෙස විප්ලවය ගැන විග්‍රහ කිරීමෙන් සහ අගය කිරීමෙනි. බොල්ෂෙවික්වරුන් කෙරෙහි විශ්වාසය තැබූ පොදු ජනයා, ඔවුන්ගෙන් අපේක්ෂා කළේ වචන නොව ක්‍රියාවන්ය; යුද්ධයට විරුද්ධව සහ ආර්ථික විනාශයට විරුද්ධව කරන අරගලයේදී ස්ථිර ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමය. විප්ලවය පිළිබඳ දේශපාලන විග්‍රහය පදනම වශයෙන් ගන්නේ නම්, අරාජිකවාදී ක්ෂණික අරගලවලින් පාවා තහවුරු වූයේ එය බව ඉතාමත් පැහැදිලි වනු ඇත.

ඊළඟට, යුරෝපයේ විප්ලවය කිරීම රුසියාවටත් වඩා දුෂ්කර වනු ඇතැයි පෙන්වා දුන්නේය. ජර්මනිය වැනි රටක නාවුක හමුදාවේ කැරැල්ලක් ඇති වන තරම් දුරට කරුණු යෙදුනි නම්, එහි අයද බොහෝ දුර ගොස් සිටිනවා විය යුතුය. බොල්ෂෙවික්වරු එම අවස්ථාවේ ක්‍රියාත්මක වුවහොත්, මුළු මහත් නිර්ධන පංතික යුරෝපයම ඔවුන් පැත්ත ගනු ඇති බව නියත වාස්තවික දත්තයන් අනුව පෙනී ගියේය. ධනපති පංතිය පෙට්‍රොග්‍රෑඩය පාවා දීමට අපේක්ෂා කරන බැව් ඔහු පෙන්වා දුන්නේය. එය වැළැක්විය හැකි එකම ක්‍රමය, බොල්ෂෙවික්වරුන් පෙට්‍රොග්‍රෑඩය අල්ලා ගැනීමය. මේ සියල්ලෙන්ම බැස ගැනීමට තිබෙන පැහැදිලි නිගමනය නම්, මධ්‍යම කාරක සභාවේ යෝජනාවෙහි සඳහන් කර තිබෙන ලෙසට, කැරලි ගසා නැගී සිටීම දවසේ කාර්යය වී ඇතැයි යන්නය.

මධ්‍යස්ථානවල නියෝජිතයින්ගේ වාර්තාවලට කන් දීමෙන් පසුව, යෝජනාව අනුව ප්‍රායෝගික නිගමනවලට බැස ගැනීම සුදුසු වනු ඇත. රුසියාවේ සහ යුරෝපයේ පංති අරගලය ගැන දේශපාලන විග්‍රහයක් කිරීමෙන්, ඉතාමත් අධිෂ්ඨාන සහගත සහ ක්‍රියාශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමේ අවශ්‍යතාවය මතුවිය. එම ප්‍රතිපත්තිය අන් කිසිවක් නොව, ආයුධ සන්නද්ධ නැගී සිටීම පමණක්මය.

2

සාකච්ඡාවේදී කළ කථාවලිනි

රැස්වීමේ වාර්තාවෙන්

1

මිලියුතින්ට හා ෂොත්මන්ට විරුද්ධව තර්ක කරමින් කථා කළ ලෙනින් සහෝදරයා පෙන්නුම් කළ පරිදි, විෂය කරුණ වූයේ ආයුධ සන්නද්ධ හමුදා පිළිබඳ ප්‍රශ්නයක් නොව, එය හමුදාවලට විරුද්ධව සටන් කිරීමේ ප්‍රශ්නයක් නොව, යුද්ධ හමුදාවේ එක් කොටසක් එහි තවත් කොටසකට විරුද්ධව සටන් කිරීමය. එහිදී කියා ඇති කරුණුවලින් කිසියම් සර්වාශුභවාදයක් තමාට නොපෙණෙන බව ඔහු කීවේය. ධනපති පංතිය පැත්තේ ඇති බලවේගයන් කුඩා බව ඔහු පෙන්වා දුන්නේය. අපගේ බලවේගයන් වඩාත් බලවත් බව කරුණු අනුව පෙනී ගියේය. මධ්‍යම කාරක සභාවට

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සටන ආරම්භ කළ නොහැකි වීමට හේතුවක් තිබේද? සත්‍ය කරුණු අනුව නිගමනය කළ හැකි හේතුවක් නොමැත. මධ්‍යම කාරක සභාවේ යෝජනාව ප්‍රතික්ෂේප කිරීමට නම්, ආර්ථික විනාශයක් සිදුවී නැති බවත්, ජාත්‍යන්තර තත්ත්වය අවුල් වියවුල් ඇති වීමට තුඩු නොදෙන බවත් ඔප්පු කළ යුතුය. වෘත්තීය සමිති නායකයෝ මුළු බලය ගැනීමට පක්ෂ වූහු නම්, ඔවුහු තමන්ට උවමනා කරන දෙය කුමක්ද යනු හොඳින් දැන සිටියහ. ගොවි ජනතාවට නායකත්වය දිය යුතු බව වාස්තවික කරුණු අනුව පෙනී ගියේය. ඔවුන් නිර්ධන පංතිය අනුගමනය කරනු ඇත.

බොල්ෂෙවික්වරුන්ට බලය රැක ගත හැකි නොවෙතැයි සමහරු බිය වූහ. එහෙත්, එම අවස්ථාවේදී බලය රැක ගැනීම සඳහා වෙන කවරදකටත් වඩා හොඳ අවස්ථාවක් ඔවුන්ට තිබෙන බව දක්නා ලදී.

විවාදය යෝජනාවේ හරයට පමණක් සීමා කිරීම සුදුසු බව ලෙනින් ප්‍රකාශ කළේය.

2

යෝජනා ඒ ආකාරයෙන් පරාජය කරනු ලැබේ නම්, ඊට වඩා හොඳ දෙයක් බලාපොරොත්තු විය නොහැකිය. සිනෝවියව් මෙසේ කීවේය: ''සෝවියට් සභාවලට බලය පවරනු'' යන සටන් පාඨය අත්හැර දමා ආණ්ඩුව කෙරෙහි පලපැම් කරන්න. කැරලි ගසා නැගී සිටීමට කල් යල් පැමිණ තිබේ යයි කියන විට කුමන්ත්‍රණය පිළිබඳ ප්‍රශ්නයක් පැන නගින්නේ නැත. කැරලි ගසා නැගී සිටීම දේශපාලන වශයෙන් අනිවාරණීය හෙයින්, එය කලාවක් සේ සැලකිය යුතුය. දේශපාලන වශයෙන් කැරලි ගසා නැගී සිටීමක් අවශ්‍යව තිබුණේය.

පාන් තිබෙන්නේ එක දවසකට පමණක් සෑහෙන ප්‍රමාණයක් නිසා, ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය එන තෙක් පක්ෂයට බලා සිටිය නොහැකිය. යෝජනාව අනුමත කරන ලෙසත්, ශක්තිමත් ලෙස සූදානම් වීමේ කටයුතුවල යෙදෙන ලෙසත්, කවදද යන්න තීරණය කිරීම මධ්‍යම කාරක සභාවට සහ සෝවියට් සභාවට භාර කරන ලෙසත් ලෙනින් සහෝදරයා යෝජනා කළේය.

3

මෙම විප්ලවය පෙබරවාරි විප්ලවය සමඟ විසංසන්දනය කළ නොහැකි යයි කියමින් ලෙනින් සහෝදරයා සිනෝවියව්ට විරුද්ධ විය. අදළ කරුණ වෙත එක එල්ලේ ඉලක්ක කළ යෝජනාවක් ඔහු විසින් ඉදිරිපත් කරන ලදී.

3

යෝජනාව

මධ්‍යම කාරක සභාවේ යෝජනාවට සම්පූර්ණ සහයෝගය දක්වන මෙම රැස්වීම, කැරලි ගසා නැගී සිටීමක් සඳහා සර්ව පාර්ශ්වීය ලෙස හා බලවත් ලෙස සූදනම් වන සේද, මධ්‍යම කාරක සභාව ඒ සඳහා පිහිටුවන මධ්‍යස්ථානයට ආධාර කරන සේද, සියළුම සංවිධානවලට, කම්කරුවන්ට ආයාචනා කරයි. පහර දීමට සුදුසු ඉතාමත් වාසිදයක අවස්ථාව සහ පහරදීමට ඉතාමත් සුදුසු ක්‍රමය මධ්‍යම කාරක සභාව විසින් කල්යල් ඇතිව පෙන්නුම් කෙරෙනු ඇතැයි යන විශ්වාසය මෙම රැස්වීම විසින් පළ කරනු ලැබේ.

ප්‍රථමයෙන් 1917 දී ''ප්‍රොලිතාර්ස්කය රෙවලූට්සිය'' සඟරාවේ අංක 10 කලාපයේ පළ කරන ලදී

සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 34, පිටු 394-397

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

බොල්ෂෙවික් පක්ෂ සාමාජිකයන්ට ලිපිය[105]

සහෝදරවරුනි,

ඔක්තෝබර් 18 බදාදා පෙට්‍රොග්‍රෑඩ් පත්‍ර මට තවමත් ලබා ගත හැකි නොවීය. අපාක්ෂික "නෝවය ෂිස්න්" පත්‍රයෙහි වූ කාමෙනෙව්ගේ සහ සිනෝවියව්ගේ සම්පූර්ණ ප්‍රකාශය මට දුර කථනයෙන් කියවන විට, මම එය විශ්වාස නොකළෙමි. එහෙත් ඒ ප්‍රකාශය කරන ලදැයි යන්න ගැන සැකයක් තිබිය නොහැකි බව පෙනී යන නිසා බ්‍රහස්පතින්ද සවස හෝ සිකුරාද උදය වන විට පක්ෂ සාමාජිකයන් වෙතට ලිපියක් ලැබෙන්නට සැලැස්වීමට මම මේ අවස්ථාවෙන් ප්‍රයෝජන ගනිමි. එවැනි පෙර නොඇසූ විරූ හොරිකඩ කමක් ගැන නිහඬව සිටීම අපරාධයක් වනු ඇත.

ප්‍රායෝගික ප්‍රශ්නය වඩාත් බරපතල වූ තරමට, හොරිකඩකම් කිරීමේ වරදට හසුවන අය, වඩාත් වගකිව යුතු සහ "ප්‍රකට" පුද්ගලයන් වූ තරමට, එය වඩාත් අන්තරාදයක වන්නේය. එනිසා, වඩාත් දැඩි ලෙස පා පහරදී ඔවුන් නෙරපා දැමිය යුතු අතර හොරිකඩයන්ගේ ඉහත "සේවාවන්" ගැන සැලකීම පවා කිසිසේත් සමාව දිය නොහැකි ක්‍රියාවක් වනු ඇත.

මොහොතක් සිතන්න! පක්ෂය සැප්තැම්බරයේ පටන් කැරලි ගසා නැගී සිටීමක් පිළිබඳ ප්‍රශ්නය සාකච්ඡා කරමින් සිටි බව පක්ෂයේ පිරිස් දැන සිටියහ. එහෙත් නම් කරන ලද පුද්ගලයන් දෙදෙනාගෙන් එක් අයෙකුගෙන් හෝ එකම ලිපියක්වත්, නැතහොත්, එකම ප්‍රකාශනයක්වත් ගැන කිසිවෙකුටත්, කිසිම දිනක අසන්නට නො ලැබුණි! දැන්, සෝවියට් සභා සම්මේලනයේ පූර්වාසන්නය ලෙසට කෙනෙකුට විස්තර කළ හැකි අවස්ථාවේ, ප්‍රකට බොල්ෂෙවික්වරු දෙදෙනෙක් බහුතරයට විරුද්ධව හා පැහැදිලි ලෙසටම, මධ්‍යම කාරක සභාවට විරුද්ධව ඉදිරිපත් වී සිටිති. පැහැදිලි ලෙසටම එසේ කියා නැත. එහෙත්, ඉඟියෙන් කථා කිරීම වඩාත් භයානක නිසා, එයින් ව්‍යාපාරයට වන හානිය වඩාත් බරපතලය.

කාමෙනෙව්ගේ සහ සිනෝවියව්ගේ ප්‍රකාශයෙන් ඉතා පැහැදිලිව පෙනෙන්නේ ඔවුන් මධ්‍යම කාරක සභාවට විරුද්ධ වූ බවය. නො එසේ නම් ඔවුන්ගේ ප්‍රකාශයෙහි අර්ථයක් නොමැත. එහෙත් ඔවුන් එකඟ නොවන්නේ මධ්‍යම කාරක සභාව ගත් කුමණ නිශ්චිත පියවරටද යන්න ඔවුහු නොකියති.

ඒ මන්ද?

ඊට හේතුව එක්වරම පෙනෙන්නේය: ඒ එම තීරණය මධ්‍යම කාරක සභාව විසින් පළ කරනු ලැබ නොමැති බැවිනි.

දැවෙන හා අතිශයින්ම වැදගත් ප්‍රශ්නයක් ගැන, පක්ෂ මධ්‍යස්ථානය ගත් ප්‍රසිද්ධ නොකළ තීරණයකට විරුද්ධව, "ප්‍රකට බොල්ෂෙවික්වරු" දෙදෙනෙක්, තීරණාත්මක දිනය වන ඔක්තෝබර් 20 පූර්වා සන්නයේදී පහර දෙති. තවද ඔවුන් මෙම පහර දීම කරන්නේ අපාක්ෂික පත්‍රයක් මගිනි. එපමණක් නොව, එම පහර දීම කරන්නේ, මෙම ඒකාන්ත ප්‍රශ්නයේදී, ධනපති පංතිය සමග තරයේ අත්වැල් බැඳ ගෙන, කම්කරුවන්ගේ පක්ෂයට විරුද්ධව සිටින පත්‍රයක් මගිනි!

මෙය නිදසුනක් වශයෙන්, 1906-1907 කාලයේදී ප්ලෙහානව් අපාක්ෂික පත්‍ර මගින් ඉදිරිපත් කළ හා පක්ෂය විසින් ඉතාමත් තියුණු ලෙස හෙළා දකින ලද ඒ ප්‍රකාශයන් සියල්ලටම වඩා, දහස් වාරයක් නින්දනීය වේ; ඊට වඩා දශ ලක්ෂ වාරයෙක් හානිදායක වේ!

ඒ අවස්ථාවේ අප මුහුණ පා සිටියේ මැතිවරණයක් පිළිබඳ ප්‍රශ්නයට පමණකි. එහෙත් දැන් අප මුහුණ පා සිටින්නේ බලය අල්ලා ගැනීම සඳහා කැරලි ගසා නැගී සිටීමක් පිළිබඳ ප්‍රශ්නයටය!

මධ්‍යම කාරක සභාව එවැනි වැදගත් ප්‍රශ්නයක් ගැන තීරණයක් ගත් පසු, පළ නොකරන ලද මෙම තීරණයට විරුද්ධව අපාක්ෂික පත්‍රයක් මගින් රොද්ස්යන්කෝලා සහ කෙරෙන්ස්කිලා ඉදිරියේ වාද විවාද කිරීමක් වන මෙයට වඩා ද්‍රෝහි කමක් හෝ හොරිකඩ කමක් හෝ ගැන සිතිය හැකිද?

කලින් සහෝදරවරුන් වූ මොවුන් සමග මා ඉහතදී පැවැත්වූ සමීප සම්බන්ධකම් සලකා, මා ඔවුන් හෙළා දැකීමට පැකිලෙන්නේ නම්, එය මගේ නින්දිත කමක් ලෙස මම සලකන්නෙමි. මින් පසු මා ඔවුන් දෙදෙනාගෙන් එකෙක් හෝ සහෝදරයෙක් ලෙසට නොසලකන බවද, ඔවුන් දෙදෙනාම පක්ෂයෙන් නෙරපා දැමීම සඳහා මධ්‍යම කාරක සභාවේදී සහ සම්මේලනයේදී යන දෙකෙහිදීම මගේ මුළු ශක්තිය යොදා සටන් කරන බවද, මම ප්‍රකාශ කරමි.

මධ්‍යස්ථානය විසින් ගන්නා ලද හා පළ නොකරන ලද තීරණ සම්මත කිරීමෙන් පසුව, ඒවාට විරුද්ධව අපාක්ෂික පත්‍ර මගින් වාද විවාද

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කෙරෙන්නේ නම් හා සටන් කරු පිරිස් අතරට අස්ථිර භාවය සහ වියවුල ගෙන එන්නේ නම්, කැරලි ගසා නැගී සිටීමේ අවශ්‍යතාවය වඩ වඩාත් නිරන්තර ලෙස සිදුවීම් රාශිය විසින් තමන් හමුවේ මතු කෙරෙන තත්ත්වයක පසුවන කම්කරු පක්ෂයකට, එම දුෂ්කර කර්තව්‍යය ඉටු කළ හැකි නොවන්නේය.

වික්ෂිප්ත තත්ත්වයේ සිටින ජනයා දුසිම් ගණනක් හෝ ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලයට තේරී පත්වීමට ඉදිරිපත් වන අපේක්ෂකයන් හෝ එකතු කරගෙන, සිනෝවියව් මහතා හා කාමෙනෙව් මහතා ඔවුන්ගේම පක්ෂය පිහිටුවා ගත්තා වේ. එම පක්ෂයේ සටන් පාඨය පහත සඳහන් පරිදි වනු ඇති හෙයින් කම්කරුවෝ එවැනි පක්ෂයකට නොබැඳෙති. එම සටන් පාඨය මෙසේය:

> "තීරණාත්මක සටනක් කිරීම පිළිබඳ ප්‍රශ්නයේදී මධ්‍යම කාරක සභාවේදී පරාජය වූ මධ්‍යම කාරක සභාවේ සාමාජිකයින්ට, පක්ෂයේ පළ නොකරන ලද තීරණවලට පහර ගැසීම සඳහා අපාක්ෂික පුවත්පත් උපයෝගී කර ගැනීමට අවසර දෙනු ලැබේ."

ඔවුන්ට එවැනි පක්ෂයක් ගොඩ නගා ගන්නට ඉඩ හරිමු. අපගේ බොල්ෂෙවික් පක්ෂයට එයින් සිදුවනු ඇත්තේ යහපතක් පමණකි.

ලියවිලි සියල්ල පළ කළ පසු, සිනෝවියව්ගේ කාමෙනෙව්ගේ හොරිකඩකම තවත් සිත් කාවදින ලෙස ප්‍රකට වනු ඇත. ඒ අතර කම්කරුවන් පහත සඳහන් ප්‍රශ්නය සලකා බැලීම සුදුසුය:

> "සමස්ත රුසියා වෘත්තීය සමිතියක කාරක සභාවක් මාසයක් තිස්සේ සාකච්ඡා කර, වැඩ වර්ජනය සඳහා කටයුතු සූදානම් කළ යුතු බවත්, නමුත්, එම අවස්ථාවේ ඒ සඳහා නියම කරන දිනය හෝ විස්තර කිසිවක් හෙළිදරව් නොකළ යුතු බවත් සියයට අසූවක වැඩි ඡන්දයෙන් තීරණය කළහයි සිතමු. තීරණය ගැනීමෙන් පසුව, "විරුද්ධ මතය" ඉදිරිපත් කිරීමේ මුවාවෙන්, ප්‍රාදේශීය කණ්ඩායම් වෙත ලිපි යවමින්, එම තීරණය නැවත සලකා බලන ලෙස ඉල්ලීම පමණක් නොව, ඔවුන්ගේ එම ලිපි අපාක්ෂික පත්‍රවලට ලැබෙන්නට ඉඩ හැරීමද, එම විධායක කාරක සභාවේ සාමාජිකයන් දෙදෙනෙක් විසින් කරන ලදැයි සිතමු. අවසාන වශයෙන්, තීරණය තවමත් ප්‍රසිද්ධ නොකර තිබිය දීම, ඔවුන් අපාක්ෂික පත්‍රවලට ලියමින් එම තීරණයට පහර දීමෙහි හා ධනපතියන් ඉදිරියේ වැඩ වර්ජනය අපහාසයට ලක් කිරීමෙහි යෙදෙතැයි සිතමු.

> "එවැනි හොරිකඩයන් තමන් අතරෙන් නෙරපා දැමීමට කම්කරුවෝ පැකිළෙති දැයි අපි ප්‍රශ්න කරමු."

* * *

ඔක්තෝබර් 20 දිනය මෙතරම් අත ළඟටම පැමිණ ඇති මෙම අවස්ථාවේ, කැරලි ගසා නැගී සිටීම හා සම්බන්ධයෙන් තත්ත්වය ගැන කියතොත්, අපාක්ෂික පත්‍ර මගින් කරන ලද හොරිකඩ ප්‍රකාශයන් නිසා ව්‍යාපාරයට කොතරම් දුරට හානි වී තිබේදැයි, මට දුර බැහැර සිට හරියටම වටහා ගත නොහැකිය. ප්‍රායෝගික වශයෙන් ඉතාමත් විශාල හානියක් වී තිබෙනවාට කිසිම සැකයක් නොමැත. මෙම තත්ත්වය ප්‍රකෘතිමත් කිරීම සඳහා, ප්‍රථමයෙන්ම හොරිකඩයන් නෙරපා දැමීමෙන් බොල්ෂෙවික් පෙරමුණේ සමගිය යළිත් ඇති කිරීම අවශ්‍ය වන්නේය.

කැරලි ගසා නැගී සිටීමට විරුද්ධව ඉදිරිපත් කරන දෘෂ්ටිමය තර්ක දහවල් එළියට ඇද දැමීමට අප වඩ වඩාත් කටයුතු කළ තරමට ඒවායේ දුර්වලකම වඩ වඩාත් පැහැදිලි වන්නේය. මෑතදී මම මේ සම්බන්ධයෙන් ලිපියක් "රබෝචි පූත්" පත්‍රයට යැව්වෙමි. එහෙත්, එහි සංස්කාරකවරුන්ට එය මුද්‍රණය කළ නොහැකි නම්, සමහර විට පක්ෂ සාමාජිකවරු එහි අත් පිටපතෙන් එහි අන්තර්ගත කරුණු දැන ගනු ඇත්තාහ.[106]

ඉදිරිපත් කර තිබෙන ඊනියා "දෘෂ්ටිමය" තර්ක, මූලික වශයෙන් දෙකකි. ප්‍රථම තර්කය, ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය එන තෙක් බලා "සිටිය" යුතුය යනුයි. අපි නැවතී සිටිමු. සමහර විට ඒ දක්වා අපට සිටිය හැකි වනු ඇත. මුළු තර්කයෙන්ම කියන්නේ එයයි. සාගතය තිබිය දීම, ආර්ථික අවුල් වියවුල් තිබියදීම, එසේම, සොල්දාදුවන්ගේ ඉවසීම කෙළවර වී තිබෙන නමුත්, පෙත්‍රොග්‍රෑඩය ජර්මානුන්ට පාවාදීමට රොද්ස්යන්කෝ පියවර ගන්නා නමුත්, කම්හල් වසා කම්කරුවන් දෙඨට දමන නමුත් සමහර විට අපට බලා සිටින්නට පුළුවන් වනු ඇත.

සමහර විට මුළු තර්කයේම අර්ථය එයය. එය එසේ වන්නට පිළිවන.

දෙවැනි තර්කය ශබ්ද සහිත සර්වාශුභවාදයය. ධනපති පංතියේ සහ කෙරෙන්ස්කිගේ තත්ත්වය සම්පූර්ණයෙන්ම හොඳය. අපගේ තත්ත්වය සම්පූර්ණයෙන්ම නරකය. ධනපතියෝ සියල්ලක්ම විශිෂ්ට ලෙස සූදානම් කර ඇත්තාහ. කම්කරුවන්ගේ කටයුතු සියල්ලක්ම වැරදී ඇත. විෂය කාරණයෙහි යුද්ධමය පැත්ත ගැන "සර්වාශුභවාදියෝ" වහළවල් මත නැගී බෙරිහන් දෙති. එහෙත් යම් යම් කරුණු රොද්ස්යන්කෝට සහ කෙරෙන්ස්කිට දැන්වීම හොරිකඩයන්ට හැර වෙනත් කිසිවෙකුට ප්‍රිය ජනක විය නොහැකි නිසා "සර්වශුභවාදියෝ" නිහඬව සිටිති.

කෙසේ හෝ වේවා, කාර්යය ඉටු කෙරෙනු ඇත. කම්කරුවන්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ඔවුන්ගේ පිරිස තහවුරු කරගනු ඇත. ගොවිජන විප්ලවය සහ පෙරමුණේ සොල්දාදුවන්ගේ අන්ත නොඉවසිලිල්ල විසින් ඒවායේ කාර්යය ඉටු කෙරෙනු ඇත! අප අපගේ පිරිස් සමගි කර ගනිමු — නිර්ධන පංතිය ජය ගනු ඒකාන්තය.

එන්. ලෙනින්

1917 ඔක්තෝබර් 18(31) දින
ලියන ලදී

ප්‍රථමයෙන්, 1927 නොවැම්බර් 1,
''ප්‍රාව්ද'' අංක 250 කලාපයෙහි
පළ කරන ලදී

සම්පූර්ණ කෘති. 5 වැනි
මුද්‍රණය, වෙළුම 34,
පිටු 419-422

රු.ස.ප්‍ර.ක.ප.(බො.) මධ්‍යම කාරක සභාවට ලිපිය

ප්‍රිය සහෝදරවරුනි,

ආත්ම ගරුත්වයක් ඇති කිසිම පක්ෂයකට, වැඩ වර්ජන කඩා කප්පල් කරන හොරිකඩයින් එය තුළ තබා ගත නොහැකිය. එය ඉතාම පැහැදිලිය.

අපාක්ෂික පත්‍ර මගින් සිනෝවියව් සහ කාමෙනෙව් කළ ඔවුන්ගේ ප්‍රකාශය ගැන අප වඩ වඩාත් කල්පනා කළ තරමට, ඔවුන් කළේ වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම වැඩ වර්ජන කඩා කප්පල් කිරීමකැයි යන්න නිරායාසයෙන්ම පැහැදිලි වන්නේය. පෙට්‍රොග්‍රෑඩ් සෝවියට් සභාවේදී කාමෙනෙව් ප්‍රශ්නයෙන් මග හැරීම ඇත්ත වශයෙන්ම නින්දනීය දෙයකි. ඔහු ට්‍රොට්ස්කි සමග පූර්ණ එකඟත්වයෙන් සිටින බව ඔබට නොපෙනේද? ට්‍රොට්ස්කි කී දෙයට වඩා යමක්, සතුරා හමුවේ කීමට, ට්‍රොට්ස්කිට නොහැකිව තිබුණු බව ඊට වඩා යමක් කීමට ඔහුට අයිතියක් නොතිබුණු බව හා ඔහු නොකිය යුතුව තිබුණු බව වටහා ගැනීම එතරම් අපහසුද? එය, (ආයුධ සන්නද්ධ නැගී සිටීමක අවශ්‍යතාවය ගැන, ඒ සඳහා කල්යල් පැමිණ ඇතැයි යන්න ගැන, ඒ සඳහා කටයුතු සූදානම් කිරීම ගැන, ආදීවූ) ස්වකීය තීරණ සඟවා තැබූ පක්ෂයක් වෙනුවෙන් ඉටු කළ යුතු යුතුකමක් වන බවත්, ප්‍රසිද්ධ ප්‍රකාශන කිරීමේදී ''දෝෂාරෝපනය'' පමණක් නොව ක්‍රියාරම්භකතාවයද සතුරා පිට දැමීම අවශ්‍ය කෙරෙන්නේ මෙම තීරණයෙන්ම බවත් වටහා ගැනීම එතරම් අපහසුද? කාමෙනෙව් ප්‍රශ්නයෙන් මග හැරීම ඉඳුරාම රැවටිල්ලක් වන්නේය යන්න වටහා ගැනීමට නොහැක්කේ ළදරුවෙකුට පමණකි. සිනෝවියව්ගේ මග හැරීම ගැන, නැතහොත් යටත් පිරිසෙයින් ඔහුගේ (මා සිතන ලෙසට ප්‍රධාන නිල පත්‍රයට ලියන ලද) ''සාධාරණ කරණ'' ලිපිය ගැනද කිව යුත්තේ එයමය. ඒ සම්බන්ධයෙන් මා දැක තිබෙන එකම ලියවිල්ල එයය. (ධනපති පුවත්පත්වල කුංචනාද කරවනු ලබන විරුද්ධ මතය, එනම්,

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

‘‘විරුද්ධ මතය යයි කියනු ලබන දෙය’’, හා සම්බන්ධ කිසිවක් මධ්‍යම කාරක සභිකයෙකු වශයෙන් මට අද දක්වාම දක්නට ලැබී නැත). සිනෝවියව්ගේ ‘‘තර්ක’’ අතර මෙය දක්නට ලැබේ. ‘‘තීරණ කිසිවක් ගැනීමට පෙර’’ ලෙනින් ඔහුගේ ලියුම් පිටත් කර හැරියේ යයි ඔහු කියයි. එහෙත් ඔබ එයට විරුද්ධත්වයක් නොදක්වූයෙහි යයි කියයි. පෙර යන වචනයට යටින් හතර වරක් ඉරි අඳිමින් මෙන් සිනෝවියව්ද ලියුවේ එයම ය. මධ්‍යස්ථානය වැඩ වර්ජනයක් ගැන තීරණයක් ගැනීමට පෙර, එයට පක්ෂව හා විරුද්ධව උද්ඝෝෂණය කිරීමට ඉඩ ඇති බව වටහා ගැනීම එතරම් අපහසුද? එහෙත්, වැඩ වර්ජනයට පක්ෂව තීරණයක් (සහ ඊට අමතරව, එය සතුරාගෙන් වසං කර තැබීමට තීරණයක්) ගත් පසු වැඩ වර්ජනයට විරුද්ධව උද්ඝෝෂණය කිරීම වැඩ වර්ජනය කඩා කප්පල් කිරීමක් බව වටහා ගැනීම එතරම් අපහසුද? ඕනෑම කම්කරුවෙකුට එය වැටහෙන්නේය. කැරලි ගසා නැගී සිටීම පිළිබඳ ප්‍රශ්නය සැප්තැම්බරයේ පටන්ම මධ්‍යස්ථානයේ සාකච්ඡා කෙරිණි. සිනෝවියව්ට හා කාමෙනෙව්ට ලියවිලි ඉදිරිපත් කිරීමට හැකිව තිබුණේ හා ඔවුන් ඒවා ඉදිරිපත් කළ යුතුව තිබුණේ, එම අවස්ථාවේදීය. ඔවුහු එසේ කළෝ නම්, ඔවුන්ගේ ඔළුව සම්පූර්ණයෙන්ම අවුල් වී තිබෙන බව කාහටත් වටහා ගත හැකිව තිබිණි. තීරණය ගැනීමට පෙර මුළු මාසයක්ම තිස්සේ කෙනෙකුගේ අදහස් පක්ෂයෙන් සඟවා ගෙන සිට, තීරණයක් ගත් පසු විරුද්ධ මතයක් පතුරුවා හැරීම යනු වැඩ වර්ජන කඩා කප්පල් කිරීම වේ.

සිනෝවියව්, ඔහුට මෙම වෙනස නොකෙරෙන සැටියක් පෙන්වන්නේය. මධ්‍යස්ථානය වැඩ වර්ජන තීරණයක් ගත් පසු, එම තීරණයට විරුද්ධව පහළ මණ්ඩල තුළ උද්ඝෝෂණය කළ හැක්කේ හොරිකඩයන්ට පමණක් බව තමන්ට නොතේරෙන සැටියක් ඔහු පෙන්වන්නේය. ඕනෑම කම්කරුවෙකුට එය වැටහෙන්නේය.

එහෙත් සිනෝවියව් උද්ඝෝෂණයෙහි යෙදෙමින් පසුගිය ඉරිදා රැස්වීමේදී[107] මධ්‍යස්ථානයේ තීරණය පරාජය කිරීමට උත්සාහ දැරුවේය. එම රැස්වීමේදී ඔහුට හා කාමෙනෙව්ට පක්ෂව එකම ඡන්දයක් හෝ නොලැබිණි. තවද, මෙහි සඳහන් ලියුමෙන්ද ඔහු කරන්නේ එයමය. ‘‘පක්ෂයේ අදහස විමසා නැතැ’’ යිද, එවැනි ප්‍රශ්න ‘‘මිනිසුන් දස දෙනෙකුට තීරණය කළ නොහැකි යයිද, කීමට තරම් සිනෝවියව් නිර්ලජ්ජිත විය. මඳක් සිතන්න! තීරණාත්මක රැස්වීමට මධ්‍යම කාරක සභිකයන් දහ දෙනෙකුට වැඩිය පැමිණ සිටි බවත්, පූර්ණ රැස්වීමෙන් බහුතරයක් පැමිණ සිටි බවත්, කාමෙනෙව්ම ‘‘මෙය තීරණාත්මක රැස්වීමකි’’ යනුවෙන් එම රැස්වීමේදී කී බවත්, නොපැමිණ සිටි සාමාජිකයන්ගෙන් බහුතරය සිනෝවියව් සහ කාමෙනෙව් සමග එකඟව නොසිටියේ යයි ඒකාන්ත

නිශ්චිතතාවයකින් දැනගන්නට තිබුණු බවත්, මධ්‍යම කාරක සභාවේ සෑම සාමාජිකයෙක්ම දන්නේය. එහෙත්, දැන්, කාමෙනෙව්ම තීරණාත්මක යයි පිළිගත් මධ්‍යම කාරක සභාව තීරණයක් ගත් පසු, මධ්‍යම කාරක සභාවේ සාමාජිකයෙක් ‘‘පක්ෂයේ අදහස විමසා නැත’’ සහ එවැනි ප්‍රශ්න මිනිසුන් දස දෙනෙකුට තීරණය කළ නොහැකිය’’ යනුවෙන් ලිවීමට තරම් ඔළු මොට්ටල වන්නේය. එය වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම වැඩ වර්ජන කඩා කප්පල් කිරීමක් වේ. පක්ෂ සම්මේලන අතර කාලයේදී මධ්‍යම කාරක සභාව තීරණ ගන්නේය. මධ්‍යම කාරක සභාව තීරණයක් ගෙන ඇත. තීරණය ගැනීමට පෙර කිසි ලියවිල්ලක් ඉදිරිපත් නොකළ කාමෙනෙව් සහ සිනෝවියව්, එම තීරණය ගැනීමෙන් පසුව එයට විරුද්ධව වාද කිරීමට පටන් ගත්තේය.

එය වචනයේ මුළු අර්ථයෙන්ම හොරිකඩ කමක් වන්නේය. තීරණයක් ගත් පසු සහ එම තීරණය ගෙන ඇත්තේ වහාම සහ රහසිගත ලෙස වැඩ වර්ජනයට සූදනම් වීමක් සඳහා වන කල, ඒ ගැන කිසිම විවාදයකට ඉඩ දිය නොහැකිය. අප ‘‘සතුරාට අනතුරු හැඟවී’’ යයි කියමින් අපට දෝෂාරෝපනය කිරීමට තරම් දැන් සිනෝවියව් අහංකාර වෙයි. ඔහුගේ නිර්ලජ්ජිත භාවයට සීමාවක් තිබේද? ‘‘සතුරාට අනතුරු හැඟවීමෙන්’’ වැඩ වර්ජනයට හානි කළේ හා එයට බාධා කළේ, අපාක්ෂික පත්‍රවලට ලියූ අය නොවේ නම් වෙන කවුද?

පක්ෂය සම්මත කළ ‘‘තීරණාත්මක’’ යෝජනාවකට විරුද්ධව, මෙම ප්‍රශ්නයේදී ධනපති පංතිය සමග අත්වැල් බැඳගෙන සිටින පත්‍රයකට ලිවීමට කෙනෙකුට හැකි වන්නේ කෙසේද?

එයට ඉඩ දුනහොත්, පක්ෂය කිසිසේත් පවත්වා ගත නොහැකි වනු ඇත — පක්ෂය විනාශ වී යනු ඇත.

බසාරව් අපාක්ෂික පත්‍රයකින් දැනගන්නා සහ එම පත්‍රයක පළ කරනු ලබන දෙයකට ‘‘විරුද්ධ මතය’’ යන නම දීම, පක්ෂයට කරන සමච්චලයකි.

කාමෙනෙව් සහ සිනෝවියව් පතුරුවන අපහාසකාරී බොරුවට විවෘත ලෙස පිළිතුරු දීමට නොහැකි තත්ත්වයක් පක්ෂය කෙරෙහි බලපාන හෙයින්, ඔවුන් අපාක්ෂික පත්‍ර මගින් කළ ප්‍රකාශය විශේෂයෙන්ම නින්දනීය වන්නේය. දිනය පිළිබඳ තීරණයක් ගැන තමා දන්නේ නැතැයි කාමෙනෙව් තමාම සහ සිනෝවියෙව්ද නමින් ලියයි, පළ කරයි. (එවැනි ප්‍රකාශයකින් පසුව, කාමෙනෙව් කරන කටයුතු සහ ප්‍රකාශයන් ගැන සිනෝවියව් සම්පූර්ණ වගකීම දැරිය යුතු වේ).

මධ්‍යම කාරක සභාව මෙය නිෂ්ප්‍රාභා කරන්නේ කෙසේද?

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ධනපතියන්ට ඇත්ත කීමට පුළුවන් කමක් අපට නොමැත. නැතහොත්, අප වැඩ වර්ජනයක් කිරීමට තීරණය කළ බව හා ඒ සඳහා තෝරාගත් මොහොත රහසේ තබා ගැනීමට තීරණය කළ බව කීමට පුළුවන් කමක් නැත.

ව්‍යාපාරයට තවදුරටත් බරපතල හානියක් නොකර සිනෝවියව්ගේ සහ කාමෙනෙව්ගේ අපහාසකාරී බොරුව නිෂ්ප්‍රභා කිරීමට පුළුවන් කමක් අපට නැත. එනිසා මෙම පුද්ගලයන් දෙදෙනාගේ අන්ත පහත්කම සහ සැබෑ ද්‍රෝහිකම නම්, වැඩ වර්ජකයන්ගේ සැලැස්ම ධනපතියන්ට දන්වීමට වන්නේය. මන්දයත්, අප පුවත්පත් මගින් කිසිවක් නොකියා නිහඬව සිටින විට, කාරණය කෙසේද යන්න ගැන කාටත් සිතා ගත හැකි වන හෙයිනි.

කාමෙනෙව් සහ සිනෝවියව් කර ඇත්තේ, ස්වකීය මධ්‍යම කාරක සභාව කැරලි ගසා නැගී සිටීමට ගත් තීරණය සහ කැරලි ගසා නැගී සිටීමට සූදනම් වීමේ කටයුතු සහ ඊට නියම කරගන්නා දිනය සතුරාගෙන් සඟවා තැබීමට ගත් තීරණය, රොද්සියන්කෝට සහ කෙරෙන්ස්කිට හෙළිදරව් කිරීමකි. එයට දිය හැක්කේ එකම පිළිතුරක් පමණකි. එය නම්, මධ්‍යම කාරක සභාව අප්‍රමාදව පහත සඳහන් පරිදි තීරණයකට එළඹීමය:

“සිනෝවියව් සහ කාමෙනෙව් අපාක්ෂික පත්‍රයට කළ ප්‍රකාශය වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම වැඩ වර්ජන කඩා කප්පල් කිරීමක් ලෙසට සලකන මධ්‍යම කාරක සභාව, ඔවුන් දෙදෙනාම පක්ෂයෙන් නෙරපයි.”

කලින් මගේ හිතවත් සහෝදරවරුන් වූ අය ගැන මෙසේ ලිවීම මට පහසු නොවේ. එහෙත් මේ ගැන දක්වන කිසිම පැකිලීමක් වේතොත්, මම එය අපරාධයක් ලෙසට සලකමි. නොඑසේ නම්, හොරිකඩයන්ට දඬුවම් නොදෙන විප්ලවවාදීන්ගේ පක්ෂයක් විනාශ වී යනු ඇත.

කැරලි ගසා නැගී සිටීම පිළිබඳ ප්‍රශ්නය රොද්සියන්කෝට සහ කෙරෙන්ස්කිට දැනගන්නට සැලැස්වීමෙන් හොරිකඩයන් එය බොහෝ ප්‍රමාද කර ඇතත්, එය න්‍යාය පත්‍රයෙන් ඉවත් කර නැත. පක්ෂය එය ඉවත් කර නැත. අප අතර “ප්‍රකට” හොරිකඩයන් සිටින්නට ඉඩ හරින්නෙමු නම් අප කැරලි ගසා නැගී සිටීමට සූදනම් වන්නේ සහ ඒ සඳහා සැලසුම් පිළියෙළ කරන්නේ කෙසේද? ඔවුන් වඩාත් ප්‍රකට අය වූ තරමට වඩාත් භයානකය. එනිසා ඔවුහු ඒතාක් දුරට “සමාවක්” ලැබීමට අඩු සුදුස්සෝ වෙති. On n'est trahi que par les siens යයි ප්‍රංශුවෝ කියති. ඔබට ද්‍රෝහී කම් කිරීමෙහි සමත් වන්නේ ඔබේම අය පමණකි.

හොරිකඩයන් වඩාත් “ප්‍රකට” වූ තරමට ඔවුන් වහාම නෙරපා දැමීමෙන් ඔවුන්ට දඬුවම් දීමේ අවශ්‍යතාවය වඩාත් අනිවාර්ය වන්නේය.

කම්කරුවන්ගේ පක්ෂයට එහි ශක්තිය නැවත වර්ධනය කර ගත හැක්කේද, අඩ දුසිමක් පමණ වන කොන්ද පණ නැති බුද්ධිමතුන්ගෙන් නිදහස් විය හැක්කේද, විප්ලවවාදීන්ගේ පිරිස් ඒකරාශී කරගත හැක්කේද, අතිමහත් සහ භාර දුර දුෂ්කරතාවයන්ට මුහුණ පෑමට විප්ලවවාදී කම්කරුවන් සමග අතිනත් ගෙන ඉදිරියට යා හැක්කේද, මෙම මාර්ගයෙන් පමණකි.

අපට සත්‍ය පළ කිරීමට නොපුළුවන. එනම්, මධ්‍යම කාරක සභාවේ තීරණාත්මක රැස්වීමෙන් පසුව, සංශෝධනයක් කරන ලෙස ඉරිද රැස්වීමේදී ඉල්ලීමට තරම් සිනෝවියව් සහ කාමෙනෙව් විළිබිය රහිත වූ බවත්, “මධ්‍යම කාරක සභාව සතියක් තිස්සේ කිසිවක් කර නැති නිසා” (ඇත්ත වශයෙන්ම කර තිබුණ දේ ගැන මට කිසිසේත් කීමට නොහැකි වූ හෙයින්, එයට පිළිතුරු දිය නොහැකි විය) “මධ්‍යම කාරක සභාව බිඳ වැටී ඇතැ”යි එම රැස්වීමේදී කෑ ගැසීමට තරම් කාමෙනෙව් නිර්ලජ්ජිත වූ අතර, සිනෝවියව් අහිංසක ස්වභාවයක් පාමින් “ඔක්තෝබර් 20 දින සෝවියට් සභා සම්මේලනයට පැමිණෙන බොල්ෂෙවික්වරුන්ගේ අදහස් දැන ගන්නා තෙක් කිසිම පියවරක් නොගත යුතුය”, කියන ඔහුගේ යෝජනාව ඉදිරිපත් කළ නමුත්, රැස්වීම එය ප්‍රතික්ෂේප කළ බවත්, පළ කිරීමට පුළුවන් කමක් අපට නොමැත.

මදක් කල්පනා කර බලන්න! වැඩ වර්ජනයක් කිරීමට මධ්‍යස්ථානය තීරණයක් ගත් පසු, එය (සම්මේලනය රැස්වීමට නියමිත දිනය වන ඔක්තෝබර් 20 තෙක් සම්මේලනය පසුව කල් තබන ලදී — සිනෝවියව් ලිබර්දන්ලා කෙරෙහි විශ්වාසය තබයි) කල් තබන ලෙසත්, පක්ෂ ව්‍යවස්ථාවේ සඳහන් නොවන ස්වභාවයේ වන, මධ්‍යම කාරක සභාවට ඉහළින් අධිකාරි බලයක් නොමැති සහ පෙට්‍රොග්‍රෑඩය ගැන දැනුමක් නැති මණ්ඩලයකට එය තබන ලෙසත්, පක්ෂයේ සාමාන්‍ය සාමාජිකයින්ගේ රැස්වීමකදී යෝජනා කරනු ලැබේ.

තවද, මෙයටත් පසුව “පක්ෂ සමගිය ශක්තිමත් කරන්නේ මෙසේ නොවේ” යයි ලිවීමට තරම් සිනෝවියව් තවමත් ගර්විතය.

මෙය පක්ෂය භේද කිරීමේ තර්ජනයක් මිස, අන් කිසිවක් ලෙස විස්තර කිරීමට ඔබට පුළුවන්ද?

මා මෙම තර්ජනයට දෙන පිළිතුර සීමාව දක්වාම යාම හා කම්කරුවන් ඉදිරියේ කථා කිරීම සඳහා නිදහස දිනා ගැනීමය. එසේම, මොන අපහසුවක් හෝ විඳ හොරිකඩ සිනෝවියව් හොරිකඩයෙක් ලෙසම හංවඩු තබන්නෙමි. භේද කිරීමේ තර්ජනයට මා දෙන පිළිතුර නම්, අවසානය

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

දක්වා සටන් කිරීම පිණිස, හොරිකඩයන් පක්ෂයෙන් නෙරපා දැමීම පිණිස, යුද්ධ ප්‍රකාශ කිරීමය.

මාසයක් තිස්සේ සාකච්ඡා කිරීමෙන් පසුව, වෘත්තීය සමිතියක විධායක කාරක සභාවක් පැවැත් වීමට හැකි අවස්ථාවක් පැමිණි විට (භේදය පිළිබඳ තර්ජනය සලකා) සියළු කරුණු ප්‍රසිද්ධ කිරීමේ අයිතිය මට තබාගෙන, හොරිකඩයන් දෙදෙනාම නෙරපා දමන ලෙස මා ඉල්ලන්නේ එහෙයිනි.

1917 ඔක්තෝබර් 19 (නොවැම්බර් 1) දින ලියන ලදී

සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 34, පිටු 423-427

ප්‍රථමයෙන් 1927 නොවැම්බර් 1 දින ''ප්‍රාව්දා'' අංක 250 කලාපයෙහි පළ කරන ලදී.

වයි. එම්. ස්වෙර්ද්ලොව්ට ලිපිය

ස්වෙර්ඩ්ලොව් සහෝදරයා වෙත.

''නෝවය ෂිස්න්'' පත්‍රයේ පළ වූ කාමෙනෙව්ගේ ප්‍රකාශය සමග තමාගේ සම්බන්ධයක් නැති බවට, සිනෝවියෙව් ලිඛිත ප්‍රතික්ෂෙපයක් නිකුත් කර තිබෙන බව මට දැනගන්නට ලැබුණේ ඊයේ රාත්‍රියේය.

එසේ නම් ඔබ මා වෙත කිසිවක් නොඑවූයේ මන්ද???

මා කාමෙනෙව් සහ සිනෝවියෙව් ගැන ලියූම් සියල්ලම යැව්වේ ම.කා. සාමාජිකයින්ට පමණකි. ඔබ මේ බව දන්නෙහිය. ඔබ මේ ගැන සැකයක් ඇතිව සිටින බව පෙනෙන්නට තිබීම විමතියට හේතුවක් නොවේද?

''ඔවුන් මා සොයමින් සිටින'' නිසා මට පූර්ණ සභා රැස්වීමට සහභාගි වීමට නොහැකි සේ පෙනේ. සිනොවියෙව් සහ කාමෙනෙව් සිද්ධිය ගැන බෛරුමකට පැමිණිය යුතු යයි ඔබ (+ ස්ටාලින්, සකොල්නිකව් සහ ජේර්ෂින්ස්කි) ඉල්ලන්නේ නම්[108] මෙමම කරුණ පක්ෂ උසාවියකට තැබීම සඳහා මට විරුද්ධව යෝජනාවක් ඇතුලත් කරන්න. (කරුණු පැහැදිලිය. සිනෝවියෙව්ද උවමනාවෙන්ම එයට බාධා කරමින් සිටියේය). මෙය කල් දැමීමක් වනු ඇත.

මධ්‍යම කාරක සභාවෙන්? ''කාමෙනෙව්ගේ ඉල්ලා අස්වීම භාර ගෙන තිබේද? ''කරුණාකර ඔහුගේ ප්‍රකාශය මාවෙත එවන්න.

කොසාක් පෙළපාළිය[109] අවලංගු කිරීම විශාල ජයග්‍රහණයකි. හුරේ! අපි අපගේ මුළු ශක්තිය යොදා පහර දෙමු නම්, අපට දින කීපයකින් ජය ගත හැකිය. ශුභ පැතුම්! මේ ඔබගේ.

1917 ඔක්තෝබර් 22 හෝ 23 (නොවැම්බර් 4 හා 5) ලියන ලදී.

සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 34, පිටුව 434

ප්‍රථමයෙන් 1957 දී, සෝ. ස. ස. විද්‍යා ඇකඩමි ප්‍රකාශකයන්ගේ පෙට්‍රොග්‍රෑඩයේ ඔක්තෝබර් ආයුධ සන්නද්ධ නැගී සිටීම යන පොතෙහි පළ කරන ලදී

https://liberationbase.wordpress.com

මධ්‍යම කාරක සභා සාමාජිකයින්ට ලිපිය[110]

සහෝදරවරුනි,

මා මෙය ලියන්නේ 24 වැනි දින සන්ධ්‍යාවේය. තත්ත්වය අතිශයින්ම බැරෑරුම්ය. නැගී සිටීම ප්‍රමාද කිරීම ඇත්ත වශයෙන්ම මරණීය වන බව දැන් සම්පූර්ණයෙන්ම පැහැදිලිය.

සියල්ලක්ම නූලකින් එල්ලී තිබෙන මෙන් වන තත්ත්වයක් පවතින බව අවබෝධ කරගන්නා ලෙසත්, අප මුහුණ පා සිටින්නේ සාකච්ඡා සභාවලින් හෝ සම්මේලනවලින් (සෝවියට් සභා සම්මේලනවලින් පවා) හෝ විසඳිය යුතු ප්‍රශ්නවලට නොව, තනිකරම ජනයා විසින්, පොදු ජනතාව විසින්, ආයුධ සන්නද්ධ ජනතාවගේ අරගලය තුළින් විසඳිය යුතු ප්‍රශ්නවලට බවත්, මම මගේ මුළු වැර යොදා සහෝදරවරුන්ට කියන්නෙමි.

කර්නිලව්වාදීන්ගේ ධනපති පංති ප්‍රහාරයෙන්ද, වෙර්හොව්ස්කි ඉවත් කිරීමෙන්ද, පෙනෙන්නේ අප ප්‍රමාද නොවිය යුතු බවය. මොන කැප කිරීමක් හෝ කර මෙම සන්ධ්‍යාවේම, අද රාත්‍රියේම, ප්‍රථමයෙන් යුංකර්වරුන් නිරායුධ කිරීමෙන් (ඔවුන් ප්‍රතිරෝධය දක්වතොත් පරාජය කිරීමෙන්) ආදියෙන් පසුව ආණ්ඩුව සිරභාරයට ගත යුතුය.

අපි ප්‍රමාද නොවිය යුත්තෙමු! අපට සියල්ලම අහිමි වීමට ඉඩ තිබේ!

වහාම බලය අල්ලා ගැනීමේ අගය නම්, වෙර්හොව්ස්කි එළවා දැමූ සහ දෙවැනි කර්නිලව් කුමන්ත්‍රණය සූදානම් කළ කර්නිලව් ආණ්ඩුවෙන් ජනතාව (සම්මේලනය නොව, ජනතාව, යුද්ධ හමුදාව සහ ප්‍රථමයෙන්ම ගොවි ජනතාව) ආරක්ෂා කර ගැනීමය.

බලය ගත යුත්තේ කවුද?

දැනට එය වැදගත් නොවේ. විප්ලවකාරී යුද්ධ කාරක සභාවට[111] හෝ "වෙනත් යම්කිසි ආයතනයකට" බලය ගැනීම සුසුදුසුය. එය, ජනතාවගේ උවමනාවන්ද, යුද්ධ හමුදාවේ උවමනාවන්ද (සාමය සඳහා වහාම යෝජනා ඉදිරිපත් කිරීම), ගොවි ජනතාවගේ උවමනාවන්ද (ඉඩම් වහාම අත්පත් කර ගැනීම සහ පෞද්ගලික දේපල අවලංගු කිරීම), කුසගින්නේ පසු වන්නවුන්ගේ උවමනාවන්ද වෙනුවෙන් නියම වශයෙන් පෙනී සිටින නියෝජිතයන්ට පමණක් බලය භාර දෙන බව ප්‍රකාශ කරනු ඇත.

සියළුම දිස්ත්‍රික්ක, සියළුම රෙජිමේන්තු, සියළුම බලවේග, වහාම ක්‍රියාත්මක විය යුතුය. මොනම තත්ත්වයක් යටතේ හෝ, මොනයම්ම තත්ත්වයක් යටතේ හෝ, 25 දින වන තෙක් බලය කෙරෙන්ස්කි සහ සමාගම අතේ නොතැබිය යුතුයයිද, එම කාරණය මෙම සන්ධ්‍යාවේම, නැතහොත්, අද රාත්‍රියේම නොවරදවාම බේරුමක් කළ යුතු යයිද, බල කරන ඉල්ලීම ඉදිරිපත් කරමින්, ඒවායේ නියෝජිත මණ්ඩල විප්ලවවාදී යුද්ධ කාරක සභාව සහ බොල්ෂෙවික්වරුන්ගේ මධ්‍යම කාරක සභාව වෙත යැවිය යුතුය.

විප්ලවවාදීන්ට අද ජයග්‍රහණය අත්පත් කර ගත හැකිව තිබියදී (අද ඒකාන්ත වශයෙන්ම ඔවුන් දිනනු ඇත), හෙට බොහෝ දේ නැති වීමේ අවදානම තිබියදී, ඇත්ත වශයෙන්, සියල්ලම නැති වීමේ අවදානම තිබියදී, ප්‍රමාද වීම ගැන ඉතිහාසය ඔවුන්ට සමාව නොදෙනු ඇත.

මක්නිසාදයත්, අද අපි බලය අල්ලා ගන්නෙමු නම්, අප එසේ කරන්නේ සෝවියට් සභාවලට විරුද්ධව නොව, ඒවා වෙනුවෙන් වන හෙයිනි.

නැගී සිටීම ඉටු කළ යුතු කාර්යය නම්, බලය අල්ලා ගැනීමය. එහි දේශපාලන අරමුණු බලය අල්ලා ගැනීමෙන් පසුව පැහැදිලි වනු ඇත.

ඔක්තෝබර් 25 දිනට නියමිත අස්ථිර ඡන්දය තෙක් බලා සිටීම භයානක අන්තරායක්, නැත හොත්, නාමික අවශ්‍යතාවයක් වනු ඇත එවැනි ප්‍රශ්න ඡන්දයෙන් නොව, බලයෙන් විසඳීමේ අයිතියක් සහ යුතු කමක් ජනතාවට ඇත. විප්ලවයේ තීරණාත්මක අවස්ථාවලදී, ස්වකීය නියෝජිතයින්, ඉතාමත් හොඳ නියෝජිතයින් පවා ක්‍රියාත්මක වන තෙක් බලා නොසිට, ඔවුන් මෙහෙය වීමේ අයිතිය හා යුතු කම ජනතාවට ඇත.

මෙය සෑම විප්ලවයකම ඉතිහාසයෙන් ඔප්පු වී තිබේ. විප්ලවයේ ආරාක්ෂාවත්, සාම යෝජනාවත්, පෙට්‍රොග්‍රෑඩයේ ආරක්ෂාවත්, සාගතයෙන් මිදීමත්, ගොවි ජනතාවට ඉඩම් පවරාදීමත්, තමන් මත රඳා පවතින බව දැන දැනම, විප්ලවවාදීන් අවස්ථාව පැහැර හරිත් නම්, ඔවුන් කරන්නේ අසීමිත අපරාධයක් වනු ඇත.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ආණ්ඩුව දෙදරා වැටෙමින් පවතී. මොන කැප කිරීමක් හෝ කර, එයට මැරෙන්නට පහර දිය යුතුය.

සටන පමා කිරීම මරණීය වේ.

1917 ඔක්තෝබර් 24 (නොවැම්බර් 6) දින ලියන ලදී

ප්‍රථමයෙන් 1924 දී පළ කරන ලදී

සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 34, පිටු 435-436

සංස්කාරකගේ සටහන්

ලෙනින් ''රාජ්‍ය සහ විප්ලවය'' ලිව්වේ 1917 අගෝස්තු හා සැප්තැම්බර් මාසවලදී තාවකාලික ආණ්ඩුවේ මර්දනකාරී කටයුතු නිසා ඔහු සැඟවී සිටියදී ය.

LIBERATIONBASE

ලෙනින් විදේශයෙහි සිටි අවසාන වර්ෂ කීපය තුළදී නිර්ධන පංති රාජ්‍ය බලයේ ස්වභාවය පිළිබඳ ප්‍රශ්නය ඔහුගේ විශේෂ අවධානයට ලක්විය. රාජ්‍යය ගැන මාක්ස්වාදී න්‍යායය, ජාත්‍යන්තර සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ කාල් කෞට්ස්කි සහ වෙනත් අවස්ථාවාදීන් විසින් විකෘති කරනු ලැබීමට විරුද්ධවීම අවශ්‍ය බව සැලකූ ලෙනින්, රාජ්‍ය පිළිබඳ ප්‍රශ්නය න්‍යායික ලෙස විමර්ශනය කිරීමේ අවශ්‍යතාවය ගැන ප්‍රථමයෙන් 1916 දෙවැනි භාගයේදී කථා කළේය. ලෙනින් ඒ. පී. ෂ්ලියාප්නිකව්ට මෙසේ ලියා යැවීය: ''දවසේ න්‍යාය පත්‍රයෙහි අපට දක්නට ලැබෙන්නේ (සාර්වාදය ආදියට විරුද්ධව) ප්‍රතිපත්තිය අපගේ යෝජනාවලින් සහ පොතෙන් තහවුරු කර දිගටම ඉදිරියට ගෙන යාම පමණක් නොවේ... ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රතික්ෂේප කිරීමේ (නිරායුධකරණය, ස්වාධිපත්‍යය ප්‍රතික්ෂේප කිරීම, පීතෘ භූමිය ආරක්ෂා කිරීම පිළිබඳ න්‍යායික වශයෙන් සාවද්‍ය ප්‍රතික්ෂේපය, රාජ්‍ය කාර්ය කොටස සහ වැදගත් කම සම්බන්ධ ප්‍රශ්නයේදී වැනෙන සුලු භාවයක් දැක්වීම ආදිය ඇතුලත්ව) වර්තමාන බහුබූත සහ අවුල්ජාලය ඉන් ඉවත් කර එය පිරිසිදු කිරීමද එයට ඇතුලත්ය.''

1916 වර්ෂයේ දෙවන භාගයේදී, රාජ්‍ය සහ නිර්ධන පංති ආඥාදායකත්වය ගැන මාක්ස්සිස්ත-විරෝධී සහ අර්ධ අරාජිකවාදී අදහස් ආරක්ෂා කරමින් එන්. අයි. බුහාරින් ලිපි ගණනාවක්ම පළ කළේය. ''තරුණ ජාත්‍යන්තරය'' යනුවෙන් බුහාරින් ලියූ සමාලෝචනයෙන් ඔහු ගත් ප්‍රතිෂ්ඨාව තියුණු විවේචනයට ලක් කළ ලෙනින් රාජ්‍යය කෙරෙහි

https://liberationbase.wordpress.com

මාක්ස්වාදීන් දක්වන ආකල්පය ගැන වඩාත් විස්තර සහිත ලිපියක් ලියන බවට ප්‍රතිඥාවක් දුන්නේය. මෙයට අවශ්‍ය කරුණු සියල්ලම පාහේ මෙන් බොහෝ දුරට සූදනම් කර ගෙන තිබෙන බව ලෙනින් 1917 පෙබරවාරි (17) දින ඒ. එම්. කලන්තායිට ලියා යැවීය. මෙම කරුණු "රාජ්‍යය ගැන මාක්ස්වාදය" යන සිරස්තලය යෙදූ සටහන් පොතක ඇතුළත් කර තිබිණි. මාක්ස්ගෙන් සහ එංගල්ස් ගෙන් උපුටාගත් වැකිද, කෞට්ස්කි, පනෙකුක් සහ බර්න්ෂ්ටයින් ලියූ පොත්වලින් හා ලිපිවලින් ගත් කොටස් ද, ලෙනින්ගේ විවේචනාත්මක සටහන්, නිගමන සහ සාමාන්‍යීකරණයන් ද එයට ඇතුලත් විය.

ලෙනින් ඔහු එකතු කළ කරුණු ඔහුගේ "රාජ්‍යය සහ විප්ලවය" යන පොත සඳහා පදනම කොට ගත්තේය.

ලෙනින් ගේ සැලැස්ම අනුව "රාජ්‍යය සහ විප්ලවය" පරිච්ඡේද හතකින් සමන්විත වීමට තිබුණි. එසේ වුවත්, හත්වැනි හා අවසාන පරිච්ඡේදය, එනම් "1905 හා 1917 රුසියානු විප්ලවයේ අත් දැකීම්" යන පරිච්ඡේදය කිසි විටෙක නොලියන ලදී. ඇත්තේ ඒ සඳහා සහ එහි නිගමන සඳහා වූ සවිස්තර සැලැස්ම පමණකි.

පොත ප්‍රථමයෙන් පළ කරන ලද්දේ 1918 දී, ඔක්තෝබර් සමාජවාදී විප්ලවයෙන් පසුව ය. "1852 දී ප්‍රශ්නය මාක්ස් විසින් ඉදිරිපත් කරන ලද ආකාරය" යන අළුත් කොටස කතුවරයා විසින් දෙවන පරිච්ඡේදයට එකතු කරන ලදුව, දෙවැනි මුද්‍රණය 1919 දී පළ විය.

2 ෆේබියන්වරු — 1884 දී පිහිටුවන ලද එංගලන්ත ප්‍රතිසංකරණ වාදී "ෆේබියන්" නම් වූ සංවිධානයේ සාමාජිකයෝ යි. ෆේබියන් වරුන්ගේ බහුතරය, විද්‍යාඥයන්, ලේඛකයන් හා දේශපාලඥයන් ඇතුළු සුළු ධනපති බුද්ධිමතුන් වූ අතර, ඔවුහු නිර්ධන පන්තියේ පන්ති අරගලයේ හා සමාජවාදී විප්ලවයේ අවශ්‍යතාවය ප්‍රතික්ෂේප කරමින් ධනපතිවාදයේ සිට සමාජවාදයට පරිවර්තනය•වීමට හැක්කේ සමාජය තුළ ක්‍රම ක්‍රමයෙන් කරන සුළු ප්‍රතිසංස්කරණ මගින් පමණකැයි කීහ. වී. අයි. ලෙනින් ෆේබියන් වාදය "අන්ත අවස්ථාවාදයේ එක් උපනතියක්" ලෙසට විස්තර කළේය. 1900 දී ෆේබියන් සමාජය ලේබර් පක්ෂය සමග එක් විය.

1914-1918 ලෝක අධිරාජ්‍යවාදී යුද්ධය සමයේදී ෆේබියන් වරු සමාජ-ජාත්‍යාන්මාදවාදයේ ප්‍රතිපත්තිය ගෙන සිටියහ.

3 සමාජවාදී-විප්ලවවාදීහු — 1901 අග භාගයේ හා 1902 මුල් භාගයේදී බිහිවූ රුසියාවේ සුළු ධනපති පක්ෂයේ සාමාජිකයෝ ය. ලෝක අධිරාජ්‍යවාදී යුද්ධය සමයේදී සමාජවාදි-විප්ලවවාදීන්ගේ වැඩි පිරිස සමාජ-ජාත්‍යාන්මාදවාදී ස්ථාවරය වැළඳ ගෙන සිටියෝය. පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයෙන් පසු සමාජවාදී-විප්ලවවාදීන් මෙන්ෂෙවික්වරුන් හා සමගම, ප්‍රතිවිප්ලවවාදී තාවකාලික ආණ්ඩුවේ ප්‍රධාන රුකුල වූ අතර ඔවුන්ගේ නායකයෝ එම ආණ්ඩුවට සහභාගී වූහ. සමාජවාදී-විප්ලවවාදී පක්ෂය, ඉඩම් හිමියන් අහිමි කිරීම සඳහා වූ ගොවීන්ගේ ඉල්ලීමට ආධාර දීම ප්‍රතික්ෂේප කළ අතර තාවකාලික ආණ්ඩුවෙහි රැඳී සිටි සමාජවාදී-විප්ලවවාදී ඇමති වරු, ඉඩම් හිමියන්ගේ ඉඩම් අල්ලා ගත් ගොවීන්ට පහර දීම සඳහා යුද්ධ සේනාංක යැවූහ. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයෙන් පසු සමාජවාදී-විප්ලවවාදීහු, ධනපතීන්, ඉඩම්හිමියන් හා විදේශීය ආක්‍රමණිකයන් සමග එක් වී සෝවියට් බලයට විරුද්ධව ක්‍රියාශීලී ලෙස සටන් කළහ.

4 මෙන්ෂෙවික් වරු — රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයෙහි සුළු ධනපති අවස්ථාවාදී උපනතියේ අනුගාමිකයෝ වූහ. 1903 දී පැවැත්වුනු රු. ස. ප්‍ර. ක. ප. දෙවැනි සම්මේලනයේදී පක්ෂයේ මධ්‍යම ආයතනවලට ඡන්ද විමසීමේදී ලෙනින්ගේ නායකත්වයෙන් යුත් විප්ලවවාදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ට ඡන්ද බහුතරයක් ලැබුණු අතර අවස්ථාවාදීන්ට ඡන්ද අල්පතරයක් ලැබුණු නිසා පළමුවැනි කණ්ඩායම "බොල්ෂෙවික්වරු" (බහුතරයෝ) හා දෙවෙනි කණ්ඩායම "මෙන්ෂෙවික් වරු" (අල්පතරයො) ලෙසට නම් කරන ලදහ.

1905-1907 විප්ලවය සමයේදී මෙන්ෂෙවික් වරු, විප්ලවයේ නිර්ධන පන්ති නායකත්වයට විරුද්ධව ද, කම්කරු පන්තියේ හා ගොවීන්ගේ සන්ධානයට විරුද්ධවද, ඉදිරිපත් වෙමින් විප්ලවයේ නායකත්වය පවරා දිය යුතුයයි ඔවුන් අදහස් කළ ලිබරල් ධනපති පන්තිකයින් සමග එකඟත්වයට එළඹෙන ලෙස ඉල්ලූහ. 1905-1907 විප්ලවය පරාජය වීමෙන් පසු ප්‍රතිවිප්ලවවාදී මර්දනයේ අවුරුදුවලදී මෙන්ෂෙවික්වරුන්ගෙන් වැඩි දෙනෙක් කම්කරු පන්තියේ පක්ෂය අහෝසි කරන ලෙස ඉල්ලමින් සිටි ලික්විඩේටර් වාදීන් බවට පත් වූහ. 1917 පෙබරවාරි මස ධනපති ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය ජයග්‍රාහී වූ පසු මෙන්ෂෙවික් වරු තාවකාලික ආණ්ඩුවට ඇතුල් වී එහි අධිරාජ්‍යවාදී ප්‍රතිපත්තියට රුකුල් දුන් අතර සූදනම් කෙරෙමින් පැවති සමාජවාදී විප්ලවයට විරුද්ධව කටයුතු කළහ.

ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු එක එල්ලේම ප්‍රතිවිප්ලවවාදී පක්ෂයක් බවට පත් වූ සෝවියට් බලය පහ කර දැමීමේ කුමන්ත්‍රණ හා කැරලි සංවිධාන කරමින් ඒවාට සහභාගී වූහ.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

5 කාල් මාක්ස්, ''ගෝතා වැඩ පිළිවෙළ ගැන විවේචනය IV කොටස (මාක්ස් සහ එංගල්ස්, තෝරාගත් කෘති, වෙළුම 3, පිටු 25—30) සහ ෆ්‍රෙඩ්රික් එංගල්ස්, ''ඩූරිං විරෝධය'' මොස්කව් 1969, පිටු 332-333 සහ එංගල්ස් 1875 මාර්තු 18—28 දිනැතිව ඕගස්ට් බෙබෙල් වෙත යැවූ ලිපියද (මාක්ස් සහ එංගල්ස්, තෝරාගත් කෘති, වෙළුම 3, පිටු 31-37) බලන්න.

6 කාල් මාක්ස්, ''ප්‍රාග්ධනය'', වෙළුම 1, පිටු 708 බලන්න.

7 තිස් අවුරුදු යුද්ධය (1618—1648) —යුරෝපීය රටවල විවිධ පෙළ ගැසීම් අතර වූ ප්‍රතිවිරෝධතාවයන් උග්‍ර වී ඇති වූ සහ ප්‍රොටස්ටන්ට්වරුන් සහ කතෝලිකයන් අතර යුද්ධයක ස්වරූපය ගත්, පොදු යුරෝපීය යුද්ධයකි. එහි ප්‍රථම අවධියේදී, මෙම යුද්ධයේ ස්වභාවය නිරූපනය වූයේ වැඩවසම් ඒකාධිපති යුරෝපයේ ප්‍රතිගාමී බලවේගයන්ට දක්වන ප්‍රතිරෝධයෙනි. එහෙත් පසුව, විශේෂයෙන් 1635 ආරම්භ වීමත් සමග, එය විදේශ හමුද විසින් නැවත නැවතත් ජර්මනිය ආක්‍රමණය කිරීමක ස්වරූපයක් ගත්තේය. ජර්මනිය දේශපාලන වශයෙන් කැබලි කිරීම ස්ථිර කළ වෙස්ට්පාලියානු සාම ගිවිසුම අත්සන් කිරීමෙන් 1648 දී එය කෙළවර විය.

8 ෆ්‍රෙඩ්රික් එංගල්ස්, ''ඩූරිං විරෝධය'', පිටු 220 බලන්න.

9 ''ගෝතා වැඩ පිළිවෙළ'' — ජර්මනියේ සමාජවාදී කම්කරු පක්ෂයේ 1875 ගෝතා සම්මේලනයේදී අනුමත කරන ලද වැඩ පිළිවෙළය. මෙම සම්මේලනයේ දී ජර්මන් සමාජවාදී පක්ෂ දෙක එක්සත් විය. එසේ එක්සත් වූයේ ඕගස්ට් බෙබෙල් සහ විල්හෙල්ම් ලීබ්ක්නෙෂ්ට්ගේ නායකත්වයෙන් යුත් සහ මාක්ස්ගේ සහ එංගල්ස්ගේ දෘෂ්ටිමය බලපෑම සහිත වූ අයිසෙනාෂ් වරුන් සහ ලසාල්වාදීන්ය. එම වැඩ පිළිවෙළ සාරසංග්‍රහවාදයේ සහ අවස්ථාවාදයේ ලක්ෂණ දැරුවේය. එසේ වූයේ අයිසෙනාෂ් වරු වැදගත් ප්‍රශ්න සම්බන්ධයෙන් ලසාල්වාදීන්ට ඉඩ දෙමින් ලසාල්වාදීන්ගේ යෝජනා පිළිගත් හෙයිනි. 1869 අයිසෙනාෂ් වැඩ පිළිවෙළ සමග සසඳන කල, කෙටුම්පත් ගෝතා වැඩ පිළිවෙළ ආපසු තැබූ විශාල පියවරක් ලෙසට සලකා මාක්ස් ඔහුගේ ''ගෝතා වැඩ පිළිවෙළ ගැන විවේචනය'' මගින්ද, එංගල්ස් ඔහු 1875 මාර්තු 18-28 ඕගස්ට් බෙබෙල්ට යැවූ ලිපියෙන්ද එය විවේචනය කළහ.

10 ශතවර්ෂයාවසානයේදී රටවල් ගණනාවක ධනපති කොටස්, සුළු සහන දීමේ මාර්ගයෙන් කම්කරු පංතිය භේදකර නිර්ධන පංතිය විප්ලවවාදී අරගලයෙන් අන් මගකට යොමු කිරීම පිණිස උපක්‍රමයක් ක්‍රියාත්මක කළහ: ඔවුහු, සමාජවාදී පක්ෂවල සමහර ප්‍රතිසංස්කරණවාදී නායකයින්ට ප්‍රතිගාමී ධනපති ආණ්ඩුවල තනතුරු පිරිනැමූහ, 1892 දී ජෝන් බර්න්ස් ඉංග්‍රීසි පාර්ලිමේන්තුවට තෝරා පත් කරන ලද අතර, 1899 දී ප්‍රංශ සමාජවාදී ඇලෙක්සාන්ඩර් එට්යේන් මිලෙරාන්, වල්දෙක්-රුසෝගේ ප්‍රතිගාමී ධනපති පංතික ආණ්ඩුවට එකතු වී, ධනපති පංතියට එහි ප්‍රතිපත්තිය ගෙනයාමට ආධාර කළේය. ධනපති ආණ්ඩුවට මිලෙරාන් සම්බන්ධ වීම නිසා ප්‍රංශයේ කම්කරු පංති ව්‍යාපාරයට බලවත් හානි සිදු විය. මිලෙරාන් වාදය යනු පංතිය පාවා දීමක් සහ සංශෝධනවාදය ලෙසට, ලෙනින් විස්තර කළේය. විසිවැනි ශතවර්ෂයාරම්භයේ දී ඉතාලියේ සමාජවාදීන් වූ ලියොනීඩ බිසොලාති, ඉවනෝ බොනෝමි සහ වෙනත් අය ආණ්ඩුව සමග සහයෝගිතාව-යෙන් කටයුතු කිරීමට විවෘත ලෙසට පක්ෂ විය. 1912 දී ඔවුන් සමාජවාදී පක්ෂයෙන් නෙරපා දමන ලදී.

දෙවැනි ලෝක යුද්ධය සමයේදී රටවල් ගණනාවකම සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂවල දක්ෂිණාංශික, අවස්ථාවාදී නායකයෝ විවෘත ලෙසම, සමාජ-ජාත්‍යෝන්මාදවාදයේ ස්ථාවරය පිළිගනිමින් ධනපති ආණ්ඩුවලට එකතු වී, ඒවායේ ප්‍රතිපත්ති ගෙනයාමට ඒවාට ආධාර කළහ.

LIBERATIONBASE

11 කැඩෙට් වරු — රුසියාවේ ලිබරල් රාජාණ්ඩුවාදී ධනපති පංතියේ ප්‍රධාන පක්ෂය වූ ව්‍යවස්ථාවාදී-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ සාමාජිකයෝ ය. 1905 ඔක්තෝබර් මාසයේදී බිහ කරන ලද එම පක්ෂය සමන්විත වූයේ ධනපති පංතියේ නියෝජිතයින්, ඉඩම්හිමි සෙම්ස්ත්ව නායකයින්, ධනපති බුද්ධිමතුන් යනාදීන් ගෙනි. පසු කලෙක කැඩෙට් වරු අධිරාජ්‍යවාදී ධනපති පංතියේ පක්ෂයක් බවට පෙරළිණ.

පළමුවැනි ලෝක යුද්ධයේ අවුරුදුවලදී කැඩෙට් වරු සාර් ආණ්ඩුවේ රටවල් අල්ලා ගැනීම් ප්‍රතිපත්තියට ක්‍රියාශීලී ලෙස ආධාර දුන් අතර පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය සමයේදී ඔවුහු රාජාණ්ඩුව ආරක්ෂා කිරීමට උත්සාහ කළහ. ධනපති තාවකාලික ආණ්ඩුවේ ප්‍රමුඛ කැඩෙට් වරු ජනතා විරෝධී ප්‍රතිවිප්ලවවාදී ප්‍රතිපත්තිය අනුගමනය කළහ. ඔක්තෝබර් සමාජවාදී විප්ලවය ජයග්‍රාහී වීමෙන් පසු සෝවියට් බලයේ අසමාදන සතුරන් ලෙසට ඉදිරිපත් වූ ඔවුහු, සියලුම ආයුද්ධ සන්නද්ධ ප්‍රතිවිප්ලවවාදී කැරලිවලට හා විදේශීය ආක්‍රමණික ක්‍රියාවන්ටද සහභාගී වූහ.

12 "Die Neue Zeit" (නවීන කාලය) — 1883 පටන් 1923 දක්වා

https://liberationbase.wordpress.com

ෂටුට්ගාට්හි පළ කෙරුණු, ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ න්‍යායික සඟරාවකි.

13 මෙම සඳහන කර ඇත්තේ, ''ජාත්‍යන්තර වැඩ කරන ජනතා සංගමයේ යුරෝපයේ සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ සමාජිකයින් වෙත ප්‍රැන්කෝ-ප්‍රැසියන් යුද්ධය ගැන වූ ජාත්‍යන්තර වැඩ කරන ජනතා සංගමයේ මධ්‍යම මණ්ඩලයේ දෙවැනි ලිපිය'' ගැනය. එය 1870 සැප්තැම්බර් 6 සහ 10 අතර මාක්ස් විසින් ලන්ඩනයේදී ලියන ලදී. (මාක්ස් සහ එංගල්ස්, තෝරාගත් කෘති, වෙළුම 2, පිටු 195-201 බලන්න).

14 මාක්ස් කුගෙල්මාන් වෙත යැවූ 1871 අප්‍රේල් 12 දින ලිපිය බලන්න (මාක්ස් සහ එංගල්ස්, තෝරාගත් කෘති, වෙළුම 2, පටු 420—421).

15 කාල් මාක්ස්, ''ප්‍රංශයේ සිවිල් යුද්ධය'' බලන්න. (මාක්ස් සහ එංගල්ස්, තෝරාගත් කෘති, වෙළුම 2, පිටු 217-221).

තවත් ඉදිරියේදී, ලෙනින් එම කෘතියෙන්ම කොටස් උපුටා දක්වයි. (ඉහත සඳහන් වෙළුමෙහි පිටු 222, 220-221).

16 ජිරොන්ඩිස්ට්වරු'' — දහ අටවැනි ශතවර්ෂයේ ප්‍රංශ ධනපති විප්ලවය සමයේ පැවති දේශපාලන කණ්ඩායමකි. මධ්‍යම ධනපති පංතියේ උවමනාවන් ප්‍රකාශ කළ ඔවුහු, විප්ලවය සහ ප්‍රතිවිප්ලවය අතර වැනෙමින්, රාජාණ්ඩුව සමග සම්මුතිවලට එළඹුනහ.

17 ප්‍රෙඩ්රික් එංගල්ස්, ''නිවාස ප්‍රශ්නය'' (මාක්ස් සහ එංගල්ස්, තෝරාගත් කෘති, වෙළුම 2, පිටු 295-375) බලන්න.

18 බ්ලංකිවාදය — ප්‍රමුඛ පංශ ජාතික විප්ලවවාදියෙකු වූද ප්‍රංශ මනෝ-රාජික කොමියුනිස්ට්වාදයේ සම්භාවනීය නියෝජිතයෙකු වූද ලුයී-ඔගුස්ට් බ්ලංකි (1805-1881) ගේ නායකත්වයෙන් යුත්, ප්‍රංශ සමාජවාදී ව්‍යාපාරයේ එක් උපනතියකි.

පන්ති අරගලය ප්‍රතික්ෂේප කළ බ්ලංකිවාදීහු ''නිර්ධන පංතිය ගෙන යන පංති අරගලය තුළින් නොව බුද්ධිමතුන්ගේ සුළු පිරිසකගේ කුමන්ත්‍රණ තුළින්ම මනුෂ්‍ය වර්ගයා වේතන වහල්භාවයෙන් මුදලිය හැකි යයි අපේක්ෂා කළහ'' (වී. අයි. ලෙනින්. කෘති එකතුව, වෙළුම 13 පිටු 76).

විප්ලවවාදී පක්ෂයේ ක්‍රියාකාරිත්වය වෙනුවට රහසිගත කුමන්ත්‍රණ කාරයින් අතලොස්සකගේ කැරලි ගසා නැගී සිටීම් ආදේශ කළ

බ්ලංකිවාදීහු, ඒවා සාර්ථක වීමට අවශ්‍ය වාතාවරණය ද මහජනයා සමඟ සබඳතාද ගැන සැලකිල්ලට නො ගත්හ.

19 ''ප්‍රැදෝන් වාදය'' — සුළු-ධනපති සමාජවාදයේ, අවිද්‍යාත්මක හා මාක්ස්වාදයට විරුද්ධ උපනතියකි. එයට නම තබන ලද්දේ එහි දෘෂ්ටිවාදියා වූ ප්‍රංශ අරාජිකවාදී ප්‍රැදෝන්ගේ නම අනුවය.සුළු ධනපති ප්‍රතිෂ්ඨාවක් ගත් ඔහු ලොකු ධනපති දේපල ගැන විවේචනය කළ අතර, සුළු දේපල හිමිකම සදාකාලික කිරීම ගැන සිහින මැව්වේය. කම්කරුවන්ට නිෂ්පාදන මාර්ග අත්පත් කර ගෙන, හස්ත කාර්මිකයන් වීමට සහ ඔවුන්ගේ නිෂ්පාදිතයන් ''සාධාරණ ලෙස'' අලෙවි කිරීමට ආධාරෝපකාර විය හැකි මහජන සහ විනිමය බැංකු පිහිටුවන ලෙස ඔහු යෝජනා කළේය.ප්‍රැදෝන්ට නිර්ධන පංතියේ ඓතිහාසික කාර්ය භාරය ගැන අවබෝධයක් නොවීය. ඔහු පංති අරගලයට, නිර්ධන පංති විප්ලවයට සහ නිර්ධන පංති ආඥාදායකත්වයට විරුද්ධ විය. එසේම අරාජිකවාදියෙක් ලෙසට, ඔහු රාජ්‍යයේ අවශ්‍යතාවය ප්‍රතික්ෂේප කළේය.

ප්‍රැදෝන්වාදීන් ඔවුන් ගේ අදහස් පළමුවැනි ජාත්‍යන්තරය මත පැටවීමට දරූ ප්‍රයත්නවලට විරුද්ධව මාක්ස් සහ එංගල්ස් නිරන්තර අරගලයක් කළහ.

20 මෙම සඳහන කර ඇත්තේ, 1873 දෙසැම්බරයේ දී "Almanacco repub-licano per l'anno 1874" නැමති ඉතාලියානු සංස්කරණයෙහි සහ ඉන් පසුව 1913 දී ජර්මන් "Die Neue Zeit" හි පළ කෙරුණු කාල් මාක්ස්ගේ ''දේශපාලන උදාසීනත්වය'' සහ ප්‍රෙඩ්රික් එංගල්ස් ගේ ''අධිකාර බලය ගැන'' යන ලිපි ගැනය.

21 කාල් මාක්ස්ගේ ''දේශපාලන උදාසීනත්වය'' යන කෘතිය බලන්න (මාක්ස් සහ එංගල්ස්, කෘති, 2 මුද්‍රණය, වෙළුම 18 පිටු 9-32).

22 ප්‍රෙඩ්රික් එංගල්ස්, ''අධිකාරි බලය ගැන'' බලන්න (මාක්ස් සහ එංගල්ස්, තෝරාගත් කෘති, වෙළුම 2, පිටු 328).

23 ප්‍රෙඩ්රික් එංගල්ස්, ''අධිකාරි බලය ගැන'' බලන්න (මාක්ස් සහ එංගල්ස්, තෝරාගත් කෘති, වෙළුම 2, පිටු 328-379).

24 කාල් මාක්ස්, ''ගෝතා වැඩ පිළිවෙළ ගැන විවේචනය'' බලන්න (මාක්ස් සහ එංගල්ස්, ''තෝරාගත් කෘති'' වෙළුම 3, පිටු 13-30).

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

25 මෙම සඳහන මාක්ස්ගේ ''දර්ශනයේ දිළිඳුකම'' යන කෘතිය ගැනය. (''දර්ශනයේ දිළිඳුකම, මොස්කව්, 1973. බලන්න).

26 එර්පුර්ට් වැඩ පිළිවෙළ—1891 ඔක්තෝබරයේදී එර්පුර්ට් සම්මේලනයේදී සම්මත කරන ලද, ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ වැඩ පිළිවෙළ ය. මේ වැඩ පිළිවෙළ පදනම් වූයේ ධනපති නිෂ්පාදන ක්‍රමයේ විනාශය හා ඒ වෙනුවට සමාජවාදී නිෂ්පාදන ක්‍රමය ආදේශ වීම පිළිබඳ මාක්ස්ගේ න්‍යායය මත ය. එයින්, කම්කරු පංතිය දේශපාලන අරගලය ගෙන යා යුතු බව අවධාරණය වූ අතර එම අරගලයේදී නායකයා ලෙසට පක්ෂය ඉටු කළ යුතු කාර්ය කොටස විස්තර වූ නමුත් එම වැඩ පිළිවෙළෙහි නිර්ධන පංතියේ ආඥාදායකත්වය ගැන කිසියම් සඳහනක් නොමැති වීම වැනි අවස්ථා වාදයට වැදගත් සහනයන් සලසන ලදී. ''1891 සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කෙටුම්පත් වැඩපිළිවෙළ ගැන විවේචනය'' යන කෘතියෙන් ෆ්‍රෙඩ්රික් එංගල්ස් එම වැඩ පිළිවෙළ සවිස්තර විවේචනයට භාජන කළේය. සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ නායකයෝ එංගල්ස්ගේ විවේචනය පක්ෂ සාමාජිකයින්ගෙන් වසං කළ අතර ඔහුගේ වැදගත්ම සටහන් වැඩ පිළිවෙළෙහි අවසාන සංස්කරණය සූදනම් කිරීමේදී සැලකිල්ලට නො ගන්නා ලදී.

27 ෆ්‍රෙඩ්රික් එංගල්ස්, ''1891 කෙටුම්පත් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී වැඩ පිළිවෙළ ගැන විවේචනයක්'' බලන්න. (මාක්ස් සහ එංගල්ස්, ''තෝරාගත් කෘති'', වෙළුම 3, පිටු 422) තවත් ඉදිරියේදී ලෙනින් එම කෘතියෙන්ම කොටස් උපුටා දක්වයි (එම වෙළුමෙහිම පිටු 433—436).

28 ''සමාජවාදය ට විරුද්ධ නීතිය'' (සමාජවාදීන්ට විරුද්ධ විශේෂ නීතිය), 1828 දී බිස්මර්ක් ආණ්ඩුව විසින් ජර්මනියේ කම්කරු පංති සහ සමාජවාදී ව්‍යාපාරයට විරුද්ධව සටන් කිරීම සඳහා පනවන ලද්දකි. මෙම නීතිය යටතේ සියළුම සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී සංවිධාන, සියළු පොදුජන කම්කරු සංවිධාන සහ කම්කරු පංති පුවත්පත් තහනම් කිරීමද, සමාජවාදී පොතපත රාජසන්තක කිරීම ද, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ට තාඩන පීඩන කිරීමද, ඔවුන් පිටුවහල් කිරීමද සිදුවිය. පොදුජන බලපෑම සහ වර්ධනය වන කම්කරු පංති ව්‍යාපරය නිසා 1890 දී සමාජවාදයට විරුද්ධ නීතිය අවලංගු කිරීමට හේතුවිය.

29 ''ප්‍රාව්ද'' (ඇත්ත) — 1912 අප්‍රේල් 22 (මාර්තු 5) සිට සන්ත පීටර්බුර්ගයේදී දින පතා පළ කෙරුණු නිත්‍යානුකූල බොල්ෂෙවික්වාදී පුවත් පතය. එම පත්‍රය පළ වූයේ කම්කරුවන්ම එකතු කළ මුදලිනි. එම පත්‍රය සාමාන්‍ය වශයෙන් 40000 ක් මුද්‍රණය කෙරුණු අතර තමහර කලාප 60000 ක් දක්වා මුද්‍රණය කෙරින.

''ප්‍රාව්ද'' පුවත් පත නිතරම පොලිස් මර්දනයට භාජන වූ අතර එය 1914 ජූනි 8(21) ද වසා දමන ලදී.

''ප්‍රාව්ද'' පළ කිරීම නැවත පටන් ගත්තේ 1917 පෙබරවාරි ධනපති ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයෙන් පසු පමණකි. 1917 මාර්තු 5(18) ද ''ප්‍රව්ද'' රු. ස. ප්‍ර. ක. ප. මධ්‍යම හා පීටර්බුර්ග් කාරක සභාවල නිල පත්‍රය බවට පත් වීය. එම අවුරුද්දේ අප්‍රියෙල් 5(18) ද විදේශයෙන් ආපසු පැමිණි වී. අයි. ලෙනින් එදින පටන් එහි කර්තෘ මණ්ඩලයට ඇතුල් වී එහි නායකත්වය භාර ගත්තේය. 1917 ජූලි — ඔක්තෝබර් මාසවලදී ප්‍රතිවිප්ලවවාදී ධනපති තාවකාලික ආණ්ඩුව කළ මර්දන ක්‍රියා නිසා බොහෝ වර සිය නම මාරු කරමින් ''ලිස්තොක් ප්‍රාව්දි'' (ප්‍රාව්ද හි පත්‍රයක්), ''ප්‍රලිතාරි'' (නිර්ධන පන්තිකයා), ''රබෝචි'' (කම්කරුවා), ''රබෝචි පුත්'' (කම්කරු මාවත) යන නම්වලින් පළ විය. ඔක්තෝබර් සමාජවාදී විප්ලවය ජයග්‍රාහී වීමෙන් පසු, 1917 ඔක්තෝබර් 27 (නොවැම්බර් 8) සිට, පක්ෂයේ නිල පත්‍රය ස්වකීය මුල් නාමය යටතේ පළ කෙරෙන්නට විය.

30 මාක්ස්ගේ ''ප්‍රංශයේ සිවිල් යුද්ධය'' නැමති පොතට ෆ්‍රෙඩ්රික් එංගල්ස්ගේ පෙරවදන බලන්න. (මාක්ස් සහ එංගල්ස්, තෝරාගත් කෘති, වෙළුම 2).

තවත් ඉදිරියේදී, එම කෘතියෙන් කොටස් උපුටා දක්වයි (එම වෙළුම පිටු 179-180, 184, 182-189 බලන්න).

31 මෙම සඳහන කර ඇත්තේ, තාවකාලික ආණ්ඩුවේ මෙන්ෂෙවික් ඇමතිවර ට්සෙරෙතේලි 1917 ජූනි 11(24) දින ප්‍රථම සමස්ත රුසියා සෝවියට් සභා සම්මේලනයේ සභාපති මණ්ඩලයේත්, පෙට්‍රොග්‍රෑඩ් කම්කරු හා සොල්දදු නියෝජිත සෝවියට් සභාවේ විධායක කාරක සභාවේත්, ගොවිජන නියෝජිත සෝවියට් සභාවේ විධායක කාරක සභාවේත්, සම්මේලනයේ කණ්ඩායම් සියල්ලෙහිම බියුරෝ සභාවලත් ඒකාබද්ධ රැස්වීමට කළ කථාව ගැනය. ට්සෙරතේලි ඔහුගේ කථාව කළේ, ජූනි 10(23) දින සඳහා බොල්ෂෙවික්වරුන් නියම කර තිබූ පෙට්‍රොග්‍රෑඩ් කම්කරුවන්ගේ සහ සොල්දදුවන්ගේ සාමකාමී පෙළපාළිය පිළිබඳ ප්‍රශ්නය ගැන සාකච්ඡා කෙරුණු අවස්ථාවේදීය. ඔහුගේ කථාව අපවාදත්මක සහ ප්‍රතිවිප්ලවවාදී එකක් විය. ආණ්ඩුවට

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

විරුද්ධව කුමන්ත්‍රණ කිරීම සහ ප්‍රතිවිප්ලවවාදීන් සමග එක්ව කටයුතු කිරීම ගැන බොල්ෂෙවික්වරුන්ට චෝදනා කළ ඔහු, බොල්ෂෙවික්-වරුන් අනුගමනය කළ කම්කරුවන් නිරායුධ කිරීමට දැඩි පියවර ගැනීමට තර්ජනය කළේය.

32 Los-von-Kirche-Bewegung (පල්ලිය අත් හැර යාමේ ව්‍යාපාරය) පළමු ලෝක යුද්ධයට පෙර ඉතා පුළුල් පරිමාණයෙන් ජර්මනිය තුළ පැතිර ගියේය. "Die Neue Zeit" එහි 1914 ජනවාරි කලාපයෙහි සංශෝධනවාදී පෝල් ගොහ්රේ ගේ "Kirchenaustrittsbewegung und Sozialdemokratie" (''පල්ලියෙන් ඉවත් වීමේ ව්‍යාපාරය සහ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය) යන ලිපිය පළ කරමින් එම ව්‍යාපාරය ගැන ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය දක්වන ආකල්පය ගැන සාකච්ඡාව පටන් ගත්තේය. පල්ලියෙන් ඉවත්වීමේ ව්‍යාපාරය සම්බන්-ධයෙන් පක්ෂය මධ්‍යස්ථව සිටිය යුතු යයිද, පක්ෂය වෙනුවෙන් ආගමට සහ පල්ලියට විරුද්ධව ප්‍රචාරයෙහි යෙදීම එහි සාමාජිකයිනට තහනම් කළ යුතු යයිද සාකච්ඡාවේදී කී ගොහ්රේ ගේ මත බිඳ දැමීමට ප්‍රමුඛ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී නායකයෝ අසමත් වූහ.

33 ගෙවිය හැකි වැටුප් ලෙසට ලෙනින් යෝජනා කර තිබෙන සංඛ්‍යා සඳහන් කර ඇත්තේ 1917 වර්ෂයේ දෙවැනි භාගයේ සංසරණය වූ නෝට්ටු වල වටිනාකම් අනුවය.

රුසියාවේ කඩදසි රූබලය ප්‍රථම ලෝක යුද්ධය සමයේ දී බොහෝ දුරට වටිනාකමින් ක්ෂය වූයේය.

34 ලසාල්වාදීන් — ප්‍රමුඛ ජර්මන් සමාජවාදියෙකු වූ ෆර්ඩිනාන්ඩ් ලසාල් විසින් 1863 දී ආරම්භ කරන ලද පොදු ජර්මන් කම්කරු සංගමයේ සාමාජිකයින් මෙසේ හැඳින්විණ. කම්කරු පංතියේ පොදුජන දේශපාලන පක්ෂයක් පිහිටුවීම ජර්මනියේ කම්කරු පංති ව්‍යාපාරයේ විශාල ඉදිරි පියවරක් වූයේය. එසේ වූ ලසාල් සහ ඔහුගේ අනුගාමිකයෝ න්‍යායය සහ උපක්‍රම පිළි මූලික ප්‍රශ්නයේ දී අවස්ථාවාදී ස්ථාවරයක් ගත්හ. සංගමයේ දේශපාලන වැඩ පිළිවෙළ සර්වජන ඡන්දය සඳහා අරගල කිරීම බවත් එහි ආර්ථික වැඩ පිළිවෙළ රජයේ ආධාර ලබන කම්කරු නිෂ්පාදන සංගම් පිහිටුවීම බවත් ප්‍රකාශ කරන ලදී.

ලසාල් සහ ඔහුගේ අනුගාමිකයෝ, ස්වකීය ප්‍රායෝගික කටයු-තුවලදී ප්රෂියාවේ මූලිකවාදයට ගැලපෙන සේ හැඩ ගැසුනු අතර බිස්මාර්ක් ගේ මහබලවත් ප්‍රතිපත්තියට ආධාර කළහ. ලසාල් ජර්මන් කම්කරු පංති ව්‍යාපාරයේ අවස්ථාවාදී උපනතියක් ලෙසට හැඳින්වූ මාක්ස් සහ එංගල්ස් ඔවුන්ගේ න්‍යායය, උපක්‍රම සහ සංවිධාන ප්‍රතිපත්ති නිතර නිතර සහ තියුණු ලෙස විවේචනය කළහ.

35 ෆ්‍රෙඩ්රික් එංගල්ස්, "Internationales aus dem 'Volksstaat'" (1871-1875) යන සඟරාවට පෙරවදන බලන්න.

36 මෙම සඳහන රු. ස. ප්‍ර. ක. ප. දෙවැනි සම්මේලනය ගැනය.

37 කාල් මාක්ස්, ''ගෝතා වැඩ පිළිවෙළ ගැන විවේචනය'' බලන්න. (මාක්ස් සහ එංගල්ස්, තෝරාගත් කෘති, වෙළුම 3, පිටු 36).

38 කාල් මාක්ස්, ''ප්‍රංශයේ සිවිල් යුද්ධය'' බලන්න. (මාක්ස් සහ එංගල්ස්, තෝරාගත් කෘති, වෙළුම 2, පිටු 221).

39 එංගල්ස් 1825 මාර්තු 18-28 දින ඇතිව ඕගස්ට් බෙබෙල් වෙත යැවූ ලිපිය බලන්න.

40 ''ෂයිලොක්'' — ශේක්ස්පියර් ගේ ''වැනිසියේ වෙළෙන්දා'' නැමති නාට්‍යයෙහි එන චරිතයකි. වස්තු හංග ණය කරු අත්සන් කර තිබූ ගිවිසුම අනුව මස් රාත්තලක් දෙනලෙස බලකර සිටි කෲර සහ අනුකම්පා විරහිත මුදල් පොළී කාරයෙකුගේ චරිතය එයින් නිරූපනය කෙරේ.

41 මෙහිදී සඳහන් කෙරෙන්නේ අන්ත අඥාන කම හා වනචාරි සිරිත් හේතුකොට ගෙන කෲරකමට පත් සෙමනෝරි ශිෂ්‍යයන් ගැනය. රුසියානු කතුවරයෙක් වූ එන්. ජී. පමිලොව්ස්කි ඔහුගේ ''සෙමනෝරි ජීවිතය ගැන සටහන්'' යන කෘතියෙහි එම චරිත නිරූපනය ළේය.

42 ෆ්‍රෙඩ්රික් එංගල්ස්, මාක්ස්ගේ ''ගෝතා වැඩ පිළිවෙළ ගැන විවේචනය'' යන කෘතියට ප්‍රස්ථාවනාව බලන්න (මාක්ස් සහ එංගල්ස්. තෝරාගත් කෘති, වෙළුම 3, පිටු 9).

පළමුවැනි ජාත්‍යන්තරයේ හාග් සම්මේලනය කෙළින්ම මාක්ස්ගේ හා එංගල්ස්ගේ නායකත්වය යටතේ 1872 සැප්තැම්බර් 2—7 දින වල පවත්වන ලදී.

මෙ සම්මේලනයේදී මාක්ස්, එංගල්ස් හා ඔවුන්ගේ අනුගාමිකයන්,

17—2015

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කම්කරු ව්‍යාපාරයේ සියලුම ආකාරවල සුළු ධනපති කණ්ඩායම් වාදයට විරුද්ධව ගෙන ගිය අරගලය ස්මපූර්ණ කෙරිනි. අරාජිකවාදීන්ගේ කඩාකප්පල් කාරී ක්‍රියාදමය හෙළා දකින ලද අතර ඔවුන්ගේ නායකයෝ (ගියෝම් හා බකුනින්) ජාත්‍යන්තරයෙන් නෙරපා දමන ලදහ.

43 ''සර්යා'' (උදව) — ''ඉස්ක්‍රා'' කතුවරුන් විසින් 1901-1902 කාලයේ දී නීතිසහගත ලෙස ෂ්ටුට්ගාට්හි පළ කරන ලද මාක්ස්වාදී විද්‍යාත්මක සහ දේශපාලන සඟරාවකි.

ජාත්‍යන්තර සහ රුසියානු සංශෝධනවාදය විවේචනය කළ මෙම සඟරාව මාක්ස්වාදයේ න්‍යායික ප්‍රතිපත්ති ආරක්ෂා කළේය.

44 මෙම සඳහන 1900 සැප්තැම්බර් 23 සිට 27 දිනවල පැරිසියේ දී රැස්වුනු ''දෙවැනි ජාත්‍යන්තරයේ පස්වන ලෝක සම්මේලනය'' ගැනය. ප්‍රතිවිප්ලවවාදී වල්දෙක්රූසෝ ආණ්ඩුවට මිලෙරන් ඇතුළු වීමේ හේතුවෙන් ''දේශපාලන බලය දිනා ගැනීම සහ ධනපති පංති පක්ෂ සමග සන්ධාන'' යන මූලික ප්‍රශ්නය සාකච්ඡා කිරීමට යොමු වුනු මෙම සම්මේලනය, එයට කෞට්ස්කි ඉදිරිපත් කළ යෝජනාව වැඩි ඡන්දයෙන් සම්මත කළේය. එම යෝජනාවෙහි මෙසේ ද සඳහන් විය: ''ධනපති ආණ්ඩුවකට තනි සමාජවාදියෙක් ඇතුලත් වීම, දේශපාලන බලය දිනාගැනීම සඳහා වූ සාමාන්‍ය ආරම්භයක් සේ සැලකිය නොහැක. එහෙත්, එය හදිසි අවස්ථාවක ගන්නා තාවකාලික සහ අවස්ථාවට පිරිමසින පියවරක් සේ පමණක් සැලකිය හැක.'' අනතුරුව තමන් ධනපති පංතිය සමග සහයෝගීව කටයුතු කිරීම සාධාරණ කර දක්වනු පිණිස අවස්ථාවාදීහු මෙම ඡේදය උපුටා දැක්වූහ.

''පැරිසියේ අළුත්ම ලෝක සමාජවාදී සම්මේලනය ගැන වචනයක්. මට බලය පැවරූ සහෝදරවරුන්ට විවෘත ලිපියක්'' යන සිරස්තලය යටතේ 1901 අප්‍රේල් ''සර්යා'' කලාපයට ලිපියක් සැපයූ ප්ලෙහානව් කෞට්ස්කිගේ යෝජනාව විවේචනය කළේය.

45 කාල් මාක්ස්, ''ලුවී බොනපාට්ගේ බ්‍රූමේර් දහ අට'' බලන්න. (මාක්ස් සහ එංගල්ස්, තෝරාගත් කෘති, වෙළුම 2, පිටු 220) .

46 මාක්ස් සහ එංගල්ස්, ''කොමියුනිස්ට් ප්‍රකාශනයේ'' ජර්මන් මුද්‍රණයට 1872 දී ලියන ලද සංඥපනය බලන්න. (මාක්ස් සහ එංගල්ස්, තෝරාගත් කෘති, වෙළුම 1 පිටු 98—99).

47 කාල් මාක්ස්, ''ප්‍රංශයේ සිවිල් යුද්ධය'' බලන්න (මාක්ස් සහ එංගල්ස්, තෝරාගත් කෘති, වෙළුම 2, පිටු 220).

48 කෞට්ස්කිගේ පොත රුසියානු බසින් පළ වූයේ 1918 වර්ෂයේදීය.

49 කාල් මාක්ස් සහ එංගල්ස්, ''කොමියුනිස්ට් සංගමයේ මධ්‍යම කාරක සභාවට දේශනය'' බලන්න (මාක්ස් සහ එංගල්ස් තෝරාගත් කෘති, වෙළුම I, පිටු 183).

50 කාල් මාක්ස්, ''ප්‍රංශයේ සිවිල් යුද්ධය'' බලන්න (මාක්ස් සහ එංගල්ස්, තෝරාගත් කෘති, වෙළුම 2, පිටු 126).

51 මෙම සඳහන සිඩ්නි සහ බියට්‍රිස් වෙබ් ගේ ''කාර්මික ප්‍රජාතන්ත්‍රවාදය'' ගැනය.

52 ''සමාජවාදී මාසිකය'' Sozialistische Monatshefte" සඟරාවක් වූ මෙය, ජර්මන් අවස්ථාවාදීන්ගේ ප්‍රධාන නිල ප්‍රකාශනය සහ ජාත්‍යන්තර සංශෝධනවාදයේ හොරනෑව විය. එය 1867 සිට 1933 දක්වා ජර්මනියේ පළවිය.

53 ජොරේස් වාදීහු—මාක්ස්වාදයේ මූලික ප්‍රතිපත්ති සංශෝධනය කිරීම සඳහා කටයුතු කළ සහ නිර්ධන පංතිය සහ ධනපති පංතිය අතර පංති සහයෝගිතාවය දේශනා කළ ප්‍රංශ සමාජවාදියෙකුගේ අනුගාමිකයෝය. 1902 දී ඔවුහු ප්‍රංශ සමාජවාදී පක්ෂය පිහිටවූහ. එම පක්ෂය ප්‍රතිසංස්කරණවාදී ප්‍රතිපත්තියක් අනුගමනය කළේය. 1905 දී ප්‍රංශ සමාජවාදී පක්ෂය පිහිටුවීම සඳහ ගේද් ගේ නායකත්වයෙන් යුත් ප්‍රංශයේ සමාජවාදී පක්ෂය සමග එය එක්සත් විය.

ප්‍රංශ සමාජවාදී පක්ෂයේ නායකත්වයේ ප්‍රබලව සිටි ජොරේස් වාදීහු පළමු ලෝක යුද්ධය ආරම්භ වූ පසු විවෘත ලෙස යුද්ධයට ආධාර කරමින් සමාජ-ජාතොයාන්මාදවදී ස්ථාවරයක් ගත්හ.

54 ''ස්වාධීන කම්කරු පක්ෂය'' (Independent Labour Party) — 1833 දී, ක්‍රියාශීලී වැඩ වර්ජන ව්‍යාපාරය සහ බ්‍රිතාන්‍ය කම්කරු පංතිය ධනපති පක්ෂවලින් මුදු ගැනීමේ ව්‍යාපාරයේ උච්ච අවස්ථාවේදී පිහිටුවන ලද සංශෝධනවාදී සංවිධානයකි. පක්ෂයේ නායකත්වය දරුවේ ජේම්ස් කෙයර්-හාඩි හා අර්. මැක්ඩෝනල්ඩ් ය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

එහි ප්‍රධාන අවධානය පාර්ලිමේන්තු අරගලවලට සහ ලිබරල් පක්ෂය සමග වූ පාර්ලිමේන්තු සම්මුතිවලට යොමු කළ මෙම පක්ෂය ආරම්භයේ පටන්ම ධනපති-ප්‍රතිසංස්කරණවාදී ස්ථාවරයක් ගත්තේය. ස්වාධීන කම්කරු පක්ෂය "නිතරම ධනපති පංතියට යටත් වූ ඇත්ත වශයෙන්ම අවස්ථාවාදී පක්ෂයකැ"යි ලෙනින් ලිවේය (එකතු කළ කෘති, වෙළුම 29, පිටු 494).

පළමුවැනි ලෝක යුද්ධය ආරම්භ වූ අවස්ථාවේදී ස්වාධීන කම්කරු පක්ෂය යුද්ධයට විරුද්ධව ප්‍රකාශයක් නිකුත් කළ නමුත්, අප්‍රමාදවම සමාජ-ප්‍රාතොයාන්මාදවාදී ස්ථාවරයක් ගත්තේය.

55 මෙහි සඳහන් කර ඇත්තේ පෙට්‍රොග්‍රෑඩ් සහ මොස්කව් සෝවියට් සභා ගැනය.

56 මැයි 6: ප්‍රථම තාවකාලික සභාග ආණ්ඩුව ප්‍රකාශයට පත් කිරීම.

අගෝස්තු 31 — සෝවියට් ආණ්ඩුවක් පිහිටුවන ලෙස ඉල්ලමින් පෙට්‍රොග්‍රෑඩ් කම්කරු සහ සොල්දාදු නියෝජිත සෝවියට් සභාව බොල්ෂෙවික් යෝජනාවක් සම්මත කළේය.

සැප්තැම්බර් 12 — සමාජවාදී-විප්ලවවාදීන් හා මෙන්ෂෙවික්වරුන් ප්‍රබල තත්ත්වයක සිටි, කම්කරු සහ සොල්දාදු නියෝජිත සෝවියට් සභාවල මධ්‍ය විධායක කාරක සභාව ප්‍රජාතන්ත්‍රවාදී සාකච්ඡා සභාවක් කැඳවීම සඳහා නියම කළ දිනය.

සමස්ත රුසියා ප්‍රජාතන්ත්‍රවාදී සම්මේලනය — මෙය බලය පිළිබඳ ප්‍රශ්නය විසඳීම සඳහා සෝවියට් සභාවල මෙන්ෂෙවික්-සමාජවාදී-විප්ලවවාදී මධ්‍යම විධායක කාරක සභාව විසින් කැඳවනු ලැබීය. ප්‍රථමයෙන් 1917 සැප්තැම්බර් 12 (25) දිනයට නියමිත කරන ලද එම සම්මේලනය පසුව සැප්තැම්බර් 14-22 (සැප්තැම්බර් 14 — ඔක්තෝබර් 5) දිනවලට කල් තබන ලදින් එදිනවල පෙට්‍රොග්‍රෑඩයේදී රැස්විය. මෙන්ෂෙවික් හා සමාජවාදී-විප්ලවවාදී නායකයෝ, කම්කරුවන්ගේ හා ගොවීන්ගේ නියෝජිත ශක්තිය දුර්වල කිරීම සඳහාද විවිධ ධනපති හා සුළු ධනපති සංවිධානවල නියෝජිතයන්ගේ සංඛ්‍යාව වැඩි කිරීම සඳහාද සෑම උපායයක්ම යොමු කිරීමෙන් සම්මේලනයේ බහුතරය හිමි කර ගත්හ.

ප්‍රජාතන්ත්‍රවාදී සම්මේලනය පූර්ව-පාර්ලිමේන්තුවක් (සමූහාණ්ඩුවේ තාවකාලික සභාව) සංවිධාන කිරීම සඳහා වූ යෝජනාව පිළිගත්තේය. තාවකාලික ආණ්ඩුව විසින් සම්මත කරන ලද පනතක් අනුව, පූර්ව-පාර්ලිමේන්තුව ආණ්ඩුව යටතේ ක්‍රියා කරන සම්භාෂක සංවිධානයක්ව පැවතිය යුතු විය.

ප්‍රජාතන්ත්‍රවාදී සම්මේලනය සම්බන්ධයෙන් බොල්ෂෙවික්වරුන් කළ වැරදි දැඩි විවේචනයට ලක් කළ ලෙනින්, බොල්ෂෙවික්වරුන් පූර්ව-පාර්ලිමේන්තුවෙන් ඉවත් වන ලෙස ඉල්ලූ අතර කැරලි ගසා නැඟී සිටීමක් සූදානම් කිරීම සඳහා සියලුම ශක්ති සංකේන්ද්‍රණ කළ යුතුව තිබුණු බව අවධාරණය කළේය. ලෙනින්ගේ යෝජනාව ගැන සාකච්ඡා කළ පක්ෂයේ මධ්‍යම කාරක සභාව, පූර්ව-පාර්ලිමේන්තුවට සහභාගී වීමට පක්ෂව සිටි රිකව්, කාමිනෙව් හා වෙනත් අයගේ පිළිවෙතටපටහැනිව බොල්ෂෙවික්වරුන් පූර්ව-පාර්ලිමේන්තුවෙන් බැහැර යාමේ තීරණය සම්මත කළේය. පූර්ව-පාර්ලිමේන්තුව විවෘත වූ දිනය, එනම් ඔක්තෝබර් 7 (20) ද බොල්ෂෙවික්වරු ඔවුන්ගේ ප්‍රකාශනය කියවා පූර්ව-පාර්ලිමේන්තුවෙන් ඉවත් වූහ.

57 1917 අගෝස්තු 12 (25) — ප්‍රතිවිප්ලවවාදී බලවේගයන් ක්‍රියාත්මක කරවීම සහ විප්ලවය මිරිකා දැමීම සඳහා තාවකාලික ආණ්ඩුව කැඳවූ සාකච්ඡා සභාවක් මෙදින මොස්කව් නගරයේදී ඇරඹින. සාකච්ඡා සභාවේ ප්‍රතිවිප්ලවවාදී ස්වභාවය හෙළිදරව් කරන සහ විරෝධය ප්‍රකාශ කිරීමේ පොදුජන රැස්වීම් පවත්වන ලෙස වැඩ කරන ජනතාවට ආයාචනා කරන ප්‍රකාශනයක් බොල්ෂෙවික් පක්ෂයේ මධ්‍යම කාරක සභාව එදිනම නිකුත් කළේය.

පක්ෂ කාරක සභාවේ තීරණය අනුව අගෝස්තු 12 (25) මොස්කව් නගරයේ සංවිධානය කෙරුණු වැඩ වර්ජනයට 4, 00,000 කට වැඩි පිරිසක් සම්බන්ධ විය. මොස්කව් කම්කරුවන්ගේ වැඩ වර්ජනය නිසා ප්‍රතිවිප්ලවවාදී බලවේගයන්ගේ බලාපොරොත්තු අසාර්ථක විය. විරෝධය පෑමේ රැස්වීම් සහ වැඩ වර්ජන වෙනත් නගරවලද පැවැත්විනි.

58 1917 මාර්තු 2 (15) ද තාවකාලික ආණ්ඩුව ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය කැඳවීම ගැන ප්‍රකාශ කළේය. ජූනි මාස 14 (27) ද තාවකාලික ආණ්ඩුව ආ. ක්‍ර. ම. තේරීමේ මැතිවරණය සැප්තැම්බර් 17 (30) දට නියමිත කිරීමට තීරණය කළ නමුත් අගෝස්තු මාසයේදී මැතිවරණය පැවැත්වීමේ දිනය නොවැම්බර් මාස 12 (25) දක්වා කල් තබන ලදී.

ආ. ක්‍ර. ස. ම. තේරීමේ මැතිවරණය පවත්වන ලද්දේ නියමිත දිනය වූ 1917 නොවැම්බර් 12 (25) ද එනම් ඔක්තෝබර් විප්ලවයෙන් පසුය. නමුත් විප්ලවයට පෙර සම්පාදනය කර තිබුණු හා රටේ නව

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

බලතුලනය පිළිබිඹු නො කරන මැතිවරණ ලේඛණ අනුව එය පැවතිණි. එනිසා ආ. ක්‍රා. ස. ම. යේ ආසන බහුතරය ලැබුණේ දක්ෂිණාංශික සමාජවාදී-විප්ලවවාදීන්ට හා මෙන්ෂෙවික්වරුන්ටය.

ආ. ක්‍රා. ස. මණ්ඩලය සෝවියට් ආණ්ඩුව විසින් කැඳවන ලද්දේ හා එය රැස් වූයේ 1918 ජනවාරි 5(18) පෙට්‍රොග්‍රෑඩයෙහිදී ය. එහි ප්‍රතිවිප්ලවවාදී බහුතරය, සමස්ත රුසියා මධ්‍යම විධායක කාරක සභාව විසින් ඉදිරිපත් කරන ලද "වැඩ කරන හා පීඩිත ජනතාවගේ අයිති-වාසිකම් ගැන ප්‍රකාශනය" ප්‍රතික්ෂේප කළ අතර සෝවියට් බලය පිළිගැනීමට අකැමති වූහ. සමස්ත රුසියා මධ්‍යම විධායක කාරක සභාව ජනවාරි 6(19) දතම් ඇති ආඥව මගින් ආ. ක්‍රා. ස. මණ්ඩලය විසිරුවා හැරීය. කම්කරුවන්, සොල්දාදුවන් හා ගොවීන් ඇතුළු රුසියාවේ පුළුල් ජනතා කොටස් මේ පියවර අනුමත කළේය.

59 ප්‍රෙඩ්රික් එංගල්ස්ගේ "ජර්මනියේ විප්ලවය සහ ප්‍රතිවිප්ලවය" බලන්න (මාක්ස් සහ එංගල්ස්. තෝරාගත් කෘති, වෙළුම I, පිටුව 377).

එම කෘතිය ලියන ලද්දේ ප්‍රෙඩ්රික් එංගල්ස් විසිනි. එය පළ වූයේ 1851-1852 අවුරුදුවලදී "New-York Daily Tribune" පුවත්පතේ ලිපි මාලාවක් ලෙස මාක්ස්ගේ අත්සන ඇතිවය. මීට හේතුව මෙම කෘතිය තමාම ලිවීමට කැමති වූ නමුත් ආර්ථිකය පිළිබඳ පරීක්ෂණවල යෙදී සිටි මාක්ස් එම කෘතිය සම්බන්ධ කටයුතු එංගල්ස්ට පවරා දීමය. එය ලියන විට එංගල්ස් නිතරම මාක්ස්ගේ උපදෙස් අනුගමනය කළ අතර එක් එක් ලිපිය මුද්‍රණාලයට සැවීමට පෙර මාක්ස් එය කියවා අනමත කරන බවට වග බලා ගත්තේය. මේ කෘතිය එංගල්ස් විසින් ලියන ලද්දකැයි දැන ගන්නට හැකි වූයේ මාක්ස් හා එංගල්ස් අතර ලිපි හුවමාරුව පළ කිරීමෙන් පසුව පමණකි.

60 කර්නිලව් කැරැල්ල — 1917 අගෝස්තුවේදී ධනපතියන් හා ඉඩම් හිමියන් සංවිධානය කරන ලද හා සාර්ගේ හමුදාවේ උසස් තම සේනාධි-පති කර්නිලව්ගේ නායකත්වය යටතේ කෙරුණු ප්‍රතිවිප්ලවවාදී කැරැල්ල ය. කුමන්ත්‍රණකාරයින්ගේ ඉලක්කය වූයේ පෙට්‍රොග්‍රෑඩය අල්ලා ගෙන බොල්ෂෙවික් පක්ෂය විනාශ කර සෝවියට් සභා විසුරුවා දමා රටේ යුද්ධමය ආඥාදායකත්වය පිහිටුවීම මගින් රාජාණ්ඩුව පුණරුත්ථාපනය කිරීමය. කැරැල්ල පටන් ගත්තේ අගෝස්තු 25 (සැප්තැම්බර් 7) ද ය. බොල්ෂෙවික් පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ ආයාචනය පරිදි පෙට්‍රොග්‍රෑඩයේ කම්කරුවෝ සහ විප්ලවවාදී සොල්-දාදුවෝ හා සේලරුවෝ කුමන්ත්‍රණකාරයින්ට විරුද්ධව සටනට නැගී

සිටියෝය. අගනුවර කම්කරුවෝ ඉක්මණින් රතු හමුද සේනාංක ලෙසට හැඩ හැසුණහ. නොයෙක් තැන්වලදී විප්ලවවාදී සමිති පිහිටවිණි. කර්නිලව් හමුදාවේ ප්‍රගමනය නවත්වන ලදී. බොල්ෂෙවික්වරුන් ගෙන ගිය උද්ඝෝෂණය නිසා කර්නිලව් හමුදාව කැඩී බිඳී යන්නට පටන් ගත්තේය. ජනතා බලපෑම යටතේ කර්නිලව් සහ ඔහුගේ සහකාරයින් අත් අඩංගුවට ගෙන ඔවුන්ට විරුද්ධව කැරලි ගැසීම පිළිබඳ චෝදනාව නගා, ඔවුන්ට විරුද්ධව නඩු පවරන ලෙසට ආඥවක් නිකුත් කිරීමට තාවකාලික ආණ්ඩුවට සිදු විය.

61 මේ සඳහන මෙන්ෂෙවික්වරුන් හා සමාජවාදී-විප්ලවවාදීන් ගැනය.

62 අලෙක්සන්ද්‍රින්ස්කි නාට්‍ය ශාලාව — ප්‍රජාතන්ත්‍රවාදී සාකච්ඡා සභාව එහි රැස්වීම පැවැත් වූයේ පෙට්‍රොග්‍රෑඩ් නගරයේ වූ මෙය තුළය.

පෙත්‍රපව්ලව්ස්කය බලකොටු —මෙය සාර්ගේ දේශපාලන ප්‍රති-පාක්ෂිකයින් සිර කර තැබීමට සිරගෙයක් ලෙසට යොදගෙන තිබිණ. එහි විශාල ආයුධ ගබඩාවක් තිබුණ අතර, එය යුද්ධෝපාය අතින් ඉතා වැදගත් ස්ථානයක පිහිටුවා තිබිණ.

63 යුංකර්වරු — අධුනික නිලධාරීහු ය.

64 මිලෙච්ඡ හමුදව — පළමුවැනි ලෝක යුද්ධය සමයේදී කෝකේසියන් කඳුකර ජාතික ස්වේච්ඡකයින්ගෙන් සැදුණු හමුදව මෙසේ හැඳින්විණ.

65 "රබෝචි පුත්" (කම්කරු මාවත) — තාවකාලික ආණ්ඩුව විසින් වසා දමන ලද "ප්‍රාව්ද" පත්‍රය වෙනුවට බොල්ෂෙවික් පක්ෂය විසින් 1917 සැප්තැම්බර් 3(16) සිට ඔක්තෝබර් 26 (නොවැම්බර් 8) දක්වා පළ කරන ලද එහි ප්‍රධාන නිල ප්‍රකාශනය වූ දිනපතා පත්‍රයකි. ඔක්තෝබර් 27 (නොවැම්බර් 9) දින "ප්‍රාව්ද" පත්‍රය නැවත එහි මුල් නමින් පළ වෙන්නට පටන් ගත්තේය.

66 තෘදවික්වරු (ශ්‍රම කණ්ඩායම) — නරොද්නික්වාදී ගොවීන් හා බුද්ධි-මතුන්ගෙන් සමන්විත, රාජ්‍ය දූමා සභාවල සිටි, සුළු ධනපති ප්‍රජාතන්-ත්‍රවාදීන් කණ්ඩායමය. එය බිහි කරන ලද්දේ 1906 අප්‍රියෙල් මාසයේදී පළමුවැනි දූමා සභාවේ ගොවි නියෝජිතවරුන් විසිනි. දූමා සභාවේදී තෘදවික්වරු, කැඩෙට්වරුන් හා විප්ලවවාදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් අතර වැනෙමින් සිටියහ. 1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

විප්ලවයෙන් පසු ඔවුහු ක්‍රියාශීලී ලෙස තාවකාලික ආණ්ඩුවට සහයෝගය දුන් අතර ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට සතුරුකම් පෙන්වූහ.

67 බුලීගින් දූමා සභාව — උපදේශක රාජ්‍ය දූමා සභාවය, එය කැඳවීම පිළිබඳ කෙටුම්පත් පනත අභ්‍යන්තර කටයුතු පිළිබඳ ඇමති ඒ. ජී. බුලීගින් විසින් සම්පාදනය කරන ලදී. 1905 අගෝස්තු 6 (19) ද සාර්ගේ ප්‍රකාශනය, රාජ්‍ය දූමා සභාව පිහිටුවීම පිළිබඳ පනත හා දූමා සභා මැතිවරණ පිළිබඳ රෙගුලාසි නිකුත් විය. දූමා සභා මැතිවරණවලදී ඡන්ද දීමේ අයිතිය හිමි වූයේ ධනපතියන්ට, රදළ ඉඩම්හිමියන්ට හා පොහොසත් දේපළ හිමි ගොවීන්ට පමණකි. දූමා සභාවට නීති පිළිගැනීමේ අයිතිය නොතිබූ අතර එයට උපදේශක ආයතනයක් වශයෙන් ඇතැම් ප්‍රශ්න සාකච්ඡාවට ලක් කිරීමට අයිතිය තිබිණ.

''ආයුධ සන්නද්ධ කැරලි ගසා නැගී සිටීම'' යන සටන් පාඨ මත උද්ඝෝෂණ කටයුතු සංකේන්ද්‍රණය කළ බොල්ෂෙවික්වරු බුලීගින් දූමා සභාව වර්ජනය කරන ලෙස කම්කරුවන්ට හා ගොවීන්ට ආයාචනය කළහ.

68 රාජ්‍ය දූමා සභාව — 1905 විප්ලවවාදී ව්‍යාපාරයේ බලපෑම යටතේ සාර් ආණ්ඩුවට කැඳවීමට සිදුවූ නියෝජිත ආයතනය ය. නාමික වශයෙන් නීති සම්පාදක ආයතනයක් වූ එයට කිසියම් බලයක් නොමැති විය. දූමා සභා මැතිවරණ සෘජු, සමාන හෝ පොදු නොවූ අතර වැඩ කරන පංතිවල හා රුසියාවෙහි වාසය කළ රුසියානු නොවන ජාතීන්ගේ ඡන්ද දීමේ අයිතිය බොහෝ දුරට කප්පාදු විය. කම්කරුවන්ගේ හා ගොවීන්ගේ සැලකිය යුතු කොටසකට එම අයිතිය සම්පූර්ණයෙන්ම අහිමි විය. පළමුවැනි රාජ්‍ය දූමා සභාව (1906 අප්‍රියෙල්-ජූනි මස) සාර් ආණ්ඩුව විසින් විසුරුවා හරින ලදී. 1907 ජූනි 3 ද රාජ්‍ය පෙරළිය කළ සාර් ආණ්ඩුව, කම්කරුවන්ගේ හා නාගරික සුළු ධනපති පංතිකයින්ගේ අයිතිවාසිකම් තවදුරටත් කප්පාදු කරන්නා වූද තුන්වැනි (1907-1912) හා හතරවැනි (1912-1917) රාජ්‍ය දූමා සභාවල විශාල ඉඩම් හිමියන්ගේ හා ධනපතීන්ගේ සම්පූර්ණ ආධිපතිත්වය සහතික කරන්නා වූද අලුත් මැතිවරණ පනතක් නිකුත් කළේය.

69 ''ලීබෙර්දන්ලා'' —මොස්කව්හි පළ කෙරුණු ''සොසියාල්-දිමක්‍රාත්'' නැමති බොල්ෂෙවික් පත්‍රයේ ''ලීබෙර්දන්'' නමින් පළ වූ දෙයාන් බේද්නිගේ පාද පාඨයෙන් පසු ලීබෙර් සහ දන් යන මෙන්ෂෙවික් නායකයන්ට පටබැඳුනු විකට නාමයකි.

70 ටිට ටිටිච් — එන්. ඔස්ත්‍රොව්ස්කිගේ ''නොපැවැත්වුණු මත් පැන් සංග්‍රහයෙන් සෙප්පන් නැති වීම'' නම් වූ නාට්‍යයෙහි එන පොහොසත් වෙළෙන්දෙකුගේ චරිතයය. ලෙනින් ඒ නාමයෙන් හැඳින්වූයේ ධනපති කෑදරයන් ය.

71 කලෙන්ඩ්ස් — මාසයේ මුල් දිනය යන අර්ථය දෙන පැරණි රෝමානු වචනයකි. මෙම නම ග්‍රීක භාෂාවෙහි නොවීය. එනිසා ''ග්‍රීක කලෙන්ඩ්ස් දිනය'' යන්නෙන් කිසි කලෙකත් නොවන යන්න අදහස් විය.

72 මෙහි සඳහන් කෙරෙන්නේ 1917 ජූලි මාසයේදී 4000 ක සාමාජිකත්වයක් සිටි විප්ලවවාදී සේලරුවන්ගේ සංවිධානයේ නායකත්වය යටතේ 1917 අගෝස්තුවේදී ජර්මන් සේලරුවන් කළ විප්ලවවාදී සටන ගැනය. එයට නායකත්වය දෙන ලද්දේ ''මහා ප්‍රෙඩ්රික්'' හි නාවුකයන් වූ මැක්ස් රයිහ්පිච් සහ අල්බින් කේබිස් විසිනි. ප්‍රජාතන්ත්‍රවාදී සාමයක් සඳහා සටන් කිරීමටත්, කැරලි ගසමින් නැගී සිටීමක් සඳහා සූදනම් වීමටත් සංවිධානය තීරණය කළේය. අගෝස්තු මාසයේ මුල් දිනවල නාවුක හමුදාවේ ඉරියව් පෙනෙන්නට විය. විල්හෙල්මස්හාපන්හි නවතා තිබුණු ''ප්‍රින්ස් රීජන්ට් ලුයිට්පොල්ඩ්'' යුද්ධ නැවේ සේලරුවෝ කලින් වැඩ වර්ජනයක් කිරීම නිසා අත් අඩංගුවට ගනු ලැබ සිටි ඔවුන්ගේ සහෝදරවරුන් වෙනුවෙන් සටන් කිරීම සඳහා නිවාඩු නොගෙන බැහැරව සිටියහ. අගෝස්තු 16 දින ''වෙස්ට්පාලිය'' නැවෙහි අඟුරු දමන්නෝ වැඩ කිරීම ප්‍රතික්ෂේප කළහ. ඒ අතරම මුහුදේ තිබුණු ''නියුරෙම්බරග්'' නැමති කෲසර් නෞකාවේ නාවුක පිරිස කැරලි ගැසූහ. සේලරුවන්ගේ ව්‍යාපාරය විල්හෙල්මස්හාපන්හි නෞකා ගණ කීපයකම නැව්වලට පැතිරී ගියේය. ජර්මන් නාවුක හමුදාවේ විප්ලවවාදී සටන් ඉතාමත් කෲර ලෙස මර්දනය කරන ලදී. රයිහ්පිච් හා කේබිස් වෙඩි තබා මරන ලද අතර, අනිකුත් ක්‍රියාශීලී සටන්කරුවන්ට බරපතල වැඩ ඇතිව දීර්ඝ සිර දඬුවම් දෙන ලදී.

73 මේ සඳහන වාමාංශික සමාජවාදී-විප්ලවවාදීන් ගැනය.

වාමාංශික සමාජවාදී-විප්ලවවාදීහු — 1917 නොවැම්බර් 19-28 (දෙසැම්බර් 2-15) රැස් වුණු පළමුවැනි සමස්ත රුසියා සම්මේලන වාරයේදී සංවිධානාත්මක වශයෙන් හැඩ ගැසුණු වාමාංශික (අන්තර්ජාතිකවාදී) සමාජවාදී-විප්ලවවාදී පක්ෂ සාමාජිකයෝ ය. ඊට පෙර ඒ පක්ෂය පැවතියේ පළමුවැනි අධිරාජ්‍යවාදී යුද්ධ අවුරුදුවලදී හැඩ ගැසෙන්නට පටන් ගත් සමාජවාදී-විප්ලවවාදී පක්ෂයේ වාමාංශය වශයෙනි.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සෝවියට් සභාවල දෙවැනි සමස්ත රුසියා සම්මේලනයේදී එම සම්මේලනයට සහභාගී වීමේ ප්‍රශ්නය ගැන ඇති වූ වෙනස්කම් නිසා බිඳී ගිය සමාජවාදී-විප්ලවවාදීන්ගේ කණ්ඩායමේ බහුතරය වූ වාමාංශික සමාජවාදී-විප්ලවවාදීහු න්‍යාය පත්‍රයෙහි වැදගත්ම ප්‍රශ්න වලදී බොල්ෂෙවික්වරුන්ට පක්ෂව ඡන්දය දුන්හ.ඔවුන්ගේ පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ නිර්දේශයන්ට කීකරුවූ සමාජවාදී-විප්ලවවාදී දක්ෂිණාංශිකයෝ සම්මේලනයෙන් ඉවත් වූහ. එවකට ගොවීන් අතර පාක්ෂිකයින් විශාල සංඛ්‍යාවක් ඇතිව සිටි වාමාංශික සමාජවාදී-විප්ලවවාදීන් සමග සන්ධානයක් ඇති කිරීම අවශ්‍ය යැයි සිතූ බොල්-ෂෙවික්වරු සෝවියට් ආණ්ඩුවට ඇතුල් වන ලෙසට වාම සමාජවාදී-විප්ලවවාදීන්ට යෝජනා කළ නමුත් ඔවුහු මේ යෝජනාව ප්‍රතික්ෂේප කළහ. 1907 නොවැම්බර්-දෙසැම්බර් මාසවලදී පැවැත්වූ සාකච්ඡාවල ප්‍රතිඵලයක් වශයෙන් වාමාංශික සමාජවාදී-විප්ලවවාදීන්ගේ ආණ්ඩුවට ඇතුල් වීම ගැන ගිවිසුමක් ඔවුන් හා බොල්ෂෙවික්වරුන් අතර ඇති කරන ලදී. සිය ක්‍රියාදමයේදී මහජන කොමිසාර් මණ්ඩලයේ පොදු ප්‍රතිපත්තිය අනුගමනය කරන බවට පොරොන්දු වූ ඔවුහු මහජන කොමිසාර් අංශ කීපයකට ඇතුල් කරන ලදහ.

බොල්ෂෙවික්වරුන් සමග සහයෝගීව සිටීමට එකඟ වූ නමුත් වාමාංශික සමාජවාදී-විප්ලවවාදීහු සමාජවාදය ගොඩ නැගීමේ ප්‍රධානතම ප්‍රශ්න පිළිබඳව බොල්ෂෙවික් ප්‍රතිපත්තිය නොපිළිගත්තෝය, නිර්ධන පංති ආඥාදායකත්වයට විරුද්ධව ඉදිරිපත් වූහ.1918 ජනවාරි හා පෙබර-වාරි මාසවලදී වාමාංශික සමාජවාදී-විප්ලවවාදී පක්ෂයේ මධ්‍යම කාරක සභාව බ්‍රෙස්ට් සාම ගිවිසුම අත්සන් කිරීමට විරුද්ධව අරගලය පටන් ගත්තේය. එම ගිවිසුම අත්සන් කිරීමෙන් හා එය හතරවැනි සෝවියට් සභා සම්මේලනය මගින් සම්මත කිරීමෙන් පසු ඔවුහු මහජන කොමිසාර් මණ්ඩලයෙන් ඉවත් වූහ. 1918 ග්‍රීෂ්ම සමයේදී ගම්බද ප්‍රදේශවල සමාජ-වාදී විප්ලවය දියුණු වීමත් සමගමද දුප්පතුන්ගේ කාරක සභා සංවිධානය කිරීමත් සමගමද වාමාංශික සමාජවාදී-විප්ලවවාදීන් අතර සෝවියට් විරෝධී ඉරියව්ව පුළුල් වන්නට පටන්ගති. බ්‍රෙස්ට් සාමය වර්ජනය කොට සෝවියට් රුසියාව හා ජර්මනිය අතර යුද්ධයක් ඇති කරවීම අරමුණු කොට ගෙන, 1918 ජූලි මාසයේදී වාම සමාජවාදී-විප්ලවවාදී මධ්‍යම කාරක සභාව මොස්කව්හි සිටි ජර්මන් නානාපති මිර්බාහ් මරා දමා සෝවියට් විරෝධී යුද්ධ සන්නද්ධ කැරැල්ලක් සංවිධාන කළේය. මේ නිසා, ජූලි කැරැල්ල මර්දනය කිරීමෙන් පසු සමස්ත රුසියා පස්වැනි සෝවියට් සභා සම්මේලනය, ඔවුන්ගේ නායකයින්ගේ ප්‍රතිපත්තිය අත නොහැර සිටි සමාජවාදී-විප්ලවවාදීන් සෝවියට් සභාවලින් නෙරපා දැමීමට තීරණය කළේය. මහජන ආධාරය අහිමි වූ වාමාංශික සමාජවාදී-විප්ලවවාදීහු සෝවියට් බලයට විරුද්ධව ආයුධ සන්නද්ධ අරගලයේ මාවත ගත්තෝය. බොල්ෂෙවික්වරුන් සමග සහයෝගිතාවයේ පිළිවෙතක් තෝරා ගත් වාමාංශික සමාජවාදී-විප්ලවවාදීන්ගේ කොටසක් ''නරෝද්නික්වාදී කොමියුනිස්ට් පක්ෂය'' හා ''විප්ලවවාදී කොමියුනිස්ට් පක්ෂය'' පිහිටවූහ. පසුව ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් කොමියුනිස්ට් පක්ෂයට ඇතුලත් කර ගන්නා ලදහ.

74 ''දියල නරෝද'' — 1917 මාර්තු මාස සිට 1918 ජූලි මාසය දක්වා පෙට්‍රොග්‍රෑඩයේදී පළ වුණු, සමාජවාදී-විප්ලවවාදී පක්ෂයේ නිල පත්‍රය වූ දිනපතා පුවත්පතකි.

75 මෙම සඳහන 1917 සැප්තැම්බර් 21 (ඔක්තෝබර් 4) දින පෙට්‍රොග්‍රෑඩ් සෝවියට් සභාව ඉදිරියේ දූබාසව් කළ කථාව ගැනය. මඳ වේලාවකට පෙර පෙරමුණෙන් ආපසු පැමිණ සිටි නිලධාරියෙකු වූ දූබාසව් මෙසේ කීවේය: ''ඔබ මෙහිදී මොනවා කීවත් සොල්දාදුවන් යුද්ධ නොකරනු ඇත.''

76 ''රුස්කිය වේදමස්ති'' (''රුසියානු වාර්තා'') — 1863 සිට 1918 දක්වා මොස්කව්හි පළවූ දිනපතා පත්‍රයකි. එය මධ්‍යස්ථ ලිබරල් බුද්ධිමතුන්ගේ අදහස් පළ කළේය. 1905 පටන් එය කැඩෙට් පක්ෂයේ දක්ෂිණාංශයේ නිල පත්‍රය විය.

77 මෙම සඳහන වැඩි වැටුප් සඳහා දුම්රිය සේවකයන් ගෙනගිය දේශ-ව්‍යාප්ත වැඩ වර්ජනය ගැනය. 1917 සැප්තැම්බර් 24 (ඔක්තෝ-බර් 7) දින රාත්‍රී සියළුම දුම්රිය සේවාවන්හි ආරම්භ වූ මෙම වැඩ වර්ජනය සැප්තැම්බර් 27 (ඔක්තෝබර් 10) දින රාත්‍රී කෙළවර වූයේ තාවකාලික ආණ්ඩුව සේවකයන්ගේ ඉල්ලීම් සමහරක් දුන් පසුවය.

78 මෙහි සඳහන් කෙරෙන්නේ කාමිනෙව්, සිනෝවියෙව්, ට්‍රොට්ස්කි හා ඔවුන්ගේ අනුගාමිකයන් ගත් ස්ථාවරය ගැනය. රුසියාවේ කම්කරු පංතිය සමාජවාදී විප්ලවය කිරීමෙහි සමත් නොවෙතියි යන අදහස ඉදිරිපත් කරමින්, කාමිනෙව් සහ සිනෝවියෙව් ආයුධ සන්නද්ධව කැරලි ගසා නැගී සිටීමක් සඳහා වූ ලෙනින්ගේ සැලැස්මට විරුද්ධ වූහ. ඔවුහු ධනපති සමූහාණ්ඩුවකට පක්ෂ වූ මෙන්ෂෙවික්වරුන්ගේ තත්ත්වයට පහත වැටුනහ.කැරලි ගසමින් නැගී සිටීම දෙවැනි සෝවියට්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සභා සම්මේලනය තෙක් කල් දමන ලෙස ට්‍රොට්ස්කි බල කර සිටියේය. සම්මේලනයේ ආරම්භක දිනය වන විට බලමුළු එකතු කර ගෙන නැගී සිටීම මර්දනය කර දැමීමට තාවකාලික ආණ්ඩුවට හැකියාව තිබුණු හෙයින් එම සම්මේලනය අසාර්ථක වීමේ ඉරණමට ගොදුරු වන්නට තිබුණි.

79 ලෙනින් සඳහන් කරන සිද්ධිය 1917 ජුනි 4(17) දින කම්කරු හා සොල්දදු නියෝජිතයින්ගේ සෝවියට් සභාවල පළමුවැනි සමස්ත රුසියා සම්මේලනයේ සැසිවාරයේදී ඇති විය. තාවකාලික ආණ්ඩුවේ මෙන්ෂෙවික්වාදී ඇමති ට්සෙරෙතේලි සිය වාර්තාව ඉදිරිපත් කරමින් රටේ සම්පූර්ණ පාලක බලය තනිවම අත්පත් කර ගැනීමට එකඟ වූ පක්ෂයක් රුසියාවේ නොමැති යයි පැවසූ විට වී. අයි. ලෙනින් තම ආසනයේ සිටම හඬ නඟා "තියෙනවා!" යි කීය. ඉන්පසු වේදිකාවෙන් කතා කළ ඔහු බොල්ෂෙවික් පක්ෂය "සෑම මොහොතේම බලය සම්පූර්ණයෙන්ම ගැනීමට සූදානම්" බව කීය.

80 "රෙච්" (වචනය) — පීටර්බුර්ගයේදී 1906 සිට 1917 ඔක්තෝබරය දක්වා පළ වුණු කැඩෙට් පක්ෂයේ නිල පත්‍රයක් වූ දිනපතා පුවත්පතකි.

81 "නෝවය ෂිස්න්" (නව ජීවනය) — 1917 අප්‍රියෙල් මස සිට 1918 ජුලි මස දක්වා පෙට්‍රොග්‍රෑඩයේ පළ වුණු දින පතා පුවත්පතකි. එය පිහිටුවන ලද්දේ "ලේතපිස්" සඟරාව වටා එකතු වුනු ලේඛකයින්ගේ හා ජාත්‍යන්තරවාදී මෙන්ෂෙවික්වරුන්ගේ කණ්ඩායම විසිනි.

82 නෙක්‍රාසව්ගේ "කාරුණික කවියා ආශීර්වාද ලද්දෙකි" නැමති කාව්‍යයෙන් උපුටා ගන්නා ලද්දකි.

83 ගොගොල්ගේ "මළගිය ඇත්තෝ" කථාවෙහි චරිතයකි.

84 "ස්නාමිය තෲද" (ශ්‍රමයේ ධජය) — 1917 අගෝස්තු පටන් 1918 ජුලි දක්වා පළ කරන ලද, සමාජවාදී-විප්ලවවාදී පක්ෂයේ පෙට්‍රොග්‍රෑඩ් කාරක සභාවේ නිල දිනපතා පත්‍රයකි.

85 "වෝලියා නරොද" (ජනතා අධිෂ්ඨානය) — සමාජවාදී-විප්ලවවාදී පක්ෂයේ නිල පත්‍රය වූ දිනපතා පුවත්පතකි. එය 1917 අප්‍රියෙල් පටන් නොවැම්බර් දක්වා පෙට්‍රොග්‍රෑඩ්හි පළ කෙරිනි. පසුව එය වෙනත් නම් යටතේ පළ කරන ලදී. අවසානයේදී 1918 දී එය වසා දමන ලදී.

86 "යෙදින්ස්ත්වො" (සමගිය) — සමාජවාදී-විප්ලවවාදී පක්ෂයේ දක්ෂිණාංශයේ නිල දිනපතා පුවත්පතකි. 1917 අප්‍රියෙල් සිට නොවැම්බරය දක්වා පෙට්‍රොග්‍රෑඩයේ පළ විය. පසුව වෙනත් නම් ඇතිව නිකුත් විය.

87 ජාත්‍යන්තරවාදී මෙන්ෂෙවික්වරු — ස්ථිර නොවූ ජාත්‍යන්තරවාදී ප්‍රතිපත්තිය අනුගමනය කළ, මෙන්ෂෙවික් පක්ෂයේ බහු සංඛ්‍යාත නොවූ එක් අංශයකි. ඔවුන්ගේ ප්‍රසිද්ධ තම නියෝජිතයෝ මාර්තව්, ලාරින්, මර්තිනව් හා වෙනත් අය වූහ.

මධ්‍යස්ථ ස්ථාවරයක් ගත් අන්තර්ජාතිකවාදී මෙන්ෂෙවික්වරු සමාජ-ජාත්‍යොන්මාදවාදීන් විවේචනයට ලක්කළ නමුත් සංවිධානාත්මක වශයෙන් ඔවුන්ගෙන් වෙන් වීමට බිය වූහ. ඔවුහු යුද්ධය, සාමය හා විප්ලවය යන ප්‍රශ්න පිළිබඳ බොල්ෂෙවික් පක්ෂය අනුගමනය කරන ලෙනින්වාදී උපක්‍රමයේ මුල් ප්‍රතිපත්තිවලට විරුද්ධව ඉදිරිපත් වූහ.

LIBERATIONBASE

88 1870-1871 ප්‍රංශ-ප්‍රුසියානු යුද්ධයේදී, මුළු ප්‍රංශ හමුදුවම, එහි නායකත්වය ගත් III වන නැපොලියන් අධිරාජයාද සමගම, සෙදන් අසල දී වටලා සිරභාරයට ගනු ලැබීය.

89 "කම්කරු හා සොල්දදු නියෝජිතයින්ගේ සෝවියට් සභාවේ මධ්‍යම විධායක කාරක සභාවේ ("ඉස්වෙස්තිය") වාර්තා" — 1917 පෙබරවාරි සිට පළ වීමට පටන් ගත් දින පතා පත්‍රයකි. මෙන්ෂෙවික්වරුන් හා සමාජවාදී -විප්ලවවාදීන් මෙහෙයවූ මේ පත්‍රය බොල්ෂෙවික් පක්ෂයට විරුද්ධව බරපතල අරගලයක් කළේය.

ඔක්තෝබර් සමාජවාදී විප්ලවයෙන් පසු "ඉස්වෙස්තිය" පත්‍රයේ කර්තෘ මණ්ඩලය මාරු කරන ලදින් එය සෝවියට් බලයේ නිල පත්‍රය බවට පත් විය.

90 මාක්ස් 1871 අප්‍රියෙල් 12 දින කුගෙල්මාන්ට ලියූ ලිපිය බලන්න (මාක්ස් සහ එංගල්ස්, තෝරාගත් කෘති, වෙළුම 2, පිටු 420).

91 "මජ්ලර් කාරයා" — චෙකොව්ගේ එම නම ඇති කථාවේ එන චරිතයකි. එය සෑම නවී කරණයකටම, සෑම ක්‍රියාරාම්භකතාවයකටම බිය වන, පටු අදහස් ඇති චරිතයකි.

92 වන්දෙයි — XVIII සියවසේ අග භාගයේ ප්‍රංශ ධනපති විප්ලවය සමයේදී ප්‍රතිවිප්ලවවාදයේ මධ්‍යස්ථානය වූ ප්‍රංශයේ පෙදෙසකි. එහි

https://liberationbase.wordpress.com

නාමය පොදු වශයෙන් ප්‍රතිවිප්ලවවාදය හැඳින්වීමට යෙදෙන වචනයක් බවට පත්විය.

93 එංගල්ස් 1888 පෙබරවාරි 22 දින සෝර්ගේ වෙත යැවූ ලිපිය බලන්න (මාක්ස්, එංගල්ස. කෘති එකතුව, වෙළුම 37, පිටු 18—20).

94 ''මැදහත් බව සහ නිවැරදි බව'' — ශ්‍රිබයේදව්ගේ ''කවටකමෙන් ඇස් රතු වේ'' නැමති කථාවෙහි එන, ආත්මලාභය පමණක් තකන පිළිකුල් සහගත මිනිසෙකුගේ චරිතයක් වන මොල්චාලින් ස්වකීය යහගුණ විස්තර කරන්නේ මෙම වචනවලිනි. ලිබරල් ධනපති පංතිය හෝ සමාජ-අවස්ථාදීන් ගැන කියන විට ලෙනින් බොහෝ විට මෙම වදන උපයෝගි කර ගත්තේය.

95 ලෙනින් සඳහන් කරන්නේ මෙය ගැනය: පෙබරවාරි 28 (මාර්තු 13) දින පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය ඇති විය. ආණ්ඩුක්‍රම සම්පාදක මණ්ඩලය කැඳවීම සඳහා තාවකාලික ආණ්ඩුව විසින් ප්‍රථමයෙන් සැප්තැම්බර් 30 (ඔක්තෝබර් 13) අස්ථිර වශයෙන් නියම කරන ලදී. 1917 නොවැම්බර් 28 (දෙසැම්බර් 11) ආණ්ඩුක්‍රම සම්පාදක මණ්ඩලය කැඳවීම සඳහා නියම කරන ලද දිනය.

96 ලෙනින් මෙය උපුටා දක්වන්නේ, ''නෝවය ෂිස්න්'' (නව ජීවිතය) ප්‍රවෘත්ති පත්‍රයේ ''තවත් හෙණ ගෙඩියක්'' යනුවෙන් එන්. සුහානව් ලියූ ලිපියෙනි.

1917 අගෝස්තුවේ පටන් ස්මොල්නි ආයතනය, සමස්ත රුසියා මධ්‍යම විධායක කාරක සභාවේ සහ පෙට්‍රොග්‍රෑඩයේ කම්කරු සහ සොල්දාදු නියෝජිත සෝවියට් සභාවේ බොල්ෂෙවික් කණ්ඩායම්වල මූලස්ථානය විය. ඔක්තෝබර් මාසයේදී විප්ලවකාරී යුද්ධ කාරක සභාවේ කාර්යස්ථානයද මෙහි විය.

97 ''රුස්කය ස්ලෝව'' (රුසියානු වචනය) — 1895 සිට 1917 දක්වා මොස්කව්හි පළ කෙරුණු දිනපතා පත්‍රයකි. මුලින් පක්ෂයට අයත් නොවූ එම පත්‍රය, මැදහත් ලිබරල් ප්‍රතිෂ්ඨාවක සිට ඇත්ත වශයෙන්ම රුසියානු ධනපති පංතියේ උවමනාවන් ආරක්ෂා කළේය.

98 උතුරු දිසාවේ සෝවියට් සභාවල සම්මේලනය 1917 ඔක්තෝබර් 11 (24) සිට ඔක්තෝබර් 13 (26) දක්වා පෙට්‍රොග්‍රෑඩයේ පවත්වන ලදී. එයට නියෝජිතවරුන් 94 ක් සහභාගි වූ අතර ඉන් 51 ක් බොල්ෂෙවික්වරු වූහ. පවතින තත්ත්වය ගැන සම්මේලනය අනුමත කළ යෝජනාවෙන් අවධාරණය කෙරුණේ, මධ්‍යස්ථානයේ සහ ප්‍රදේශවල මුළු බලය සෝවියට් සභාවලට වහාම පැවරීම, රට හා විප්ලවය මුදා ගැනීමේ එකම මාර්ගය වන බවය. බලය සඳහා නිර්ධන පංතිය ගෙන යන අරගලයට ආධාර දෙන ලෙස ගොවි ජනයාට ආයාචනා කරන යෝජනාවක්ද සම්මේලනය අනුමත කළේය. ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවයේ ජයග්‍රහණය සඳහා සියළුම බලවේගයන් සූදානම් කිරීම, සංවිධානය කිරීම සහ ඒකරාශී කිරීම සඳහා මෙම සම්මේලනයේ තීරණ බෙහෙවින් වැදගත් විය.

99 ෆ්‍රෙඩ්රික් එංගල්ස්, ''ජර්මනියේ විප්ලවය සහ ප්‍රතිවිප්ලවය'' බලන්න (මාක්ස් සහ එංගල්ස්, ''තෝරාගත් කෘති'', වෙළුම I, පිටු 376-378).

100 මෙහි සඳහන් කර ඇත්තේ 1917 අගෝස්තු මස ටියුරින්හි පැවැත්වුනු විශාල යුද්ධ-විරෝධී පෙළපාළි ගැන ය. අගෝස්තු 21 දින ආහාර හිඟය හා සම්බන්ධයෙන් පෙළපාළි ආරම්භ වූ අතර ඊ ළඟ දින කම්කරුවෝ වැඩ වර්ජනය කළහ. එය මහා වැඩ වර්ජනයක් බවට හැරිණ. වීදි වල වීදිබාධක ඉදි කෙරිණ. ව්‍යාපාරය දේශපාලන වශයෙන් යුද්ධ විරෝධී ස්වභාවයක් ගත්තේය. අගෝස්තු 23 දින වන විට ටියුරින්හි උප නගර පෙදෙස් කැරළි කරුවන් අතට පත්ව තිබුණි. ආණ්ඩුව එම ව්‍යාපාරය මර්දනය කිරීමට යුද්ධ හමුදව යොදවා යුද්ධ නීතිය පැන වීය. අගෝස්තු 27 දින මහා වැඩ වර්ජනය කෙළවර කරන ලදී.

101 කළු සිය — විප්ලවවාදී ව්‍යාපාරය මර්දනය කිරීම සඳහා සාර් පොලිසිය සංවිධාන කළ රාජාණ්ඩුවාදී ප්‍රහාරක පිරිස් විය.

102 එම රැස්වීම වූයේ, වීබොර්ග් සිට පෙට්‍රොග්‍රෑඩයට පැමිණීමෙන් පසු වී. අයි. ලෙනින් සහභාගී වූ පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ පළමුවැනි රැස්වීමය. වයි. එම්. ස්වෙර්ද්ලව්ගේ සභාපතිත්වය යටතේ පැවතුණු මේ රැස්වීමේදී වී. අයි. ලෙනින් පවතින තත්ත්වය ගැන වාර්තාවක් ඉදිරිපත් කරමින් කතා කළේය. අප්‍රමාදව ආයුධ සන්නද්ධ කැරලි ගසා නැගී සිටීමක් ගැන ලෙනින්ගේ යෝජනාව මධ්‍යම කාරක සභාව සම්මත කළේය. එයට විරුද්ධව ඡන්ද දුන්නේ සිනෝවියව් සහ කාමිනෙව් පමණකි. මධ්‍යම කාරක සභාවේ රැස්වීමේදී ට්‍රොට්ස්කි කැරලි

LIBERATION BASE
https://liberationbase.wordpress.com

ගසා නැගී සිටීම ගැන යෝජනාවට විරුද්ධව ඡන්ද නො දුන් නමුත් එය දෙවැනි සෝවියට් සභා සම්මේලනය රැස් වෙන තෙක් කල් තැබිය යුතු යැයි සිතුවේය. ඇත්ත වශයෙන්ම එයින් අදහස් වූයේ කැරලි ගසා නැගී සිටීම කඩා කප්පල් කිරීමය. මන්දයත්, ප්‍රමාදය නිසා සම්මේලනය කැඳවීමේ දිනය වන තෙක් කැරලි ගැසීම මර්දනය කිරීම සඳහා හමුදා සංකේන්ද්‍රණ කිරීමට තාවකාලික ආණ්ඩුවට හැකිව තිබූ හෙයිනි. මධ්‍යම කාරක සභාව පරාජයවාදීන්ට දැඩි ලෙස විරුද්ධ විය. මධ්‍යම කාරක සභාවේ ඔක්තෝබර් 10(23) රැස්වීම ඉමහත් ඓතිහාසික වැදගත්කමකින් යුක්තය. ඡන්ද දෙකක් විරුද්ධවත් ඡන්ද දහයක් පක්ෂව ලැබුණු කැරලි ගැසීම ගැන යෝජනාව ආයුධ සන්නද්ධ කැරැල්ල අප්‍රමාදව සූදනම් කිරීම සඳහා බොල්ෂෙවික් පක්ෂයට කළ නියමයක් විය. එම රැස්වීමේදී කැරලි ගැසීම මෙහෙයවීම සඳහා වී. අයි. ලෙනින්ගේ ප්‍රධානත්වයෙන් යුත් දේශපාලන බියුරෝ සභාව පිහිටුවන ලදී.

103 ලෙනින් සඳහන් කරන්නේ, මින්ස්ක්හි ආයුධ සන්නද්ධ නැගී සිටීමක් සඳහා ඇති තාක්ෂණික ඉඩකඩ ගැන හා පෙට්‍රොග්‍රෑඩයේ ආධාරයට මින්ස්ක්හි සිට විප්ලවවාදී හමුදවක් එවීමට කැමැත්ත දක්වමින් 1917 ඔක්තෝබර් 10(23) දින ස්වෙර්ද්ලොව් සහෝදරයා මධ්‍යම කාරක සභාවට එවූ වාර්තාව ගැනය.

104 රු. ස. ප්‍ර. ක. (බො.) ප. මධ්‍යම කාරක සභාවේ පුළුල් කළ රැස්වීම පැවතියේ 1917 ඔක්තෝබර් 16(29) දින පෙට්‍රොග්‍රෑඩයේදීය. ඔක්තෝබර් 10(23) ද පිළිගන්නා ලද ආයුධ සන්නද්ධ කැරලි ගසා නැගී සිටීම ගැන වූ යෝජනාව පිළිබඳ වාර්තාවක් ලෙනින් ඉදිරිපත් කළේය. බොල්ෂෙවික්වරුන්ගේ බලය අප්‍රමාණවත් වූ නිසා ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය රැස්වෙන තෙක් බලා සිටිය යුතු වී යැයි තර්ක කළ කාමිනෙව් හා සිනෝවියව් නැවත වරක් කැරලි ගැසීමට විරුද්ධව ඉදිරිපත් වූහ. ලෙනින් ඉදිරිපත් කළ යෝජනාවට පක්ෂව ඡන්ද 19 ක් ලැබුණු අතර එයට විරුද්ධව ඡන්ද දෙකක් දෙන ලදී. හතර දෙනෙක් ඡන්ද විමසීමට සහභාගි නොවූහ. මධ්‍යම කාරක සභාවේ ආවෘත රැස්වීමේදී කැරැල්ල මෙහෙයවීම සඳහා විප්ලවකාරී යුද්ධ මධ්‍යස්ථානය පිහිටුවන ලදී.

105 ''බොල්ෂෙවික් පක්ෂ සාමාජිකයින් වෙත ලිපිය'' හා රු. ස. ප්‍ර. ක. ප. (බො.) මධ්‍යම කාරක සභාවට ලිපිය (මෙම වෙළුමෙහි පිටු 232—242 බලන්න) යන ලියවිලිවලින් පිළිබිඹු වන්නේ, කැරළි ගසා නැගී සිටීම සම්බන්ධයෙන් මධ්‍යම කාරක සභාව කළ තීරණය කඩා කප්පල් කිරීමට උත්සාහ කළ සිනෝවියෙව් සහ කාමිනෙව් යන දෙදෙනාට විරුද්ධව ලෙනින් කළ අරගලය ය. ආයුධ සන්නද්ධ නැගී සිටීම ගැන සාකච්ඡා කළ 1917 ඔක්තෝබර් 10(23) දින මධ්‍යම කාරක සභාවේදී පරාජයට පත්වූ සිනෝවියෙව් සහ කාමිනෙව්, ඊට පසුදින ''වර්තමාන තත්ත්වය ගැන'' යන මාතෘකාව යටතේ මධ්‍යම කාරක සභාවට ලිපියක් එවූහ. මෙම ලිපියෙන්, ඔවුහු මධ්‍යම කාරක සභාවේ ආයුධ සන්නද්ධ නැගී සිටීම පිළිබඳ තීරණයට විරුද්ධත්වය දැක්වූහ. ඔක්තෝබර් 15(28) දින පැවැත්වුනු පෙට්‍රොග්‍රෑඩ් කාරක සභාවේ පුළුල් කළ රැස්වීමේදී මොවුන්ගේ ලිපිය කියවන ලද නමුත්, එහිදී එයට සහයෝගය ලබා ගත නොහැකි වූ පසු සහ ඉන් පසු පැවැත්වුනු පුළුල් කළ මධ්‍යම කාරක සභා රැස්වීමේදී ආයුධ සන්නද්ධ නැගී සිටීමට විරුද්ධව නැවතත් කතා කළ නමුත් එහිදීද සහයෝගයක් නොලැබුනු පසු සිනෝවියෙව් හා කාමිනෙව් කෙළින්ම ද්‍රෝහි කමට බටහ. ඔක්තෝබර් 18(31) දින ''නොවය ෂිස්න්'' නැමති අර්ධ මෙන්ෂෙවික්වාදී පත්‍රයේ ''නැගී සිටීම ගැන කාමිනෙව්ගෙන්'' යන මාතෘකාව යටතේ ප්‍රකාශයක් පළ විය. කාමිනෙව් එමගින් තමන් හා සිනෝවියෙව් වෙනුවෙන් ආයුධ සන්නද්ධ නැගී සිටීමට විරුද්ධව අදහස් ප්‍රකාශ කළේය. එසේ කිරීමෙන් ඔහු පක්ෂයේ ඉතාමත් වැදගත් රහස් තීරණය සතුරාට දැන්වූයේය. එදිනම ලෙනින් ''බොල්ෂෙවික් පක්ෂ සාමාජිකයින්ට ලිපිය'' ලිවේය. එසේම ඔහු ඔක්තෝබර් 19 (නොවැම්බර් 1) දින ''රු. ස. ප්‍ර. ක. ප. (බො.) මධ්‍යම කාරක සභාවට ලිපිය'' ලිවේය. මෙම ලිපිවලින් සිනෝවියව්ගේ සහ කාමිනෙව්ගේ ක්‍රියාව ද්‍රෝහි කමක් ලෙස සහ ඔවුන් හොරිකඩයන් ලෙස හැඳින්වූ හෙතෙම, ඔවුන් පක්ෂයෙන් නෙරපන ලෙස ඉල්ලා සිටියේය.

106 මෙම සඳහන ලෙනින්ගේ ''සහෝදරවරුන්ට ලිපියක්'' යන ලිපිය ගැනය. කාමිනෙව් සහ සිනෝවියෙව් ආයුධ සන්නද්ධ නැගී සිටීමට විරුද්ධව ඉදිරිපත් කරන තර්ක සසංගත නොවන බව ලෙනින් එම ලිපියෙන් පෙන්වා දුන්නේය.

107 ලෙනින් මෙහි සඳහන් කරන්නේ රු. ස. ප්‍ර. ක. ප. (බො.) මධ්‍යම කාරක සභාවේ ඔක්තෝබර් 16(29) රැස්වීම ගැනය. මෙම රැස්වීමේදී සිනෝවියෙව් සහ කාමිනෙව්, ඔක්තෝබර් 10(23) මධ්‍යම කාරක සභා රැස්වීමේදී ගන්නා ලද ආයුධ සන්නද්ධ නැගී සිටීම පිළිබඳ තීරණයට විරුද්ධ වූහ.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

108 මෙම සඳහන ස්වෙර්ද්ලොව්, ස්ටාලින්, ජෙර්ෂින්ස්කි සහ සකොල්නිකව් 1917 ඔක්තෝබර් 20 (නොවැම්බර් 2) මධ්‍යම කාරක සභා රැස්වීමේදී කළ කථා ගැනය. එම කථාවන් කරන ලද්දේ ලෙනින්ගේ "රු. ස. ප්‍ර. ක. ප. (බො.) මධ්‍යම කාරක සභාවට ලිපිය" සාකච්ඡා කරන විටය. (මෙම වෙළුමෙහි පිටු 237-232 සහ අංක 105 සටහන බලන්න).

109 කොසාක් පෙළපාළිය, 1917 ඔක්තෝබර් 22 (නොවැම්බර් 4) පැවැත්වීමට නියමිතව තිබුණි. එය නැගී එන විප්ලවයට විරුද්ධ තම අරගලයේ බලවේගයන් උරගා බැලීමක් ලෙස ප්‍රතිවිප්ලවය විසින් සලකන ලදී. කොසාක්වරුන් අතර පුළුල් ප්‍රචාරයක් ගෙනගිය බොල්ෂෙවික්වරු, පෙළපාළියට සහභාගි නොවන ලෙස ඔවුනට ආයාචනා කළහ. පෙට්‍රොග්‍රෑඩයේ කම්කරු සහ සොල්දාදු සෝවියට් සභාව කොසාක්වරුන්ට ආයාචනයක් නිකුත් කලේය. පෙට්‍රොග්‍රෑඩයේ සෝවියට් සභාව ඔක්තෝබර් 21 (නොවැම්බර් 3) දින ස්මොල්නිහි පැවැත්වීමට සංවිධාන කළ රෙජිමේන්තු කාරක සභාවල සාකච්ඡා සභාවකට සහභාගි වන ලෙස එය කොසාක් රෙජිමේන්තුවල නියෝජිතයන්ටද ආරාධනා කලේය. තමන් කම්කරුවන්ට හා සොල්දාදුවන්ට විරුද්ධව නොයන බව කොසාක්වරු සාකච්ඡා සභාවේදී ප්‍රකාශ කළහ. ඔක්තෝබර් 22 (නොවැම්බර් 4) දින අළුයම පෙළපාළිය අවලංගු කිරීමට තාවකාලික ආණ්ඩුවට සිදු විය.

110 එම ලිපිය ලෙනින් ලියුවේ 1917 ඔක්තෝබර් 24 (නොවැම්බර් 6) දිනය. එද රෑ ලෙනින් රහසේ ස්මොල්නි ආයතනයට පැමිණ යුද්ධ සන්නද්ධ කැරලි ගැසීමේ නායකත්වය කෙළින්ම තම අතට ගත්තේය. ඔක්තෝබර් සමාජවාදී විප්ලවය ජයග්‍රාහී වී දෙවැනි සෝවියට් සභා සම්මේලනයේදී සෝවියට් ආණ්ඩුව පිහිටුවීමෙන් පසු විප්ලවකාරී යුද්ධ කාරක සභාව ඉදිරියේ වූ ප්‍රධානතම අරමුණ හැටියට පැවතියේ ප්‍රතිවිප්ලවයට විරුද්ධව කරන අරගලය හා විප්ලවය ආරක්ෂා කිරීමය. සෝවියට් ආයතන පිහිටුවීම හා තහවුරු කිරීමත් සමගම විප්ලවකාරී යුද්ධ කාරක සභාව, සංවිධිත වන මහජන කොමිසාර් අංශවලට සිය කාර්ය භාරයන් පවරා දුන්නේය. 1917 දෙසැම්බර් 5 (18) දින එය අහෝසි කරන ලදී.

111 පෙට්‍රොග්‍රෑඩයේ විප්ලවකාරී යුද්ධ කාරක සභාව — මෙය 1917 ඔක්තෝබර් 12 (25) දින බොල්ෂෙවික් පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ උපදෙස් අනුව පිහිටුවන ලදී. පක්ෂ මධ්‍යම කාරක සභාවේද, පෙට්‍රොග්‍රෑඩ් කාරක සභාවේද, වෘත්තීය සමිතිවලද, යුද්ධ සංවිධානවලද, නියෝජිතවරු එහි සාමාජිකයන් අතර වූහ. පක්ෂ මධ්‍යම කාරක සභාවේ මෙහෙයවීම අනුව කටයුතු කළ වි.යු.කා.ස. රතුහට සේනාංක පිහිටුවීමේදී සහ කම්කරුවන් ආයුධ සන්නද්ධ කිරීමේදී බොල්ෂෙවික් යුද්ධ සංවිධානය සමග සමීප සම්බන්ධය ඇතිව ක්‍රියා කලේය. මෙම කාරක සභාව මුහුණ දුන් ප්‍රධාන කර්තව්‍යය වූයේ ම.කා.ස. නියමයන් අනුව ආයුධ සන්නද්ධ නැගී සිටීම සඳහා කටයුතු සූදනම් කිරීමය. වි.යු.කා.ස. ඔක්තෝබර් විප්ලවයේ ජයග්‍රහණය සඳහා සටන් කාරී බල පිරිස් සංවිධානය කිරීමේ විවිධ කාර්යයන්හි යෙදුණේය. එම කාරක සභාවේ හරය ලෙසට ගත හැකි නායකත්වය වූයේ 1917 ඔක්තෝබර් 16 (29) දින ම.කා.ස. රැස්වීමේදී පිහිටුවන ලද විප්ලවකාරී යුද්ධ මධ්‍යස්ථානය විය. ලෙනින් එහි කටයුතු මෙහෙය වූයේය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

නාමාවලිය

අඩ්ලර් (Adler), ෆ්‍රෙඩ්රික් (1879-1960) — ඔස්ත්‍රියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකි, විප්ලවවාදී මාක්ස්වාදය හා නිර්ධන පංතියේ පංති අරගලය ප්‍රතික්ෂේප කිරීම මාක්ස්වාදී වචනයෙන් වසං කරන, ඊනියා "ඔස්ත්‍රියානු මාක්ස්වාදයේ" එක් දෘෂ්ටිවාදියකි. ඔහු 1916 ඔක්තෝබර් 21 දින ඔස්ත්‍රියාවේ අගමැති ෂ්ටුර්ක් වෙඩි තබා මරා දැම්මේය.

LIBERATIONBASE

අලෙක්සින්ස්කි, ග්‍රිගෝරි අලෙක්සේයෙවිච් (උපත 1879) — සිය දේශපාලන ජීවිතය ආරම්භයේදී ඔහු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙක් විය. පළමුවැනි ලෝක යුද්ධය සමයේදී සමාජ-ජාත්‍යෝන්මාදවාදියෙක් වී ධනපති පුවත්පත් කීපයක් සඳහා සේවය කළේය. 1917 දී "යෙදීන්ස්ත්වො" නම් වූ ප්ලෙහානව් කණ්ඩායමට ඇතුල් වූ ඔහු ප්‍රතිවිප්ලවවාදී ස්ථාවරය වැලඳ ගෙන සිටියේය. 1917 ජූලි මාසයේදී යුද්ධමය ඔත්තු සේවය සමග සහයෝගීව ව්‍යාජ ලියවිලි සදගත් ඔහු ලෙනින් හා බොල්ෂෙවික්වරුන්ට විරුද්ධව බොරු චෝදනා නැගුවේය.

අව්ක්සෙන්තියව්, නිකොලායි ද්මිත්‍රියෙවිච් (1878-1943) — සමාජවාදී-විප්ලවවාදී පක්ෂයේ එක් නායකයෙකි, එහි මධ්‍යම කාරක සභාවේ සාමාජිකයෙකි. 1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයෙන් පසු සමස්ත රුසියා ගොවි නියෝජිතයින්ගේ සභාවේ සභාපති ධුරය ඉසුලූ ඔහු දෙවැනි කෙරෙන්ස්කි සභාග ආණ්ඩුවේ ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති ධුරයද භාරව සිටියේය. පසුව ප්‍රතිවිප්ලවවාදී සමූහාණ්ඩුවේ තාවකාලික සභාවේ (පූර්ව-පාර්ලිමේන්තුවේ) සභාපති වරයා බවට පත්විය.

එංගල්ස් (Engels) ෆ්‍රෙඩ්රික් (1820-1895)

කනවාලව්, අලෙක්සාන්දර් ඉවානවිච් (උපත 1875) — රුසියාවේ විශාලම රෙදි පිළි පැක්ටරි හිමියා විය. 1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයෙන් පසු වෙළඳාම හා ආර්ථිකය භාර ඇමති වූ ඔහු පසුව ධනපති තාවකාලික ආණ්ඩුවේ අගමැති කෙරෙන්ස්කි යටතේ නියෝජ්‍ය අගමැති ධුරයද ඉසිලිය.

කවෙනයාක් (Cavaignac), ලූයි එෂෙන් (1802-1857) — ප්‍රංශ සේනාධිපතියෙකි, ප්‍රතිගාමී දේශපාලන නායකයෙකි. 1848 දී යුද්ධමය ආඥාදායකත්වය මෙහෙයවූ ඔහු පැරිස් කම්කරුවන්ගේ ජූනි කැරැල්ල අති කෲර ලෙස මර්දනය කළේය. —

කාමිනෙව් (රෝසන්පෙල්ඩ්), ලෙව් බරිසවිච් (1883-1936) — 1901 සිට බොල්ෂෙවික් පක්ෂයේ සාමාජිකයෙකු වූ ඔහු 1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයෙන් පසු සමාජවාදී විප්ලවය සඳහා වූ පක්ෂයේ ලෙනින්වාදී ප්‍රතිපත්තියට විරුද්ධව ඉදිරිපත් විය. 1917 ඔක්තෝබරයේදී, ආයුධ සන්නද්ධ කැරලි ගැසීම සම්බන්ධයෙන් මධ්‍යම කාරක සභාව ගත් තීරණයට ඔහු විරුද්ධව සිටි බව තමා හා සිනෝවියව් වෙනුවෙන් "නෝවය ෂිස්න්" අර්ධ මෙන්ෂෙවික්වාදී පත්‍රය මගින් ප්‍රකාශ කළේය. මෙය පක්ෂයේ රහස් තීරණය අනාවරණය කිරීමක් එනම් විප්ලවය පාවාදීමක් විය.

ඔක්තෝබර් සමාජවාදී විප්ලවයෙන් පසු පක්ෂ නායකත්වයට සහභාගී වූ ඔහු පක්ෂ විරෝධී කටයුතු නිසා පක්ෂයෙන් නෙරපා දමන ලදී.

කිෂ්කින්, නිකොලායි මිහයිලවිච් (1864-1930) — කැඩෙට් පක්ෂයේ එක් නායකයෙකි. තාවකාලික ආණ්ඩුවේ අවසාන ඇමති මණ්ඩලයේ රාජ්‍ය ආරක්ෂක ඇමති ධුරය ඉසුලූ ඔහු ඔක්තෝබර් විප්ලවයට කෙටි කාලයකට පෙර පෙට්‍රොග්‍රෑඩයේ "ආඥාදායකයා" ලෙසට පත් කෙරිණ.

කුගල්මාන් (Kugelmann), ලුද්විග් (1830-1902) — ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකු වූ ඔහු මාක්ස්ගේ මිත්‍රයෙක් විය. 1848-1849 ජර්මනියේ විප්ලවයට සහභාගී වූ අතර, කුගල්මාන් පළමුවැනි ජාත්‍යන්තරයේ සාමාජිකයෙක් විය. 1862 සිට 1874 දක්වා ලන්ඩනයෙහි පදිංචිව සිටි මාක්ස් සමග ලිපි හුවමාරුවේ යෙදී සිටි ඔහු ජර්මනියේ පැවති තත්ත්වය ගැන මාක්ස්ට තොරතුරු සැපයීය.

https://liberationbase.wordpress.com

කුස්කෝවා, යෙකතෙරිනා ද්මිත්‍රියෙව්නා (1869-1958) — රුසියානු ධනපතිවාදී සමාජ නායිකාවක, දේශපාලන විචාරිකාවක හා රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය තුළ ආර්ථිකවාදයේ සම්භාවනීය නියෝජිතවරියෙක වූ ඈ එම උපනතියේ අවස්ථාවාදී හරය වඩාත් සම්පූර්ණ ලෙස පිළිබිඹු කළ "Credo" ප්‍රකාශනයෙහි කතුවරියකි. පසුව කැඩෙට් ස්ථාවරය වැළඳ ගෙන සිටියාය.

කොර්නෙලිසෙන් (Cornelissen), ක්‍රිස්තියාන් — ක්‍රපොත්කින්ගේ අනුගාමික ඕලන්ද අරාජිකවාදියෙකි. මාක්ස්වාදය විරෝධී පිළිවෙතක් ගත් ඔහු පළමුවැනි ලෝක යුද්ධය සමයේදී ජාතෝන්මාදවාදියකු බවට පත් විය.

කොල්බ් (Kolb), විල්හෙල්ම් (1870-1918) — ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකු, අවස්ථාවාදියෙකු හා සංශෝධනවාදියෙකු වූ ඔහු පළමුවැනි ලෝක යුද්ධය සමයේදී සමාජ-ජාතෝන්මාදවාදියෙකු ද විය.

කෞට්ස්කි (Kautsky), කාල් (1854-1938) — ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ හා දෙවැනි ජාත්‍යන්තරයේ එක් නායකයෙකි. පළමුවෙන් මාක්ස්වාදියෙකු වූ ඔහු පසුව මාක්ස්වාදය පාවාදී අවස්ථාවාදයේ ඉතාම අන්තරාදයක හා හානිදයක විශේෂයක් වූ මධ්‍යස්ථවාදයේ (කෞට්ස්කිවාදයේ) දෘෂ්ටිවාදියෙක් විය. "Die Neue Zeit" නම් වූ ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ දර්ශනික සඟරාවේ සංස්කාරකයෙක් විය.

කෙරෙන්ස්කි, අලෙක්සාන්දර් පියෝදරවිච් (1881-1970) — සමාජවාදී-විප්ලවවාදියෙකි. 1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයෙන් පසු, පළමුවෙන් අධිකරණ ඇමති ධුරයත් යුද්ධ හා නාවුක හමුද ඇමති ධුරයත් ඉසුලූ ඔහු ඉක්බිතිව ධනපති තාවකාලික ආණ්ඩුවේ ඇමති-සභාපති ධුරයත් හා උසස්තම සේනාධිපති ධුරයත් භාර ගති. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයෙන් පසු සෝවියට් බලයට විරුද්ධව අරගල කළේය. 1918 දී විදේශ ගත වූ ඔහු සෝවියට් විරෝධී ප්‍රචාරය ගෙන ගියේය.

ක්‍රපොත්කින්, පියොතර් අලෙක්සේයවිච් (1842-1921) — අරාජිකවාදයේ ප්‍රධානම නායකයින්ගෙන් හා දෘෂ්ටිවාදීන්ගෙන් එකෙකි. 1876 සිට 1917 දක්වා විදේශගත වී සිටියේය. පළමුවැනි ලෝක යුද්ධය සමයේදී ඔහු ජාතෝන්මාදවාදියෙකු බවට පත්විය. 1917 දී විදේශයෙන් ආපසු ආ ක්‍රපොත්කින් ධනපතිවාදී ස්ථාවරය රැක ගෙන සිටි නමුත් ඔක්තෝබර් සමාජවාදී විප්ලවයේ ඓතිහාසික වැදගත්කම පිළිගත් අතර සෝවියට් රුසියාවට විරුද්ධව කළ ආක්‍රමණය වළක්වන ලෙස ආයාචනය කරන ලිපියක් යුරෝපීය කම්කරුවන් වෙත ලියා යෙව්වේය.

කර්නිලව්, ලව්රි ගියොර්ගියවිච් (1870-1918) — රාජාණ්ඩුවාදී සේනාධිපතියෙකි. 1917 ජූලි හා අගෝස්තු මාසවලදී රුසියානු හමුදවේ උසස්තම සේනාධිපති වූ ඔහු අගෝස්තුවේදී ප්‍රතිවිප්ලවවාදී කැරැල්ලක් මෙහෙය වූයේය

ගේ, අලෙක්සාන්දර් (විපත 1919) — රුසියානු අරාජිකවාදියෙකු වූ ඔහු ඔක්තෝබර් සමාජවාදී විප්ලවයෙන් පසු සෝවියට් බලයට පක්ෂව සිටියේය.

ගෙද් (Guesde), ජූල් (බසිල්, මත්යේ) (1845-1922) — ප්‍රංශ සමාජවාදී ව්‍යාපාරයේ හා දෙවැනි ජාත්‍යන්තරයේ සංවිධායකයන්ගෙන් හා නායකයින්ගෙන් කෙනෙකි. ප්‍රංශයේ මාක්ස්වාදී අදහස් ව්‍යාප්ත කිරීම හා සමාජවාදී ව්‍යාපාරය දියුණු කිරීම සඳහා විශාල සේවයක් කළ ගෙද් දක්ෂිණාංශික සමාජවාදීන්ට විරුද්ධව සටන් කළ අතර න්‍යායික හා උපක්‍රමීය ප්‍රශ්නවලදී කණ්ඩායම් වාදී වැරදි ගණනක් කළේය. පළමුවැනි ලෝක යුද්ධය පටන් ගත් විට සමාජ-ජාතෝන්මාදවාදී ප්‍රතිපත්තිය පිළිගත් ඔහු ප්‍රංශ ධනපතිවාදී ආණ්ඩුවට ඇතුල් විය.

ගුච්කොව්, අලෙක්සාන්දර් ඉවානවිච් (1882-1932) —විශාල ධනපතියෙක් වූ ඔහු ඔක්තියාබ්රිස්ට් පක්ෂයේ ("ඔක්තෝබර් 17 යේ සංගමයේ") සංවිධායකයා හා නායකයා විය. පළමුවැනි ලෝක යුද්ධය සමයේදී මධ්‍යම යුද්ධ-ආර්ථික මණ්ඩලයේ සභාපති හා විශේෂ ආරක්ෂක මණ්ඩලයේ සාමාජිකයෙක් වූ අතර 1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයෙන් පසු ගුච්කොව් පළමුවැනි තාවකාලික ආණ්ඩුවේ යුද්ධ හා නාවුක හමුද ඇමති ධුරය ඉසිලීය. 1917 අගෝස්තුවේදී කර්නිලව් කැරැල්ල සංවිධානය කිරීමට සහභාගී විය.

ග්‍රාව් (Grave) ජාන් (1854-1939) — ප්‍රංශ සුළු ධනපතිවාදී සමාජවාදියෙකි; අරාජිකවාදයේ එක් දෘෂ්ටිවාදියෙකි. විසිවැනි ශතවර්ෂයාරම්භ-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

යේදී අරාජිකවාදී-සම්මේලවාදී ස්ථාවරය ගත් ඔහු, පළමුවැනි ලෝක යුද්ධය සමයේදී සමාජවාදී -ජාත්‍යෝන්මාදවාදියකු බවට පත් විය.

ග්වොස්දියව්, කුස්මා අන්තෝනවිච් (උපත 1883) — රුසියානු මෙන්ෂෙවික් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙක් වූ ඔහු පළමුවැනි ලෝක යුද්ධය සමයේදී සමාජ-ජාත්‍යෝන්මාදවාදියෙක් බවට පත්විය. ඒ කාලයේදීත් ඔහු මධ්‍යම යුද්ධ-කර්මාන්ත මණ්ඩලයේ සභාපති විය. 1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍ර විප්ලවයෙන් පසු ග්වොස්දියව් පෙට්‍රොග්‍රෑඩ් සෝවියට් සභාවේ විධායක කාරක සභාවේ සාමාජිකයෙකු වූ අතර තාවකාලික ආණ්ඩුවේ කම්කරු නියෝජ්‍ය ඇමති ධූරය හා 1917 සැප්තැම්බර් සිට කම්කරු අමති ධූරයද ඉසිලිය.

චයිකොව්ස්කි, නිකොලායි වසිලියවිච් (1850-1926) — නරොද්නික්වාදියෙකු, අනතුරුව, සමාජවාදී-විප්ලවවාදියෙකු හා ''ජනතාවාදී සමාජවාදියෙකු'' වූ ඔහු පළමුවැනි ලෝක යුද්ධය සමයේදී සමාජ-ජාත්‍යෝන්මාදවාදියෙකු බවට පත් විය. 1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයෙන් පසු චයිකොව්ස්කි ''එක්සත් ශ්‍රම ජනතා සමාජවාදී පක්ෂයේ'' මධ්‍යම කාරක සභාවේ සාමාජිකයෙකු වූ අතර පෙට්‍රොග්‍රෑඩ් කම්කරු හා සොල්දාදු නියෝජිතයින්ගේ සෝවියට් සභාවේ හා සමස්ත රුසියා ගොවි නියෝජිතයින්ගේ සෝවියට් සභාවේ විධායක කාරක සභාවලට ඇතුල් විය.

චෙර්නොව්, වික්තර් මිහයිලවිච් (1876-1952) — සමාජවාදී-විප්ලවවාදී පක්ෂයේ එක් නායකයෙක් හා දෘෂ්ටිවාදියෙක් වූ ඔහු පළමුවැනි ලෝක යුද්ධය සමයේදී සිය සමාජ-ජාත්‍යෝන්මාදවාදය වාමාංශික වදන් පාඨවලින් වසං කළේය. 1917 මැයි හා අගෝස්තු මාසවලදී චෙර්නොව් ධනපති තාවකාලික ආණ්ඩුවේ කෘෂිකර්ම ඇමති ධූරය ඉසිළු අතර, රදළ ඉඩම් හිමියන්ගේ ඉඩම් අල්ලා ගත් ගෙවීන් කෲර ලෙස මර්දනය කිරීමේ ප්‍රතිපත්තිය ගෙන ගියේය.

ජෙර්ෂින්ස්කි, පෙලික්ස් එද්මුන්දවිච් (1877-1926) — කොමියුනිස්ට් පක්ෂයේ හා සෝවියට් රාජ්‍යයේ සම්භාවනීය නායකයෙක් වූ ඔහු පක්ෂයට ඇතුල් වූයේ 1895 දීය. 1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයෙන් පසු මොස්කව්හි පක්ෂ වැඩ කටයුතුවලදී යෙදී සිටි ඔහු ඔක්තෝබර් සමාජවාදී විප්ලවය සූදානම් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ

සමයේදී පෙට්‍රොග්‍රෑඩ් විප්ලවවාදී යුද්ධ කාරක සභාවේද කැරලි ගැසීම මෙහෙයවීම සඳහා පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් පිහිටුවන ලද විප්ලවකාරී යුද්ධ මධ්‍යස්ථානයේද සාමාජිකයෙක් විය. සමාජවාදී විප්ලවයෙන් පසු ජෙර්ෂින්ස්කි ප්‍රතිවිප්ලවය හා කඩා කප්පල් කිරීම් මැඩ පැවැත්වීමේ සමස්ත රුසියා විශේෂ කොමිසමේ සභාපතිවරයා විය.

ජොරේස් (Jaurès), ජාන් (1859-1914) — ප්‍රංශ හා ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරයේ සම්භාවනීය නායකයෙකි. ජොරේස් කම්කරු ව්‍යාපාරය හා එහි කාර්යභාරයන් සම්බන්ධයෙන් ප්‍රතිසංස්කරණවාදී මත දැරූ නමුත් සාමය සඳහා වූද අධිරාජ්‍යවාදී පීඩනයට හා රටවල් අල්ලා ගැනීමේ යුද්ධවලට විරුද්ධවූද අරගලය නොනවත්වාම පවත්වා ගෙන ගියේය. එනිසා ඔහු ගැන වෛරයෙන් පිරුණු ප්‍රතිගාමී ධනපති පංතියේ අතවැසියන් විසින් ඔහු මරා දමන ලදී.

ජෝර්දනිය, නොයි නිකොලායවිච් (1870-1953) — සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකි; කොකේසියානු මෙන්ෂෙවික්වරුන්ගේ නායකයකි. පළමුවැනි ලෝක යුද්ධයේ අවුරුදුවලදී සමාජ-ජාත්‍යෝන්මාදවාදියෙකු වූ ඔහු 1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයෙන් පසු තිප්ලිස්හි කම්කරු නියෝජිතයින්ගේ සෝවියට් සභාවේ සභාපති ධූරය ඉසිලිය. 1918-1921 අවුරුදුවලදී ජෝර්ජියාවේ ප්‍රතිවිප්ලවවාදී මෙන්ෂෙවික් ආණ්ඩුවේ නායකයා විය. පසුව විදේශ ගත විය.

ට්‍රොට්ස්කි (බ්‍රොන්ෂ්ටෙයින්), ලෙව් දවීදවිච් (1879-1940) — රුසියානු මෙන්ෂෙවික් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකි. 1905-1907 විප්ලවය පරාජය වීමෙන් පසු ලික්විඩේටර්වාදයට පත් ඔහු යුද්ධය, සාමය හා විප්ලවය යන ප්‍රශ්න සම්බන්ධයෙන් ලෙනින්ට හා බොල්ෂෙවික්වරුන්ට විරුද්ධව අරගල කළේය. පළමුවැනි ලෝක යුද්ධය සමයේදී මධ්‍යස්ථ පිළිවෙතක් ගත් අතර 1917 දී බොල්ෂෙවික් පක්ෂයට ඇතුලත් විය. එහෙත් ට්‍රොට්ස්කි බොල්ෂෙවික් ප්‍රතිපත්තිය නොපිළිගත්තා පමණක් නොව ඔහු ලෙනින්වාදයටත් පක්ෂයේ ප්‍රතිපත්තියටත් විරුද්ධව විවෘත හා ආවෘත අරගලයක්ද ගෙන ගියේය.

ඔක්තෝබර් සමාජවාදී විප්ලවයෙන් පසු වගකිව යුතු තනතුරු ගණනක් ඉසිලූ ඔහු පක්ෂයේ ප්‍රධාන පිළිවෙතට විරුද්ධවත් සෝවියට් සංගමයේ සමාජවාදය ගොඩ නැගීමේ වැඩ පිළිවෙලට විරුද්ධවත් ඉදිරිපත්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

වූ නිසා 1927 පක්ෂයෙන් නෙරපා දමන ලදී. 1927 දී සෝවියට විරෝධී කටයුතු නිසා ට්‍රොට්ස්කි සෝවියට් සංගමයෙන් පිටු වහල් කරන ලදී. 1932 දී ඔහුට සෝවියට් පුරවැසිකම අහිමි කරන ලදී.

ටුරාටි (Turati), පිලිපො (1857-1932) — ඉතාලියානු කම්කරු ව්‍යාපාරයේ එක් නායකයෙකි; ඉතාලියානු සමාජවාදී පක්ෂයේ (1902) එක් සංවිධායකයෙකි; එහි ප්‍රතිසංස්කරණවාදී වාමාංශයේ නායකයෙකි. 1896 දී ඔහු පාර්ලිමේන්තුවට තෝරා පත් කෙරුණු පසු එහි සමාජ-ප්‍රතිසංස්කරණවාදී කණ්ඩායමේ නායකත්වය ඉසිලීය. පළමුවැනි ලෝක යුද්ධය කාලයේදී ටුරාටි මධ්‍යස්ථ ස්ථාවරයක් ගෙන සිටියේය.

දවීද් (David), එදුආර්ඩ් (1863-1930) ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ වාමාංශයේ එක් නායකයෙකි; සංශෝධනවාදියෙකි. “Sozalistische Monatshefte” (‘‘සමාජවාදී මාසිකය’’) නම් වූ ජර්මන් අවස්ථාවාදී සඟරාවේ එක් නිර්මාපකයෙකි. 1903 පටන් රෙයිස්ටාගයට නොඑක්වර තේරී පත් විය. පළමුවැනි යුද්ධ සමයේදී සමාජ-ජාත්‍යාන්මාදවාදී ස්ථාවරය ගෙන සිටියේය.

ඩූරිං (Dühring), එව්ගන් (1833-1921) — ජර්මන් දර්ශනවාදියෙකි, ආර්ථිකවාදියෙකි; සුළු ධනපති දෘෂ්ටිවාදියෙකි. ඔහුගේ මතය, ප්‍රත්‍යක්ෂවාදයේත්, අධ්‍යාත්ම භෞතිකවාදයේත් විඥානවාදයේත් සාරසංග්‍රහවාදී මිශ්‍රණයක් විය.

තුගාන්-බරනොව්ස්කි, මිහයීල් ඉවානවිච් (1865-1919) — රුසියානු ධනවාදී ආර්ථික විද්‍යාඥයෙක් වූ ඔහු අනූගණන්වලදී ‘‘නීත්‍යානුකූල මාක්ස්වාදයේ’’ සුප්‍රසිද්ධ නියෝජිතයෙක් විය

ත්‍රෙවෙස් (Treves), ක්ලව්දිඔ (1868-1933) — ඉතාලියානු සමාජවාදී පක්ෂයේ සංශෝධනවාදී නායකයින්ගෙන් කෙනෙක් වූ ඔහු පළමුවැනි ලෝක යුද්ධය කාලයේදී මධ්‍යස්ථවාදියෙක් විය.

පළමුවැනි නැපෝලියන් (බොනපාට්) (1769-1821) — 1804-1814 හා 1815 දී ප්‍රංශ අධිරාජ්‍යයා විය.

තුන්වැනි නැපෝලියන් (බොනපාට්, ලූයි) (1808-1873) — පළමුවැනි නැපෝලියන්ගේ බෑණා වූ ඔහු 1852 සිට 1870 දක්වා වූ අවුරුදුවලදී ප්‍රංශයේ අධිරාජ්‍යයා විය. 1848 විප්ලවය පරාජය වීමෙන් පසු ප්‍රංශ සමූහාණ්ඩුවේ ජනාධිපති ධුරයට තෝරා පත් වූ ඔහු 1851 දෙසැම්බර් 2 දින රාත්‍රියේ ආණ්ඩු පෙරලිය ක්‍රියාත්මක කළේය.

දෙවැනි නිකොලායි (රමානව් (1868-1918) — අවසාන රුසියානු අධිරාජ්‍යයා වූ ඔහු 1894 සිට 1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය දක්වා රජ කළේය.

නිකීතින්, ඒ. එම්. (උපත 1876) — මෙන්ෂෙවික්වරයෙකි. 1917 ජූලි මස සිද්ධීන්ගෙන් පසු ඔහු තැපැල් හා විදුලි පණිවුඩ සේවය භාර ඇමති ධුරය ඉසිලීය. ධනපති තාවකාලික ආණ්ඩුවේ අවසාන කැබිනට් මණ්ඩලයේ ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති තනතුර භාර ගෙන සිටියේය.

පනෙකුක් (Panneckoek), ඇන්ටනි (1973-1960) — ඕලන්ද සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකි. 1909 දී ඕලන්දයේ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී (‘‘ත්‍රිබූන්වාදී’’) පක්ෂයට පරිවර්තනය වූ, ඕලන්ද සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ වාමාංශයේ “De Tribune” (‘‘වේදිකාව’’) නම් වූ නිල පත්‍රය පිහිටුවීමට 1907 දී ඔහු සහභාගී විය. පළමුවැනි ලෝක යුද්ධ සමයේදී පනෙකුක් ජාත්‍යන්තරවාදී ස්ථාවරය ගෙන සිටි අතර, “Verbote” (පූර්වගාමියා) නම්වූ ට්සිමර්වොල්ඩ් වාමාංශික පක්ෂයේ දර්ශනික සඟරාව පළ කිරීමට සහභාගී විය.

පල්චින්ස්කි, පියොතර් යොඅකීමවිච් (1875-1929) — බැංකු හා සමග කිට්ටු සම්බන්ධතා පැවැත්වූ ඔහු ‘‘ප්‍රොදුගොල්’’ සම්මේලයේ සංවිධායකයා විය. 1917 පෙබරවාරි ධනපති ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයෙන් පසු තාවකාලික ආණ්ඩුවේ වෙළඳාම හා කර්මාන්තය පිළිබඳ උප ඇමති ධුරය ඉසිලූ ඔහු කර්මාන්ත කරුවන්ගේ වර්ජනයේ සංවිධායකයා වූ අතර ප්‍රජාතන්ත්‍රවාදී සංවිධානවලට විරුද්ධව අරගලට කළේය. 1917 ඔක්තෝබර් 25 (නොවැම්බර් 7) දින පල්චින්ස්කි සිම්නි මළිගාවේ ආරක්ෂාවේ නායකත්වය දැරීය.

පෙරිවෙර්සෙව්, පාවෙල් නිකොලායවිච් — නීතිඥයකි; සමාජවාදී-විප්ලවවාදීන්ට කිට්ටු තෘදෙවික්වරයෙකි. 1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයෙන් පසු ඔහු පළමුවැනි සභාග තාවකාලික ආණ්ඩුවේ අධිකරණ ඇමති ධුරය ඉසිලීය. 1917 ජූලි මාසයේදී යුද්ධමය ඔත්තු

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සේවය සමග සහයෝගී වෙමින් අලෙක්සින්ස්කි විසින් ලෙනින්ට හා බොල්ෂෙවික් වරුන්ට විරුද්ධව නගන ලද බොරු චෝදනා ලියවිලි පල්චින්ස්කි පළ කළේය.

පෙෂෙහොනව්, අලෙක්සෙයි වසිලියෙවිච් (1867-1933) — ධනපතිවාදී සමාජ නායකයෙක් හා දේශපාලන විචාරයකි. 1906 පටන් සුළු ධනපතිවාදී ''ජනතා සමාජවාදී'' පක්ෂයේ එක් නායකයෙකි. 1917 දී ධනපති තාවකාලික ආණ්ඩුවේ ආහාර ඇමති ධුරය ඉසිලීය.

පොත්‍රෙසව්, අලෙක්සාන්දර් නිකොලායෙවිච් (1869-1934) — මෙන්ෂෙවික්වාදීන්ගේ එක් නායකයෙක් වූ ඔහු පළමුවැනි ලෝක යුද්ධය සමයේදී සමාජ-ජාත්‍යෝන්මාදවාදය වැළඳ ගෙන සිටියේය. 1917 දී බොල්ෂෙවික්වරුන්ට විරුද්ධව තියුණු ප්‍රචාරයක් හා අරගලයක් කළ ''දේන්'' (දිනය) පුවත්පතේ කර්තෘ මණ්ඩලයේ නායකත්වය දැරීය.

පමිලොව්ස්කි, නිකොලායි ගෙරාසිමොවිච් (1835-1863) — රුසියානු ප්‍රජාතන්ත්‍රවාදී ලේඛකයෙකි.

ප්‍රකපෝවිච්, සෙර්ගේ නිකොලායෙවිච් (1871-1955) — ධනවාදී ආර්ථික විද්‍යාඥයෙක් හා දේශපාලන විචාරකයෙකි. අර්ධ වශයෙන් කැඩෙට්, අර්ධ වශයෙන් මෙන්ෂෙවික් ''බෙස් සග්ලාවිය'' (''මාතෘකා රහිත'') සඟරාව පළ කළේය. 1917 දී ධනපති තාවකාලික ආණ්ඩුවේ ආහාර ඇමති ධුරය භාර ගෙන සිටියේය.

ප්‍රූදොන් (Proudhon), පියේර් ජොසේප් (1809-1865) — ප්‍රංශ ජාතික දේ දේශපාලන විචාරකයෙක්, ආර්ථික විද්‍යාඥයෙක් හා සමාජ විද්‍යාඥයෙක් වූ ඔහු සුළු ධනපති පංතියේ දෘෂ්ටිවාදියෙක් විය, එසේම අරාජිකවාදයේ එක් නිර්මාපකයෙක් විය. රාජ්‍යය, පංති විරෝධිතාවයන්ගේ ප්‍රධාන උල්පත ලෙසට සැලකූ ප්‍රූදෝන් රාජ්‍යය සාමකාමී ලෙස අහෝසි කිරීමේ යෝජනා ඉදිරිපත් කළ අතර දේශපාලන අරගලය ප්‍රතික්ෂේප කළේය.

ප්ලෙහානව්, ගෙඔර්ගි වලෙන්තිනවිච් (1856-1918) — රුසියානු හා ජාත්‍යන්තර කම්කරු ව්‍යාපාරයේ සම්භාවනීය නායකයෙකි, රුසියාවේදී මාක්ස්වාදයේ ප්‍රථම ප්‍රචාරකයා විය.

රු. ස. ප්‍ර. ක. ප. දෙවැනි සම්මේලනයෙන් පසු (1903) අවස්ථාවාදීන් සමග සාමයට පක්ෂව සිටි ප්ලෙහානව් අනතුරුව මෙන්ෂෙවික්වරුන්ගේ පැත්තට ගියේය. පළමුවැනි ලෝක යුද්ධය සමයේදී ඔහු ජාතෝන්මාදවාදය වැළඳ ගත්තේය.

1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයෙන් පසු රුසියාව, සමාජවාදී සමාජයට පරිවර්තනය වීම සඳහා මෝරා නැතැයි සැලකූ ප්ලෙහානව් ''යෙදින්ස්ත්ව'' නම්වූ අන්ත දක්ෂිණාංශික ආරක්ෂාවාදී මෙන්ෂෙවික්වරුන්ගේ කණ්ඩායමේ නායකත්වය දැරූ අතර බොල්ෂෙවික්වරුන්ටත් සමාජවාදී විප්ලවයටත් විරුද්ධව ඉදිරිපත් විය. ඔහු ඔක්තෝබර් සමාජවාදී විප්ලවය නොපිළිගත් නමුත් සෝවියට් විරෝධී ක්‍රියාකාරීත්වයට සහභාගි නොවිය.

බකූනින්, මිහයිල් අලෙක්සන්ද්‍රොවිච් (1814-1876) — රුසියානු විප්ලවවාදියෙකි. අරාජිකවාදයේ එක් දෘෂ්ටිවාදියෙක් වූ ඔහු අරාජිකවාදයේ න්‍යායය හා ව්‍යවහාරය ගැන පොත් ගණනාවක් ලිවේය.

බසාරව්, වී (රුද්නෙව්, ව්ලදිමිර් අලෙක්සන්ද්‍රොවිච්) (1874-1939)— රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙක් වූ ඔහු මාහ්වාදී සංශෝධනවාදීන්ගේ එක් නායකයෙක් විය. 1917 දී බසාරව් ජාත්‍යන්තරවාදී මෙන්ෂෙවික් ස්ථාවරය ගත්තේය. ඔහු ''නෝවය ෂිස්න්'' නම් වූ අර්ධ මෙන්ෂෙවික්වාදී පත්‍රයේ කර්තෘ මණ්ඩලයට ඇතුල් වී සිටි අතර ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට විරුද්ධව ඉදිරිපත් විය.

බිස්මර්ක් (Bismarck), ඔටෝ එදුආර්ද් ලෙඔපොල්ඩ් (1815-1898) — ප්‍රෘසියාවේ හා ජර්මනියේ දේශපාලඥයෙක් හා රාජතන්ත්‍රිකයෙක් වූ ඔහු 1871-1890 අවුරුදුවලදී ජර්මන් අධිරාජ්‍යයේ රෙයිස්ටාගයේ චාන්සලර් තනතුරු දරමින් සිටියේය. රදළ ඉඩම් හිමියන් හා විශාල ධනපතීන් අතර සන්ධානය ඇති කිරීමට උත්සාහ කරන අතර ඉඩම් හිමියන්ගේ උවමනාවන් සපුරාලීම අරමුණු කොට ගෙන ජර්මනියේ මුළු අභ්‍යන්තර හා විදේශීය ප්‍රතිපත්තියම මෙහෙයවිය.

බිසොලාති (Bissolati), ලෙඔනීඩ (1857-1920) — ඉතාලියානු සමාජවාදී පක්ෂයේ ආරම්භකයින්ගෙන් හා එහි අන්ත දක්ෂිණ හා ප්‍රතිසංස්කරණවාදී අංශයේ නායකයින්ගෙන් එක් කෙනෙකි. 1912 දී බිසොලාති ඉතාලියානු සමාජවාදී පක්ෂයෙන් නෙරපා දමන ලදුව

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

‘‘සමාජ-ප්‍රතිසංස්කරණවාදී පක්ෂය’’ පිහිටුවිය. පළමුවැනි ලෝක යුද්ධය සමයේදී සමාජ-ජාත්‍යොන්මාදවාදියෙක් බවට පත් ඔහු ඉතාලිය එන්ටෙන්ටේ ගිවිසුමට පක්ෂව යුද්ධයට සහභාගී වීමට එකහව සිටියේය. 1916-1918 දී බිසොලාති කාර්ය නියමයක් නොමැති ඇමති වශයෙන් ආණ්ඩුවට ඇතුල් වී සිටියේය.

බුලීගින්, අලෙක්සන්දර් ග්‍රිගෝරියවිච් (1851-1919) — විශාල ඉඩම් හිමියෙක් හා සාර්ගේ ඇමතිවරයෙකි. 1905 දී, රටේ මතු වී පවතින විප්ලවවාදී ව්‍යාපාරය දුර්වල කිරීමේ අරමුණු ඇතිව, උපදේශක රාජ්‍ය දූමා සභාව කැඳවීමේ කෙටුම්පත් පනත පිළිබඳ සම්පාදක කොමිසමේ නායකත්වය දැරිය. එහෙත් 1905-1907 විප්ලවය නිසා මේ දූමා සභාව නොකැඳවිණි.

බෙබෙල් (Bebel), අවුගුස්ට් (1840-1913) — ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ හා දෙවැනි ජාත්‍යන්තරයේ ප්‍රසිද්ධතම නායකයින්ගෙන් කෙනෙකි. අනූ ගණන්වලදී හා විසිවැනි ශත වර්ෂයාරම්භයේදීත් ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රතිසංස්කරණවාදයට හා සංශෝධනවාදයට විරුද්ධව ඉදිරිපත් විය. දක්ෂ සංවිධායකයෙකු හා දේශපාලන විචාරකයෙකු වූ බෙබෙල්, ජර්මන් හා ජාත්‍යන්තර කම්කරු ව්‍යාපාරය කෙරෙහි විශාල බලපෑමක් කළේය.

බෙර්කන්ගෙයිම්, අලෙක්සන්දර් මයිසේයවිච් (1880-1932) — සමාජවාදී-විප්ලවවාදියෙකු වූ ඔහු 1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයෙන් පසු මොස්කව් ආහාර කොමිටුවේ සභාපති විය.

බෙර්න්ෂ්ටයින් (Bernstein), එදුවාර්ද් (1850-1932) — ඔහු ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ හා දෙවැනි ජාත්‍යන්තරයේ අන්ත අවස්ථාවාදී අංශයේ නායකයා හා සංශෝධනවාදයේ සහ ප්‍රතිසංස්කරණදයේ දෘෂ්ටිවාදියාද විය. 1896-1898 දී “Die Neue Zeit” (නවීන කාලය) සඟරාව මගින් ‘‘සමාජවාදයේ ගැටළු’’ යන ලිපි මාලාවක් පළ කළේය. පසුව ‘‘සමාජවාදයේ පූර්ව කොන්දේසි හා සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ යුතුකම්’’ නමින් වෙනම පොතක් වශයෙන් පළ කළ මේ ලිපි මාලාව මගින් බෙර්න්ෂ්ටයින් විප්ලවවාදී මාක්ස්වාදයේ දර්ශනික, ආර්ථික හා දේශපාලන පදනම් විවෘත ලෙස සංශෝධනයට ලක් කළේය. ධනපතිවාදය යටතේම කම්කරුවන්ගේ ආර්ථික තත්ත්වය දියුණු කරන ප්‍රතිසංස්කරණ සඳහා වූ අරගලය, කම්කරු ව්‍යාපාරයේ ප්‍රධාන ඉලක්කය

ලෙස සැලකූ ඔහු, ‘‘ව්‍යාපාරය පමණක් වැදගත්ය; පරමාර්ථය වැදගත් නොවේ,’’ යන අවස්ථාවාදී පාඨය ඉදිරිපත් කළේය. පළමුවැනි ලෝක යුද්ධය කාලයේදී බෙර්න්ෂ්ටයින් මධ්‍යස්ථ ස්ථාවරයක් ගත් අතර ජාත්‍යන්තරවාදය පිළිබඳ වචනවලින් සමාජ-ජාත්‍යෝන්මාදවාදය වසං කළේය.

බොනපාට්, ලූයි — තුන්වැනි නැපෝලියන් බලන්න.

බ්‍යුකනන් (Buchanan), ජෝර්ජ් විලියම් (1851-1919) — ඉංග්‍රීසි රාජතන්ත්‍රකයෙකි. 1910-1918 දී රුසියාවේ තානාපති වරයෙකුව සිටි ඔහු ප්‍රතිවිප්ලවවාදී අරගලයේදී ප්‍රතිගාමීත්වයට සහයෝගය දුන්නේය. 1917 අගෝස්තුවේදී කර්නිලව් කැරැල්ලට ආධාර කළේය.

බ්‍රක්කේ (Bracke), විල් හෙල්ම් (1842-1880) — ජර්මන් සමාජවාදියෙකි. පොත් ප්‍රකාශකයෙකු හා වෙළෙන්දෙකු වූ ඔහු ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ ආරම්භකයෙකු හා නායකයෙකු විය.

බ්‍රන්ටිං (Branting), කාල්යල්මර් (1860-1925) — ස්වීඩනයේ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ නායකයා හා දෙවැනි ජාත්‍යන්තරයේ නායකයෙකි. ඔහු අවස්ථාවාදියෙක් විය. 1887-1917 අවුරුදුවලදී (වරින් වර) බ්‍රන්ටිං “Socialdemocraten” (සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියා) නම් වූ පක්ෂයේ නිල පත්‍රයේ කර්තෘ මණ්ඩලයේ සිටි අතර 1897-1925 අවුරුදුවලදී රික්ස්දගයට තේරී පත් විය. පළමුවැනි ලෝක යුද්ධය සමයේදී සමාජ-ජාත්‍යෝන්මාදවාදියකු බවට පත් බ්‍රන්ටිං 1910 දී එදෙන්ගේ සභාග ආණ්ඩුවට ඇතුල් වී සෝවියට් රුසියාවට විරුද්ධව කෙරුණු ආක්‍රමණයට පක්ෂව සිටියේය.

බ්‍රියාන් (Briand), අරිස්තිද් (1862-1932) — ප්‍රංශයේ දේශපාලනඥයෙක් හා රාජතන්ත්‍රිකයෙකි. කෙටි කාලයක් සමාජවාදී වාමාංශයට සමීපව සිටියේය. බොහෝ වරක් ප්‍රංශයේ ධනපති ආණ්ඩුවලට ඇතුල් විය. බ්‍රියාන් කම්කරු පංතිය කෙරෙහි විවෘත සතුරු කමකින් යුත් ආකල්පයක් දක්විය. 1913, 1915-1917 හා 1921-1922 අවුරුදුවලදී බ්‍රියාන් අගමැති තනතුර ඉසිලීය.

බ්‍රෙෂ්කො-බ්‍රෙෂ්කොව්ස්කය, යෙකතෙරීනා කොන්ස්තන්තීනව්නා (1844-1934) — සමාජවාදී-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ ආරම්භකයන්ගෙන් හා

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

නායකයින්ගෙන් කෙනෙක් වූ ඇ එහි දක්ෂිණාංශයට අයත් වූවාය. 1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයෙන් පසු තාවකාලික ආණ්ඩුවට ආධාර දුන් අතර අධිරාජ්‍යවාදී යුද්ධය ''ජයග්‍රාහී අවසානය'' දක්වාම පවත්වා ගෙන යාමට පක්ෂව සිටියාය.

බ්ලාංකි (Blanqui), ලුයි ඔගුස්ට් (1805-1881) — සුප්‍රසිද්ධ ප්‍රංශ විප්ලව-වාදියෙක් හා මනෝරාජික කොමියුනිස්ට්වාදියෙකි. 1830 සිට 1870 දක්වාම පැරිස් කැරලි හා විප්ලවවලට සහභාගී වූ ඔහු 36 අවුරුද්දකට අධික කාලයක් සිරගතව සිටියේය. බ්ලාංකි, විප්ලවකාරී සටන සඳහා ජනතාව සංවිධානය කිරීමේ අති විශාල වැදගත්කම වටහා නොගත් අතර කුමන්ත්‍රණකාරයින් අතලොස්සක් විසින් බලය අල්ලා ගැනීම සඳහා කටයුතු කළේය.

මාර්තව්, ඇල්. (සෙදර්බවම්, යූලි ඔසිපවිච්) (1873-1923) — මෙන්ෂෙවික්වාදයේ එක් නායකයෙක් වූ ඔහු පළමුවැනි ලෝක යුද්ධය සමයේදී මධ්‍යස්ථ පිළිවෙත ගෙන සිටියේය. 1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයෙන් පසු ජාත්‍යන්තරවාදී මෙන්ෂෙවික්වරුන්ගේ කණ්ඩායාමේ නායකයා විය.

මාක්ස් (Marx), කාල් (1818-1883)

මැක්ලීන් (Maclean), ජෝන් (1879-1923) — වෘත්තියෙන් ගුරුවරයෙකු වූ, ඉංග්‍රීසි කම්කරු ව්‍යාපාරයේ ප්‍රසිද්ධ නායකයෙකි. පළමුවැනි ලෝක යුද්ධයට පෙර මැක්ලීන් බ්‍රිතාන්‍ය සමාජවාදී පක්ෂයේ වාමාංශයට ඇතුල් වී ස්කොට්ලන්තයේ එහි නායකයින්ගෙන් එක් කෙනෙක් විය. යුද්ධ සමයේදී ජාත්‍යන්තර ප්‍රතිපත්තිය පිළිගත් ඔහු ක්‍රියාශීලී ලෙස යුද්ධ විරෝධී ප්‍රචාරය ගෙන ගිය අතර (යුද්ධ පැක්ටරිවල) කම්කරුවන්ගේ බහුජන පෙළපාලි හා වැඩ වර්ජන සංවිධානය කළේය. ඔහුගේ ක්‍රියාකාරිත්වය නිසා මැක්ලීන් බ්‍රිතාන්‍ය ආණ්ඩුව විසින් නිතරම ලුහු බඳින ලදී.

මිලියුතින්, ව්ලදීමීර් පාව්ලවිච් (1884-1938) — ඔහු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයට 1903 සිට සහභාගී විය. ප්‍රථමයෙන් මෙන්ෂෙවික්වරුන්ට සමීපව සිටි මිලියුතින් 1910 දී බොල්ෂෙවික්වාදියෙක් බවට පත් වී 1919 නොවැම්බරය දක්වා පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ සාමාජික තනතුර දැරුවේය.

මිලුකොව්, පාවෙල් නිකොලායවිච් (1859-1943) — කැඩෙට් පක්ෂයේ ආරම්භකයින්ගෙන් හා නායකයින්ගෙන් කෙනෙක් වූ ඔහු එහි මධ්‍යම කාරක සභාවේ සභාපති හා ''රෙච්'' නම් වූ එහි නිල පත්‍රයේ කර්තෘවරයා විය. 1917 දී මිලුකොව් පළමුවැනි ධනපති තාවකාලික ආණ්ඩුවේ විදේශ කටයුතු භාර ඇමති වූ අතර අධිරාජ්‍යවාදී යුද්ධය ''ජයග්‍රාහී අවසානය දක්වා'' ගෙන යාමේ ප්‍රතිපත්තියට සහයෝගය දුන්නේය. 1917 දී ඔහු කර්නිලව් කැරැල්ල සංවිධානය කිරීමට සහභාගි විය.

මිලෙරාන් (Millerand), අලෙක්සන්දර් එතියන් (1859-1943) — ප්‍රංශ ජාතික දේශපාලනඥයෙකි. 90 ගණන්වලදී සමාජවාදී පක්ෂයට ඇතුල් වූ ඔහු ප්‍රංශ සමාජවාදී ව්‍යාපාරයේ අවස්ථාවාදී අංශයේ නායකයා බවට පත් විය. 1899 මිලෙරාන් ප්‍රතිගාමී ධනපතිවාදී වල්දෙක්-රුසෝගේ ආණ්ඩුවට ඇතුල් වී පැරිස් කොමියුනයේ වදකයා වන සේනාධිපති-ගලිෆේ සමග සහයෝගිව කටයුතු කළේය. 1904 දී වෙනත් හිටපු සමාජ වාදීන් (බ්‍රියාන්, විවියනි) සමග සමාජවාදී පක්ෂයෙන් නෙරපා දමන ලද පසු ඔහු ''ස්වාධීන සමාජවාදී'' කණ්ඩායම ආරම්භ කළේය. බොහෝ වරක් විවිධ ඇමති ධුර ඉසිලූ මිලෙරාන් 1920-1924 අවුරුදුවලදී ප්‍රංශ සමූහාණ්ඩුවේ ජනාධිපති තනතුරට තේරී පත් විය.

මිහයිලොව්ස්කි, නිකොලායි කන්ස්තන්තීනවිච් (1842-1904) — ලිබරල් නරොද්නික්වාදයේ ප්‍රසිද්ධතම දෘෂ්ටිවාදියා වූ ඔහු දේශපාලන හා සාහිත්‍යමය විචාරකයෙක් සහ ප්‍රත්‍යක්ෂවාදී දර්ශනවාදියෙක් විය.

මේරිං (Mehring), ප්‍රාන්ස් (1846-1919) — ජර්මන් කම්කරු ව්‍යාපාරයේ සුප්‍රසිද්ධ නායකයෙක් වූ ඔහු ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ වාමාංශයේ නායකයන් හා දෘෂ්ටිවාදීන්ගෙන් එක් කෙනෙක් විය. "Die Neue Zeit" (නවීන කාලය) නම් පක්ෂයේ නිල පත්‍රයේ කර්තෘවරයෙක් විය.

මොන්තෙස්ක්යෝ (Montesquieu), ෂාර්ල් ලුයි (1689-1755) — සුප්‍රසිද්ධ ප්‍රංශජාතික සමාජ විද්‍යාඥයෙක්, ආර්ථික විද්‍යාඥයෙක් හා ලේඛකයෙක් වූ ඔහු දහඅටවැනි සියවසේ ප්‍රබෝධයේ නියෝජිතයෙක් හා ව්‍යවස්ථාවාදී රාජාණ්ඩුවාදයේ දෘෂ්ටිවාදියෙක්ද විය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

රාදෙක්, කාල් බෙර්නර්දවිච් (1885-1939) — ඔහු විසිවැනි ශත වර්ෂයාරම්භයේ පටන් ගැලීසියාවේ, පෝලන්තයේ හා ජර්මනියේ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපරයටද ජර්මන් වාමාංශික සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ ප්‍රකාශක කටයුතුවලටද සහභාගී විය. පළමුවැනි ලෝක යුද්ධය සමයේදී ජාත්‍යන්තරවාදී ස්ථාවරය ගෙන සිට රාදෙක් මධ්‍යස්ථවාදය වෙත නැඹුරු වෙමින් වැනෙන සුලු භාවය දක්වූ අතර ස්වාධිපත්‍යය සඳහා ජාතීන් සතු අයිතිය ගැන ප්‍රශ්නය සම්බන්ධයෙන් වැරදි සහගත පිළිවෙතක් ගෙන සිටියේය. ඔහු 1917 සිට බොල්ෂෙවික් පක්ෂයේ සාමාජිකයෙක් විය.

රැබනොවිච්, ඉලියා අදෙල්පවිච් (1860-1920) — සමාජවාදී-විප්ලවවාදී පක්ෂයේ එක් නායකයෙක් වූ ඔහු ජාත්‍යන්තර සමාජවාදී බියුරෝවේ සාමාජිකයෙක් විය. පළමුවැනි ලෝක යුද්ධය සමයේදී රැබනොවිච් සමාජ-ජාත්‍යෝන්මාදවාදය වැළඳ ගෙන සිටියේය.

රුසානව්, නිකොලායි සෙර්ගේයවිච් (උපත 1859) — දේශපාලන විචාරකයෙක් වූ ඔහු ප්‍රථමයෙන් ''නරෝද්නය වෝලිය'' කණ්ඩායමේ සාමාජිකයෙක් හා ඉක්බිතිව සමාජවාදී-විප්ලවවාදියෙක් විය. සමාජවාදී-විප්ලවවාදී පත්‍ර ගණනක් පළ කළේය.

රෙනොදේල් (Renaudel), පියේර් (1871-1935) — ප්‍රංශ සමාජවාදී පක්ෂයේ ප්‍රතිසංස්කරණවාදී නායකයින්ගෙන් එක් කෙනෙකි. 1902-1914 දී “Le Peuple” (''ජනතාව'') හා 1914-1920 අවුරුදුවලදී “L'Humanite” (''මානවවර්ගය'') යන පත්‍ර පළ කළ ඔහු 1914-1919 දී හා 1924 දී නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකයෙක් විය. පළමුවැනි ලෝක යුද්ධය කාලයේදී සමාජ-ජාත්‍යෝන්මාදවාදියෙක් බවට පත්විය.

රොද්සියංකො, මිහයිල් ව්ලදීමිරවිච් (1859-1924) — විශාල ඉඩම් හිමියෙක් හා රාජාණ්ඩුවාදියෙක් වූ ඔහු ඔක්තියාබ්‍රිස්ට් පක්ෂයේ (''ඔක්තෝබර් 17 සංගමයේ'') එක් නායකයෙකු විය. 1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය සමයේදී හෙතෙම''රාජ්‍ය දූමා සභාවේ තාවකාලික කාරක සභාව'' හා ඉන්පසු ''දූමා සාමාජිකයින්ගේ විශේෂ සභාව'' යන ප්‍රතිවිප්ලවවාදී මධ්‍යස්ථාන සංවිධාන කළ අතර කර්නීලව් කැරැල්ලේ එක් ආරම්භකයෙක්ද විය.

ලසාල් (Lassalle), පෙර්ඩිනන්ඩ් (1825-1864) — ප්‍රංශ ජාතික සුළු ධනපති සමාජවාදියෙක් වූ ඔහු, ලසාල්වාදය නැමති ජර්මන් කම්කරු ව්‍යාපාරයේ අවස්ථාවාදයේ එක් විශේෂයක ආරම්භකයාය. සමස්ත ජර්මන් කම්කරු සංගමය (1863) පිහිටුවීම ගැන ගෞරවය ලසාල්ට හිමි වූ නමුත් ඔහු එය අවස්ථාවාදී මාවත ඔස්සේ මෙහෙයවීය.

ලෙනින් (උල්‍යානව්), ව්ලදීමිර් ඉලිච් (1870-1924)

ලේගින් (Legien), කාල් (1861-1920) — ඔහු ජර්මන් දක්ෂිණාංශික සංශෝධනවාදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙක් හා ජර්මන් වෘත්තීය සමිතිවල එක් නායකයෙක් විය. ලේගින්, 1903 සිට වෘත්තීය සමිතියේ ජාත්‍යන්තර අංශයේ ලේකම් ධුරය හා 1913 සිට එහි සභාපති ධුරයද ඉසිලූ අතර 1893-1920 අවුරුදුවලදී (වරින්වර) ජර්මන් සමාජවාදී පක්ෂයේ නියෝජිතයෙකු ලෙස රෙයිස්ටාගයට තේරී පත් විය. පළමුවැනි ලෝක යුද්ධය සමයේදී ඔහු අන්ත සමාජ-ජාත්‍යෝන්මාදවාදය වැළඳ ගෙන සිටියේය.

ලිබෙර් (ගොල්ඩ්මන්), මිහයිල් ඉසාකවිච් (1880-1937) බුන්ඩ් හි එක් නායකයෙක් වූ ඔහු පළමුවැනි යුද්ධය සමයේදී සමාජ-ජාත්‍යෝන්මාදවාදී ස්ථාවරය ගෙන සිටියේය. 1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයෙන් පසු ලීබෙර් පෙට්‍රොග්‍රෑඩ් කම්කරු හා සොල්දාදු නියෝජිතයන්ගේ සෝවියට් සභාවේ විධායක කාරක සභාවේ හා මධ්‍යම විධායක කාරක සභාවේ සභාපති මණ්ඩලයේ සාමාජිකයෙක් විය. මෙන්ෂෙවික් ප්‍රතිපත්තිය අනුගමනය කළ ඔහු සභාග ආණ්ඩුවට පක්ෂව සිටියේය.

ලීබ්ක්නෙහ්ට් (Liebkhnecht), විල්හෙල්ම් (1820-1900) — ජර්මන් හා ජාත්‍යන්තර කම්කරු ව්‍යාපාරයේ සම්භාවනීය නායකයෙක් වූ ඔහු ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ එක් ආරම්භකයෙක් හා නායකයෙක්ද විය. ලීබ්ක්නෙහ්ට් ජර්මන් රෙයිස්ටාගයට බොහෝ වරක් තේරී පත් වූ අතර ඔහු පළමුවැනි ජාත්‍යන්තරය පිහිටුවීමටද සහභාගී විය.

ලීබ්ක්නෙහ්ට් (Liebknecht), කාල් (1871-1919) — ජර්මන් හා ජාත්‍යන්තර කම්කරු ව්‍යාපාරයේ ප්‍රසිද්ධ නායකයෙක් වූ ඔහු ජර්මන් සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ වාමාංශයේ එක් නායකයෙක්ද විය. 1912 දී ඔහු රෙයිස්ටාගයට තේරී පත්විය. පළමුවැනි ලෝක යුද්ධය සමයේදී විප්ලවවාදී-ජාත්‍යන්තරවාදී ස්ථාවරය ගෙන සිටියේය. 1914 දෙසැම්බර 2 දින සියලු රෙයිස්ටාග් නියෝජිතයින් අතුරෙන් යුද්ධමය වියදම්වලට විරුද්ධව ඡන්දය දුන්නේ ඔහු පමණකි.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කාල් ලිබ්ක්නෙෂ්ට "ස්පාටකස් සංගමයේ" පූර්වාරම්භකයින් හා නායකයින්ගෙන් එක් කෙනෙක් වූ අතර 1916 දී යුද්ධ විරෝධී ප්‍රචාර ගෙන යාම නිසා ඔහුට බරපතල වැඩ සහිත සිර දඬුවම් නියම කරන ලදී. 1918 නොවැම්බර් විප්ලවය සමයේදී අර්. ලුක්සම්බුර්ග් සමග ජර්මන් කම්කරුවන්ගේ විප්ලවකාරී පෙරමුණට නායකත්වය දුන් ලිබ්ක්නෙෂ්ට් ජර්මන් කම්කරු පක්ෂයේ සංවිධායකයන්ගෙන් හා 1919 ජනවාරි මස බර්ලින් කම්කරුවන්ගේ කැරලි ගැසීමේ නායකයින්ගෙන් එක් කෙනෙක් ද විය. කැරැල්ල මර්දනය කිරීමෙන් පසු ඔහු ප්‍රතිවිප්ලවවාදීන් විසින් මිලේච්ඡ ලෙස මරා දමන ලදී.

ලුක්සම්බුර්ග් (Luxemburg), රෝසා (1871-1919) — ජර්මන්, පෝලන්ත හා ජාත්‍යන්තර කම්කරු ව්‍යාපාරයේ සුප්‍රසිද්ධ නායකයෙක් වූ ඇ දෙවැනි ජාත්‍යන්තරයේ වාමාංශයේ එක් නායකයෙක්ද වූවාය.

පළමුවැනි ලෝක යුද්ධයාරම්භයේ පටන්ම ජාත්‍යන්තරවාදී ප්‍රතිපත්තිය පිළිගත් ඇ ජර්මනියේ "ස්පාටකස් සංගමය" පිහිටුවීමට සහභාගී වූවාය. ජර්මනියේ 1917 නොවැම්බර් විප්ලවයෙන් පසු ලුක්සම්බුර්ග් ජර්මන් කොමියුනිස්ට් පක්ෂයේ ව්‍යවස්ථා සම්පාදක සම්මේලනයේ එක් නායකයෙක් වූ අතර 1919 ජනවාරි මාසයේදී ඇ අත් අඩංගුවට ගන්නා ලදුව ප්‍රතිවිප්ලවවාදීන් විසින් මිලේච්ඡ ලෙස මරා දමන ලදී.

වන්දෙර්වෙල්දෙ (Wanderwelde), එමිල් (1866-1938) — බෙල්ජියමේ කම්කරු පක්ෂයේ නායකයා හා දෙවැනි ජාත්‍යන්තරයේ අන්තර්ජාතික සමාජවාදී බියුරෝවේ සභාපති වූ ඔහු අන්ත අවස්ථාවාදී ස්ථාවරය ගෙන සිටියේය. පළමුවැනි ලෝක යුද්ධය සමයේදී සමාජ-ජාත්‍යෝන්මාදවාදියෙක් බවට පත් වූ වන්දෙර්වෙල්දෙ ධනපති ආණ්ඩුවට ඇතුල් විය. 1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයෙන් පසු, අධිරාජ්‍යවාදී යුද්ධය පවත්වා ගෙන යාම සඳහා උද්ඝෝෂණය කිරීමට ඔහු රුසියාවට පැමිණියේය.

දෙවැනි විල්හෙල්ම් (ගොගන්සොලර්න්) (1859-1941) — ජර්මන් අධිරාජයා හා ප්‍රරුසියාවේ රාජයා (1888-1918) ය.

වෙබ් (Webb), බියැට්රිස් (1858-1943) — සුප්‍රසිද්ධ ඉංග්‍රීසි සමාජ නායිකාවක වූවාය.

වෙබ් (Webb), සිඩ්නි (1859-1947) — සුප්‍රසිද්ධ ඉංග්‍රීසි ප්‍රතිසංස්කරණවාදී සමාජ නායකයෙකු විය. තම බිරිඳ වූ බී. වෙබ් සමග සහයෝගීව කටයුතු කළ ඔහු ඉංග්‍රීසි කම්කරු ව්‍යාපාරයේ ඉතිහාසය හා න්‍යායය ගැන කෘති ගණනක් ලිවේය. ප්‍රතිසංස්කරණවාදී ෆේබියන් සමාජයේ එක් පූර්වාරම්භකයෙක් වූ වෙබ්, ධනපති සමාජය තුළින්ම සාමකාමී ආකාරයෙන් කම්කරු ප්‍රශ්න විසඳීමේ අදහස සිය කෘති මගින් ඉදිරිපත් කළේය.

වෙයිඩමෙයර් (Weydemeyer,) ජෝසප් (1818-1866) — ජර්මන් හා ඇමෙරිකන් කම්කරු ව්‍යාපාරයේ එක් නායකයෙක් හා කොමියුනිස්ට්වරුන්ගේ සංගමයේ සාමාජිකයෙක් වූ ඔහු කාල් මාක්ස් හා ෆ්‍රෙඩ්රික් එංගල්ස්ගේ මිත්‍රයෙක් හා සහකාරයෙක්ද විය. 1848-1849 අවුරුදුවලදී වෙයිඩමෙයර් ජර්මන් විප්ලවයට සහභාගී විය.

වෙර්හොව්ස්කි, අලෙක්සන්දර් ඉවානවිච් (1886-1941) — සාර් හමුදවේ ලුතිනන් කර්නල් හා යුද්ධ ලේඛකයෙක් වූ ඔහු 1917 දී මොස්කව් යුද්ධ ප්‍රදේශයේ හමුදවේ සේනාධිපති ලෙස පත් කරන ලදී. කර්නිලව් කැරැල්ල මර්දනය කිරීමෙන් පසු මේජර් ජෙනරාල් ධුරයට පත් කරන ලද වෙර්හොව්ස්කි ධනපති තාවකාලික ආණ්ඩුවේ අවසාන අවදියේ යුද්ධ කටයුතු භාර ඇමති ධුරය ඉසිලීය. හමුදවේ විශාල කොටසක් විසිරුවා හැරීමට හා වෙනත් පියවර සඳහා තමා ඉදිරිපත් කළ යෝජනා පූර්ව-පාර්ලිමේන්තුව විසින් ප්‍රතික්ෂේප කිරීම නිසා වෙර්හොව්ස්කි 1917 ඔක්තෝබර් 19 (නොවැම්බර් 1) දින මෙ ධුරයෙන් ඉල්ලා අස්විය.

ෂයිඩමාන් (Scheidemann,) පිලිප් (1865-1939) — ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ අවස්ථාවාදී අන්ත දක්ෂිණාංශයේ එක් නායකයෙකි. 1903 සිට රෙයිස්ටාග්හි සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කණ්ඩායමට ඇතුල් වී සිටි ඔහු 1911 දී ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ විධායක මණ්ඩලයේ සාමාජිකයෙකු බවට පත්විය. පළමුවැනි ලෝක යුද්ධය සමයේදී ෂයිඩමාන් සමාජ-ජාත්‍යෝන්මාදවාදී පිළිවෙත ගෙන සිටියේය.

ෂිංගරියොව්, අන්ද්‍රෙයි ඉවානවිච් (1869-1918) — කැඩෙට් වරයෙක් වූ ඔහු 1907 දී කැඩෙට් පක්ෂයේ මධ්‍යම කාරක සභාවට ඇතුල් විය. 1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයෙන් පසු ධනපති තාවකාලික ආණ්ඩුවේ මුල් අවධියේදී කෘෂිකර්මාන්ත ඇමති ධුරයද එහි දෙවැනි අවධියේදී මුදල් ඇමති ධුරයද ඉසිලීය.

ෂොත්මන්, අලෙක්සාන්දර් වසිලියවිච් (1880-1939) — විප්ලවවාදියෙකි, බොල්ෂෙවික්වාදියෙකි. 1917 ජූනි මස සිට පෙට්‍රොග්‍රෑඩ් ප්‍රාදේශීය කාරක සභාවේ සාමාජිකයෙක් බවට පත් වූ ඔහු එම අවුරුද්දේ අගෝස්තු

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

මාසයේදී ලෙනින් රස්ලිව් සිට පින්ලන්තයට යාම සංවිධානය කළේය. පොත්මන් ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට ක්‍රියාශීලි ලෙස සහභාගී විය.

ෂ්ටිර්නර් (Stirner,) මැක්ස් (1806-1856) — ජර්මන් දර්ශනවාදියෙකු වූ ඔහු ධනපති පෞද්ගලිකවාදයේ හා ආරාජිකවාදයේ දෘෂ්ටිවාදියෙක්ද විය.

සම්බා (Sambat,) මර්සෙල් (1862-1922) — කලාවේදියෙකු වූ ඔහු ප්‍රංශ සමාජවාදී පක්ෂයේ ප්‍රතිසංස්කරණවාදී නායකයින්ගෙන් එක් කෙනෙක් විය. 1893 සිට හෙතෙම නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකයෙකුව සිටියේය. පළමුවැනි ලෝක යුද්ධය සමයේදී සම්බා සමාජ-ජාත්‍යෝන්මාදවාදය වැළඳ ගෙන සිටි අතර 1914-1917 දී ප්‍රංශයේ අධිරාජ්‍යවාදී ''ජාතික ආරක්ෂා ආණ්ඩුවේ'' සමාජ සේවා භාර ඇමති විය.

සිනෝවියව් (රදම්සල්ස්කි), ග්‍රිගෝරි යෙව්සේයවිච් (1883-1936) — 1901 සිට බොල්ෂෙවික් පක්ෂයේ සාමාජිකයෙකි. ඔක්තෝබර් සමාජවාදී විප්ලවය සූදනම් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ කාලයේදී වැනෙන සුලු භාවය පාමින් සිටි ඔහු ආයුධ සන්නද්ධ කැරලි ගසා නැගී සිටීමට විරුද්ධව ඉදිරිපත් විය.

1917 ඔක්තෝබරයේදී, ආයුධ සන්නද්ධ කැරලි ගැසීම සම්බන්ධයෙන් මධ්‍යම කාරක සභාව ගත් තීරණයට විරුද්ධ බව ඔහු හා තමා වෙනුවෙන් ''නෝවය ෂිස්න්'' අර්ධ මෙන්ෂෙවික්වාදී පත්‍රය මගින් කාමිනෙව් කළ ප්‍රකාශය පක්ෂයේ රහස් තීරණය අනාවරණය කිරීමක් එනම් විප්ලවය පාවා දීමක් විය.

ඔක්තෝබර් සමාජවාදී විප්ලවයෙන් පසු වගකිව යුතු තනතුරු ගණනක් ඉසිලූ සිනෝවියව් පක්ෂයේ ලෙනින්වාදී ප්‍රතිපත්තියට විරුද්ධව බොහෝ වරක් ඉදිරිපත් විය. 1927 දී කණ්ඩායම්වාදී ක්‍රියා කාරීත්වය නිසා පක්ෂයෙන් නෙරපා දමන ලද ඔහු ඉන් පසු දෙවරක් පක්ෂයේ සාමාජිකයෙකු ලෙස පුණරුත්ථාපනය වී පක්ෂ විරෝධී ක්‍රියාවන් නිසා යළිත් දෙවරක්ද නෙරපා දමන ලදී.

සෙන්සිනව්, ව්ලදීමිර් මිහයිලවිච් (උපත 1881) — සමාජවාදී-විප්ලවවාදී පක්ෂයේ එක් නායකයෙක් හා එහි මධ්‍යම කාරක සභාවේ සාමාජිකයෙක් වූ ඔහු පළමුවැනි ලෝක යුද්ධය සමයේදී ආරක්ෂාවාදී ප්‍රතිපත්තිය පිළිගෙන සිටියේය. 1917 දී සෙන්සිනව් පෙට්‍රොග්‍රෑඩ් සෝවියට් සභාවේ

විධායක කාරක සභාවේ සාමාජිකයෙක් වූ අතර ධනපති පංතිය සමග සන්ධානයට පක්ෂව සිටියේය. සමාජවාදී-විප්ලවවාදීන්ගේ නිල පත්‍රය වූ ''දියල නරෝද'' හි කර්තෘ වරයෙක්ද විය.

ට්සෙරෙතේලි,ඉරක්ලි ගෙයොර්ගියවිච් (1882-1959)—මෙන්ෂෙවික්වාදීන්ගේ එක් නායකයෙක් වූ ඔහු පළමුවැනි ලෝක යුද්ධය සමයේදී මධ්‍යස්ථවාදියෙක් බවට පත් විය. 1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයෙන් පසු ට්සෙරෙතේලි පෙට්‍රොග්‍රෑඩ් විධායක කාරක සභාවේ හා පළමුවැනි සෝවියට් සභා මධ්‍යම විධායක කාරක සභාවේ සාමාජිකයෙක් විය. 1917 මැයි මාසයේදී ඔහු ධනපති තාවකාලික ආණ්ඩුවට ඇතුල් වී තැපැල් හා විදුලි පණිවුඩ සේවය භාර ඇමති ධුරය හා පසුව ස්වදේශ ඇමති ධුරයද ඉසිලීය. ඒ වකවානුවේදී ට්සෙරෙතේලි බොල්ෂෙවික් විරෝධී ප්‍රහාරක ව්‍යාපාරය උසිගැන්වූ අයෙක් විය.

සකොල්නිකව්, ග්‍රිගෝරි යාකව්ලෙවිච් (1888-1939) — 1905 සිට බොල්ෂෙවික් පක්ෂයේ සාමාජිකයෙකුව සිටි ඔහු 1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයෙන් පසු රු. ස. ප්‍ර. ක. (බො) ප. මොස්කව් කාරක සභාවේද, මොස්කව් ප්‍රදේශීය බියුරෝ සභාවේද ''ප්‍රාව්ද'' කර්තෘ මණ්ඩලයේද සාමාජිකයෙක් විය. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයෙන් පසු පක්ෂ හා සෝවියට් සේවකයෙකු වූ සකොල්නිකව් ඉක්බිතිව පක්ෂ විරෝධී ක්‍රියා නිසා පක්ෂයෙන් නෙරපා දමන ලදී.

ස්තලීපින්, පියෝතර් අන්ද්‍රෙයවිච් (1802-1911) — විශාල ඉඩම් හිමියෙක් හා සාර්වාදී රුසියාවේ දේශපාලඥයෙක් වූ ඔහු 1906-1911 අවුරුදුවලදී ඇමති මණ්ඩලයේ සභාපති ධුරයද අභ්‍යන්තර කටයුතු පිළිබඳ ඇමති ධුරයද ඉසිලීය. විප්ලවකාරී ව්‍යාපාරය මැඩලීම පිණිස පුළුල් වශයෙන් මරණ දඬුවම පැමිණවීම ඇතුළු අතිශයින්ම කෲර මර්දනකාරී ක්‍රියා කලාපය (ඊනියා ස්තලීපින් ප්‍රතිගාමිත්වය) ඔහුගේ නාමය සමග සම්බන්ධ වේ. කුලාක්වරුන්, ගමේ සාර්වාදී සර්වබලධාරී පාලනයේ ආධාරකයක් බවට පරිවර්තනය කිරීම අරමුණු කොට ගෙන ස්තලීපින් ගොවි ප්‍රතිසංස්කරණ කටයුතු කළේය. එහෙත් ධනපති හා ඉඩම් හිමි පංතිවල උවමනාවන් සපුරා ලන ඇතැම් ප්‍රතිසංස්කරණ ඉහළින් ඇති කිරීමේ මාර්ගයෙන් සාර්වාදී අත්තනෝමතිකවාදය තහවුරු කිරීම සඳහා ඔහු දැරූ ප්‍රයත්න නිෂ්ඵල වී ගියේය. 1911 දී ස්තලීපින් කියෙව්හි රහස් පොලිසියේ ඒජන්තවරයෙකු වූ සමාජවාදී-විප්ලවවාදියෙකු විසින් මරා දමන ලදී.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ස්ත්රුවේ, පියොතර් බෙර්න්ගර්දවිච් (1870-1944) — රුසියානු ධනපති ආර්ථික විද්‍යාඥයෙක් හා දේශපාලන විචාරකයෙක් වූ ඔහු කැඩෙට් පක්ෂයේ එක් නායකයෙකි. අනූ ගණන්වලදී ''නිත්‍යානුකූල මාක්ස්වාදයේ''ප්‍රධානතම නියෝජිතයෙක් වූ ස්ත්රුවේ ධනපති පංතියේ උවමනාවන් සපුරාලන පරිද්දෙන් මාක්ස්වාදය හා කම්කරු ව්‍යාපාරය ප්‍රතිසංස්කාරණය කිරීම සඳහා මාක්ස්ගේ ආර්ථික හා දර්ශනික උගැන්වීම ගැන ''විවේචනය'' හා ඊට ''එකතු කිරීම්'' ඉදිරිපත් කළේය.

ස්ටාලින්, ඉඔසිප් විසරිඔනවිච් (1879-1953) — 1898 සිට පක්ෂයේ සාමාජිකයෙකු වූ ඔහු 1912 දී. රු. ස. ප්‍ර. ක. (බො) ප. මධ්‍යම කාරක සභාවට ඇතුල් විය. ඔක්තෝබර් සමාජවාදී විප්ලවය සූදනම් කිරීමේ හා එය ඉටු කිරීමේ කාලයේදී, පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් ඇති කරන ලද කැරලි ගසා නැගි සිටීමේ විප්ලවකාරී යුද්ධ මධ්‍යස්ථානයට ඔහු ඇතුලත්ව සිටියේය.

රු. කො. (බො.) ප. දේශපාලන බියුරෝ සභාවේ සාමාජිකයෙකු වූ හෙතෙම 1917 නොවැම්බරයේ සිට 1922 ජූලි මස දක්වා ජාතීන් පිළිබඳ මහජන කොමිසාර් වශයෙනුත්, 1919 මාර්තු සිට රජය මගින් කෙරෙන පාලනය පිළිබඳ මහජන කොමිසාර් වශයෙනුත් ඉන් පසු 1922 අප්‍රියෙල් 25 දින දක්වා කම්කරු-ගොවි පාලනය භාර මහජන කොමිසාර් වශයෙනුත් සේවය කළේය. සිවිල් යුද්ධයේ අවුරුදුවලදී ස්ටාලින් ජනරජයේ විප්ලවකාරී-යුද්ධ සභාවේ හා පෙරමුණු ගණනාවක විප්ලවකාරී-යුද්ධ සභාවල සාමාජිකයෙකුද විය.

1922 පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ ප්‍රධාන ලේකම් ලෙසට තේරීපත් වූ ඔහු 1941 දී මහජන කොමිසාර් මණ්ඩලයේ සභාපති ධුරයටද අනතුරුව සෝවියට් සංගමයේ ඇමති මණ්ඩලයේ සභාපති ධුරයටද පත් විය.

බොහෝ කාලයක් තිස්සේ පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ ප්‍රධාන ලේකම් ධුරය ඉසිලූ ස්ටාලින් වෙනත් නායකයින් සමග සමාජවාදය ගොඩ නැගීම සඳහා ක්‍රියාශීලී ලෙස අරගල කළ අතර පක්ෂ විරෝධී උපනති, විශේෂයෙන්ම ට්‍රොට්ස්කිවාදය හා දක්ෂිණාංශික අවස්ථාවාදය, මැඩ පැවැත්වීමෙහි වැදගත් කාර්ය කොටසක් ඉටු කළේය.

ඒ අතරම මාක්ස්-ලෙනින්වාදයට නොගැලපෙන පුද්ගලාභිවාදනය ලෙසට පක්ෂය විස්තර කර ඇති, සෝවියට් සමාජයේ ඇති වූ විකෘති කිරීම් ඔහුගේ නාමය සමග සම්බන්ධ වේ.

ස්ටෞනිං (Stauning), ටොර්වල්ඩ් අව්ගුස්ට් මරිනුස් (1873-1942) — ඩෙන්මාර්කයේ දේශපාලනඥයෙක් වූ ඔහු ඩෙන්මාර්ක් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ හා දෙවැනි ජාත්‍යන්තරයේ දක්ෂිණාංශික නායකයන්ගෙන් එක් කෙනෙකි. ස්ටෞනිං 1906 සිට ඩෙන්මාර්ක් පාර්ලිමේන්තුවේ නියෝජිතයෙක්ද 1910 සිට ඩෙන්මාර්කයේ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ හා එහි පාර්ලිමේන්තු කණ්ඩායමේ සභාපතිද විය. පළමුවැනි ලෝක යුද්ධය සමයේදී සමාජ-ජාතෝයන්මාදවාදී ස්ථාවරය ගෙන සිටි ඔහු 1916-1920 දී ඩෙන්මාර්ක් ධනපති ආණ්ඩුවේ කාර්ය නියමයක් නොමැති ඇමති ධුරය ඉසිලීය.

ස්පෙන්සර් (Spencer), හර්බර්ට් (1820-1903) — ඉංග්‍රීසි දර්ශනවාදියෙක්, මනෝවිද්‍යාඥයෙක් හා සමාජවාදියෙක් වූ ඔහු ප්‍රත්‍යක්ෂවාදයේ ප්‍රසිද්ධ නියෝජිතයෙක්ද විය.

ස්වෙර්ද්ලොව්,යාකව් මිහයිලවිච් (1886-1919)— 1901 සිට කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයෙක් වූ ඔහු පක්ෂයේ හා සෝවියට් රාජ්‍යයේ එක් නායකයෙක් විය. (1917 අප්‍රියෙල් මස) හත්වැනි සමස්ත රුසියා සම්මේලනයේදී රු. ස. ප්‍ර. ක. (බො) ප. මධ්‍යම කාරක සභාවේ සාමාජිකයෙකු ලෙස තේරී පත්වූ ස්වෙර්ද්ලොව් මධ්‍යම කාරක සභාවේ ලේකම් මණ්ඩලයේ නායකත්වය දැරිය. ඔහු ඔක්තෝබර් සමාජවාදී විප්ලවය සූදනම් කිරීමට හා ඉටු කිරීමට ක්‍රියාශීලී ලෙස සහභාගී වූ අතර පෙට්‍රොග්‍රෑඩ් යුද්ධමය විප්ලවවාදී කාරක සභාවේ හා කැරැල්ල මෙහෙයවීම සඳහා පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් ඇති කරන ලද යුද්ධමය විප්ලවකාරී මණ්ඩලයේ සාමාජිකයෙක් විය. 1918 නොවැම්බර් 8(21) දින හෙතෙම සමස්ත රුසියා මධ්‍යම විධායක කාරක සභාවේ සභාපති ලෙසට තේරී පත්විය.

හයින්ඩ්මන් (Hyndman,) හෙන්රි මයර්ස් (1842-1921) — ඉංග්‍රීසි සමාජවාදියෙක් හා ප්‍රතිසංස්කරණවාදියෙක් වූ ඔහු බ්‍රිතාන්‍ය සමාජවාදී පක්ෂයේ එක් නායකයෙක්ද විය. සොල්පොර්ඩ්හි රැස් වූ පක්ෂයේ සම්මේලනය අධිරාජ්‍යවාදී යුද්ධය කෙරෙහි ඔහු දැක්වූ සමාජ-ජාතෝයන්මාදවාදී ආකල්පය හෙළා දුටු නිසා හයින්ඩ්මන් 1916 දී පක්ෂයෙන් ඉවත් විය.

හෙන්ඩර්සන් (Henderson,) ආතර් (1863-1935) — ලේබර් පක්ෂයේ හා ඉංග්‍රීසි වෘත්තීය සමිති ව්‍යාපාරයේ එක් නායකයෙකි. පළමුවැනි ලෝක යුද්ධය සමයේදී සමාජ-ජාතෝයන්මාදවාදය වැළඳ ගෙන සිටි ඔහු එංගලන්තයේ ධනපති ආණ්ඩුවට ඇතුල් විය. 1917 පෙබරවාරි

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයෙන් පසු යුද්ධය තවදුරටත් පවත්වා ගෙන යාම සඳහා උද්ඝෝෂණය කිරීමේ අරමුණ ඇතිව රුසියාවට පැමිණ සිටියේය. බෙර්න් (දෙවැනි) ජාත්‍යන්තරයේ පූර්වාරම්භකයන්ගෙන් කෙනෙක් විය.

හෙරොස්ත්‍රෙටස් — තම නාමය ප්‍රසිද්ධ කිරීම අරමුණු කොට ගෙන ක්‍රි. ව. පෙර 356 දී එපෙස්හි අර්ටෙමිස් දේවස්ථානයට ගිනි තැබූ ග්‍රීක ජාතිකයෙකි.

හේගල් (Hegel,) ගෙයොර්ග් විල්හෙල්ම් ෆ්‍රෙඩරික් (1770-1831) — සුප්‍රසිද්ධ ජර්මන් වාස්තවික විඥානවාදී දර්ශනවාදියෙකි. හෙතෙම, දයලෙක්තික භෞතිකවාදයේ දර්ශනික උල්පත්වලින් එකක් වූ විඥානවාදී දයලෙක්තිකය නිර්මාණ කර එය සම්පූර්ණයෙන්ම දියුණු කළේය.

පාඨකයින් වෙතටයි

මෙම පොතෙහි අඩංගු කරුණු, අනුවාදය හා මුද්‍රණය පිළිබඳව ඔබගේ අදහස් දන්වා එවීමෙන් ප්‍රගති ප්‍රකාශක මන්දිරයේ කෘතඥතාව ඔබට හිමිවේ. ඔබගේ වෙනත් යෝජනා ඇතොත් අපි එය කරුණාවෙන් බාර ගනිමු.

අපේ ලිපිනය:

Progress Publishers,
17 Zubovsky Boulevard,
Moscow, USSR

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

LIBERATIONBASE
ඩිජිටල් පුස්තකාලය

ඩිජිටල් පුස්තකාලය සහ ලේඛණ සංරක්ෂණ ව්‍යාපෘතිය
ආරම්භය (***NMSG Library*** ලෙස): 2010
LIBERATIONBASE ලෙස නැවත නාමකරණය: 2013

සූචිකරණ දත්ත

- කෘතිය: ලෙනින් තෝරාගත් කෘති වෙළුම් දොළහ, වෙළුම 6
- කතෘ/පරිවර්තක: වී.අයි. ලෙනින්/උ. මු. අබයරත්න
- ප්‍රකාශක: ප්‍රගති ප්‍රකාශක මන්දිරය, මොස්කව්
- පළමු ඩිජිටල් පළ කිරීම: 2014-09-22
- ඩිජිටල් සංස්කරණයන්: V1:2014-09-22, V2:2019-05-29
- පිටු ගණන: 300
- භාෂා මාධ්‍ය: සිංහල
- ගොනු ආකෘතිය: PDF

Web: https://liberationbase.wordpress.com
Email: slradical@ymail.com